

# සන්දේහ ඝාතිනී

(නාමොපලක්ෂිත)

# කංඛාවිතරණී විසිතුරු සන්නය

## ප්‍රථම භාගය

සැකසුම : රුවන්ගිරිකන්ද සේනාසන පාලක සභාව

සන්දේහ ඝාතිනී නම් වූ කංඛාවිතරණී සන්නය

# පිදුම

රුවන්ගිරිය වන සෙනසුන් නිර්මාතෘ

අපවත් වී වදාල

**අති පූජනීය විදර්ශනාචාර්ය**

**මාතලේ ශ්‍රී සීලරක්ඛිත හිමි පාණන්**

**වහන්සේගේ**

21 වන ගුණ සමරු පිංකම

නිමිති කරගෙන

උන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ

උප සභාපති ධූරීන හා මහෝපාධ්‍යාය

රුවන්ගිරිය හා බුත්තල බුදුගල්ලෙන

ආරණ්‍ය සෙනසුන්පති

**අති පූජනීය මාවතගම**

**ගුණානන්ද නායක හිමිපාණන්**

**වහන්සේගේ**

**උතුම් ශ්‍රී හස්ථයට**

**ගුරු පූජාවක් ලෙසට පිරිනමන වගයි.**

# සංඥාපනය

ශ්‍රී ඝන සුගත තථාගත වූ අප බුදු රජාණන් වහන්සේ මේ මහා භද්‍රකල්පයට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි කුළුණු නුවණැති සුමේධ නම් මහා තාපසව ලෝක ශිවංකර වූ දීපංකර නම් සර්වඥයන් වහන්සේගේ සම්මුඛයෙහි හස්ත ප්‍රාප්ත නිර්වාණ පදය සසර දුක මෙන් හැරපියා සකල සත්වයන් කෙරෙහි පතළ මහා කරුණාවෙන් එම දිවකුරු බුදුන්ගෙන් නියත විවරණ ශ්‍රී ලැබ සසර වැද ඉන් මෑත ලොව පහළ වූ තෙවිසි සර්වඥවරයන්ගෙන් ද ලබන ලද විවරණ ශ්‍රී ඇතිසේක් සමතිංශත් පාරමී ධර්මයන් පුරා පිළිවෙලින් බෝධිද්‍රැම රාජයා කරා පැමිණ පස්මරුන් පරදවා වෙසක් මස පුණු පොහෝ දවස්හි මේ මහ පොළොව යදණ්ඩකින් පහල ලොහොතලියක් සේ ශතරාව සහශ්‍රාවයෙන් කම්පාකොට දශබල චතුවෛශාරද්‍යඥානාදී විවිධ ගුණ ගණාලංකෘත සර්වඥතා ඥානාධිගමයෙන් සර්ව ධර්මයන් සර්වාකාරයෙන් අවබෝධකොට බුද්ධරාජ්‍යශ්‍රීයට පැමිණ පන්සාළිස් හවුරුද්දක් මුළුල්ලේහි වැඩහිඳ දිව්‍ය බ්‍රහ්මයන් සහිත අනන්ත සත්ව වර්ගයාට දහම් දෙසා හිත වැඩ සලස්වමින් භික්ෂූන් උදෙසා යම් ශික්ෂා පද ප්‍රඥප්තියක් පණවා වදාළ සේක්ද ඒ ප්‍රඥප්ති තොමෝ සර්වඥයන් වහන්සේටම විෂය වන්නිය.

ඊට කරුණු කිම යත්? ප්‍රාඥයන් අතුරෙන් අගතැන්පත් ආයුෂ්මත් ධම්මසෙනාපති ශාරිපුත්‍ර මහා ස්වාමින් වහන්සේ විසින් එක් කලෙක ශික්ෂා පද පැණවීම පිණිස අවසර ඉල්වා තුන් යලක් සර්වඥයන් වහන්සේට යාච්ඤා කරණු ලැබූයේ එම්බා ශාරිපුත්‍රය මේ ශික්ෂා පද ප්‍රඥප්තිය තොපට විෂය නොවන්නිය. සචිනේ ගෙවාදත් බුද්ධ වරයන්ටම විෂය වන්නිය. කුමක් හෙයින යත්? මේ වරදට මේ දඬුවම වටනේය. මේ ව්‍යතික්‍රමය මේ ප්‍රතිකර්මයෙන් පිරිසිදු වෙයි යනු සර්වඥතා ඥනයට මුත් ප්‍රදේශඥනයට විෂය නොවන හෙයිනි. ඒ එසේ මැයි. බුද්ධ ප්‍රඥප්ත විනය පිටකයෙහි උපාලි මහා කාශ්‍යප ශාරිපුත්‍රාදි මහා ශ්‍රාවකයන් විසින් එක් ශික්ෂා පදයකුදු නොපණවන ලදී.

අභිධර්ම පිටකටයෙහි වනාහි තිකදුකමාතෘකා මාතෘයක්ම සර්වඥයන් වහන්සේගෙන් අසා ඉගෙන ශාරිපුත්‍ර මහා ස්වාමීන් වහන්සේ විසින් සර්වඥයන් වහන්සේගේ මාතෘකාවෙහි පිහිටා සිටගෙන ෂට්ප්‍රකරණයෝ දේශනා කරණ ලද්දාහුය. එසේ ම තෘතීය සංඝායනාවසානියෙහි මොග්ගලිපුත්ත තිස්ස මහා ස්ථවිරයන් වහන්සේ විසින් බුද්ධ ප්‍රඥප්ත මාතෘකායෙහි සිටගෙන කථාවස්තු ප්‍රකරණය දේශනා කරණ ලදී. සූත්‍ර පිටකයෙහි කුදු ගත් සඟියට අයත් ප්‍රතිසම්භිදාමාර්ගීය මහා නිර්දේශය චූල නිර්දේශය යන ප්‍රකරණත්‍රය හා සිය ගණන් සූත්‍රද දේශනා කළහ. මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින් මධුපිණ්ඩික සූත්‍රය හා පෙටකොපදේශය නෙත්ති ප්‍රකරණයද දේශනා කරන ලදී.

එක් කලෙක සුභ නම් මාණවක තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අතින් නුඹ වහන්සේ ත්‍රිපිටක ධර්මය ඉගෙන ගත්තේ කවරක් හුගෙන් දැයි විචාල ප්‍රශ්නයට

පිළිතුරු වශයෙන් "ද්වාසීතිංබුද්ධතො ගණ්හිං පෙ ද්වෙසහස්සානි භික්ඛුතො" යනුවෙන් අසූදෙදහසක් ධර්ම ස්කන්ධයන් සර්වඥයන් වහන්සේගෙන්ද දෙදහසක් ධර්ම ස්කන්ධයන් ශ්‍රාවකයන්ගෙන්ද උගන්නාලදිමියි දුන් උත්තරයෙන් දෙදහස් ධර්ම ස්කන්ධයෝ ශ්‍රාවක භාෂිතයෝ යයි හැඟේ. විනය පිටකයෙහි වනාහි ශ්‍රාවක භාෂිත එක් ශික්ෂා පදයකුදු නොදක්නා ලදී.

"විනයො නාම සාසනස්ස ආයු" යන්නෙන් මේ විනය ධර්මය තෙම සර්වඥ ශාසනය සම්බන්ධ වූ ආයුෂය නොහොත් ජීවිතය නම් වේ යයි පෙනේ. "විනයෙඨිතෙසාසනංඨිතංහොති" යන්නෙන්ද "විනයෙ අවිනට්ඨම්හි පුන්තිට්ඨතිසාසනං" යන්නෙන්ද විනය ධර්මය උද්ග්‍රහණ පුච්ඡා ශ්‍රවණධාරණ ප්‍රත්‍යවෙක්ෂාදියෙන් අවබෝධ කොටගෙණ ඒ වූ පරිදි පිළිපදිමින් විනෂ්ට නොව මනාව පෙවත්නා කල්හි සර්වඥ ශාසනය චිරස්ථිතියට පැමිණේයයි ප්‍රකාශිතයි. ආඥා දේශනා සංඛ්‍යාත විනයෙහි ආවා වූ පාරාජිකාදි සප්තාපත්ති ස්කන්ධයන් රක්ෂා කරන්නා වූ භික්ෂූන්ගේ සමූහයකට සම්මුති සංඝයයි කියති. එබඳු භික්ෂු සංඝයාට සීමාබන්ධන උපසම්පදාදී සියලු විනය කර්මය කරණු සඳහා සර්වඥයන් වහන්සේ විසින් අනුදැන වදරණ ලදී. ඒ භික්ෂූන් අතුරෙන් අන්තිම භික්ෂුහුගේ පාරාජිකාපත්තියට පැමිණීමෙන් ප්‍රතිපත්ති අන්තර්ධානය යම් කලෙක්හි වන්නේද, එකල්හි මේ ලෝකය මහත් වූ මෝහාන්ධකාරයෙන් වැසී යන්නේය. එහෙයින් සර්වඥයන් වහන්සේ විසින් පාරාජික පචිති සුළුවග මහවග පරිවාරයන පොත් පසකින් යුත් විනය පිටකය දේශනා කරණ ලදී.

ඒ විනය පිටකයෙහි දේශනා කරණ ලද උභතො විභංගයෝ පාරාජිකා පාචිත්ති යන ග්‍රන්ථද්වයකින් සංග්‍රහ කරණ ලද්දහුය. දෙවිසිඛන්ධකයෝ ‍සුළුවග මහවග යන ග්‍රන්ථද්වයකින් යුක්තයහ. සොළොස් පරිවාරයෝ පරිවාර පාළියයි දක්වන ලදහ. භික්ෂු ප්‍රාතිමෝක්ෂාගත දෙසියවිස්ස (220) ක් ශික්ෂා පදයන්අතුරෙන් සතර (4) පරිජි ඇවැත්ය. තෙළෙස් (13) සඟ වෙසෙස් ඇවැත්ය. ද්විවිධ (2) අනියත ඇවැත්ය තිසක් (30) නිසගි පචිති ඇවැත් යන එකුන් පණස් (49) මාතෘකා ශික්ෂා පදයෝ පාරාජිකා පාළියෙන් සංග්‍රහ කරණ ලද්දහුය. දෙයානුව (92) ක් ශුද්ධ පචිති ඇවැත්ය. සතර (4) පාටිදෙසනීය ඇවැත්ය පන් සැතැනැව (75) ක් සෙඛියා ඇවැත්ය යන එක්සිය සැත්තෑ එක (171) ක් මාතෘකා ශික්ෂා පදයෝද (7) සප්තාධිකරණ සමථයෝද පාචිත්තිය පාළියෙන් සංග්‍රහ කරණ ලදහ. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂාගත අට (8) පරිජි ඇවැත්ය සතළොස් (17) සඟ වෙසෙස් ඇවැත්ය තිසක් (30) නිසගිපචිති ඇවැත්ය එක්සිය සැට (166) ක් ශුද්ධ පචිති ඇවැත්ය අට (8) ක් පාටිදේසනීය ඇවැත්ය පන්සැත්තෑව (75) ක් සෙඛියා ඇවැත්ය යන තුන්සිය සතර (304) ක් මාතෘකා ශික්ෂා පදයෝද (7) සප්තාධිකරණ සමථයෝද පාචිත්තිය පාළියෙන් සංග්‍රහ කරණ ලදහ. ආදියෙහි නිදානුද්දේශයද මාතෘකා ශික්ෂාපද පන්සිය සුවිස්ස (524) ක් හා (7) සප්තාධිකරණ සමථයෝද යන මෙයින් සමුප ලක්ෂිතයි. එම ශික්ෂා පද සමූහය කවර අර්ථයකින් විනය නම් වන්නේ ද යත්? නිදානුද්දේස පාරාජිකුද්දේස සංඝාදිසේසුද්දේස අනියතුද්දේස විත්ථාරුද්දේස (නිසගිපචිති මුල පටන්

සප්තාධිකරණ සමථාවසානය දක්වා විත්ථාරුද්දේසය වෙයි) යන පඤ්චවිධ පාතිමොක්ඛොද්දේශ සප්තාපත්ති ස්කන්ධ මාතෘකා විභංගාදී ප්‍රභේද වශයෙන් නානාවිධ විශේෂ ක්‍රම ඇති හෙයින්ද කායික වාචසික අනාචාරයන් වළක්වන හෙයින්ද ඔවුන් හික්මවන හෙයින්ද මේ පිටකය විනය නම් වන්නේ යයි දක්වන ලදී.

**"විවිධ විසෙසනයත්තා - විනයනතො චෙව කායවාචානං**

**විනයත්ථ විදූහි අයං - විනයො විනයොති අක්ඛාතො"**

ඒ විනය ශබ්දය පයඨ්ාපතිභාපනාර්ථ වාචක වූ පිටක ශබ්දය සමග "විනයොචයො පිටකඤ්චෙති - විනය පිටකං" කියා හෝ "විනයස්ස පිටකං - විනය පිටකං" කියා හෝ සමාස කරණු ලැබේ. කර්මධාරය සමාස පක්ෂයෙහි විනය වූ පයඨ්ාපත්‍යර්ත්ථය ද තත් පුරුෂ සමාසපක්ෂයෙහි වින සම්බන්ධි වූ හෝ විනය පයඨ්ාපන්න වූ හෝ ඒ ඒ අර්ථයන්ට භාජනාර්ථයද ප්‍රකාශ වෙයි.

විනය පිටකයෙහි දක්ෂභාවය කැමැත්තවුන් විසින් සූත්‍ර සූත්‍රානුලෝම ආචරියවාද අත්තනෝමති යන සතර මහා ප්‍රදේශයෝ දතයුත්තාහුය. මුළු විනය පිටකයෙහි පාළිය සූත්‍ර නම් වේ. "යංභික්ඛවෙමයා ඉදංනකප්පතීති පටික්ඛිත්තංතඤ්චෙ අකප්පියං අනුලෝමේතිකප්පියං පටිබාහති නංවොනකප්පති" යනාදියෙන් දක්වන ලද්දේ සූත්‍රානු ලෝම නම් වේ. ප්‍රකීර්ණක දේශනාසංඛ්‍යාත අර්ථ කථා පාළිය ආචාර්යප්‍රවාද නම් වේ. අර්ථකථාවන්හි ආචාවු ථේරවාදය අත්තනොමති නම් වෙයි. අත්තනෝමතියට වඩා ආචාර්යප්‍රවාදය අතිශයින් බලවත් වෙයි. ඊටත් වඩා සූත්‍රානුලෝමය අතිශයින් බලවත් වේ. ඊටත් වඩා සූත්‍රය අතිශයින් බලවත් වෙයි. මේ චතුර්විධ සතර මහා ප්‍රදේශයන් දැනගෙන පාලි වශයෙන් අර්ථකථා වශයෙන් විනය පිටකය ප්‍රගුණ වාචොද්ගත කොට සුවිනිශ්චය කරගැන්මද පෙළසම්බන්ධි වූ යට භාගයෙන් හෝ උපරිභාගයෙන් හෝ පදපටිපාටියෙන් හෝ අර්ථ කථාවෙන් හෝ එක එක රෝමයක් සණ්ඩාසයකින් වෙන් කොටැ ගන්නෙකු මෙන් විසර්ජනය කෙරේද ආවර්ජනය කළ කල්හි ආලෝකමත් ප්‍රදීපාලෝකයක් සේ ඇදුරු පරපුර ස්ථවිර පරම්පරාව වංශ පරම්පරාව මනාව අවබෝධ වීමද යන මේ ලක්ෂණත්‍රයෙන් විනයධර භික්ෂුහෙමේ සම්පූර්ණ විය යුත්තේය. විනය ධරයන් විසින් දස අවුරුද්දක් පමණ උගතමනා විනය පිටකය අනාගතයෙහි උපදනා මන්දබුද්ධිකයන්ට උද්ග්‍රහණාදිය නොකට හැකිව සම්බුද්ධ ශාසනය පිරිහේ දේහෝයි යන හයින්ද අඩමසක් පාසා පාමොක් උදෙසනු පිණිසද ධර්මසංග්‍රාහක මහා ස්ථවිරයන් විසින්ම භික්ෂු භික්ෂුණීන්ට පනවා වදළ ශික්ෂාපදයන්ගේ මුල් මාතෘකා පද සංග්‍රහ කොට විනය මාතෘකායයි කියන ලද උභය ප්‍රාතිමෝක්ෂය සංගායනා කල හෙයින් ඒ විනය මාතෘකාවේ සම්පූර්ණාර්ථ විස්තර කිරීමෙන් කංඛාවිතරණී නම් අටුවාව මහාකවි බුද්ධඝෝෂාචාර්‍යයන් වහන්සේ විසින්ම කරන ලදී.

ඒ කංඛාවිතරණී නොමෝ ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය සම්බන්ධවූ පදපදාර්ථ විනිශ්චය මුඛයෙන් ඛන්ධකපරිවාර පදභාජනා දී වශයෙන් කරණු ලබන විනිශ්චය ද නිදනාදී

වශයෙන් කරනු ලබන සප්තරස ප්‍රභේදයද සියලු ශික්ෂාපදයන් සම්බන්ධ වූ සාධාරණ විනිශ්චය ද දක්වන්නීය. එහෙයින් ස්වදේශ විදේශීය සියලු ආචාර්ය පරම්පරාවන්හි මේ මාතෘකාර්ථකථා තොමෝ උභය ප්‍රාතිමෝක්ෂ ග්‍රන්ථය හදරන්නා වූ භික්ෂූන් වහන්සේලාගේ උද්දේසාදියෙහි ප්‍රයුක්ත වූවා තදර්ථාවබෝධයෙහි ඒ භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්ති සැකදුරලීමෙහි තරණී වූවා හෙවත් නෞකාවක් සමාන වූවා ඒකාන්තයෙන් පරිශීලනය කරණු ලබන්නීය. පරිවාර ග්‍රන්ථාන්තර සම්පත්තීන්ද යුක්ත වූවා විනයාර්ථ මඤ්ජුසා නම් ටීකාවෙන්ද සිංහල භාෂාවෙන් විරචිත ග්‍රන්ථිපදවර්ණනාවෙන්ද සමලංකෘත වන්නීය.

මේ ශාසනයෙහි සියලු භික්ෂූන් විසින් නිස්සයමුඤ්චනක සම්මුතිය ලැබ ස්ථානාධිපති භාවයට හා ශිෂ්‍යයන් හික්මවීමටද ආචාර්යෝපාධ්‍යායයන්ගෙන් වෙන්ව සෙවරී භාවයෙන් ක්‍රියා කිරීමට ද විනයෙහි නියමබව දත යුත්තේයි. "නිස්සයමුඤ්චනකේනභික්ඛුනා අන්තමසොද්වෙමාතිකා පගුණා වාචුග්ගතා කාතබ්බා" යනු මහවග අටුවාවෙහි ආ හෙයින් නිස නොමිදී ශෛවරීව වසන භික්ෂූන්ට ආපත්ති අනාපත්ති භාවය නොදැනීමෙන් දවස්පතා පැමිණෙන ඇවතින් ගිස ඔසවන්නට නොහැකිව මේ ප්‍රවුප්ජාව හේතුකොටගෙණ ලැබිය යුතු සුගතියහබා අපාය මාර්ගය නොදැනුවත්ව එලිවන බව සලකා සැදැහැයෙන් උපසපන් වූ තැන්පටන් පස්වසක් විනයධරයෙකු වෙත නිස සමාදන්ව උභය ප්‍රාතිමෝක්ෂාදී නිස්සයාංගයන්ට සුදුසු බණදහම් පුහුණුකොට කංඛාවිතරණී අටුවායෙහි ආනයින් යටත් පිරිසෙයින් මේ උභය ප්‍රාතිමෝක්ෂයෙහිවත් අර්ථ ඉගෙණගත යුතු වන්නේය.

එසේ හෙයින් පසුබැසයන්නා වූ මේ ශාසනය නැවත යථා ස්ථානයෙහි පිහිටුවන්නට සහායවනු කැමැත්තෙන් සියලු විනයාර්ථයන් හකුළුවා කරණ ලද මේ අර්ථ කථාවට සවිස්තර සන්නයක් සම්පාදනය කොට ශාසනාවචර කුලදරුවන්ගේ අත්වලට පමුණුවන්නෙහි නම් සම්භාව්‍ය ශාසන සංග්‍රහයක් වේයයි දකුණු පලාතේ මාදම්පේ ඉඩන්තොට සුවිසුද්ධාරාමාධිවාසී විනයගරුක ආයුෂ්මත් සොමානන්දභිධාන ස්ථවිරයන් විසින් සමාරාධිතවූ මේ උදරතර ශාසනාකෘත්‍යය නිපදවාලීමෙහි උද්‍යෝගවත් වීමු.

තවද මහාවිහාරන්වයෙහි වූ අමරපුර සමාගමේ සිරිසද්ධම්ම වංස මහානිකායාධිපතිව විසූ ඒ මහා ස්ථවිරයන් වූ මාදම්පාගම ලංකාගොඩ කවිකුලශේඛරායමාන සිරිධම්ම වංසපාල පූජ්‍ය පාද ධීරානන්ද මහා ස්ථවිරයන් වහන්සේ විසින් "විනයවිනිශ්චය" නම් ග්‍රන්ථයට ප්‍රණීතතර ව්‍යාඛ්‍යානයක් කරණ ලදී. උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය වූ යථෝක්ත ග්‍රාමයෙහි හුඹුවේවත්තේ සිරිවිසුද්ධ අරියවංසාලංකාර මහානිශ්‍රය කාරකාවයවී "පඤ්ඤසීහ" මහා ස්ථවිරයන් වහන්සේ විසින් "සමන්ත පාසාදිකා" නම් විනයාර්ථ කථාවට සන්නයක් කරණ ලදී. ඒ මහාස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය වූ පූජ්‍යපාද සුගත ශාසනධජ විනයාචාරිය ධම්මාලංකාරාභිධාන මහා නායක ස්ථවිරයන් වහන්සේ විසින් "සීමානයදප්පන" නම් විනය ග්‍රන්තයක් කරණ ලදී.

මෙසේ පූර්වෝක්ත උත්තම ස්ථවිරයන් වහන්සේලා අද්විතිය විනයධර චාතුර්‍යභිහිගය උද්දීප්තියෙන් බැබළුහ. දැනුදු මේ විනයධර පරම්පරාව විනයපර්‍යාප්ති චාතුර්‍යයෙන් හා සංඝපිතෘභාවයෙන්ද අනූනව පවත්නීය. නානාදිශාවන්හි ගණප්‍රධාන මහා නායක ස්ථවිර අනුනායක ස්ථවිරාදීන්ගෙන් යුත් අප සිරිධම්ම වංසනිකායෙහි "සුධර්මා" නම් කාරක සභා තොමෝ චිරාත්කාලයක් මුලුල්ලෙහි නිරුපද්‍රව විරාජමාන වේවායි ආශිංසනය කරමිහ.

රත්මලාණෝ පුෂ්පාරාමාධිපතිව වැඩ විසූ ශ්‍රද්ධාශීලාදී විවිධ ගුණ සමුදයෙහි භාෂිත වූ "විමලතිස්සාභිධාන මහා ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යවූද කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පරිවෙණාධිපති ස්වදේශ විදේශයන්හි ව්‍යාප්ත කීර්ති කදම්බයෙන් අනූනව විසූ ශ්‍රී සුමංගලාභිධාන මහානායක ස්ථවිරයන් වහන්සේගේ ධර්මාන්තෙවාසී වූද මෙහි පහත නම් සඳහන් කරණ මා විසින් බුද්ධශාසන මහා සුරසේනාපති යන රාජ දත්ත නාමොපලක්ෂිත "ඇම්. ධර්මරතන ලක්ෂ්මිණී පහන් කර්තෘභූත" පඬිතුමාගේ වාචනා මාර්ගය ඇසුරු කොට බුරුමරට ආචාර්‍ය්‍ය පරම්පරාවෙහි අර්ථකථනය කරගෙන එන පරිදි නොපිරිහෙලා මේ "සන්දේහඝාතිනී" නම් වූ කංඛාවිතරණී අර්ථව්‍යාඛ්‍යාව සම්පාදනය කරණ ලද්දීය. තවද මේපොතට අර්ථ ලිවීමේ හිදී දික්වැල්ලේ ගුණරතන ස්ථවිර උඩවේ මිරහවත්තේ විමලසාරස්ථවිරාදී අප මිත්‍ර ස්ථවිරයන් වහන්සේලා කීපනමක් ගෙන්ද මීට ආධාර ලැබුන බව ස්තුති පෙරටුව සඳහන් කරමු.

සසුන්වන් කුලදරුවන්ට අභිමතාර්ථ සාධක කල්ප වෘක්ෂයක් හා සදෘශ්‍ය වූ මේ අරුත් වියතන එකවරකට මුද්‍රණය කරවන්නට රුපියල් එක්දහස් පන්සිය (1500) ක් පමණ වියදම් දරණ බව පෙණී ගිය බැවින්ද අර්ථ කියවා ගන්නා වූ භික්ෂූන් විසින් නොපමාව පොත ඉල්වන ලද බැවින් ද මේවරට නිදානුද්දේසය පාරාජිකුද්දේසය සංඝාදිසේසුද්දේසය යන උද්දේසත්‍රයකින් යුක්ත වූ ප්‍රථම භාගය දෙන්ට අදහස් කෙළෙමු. ද්විතියභාගයට අනියතුද්දේශය ආදි කොට ඇති භික්ෂු ප්‍රාතිමෝක්ෂය අර්ථකථාව හා භික්ෂුනී ප්‍රාතිමෝක්ෂය අර්ථකථාවද ඇතුළත් කොට මෙසේ ම මුද්‍රණය කරවන්නෙමු. මේ සම්බන්ධවැ නොමසුරුව මුදල් දීමෙන් ආධාර කළ පුන්‍යකාමී භවතුන්ගේ නාමලේඛණය ස්තුති පූර්වකව මෙහි අගට පළකරවන්නෙමු. ඒ මහතුන් විසින් පින් අනුමෝදන් විය යුත්තේයි.

තවද මෙහි ඌනාධික ලිපිදෝෂාදිය ඇති තැන් දැන මෙසේ ශුද්ධ කටයුතුයැයි. විනයධර සුධීන් විසින් අපවෙත ලියා එවනු ලැබෙත් නම් පරීක්ෂාකොට සුදුසුනම් පිළිගෙන අපේ ශුද්ධි පත්‍රයට ඇතුළත් කර පොත අවසානයේදී දෙන බවද සැළකිය යුතුයි. ශාසනායුෂ්‍යත විනයපර්‍යාප්තියෙහි කෞශල්‍යය පතන්නා වූ ශාසනික කුල පුත්‍රයන් විසින් මේ අරුත් වියතන ඉගෙන විනයධර පදවියට පැමිණිය යුතුයි.

මේ වගට,<br>
රත්මලාණෝ පුෂ්පාරාමධිපති<br>
**විබුද්ධසේනාචාර්‍ය මාදම්පේ ධම්මාධාර ස්ථවිර**<br>
M. Dhammadhara

# සන්දේහඝාතිනී පත්ථාවනා

1. සංවණ්ණිතා මිත ගුණො සනරාමරෙහි
සච්චද්දසො නධිවරො වරභූරි පඤ්ඤෙ
සල්ලොක පීති ජනකො පරමත්ථදතා
සම්මාධුවං ජිනවරං පණාමාමහන්තං

2. සංසාර නීඝ තිමිරං සුවිධංසනක්කං
සප්පඤ්ඤ ජන්තු කුමුදෙ සුවිබුද්ධසොමං
සද්ධම්ම මග්ග මසමං කචිකන්ත ධම්මං
සම්මා සඤ සුවිසඤං පණාමා මහන්තං

3. සද්ධා දයා මති පතී මුනි රාජ යුනු
සංසුද්ධ සීල ධනවා විගතාරි රාසි
සංඝො මනුඤ්ඤ සතිමා සුගමාහි රාමො
සප්පීතිකො නවරතං පණාමා මගන්තං

4. ඉච්චේවම මාසය කරෙහි නමස්සනියං
වත්ථුත්තයං පියතරං අභිවන්දමානො
පුඤ්ඤාභියන්ද මමලං යමහං අලත්ථං
තස්සානුභාව මුපගම්ම හතන්තරායො

5. බුද්ධඝෝෂ මහාථේරො - මහාධීරො ගරුත්තමො
සාසනස්ස හිතත්ථාය - මාතිකට්ඨකථං අකා

6. තායත්ථිකානං විපුලං - ඵලං පස්සං විසුද්ධිදං
පුබ්බාචරිය සීහානං - මතං සම්මාච ලම්බිය

7. ලංබාමණිජ්ජ දීපස්ස - කත්තුගුනස්ස ධීමතො
ධම්මරතන නාමස්ස - නිස්සාය වාචනානයං

8. මාදම්පේති ප්පහිතස්මිං - ගාමස්මිං සුජනාකරෙ
සුවිසුද්ධාරාම නාමෙ - විහාරස්මිං මනොරමෙ

9. සාසනොදයකාමෙන - පිය සබ්‍රහ්මචාරිනා
සොමානන්දභිධානේන - ථේරේන අභියාචිතො

10. විබුද්ධසේනාචරියො - ධම්මාධාරොති විස්සුතො
රාජ දත්තිය නමෝහං - පුප්ඵාරාමාධිවාසිකො

11. කවිකුසදජරානමානන්ද - මාදදං සුවිනිච්ඡයං
සන්දේහඝාතිනිං නාම - ව්‍යාඛ්‍යංලික්ඛාමි මුත්තිදං

12. සාසනෙ කුල පුත්තානං - මුඛාලංකාරසන්නිභා
මොහප්පධංසිනිවායං - නිච්චං පීණයතං මනං

13. සද්ධම්ම වංසික නිකාය පතී සධීරා
නන්දෙ මහා යතිවරො විබුද්ධාච තංසො
සම්බුද්ධ සාසනභවං අභිපත්ථ යන්තො
ව්‍යාඛ්‍යං කරිත්ථ විනයාදි විනිච්ඡයස්ස

14. සියස්සන හස්ස වර සීහුපමෙන පඤ්ඤද
සීහවහයෙන යතිසාමි වරෙන සම්මා
අත්ථාය සංයමිගණස්ස කතා සමන්ත
පාසාදිකාය විනයට්ඨ කථාය ව්‍යාඛ්‍යා

15. තේසං පසත්ථචරිතං ථවිරුත්ත මානං
සුත්වා හමේවචරිතං අනුසික්ඛිතස්ස
සද්ධම්ම වංසික සුධීපි මමුස්සහාය
මොදන්තමා චරියවංස විභූසයන්තා

16. රමේම කලම්බු නගරෙ නගරංග පුණ්ණෙ
ජෝර්ජිති පංචම නරින්ද පසාසනස්මිං
තසේසව දක්ඛිණා දිසායතු රත්මලාණ
ගාමො විහාති බුධසජ්ජන වාසවාසො

17. යොහත්ථසජ්ජනගණෙහි කතම්හි පුජ්ජා
රාමෙපති විමලතිස්ස මහ යතින්දෙ
ගන්ථෙපි තීසු පිටකේසු ලිඛාපයිත්වා
පාලෙසි සාසනවරං ගරුමෙ හවිසො

18. සම්බුද්ධ සාසන සරම්හි සරොරුහංව
යො සෙවතො විවිධසිස්ස මධුබ්බතේහි
විජ්ජොදයාඛ්‍ය පරිවෙණ පතී ගරුමෙ
දේවත්තගො සිරි සුමංගල සංඝසේට්ඨයො

19. පවර ජින ගිරාරවින්ද හංසො
විවිධ දිසාස්වති විස්සුතොරු කිත්ති
විදුර සිරිධරො විභාතු ධම්ම
රතන සම්විග ගරු චිරං හිතාය

20. පුසද්කෙදන්නේන විපුලෙන අනාගතේහං
හෙස්සංති හේතුක බලො විබුද්ධගග්චාරී
මාතා පිතාචරිය පච්චය දයකා මෙ
තෙසඳ නිම්ත්ත පවරා අමහංච ජන්තු

21. ධම්මේන වත්තතු සඳ සනරින්ද ලොකො
සඳණෝන රක්ඛතුප්ජං සපජ්ංච නිච්චං
සීලෙසු හොන්තු යතයො පරිපූරකාරී
දුක්ඛෙන මුසද්චතු පජා නිඛිලා අරොගා

**සිවමත්ථු**

# ලේකම් තුමාගෙන්

සුදුසු කාලයේදී කෙරෙන ධර්ම ශ්‍රවණය මහා මංගල කාරණයක් ලෙසට දේශනා කල බුදු රජාණන් වහන්සේ ධර්මය රත්නයක් පරිදි පෙන්වා දෙමින් එය තෙරුවනින් එකක් ලෙසට ගෙනහැර දැක්වූහ.

බෞද්ධයෙකු යනුවෙන් කෙනෙකු හඳුන්වන්නේ ඔහු රත්නත්‍රය සරණගිය පුද්ගලයකු ලෙස සලකා ගෙනය. බුදුන් වහන්සේගේ චරිතාපදානය අනුගමනය කිරීම මෙන්ම බෞද්ධ ධර්මානුකූලව ජීවිතය සකස්කර ගැනීමට ද බෞද්ධයෙකු කටයුතුකල යුතු බව පැහැදිලිය. මේ නිසා ධර්මය ගැන වර්ණනාත්මකව බුදු රජාණන් වහන්සේ දේශනාකොට වදාල තැන් ත්‍රිපිටක ධර්මයෙහි බොහෝ තැන්වල අඩංගුව ඇත.

මෙසේ වූ ධර්මය ඇසිය යුතුය. එය ප්‍රමාණවත් නොවේ. ඒ අනුව ධාරණය කරගත් ධර්මයකින් බෞද්ධ ආකල්ප ගොඩනගා ගත යුතුය.ඒ අනුව පෞද්ගලික ජීවිතයේ චර්යාධර්ම රටාව සකස්කර ගත යුතුය. ධර්මයෙන් වැඩක් ගන්නා වෙන්නේ එසේ වුවහොත් පමණි.

ධර්මය ගැන විමසා බලන පමණින් ධර්මය ගැන කථාකරණ පමණින් ඒ ගැන පරීක්ෂාකර බලන පමණින් ධර්මය තව තවත් බැබළෙන බවත් ධර්මය වැයී තිබෙන තරමට නොබැබළෙන බවත් බුදුරජාණන් වහන්සේ පෙන්වාදී ඇත.

මේ පදනමෙහි පිහිටා ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ සිටම ධර්මය පදනම් කොට ග්‍රන්ථ කරණයට බට භික්ෂූන් වහන්සේලා හා ගිහි භවතුන් ගැන අපේ බෞද්ධ සාහිත්‍යයේ මෙන්ම බෞද්ධ ඉතිහාසයේද සඳහන් වෙයි.

පෙදෙන් බුදු සිරිත - බසින් වත් සිරිත් ඈ යනුවෙන් සියබස්ලකර කතුවරයා කවියක් ලියුවහොත් එය බුද්ධ චරිතයම මුල් කර ගන්නක් විය යුතුය යනුවෙන් ප්‍රකාශ කොට ඇත. භික්ෂු ප්‍රතිපත්ති ගැන සඳහන් කරන අවස්ථාවකදී සාර්ථක පැවිදි ජීවිතයක් ගත කරන භික්ෂූන් වහන්සේ නමක් විනයධර විය යුතු බවත් ධර්මධර විය යුතු බවත් සඳහන් කර ඇත. භික්ෂු ප්‍රතිපත්ති වලට ධර්මධර වීම අත්‍යවශ්‍ය දෙයක් නම් ධර්මයෙහි ඇති වටිනාකම එමගින්ද පැහැදිලි වේ.

ඈත අතීතයේ ග්‍රන්ථධූර දැරූ භික්ෂූන් වහන්සේලා ගැන නොනෙකුත් සඳහන් වන අපේ සාහිත්‍යයේ උන් වහන්සේලා ලියූ එවැනි පොත්පත් නිසාම අපට සාහිත්‍යයක්ද ඉතිරි වී ඇත. එය නිකම්ම සාහිත්‍යයක් නොව බෞද්ධ සාහිත්‍යයක් වීමද ඉතා වැදගත් කොට සැලකිය යුත්තකි.

එවැනි දහම් පත පොත කාලයාගේ ඇවෑමෙන් විනාශයට පත් වෙමින් පවතී. මේ පිළිබඳව සිත යොමුකල රුවන්ගිරිය වන සෙනසුන් සේනාසනාධිකාරී පූජනීය බුත්තල බුද්ධදත්ත හිමිපාණෝ අභාවයට යමින් පවතින ඉතා දුර්ලභ දහම් පත පොත වසරකට එකක් බැගින් සංරක්ෂණය කොට නැවත ගෞරවණීය මහා සගරුවන අතට පත්කිරීමේ උතුම් අදහස මල්පල ගැන්වීමක් ලෙසට මෙය ඔබ අතට පරිනැමේ. මේ සඳහා උන්වහන්සේගේ ගුරු දේවෝත්තම ශ්‍රී කල්‍යාණියෝගාශ්‍රම සංස්ථාවේ උප සභාපති ධුරීන හා මහෝපාධ්‍යාය අති පූජනීය මාවනගම ගුණානන්ද මාහිමිපාණන් වහන්සේගේ අනුශාසනා හා මග පෙන්වීම පිංදීමෙන් යුතුව සිහිපත් කරමි.

මෙම උතුම් දහම් ග්‍රන්ථය ඔබ අතට පිරිනැමීම සඳහා මූලාමය අනුග්‍රහය ලබාදුන් වඩුමුන්නේ ගෙදර ජේ. ආර්. රංකිරා මුදලාලි මහතා සහ එම මැතිනියද වැඩැර වෛද්‍ය වසන්ත වෙලේමුල්ල මහතාටද මේ පින එකසේම අයිති වේවා.

මේ සඳහා අපට ධෛර්යයවත් කළ බුත්තල බුද්ධදත්ත හිමිපාණන් වහන්සේට නිදුක් නිරෝගී දීර්ඝායු ශ්‍රී සම්පත් පතන අතර උතුම් සම්‍යක් ප්‍රාර්ථනාවන් සඵල වේවායි ප්‍රාර්ථනය කරමි.

මෙම ධර්ම සංග්‍රහය සකස් කිරීමේදී සෝදුපත් බැලීමෙන් සහය වූ කටුපොත සද්ධාශීල ස්වාමින් වහන්සේ, රුවන්ගිරියේ සමතවංශ ස්වාමින් වහන්සේ හා පැවිදි අපේක්ෂක මධුශංක දරුවා යන සැමට අපගේ ප්‍රශංසාව හිමිවිය යුතු අතර උන්වහන්සේලාගේ ප්‍රාර්ථනාවන් සඵල වේවායි ප්‍රාර්ථනය කරමි.

රුවන්ගිරියේ යෝගාශ්‍රමවාසී සියළු සඟ පිරිසටත් සභාපති කේ. එම්. ධර්මරත්න මහතා භාණ්ඩාගාරික ඩබ්. එම්. චිත්‍රරත්න මහතා හා කලට වේලාවට සෝභන අයුරින් හා මහත් සැලකිල්ලෙන් මෙම පොත මුද්‍රණය කරවා දුන් කුරුණෑගල අනුර ප්‍රින්ටර්ස් අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටද මාගේ කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනාව හිමි වේවා.

මෙයට,<br>
රුවන්ගිරියේ භාරකාර මංඩලයේ,<br>
ගරු ලේකම්,<br>
**ජී. එම්. වයි. සී. බංඩාර**

# සන්දේහ ඝාතිනී නම් වූ
# කංඛාවිතරණී සන්නය

## නමොතස්ස භගවතො අරහතො
## සම්මා සම්බුද්ධස්ස

1. බුද්ධං ධම්මංච සංඝංච - විප්පසන්නේනචේතසා
වන්දිත්වා වන්දනාමාන - පූජාසක්කාර භාජනං
2. ථේරවංසප්ප දීපානං - ථිරානං විනයක්කමෙ
පුබ්බා චරිය සීහානං - නමෝ කත්වා කතංජලී
3. පාමොක්ඛං අනවජ්ජානං - ධම්මා නං යංමහෙසිනා
මුඛං මොක්ඛප්ප වේසාය - පාතිමොක්ඛං පකාසිතං
4. සුරතෙන නිවාතෙන - සුචිසල්ලෙඛ වුත්තිනා
විනයාචාරයුත්තේන - සෝණත්ථේරේන යාචිතො
5. තත්ථ සඤ්ජාතකංඛානං - භික්ඛුනං තස්ස වණ්ණනං
කංඛා විතරණත්ථාය - පරිපුණ්ණ විනිච්ඡයං
6. මහා විහාරවාසීනං - වාචනාමග්ග නිස්සිතං
කථයිස්සාමි නාමේන - කංඛා විතරණිං සුභන්ති

සර්ව කුශල ධර්ම ප්‍රමුඛ වූ විපුලෝදාර ගුණ විශේෂ වහ වූ පරම ගම්භීර බුද්ධ ප්‍රඥප්ත විනය මාතෘකා සංඛ්‍යාත ප්‍රාතිමෝක්ෂයාගේ අර්ථ සංවර්ණනාව කරණු කැමති බුද්ධ ඝොෂාචාර්‍ය්‍ය මහා ස්වාමිපාදයෝ පළමු කොට "බුද්ධං ධම්මං" යනාදීන් රත්නත්‍රය ප්‍රණාම කරණයෙන් ස්වකීය චිත්ත සන්තානය පවිත්‍ර කළෝ ඒ එසේමැයි. විශුද්ධ චිත්ත සන්තානොපනිශ්‍රය කොට පවත්නා වූ ප්‍රඥ තොමෝ තීක්ෂණ විශදතරභාවයට පැමිණීමෙන් යථාධිප්‍රේතාර්ථ සංවර්ණනාව කෙළවරට ගෙන යාමෙහි පොහොසත් වන්නීය. වැලිත් රත්නත්‍රය ප්‍රණාමයෙන්

විධූත සර්ව කිල් විෂ ඇති සත්ව සන්තානයෙහි භවාන්තරයෙහි රැස් කරන ලද්ද වූද අන්තරායකර අකුශල කර්මයෝ තුමූ ප්‍රත්‍යයවෛකල්‍යයට පැමිණීමෙන් යථාධිප්‍රේතාර්ථ සංවර්ණනාවට අන්තරාය කිරීමෙහි පොහොසත් නොවෙති යනු ආචාර්යයන්ගේ රත්නත්‍රය ප්‍රණාම කරණයෙහි ආනිසංසය වේ.

("අහං බුද්ධංච ධම්මංච සංඝංච වන්දිත්වා කංඛාවිතරණිං කථයිස්සාමි" යනු මෙහි ක්‍රියාකාරක පද සම්බන්ධයි. මම් බුදුන්ද ධර්මයද සංඝයාද වැඳ කංඛාවිතරණී නම් ප්‍රකරණය කියම් ද යත්?

1. අහං, (බුද්ධ ඝෝෂාචාර්‍ය්‍ය වූ) මම, වන්දනාමාන පූජා සත්කාර භාජනං, ප්‍රණාම කිරීමය බුහුමන් කිරීමය පූජා කිරීමය ගෞරව කිරීමය යන මොවුන්ට ආධාර ස්ථාන වූ (නොහොත්) වැඳීමට ආධාර ස්ථාන වූද බුහුමන් කිරීමට ආධාර ස්ථාන වූද පූජා කිරීමට ආධාර ස්ථාන වූද ගෞරව කිරීමට ආධාර ස්ථාන වූද ("යං වන්දනො පරං තං පච්චේකමභිසම්බජ්ඣතෙ" යනු ශබ්ද ලක්ෂණයි) බුද්ධං; පරෝපදේශ රහිතව චතුරාර්‍ය්‍ය සත්‍ය ප්‍රතිවේධ කළාවූ සර්වඥයන් වහන්සේ, විප්පසන්නේන, විවිධ විචිත්‍ර ගුණානුස්මෘති වශයෙන් විශේෂයෙන් ප්‍රසන්න වූ චේතසා, ත්‍රිවිධ ද්වාරය කරණ කොට ගෙන (වන්දම්, නමස්කාර කෙරෙම්) වන්දිත්වා, නමස්කාර කොට, වන්දනාමාන පූජා සත්කාර භාජනං, ප්‍රණාම කිරීමය බුහුමන් කිරීමය පූජා කිරීමය. ගෞරව කිරීමය යන මොවුන්ට භාජන වූ (යට කී නයින් ප්‍රත්‍යයක සම්බන්ධ කටයුතුයි) ධම්මං, දශප්‍රකාර වූ ශ්‍රී සද්ධර්මය, විප්පසන්නේන, විශේෂයෙන් ප්‍රසන්න වූ චේතසා, ත්‍රිවිධ වාරය කරණ කොට ගෙන (වන්දම්, නමස්කාර කෙරෙම්) වන්දිත්වා, නමස්කාර කොට, වන්දනාමාන පූජා සත්කාර භාජනං, ප්‍රණාම කිරීමය, බුහුමන් කිරීමය, පිදීමය ගෞරව කිරීමය යන මොවුන්ට භාජන වූ, සංඝංච, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සංඝරත්නයද (යට කී නයින් ප්‍රත්‍යයක සම්බන්ධය කටයුතුයි. මේ "වන්දනාමාන පූජා සත්කාර භාජනං" යන වාක්‍යය වෙන් වෙන්ව සම්බන්ධ කොට කළ අර්ථ යෝජනාව වනාහී "ඉදංච විසේසනං පච්චෙකමෙව යොජෙ තබ්බං වන්දනා පෙ භාජනං බුද්ධංච වන්දනා පෙ භාජනං ධම්මංච වන්දනා -පෙ- භාජනං සංඝංච" යන ටීකා පාඨයට අනුව යෙදූහයි දත යුතු, මේ අර්ථ කථනය වනාහී සකලාචාර්‍ය්‍යවරයන්ට ම අභිමත වේ. විකල්පයෙන් කල්‍යාණ පෘථග්ජන සංඝයාද අෂ්ටාර්‍ය්‍ය පුද්ගල පරමාර්ථ සංඝයාද ගන්නේ

යි මේ අර්ථ යෝජනාව වනාහී පොථුජ්ජනික සංඝස්සාපි පුබ්බභාග පටිපදය ඨිතත්තා පුරිම චේතනා විය දනේ. ඒත්ථේව සංඝහො දට්ඨබ්බො" යනාදී ටීකාචාර්‍යවරයන්ගේ මතයට අනුව කරන ලදී) විප්පසන්නේන, විවිධාකාරයෙන් ප්‍රසන්න වූ නොහොත් වෙසෙසින් පහන් වූ, චෙතසා, ත්‍රිවිධ ද්වාරය කරණ කොට ගෙන (වන්දමි, නමස්කාර කරමි) වන්දිත්වා, නමස්කාර කොට, (මේ ක්‍රියා විශේෂණය වනාහි "කථයිස්සාමි" යන පදයෙහි සම්බන්ධ කරනු, මෙසේ රත්නත්‍රය ප්‍රණාමය කොට දැන් තමහට නිශ්‍රයස්ථාන වූ අර්ථකථාචාර්‍යයන්ටද ප්‍රණාමය දක්වනු පිණිස "ථේරවංසප්පදීපානං" යනාදිගය කීහ)

2. ථේරවංසප්පදීපානං, ආයුෂ්මත් මහා කාශ්‍යපාදී පන්සියයක් මහාක්ෂීණාශ්‍රවයන්ගේ අන්වය ප්‍රකාශ කරන්නාවූ (යනුටීකාමතයි) මහාකාශ්‍යපාදී මහා ස්ථවිරයන්ගේ ස්ථවිර වංශයෙහි නගන ලද ප්‍රදීපයන් සෙයින් බබලන්නා වූ (යනු ආචාර්‍ය පරම්පරාගත වචනයි) විනයක්කමෙ, අනේක විධ වූ විනය ක්‍රමයෙහි, ථිරානං, ස්ථිර වූ (නොහොත්) තැන්පත් වූ, පුබ්බාචරිය සීහානං, පූර්වාචාර්‍ය ශ්‍රේෂ්ඨයන්ටද, (මේ වනාහී "නරසීහො" යනාදියෙහි මෙන් සීහශබ්ද තොමේ ශ්‍රේෂ්ඨ පරියාය වශයෙන් ගෙන කියන ලද අර්ථයි) (නොහොත්) චීවරාදී චතුර්විධ ප්‍රත්‍යයන්ගේ ක්ෂයවීම් සංඛ්‍යාත වූ භය ඉවසීමෙන් පොහොසත් වූ පුරාතනාචාර්‍යය වරයන්ටද, ප්‍රතිපක්ෂ වූ ක්ලේශයන් සමුච්ඡේද ප්‍රහාණය කළා වූ පුරාතනාචාර්වරයන්ටද (නොහොත්) පරවාදීන් නැමති චතුෂ්පදිකයන් විසින් විනයනය නොකළ හැකි හෙයින් අභීත කේශර සිංහ රාජයන්ට බඳු වූ පුරාතනාචාර්යවරයන්ටද, කතංජලී, මස්තකයෙහි බඳනා ලද ඇඳිලි ඇත්තේ, නමෝ (නමක්කාරං) නමස්කාරය, කත්වා (කරොමි කරන්නෙමි) කොට (ඇතම් ආචාර්‍යය වරයෝ වනාහී කතඤ්ජලී කත්වා" යි සම්බන්ධ කෙරෙහි ඔවුන්ගේ සම්බන්ධය පුරාණාභිනවටීකාවන්ට නොගැළපේ මෙසේ ආචාර්‍යය ප්‍රණාමය දක්වා සංවර්ණනීය ධර්මයාගේ නාමයද ප්‍රයෝජන පරම්පරාවද දේශකයන් වහන්සේද දක්වනු පිණිස "පාමොක්ඛං" යනාදී ගාථාව කීහ)

3. මහෙසිනා, පූජ්‍ය වූ (නොහොත්) ශීලාදිපඤ්චව ප්‍රකාර ගුණධර්මයන් එශනය ගවේශනය කළා වූ (නොහොත්) උත්තමයන් විසින් සෙවනා ලද්ද වූ (නොහොත්) උත්තමාර්ථදර්ශී වූ ශාස්තෘන්වහන්සේ විසින්, අනවජ්ජානං, නිරවද්‍ය වූ, (නොහොත්) දේෂයන්ට ප්‍රතිපක්ෂ වූ, ධම්මානං, ශීල සමාධි ප්‍රඥ

ධර්මයන්ට, පාමොක්ඛං, ප්‍රමුඛ වූ, (නොහොත්) ප්‍රධාන වූ, මොක්ඛප්පවේසාය, නිවන් පිවිසීම.

විසීම පිණිස, මුඛං, මුඛයකට බඳු වූ (නොහොත්) ද්වාරයකට බඳු වූ, යං (යාදිසං) යම් බඳු ස්වභාවක් ඇත්තා වූ (නොහොත්) යම් බඳු විනය ධර්මයක් වූ, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය, පකාසිතං, ප්‍රකාශ කරන ලද්දේ වේද, (සංවර්ණිතව්‍ය ධර්මයාගේ නාමාදිය දක්වා පරම ගම්භීර වූ ප්‍රාතිමෝක්ෂපාලපර්ථ කථාවගේ දුෂ්කරභාවය ඇති හෙයින් අභියාචකයයි කියන ලද්ද වූ සංවර්ණනා නිමිත්ත දක්වනු කැමතිව ආයුෂ්මත් අර්ථකථාචාර්‍යයෝ "සූරතෙන" යනාදී ගාථාව වාංමුඛ කළෝ)

4. සූරතෙන, යහපත් වූ කාය කර්ම, වචී කර්මයෙහි ඇලුනා වූ, නිවාතෙන යටහත් වූ කාය චිත්ත දෙකක් ඇත්තා වූ (නඛශෘංග වරහිත වූ ඍිච්පාවෙක් මෙන්ද දළ සිඳිනා ලද සර්පයෙක් මෙන්ද හික්මුණා වූ කාය චිත්තද්වය ඇත්තේ යයි කී නිසායි) සුවිසල්ලේඛවුත්තිනා, පවිත්‍ර වූ සැහැල්ලු පැවතුම් ඇත්තා වූ, (ඉන්ද්‍රිය සංවරාදි ත්‍රිවිධ ශීලය ගැනේ) විනයාචාරයුත්තෙන, චාරිත්‍ර වාරිත්‍ර ශීලයෙන් සම්පූර්ණ වූ (කටයුතු යයි පණවා වදාල ආභිසමාචාරික ප්‍රතිපත්ති පූරණය චාරිත්‍ර ශීල නම්) වා, (නොහොත්) විනය ප්‍රතිපත්තීන් සම්පූර්ණ වූ (විනය යනු ප්‍රාතිමෝක්ෂ සංවර ශීලාදි සංවර විනයයි ආචාරය යනු විශුද්ධි මාර්ගගෝකත ආචාර ගෝචර නිර්දද්ශයෙහි ආවා වූ ශ්‍රමණ සාරුප්‍ය වූ හැසිරීමයි) සොණත්ථෙරෙන, සෝණ නම් ඇත්තා වූ ස්ථවිරයන් විසින්, යාචිතො (අභියාචිතො) අභිමුඛයෙහි සිට යාචඤා කරණ ලද්දේ (වා, නොහොත්) අභි මුඛයෙහි සිට යාචඤා කරනු ලැබූ බුද්ධ ඝෝෂ ස්ථවිර නම් වූ මම (කථයිස්සාමි - යන්නෙහි සම්බන්ධයි අභියාචකයයි කියන ලද්ද වූ සංවර්ණනා නිමිත්ත ප්‍රකාශ කොට ඒ සංවර්ණනාව ශ්‍රවණය කිරීමෙහි ශ්‍රොතෘජනයාගේ උත්සාහ දනවීම පිණිස ඒ සංවර්ණනාවගේ ප්‍රයෝජනය කරණ ප්‍රකාරය නිශ්‍රය අභිධානය යන මොවුන් දක්වනු පිණිස "තත්ථ" යනාදී ගාථාද්වය වාඕමුඛකළෝ)

5-6 තත්ථ, ("යංමහෙසිනා පාතිමොක්ඛං පකාසිතං, යිමා විසින් කියන ලද්ද වූ) ඒ ප්‍රාතිමොක්ෂයෙහි, සඤ්ජාත කඞ්ඛාණං, හටගත් සංශය ඇත්තා වූ, භික්ඛූනං, භික්ෂූන්ගේ, කංඛාවිතරණත්ථාය, කාංශාවතරණය පිණිස (නොහොත්)

සැකදුරු වීම පිණිස, පරිපුණ්ණවිනිච්ඡයං, සම්පූර්ණ වූ අර්ථ විනිශ්චය ඇත්තා වූ, මහාවිහාරවාසීනං, අනුරාධපුර මහ වෙහෙර වැසි ත්‍රිපිටක චුල්ල නාගාදී මහතෙරුන්ගේ, වාචනාමග්ගනිස්සිතං, වචන පරම්පරාව ආශ්‍රය කොට පවත්නා වූ, සුභං, අර්ථයෙන් හා ශබ්දයෙන් පරිපූර්ණ හෙයින් සොඟණ වූ, නාමෙන, නම කරණ කොට ගෙන, කංඛාවිතරණී, කංඛාවිතරණී නම් ඇත්තා වූ, තස්සපාතිමොක්ඛස්ස, ඒ ප්‍රාතිමෝක්ෂයාගේ, වණ්ණනං, අර්ථවර්ණනාව, කථයිස්සාමි, කථනය කෙරෙමි (මේ චුල්ල නාග ශබ්දය වනාහි බොහෝ පොත්හි චූලනාගයයි දක්නා ලැබේ, එසේ වුවත් චූල ශබ්දය චූඩා මාණික්‍යයද චුල්ල ශබ්දය ස්වල්පාර්ථයද වාචකවෙයි එහෙයින් මහා නාග, මහා සුමන, ශබ්දදීන් නිසා චුල්ල නාග, චුල්ල සුමන ශබ්දදිය විය යුතු හෙයින් කනිෂ්ට වූ (නොහොත්) බාල වූ නාගස්ථවරයෝය, සුමනස්ථවිරයෝයයි අර්ථ ලැබෙන බැවින් චුල්ල නාග චුල්ල සුමන ශබ්දදියම අනවද්‍ය පාඨයයි හැඟේ. මේ ශබ්දද්වය පර්යාය ශබ්ද ද නොවෙති, එහෙයින් සිංහල භාෂාවට තද්භව වන කල්හි සිළුමිණ සුලුසුමන යනාදීන් තද්භ වවේ මෙහි "වණ්ණයිස්සාමි" යන ක්‍රියාව බොහෝ සේ අටුවා පොත්හි දක්නා ලැබේ. එතකුදු වුවත් මේ පාඨය මෙහි නොයෙදෙයි කුමක් හෙයින් ද යත්? ඒ ඒ අටුවා ටීකාවන්හි "සංවණ්ණයිස්සාමි විනය සංගහං" යනුද "වණ්ණයිස්සාමි විනයසංගහං" යනුද "වණ්ණයිස්සං සමාසෙන අභිධම්මත්ථසංගහං" යනුද පාලහාර්ථ කථාවන්ගේ සංවර්ණණීතවත් කර්මය දරන්නා වූ ස්ථානයෙහිම ඇති හෙයින්ද ශබ්දර්ථය නොයෙදෙන හෙයින්ද සංවර්ණනාභූත වූ අර්ථකථාටීකා සංඛ්‍යාත කර්මය දරන්නා වූ තන්හි "අත්ථං පකාසයිස්සාමි" යනුද "කරිස්සං පන වණ්ණනං" යනුද "විභවෙනෙනා සමාසෙන රචයිස්සාමි වණ්ණනං" යනුද කියන ලදී. ඉදින් වණ්ණධාතු තොමෝ කථනාර්ථයෙහි වන්නේ යයි කියත්නම් හෙදනොයෙදෙයි කුමක් හෙයින යත් "වණ්ණවණ්ණක්‍රියා විජ්ථාරගුණ වචනෙසු" යි ධාත්වාහාර ධාතුමාලා සද්ද නීතිය යනාදියෙහි ආ බැවිනි. වණ්ණධාතු තොමෝ කථනාර්ථයෙහි වන්නේ යයි අභිධාන අනෙකාර්ථ වර්ගාදියෙහි නො ආයේයි එහෙයින් "කථයිස්සාමි" යි යෙදිය යුතුයි ඇතැම් අටුවා පොත්හි "වත්තයිස්සාමි" යන ක්‍රියාවද දක්නා ලැබේ. මේ පදයෙහි වතු ධාතු තොමෝ "වත්තා පවත්තා ධම්මචක්කපවත්තනං, යාවධම්මචක්කපවත්තනා, ධම්මචක්කංපවත්තෙත්වා, පවත්තිතෙ භගවතා

ධම්මචක්කෙ' යනාදී උදහරණයෙහි මෙන් පවත්තනාර්ථයෙහි වැටේ මේ වනාහී ආචාර්ය පරම්පරාගත මතයි පරීක්ෂාකොට යුක්තාර්ථයක්ම ගතයුත්තේයි මාර්ගයෙහි යනු කැමති පුරුෂ තෙමේ මාර්ගයට පිළිපැදීමට පළමුවෙන්ම කටයුතු කෘත්‍යයන් නිමවා ඒ මාර්ගයට පිළිපැදීමක් මෙන් මාර්ගයකට බඳු වූ මේ මාතෘකාවගේ අර්ථවර්ණනාව කටැට්වූ ආචාර්‍ය්‍යයෝ වර්ණනා කටයුතු පදයන්ම වර්ණ නොකොට වචනාදිය දක්වනු පිණිස "තත්ථපාතිමොක්ඛන්ති" යනාදිය කීහ.)

තත්ථ (තස්මිංගාථාපදෙ) ඒ "පාමොක්ඛං අනවජ්ජානං" යනාදී ගාථාපදයෙහි අන්තර්ගත වූ, පාතිමෝක්ඛන්ති පදස්ස, පාතිමොක්ඛං යන පදයාගේ, ප අතිමොක්ඛන්ති අත්ථො, ප අතිමොක්ඛං යන අර්ථය දත යුතුයි, ප අතිමොක්ඛං, ප්‍රභේද වශයෙන් අතිශයින් උතුම් වූ (නොහොත්) ප අතිමොක්ඛන්ති පදච්ඡෙදෙ, ප අතිමොක්ඛංයන පද බිදීම, කාතබ්බෝ, කටයුත්තේයි, අතිපමොක්ඛං, අතිශයින් අනේක ප්‍රකාර වශයෙන් උතුම් වූ, අතිසෙට්ඨං (අති උත්තමං) අතිශයින් උතුම් වූ, ඉති අයං අත්ථො, මේ වනාහි අර්ථයි. (මෙයින් වචනාර්ථය ප්‍රකාශ කළෝ) ඉති (ඉමිනාවචනත්ථෙන) මෙබඳු වූ ශබ්දර්ථයෙන් (නිර්වචනාර්ථයෙන් නොවෙයි යනු භාවයි.) එක විධම්පි, එක් වැදෑරුම් වූයේද, සීලගන්ථභේදතො, ශිලය ග්‍රන්ථය යන ප්‍රභේද වශයෙන්, දුවිධංහොති, දෙවැදෑරුම් වේ, (ඊට සාධක් සඳපකයන් දක්වනු පිණිස "තථාහි" යනාදිය කීහ) තථා (තංවචනං) ඒ වචනය, හි, ඒ එසේ මැයි, පාතිමොක්ඛසංවරසංවුතො විහරතීතිච, පාතිමොක්ඛ සංවර සංවුතො විහරති යනු ද ආදී මේතං මුඛ මේතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛන්තිච. පාදිමෙතං - පෙ- පාතිමොක්ඛං යනුද, ඉති ආදිසු, යන මේආදී පාඨයෙහි (ඉති ශබ්දය ලොප්කරනලද්) කුසලාතිචා ධම්මාති ආදීනි, යනාදී පදයෙහි මෙනි. සීලං, ශීලය, පාතිමොක්ඛන්ති, ප්‍රාතිමෝක්ෂයයි, වුච්චති, කියනු ලැබේ. (සාධක පාඨයාගේ අර්ථය කෙසේද යත්?) පාතිමෝක්ඛසංවර සංවුතො, ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් සංවෘතව හෙවත් ආරක්ෂා කරණලදුව, විහරති, වාසය කෙරේ, ඒතං, ඒ ශීල තෙමේ, කුසලානං ධම්මානං, අනවද්‍ය වූ සමාධි ප්‍රඥ ධර්මයන්ට,ආදි ආදිය වෙයි. ඒතං, මේ ප්‍රාතිමෝක්ෂ තෙමේ, කුසලානංධම්මානං, අනවද්‍ය වූ සමාධි ප්‍රඥධර්මයන්ට,මුඛං ද්වාරයට බඳුවෙයි, ඒතං මේ ප්‍රාතිමෝක්ෂ තෙමේ, කුසලා නං ධම්මා නං, අනවද්‍ය වූ සමාධි ප්‍රඥ

ධම්මියන්ට, පාමොක්ඛං, ප්‍රධානවෙයි. ඉති(තස්මා) එසේ හෙයින්, පාතිමොක්ඛන්ති වුච්චති, පාතිමොක්ඛයයි කියනු ලැබේ. උභයානි ඛොපනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්තිනි ආදීසු, උභයානි -පෙ- හොන්තියනාදියෙහි, ගන්ථො, ග්‍රන්ථප්‍රාතිමෝක්ෂය, පාතිමොක්ඛන්ති වුච්චති, පාතිමොක්ඛයයි කියනු ලැබේ. (ඒ සාධක පාඨයාගේ අර්ථ කවරයත්?) අස්ස, ඒ භික්ඛුනො වාදක ස්ථාවිරයාහට, උභයානිපාති මොක්ඛානි, භික්ඛුපාතිමොක්ඛ භික්ඛුනිපාතිමොක්ඛයෝ තුමූ, විත්ථාරෙන, විස්තාර වශයෙන් (උභතො විභංගය හා සමගය යනු කී නියායි) ස්වාගතානිහොන්ති, මොනවට වාචොද්ගත කරණ ලද්ද හු වෙද්ද, තත්ථ, ඒ ද්විප්‍රකාර ප්‍රාතිමෝක්ෂයන් අතුරෙන්, ශීලං, ශීලප්‍රාතිමෝක්ෂ තෙමේ, යො, යමෙක් තෙමේ, නං, ඒ ශීලය, පාතිරක්ඛති, "රක්ෂා කෙරේද, තං ඒ ශීල ප්‍රාතිමෝක්ෂය රක්ෂා කරන්නා වූ භික්ෂුව, ආපායිකාදීහි, සතර අපායාදියෙහි හටගන්නා වූ, දුක්ඛේහිච, දුක් සමූහයෙන් ද, අත්තානුවාදදීහි, තමාගේ ආත්මයට ගැරහීම් ආදී වූ, භයෙහිච, භයෙනුදු, මොක්ඛති මොචෙති මොචයති, මුදවාද, ඉති (තස්මා) එසේ හෙයින්, පාතිමොක්ඛ නම් වේ, (මේ "පාතිමොක්ඛං" යන පදය පාතිශබ්දය පූර්වකොට ඇත්තා වූ "මොක්ඛ" ධාතු හු කෙරෙන් පරව සිද්ධ වුන ප්‍රත්‍යය අවසන් කොට ඇත්තා වූ කෘදන්තසමාසපදැයි "කුම්භකාරො" යනාදිය මෙනි, සද්ද නීතියෙහි වනාහි සමාස පදයක් නොව තද්ධිත පදයෙකැයි කියන ලද්දේ යයි ප්‍රාතිමෝක්ෂ ගැටපදයෙහි කීහ. ඒවචනයද මතු වක්ෂ්‍යමාන වනු ලබන්නා වූ ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂයාගේ වචනාර්ථ ප්‍රකාශ කරන්නාවූ පාඨය හා යෙදෙයි පරීක්ෂාකොට යුක්තාර්ථයක් ගත යුතුයි) ගන්ථොපන, ගන්ථප්‍රාතිමොක්ෂය වනාහි, තස්සපාති මොක්ඛස්ස, ඒ ශීල ප්‍රාතිමෝක්ෂය, ජොතකත්තා, ද්‍යොතකවන හෙයින් (හෙවත් ප්‍රකාශකරණ හෙයින්) පාති මොක්ඛනති වුච්චති, ප්‍රාතිමෝක්ෂයයි කියනු ලැබේ. ආදිම්හිවුත්තො, ආදියෙහි කියන ලද්ද වූ, වචනත්ථොපන, වචනාර්ථය වනාහි, උභින්නම්පි, ශීලග්‍රන්ථ යන උභය ප්‍රාතිමෝක්ෂයන්ටම, සාධාරණොහොති, සාධාරණ වෙයි. (ඒ ශීල ග්‍රන්ථයන ප්‍රාතිමෝක්ෂ ද්දෙදෙනාහට සාධාරණය යනු ශීලප්‍රාතිමෝක්ෂ තෙමේ සියලු ලොව් ලොව්තුරා සැපතට කාරනා වන හෙයින් උතුම් වෙයි. ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂ තෙමේ ද ශ්‍රේෂ්ඨ ගුණය-හා වෙන් නොවිය යුතු බැවින් සහචරණනයාය වශයෙන් උතුම් වෙයයි කී නියි")

තත්ථ, ඒ දෙවැදෑරුම් ප්‍රාතිමෝක්ෂයන් අතුරෙන්, අයංවණ්ණනා, මේ වක්ෂ්‍යමාන වනු ලබන්නා වූ අර්ථකථා තොමෝ, සීලපාතිමොක්ඛස්සාපි, ශීල ප්‍රාතිමෝක්ෂයට ද, යුජ්ජති, යෙදෙයි, ගන්ථපාති මොක්ඛස්සාපි, ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂයටද, යෙදෙයි ගන්ථෙ, ග්‍රන්ථ තෙමේ, වණ්ණිතෙ, වර්ණනා කළ කල්හි, තස්ස, ඒ ග්‍රන්ථයාගේ අත්ථො, අර්ථය, හි (යස්මා) යම් හෙයකින්, වණ්ණිතොව හොති, වර්ණනා කරන ලද්දේ ම වේද, තස්මා, එහෙයින්, සීලපාතිමොක්ඛස්ස අපි, ශීලප්‍රාතිමෝක්ෂයටද, යුජ්ජති, යෙදෙයි, (මේ වනාහි ස්වරූප ප්‍රභේද දැක්වීමයි) තංපනෙතංගන්ථපාතිමොක්ඛං, ඒ ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂ තෙමේ, (පන. යනු පක්ෂාන්තරාර්ථයි එතං යනු පද පූරණ වාචාශ්ලිෂ්ට මාත්‍රාර්ථයි "සබ්බ නාමද්වයෙ පුබ්බමේව පධානං" යනු නිරුක්ති ශාස්ත්‍රයි) භික්ඛුප්‍රාතිමෝක්ඛං, භික්ෂු ප්‍රාතිමෝක්ෂයද, භික්ඛුනීපාතිමොක්ඛං, භික්ෂුනීප්‍රාතිමෝක්ෂයද, ඉති (ඉමිනාපභෙදෙන) මෙසේ මේ ප්‍රභේදයෙන් දුවිධංහොති, දෙවැරුම් වේ. තත්ථ, ඒ දෙවැදෑරුම් ප්‍රාතිමෝක්ෂයන් අතුරෙන්, සුණාතු මෙ භන්තෙ සංඝොති ආදිකං, සුණාතු මෙ භන්තෙ සංඝො යනාදී වූ, පඤ්චහි උද්දේසපරච්ඡේදේහි, පස්වැදෑර උම් උද්දේස පරිච්ඡේදයන් කරණකොටගෙන, වවත්ථිතං, නියකරන ලද්ද වූ, (පාතිමොක්ඛං) ප්‍රාතිමොක්ෂ තෙමේ (ප්‍රධාන පදය පිණිස තබන ලදී) භික්ඛුපාතිමොක්ඛං, භික්ඛුපාතිමොක්ඛ නම් වේ, සුණාතු මෙ අයෙ‍ය සංඝොති ආදිකං, සුණාතු මේ අයෙ‍ය සංඝොයනාදීවූ, චතුහිඋද්දේසපරිච්ඡේදෙහි, සතර වැදෑරුම් උද්දේස පරිච්ඡේදයන් කරන කොට ගෙන, වවත්ථිතං, නියමකරන ලද්ද වූ (පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂ තෙමේ) භික්ඛුනීපාතිමොක්ඛං, භික්ෂුනී ප්‍රාතිමෝක්ෂය නම්වෙයි. (මෙයින් ග්‍රන්ථ ප්‍රභේද ප්‍රකාශ කෙළේයි) තත්ථ, ඒ දෙවැදෑරුම් ප්‍රාතිමෝක්ෂයන් අතුරෙන්, භික්ඛුපාතිමොක්ඛෙ, භික්ෂුප්‍රාතිමොක්ෂයෙහි, පඤ්ච උද්දේසාම නාම, පස්වැදෑරුම් වූ උද්දේසයෝ වනාහී, නිදනුද්දේසො නිදනෝද්දේදය ද, පාරාජිකුද්දේසො, පාරාජිකොද්දේසයද, සංඝාදිසෙසුද්දේසො, සංඝාදිසෙසො ද්දේසයද, අනියතුද්දේසො, අනියතොද්දේසයද, විත්ථාරුද්දේසො, විත්ථාරොද්දේසයදැයි, ඉති ඉමෙ, මේ පස් ප්‍රකාර උද්දේසයෝයි (මේ උද්දේසවිභාගයයි) තත්ථ, ඒ පඤ්ච ප්‍රකාර උද්දේ සයන් අතුරෙන් නිදනුද්දේසොනාම, නිදනොද්දෙසය (උද්දිට්ඨො - යන්නෙහි සම්බන්ධයි) සුණාතු

මෙහන්තෙ සංඝො - පෙ- තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායසමන්නො නිදනන්ති ආදිනානයෙන, උද්දිට්ඨං පෙ නිදනං, යනාදී ක්‍රමයෙන්, අවසෙසෙ, අවශිෂ්ට වූ උද්දේසයන්, සුතේන, සුත ශබ්දය කරණ කොට ගෙන, සාවිතෙ, අස්වන ලද කල්හි, උද්දිට්ඨයෝහෝති, උදෙසන ලද්දේ වේ. (මේ නිද නොද්දෙස පරිච්ඡේදය දක්වන්නා වූ ස්ථානයෙහි මේ ප්‍රාතිමෝක්ෂයෙහි ආවා වූ නිදන පාළියගේ කෙළවර "උද්දිට්ඨං ඛොආයස්මන්තො නිදනං, යන මේ පාඨය සිංහල බුරුම සියම් යන රට තුනෙහි බොහෝ පොත්හි දක්නා ලැබේ. එතකුදු වුවත් ඒ පාඨය පුරාණ පාඨයක් නොව මෑත භාගයෙහි යම් කිසිවෙකු විසින් අත්හැර මේකංඛාවිතරණීපෙළ ශුද්ධ කරගන්නා ලදී. කුමක් හෙයින් මේ පාඨය පුරාණ පාඨයක් නොවන්නේද යනු අවබෝධ කටයුතුද යත්? "යංපනෙත්ථ නිදනුද්දේස පරිච්ඡෙදං දස්සෙන්තේන සුණාතු මෙ හන්තෙ සංඝො පෙ ඵාසුහෝති ඉධාගතනිද නපාළිං දස්සෙත්වා තදනන්තරං උද්දෙස කාලෙ වත්තබ්බසසාපි උද්දිට්ඨංඛො ආයසමන්තො නිදනන්ති ඉමිස්සපාඨස්ස යෝජනං අකත්වා තත්ථායසමන්තෙ නිදනන්ති ඉමිස්සපාඨස්ස යෝජනං අකත්වා තත්ථායසමන්තෙ පුච්ඡාමිති ආදිනා අනුසාවණාදික මෙවයොපෙත්වා දස්සිතං, යන ටීකා පාඨය දැකීමෙන්ම ඒ පාඨය පුරාණ පාඨයක් නොවන බව හැගේ) පාරාජිකුද්දේසාදීනං, පාරාජිකො ද්දෙසාදීන්ගේ, පරිච්ඡේද, පිරිසිඳීම (නොහොත්) වෙන් වෙන්කොට දැක්වීම, නිදනස්ස, නිදනයාගේ ආදිතොපට්ඨාය මුලපටන්, පාරාජිකාදීනි, පාරාජිකාදීන්, ඔසාපෙත්වා, කෙළවර කොට, යොජේතබ්බා, යෙදිය යුත්තාහුය. විත්ථාරො, විත්ථාරොද්දෙශාදීන්ගේ පිරිසිඳීම නිදනයාගේ මුලපටන් පාරාජිකාදීහු කෙළවර කොට යොදන ලද්දහ. ඒ පාරාජිකාදීහු අවසන් නොකළතාක් පඤ්චවිධ අන්තරායන්ගෙන් යම්කිසි අන්තරායක් ඇතිකල කෙසේ කටයුතු දැයි යන චොදනය සඳහා "අවසේසං සුතේන සාවෙතබ්බන්ති" යනාදිය කීහ එහි අර්ථ) අවසෙසං, සෙස්ස, සුතේන, සුතශබ්දයක කරණ කොට ගෙන, සාවෙතබ්බන්ති වචන තොපන, ඇස් විය යුත්තේ යයි වදළ හෙයින් වනාහි, පාරාජිකුද්දේසාදිසු, පාරාජිකොද්දේසාදීන් අතුරෙන්, යස්මිං, යම් උද්දේශයක්, විප්පකතෙ, අඩාල කළ කල්හි, අන්තරායො උප්පජ්ජති, අන්තරායෙක් උපදී ද, තෙන සද්ධිං, ඒ අවසන් නොකළ උද්දේසය හා සමග, අවසේසං, සෙස්ස, සුතෙන,

සුතශබ්දයකරණ කොටගෙන, සාවෙතබ්බංනාම නත්ථි, ඇස්විය යුත්තක් නම් නැත්තේයි, භික්ඛු නිපාතිමොක්ඛපන, භික්ෂුනීපාතිමෝක්ෂයෙහි වනාහි, අනියතු ද්දේසො, අනියතොද්දේසතෙමේ, පරිහායති, අඩුවේ, සේසං, සෙස්ස, වුත්තනයමේව, කියන ලද ක්‍රම ඇත්තේ මැයි, (මේවනාහිඋද්දේසපරිච්ඡේදය ප්‍රකාශ කිරීමයි. "තස්ස වණ්ණනං වත්තයිස්සාමි" යන ප්‍රතිඥාවට සුදුසු පරිද්දෙන් මාතෘකාර්ථ කථාව රචනාකරනු කැමති බුද්ධඝෝෂාචාරීන් වහන්සේ "එවමෙතෙසං" යනුවෙන් පරිච්ඡේදවත් වූ න්‍යාසටීකා ක්‍රමය හෝ විශේෂ වත් වූ රූප සිද්ධි ක්‍රමය හෝ බුද්දසික්ඛා ටීකාව හෝ යන ප්‍රකරණත්‍රයෙහි ආවාවූ වාක්‍ය රචනාව "සුණාන්තු මෙ" යන තැන් දක්වා කී යේයැයි දත යුතුයි.)

එවං (ඉමිනාවුත්තක්කමේන) මෙසේ කියන ලද ක්‍රමයෙන්, පඤ්චහිවේව, පඤ්චප්‍රකාර වූද, චහිව, සතරප්‍රකාර වූද, උද්දෙස පරිච්ඡේදෙහි, උද්දේස පරිච්ඡේදයන් කරණ කොට ගෙන, වවත්ථිතානං, නියමකරන ලද්ද වූ, එතේසං ද්වින්නං පාතිමොක්ඛානං අපි, මේභික්ෂුභික්ෂුනී ප්‍රාතිමෝක්ෂයන් දෙදෙනාගේද, අයංවණ්ණනා, මේ අර්ථ වර්ණනාතොමෝ, භවිස්සති, වන්නීය, යස්මාපන, යම් හෙයකින් වනාහී, එත්ථ, මේ ද්විප්‍රකාර ප්‍රාතිමෝක්ෂයෙන් අතුරෙන්, භික්ඛුපාතිමොක්ඛං, භික්ෂුප්‍රාතිමෝක්ෂය, පඨමංහොති, පළමුවෙනිවේද, තස්මා, එසේ හෙයින්, තස්ස, ඒ භික්ෂු ප්‍රාතිමෝක්ෂය, තාව, පළමුකොට, වණ්ණ වණ්ණනත්ථම අර්ථ වර්ණනා කරනු පිණිස සුණාතු -පෙ- සුණාතු මෙති, සුණාතු පෙ සුණාතුමෙයන, ඉදංවචනං, මෙවචනය, වුච්චති, කියනු ලැබේ.

සුණාතු මෙති ආදීනං, සුණාතු මේ යනාදි වූ, පදනං, පදයන්ගේ, අත්ථනිච්ඡයං, අර්ථයන්ගේ විනිශ්චය, සිලසම්පන්නා, ශීලයෙන් සම්පූර්ණ වූ, සික්ඛාකාමා, අධිශීල අධි චිත්ත අධි ප්‍රඥ සංඛ්‍යාත ත්‍රිවිධ ශික්ෂාවන් කැමති වූ, භික්ඛවෝ, එම්බා භික්ෂුනි, මෙ, මාගේ (සන්තිකා, සමීපයෙන්) සුණාන්තු අසත්වා, (මේ පාඨයෙන් උයෙකාජනය ප්‍රකාශකළෙයි) හි, ඒ වචනය යෙදේ මැයි, එත්ථ (එතස්මිංගාථාපදෙ) මේ "සුණාතුමෙති" යනාදි ගාථාපදයෙහි ඇතුළත් වූ (නොහොත්) සුණාතු මෙති ආදී ගාථාව කරණ කොට ගෙන, සංඝහිතානං, සංග්‍රහ කරණ ලද්ද වූ, එතෙසංපදනං, මේ සුණාතු මේ යනාදි පදයන්ගේ, අන්තරේ, අතුරෙහි, පවත්තං, හටගත්තා වූ, සුණාතු ති ඉදං, සුණාතු යන මේ පද තෙමේ,

සවණාණත්තිකවචනං, ඇස්වීමෙහි ඇණවන්නා වූ ශබ්දයයි. මෙති (ඉදංපදං) මේ යන පද තෙමේ, යො, යමෙක් තෙමේ, සාවෙති, අස්වාද, තස්ස, ඔහුගේ, අත්තනිද්දේස වචනං, තමා දන්වන්නා වූ ශබ්දයයි. භන්තෙති (ඉදං පදං) භන්තේ යන මේ පදය තෙමේ සගාරව සප්පතිස්ස වචනං, ගෞරව සහිත වූ කීකරු බව සහිත ශබ්දයයි සංඝොති (ඉදංපදං) සංඝො යන මේ පද තෙමේ, පුග්ගල සමූහ වචනං, පුද්ගල සමූහවාචක වූ ශබ්දයයි. හි, විස්තර කරමි. පාතිමොක්ඛුද්දේසං, පාමොක් උදෙසීම, අනුජානන්තේන, අනුදැන වදරන්නා වූ, රාජගහෙ, රජගහ නුවර වැඩවසන්නා වූ, භගවතා, භාග්‍යවත්හු විසින්, වුත්තං, වදරණ ලද්ද වූ, සබ්බ මේව, සියලුම, එතං වචනං, සුණාතු මෙ භන්තෙ සංඝො, යනාදී මේ වචන තෙමේ, පාතිමොක්ඛුද්දේසකෙන, පාමොක් උදෙසන්නාවූ, භික්ඛුනා, භික්ෂුහු විසින්, වත්තබ්බං, කියයුතු වූ, වචනං, වචන තෙමේ, යස්මා (හොති) යම් හෙයකින් වේද, තස්මා, එහෙයින්, යොභික්ඛු, යම් භික්ෂුවක් තෙමේ, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය, උද්දිසති, ප්‍රකාශ කෙරේද, තේන, ඒ භික්ෂුහු විසින්, සංඝත්ථෙරො, සංඝස්ථවිර තෙමේ, සචෙ හොති, ඉදින් වේ නම්, ආවුසෝති, ආවුසොයි, වත්තබ්බං, කියයුතුයි. නවකතරො, බාල භික්ෂුවක් තෙමේ, සචෙහෝති, ඉදින් වේ නම්, පාළියං, ප්‍රාතිමෝක්ෂ පාළියෙහි, ආගතනයේනේව, ආවා වූ ක්‍රමයෙන්ම, භන්තෙති වත්තබ්බං, භන්තෙයි කියයුතුයි. හි, ඒ වචනය යෙදේ මැයි, ථෙරාධෙය්‍යංපාතිමොක්ඛන්ති, ථෙරාධෙය්‍යංපාතිමොක්ඛං යි, වචනතො, ශ්‍රී මුඛයෙන් වදළ හෙයින්, සංඝත්ථෙරෝ, සංඝස්ථවිර තෙමේ හෝ, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය, උද්දිසෙය්‍ය, ප්‍රකාශ කරන්නේය, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂ තෙමේ, ථේරාධෙය්‍යං, මහා ස්ථවිරයන් හා සම්බන්ධයි. අනුජානාමි භික්ඛවෙ යො තත්ථ භික්ඛු බ්‍යත්තෝ පටිබලො තස්සාධෙය්‍යං පාතිමොක්ඛන්ති. අනුජානාමි පෙ පාතිමොක්ඛංයි, වචනතො, වදළ හෙයින්, නවකතරොවා, බාලභික්ෂුවක් හෝ, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය, උද්දිසෙය්‍ය, ප්‍රකාශ කරන්නේයි, භික්ඛවේ, මහණෙනි, තත්ථ, ඒ සංඝ මධ්‍යයෙහි, යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ, වත්තෝහොති, ප්‍රාති මොක්ෂයෙහි දක්ෂ වේද, පටිබලොහොති, ප්‍රාතිමෝක්ෂෝද්දේසයෙහි, පොහොසත් වේද, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය. තස්සාධෙය්‍යං, ඒ භික්ෂුහටම සම්බන්ධ වන්නේ යයි. අනුජානාමි, අවසර දෙමි,

සංඝෝති (ග්‍රම්නාපදෙන) සංඝයා යන මේ පද කරණ කොට ගෙන, අවිසෙසතො, සාමාන්‍ය වශයෙන්, පුග්ගල සමූහො, පුද්ගල සමූහයෙක්, කිඤ්චාපිවුත්තො, ඉදින් දේශනා කරණ ලද්දේ වේද, අථඛො, එසේ දේශනා කළේ නමුදු, සො, ඒ සංඝ තෙමේ, දක්ඛිණෙය්‍ය සංඝෝච, කම්පල අදහා දන්දිය යුතු සංඝයා ද, සම්මුති සංඝොච, සම්මුතියෙන් සංඝ යයි නම් ලත් සංඝයා දැයි ඉති, මෙසේ, දුවිධෝ හෝති ද්විප්‍රකාර වේ. තත්ථ ඒ ද්විප්‍රකාර වූ සංඝය අතුරෙන්, දක්ඛිණෙය්‍ය සංඝොති, දක්ෂිණාව පිදීමට සුදුසු සංඝයා යනු, අට්ඨ අරිය පුග්ගල සමූහො, අටවැදෑරුම් ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සමූහයයි, වුච්චති, කියනු ලැබේ. සම්මුති සංඝො ඉති, සම්මුති සංඝයයි, අවිසෙසෙන, සාමාන්‍ය වශයෙන්, භික්ඛු සමූහොවුච්චති, භික්ෂූන්ගේ සමූහය කියනු ලැබේ. සො, ඒ සම්මුති සංඝයා, ඉධ, මේ ප්‍රාතිමොක්ෂයෙහි, අධිප්පෙතො අදහස් කරන ලදී. සොපන, (එසෝ සම්මුති සංඝො) ඒ සම්මුති සංඝ තෙමේ වනාහි, කම්මවසෙන, විනයකර්‍මයන්ගේ වශයෙන්, පඤ්ච විධංහෝති, පස්වැදෑරුම් වෙයි, චතුවග්ගො චතු වර්ගී සංඝයාද පඤ්ච වග්ගෝ පඤ්ච වර්ගී සංඝයාද දසවග්ගෝ දසවර්ගී සංඝයාද, වීසති වග්ගෝ, වීසති වර්ගී සංඝයාද, අතිරේක වීසතිවග්ගො, අතිරේක වීසති වර්ගී සංඝයා දැයි, ඉති, මෙසේ, පඤ්චවිධෝහෝති, පස්වැදෑරුම් වේ.

තත්ථ, ඒ පඤ්ච ප්‍රකාර වූ වර්ගීයන් අතුරෙන්, චතුවග්ගේන, චතුවර්ගී සංඝයා විසින්, උපසම්පද කම්ම පවාරණ අබ්භානානි ඨපෙත්වා, උපසම්පද කර්මය පවාරණ කර්මය අබ්භානකර්‍මය යන මේ කර්මත්‍රය හැර, සබ්බ සංඝ කම්මං, සියලු සංඝ කර්මය, කාතුංවට්ටති, කරන්නට වටනේයි, පඤ්ච වග්ගේන, පඤ්ච වර්ගී සංඝයා විසින්, මජ්ඣිමේසු, මධ්‍යම ප්‍රදේශයෙහි (නොහොත්) කජංගල සල්ලවති ස්වේත කර්ණික ථූන උසීරධජයන පර්වත ග්‍රාම ගංගා සීමාවන්ගෙන් ඇතුළත් හි වූ ප්‍රදේශයෙහි (මේ ආධාර කාරකය "උපසම්පදකඤ්ච" යන්නෙහිම සම්බන්ධයි ජනපදවාචි ශබ්දයන්ගේ බහුවචනත්වයෙන් "මජ්ඣිමේසු" යි බහුවචනය යොදන ලදී) උපසම්පදකඤ්ච, උපසම්පදකර්මයද, අබ්භානකඤ්ච, අබ්භානකර්‍මයද, ඨපෙත්වා, හැර, සබ්බං සංඝ කම්මං, සියලු සංඝකර්‍මය, කාතුං වට්ටති, කරන්නට වටනේයි, දසවග්ගෙන, දශවර්ගී සංඝයා විසින්, අබ්භාන කම්ම මත්තං ඨපෙත්වා, අබ්භාන කර්මය පමණක් හැර, සබ්බං සංඝ කම්මං, සියළු සංඝ කර්මය, කාතුං වට්ටති, කරන්නට වටනේයි, වීසති වග්ගේන, වීසති

වර්ග සංඝයා විසින්, කිඤ්චි සංඝ කම්මං, කිසි සංඝ කර්මයක්. කාතුං, කරන්නට, නවට්ටති, නොවටනේයි, න, නැත්තේයි, වට්ටති එව, වටනේ මැයි, අතිරේක විස වග්ගේන, විස්සට අධික වූ වර්ග සංඝයා විසින්. තථා එපරිද්දෙන්. වට්ටතිඑව, වටනේ මැයි, සොපන, ඒ අතිරේක විසති වර්ග වනාහි, චතු වග්ගා දිනා සංඝෙන, චතුවර්ගාදී සංඝයා විසින්, කත්තබ්බංකම්මං, කටයුතු විනය කර්මය, ඌනකතරෙන, අඩුවූ වර්ග සංඝයා විසින්, කාතුං න වට්ටති, කරන්නට නොවටනේයි, අතිරේක නේපන, අධික වූ වර්ගයාගේ වසයෙන් වනාහි, කාතුං, කරන්නට, වට්ටතීති දස්සනත්ථං, වටනේ යයි දක්වනු පිණිස, වුත්තෝ, කියන ලදී, ඉමස්මිං නත්ථෙ, මේ අර්ථයෙහි වනාහී, චතු වග්ගං උපාදය, චතුවර්ග සංඝයා පටන්, සබ්බොපි, සියලුම, සම්මුති සංඝො, සම්මුති සංඝ තෙමේ, අධිප්පෙතො, කැමති වන ලදී.

අජ්ජ පොසථොති, අජ්ජ පොසථොයනු වනාහි, අජ්ජ, අද (මේ දවස) උපෝසථදිවසො, පොහෝ දවස වෙයි. එතේන ඒ "අජ්ජ පොසොථො" යන ශබ්දය කරණ කොට ගෙණ, අනුපොසථදිවසං, පොහෝ නොවන්නා වූ දවස, පටික්ඛිපති, ප්‍රතික්ෂේප කෙරෙයි, පණ්ණ රසොති ඉමිනා "පණ්ණරසෝ" යන මේ ශබ්දය කරණ කොට ගෙන, අඤ්ඤං උපොසථ දිවසං, අන්‍ය වූ උපෝසථ දවස, පටික්ඛිපති, ප්‍රතික්ෂේප කෙරේ හි. ඒ වචනයාගේ විස්තර දක්වමි. දිවස වසෙන, දවස්හු ගේ වශයෙන් තයෝ උපොසථා, උපෝසථයෝ තුන් දෙනෙක්, වුත්තා, වදරණ ලද්දහුය. චාතු ද්දසිකො, චාතුද්දසී උපෝසථයද, පණ්ණරසො, පණ්ණරසී උපෝසථය ද, සාමග්ගි උපොසථොති, සාමග්ගි උපෝසථ දැයි (මෙහි වශබ්දය ලුප්ත නිද්දිෂ්ටයි) ඉති. මෙසේ, තයො උපොසථා, උපෝසථයෝ තුන් දෙනෙක්, වුත්තා, වදරණ ලද්දහුය. තත්ථ, ඒ ත්‍රිවිධ උපෝසථයන් අතුරෙන්, හේමන්ත, ගිම්හාන, වස්සානානං, හේමන්තය, ග්‍රීෂ්මය, වස්සානය යන, තිණ්ණං, උතූනං, තුන්සෘතුන්ගේ, තතියසත්තම පක්ඛේසු, තුන්වන සත්වන පක්ෂයෙහි, ද්වේ ද්වේකත්වා, දෙකක් දෙකක් කොට, ඡ උපෝසථා, උපෝසථයෝ සදෙනෙක් තුමූ, චාතුද්ද සිකාහොන්ති, චාතුද්දසිකයෝ වෙති, සෙසාඅට්ඨා රස, අවශේෂ වූ අටළොස් උපොසථයෝ තුමූ, පණ්ණරසිකා හොන්ති, පණ්ණරසී උපෝසථයෝ වෙති, ඒවං, මෙසේ, එකසංවච්ඡරෙ, එක් අවුරුද් දෙක්හි. චතුවි සති උපොසථා හොන්ති, සුවිසි උපෝසථ කෙනෙක් වෙත්, ඉදං මේ කියන ලද්ද වූ පොහො

කිරීම, තාව (පඨමං) පළමු කොට, පකතිචාරිත්තං, ප්‍රකෘති වශයෙන් කරණ ලද්ද වූ චාරිත්‍රයයි.

(මෙසේ කියන ලද්ද වූ උපොසථය ප්‍රකෘති චාරිත්‍රයයි කියත් ප්‍රකෘති චාරිත්‍රයෙන් අන්‍ය වූ ප්‍රත්‍යයක් ඇති කල්හි කටයුතු උපොසථයක් නැත්තේ දැයි යන චොදනය සඳහා "සකිංපක්ඛස්සච, යනාදිය කීහ. "පකතියා තබහුතරාවාසිකාදිපච්චයෙන කත්තබ්බං පකති චාරිත්තං බහුතරා වාසකාදි පච්චයේ පනසති අඤ්ඤදස්මිං චාතුද්දසේපි කාතුං වට්ටති යන ටීකා පාඨයද පකතියා සභාවේන චාරිත්තං. කත්තබ්බං කම්මං හොති තබහුතරාවාසිකාදිනා කාරණෙන කත්තබ්බන්ති අත්ථො, යන විනයාලංකාර ටීකා පාඨයද බැලිය යුතුයි. පුරාතන ආචාර්යවරයෝ චනාහි තාව ශබ්දය "පඨමං" යන අර්ථයෙහි වන්නේයයි කියත් පශ්චාද්භාගයෙහි "එත්ථච පඨමසුත්තස්ස එකෙකස්ස උතුනො තතියසත්තමපක්ඛස්ස චාතුද්දසීචා අවසෙසස්ස පණ්ණරසීචා සකිං පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති පක්තිචාරිත්තවසෙනාපි අත්ථ සම්භවතො, යන ටීකා පාඨය ද බලා "පකතිචාරිතතං යන සාමාන්‍යය නොකියා "තාවපකතිචාරිත්තං යි කීහ මෙයින් අන්‍ය වූ ප්‍රකෘති චාරිත්‍රයක් ඇත්තේ නමුදු එසේ කිය යුත්තේ දැයි යන චෝදනය සඳහා "සකිං යනා දිය කීහ)

පක්ඛස්ස, පක්ෂයාගේ. චාතුද්දසීචා, තුදුස්වන දවස හෝ, පණ්ණරසේවා, පසළොස්වන දවස හෝ, සකිං, එක්වරක්, පාතිමොක්ඛං උද්දිසිතුං, පාමොක් උදෙසීමට, අනුජානාමි, ආඥ කෙරෙමි, ඉතවචන නොපන, මෙසේ වදළ හෙයින් චනාහි, ආගන්තුකෙහි, ආගන්තුක භික්ෂූන් විසින්, නේවාසිකානං, විහාරයෙහි වැසි භික්ෂූන්ගේ (මනි) කැමැත්තට, අනුවත්තිතබ්බං, අනුව පැවතිය යුතුයි, ඉති ආදි වචන හොච, මේ ආදිය වදළ හෙයින් ද, තථාරූපප්පච්චයෙසති. එබඳු ස්වභාව ඇත්තා වූ කාරණයක් ඇති කල්හි, අඤ්ඤදස්මිං, අන්‍ය වූ, චාතුද්දසෙ අපි, චාතුද්දසී දිනයෙහිද, උපෝසථං කාතුං වට්ටති, පොහොය කරන්නට වටනේයි. (ආදි ශබ්දයෙන් "ආවාසිකෙහි ආගන්තුකානං අනුවත්ති තබ්බං යන පාළියද "අනුජානාමි භික්ඛවෙ තෙහිභික්ඛුහි ද්වේතයො උපොසථෙ චාතුද්දසිකෙ කාතුං කථං මයා තෙහිභික්ඛුහි පඨමතරංචා කරෙය්‍යාම යන පාළියද ගත යුතුයි. මෙහි අභිප්‍රාය

විස්තරාර්ථීන් විසින් කංඛාවිතරණී ටීකා විනයාලංකාර ටීකා සාරාර්ථ දීපනී ටීකාදියෙන් දත යුතුයි. පුරිම වස්සංවුත්ථානංපන, පෙරවස් පැවැරූ භික්ෂූන්ට වනාහි, පුබ්බකත්තික පුණ්ණමාවා, පූර්වකාර්තික පෞර්ණමිය හෝ (නොහොත්) වප්මස පුරපසළොස්වක් පොහොය හෝ, තෙසංයේව, ඒ පෙරවස් පැවැරූ භික්ෂූන්ගේම, භණ්ඩනකාරකෙහි, කලහකාරක භික්ෂූන් විසින්, උපද්දුතා, හිංසා කරන ලද්ද හු, පවාරණං, වස් පවාරණ කිරීම, සවෙපච්චුක්කඩ්ඪන්ති, ඉදින් ඉදිරියට අදනාහු ද, අථ, මෙසේ ඇති කල්හි වනාහි, පුබ්බකත්තිකාමාසස්ස, වප් මස් හුගේ, කාලපක්ඛ චාතුද්ද සොවා, අවතුදුස් වක් දවස හෝ, පච්ඡිම කත්තික පුණ්ණමා වා, ඉල්මස පුර පසළොස්වක දවස හෝ පවාරණ දිවසො හොති, වස් පවාරණය කරණ දවස වෙයි, ඉති (ඉමෙතයො) මේ තුන් වැදෑරුම් වූ, පවාරණ දිවසාපි හොන්ති, වස් පවාරණය කරණ දවස්හුවෙත්, ඉදං අපි, මේ කියන ලද්ද වූ චාරිත්‍රයද, පකතිචාරිත්තං එව, ප්‍රකෘති චාරිත්‍රය මැයි, තථා රූපප්පච්චයෙපනසති, එබඳු ස්වභාව ඇත්තා වූ කාරණයක් ඇති කල්හි වනාහි, ද්වින්නං, දෙවදෑරුම් වූ, කත්තිකපුණ්ණමානං, වප් හිල් මස් පෞර්ණමින්ගේ .පුරිමෙසු, පූර්ව වූ, චාතුද්දසෙසු අපි, තුදුස්වක් දවස් හිද, පවාරණං කාතුං වට්ටති. පවාරණය කරන්නට වටනේයි, යදපන, යම් කලෙක වනාහි, කොසම්බක්ඛන්ධකෙ, කොසම්බක්ඛන්ධයෙහි, ආගතනයෙන, ආවා වූ ක්‍රමයෙන්, සංඝො, සංඝයා, භින්නෙ, වෙනස් වූ කල, (භෙවත් භේදවූ කල්හි) තස්මිං භික්ඛුස්මිං, ඒ උක්ඛිත්තක භික්ෂුව, ඔසාරිතෙ, නැවත සංඝයාට ඇතුළත් කළ කල්හි, සංඝො, සංඝ තෙමේ, තස්සවත්ථුස්ස, ඒ අධිකරණය, වූ පසමාය, ව්‍යපසමනය පිණිස, සංඝ සාමග්ගිංකරොති, සංඝසාමග්‍රිය කෙරේද, තද, එ කල්හි (සාමග්ගි උපොසථ දිවසොනාමහොති යන්නෙහි සම්බන්ධයි) තාවදෙව දවස්හිම, උපොසථොකාතබ්බො, පොහොය කටයුත්තේයි.

පාතිමොක්ඛං උද්දිසිතබ්බං, පාමොක් උදෙසිය යුත්තේ යයි, ඉතිවචනතො, මෙසේ වදළ හෙයින්, චාතුද්දස පණ්ණරසෙ, චාතුද්දසීපණ්ණරසී උපොසථ දිනයන්, ඨපෙත්වා, හැර, අඤ්ඤේපි, අන්‍ය වූද, යොකොචිදිවසො, යම්කිසි දවසක්, සාමග්ගි උපොසථොනාමහොති, සාමාග්‍රි පොහෝ දවස නම් වෙයි. පුරිම වස්සං වුත්ථානංපන, පෙරවස් පැවරූ භික්ෂූන්ට වනාහි, කත්තිකමාසබ්භන්තරෙ. වප්මස අවපක්ෂය ඉල්මස පුර පක්ෂය යන

දෙදෙනාගේ අබ්භන්තරයෙහි, අයමෙව, මේ විසිනව දවස ඇතුළෙහි එක එක දවසක්ම, සාමග්ගිපවාරණා දිවසො නාමහොති, සාමාග්‍රිපවාරණා දවස නම් වෙයි. ඉති (ඉමෙසුතිසුදිවසෙසු) මේ තුන් වැදෑරුම් දවස් අතුරෙන්, පණ්ණරසොති ඉමිනා, පණ්ණරසො යන මේ පදය කරණ කොට ගෙන, අඤ්ඤං උපොසථ දිවසං, අන්‍ය වූ පොහෝ දවස, යස්මා යම් හෙයකින්, පටික්ඛිපති, පිළිකෙව් කෙරේද,, තස්මා, එසේ හෙයින්, අප්පු පොසථොති වචනෙන, අප්පුපොසථො යන ශබ්දය කරණ කොට ගෙන යථායං (යොඅයං අනුපොසථ දිවසො) යම් පොහෝ නොවන දවසක්, පටික්ඛිත්තො, පිළිකෙව් කරණ ලද්දේ වේද, තස්මිං, ඒ පොහෝ නොවන දවස්හි, උපොසථො නකාතබ්බොයෙව, පොහොය නොකටයුත්තේ මැයි, අඤ්ඤො පොහෝ නොවන දවසින් අන්‍ය වූ, යොපන අයං උපොසථ දිවසො අත්ථි, යම් පොහෝ දවසක් ඇත්තේ වේද, තස්මිං, එදවස්හි, උපොසථොකාතබ්බො, පොහොය කටයුත්තේයි. කරොන්තෙනපන, පොහොය කරන්නා වූ භික්ෂුහු විසින් වනාහි, චාතුද්දසිකො, චාතුද්දිසි උපොසථයක්, තෙමේ, සචෙහොති, ඉදින් වේනම්, අප්පු පොසථො චාතුද්දසොති, අප්පු පොසථො චාතුද්දසො යි, වත්තබ්බං, කිය යුතුයි. පණ්ණරසිකො, පණ්ණරසී උපොසථයක් තෙමේ, සචෙහොති, ඉදින් වේ නම්, අප්පුපොසථො පණ්ණරසොති, අප්පු පෝසථො පණ්ණරසො යි වත්තබ්බං, කිය යුතුයි. සාමග්ගි උපොසථො, සාමග්ගි උපොසථයක් තෙමේ, සචෙහොති, ඉදින් වේ නම්, අප්පු පොසථොසාමග්ගිති, අප්පු පොසථොසාමග්ගි යී, වත්තබ්බං, කිය යුත්තේයි.

යදි සංඝස්ස පත්ත කල්ලන්ති (එත්ථ) යදිසංඝස්ස පත්තකල්ලං ය නමේ වාක්‍යයෙහි, ඉමස්ස උපොසථ කම්මස්ස, මේ උපොසථකර්මයට, පත්තො, සුදුසු වූ, කාලො, කාලය තෙමේ, අත්ථි, ඇත්තේ වේද, ඉති, (තස්මා) එසේ හෙයින්, පත්තකාලං, පත්තකාල නම් වේ, පත්තකාලං එව, පත්තකාලයම, පත්තකල්ලං, පත්තකල්ල නම්වේ. (පත්තකල්ලං යන තන්හි ණ්‍ය ප්‍රත්‍යය තෙමේ ස්වාර්ථයෙහි වේ) තංඑතං, ඒ පත්තකල්ලය, ඉධ, මෙතන්හි, චතුහි අඞ්ගේහි, සතර අංගයකින්, සංගහිතං, සංග්‍රහ කරන ලදී. අට්ඨ කථාචරියා, අටුවා ඇජරෝ තුමූ, යථාහු (මේ අර්ථයෙහි) කෙසේ කිවාහුද යත්,

**උපොසථො යාවතිකාච භික්ඛු**

**කම්මප්පත්තා සභාගාපත්තියොච**

**නවිජ්ජන්ති වජ්ජනියාච පුග්ගලා**

**තස්මිං නහොන්ති පත්ත කල්ලන්ති වුච්චති**

උපොසථො, පොහෝ දවසකුත් වේද, යාවතිකා, යම් පමණ වූ, භික්ඛුව, භික්ෂුහුද, කම්මප්පත්තා, උපොසථකර්මයට සුදුසු වූවාහුද, සභාගාපත්තියොච, වස්තු ස්වභාව සදෘශ්‍ය වූ ඇවැත් අවන් භික්ෂුහුද, නවිජ්ජන්ති, නැත්තාහුද, වජ්ජනියා, අත් පසින් බැහැර කටයුතු වූ, පුග්ගලාච, එක් විසි පුද්ගලයෝද, තස්මිං, ඒ සංඝසන්නිපාතයෙහි, නහොන්ති, නැත්තාහුද (එතානිචත්තාරි, මේ සතර කාරණායෝ) පත්තකල්ලන්ති, පත්තකල්ල යයි, වුච්චති, කියනු ලැබේ යනු කීහු.

තත්ථ, (තිස්සංගාථායං) ඒ ගාථාවෙහි, උපොසථො ඉති, උපොසථො යනු, තිසු උපොසථ දිවසෙසු, තුන්වැදෑරුම් උපොසථ දිනයන් අතුරෙන්, අඤ්ඤතර උපොසථ දිවසො, එක්තරා අනියමිත පොහෝ දිනයෙකි. හි, ඒ එසේ මැයි, තස්මිංසති, ඒ පොහෝ දින ඇති කල්හි, සංඝස්ස, සංඝයාගේ, ඉදං උපොසථ කම්මං, මේ පොහෝකර්මය, පත්තකල්ලං නාමහොති, යෝග්‍ය කල් ඇත්තේ නම්වේ. අසති, පොහෝ දින නැති කල්හි, න, පත්තකල්ල නම් නොවේ., යථාහ, භාග්‍යවතුන් වහන්සේ මේ කාරණාය කෙසේ වදාල සේක්ද යත්, න භික්ඛවෙ අනුපොසථෙ උපොසථො කාතබ්බො යො කරෙය්‍ය ආපත්ති දුක්කට ස්සාති, නභික්ඛවේ  පෙ  දුක්කටස්ස යි, ආහ, වදාල සේක. (උදාහරණ පාඨයෙහි අර්ථ) භික්ඛවෙ, මහණෙනි, අනුපොසථෙ, පොහෝ නොවන දවස්හි, උපොසථො, පොහොය, නකාතබ්බො, නොකටයුත්තේයි, යො, යම් මහණෙක් තෙමේ, කරෙය්‍ය, පොහෝ නොවන දවස පොහොය කළේ වී නම්, සො, ඒ මහණතෙමේ, දුක්කටාපත්ති (ආපජ්ජනං) දුකුළා ඇවතට පැමිණීම, අස්ස (හොති) වෙයි, යාවතිකාච භික්ඛු කම්මප්පත්තා ඉති, යාවතිකාච භික්ඛුකම්මප්පත්තා යනු වනාහි, යත්තකා, යම් පමණ වූ, භික්ඛු, භික්ෂුහුතුමු, තස්ස උපොසථ කම්මස්ස, ඒ උපොසථ කර්මයට, පත්තා යුත්තා අනුරූපා, සුදුසු වූවාහුද, සබ්බන්තිමෙන පරිච්ඡෙද දෙන, සියල්ලට යටත් පිරිසෙයින් පිරිසිඳීම් වශයෙන්, චත්තාරො, සතර

දෙනෙක්, පකතත්තා භික්ඛූ, පකතත්ත භික්ෂූහු හොන්ති, වෙද්ද, සංඝේන, සංඝයා විසින්, අනුක්ඛිත්තා, අනුක්ඛිත්තක භික්ෂුහුය (පකතත්ත භික්ෂුය යනු උක්ඛිත්තක භික්ෂුය පාරාජිකා පත්තියට පැමිණි භික්ෂුය යන මේ දෙදෙන හැර, යන මේ දෙදෙන හැර අවසේස සියලු භික්ෂූහු පකතත්ත භික්ෂුහු නම් වෙති) තේ ච, ඒ පකතත්ත භික්ෂුහුද වනාහි හත්ථ පාසං අවිජහිත්වා, අත්පස නොහැර, එකසීමායං, එක් සීමාවෙක්හි, ඨිතා, සිටියාහු, කම්මස්ස අනුරූපා, කර්මයට යෝග්‍ය වූවාහු වෙත් (විභාගවත් වූ ධර්මයාගේ ස්වභාව විභාවන කිරීම විභාගයෙන් තොරව නොවිය යුතු හෙයින් විභාගය ප්‍රකාශ කරණු කැමති අර්ථකථාචාරීන් වහන්සේ "සීමාවනාමෙසා" යනාදිය කියේයි.

ඒසා සීමාවනාම, මේ සීමාව නම් වනාහි, බද්ධ සීමා, බද්ධ සීමාය, අබද්ධ සීමා .අබද්ධසීමායයි, ඉති (ඉමිනාපෙහෙදෙන) මේ ප්‍රභේදය කරණ කොට ගෙන, දුවිධාහොති, ද්විප්‍රකාරවන්නීය, තත්ථ ඒ ද්විප්‍රකාර සීමාවන් අතුරෙන්, ඒකා දස විපත්ති සීමායෝ එකොළොස් වැදෑරුම් වූ වරද සීමාවන්, අතික්කමිත්වා, ඉක්මවා, තිවිධ සම්පත්ති යුත්තා, ත්‍රිවිධ සමපත්තියෙන් යුක්ත වූ, නිමිත්තෙන, නිමිත්ත හා සමග, නිමිත්තං සම්බන්ධිත්වා, නිමිත්ත සම්බන්ධ කොට, සම්මතා සීමා, සම්මත කරණ ලද්ද වූ සීමා තොමෝ, බද්ධ සීමා නාම, බද්ධ සීමා නම් වෙයි. (ඒ සීමාව විස්තර කරණු කැමති අර්ථකථාචාරීන් වහන්සේ "අතිඛුද්දක" යනාදිය කීයේයි) හි, ඒ වචනය විස්තර කරමි. අතිඛුද්දකා, ඉතා කුඩා වූ සීමාව, අතිමහති, ඉතාමහත් වූ සීමාව, ඛණ්ඩ නිමිත්තා, කඩනිමිති සීමාව. (නොහොත්) නිමිත්ත කැඩී ගිය සීමාව, ඡායා නිමිත්තා, පර්වත වෘක්ෂාදීන්ගේ සෙවන නිමිතිකොට සම්මත කළා වූ සීමාව, අනිමිත්තා, නිමිති රහිත සීමාව, බහිසීමෙඨිතසම්මතා, සීමාවෙන් පිටත් හිඳිට ගෙණ සම්මත කළා වූ සීමාව, නදියා, ගංගාවෙහි, සම්මතා සම්මත කරණ ලද්ද වූ සීමාව, සමුද්දේ සමුද්‍රයෙහි, සම්මතා, සම්මත කරන ලද සීමාව, ජාතස්සරෙ, ස්වයං ජාත විල්හි, සම්මතා, සම්මත කරන ලද්ද වූ සීමාව සීමාය, තමාගේ සීමාවහා, සීමං සම්භින්ධන්තේන, අනුන්ගේ සීමාව සම්බන්ධ කිරීමෙන්, සම්මතා. සම්මත කරණ ලද්ද වූ සීමාව, සීමාය, තමාගේ සීමාවෙන්, සීමං, අනුන්ගේ සීමාව අජ්ඣෝත්ථරන්තේන, වතුරු වීම කරණ කොට ගෙන, සම්මතා, සම්මත කරණ ලද්ද වූ සීමායයි, ඉති, මේ දශ ප්‍රකාර වූ සීමාවෝ තුමූ, (විපත්ති සීමායො- යන්නෙහි සම්බන්ධයි මේ

කංඛාවිතරණී අර්ථ කථාවට අර්ථ කියන්නා වූ ඇතැම් ආචාර්යපවරයෝ වනාහි "ඉමාහි" යන්නෙහි හි ශබ්දය විස්තරාර්ථයෙහි නිපාතයයි නොසිතා හි විභක්තියයි සිතා "ඉමා" යන්නද "ඉමෙ" යනු යයි සකස් කොට "ඉමෙහි එකාදස හි ආකාරෙහි" යන පාළිය හා සම්බන්ධ කොට අර්ථ කියත් මැයි. ඒ අරුත් කීම වනාහී "ඉමා පෙ සම්බන්ධො" යන ටීකාව හා නොගැලපෙයි. ස්වභාව යුක්තියද නොයෙදෙයි ඒ ආචාරීන්ගේ මතිමාත්‍රයකි) එකා දස හි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්තීති, එකාදසහි පෙ විපජ්ජන්තියි, වචනතො, වදාළ හෙයින්, එතා විපත්ති සීමා යො නාම, මේ විපත්ති සීමා නොහොත් වරද සීමාවෝ නම් වෙත් (ඒ පාළියෙහි අර්ථ කෙසේද යත්) එකාදසහි ආකාරෙහි, එකොළොස් ආකාරයකින්, සීමතො, සීමා හේතුවෙන්, කම්මානි, විනය කර්මයෝ තුමූ, විපජ්ජන්ති, වෙසෙසින් වරදිත්, (එහි අභිප්‍රාය එකොළොස් කාරණයකින් සීමාව වරදී ඒ වරද සීමාව හේතු කොටගෙන එහි කරන ලද්ද වූ විනය කර්මයද වරදින්නේ මැයි) තත්ථ. ඒ එකොළොස් වැදැරුම්වර ද සීමාවන් අතුරෙන්, අති ඛුද්දකා නාම, ඉතා කුඩා වූ සීමාව නම්, යම් සීමාවෙක්හි, ඒක විසති භික්ඛූ, ඒක් විසි භික්ෂූහු, පරිමණ්ඩලාකාරේන, පිරිමඬුලු ආකාරයෙන් නිසීදිතුං, හිඳිනට, න සක්කොන්ති, පොහොසත් නොවෙත්ද, සා සීමා තොමෝ අති ඛුද්දක නාම, ඉතා කුඩා සීමා නම් වේ. අති මහති නාම, ඉතා මහත් සීමා නම්, අන්තමසො, යටත් පිරිසෙයින්, යා, යම් සීමාවක්, කෙසග්ගමත්තේන අපි, කෙසගක් පමණකිනුදු, තියෝජනං, තුන් යොදුනක්, අතික්කමිත්වා, ඉක්මවා, සම්මතා, සම්මත කරණ ලද්දී වේද, සා, ඒ සීමා තොමෝ, අති මහතී නාම, ඉතා මහත් සීමා නම්වේ. ඛණ්ඩ නිමිත්තා නාම, කඩ නිමිති ඇති සීමා නම් අඝටිත නිමිත්තා සම්බන්ධ නොකරණ ලද නිමිත ඇති සීමා යයි, වුච්චති, කියනු ලැබේ. (ඒ අඝටිත නිමිති ඇති සීමාව ව්‍යතිරේක වශයෙන් ප්‍රකාශ කරනු පිණිස "පුරත්ථිමාය දිසාය" යනාදිය කීහ) පුරත්ථිමාය දිසාය, පැදුන් දිග, නිමිත්තං කිත්තෙත්වා, නිමිත්ත කීර්තනය කොට (නොහොත්) නිමිත්ත අස්වා, අනුක්ක මෙන එව, ක්‍රමයෙන්ම, දක්ඛිණාය, දකුණු දිග, නිමිත්තං කිත්තෙත්වා, නිමිත්ත අස්වා, පච්ඡිමාය, පශ්චිම දිග, නිමිත්තං කිත්තෙත්වා, නිමිත්ත අස්වා, පුන, නැවත, පුරත්ථිමාය දිසාය, පූර්ව දිග, පුබ්බ කිත්තිතං, පළමු කොට අස්වන ලද්ද වූ නමිත්ත, පටිකිත්තෙත්වා, නැවත වරක් අස්වා, ඨපෙතුං වට්ටති, තබන්නට වටනේයි

ඒවං, මෙසේ (නිමිති ඇස්වීම ඇති කල්හි) අඛණ්ඩ නිමිත්තා හොති, කඩ නිමිති ඇති සීමා නම් නොවෙයි, සචෙපන, ඉදින් වනාහි, අනුක්කමෙන, ක්‍රමයෙන්, ආහරිත්වා, නිමිත්ත කිර්තනය එළවා, උත්තරාය දිසාය, උතුරු දිග, නිමිත්තං කිත්තෙත්වා, නිමිත්ත අස්වා, ඨත්වා එව, ඒ උතුරු දිග, ඨපෙති, තබාද, ඛණ්ඩ නිමිත්තා නාම හොති, ඛණ්ඩ නිමිත්ත සීමා නම් වේ. අපරා අපි, අන්‍ය වද, ඛණ්ඩ නිමිත්තා නාම, ඛණ්ඩ නිමිත්ත සීමා නම්, යා, යම් සීමාවක් තොමෝ, අනිමිත්තු පගං, නිමිත්තට නුසුදුසු වූ, තචසාරරුක්ඛංවා, තල් පොල් ආදි වූ ත්වචසාර වෘක්ෂයක් හෝ, ඛණුකංවා, කණුමුලක් හෝ, නොහොත් වෘක්ෂයක් සඳහන් මුලක් හෝ, පංසු පුඤ්ජ වාලුක, පුඤ්ජානං, පස්ගොඩවැලිගොඩ යන මොවුන් අතුරෙන්, අඤ්ඤතරංවා, යම්කිසි එකක් හෝ (ඇතම් පොත්හි පංසුපුඤ්ජංවා වාලුකා පුඤ්ජංවා යනු දක්නා ලැබේ) අන්තරා, අතුරෙහි, එකංනිමිත්තං කත්වා, එකක් නිමිති කොට, සම්මතා, සම්මත කරණ ලද්දී ද, සා, ඒ සීමා තොමෝ, ඛණ්ඩ නිමිත්තා නාම, කඩ නිමිති සීමා නම් වේ. ඡායා නිමිත්තානාම, ඡායා නිමිත්ත සීමා නම්, පබ්බතච්ඡායාදිනං, පර්වත ඡායාදීන් අතුරෙන්, යංකිඤ්චිඡායං, යම්කිසි ඡායාවක්, නිමිත්තංකත්වා, නිමිති කොට, සම්මතා, සම්මත කරන ලද්ද වූ සීමාවයි. අනිමිත්තා නාම, නිමිති රහිත සීමා නම්, සබ්බෙන සබ්බං, සර්ව ප්‍රකාරයෙන්, නිමිත්තානි, නිමිත්තයන්, අකිත්තෙත්වා, නොඅස්වා, සම්මතා, සම්මත කරණ ලද සීමායි. බහිසීමෙඨිත සම්මතා නාම, සීමාවෙන් පිටත් හි සිටගෙන සම්මත කරණ ලද්ද වූ සීමානම්, නිමිත්තානි, නිමිත්තයන්, කිත්තෙත්වා, අස්වා, නිමිත්තානං, නිමිත්තයන්ගේ, බහිඨිතේන, පිටත් හි සිටියහු විසින්, සම්මතා, සම්මත කරන ලද සීමාවයි නදියා, ගංගාවෙහි ද, සමුද්දේ, සමුද්‍රයෙහිද, ජාතස්සරෙ, ස්වයංජාත විලෙහි ද, සම්මතා නාම, සම්මත කරන ලද සීමා නම් වනාහි, එතේසු නදී ආදීසු, ඒ ගංගාදියෙහි සම්මත කරන ලද සීමායි. හි, ඒ වචනය යෙදේ මැයි, සා, ඒ සීමා තොමෝ සම්මතා පි, සම්මත කරන ලද්දී නමුදු භික්ඛවෙ, මහණෙනි, සබ්බා නදී, සියලු ගංගා තොමෝ, අසීමා, සීමා නම් නොවන්නිය. සබ්බෝ සමුද්දේ සියලු සමුද්‍ර තෙමේ අසීමා, සීමානම් නොවේ. සබ්බෝ ජාතස්සරො, සියලු ස්වයංජාතවිල, අසීමො, සීමානම් නොවෙයි, ඉති වචන තො, මෙසේ වදළ හෙයින්, අසම්මතා එව හොති. සම්මත කරන ලද්දීම නොවෙයි. සීමාය, සීමාවහා,

සීමං, සීමාව, සමභින්දන්තේන, සම්බන්ධ කිරීම් වශයෙන්, සම්මතා සම්මත කරන ලද්ද වූ සීමායි හි, ඒ වචනය විස්තර කෙරෙමි, පොරාණකස්ස විහාරස්ස, පුරාණ විහාරයාගේ, පුරත්ථිමාය දිසාය, පැදුම් දිග, අම්බොචේව, අඹරුකෙක්ද, ජඹුව, දඹරුකෙක් ද, ඉති, මෙසේ, ද්වේරුක්ඛා, වෘක්ෂයෝ දෙදෙනෙක් තුමූ, අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්, සංසට්ඨවිටපා, පැටලී ගිය වෙලෙප් ඇත්තා හු, සචේ හොන්ති, ඉදින් වෙද්ද, තෙසු, ඒ වෘක්ෂයන් දෙදෙනා අතුරෙන්, අම්බස්ස, අඹරුකට, පච්ඡිම දිසා භාගෙ, පශ්චිම දිශා භාගයෙහි, ජම්බු, දඹරුකෙක් ඇත්තේද, විහාර සීමාව, විහාර සීමා නොමෝ ද, ජම්බුං, දඹරුක, අන්තෝකත්වා, ඇතුළත් කොට, අම්බංකිත්තෙන්වා, අඹරුක අස්වා, බද්ධා හොති, බඳනා ලද්දී වේද, අථපච්ඡා, ඊට පසු භාගයෙහි, තස්ස විහාරස්ස, ඒ වෙහෙරට, පුරත්ථිම දිසාය, පැදුම් දිග, විහාරකෙතෙ, වෙහෙරක් කළ කල්හි, සීමා සම්බන්ධනා සීමාව බඳින්නා වූ, භික්ඛූ, භික්ෂුහු තුමූ, තං අම්බං, ඒ අඹරුක, අන්තෙකත්වා, ඇතුළත් කොට, ජම්බුං කිතෙත්වා, දඹරුක අස්වා, බන්ධති, බඩා හොති, බඳනා ලද්දී වේද, අථපච්ඡා, ඊට පසු භාගයෙහි, තස්ස විහාරස්ස, ඒ වෙහෙරට පුරත්ථිම දිසාය, පැදුම් දිග, විහාරෙකතෙ, වෙහෙරක් කල කල්හි, සීමං බන්ධන්තා, සීමාව බඳින්නා වූ, භික්ඛූ, භික්ෂුහු තුමූ, තං අම්බං, ඒ අඹරුක, අන්තෙකත්වා, ඇතුළත් කොට, ජම්බුංකිත්තෙත්වා, දඹරුක අස්වාබන්ධති, බඳිද්ද, සීමාය, සීමාවහා, සීමං, සීමාව, සමභින්නාහොති, සම්බන්ධ කරන ලද්දී වෙයි. සීමාය, සීමාව කරණ කොටගෙන, සීමං, සීමාව, අජ්ඣෝත්ථරන්තේන, වැතිර වීම කරණ කොට ගෙන, සම්මතා නාම, සම්මත කරණ ලද සීමා නම් වේ. අත්තනොසීමාය, තමාගේ සීමාවෙන්, පරෙසං සීමං, මෙරමාගේ සීමාව, අජ්ඣෝත්ථරන්තේන, වැතිර වීම කරණ කොටගෙණ, සම්මතා, සම්මත කරණ ලද්ද වූ සීමායි, හි, ඒ එසේමැයි, සචෙ, ඉදින්, පරෙසං, මෙර මාගේ, බද්ධ සීමං, බද්ධ සීමාව, සකලංවා, සියල්ල හෝ, තස්සා, ඒ බද්ධ සීමාවගේ, පදෙසංවා, එක් පෙදෙසක් හෝ, අනෙතා කත්වා, ඇතුළත් කොට, අත්තනොසීමං, තමාගේ සීමාව, සම්මන්නති, සම්මත කෙරේද', සීමාය, සීමාව කරණ කොටගෙන, සීමං, සීමාව, අජ්ඣෝත්ථරිතානාම හොති, වතුරුවන ලද්දී නම් වෙයි. (සමභින්දනය හා අජ්ඣෝත්ථරණයාගේ වෙශේෂ කවර යත්? යම් පමණ ප්‍රදේශයෙක් හි භික්ෂූන් සතර නමකට සිටගෙණ සංඝ කර්මයක් නොකට හැකිවේද එපමණ ප්‍රදේශයක්

ඇතුල් කොට සම්මත කරණ ලද්ද වූ සීමා තොමෝ, සම්භින්දන සීමා නම් ඉන් අධික වූ ප්‍රදේශයෙක්හි පස් නමක් හෝ සනමක් හෝ සත් නමක් හෝ ආදි වශයෙන් සිටගෙණ සංඝකර්මකට හැකිවූ අනුන්ගේ සීමාවෙන් එපමණ පෙදෙසක් ඇතුළත් කොට බඳින ලද්ද වූ සීමා තොමෝ අජ්ඣෝත්ථරණ සීමා නම් මේ මෙහි වෙනසී) ඉති, මෙසේ, ඉමා එකාදසවිපත්ති සීමායො, මේ එකොළොස්වැදෑරුම් වර ද සීමාවන්, අතික්කමිත්වා, ඉක්මවා, සම්මතා, සම්මත කරණ ලද සීමා තොමෝ, බද්ධ සීමා නාම, බද්ධ සීමා නම් වේ, (යට පාඨය මෙහි අධ්‍යාහාර කොට අර්ථ යෝජනා කටයුතුයි මෙසේ එකොළොස් විපත්ති සීමාවන් දක්වා ත්‍රිවිධ සීමා සම්පත්තීන් දක්වනු පිණිස. තිවිධ සම්පත්ති යුත්තාය" නාදිය කීහ. තිවිධ සම්පත්ති යුත්තං ඉති, තිවිධ සම්පත්ති යුත්තා යනු නිමිත්ත සම්පත්තියා, නිමිත්ත සමපත්තියෙන්ද නොහොත් නිමිති හුගේ සම්පූර්ණත්වයෙන් ද පරිසසම්පත්තියා, පිරිස්හුගේ සම්පූර්ණත්වයෙන්ද, කම්ම වාචා සම්පත්තියාච, කර්මවාක්‍යයාගේ සම්පූර්ණත්වයෙන්ද, යුත්තා, යුක්ත වූ සීමාවයි. තත්ථ, ඒ ත්‍රිවිධ සම්පත්තීන් , අතුරෙන්, නිමිත්ත සම්පත්ති යුත්තා නාම, නිමිත්ත සම්පත්තියෙන් යුක්ත වූ සීමා නම් වනාහී, පබ්බත නිමිත්තං, පර්වත නිමිත්තය, පාසාණ නිමිත්තං, පහන් නිමිත්තය, වනනිමිත්තං, ආරණ්‍ය නිමිත්තය, රුක්ඛ නිමිත්තං, වෘක්ෂ නිමිත්තය, මග්ග නිමිත්තං, මාර්ග නිමිත්තය, වම්මික නිමිත්තං, තුඹස් නිමිත්තය, නදී නිමිත්තං, ගංගා නිමිත්තය, උදක නිමිත්තං ඉති, උදක නිමිත්තයයි, ඒවං, මෙසේ, වුත්තේ, වදරණ ලද්ද වූ, අට්ඨසු නිමිත්තෙසු, අෂ්ට ප්‍රකාර නිමිති අතුරෙන් තස්මිං තස්මිං දිසාභාගෙ, ඒ ඒ දිශාභාගයෙහි, යථාලද්ධානි යම් යම් පරිද්දෙකින් ලබන ලද්ද වූ (නොහොත්) ලැබුනු පරිද්දෙකින්, නිමිත්තු පගානි, නිමිත්තයන්ට සුදුසු වූ, නිමිත්තානි, නිමිති හු, (කිත්තෙත්වා යන්නගා සම්බන්ධයි) පුරත්ථිමාය දිසාය, පූර්ව දිශාවෙහි, කිංනිමිත්තං, කවර නිමිත්තක්ද (නොහොත් නිමිත්ත කවරක්ද) භන්තෙ, ස්වාමින්වහන්ස , පබ්බතො, පර්වතයයි, එසෝ පබ්බතො, මේ පර්වත තෙමේ, නිමිත්තං ඉති, නිමිත්ත නම් වෙයි, ඉති ආදිනානයෙන, මේ ආදී ක්‍රමයෙන්, සම්මා කිත්තෙත්වා, මොනවට අස්වා, සම්මතා, සම්මත කරණ ලද්ද වූ සීමායි තත්‍ර (තෙසු අට්ඨසු නිමිත්තේසු) ඒ අෂ්ට ප්‍රකාර නිමිත්තයන් අතුරෙන්, ඒවං මෙසේ, සංඛෙපතො, සැකෙවින්, නිමිත්තුපගා, නිමිත්තයන්ට සුදුසු පර්වතාදීහු,

වේදිතබ්බා, දතයුත්තාහුය, හි, කෙසේ දත යුත්තා හුද යත්, සුද්ධපංසු, හුදු පස් පර්වතය, සුද්ධපාසාණ, හුදු පහන් පර්වතය , උභයමිස්සකවසෙන, පස්පහන් දෙකින් මිශ්‍ර වූ පර්වතය යන මොවුන්ගේ වශයෙන්, තිවිධො අපි, තුන් වැදෑරුම් වූද, පබ්බතො, පර්වත තෙමේ, හත්ථිප්පමාණතොපට්ඨාය, ඇතෙකුගේ ප්‍රමාණය පටන්, උඩං, මත්තට ඉක්මවා සිටියේ, නිමිත්තුපගො, නිමිත්තට සුදුසු පර්වතය වෙයි. තතො, ඒ හස්ති ප්‍රමාණයෙන්, ඔම කතරො, අතිශයින් කුඩා වූ, (නොහොත්) මිටි වූ පර්වත තෙමේ නවට්ටති, නොවටනේයි, පාසාණ නිමිත්තෙ, පහන් නිමිත්තෙහි, අයගුළං අපි යගුලද, පාසාණ සංඛං එව, පහන් සංඛ්‍යාවටම, ගච්ඡති, යම් හෙයකින් යේද, තස්මා, එසේ හෙයින්, යො කෝචි පාසාණො යම්කිසි අනියමිත පහණක් තෙමේ, උක්කංසවසෙන, උත්කෘෂ්ට වශයෙන්, හත්ථිප්පමාණතො, ඇතෙකුගේ ප්‍රමාණයෙන්, ඔමකතරං ආදිං කත්වා, කුඩා වූ පහණ පටන් ගෙණ, හෙට්ඨිම පරිච්ඡෙදෙන, යටත් පිරිසෙයින්, ද්වත්තිංසපල ගුළ පිණ්ඩ පරිමාණො, දෙතිස් පලමකින් යුත් හකුරු පිඩක් පමණ වූ පහණද (එකලවඡවගාර වූ සකුරු මුලක් මෙහි උදාහරණ කෙළේයි) නිමිත්තුපගො, නිමිත්තට යෝග්‍ය වෙයි, තතො, ඒ දෙතිස්පලම් සකුරු පිඩෙන්, ඛුද්දකතරො, කුඩා වූ පහණක් තෙමේ, න, නිමිත්තට නොවටනේයි, පිට්ඨිපාසාණොපන, ගල් තලාව වනාහි, අති මහන්තෝ අපි, අතිශයින් මහත් වුයේද වට්ටති, පහන් නිමිත්තට වටනේයි, වන නිමිත්තේ, ආරණ්‍ය නිමිත්තයෙහි, අන්තොසාරෙහිවා, අතුළ හර ඇත්තා වූ හෝ, අන්තෝසාරමිස්සකෙහිවා, ඇතුළ හර ඇත්තා වූ වෘක්ෂයන්ගෙන් මිශ්‍ර වූ හෝ රුක්ඛෙහි, වෘක්ෂයන් කරණ කොට ගෙන, චතුපඤ්චරුක්ඛ මත්තං අපි, සතර පස් රුකක් පමණ ඇත්තා වූද, වනං, ආරණ්‍යය, නිමිත්තුපගං, නිමිත්තටයෝග්‍යවෙයි, තතො ඌනකතරං, එයින් අඩුවූ වනය, නවට්ටති, නිමිත්තට නොවටනේයි (මෙහි භාවය වෘක්ෂයන් සතරක් ඇත්තා වූ වනයක් වී නම් එයින් වෘක්ෂයන් තුන් දෙනෙක් හර ඇත්තා වූ වෘක්ෂයෝ වෙද්ද එක් වෘක්ෂයක් හර නැත්තා වූ වෘක්ෂයක් වේද ඒ වනය ගත යුතුයි. වෘක්ෂයන් පසක් ඇත්තා වූ වනයක් වී නම් ඔවුන් අතුරෙන් වෘක්ෂයෝ තුන් දෙනෙක් හර ඇත්තෝ වෙද්ද වෘක්ෂයෝ දෙදෙනෙක් හර නැත්තෝ වෙද්ද එබඳු වනයද ගත යුතුයි. හර ඇත්තා වූ වෘක්ෂයන් අධික වූ කල්හිම ගත යුත්තේය. වජිරබුද්ධි ටීකායෙහි ද මේ ක්‍රමය මෙසේම දක්වන ලදී. විනයාලංකාර

ටීකායෙහි චනාහි "චතුපඤ්චරුක්ඛමත්තම්පි සාර රුක්ඛෙසන්ධාය වුත්තං යනු කියන ලදී වජිර බුද්ධ ටීකායෙහි කී නයින් නොගත යුතු යයි "වජිරබුද්ධයංපන, යනාදීන් ගැහී වශයෙන් කීහ. එතකුදු වුවත් කංඛාවිතරණී ටීකාචාර්ය වරයෝ වජිර බුද්ධි ටීකාවට අනුව අර්ථ වර්ණනා කළහ. කුමක් හෙයින් යත්? මේ අටුවායෙහිම දඅන්තෝසාරේහිවා අනෙනාසාරමිස්සකෙහිවා රුක්ඛේහි චතුපඤ්චරුක්ඛමත්තම්පි වනං නිමිත්තුපගං, යනු ආගෙයිනැයි දත යුතු) ජීවන්තෝයෙව, පිවත් වන්නා වූම, අන්තෝසාරො, ඇතුළහර ඇත්තා වූ, භූමියංපතිට්ඨිතො, බිම පිහිටයා වූ, රුක්ඛො, වෘක්ෂ තෙමේ, අන්තමසො, යටත් පිරිසෙයින්, උබ්බෙධතො, උසින්, අට්ඨංගුලො, අටගුල් පමණ වූද, පරිණාහතො, මහතින්, සූචිදණ්ඩප්පමාණො අපි, සිංහල පන්හින් කඳක් පමණ වූද (සිංහල පන්ගිත් කඳය යනු යුලැඟිලි පමණ මහත් වූ පන්ගිත් කඳය යනු ගාවයි) නිමිත්තුපගො, නිමිත්තට යෝග්‍ය වෙයි. නතො, ඒ සිංගල පන්ගිත් කඳට වඩා, ඔමකතරො, කුඩා වූ වෘක්ෂය, නවට්ටති, නොවටනේයි, මග්ගො, මාර්ග නිමිත්ත තෙමේ, ජංඝමග්ගෝවා, පාදමාර්ගයක් හෝ, හොතු වේවා, සකටමග්ගෝවා, ගැල්මාර්ගයක් හෝ, වේවා, යො, යම්මාර්ගයක් තෙමේ, ද්වේතිණ්ගාමක්ඛෙත්තානි, දෙතුන් ග්‍රාම ක්ෂේත්‍ර කෙනෙකුන් විනිවිදගෙණ, ගච්ජති, යේද, තාදිසො, දෙතුන් ග්‍රාම ක්ෂේත්‍ර කෙනෙකුන් විනිවිජ්ඣිත්වා විනිවිද ගෙණ යන්නා වූ ස්වභාව ඇති ඒ මාර්ග තෙමේ, ජංඝසත්ථ, කත් වෙලඳ සමූහයා විසින් හෝ, සකටසත්ථෙහි, ගැල් වෙලඳ සමූහයා විසින් හෝ වළඤ්ජියාමානොයේව, පරිභෝග කරන ලද්දේම නිමිත්තපගො නිමිත්තට යෝග්‍ය වේ. අවලඤ්ජෝ, කත් වෙලඳුන් විසින් හෝ ගැල්වෙලඳුන් විසින් හෝ පරිභෝග නොකරන ලද්දේ නම්, නවට්ටති, නොවටනේයි වම්මිකේපන, තුඹස් නිමිත්තෙහි වනාහි, හෙට්ඨිම පරිච්ඡෙදෙන, යටත් පිරිසෙයින්, තංදිවසං, එදවස්හි, ජාතො, හටගත්තාවූ, (නොහොත්) වේයන් විසින් බඳින ලද්ද වූ, අට්ඨංගුලුබ්බෙධො, අටගුල් පමණ උස්වූද, ගොවිසාණ මත්තෝපි, ගෙරිහගක් පමණක් වූද, වම්මිකෝ, තුඹස් තෙමේ, නිමිත්තුපගො, නිමිත්තට සුදුසු වේ, තතො, ඒ අටගුල් තුඹසින්, ඔමකතරො, අඩු ප්‍රමාණ ඇත්තේ නම්, න වට්ටති, නිමිත්තට නොවටනේයි. අබද්ධසීමා ලක්ඛණෙන, අබද්ධ සීමාවගේ ලක්ෂණය කරණ කොටගෙණ, යංනදිං, යම්ගංගාවක්, වක්ඛාමි, මතු කියන්නෙම් ද, සා, ඒ

ගංගාහොමෝ, නිම්නූපගා, නිම්නයට යෝග්‍ය වන්නීය, අඤ්ඤං, අන්‍යගංගාවක් හොමෝ, නපවත්තති, නිම්නයට නොවටනේයි යං උදකං, යම්ජලයක් හෙමේ, අසන්දමානං, නොබස්නාලබනුයේ, ආවාට පොක්ඛරණී තළාක ජාතස්සර ලෝණි සමුද්ද දීසු, වලය පොකුණය විලය සයංඤ්ජාතවිලය කලපුය යනාදී හන්හි, ඨිතං, සිටියාවූ, තං, ඒ ජලය, ආදිකත්වා, මුල් කොට ගෙණ, අන්තමසො, යටත් පිරිසෙයින්, තංබණං එව, එකෙණෙහිම, පඨවියං, පෘථිවියෙහි, ඛණිතෙ, කණින ලද්ද වූ, ආවාටකෙ, කුඩා වලෙහි, ඝටෙහි, කළවලින්, ආහරිත්වා, ගෙණවුත්, පූරිතං අපි, පුරවන ලද්ද වූ ජලය ද, යාවකම්මවාචාපාරියොසානා, කර්ම වාක්‍යයාගේ කෙළවර දක්වා, සණ්ඨානකං, සිටිනු ලබනුයේ, නිම්නූපගං, නිම්නයට යෝග්‍ය වේ. ඉතරං, මේ ජලයෙන් අන්‍ය වූ, සන්දමානංවා, බස්නා වූ ජලයක් හෝ වුත්ත පරිච්ඡේද කාලං, යට කියන ලද පිරිසිඳිනා ලද කාලයක් මුලුල්ලෙහි (නොහොත් කර්ම වාක්‍යාවසානය දක්වා) අතිට්ඨන්තංවා, නොසිටිනා වූ ජලය හෝ, භාජනගතංවා, භාජනයෙහි වත්කළා වූ ජලය හෝ, නපවත්තති, නිම්නයට නොවටනේයි, ඉති, මෙසේ. නිම්නූපගාදයො, නිම්නයට යෝග්‍ය වූ පර්වතා දිහු, වෙදිතබ්බා, දත යුත්තාහුය. (මෙසේ නිමිත්ත සම්පත්තිය දක්වා තදනන්තරව පරිසසම්පත්තිය දක්වනු පිණිස "පරිසසම්පත්තියා යුත්තා නාම, යනාදිය කීහ.)

පරිසසම්පත්තියා යුත්තා නාම, පරිසසම්පත්තියෙන් සම්පූර්ණ වීම වනාහී, සබ්බන්ති මේන පරිච්ඡේදෙන, සියල්ලට යටත් පිරිසෙයින්, චතූහි භික්ඛූහි, භික්ෂූන් සතර නමක් විසින්, සන්නිපතිත්වා, රැස්ව, තස්මිංගාමක්ඛෙත්තේ, ඒ ග්‍රාම ක්ෂේත්‍රයෙහි, බද්ධ සීමංවා, බද්ධසීමාවකට හෝ, නදී සමුද්දජාතස්සරානිවා, ගංගා සමුදු ස්වංඤ්ජාත විලකට හෝ, අනුක්කමිත්වා, නොබැස, ඨිතා, සිටියාහු ද, තෙ සබ්බෙ භික්ඛූ, ඒ සියලු භික්ෂූන්, හත්ථපාසෙවාකත්වා, අත්පසෙහි හෝ කොට, ඡන්දංවා, ඡන්දය හෝ, ආහරිත්වා, ගෙනවුත් සම්මතා, සම්මත කරණ ලද්ද වූ සීමායි.

කම්මවාචා සම්පත්ති යුත්තා නාම, කර්ම වාක්‍ය සම්පත්තියෙන් යුක්තවීම නම්, වනාහී, සුණාතු මෙ භන්තෙ සංඝො යාවතාසමන්තා නිමිත්තා කිත්තිතා ඉති, සුණාතු මෙ පෙ කිත්තිතායග, ආදිනා නයෙන, මේ ආදී ක්‍රමයෙන්,

වුත්තා, වදරණ ලද්ද වූ, පරිසුද්ධාය, හාත්පසින් පවිත්‍ර වූ, ඤත්ති දුතියක ම්මවාචාය, ඤත්තිය (දැන්වීම්) දෙවෙනි කොට ඇත්තා වූ කර්ම වාක්‍ය කරණ කොට ගෙන, සම්මතා, සම්මත කරණ ලද්ද වූ සීමායි එවං (ඉමිනාවුත්තනයේන) මේ කියන ලද්ද වූ ක්‍රමයෙන්, එකාදස විපත්ති සීමායො, එකොළොස් වැදෑරුම් වරද සීමාවන්, අතික්කමිත්වා, ඉක්මවා, තිවිධ සම්පත්ති යුත්තා, තුන්වැදෑරුම් සම්පූර්ණත්වයකින් යුක්ත වූ, නිමිත්තේන, නිමිත්ත හා, නිමිත්තං, නිමිත්ත, සම්බන්ධිත්වා, ගළපා, සම්මතා, සම්මත කරන ලද සීමාව, බද්ධ සීමා ඉති, බද්ධ සීමා යයි, වෙදිතබ්බා, දතයුත්තිය ඛණ්ඩ සීමා, ඛණ්ඩ සීමාය, සමාන සංවාස සීමා, සමාන සංවාස සීමාය, අවිප්පවාස සීමාය යනුද,, තස්සායෙව, ඒ බද්ධ සීමාවගේම, පභෙදෙ, ප්‍රභේදයයි (බද්ධ සීමාවගේ ප්‍රභේදය දක්වා අබද්ධ සීමාව දක්වන්නාවූ අර්ථකථාචාර්‍ය්‍යයෝ "අබද්ධසීමාපන" යනාදිය කිග)

අබද්ධසීමාපන, අබද්ධසීමාව වනාහි, ගාමසීමා ගාමසීමාය, සත්තබ්භන්තර සීමා, සත්තබ්භන්තර සීමාය, උදකුක්ඛෙපසීමා ඉති, උදකුක්ඛෙපසීමා යයි, ඉති, මෙසේ, තිවිධා, තුන් වැදෑරුම් වන්නිය, තත්ථ, ඒ තුන් වැදෑරුම් සීමාවන් අතුරෙන්, යාවතා, යම් පමණ වූ, එකංගාමක්ඛෙත්තං, එක් ග්‍රාම ක්ෂේත්‍රයක් ඇත්තේ වේද, අයං, මේ ග්‍රාම ක්ෂේත්‍රය, ගාමසීමානාම, ගාමසීමානම් වන්නීය. අගාමකෙ, ග්‍රාමසීමාවන්ගෙන් වෙන් නොකරනලද්ද වූ නොහොත් ගම්නොවන්නාවූ, අරඤ්ඤෙ, ආරණ්‍යයෙහි, සමන්තා හාත්පසින්, සත්තබ්භන්තරො, අබ්භන්තරයෝ සත් දෙනෙක් තුමූ, සත්තබ්භන්තර සීමානාම, සත්තබ්භන්තර සීමානම් වන්නිය, තත්ථ, ඒ වචනයෙහි, අගාමකං, ගම්නොවන්නා වූ, අරඤ්ඤං නාම, අරණ්‍යය නම්, විඤ්ඣාටවී ආදිසුවා, වින්ධ්‍යාදී වූ වනයෙහි හෝ, මච්ඡබන්ධානං, මස් අල්වන්නවුන්ගේ, අගමනපථෙ, ගොස් නැවත නොඑන්නා වූ, මාර්ගයෙහි, සමුද්ද මජ්ඣෙවා, මුහුදු මැද හෝ, පවත්තේසු හට ගත්තා වූ, දීපකෙසුවා, දූපත්වල හෝ, ලබ්භති, ලබයි, සමන්තා සත්තබ්භන්තරා ඉති, සමන්තාසත්තබ්භන්තරා යනුවනාහි මජ්ඣෙඨිතානං, මැද සිටියා වූ, භික්ඛූනං, භික්ෂූන්ගේ, ඨිතොකාසතො, සිටි අවකාශයෙන්, සබ්බ දිසාසු, සියලු දිසා භාගයෙහි, සත්තබ්භන්තරා, අබ්භන්තරයෝ සත් සත් දෙනෙක් වෙති, විනිබ්බෙධෙන, විනි විදීම් වශයෙන්, චුද්දස හොන්ති, තුදුස් අබ්භන්තර කෙනෙක් වෙති. තත්ථ, ඒ වචනයෙහි, ඒකං අබ්භන්තරං, එක් අබ්භන්තරයක් තෙමේ,

අද්ධියඩ්ඪසතිගත්ථප්පමාණං හොති, අටවිසි රියනක් පමණ වෙයි. අයසඳුව සීමා, මේ සීමා තොමෝද, පරිසවසෙන භික්ෂූන්ගේ පිරිස් වශයෙන්, වඩ්ඪති, යම් හෙයකින් වැඩේද, තස්මා, එහෙයින්, සමන්තා. හාත්පසින් පරිසපරියන්ත තොපට්ඨාය, භික්ෂූන්ගේ පිරිස් කෙළවර සිටි භික්ෂුවගේ පටන්, අබ්භන්තර පරිච්ජෙද, අබ්භන්තරයාගේ වෙන්කිරීම, කාතබ්බො, කටයුතුයි. සචෙපන, ඉදින් වනාහි, ද්වෙසංඝා, සඟ පිරිස් දෙදෙනෙක්, විසුං විසුං, වෙනවෙනම, උපෝසථංකරොන්ති, පොහොය කෙරෙද්ද, ද්වින්නං, ඒ භික්ෂු පිරිස් දෙදෙනාගේ, සත්තබ්භන්තරානං, සත්තබ්භන්තරයන්ගේ අන්තරේ, අඤ්ඤං, අන්‍ය වූ එකං සත්තබ්භන්තරං, එක්සත්තබ්භන්තරයක්, උපචාරත්ථාය, උපචාර පිණිස, ඨපෙතබ්බං, තැබිය යුතුයි. සබ්බාභික්ඛවෙ නදී අසීමා ඉති, සබ්බා පෙ "අසීමා" යන ආදිනානයෙන, ආදී ක්‍රමයෙන්, නදී ආදිනං, ගඟාදීන්ගේ, සීමාභාවං, බද්ධසීමාබව පටික්ඛිපිත්වා, පිළිකෙව් කොට, පුන, නැවත භික්ඛවේ, මහණෙනි, නදියාවා, ගංගාවෙහි හෝ සමුද්දේවා, සමුද්‍රයෙහි හෝ, ජාතස්සරේවා, ස්වයං ජාත විලෙහි හෝ යං, යම් ස්ථානයක් මජ්ඣිමස්ස පුරිසස්ස මැදුම් බලැති පුරුෂයෙකුගේ, සමන්තා, හාත්පසින්, උදකුක්ඛෙපා, උදකොත්ක්ෂෙපය කරණ කොට ගෙන (කරණ කාරකයෙහි පංචමී විභක්තියි) අයං, මේ උදකොත්ක්ෂෙපයෙන් වෙන් කරන ලද්ද වූ සීමා තොමෝ, තත්ථ, ඒ ගංගා සමුද්‍ර ස්වයංජාතවිල යන තුන් තන්හි (නොහොත් ත්‍රිවිධ ස්ථානයන් අතුරෙන්) සමාන සංවාසා, සමාන සංවාස ඇත්තිය. එකුපෝසථා, සදෘශ වූ පාමොක් උදෙසීම් ඇත්තීය. ඉති, මෙසේ, යාපන එසා සීමා, යම් සීමාවක්, වුත්තා, වදාරණ ලද්දීද, අයං, මේ සීමා තොමෝ, උදකුක්ඛේපසීමා නාම, උදකොත්ක්ෂේප සීමා නම් වන්නීය. තත්ථ, ඒ වචනයෙහි, යස්සා, යම් ගංගාවෙක්හි, ධම්මිකානං රාජූනං, දැහැමි රජුන්ගේ, කාලෙ. කාලයෙහි, නොහොත් කාලයෙහි වූ, අන්වද්ධමාසං, අඩමසක්පාසාහෝ, අනුදසාහං, (දස දවසක් පාසා හෝ නොහොත් දස දවසකට වරක් හෝ) අනුපඤ්චාහං, පස් දවසකට වරක් හෝ, අනතික්කමිත්වා, නොඉක්මවා, දෙවෙවස්සන්තේ, වැසිවස්නා කල්හි, වලාහකෙසු, වලාපටලයන්, විගතමත්තේසු, පහවූ මාත්‍රයක් ඇති කල්හි, සොතං, ජල ප්‍රවාහය, පච්ඡිජ්ජති, සිඳේද, අයං, මේ ගංගා තොමෝ නදීසංඛං, නදීසීමායන ගණ ට, නගච්ඡති නොපැමිණෙයි. යස්සාපන, යම් ගංගාවක් තුගේ වනාහී, ඊදිසෙසු, මෙබඳු ස්වභාව

ඇත්තා වූ, සුවුට්ඨිකාලෙසු, යහපත් වැසි වස්නා කල්හි, වස්සානස්ස, වස්සාන සෘතුහුගේ, චාතු මාසෙ, සාර මස මුලුල්ලෙහි, සොතං. ජල ප්‍රවාහය, නපච්ඡිජ්ජති, නොසිඳේද, යත්ථ, යම් ගංගාවෙක්හි, තිත්ථේනවා, තොටුපලින් හෝ, අතිත්ථේනවා, නොතොටුපලින් හෝ, සික්ඛාකරණියෙ, සෙඛියා ශික්ෂාවෙහි, ආගතලක්ඛණෙන, ආවා වූ ලක්ෂණය කරණකොටගෙණ, තිමණ්ඩලං පටිච්ඡාදෙත්වා, තෙමඩුලු පිළිසන් කොට, අන්තරවාසකං, හඳනය, අනුක්ඛිපිත්වා, නොඔසවා, උත්තරන්තිය, එතරවන්නා වූ භික්ඛුනි යා, භික්ෂුණියක් හුගේ, එකද්වඞ්ගුලමත්තං අපි, එකඟුල් දෙයඟුල් පමණ ප්‍රදේශයක්, අන්තරවාසකො, හඳනය, තෙම්යති, තෙමේද, අයං, මේ ගංගා තොමෝ, සමුද්දංවා, පව්සතු සමුද්‍රයට හෝ ගළායේවා, තළාකංවා, වැවකට හෝ ගළායේවා, සාපභවනොපට්ඨාය, ඕතොමෝ ගග මුල පටන්, නදීනාම, ගංගා නම් වන්නීය. සමුද්දෙ, සමුද්‍ර තෙමේ, පාකටොයෙව, ප්‍රකට මැයි කෙනච්, යම්කිසිවෙකු විසින්, ඛණිත්වා, කැණ, අකතො, නොකරණ ලද්ද වූ, සයංජාතො, තෙමේ ම හටගත්තාවූ, යොපන සොබ්භෝ, යම් හෙබක් වේද, සමන්තතො, හාත්පසින්, ආගතේන උදකෙන, ආවා වූ ජලයෙන්, පූරිතොතිට්ඨති, පිරී සිටීද, යත්ථ, යම් හෙබෙක්හි, නදියං, ගංගාවෙහි, වුත්තප්පකාරෙ, කියන ලද ලක්ෂණ ඇත්තා වූ, වස්සකාලෙ, වැසිකල්හි, උදකංසන්තිට්ඨති, ජලය සිටීද, අයං, මේහෙප් තෙමේ, ජාතස්සරොනාම, ස්වයං ජාතවිල නම් වේ. නදිංවා, ගංගාවක් හෝ සමුද්දංවා, සමුද්‍රය හෝ, භින්දිත්වා, බිඳගෙණ, නික්ඛන්ත උදකෙන, නික්මුණු ජලය විසින්, ඛතො, ඛණන ලද්ද වූ, යො සොබෙහා අපි, යම් හෙබක්ද, ඒතං ලක්ඛණං, ඒ කියන ලද්ද වූ ලක්ෂණයට පාපුණාති, පැමිණේද, අයං අපි, මේ හබද, ජාතස්සර වේ මැයි (අපි ශබ්දයෙන් කියන ලද්දවූ හෙබද ජාතස්සර නම් නොවෙයි. මේ ගංගා දිය බිඳ ගෙණ ජලය විසින් ඛණන ලද්ද වූ හෙබද කියන ලද්ද වූ ලක්ෂණ ඇත්තේ යයි කීනියායි) යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකු ක්ඛේපා ඉති, යං පෙ උදකුක්ඛේපා, යනු. යංඨානං, යම් ස්ථානයක්, ථාමමජ්ඣිමස්ස, මධ්‍යම ශක්ති ඇත්තා වූ, පුරිසස්ස, පුරුෂයෙකුගේ සමන්තා, හාත්පසින්, උදකුක්ඛේපා, උදකොත්ක්ෂේපයෙන්, නොහොත් ජලය දමා ගැසීමෙන්, පරිච්ඡින්නං, පිරිසිඳින ලද්දේ ද, තත්ථ, (තස්මිං වචනෙ) ඒ වචනයෙහි, අක්ඛධුත්තා, අක්ෂධූර්තයෝ, තුමූ, දරුගුලං, දූ කැටය, යථාඛිපන්ති, යම් සේ

දමා ගසද්ද, ඒවං, එපරිද්දෙන්, උදකංවා, ජලය හෝ, වාලිකංවා, වැලි හෝ හත්ථේන ගහෙත්වා, අතින් ගෙණ, මජ්ඣිමෙ න පුරිසෙන, මැදුම් බලැති පුරුෂයෙකු විසින්, සබ්බත්ථාමෙන, සියලු ශක්තියෙන්, ඛිපිතබ්බං, දමා ගැසිය යුතුය. තත්ථ, ඒ දමා ගැසීමෙහි, යත්ථ, යම් තැනෙක්හි, ඒවං ඛිත්තං, මෙසේ දමා ගසන ලද්ද වූ උදකංවා, ජලය හෝ, වා ලිකං, වා, වැලි හෝ පතති, හේද, අයං, මේ ජලය හෝ වැලි හෝ හෙන තැන. උදකුක්ඛේපොනාම, උදකුක්ඛේප නම් වේ. අයං තත්ථ සමාන සංවාසා එකුපොසථා ඉති, අයං පෙ එකුපොසථා යනු, තෙසුනදී ආදීසු. ඒ ගංගාදියෙහි. උදකුක්ඛේපපරිච්ඡින්නා, උදකොත්ක්ෂේපයෙන් පිරිසිඳින ලද්ද වූ. අයංසීමා, මේ සීමා තොමෝ, සමාන සංවාස චේව, සමානසංවාස ඇත්තීද වේ. එකුපොසථාච, සදෘශ වූ පාමොක් උදෙසීම් ඇත්තීද වේ. ("එකුපොසථා" යි උපොසථකර්මය වෙන් කොට දැක්වූ හෙයින් අවශේෂ සංඝකර්මය "සමාන සංවාස" යන්නෙන් දත යුතුයි) අයංපන, මේ උදකොත්ක්ෂේප සීමාව වනාහි, එතෙසංනදී ආදීනං, ඒ ගංගාදීන්ගේ, අන්තෝයේව, ඇතුළත්හිම, යස්මාලබ්භති. යම් හෙයකින් ලැබේද?, බහිනලබ්භති, පිටත් හි නොලැබේද, තස්මා, එහෙයින්, නදියාවා, ගංගාවෙහි හෝ, ජාතස්සරේවා, ස්වයං ජාත විලෙහි හෝ යත්තකං පදෙසං, යම් පමණ පෙදෙසක්, පකතිවස්සකාලෙ, ප්‍රකෘතිවර්ෂාකාලයෙහි, චතුසුමාසෙසු, වැසිසාරමස්හි, උදකං, ජලය, ඔත්ථරති, ගලා සිටිද, සමුද්දේ, සමුද්‍රයෙහි, යස්මිංපදෙසෙ, යම් ප්‍රදේශයෙක්හි පකතිවීචියො, ප්‍රකෘතිරළ වේගයො, ඔසරිත්වා, බැස, සණ්ඨහන්ති, පිහිටා සිටිද්ද, තතොපට්ඨාය, ඒ ජලය පිහිටි තැන් පටන්, කප්පිය භූමි, කැප භූමි නම් වේ. තත්ථ, ඒ කප්පිය භූමියෙහි, ඨත්වා, සිට, උපොසථාදිකම්මං, පොහොය කිරීම් ආදී වූ සංඝකර්මය, කාතුංවට්ටති. කරන්නට වටනේයි, දුබ්බුට්ඨිකාලෙවා, වැසි නොවස්නා කල්හි හෝ, ගිම්හෙවා, ග්‍රීෂ්ම ඍතුවෙහි හෝ, නදීජාතස්සරෙසු, ගංගාස්වංජාත විල්හු, සුක්ඛේසු අපි, වියලී ගිය කල්හි ද සා එව, ඒ ජලය ගලා තුබූ භූමිය ම කප්පිය භූමි හොති කප්පිය භූමි නම් වේ, සචෙ පන, ඉදින් වනාහි, සුක්ඛෙ ජාතස්සරෙ වියලී ගිය ජාතස්සරයෙහි, වාපිංවාඛණන්ති, වැවක් හෝ කණිද්ද, වප්පංවාකරොන්ති, ලබු පුසුල් ආදිය හෝ රෝපනය කෙරෙද්ද තං ඨානං, ඒ ස්ථානය, ගමක්ඛෙත්තං හොති, ග්‍රාම ක්ෂේත්‍රය වෙයි (භාවය ඒ වියලී ගිය ජාතස්සරයෙහි ලිං පොකුණු ආදිය ඛණිත්ද, ලබු, පුසුල් ආදිය රෝපණය

කෙරෙත්ද ඒ ප්‍රදේශය ග්‍රාම ක්ෂේත්‍ර නම් ලින් පොකුණු ආදිය නොකණින්නාවූද ලබු පුසුල් ආදිය රෝපනය නොකරන්නා වූ ද ප්‍රදේශය කප්පිය භූමි නම් යතරු ස් වූ ජාතස්සරයක් ඇතිකල ඒ සියලු තැන ජලයෙන් පිරී සිටී නම් ඒ භූමිය කප්පිය භූමි නම් ප්‍රකෘති ජලයෙන් නොබස්නා තැන කප්පිය භූමි නොවේ ඇතැම් ආචාර්යපීවරයෝ "සවේපන සුක්ඛෙ ජාතයස්සරෙ වාපිංවා ඛණන්ති පෙ තංඨානං ගාමක්ඛෙත්තංහොති" යන පාඨ උදහරණය කොට ගංගා සමුද්‍ර ජාතස්සර යෙක්හි ජලවේගයෙන් මතුවෙන්නාවූ දිවයින්හිද යම් පමණ කලක් මිනිසුන් විසින් ලින් පොකුණු ආදිය නොකණිනු ලැබේද්ද ලබු පුසුල් ආදිය රෝපණය කොකරනු ලැබෙද්ද ඒ තාක් කල් උදකොත්ක්ෂේප සීමා වශයෙන් සංඝකර්ම කටයුතුයි. ගාමසීමා සත්තබ්භන්තර සීමා වශයෙන් සංඝකර්ම නො කටයුතුයි. බද්ධ සීමාවද නොබැඳිය යුතු යයි කියති ඒ ආචාර්යපවරයන්ගේ වාදය පරීක්ෂා කටයුතු වේ. කුමක් හෙයින යත් මේ "සවේපන" යනාදී පාඨය එබඳු ජල වේගයෙන් මතු වූ දිවයින් ආදිය සඳහා කියන ලද්දේ නොවේ. ප්‍රකෘති වර්ෂා කාලයෙහි වර්ෂාව සිඳීමෙන්ද ශීත කල්හි උෂ්ණ කාලයෙහි ජලය නැවැත්මට අවකාශ ඇත්තේ නමුදු ජලය සිඳී යාම සඳහා කියන ලද පාඨයක් හෙයින් ද නදී පාර සීමා විනිශ්චයෙහි මධ්‍යයෙහි ඇත්තා වූ දිවයන්හි බද්ධ සීමාවක් කටයුතු බව ආ හෙයින්ද "අති වුට්ඨිකාලෙ ඔඝෙන ඔත්ථටොකාසො නගහෙතබ්බො" යනුද "අන්තොනදියං ජාතස්සරෙ පාතපිඨීපාසානාදිකෙසුපි ආයමෙව විනිච්ඡයො වෙදිතබ්බො" යනුද ටීකාවෙහි කියන ලදී. ඉදින් අර්ථ කථා ටීකාවන්හි පූර්වයෙහි ජලයෙන් යට නොවන්නා වූ දිවයින ජලයෙන් යටවන්නේ නමුදු යටකී ක්‍රමයෙන් ලබු පුසුල් ආදිය රෝපනය කොට ගම් කෙත් බවට පැමිණි දිවයින සඳහාම විනිශ්චය කෙළේ යයි කියත් නම් එබඳු විනිශ්චයක් අටුවා ටීකාවන්හි නොආයේය. ඒ වචනයද යෙදේ. එහෙයින් වර්ෂා සාරමස ඉක්මගිය ගංගා සමුද්‍ර ජාතස්සරයෝ ජලය සිඳී ගිය කල්හි ලින් පොකුණු ආදිය කණින ලදුයේ හෝ නොකණින ලදුයේ හෝ ග්‍රාම සීමා ආරණ්‍ය සීමා ලක්ෂණයන්ගේ ගණනටම පැමිණෙත් උදකොත් ක්ෂේපසීමාවගේ ලක්ෂණයට නොපැමිණෙන මේ ස්ථානය වනාහි විනය ධරයන්ට ගෝචර වූ අතිශය ගම්භීර ස්ථානයක් වේ. එහෙයින් "ගරුකලහුකෙසුගරුකෙඨාතබ්බං එතංවිනය ලක්ඛණං" යනු හෙයින් මේ ස්ථානයෙහි විනයධරයන්ගේ සේවනයෙන්ම අර්ථාවබෝධය

කටයුතුයි) යාපනෙයා (යාපනඵයාහුම්) යම් භූමියක්, කප්පිය භූමි ඉති, කැප භූමියයි, වුත්තා, කියන ලද්දී ද, තතො, ඒ කප්පිය භූමියෙන්, බහි පිටත්හි, උදකුක්ඛේප සීමාන ගච්ඡති. 'උදකුක්ඛේප සීමාව නොයෙයි, අන්තෝයේව, ඇතුළත්හිම, යස්මාගච්ඡති, යම් හෙයකින් යේද, තස්මා, එසේ හෙයින්, නෙයංනදී ආදී නං, ඒ ගංගාදීන්ගේ අන්තෝ. ඇතුළත්හි, පරිසපරියන්තතොපට්ඨාය, පිරිස් කෙළවර පටන්, සමන්තා, හාත්පසින්, උදකුක්ඛේප පරිච්ඡෙදෙ, උදකොත්ක්ෂේපයාගේ පිරිසිඳීම, කාතබ්බො, කටයුතුයි, ද්වෙසංඝා, සඟ පිරිස් දෙකක් තුමූ, විසුං විසුං, වෙන වෙනම උපෝසථාදිකම්මං, උපෝසථාදී සංඝකර්මය, සචෙපනකරොන්ති, ඉදින් කෙරෙද්ද, ද්වින්නං උදකුක්ඛේපානං, උදකෝත්ෂේපයන් දෙදෙනෙකුන්ගේ අන්තරෙ, අතුරෙහි අඤ්ඤො එකො උදකුක්ඛෙපො, අනික් එක් උදකොත්ක්ෂේපයක්, උපචාරත්ථාය, උපචාරපිණිස, ඨපෙතබ්බො, තැබිය යුතුයි. අයං සත්තබ්භන්තර සීමාව, මේ සත්තබ්භන්තර සීමාවද, උදකුක්ඛෙපසීමාව, උදකුක්ඛේපසීමාවද, භික්ඛූනං, භික්ෂූන්ගේ, ඨිතොකාසතොපට්ඨාය, සිටි අවකාශය පටන්, හි, (යස්මා) යම් හෙයකින්, ලබ්භන්ති, ලැබේද, තස්මා, එසේ හෙයින්, උපචාරත්ථාය, උපචාරය පිණිස, ඨපෙතබ්බා, තැබිය යුත්තිය.

(භාවය - මේ සත්තබ්භන්තර සීමා උදකුක්ඛේප සීමාවෝ භික්ෂූන් ගේ හුන් තැන් පටන් තැබිය යුත්තා හ භික්ෂූහුද සියලු කල්හි සමාන නොවෙති. ඇතැම් කලෙක්හි බොහෝ වෙති ඇතැම් කලෙක්හි මඳ වෙති. යම් කලෙක්හි බොහෝ වෙත්නම් එකල්හි සීමාසංකරය ඇතිවේ එහෙයින් සත්තබ්භන්තර සී මා උදකුක්ඛේප සීමාවන්ට අතුරෙහි එක් අබ්භන්තරයක් හෝ උදකොත්ක්ෂේපයක් හෝ තැබිය යුතුයි කී නියායි. මේ කංඛාවිතරණී ටීකාමතයි විනයාලංකාර ටීකාවෙහි වනාහි මේසබ්භන්තරසීමා උදකුක්ඛෙපසීමාවන්ගේ පරිච්ඡේදය නොදත හැකි බැවින් සීමාසංකර දෝෂය වළක්වනු පිණිස භික්ෂූන් දෙපක්ෂයක් දෙතැනෙක්හි සත්තබ්භන්තර සීමා දෙකෙක හෝ උදකුක්ඛේපසීමා දෙකක හෝ විනය කර්මයන් කෙරෙත් නම් උපචාරය දැන ගැන්ම පිණිස එක් අබ්භන්තරයක් හෝ එක් උදකොත්ක්ෂෙපයක් හෝ තැබිය යුතුයයි කියයි) පරිච්ඡේදබ්භන්තරෙ, වෙන්කරගන්නාලද සීමාව ඇතුලෙහි, හත්ථපාසා විජහිත්වා, අත්පය හැර, ඨිතො අපි, සිටි භික්ෂු තෙමේ ද පරිච්ඡේදතො බහි,

වෙන් කරගන්නා ලද සීමාවෙන් පිටත්හි, අඤ්ඤං, අන්‍ය වූ, තත්තකංයෙව පරිච්ඡේදං, එපමණ වූ පරිච්ඡේදයක්, අනතික්කමිත්වා, නොඉක්මවා, ඨිතොඅපි, සිටි භික්ෂුතෙමේ ද, කම්මං කොපෙති, කර්මය විනාශ කෙරෙයි. ඉදං, මේ කියන ලද්ද වූ, සබ්බං සියලු විනිශ්චය, සබ්බේ සු අට්ඨකථාසු, සියලු අටුවාවන්හි, සන්නිට්ඨානං, අන්තිම විනිශ්චයයි. ඒවං, මෙසේ, අබද්ධසීමාවේදිතබ්බො, අබද්ධසීමා තොමෝ දත යුත්තිය. බද්ධසීමා බද්ධසීමාවසෙන, බද්ධසීමාව අබද්ධ සීමාව යන දෙදෙනාගේ වශයෙන්, දුවිධං, ද්විප්‍රකාර වූ, ඒතං ඉමංසීමංසන්ධාය, මේ සීමාව සඳහා, තෙවබොහත්ථපාසං අවිජහිත්වා එක සීමායංඨිතා ඉති, තෙවබො පෙ ඨිතායන, එතංවචන, ඒ වචනය, අම්හේහි, අප විසින්, වුත්තං, කියන ලදී. හි, ඒ වචනය සැබෑමය. තෙයුචතුසු භික්ඛුසු, ඒ භික්ෂුන් සතර දෙනෙක්, එකසීමායං, එක් සීමාවෙක්හි, හත්ථපාසං අවිජහිත්වා, අත්පස නොහැර ඨිතෙසුඑව, සිටි කල්හි, සංඝස්ස, සංඝයාගේ එතංඋපොසථ, කම්මං, මේ උපෝසථ කර්ම තෙමේ, පත්තකල්ලංනාම හොති, යුක්ත ප්‍රාප්ත වූ සුදුසු කල් ඇති කර්ම නම් වේ. ඉතරථා අත්පස හැර අන් පරිද්දෙකින් සිටියෙ නම්, නහොති, පත්තකල්ල නම් නොවේ. යථාහ භාගයවත් තෙමේ මේ කාරණය කෙසේ වදළ සේක්ද යත්? අනුජානා මිභික්ඛවෙ චතුන්නංපාතිමොක්ඛං උද්දිසිතුංඉති, අනුජානාමි පෙ උද්දිසිතුං යනු, ආහ (අවොච) වදල සේක. (මෙහි අර්ථ) භික්ඛවෙ, මහණෙනි, චතුන්නං සතර නමක් වූ භික්ෂුන්ට, පාතිමොක්ඛං උද්දිසිතුං, ප්‍රාතිමෝක්ෂය ප්‍රකාශ කරනු පිණිස, අනුජානාමි, අවසර දෙමි. සභාගාපත්තියොව නච්ඡජන්ති ඉති, සභාගාපත්තියොව නච්ඡජන්ති යනු, සබ්බො, සියලු සංඝා, සංඝතෙමේ, විකාල භෝජනාදිනා, විකල් බොජුන් ආදිවූ, සභාවගවත්ථුනා, ස්වභාව සදෘශ්‍ය වස්තුවකින්, යංලහුකාපත්තිං, යම් සැහැල්ලු ඇවතකට, ආපජ්ජති, ආවදිද, එවරූපා, මෙබඳු ස්වභාව ඇත්තා වූ, වත්ථුසභාගා, වස්තු ස්වභාව සදෘශ්‍ය වූ ආපත්තියක්, සභාගාඉති, සභාගාපත්තියයි, වුච්චති, කියනු ලැබේ. විකා භෝජන පච්චයං, විකල් බොජුන් ප්‍රත්‍යය කොට ගෙණ, ආපන්නං, අවන් වූ ආපත්තිසභාගංපන, ස්වභාව සදෘශ්‍ය ආපත්ති වනාහි, අනතිරිත්ත භෝජනප්පච්චයා, අතිරික්ත විනය කර්ම නොකළ භෝජනය අනුභව කිරීමෙන්, ආපන්නස්ස, අවන් ඇවැත් ඇති භික්ෂුවක් හුගේ, සන්තිකේ, සමීපයෙහි, දෙසෙතුං වට්ටති, අස්වන්නට වටනේයි යති, වස්තු

ස්වභාව සදෘශ වූ ඇවතක් ඇති කල්හි, තෙහිභික්ඛු හි, ඒ භික්ෂූන් විසින්, එකො භික්ඛු, එක් මහණෙක්, සාමන්තා ආවාසා, ලඟ වෙහෙරකට, සජ්ජුකං, එකෙණෙහි, පාහෙතබ්බො, පිටත් කටයුත්තේයි. ආවුසො, ඇවැත්නි, ත්වං, තෝ, ගච්ඡ, යව, තංආ පත්තිං, ඒ ඇවැත, පටිකරිත්වා, පිළියම් කොටගෙන අගච්ඡ, නැවැත එව, මයං තොපගේ සමීපයෙහි ආපත්තිං ඇවැත පටිකරිස්සාම ඉති. පිළියම් කරම්හයි කියා, පාහෙතබ්බො, පිටත් කළ යුත්තේයි, එවං, මෙසේ, තං, ඒ ආපත්තියෙන් නැගිටීම, ලහෙථ, ලබන්නහු නම්; ඉති ඒතං, මෙසේ මේ ලැබීම, කුසලං (සාධු) මැනව, නොවෙලහෙථ, ඉදින් නොලබන්නහු නම්, වත්තේන විනයෙහි දක්ෂ වූ, පටිබලෙන කීමෙහි බිණීමෙහි පොහොසත් වූ, භික්ඛුනා, භික්ෂුවක් හු විසින් සංඝො, සංඝයා, ඤපෙතබ්බෝ, දැන්විය යුතුයි, භන්තෙ, වහන්ස, සංඝොසංඝතෙම, මේ, මාගේ වචනය, සුණාතු, අසන සේක්වා, සබ්බො අයං සංඝො, සියලු මේ සංඝ තෙමේ, සභාගං වස්තු ස්වභාව සදෘශ වූ, ආපත්තිං, ඇවතකට, ආපන්නෝ, පැමිණියේයි. යදා, යම්කලෙක්හි, අඤ්ඤං අන්‍ය වූ, සුද්ධං, පිරිසිදු වූ, අනාපත්තිකං, නිරාපත්තික වූ, භික්ඛුං, භික්ෂුවක්, පස්සිස්සති, දක්නේ වේද, තදා, එකල්හි, ධංඝො, සංඝ තෙමේ, තස්සසන්තිකෙ, ඒ නිරාපත්තික වූ මහණුහුගේ සමීපයෙහි, තංආපත්තිං, ඒ වස්තු ස්වභාවය සදෘශ වූ ඇවත, පටිකරිස්සති, පිළියම් කරන්නේයි, ඉතිවත්වා, මෙසේ කියා, උපෝසථො කාතබ්බො, පොහොය කටයුතුයි  වෙමතිකො, සභාගාපත්ති ඇද්දේ නැද්දේයි සැක ඇත්තේ, සචේපන හොති, ඉදින් වේද, භන්තෙ, වහන්ස, සංඝො, සංඝතෙමේ, මෙ, මාගේ වචනය, සුණාතු, අසන සේක්වා, සබ්බෝ අයං සංඝො, සියලු මේ සංඝ තෙමේ, සභාගාය වස්තු ස්වභාව සදෘශ වූ, ආපත්තියා, ඇවතෙහි, වෙමතිකො, විමති ඇත්තේ වෙයි. යදා, යම් කලෙක්හි, නිබ්බේ මතිකො භවිස්සති, නිසැක වන්නේද, තදා එකල්හි, තංආපත්තිං, ඒ ඇවත, පටිකරිස්සති, පිළියම් කෙරෙයි, ඉතිවත්වා, මෙසේ කියා, උපෝසථො කාතබ්බො, පොහොය කටයුතුයි. සචේපන, ඉදින් වනාහි, එත්ථ, මේ සංඝ මධ්‍යයෙහි, කොචි, යම්කිසි භික්ෂුවක් තෙමේ, සභාගං, වයතු ස්වභාව සදෘශ වූ, තංආප්ත්ති, ඒ ඇවත. දෙසෙතුං වට්ටති ඉති, දෙසන්නට වටනේ යයි, මඤ්ඤමානො, සිතනු ලබමින්, එකස්ස සන්තිකෙ, එක් භික්ෂුවක් හුගේ සමීපයෙහි, දෙසෙති. ඇවැත් දෙසාද, දෙසිතා, දේශනා තොමෝ, සුදෙසිත එව, යහපත් දේශනාවක්ම වේ, අඤ්ඤං,

අන්‍ය වූ වස්තු ස්වභාව සදෘශ්‍ය වූ ඇවත, දේසනා පච්චයා, දෙසීම හේතු කොටගෙන, දෙසකො, ඇවැත් දෙසන මහණ තෙමේද, පටිග්ගහණපච්චයා, ඇවැත් පිළිගන්නා ප්‍රත්‍යයෙන්, පටිග්ගාහකො ච, ඇවැත් පිළිගන්නා වූ මහණ තෙමේද, ඉති ඉමෙ උභො අපි, මේ භික්ෂුහු දෙදෙනාම, දුක්කටං ආපජ්ජන්ති, දුකුළා ඇවතට අවදිත්, තං, ඒ දුකුළා ඇවත, නානාවත්ථුකං හොති, නොයෙක් වස්තු ඇත්තේ වේ. තස්මා. එහෙයින්. අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන් විසින්, දෙසෙතබ්බං, දෙසිය යුතුයි. (භාවය දෙසක පුද්ගලයාහට දේශනා ප්‍රත්‍යයෙන්ද ප්‍රතිග්‍රාහක පුද්ගලයාහට ප්‍රතිග්‍රහණ ප්‍රත්‍යයෙන්ද ඇවැත් විය යුතුයි. ඒ දේශනා ප්‍රතිග්‍රහණ වස්තුහු නානා වස්තුක වෙති. එහෙයින් ඔවුනොවුන් විසින් ඇවැත් දෙසිය යුතුයි. මේ අර්ථය සලකා අපගේ ආචාර්ය්‍ය පරම්පරාවෙහි පොහොය සීමාවෙහි පළමු කොට ඇවැත් දෙසන භික්ෂු තෙම අනික් භික්ෂුන්ගේ අවසානයෙහි නැවතත් ඇවැත් දෙසයි) එත්තාවතා, මෙපමණකින්. තෙපෙභික්ඛූ, ඒ භික්ෂුහුදේදෙන, නිරාපත්තිකාහොන්ති, නිරාපත්තිකපුවාහුවෙත්, තේසං සන්තිකෙ, ඒ නිරාපත්තික භික්ෂුන් දෙදෙනාගේ සමීපයෙහි, ශෙයෙහි, අවශේෂ භික්ෂුන් විසින්, සභාගාපත්තියො, වස්තු ස්වභාව සදෘශ්‍ය වූ ආපත්තිහු, දෙසෙතබ්බාවා, ඇස්විය යුත්තා හු හෝ වෙති. ආරෝවෙතබ්බාවා, පහළ කටයුත්තා හු හෝ වෙති, තෙභික්ඛූ, ඒ භික්ෂුහු තුමු, ඒවං අකත්වා, මෙසේ නොකොට, උපෝසථං, පොහොය, සචෙකරොන්ති, ඉදින් කෙරෙද්ද, ඒවං, මෙසේ ඇති කල්හි, පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ ඉති, පාරිසුද්ධිං පෙ ආරොචෙථයන, ආදිනානයෙන, යන මේ ආදි ක්‍රමයෙන්, සාපත්තිකස්ස, ඇවැත් සහිත වූ භික්ෂුහට. උපොසථකරණෙ, පොහෝ කිරීම හේතුකොට ගෙණ පඤ්ඤත්තං, පණවන ලද්ද වූ, දුක්කටං, දුකුළා ඇවතට, ආපජ්ජන්ති, අවදිත් සචෙ, ඉදින්, සබ්බො සංඝො, සියලු සංඝ තෙමේ, සභාගාපත්තියාසති, වස්තු ස්වභාව සදෘශ්‍ය වූ ඇවතක් ඇති කල්හි. වුත්ත විධිං අකත්වා, කියන ලද විධිය නොකොට, උපොසථංකරොති, පොහොය කෙරේද, වුත්තනයෙන එව, කියන ලද ක්‍රමයෙන්ම, සබ්බො සංඝො, සියලු සංඝ තෙමේ, ආපත්තිං, ඇවතට, යස්මා ආපජ්ජති, යම් හෙයකින් අවදී ද, තස්මා, එහෙයින්, සභාගාපත්තියාසති, වස්තු ස්වභාව සදෘශ වූ ඇවතක් ඇති කල්හි සංඝස්ස, සංඝයා හට, පත්ත කල්ලං නාමනහොති. යුක්ත ප්‍රාප්ත කල් ඇත්තේ නම් නොවේ. තේන, එහෙයින්,

සභාගාපත්තියොච නවිජ්ජන්ති ඉති. සභාගාපත්තියෝච නවිජ්ජන්ති යනු, වුත්තං. කියන ලදී, හි ඒ එසේ මැයි, එනාසු සභාගාපත්තීසු, ඒ වස්තු ස්වභාග සදෘශ වූ ඇවැත්හු, අවිජ්ජමානාසු, අවිද්‍යමාන කල්හි, විසභාගාසු, වස්තු ස්වභාව සදෘශ වූ ඇවැත්හු, විජ්ජමානසු අපි. විද්‍යමාන කල්හි, පත්තකල්ලං හොතියෙව, පත්තකල්ල ඇත්තේ වේ මැයි ඒ විසභාග ඇවැත් නැතිකල ඒ භික්ෂුන්ටම ඇවැත් සිද්ධ වෙති. සංඝයාට ඇවැත් ද සිද්ධ නොවෙති. එහෙයින් පත්ත කල්ල ඇත්තේ යයි කී නිසායි.)

වජ්ජනීයාච පුග්ගලා තස්මිං නහොන්ති ඉති වජ්ජනීයා පෙ නහොන්තියන, එත්ථ, මේ පාඨයෙහි, නභික්ඛ වෙ සගහට්ඨාය පරිසාය ඉති, න පෙ පරිසාය යන, ආදිනානයෙන, මේ ආදි ක්‍රමයෙන්, වචනතො, වදළ හෙයින්, ගහට්ඨො, ගෘහස්ථයෙක්ද, භික්ඛවෙ, මහණෙනි, භික්ඛුනියා, භික්ෂුණියක් හු විසින්, නිසින්නපරිසාය, හුන්නා වූ පිරිසෙහි, පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂය, නඋද්දිසිතබ්බං, ප්‍රකාශ නො කටයුතුයි. ඉති ආදිනා නයෙන, මේ ආදි ක්‍රමයෙන්, වුත්තා, වදාරණ ලද්ද, වූ, භික්ඛුනී, භික්ෂුණියක්ද, සික්ඛමානා, සික්ෂාමානයෙක්ද, සාමණේර හෙරණෙක්ද, සාමණේරී, හෙරණියක්ද, සික්ඛාපච්චක්ඛාතකො, සික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාණය කළ භික්ෂුවක්ද, අන්තිම වත්ථුජ්ඣාපන්නකො, සතරපරිජි ඇවතුන් අතුරෙන් එක්තරාපරිජි ඇවතකට පැමිණි භික්ෂුවක්ද, ආපත්තියා අදස්සනෙ, ඇවැත් නොදැක්මෙහි, උක්ඛිත්තකො, සංඝයා විසින් උක්ෂේපනීය කර්මය කොට නෙරපනලද භික්ෂුවක්ද ආපත්තියා අප්පටිකම්මෙ, ඇවතට පිළියම් නොකිරීමෙන්. උක්ඛිත්තකො, සංඝයා විසින් උක්ෂේපනීය කර්මයෙන් බැහැර කරන ලද භික්ෂුවක්ද, පාපිකාය දිට්ඨියා ලාමක වූ දෘෂ්ටියක්, අප්පටිනිස්සග්ගේ, අත් නොහැරීමෙහි, උක්ඛිත්තකො, උක්ෂේපනීයකර්මයෙන් බැහැර කරන ලද භික්ෂුවක්ද, පණ්ඩකො, පණ්ඩකයෙක්ද, (මේ පණ්ඩකාදීන්ගේ විනිශ්චය මතු පාරාජිකොද්දේසයෙහි පහළ වෙයි) ථෙය්‍යසංවාසකො, ථෙය්‍යසංවාසකයෙක්ද, තිත්ථියපක්කන්තකොතිර්ථකයන් මැදට පැණ ගිය භික්ෂුවක්ද, තිරච්ඡානගතො, තිරිසන් ගිය සත්වයෙක් ද (මෙහි "තිරච්ඡානගතො" යනු භික්ෂු වේශයෙන් සංඝ මධ්‍යයට ආවා වූ ද්වනයින් දිවගුරුළුන් ආදිවූ අමනුෂ්‍යයානිහුම වෙති ඇත් අස් ගව මහිෂාදී

තිරිසන් සතුන් නොගත යුත්තාහ) මාතු ඝාතකො, මාතෘඝාතක කර්මය කළ භික්ෂුවක් හෝ, පිතුඝාතකො, පිතෘඝාතක කර්මය කළ භික්ෂුවක් හෝ, අරහන්ත ඝාතකො, අරහන්ත ඝාතක කර්මය කළ භික්ෂුවක් හෝ, භික්ඛුනීදූසකො, භික්ෂුණී දූෂක කර්මය කළ භික්ෂුවක් හෝ, සංඝ භේදකො, සංඝ භේද කර්මය කළ භික්ෂුවක් හෝ, ලෝහිතුප්පාදකො, ලෝහිතුප්පාදක කර්මය කළ, භික්ෂුවක් හෝ, උභතොබ්‍යඤ්ජනකො, උභතොබ්‍යඤ්ජනකයෙක් හෝ, ඉති ඉමෙ වීසතිවාති, මෙසේ මේ විසි දෙනෙක් දැයි, එක්වීසති පුග්ගලා, එක් විසි පුද්ගලයෝ තුමූ, වජ්ජනීයා නාම (සීමාවෙන්) බැහැර කටයුතු පුද්ගලයෝ නම් වෙති. තෙ, ඒ එක් විසි පුද්ගලයෝ, හත්ථපාසතො, අත්පසින්, බහිකරණවසෙන, පිටත්කිරීම් වශයෙන්, වජ්ජෙතබ්බා, දුරු කටයුත්තාහුය. තෙසු, ඒ එක්විසිපුද්ගලයන් අතුරෙන්, තිවිධො, තුන්වැදෑරුම් වූ, උක්ඛිත්තකො, උත්ක්ෂේපනීය කර්මය කළ මහණෙක්, සති (සීමාවෙහි) ඇති කල්හි. උපොසථං කරොන්තො පොහොය කරන්නාවූ, සංඝො, සංඝ තෙමේ, පාචිත්තියං, පචිති ඇවතට, හි (යස්මා) යම් හෙයකින්, ආපජ්ජති, අවදනේ වේද, සෙසෙසු, සෙසු අටළොස් පුද්ගලයෝ තුමූ, සන්තේසු, ඇති කල්හි, සංඝො සංඝ තෙමේ, දුක්කටං, දුකුළා ඇවතට, හි, යම් හෙයකින්, ආපජ්ජති, අවදනේ වේද, තස්මා, එසේ පචිති ඇවැත් දුකුළා ඇවතුන්ට පැමිණෙන හෙයින්, වජ්ජෙතබ්බා, සීමාවෙන් බැහැර කටයුත්තාහුය (මෙසේ සම්පූර්ණයෙන් පද සම්බන්ධය කටයුතුයි, හි ශබ්දය හෙත්වර්ථයෙහි වැටේ. ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ දළහීකරණාර්ථයෙහි යයි කියති)

එත්ථච, මේවජ්ජනීය පුද්ගල කථාවෙහිද, තිරච්ඡානගතො ඉති, තිරච්ඡානගතො යනු, යස්ස, යමෙක් හට, උපසම්පදා පටික්ඛිත්තා, උපසම්පදා තොමෝ නොකටයුත්තීයයි ප්‍රතික්ෂේප කරණ ලද්දීය. සො, හෙතෙම තිරච්ඡානගතො, තිරච්ඡානගත නම් වේ. තිත්ථියා, තිර්ථකයෝ, ගහට්ඨෙනඑව, ගහට්ඨ ශබ්දයෙන්ම, සංඝහිතා, සංග්‍රහ කරණ ලද්දහුය, හි (යස්මා) යම් හෙයකින්, එතෙපි, ඒ තිර්ථකයෝද, වජ්ජනීයා, දුරු කටයුත්තා හුද, තස්මා, එසේ හෙයින්, සංගහිතා, සංග්‍රහ කරන ලද්දහුය. ඒවං, මෙසේ, පත්තකල්ලං, පොහොය කිරීමට යුක්ත ප්‍රාප්ත කල් ඇති බව, ඉමෙහි චතුහි අඞ්ගෙහි, මේ චතුරාඞ්ගයෙන්, සංගහිතං ඉති, සංග්‍රහ කරන ලද්දේ යයි, වේදිතබ්බං, දත යුතුයි. සංඝො උපෝසථං කරෙය්‍ය ඉති, සංඝො පෙ කරෙය්‍ය යන,

ඉමිනා, මේ පාඨයෙන්, අපරෙපි, අනපචුද, තයො, තුන් වැදෑරුම් වූ, යෙතෙ උපොසථා, යම් උපොසථ කෙනෙක්, වුත්තා, දේශනා කරන ලද්ද හුද . සංඝෙ, (සංඝෙන) සංඝයා විසින්, උපෝසථො, (කටයුතු) උපෝසථ යයි කියාද, ගණ උපොසථො, ගණයා විසින් කටයුතු උපෝසථය කියාද පුග්ගලෙ උපොසථො ඉති, පුද්ගලයා විසින් කටයුතු උපොසථය යයි කියාද, ඒවං, මෙසේ, කාරකවසෙන, (පොහොය කරන) කාරක පුද්ගලයන්ගේ වශයෙන්, තයො, තුන්වැදෑරුම් වූ, යෙ තෙ උපෝසථා, යම් උපොසථ කෙනෙක්, (තෙයනු පදශ්ලිෂ්ටතා මාත්‍රයකි) වුත්තා, වදරණ ලද්ද හුද, තෙසු, ඒ උපොසථයන් තුන් දෙන අතුරෙන්, ඉතරෙ, සංඝුපොසථයෙන් අනප වූ, ද්වෙ, ගණ පුද්ගල උපෝසථයන් දෙදෙන, පටික්ඛිපිත්වා, පිළිකෙව් කොට, සංඝෙ උපොසථං එව, සංඝ උපෝසථයම, දීපෙති, ප්‍රකාශ කෙරේ පාතිමොක්ඛං උද්දිසෙය්‍ය ඉති, පාතිමොක්ඛං උද්දි සෙය්‍ය යන, ඉමිනා, මේ පදයෙන්, අපරෙපි, අනපචුද, තයො උපෝසථා, තුන් උපෝසථ කෙනෙක්, වුත්තා, වදරණ ලද්ද හුය. සුත්තුද්දේසො, සුත්තුද්දේස උපෝසථයද, පාරිසුද්ධි උපෝසථො, පාරිසුද්ධි උපොසථයද, අධිට්ඨාන උපෝසථො, අධිට්ඨාන උපෝසථයද, ඉති (එවං) මෙසේ, කත්තබ්බාකාර වසෙන, කටයුතු ආකාර වශයෙන්, තයො, තුන් වැදෑරුම් වූ, යෙතෙ උපෝසථා, යම් උපෝසථ කෙනෙක්, වුත්තා, කියන ලද්දහුද, තෙසු, ඔවුන් අතුරෙන්, ඉතරෙ, සුත්තුද්දේසයෙන් අනප වූ, ද්වෙ, උපෝසථදෙදෙන, පටික්ඛිපිත්වා, පිළිකෙව් කොට, සුත්තුද්දේසං, එව, සුත්තුද්දේස උපෝසථයම, දීපෙති, ප්‍රකාශ කෙරෙයි.

සුත්තුද්දේසොනාම, සුත්තුද්දේස නම්, පාතිමොක්ඛුද්දේසො, පාමොක් උදෙසීම යයි, වුච්චති, කියනු ලැබේ. සො, ඒ පාමොක් උදෙසීම, ඔවාදපාතිමොක්ඛුද්දේසොච, ඔවාදප්‍රාති මොක්ෂෝද්දේසයද, ආණාපාතිමොක්ඛුද්දේසොච, ආණාප්‍රාතිමෝක්ෂෝද්දේසයද, ඉති මෙසේ දුවිධොහෝති, දෙවැදෑරුම් වේ. තත්ථ, ඒ දෙවැදෑරුම් ප්‍රාතිමෝක්ෂයන් අතුරෙන්, "ඛන්තිපරමං තපො තිතික්ඛා පෙ සබ්බ පාපස්ස අකරණං පෙ අනුපවාදෙ අනුපඝා තො ඉති, ඛන්ති පරමං 'පෙ අනුපඝාතො" යන, ආදිනානයෙන, මේ ආදි ක්‍රමයෙන්, වුත්තා, වදරණ ලද්ද වූ, තිස්සො ගාථා, තුන් ගාථාවෝ, ඔවාද පාතිමෝක්ඛං නාම, ඒ ඔවාද ප්‍රාතිමෝක්ෂ, නම් වේ. තං ඒ ඕවාද ප්‍රාතිමොක්ෂය බුද්ධා එව,

සර්වඥ වරයෝම. උද්දිසන්ති, ප්‍රකාශ කෙරෙති, සාවකා, ශ්‍රාවකයෝ තුමූ, නඋද්දිසන්ති, ප්‍රකාශනො කෙරෙති. සුණාතු මෙභන්තෙ සංඝො ඉති, සුණාතු මේභන්තෙ සංඝො යන, ආදිනනායෙන, මෙ ආදි ක්‍රමයෙන්, වුත්තං, වදාරණ ලද්ද වූ ප්‍රාතිමෝක්ෂ තෙමේ, ආණාපාතිමොක්ඛං නාම, ආඥාප්‍රාතිමෝක්ෂ නම් වේ, තං ඒ ආඥාප්‍රාති මෝක්ෂය, සාවකාඑව, බුද්ධශ්‍රාවකයෝම, උද්දිසන්ති, ප්‍රකාශ කෙරෙති, බුද්ධා බුදුවරයෝ තුමූ, නඋද්දිසන්ති. ප්‍රකාශ නොකෙරෙතියි, ඉදංඑව, මේ ආඥාප්‍රාති මෝක්ෂයම, ඉමස්මිං අත්ථෙ, මේඅර්ථයෙහි, පාතිමොක්ඛං ඉති, ප්‍රාතිමෝක්ෂයයි. අධිප්පෙතං, කැමතිවන ලදී. , ඉතරෙ, සුත්තුද්දේසයෙන් අනප වූ, වෙ, ද්විප්‍රකාර වූ, යෙපන උපොසථා, යම්පාරිසුද්ධි උපොසථය අධිට්ඨාන උපෝසථය යන උපෝසථ කෙනෙක්, සන්ති.ඇත්තාහුද, තෙසු, ඔවුන් අතුරෙන් පාරිසුද්ධි උපෝසථො, පාරිසුද්ධි උපෝසථ තෙමේ, තාව (පඨමං) පළමු කොට, අඤ්ඤෙසඤ්ච. සෙස්සානංගේද, සන්තිකෙ, සම්පයෙහි, අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන් විසින් ද, ආරොචනවසෙන, දැන්වීම් වශයෙන්, දුවිධො, ද්විප්‍රකාර වේ. තත්ථ ඒ දෙවැදෑරුම් උපෝසථයන් අතුරෙන්, අඤ්ඤෙසං, සෙස්සන්ගේ සන්තිකෙ සමීපයෙහි, යො අයං, යම් උපෝසථයක් (අයං යනු වචන ශිලිෂ්ටතා මාත්‍රයි) කරියති, කරණු ලැබේද?. සොඅපි, ඒ උපොසථයද, පවාරිතානඤ්ච, පවාරණය කරණ ලද්ද වුන්ගේ ද, අප්පවාරිතානංච, පවාරණය නොකරන ලද්දවුන්ගේ ද, සන්තිකෙ, සම්පයෙහි කරණවසෙන, කිරීම් වශයෙන්. දුවිධො, ද්විප්‍රකාර වේ. තත්ථ, ඒ ද්විප්‍රකාරයන් අතුරෙන්, මහා පවාරණය වප් මස පුරපසළොස්වක් දවස් හි, පවාරිතානං, පවාරණය කළ භික්ෂූනගේ සන්තිකෙ, සම්පයෙහි, පච්ඡිමිකාය, පසුවසට, උපගතෙනවා, එළඹි භික්ෂුවක් විසින් හෝ, අනුපගතෙනවා, නොඑළඹි භික්ෂුවක් විසින් හෝ (වස් නොඑලඹි භික්ෂු යනු ඒ වස් කාලයෙහි උපසම්පද භික්ෂුවක් හෝ සමෘති විප්‍රවාසයෙන් වස් නොඑළඹි භික්ෂුවක් හෝ ගැණේ) ඡින්නවස්සේනවා, සිඳින ලද් වස් ඇත්තා වූ භික්ෂුවක් විසින් හෝ, චාතුමාසිනියංපන, ඉල්මස පුරපසළොස්වක් දවස්හි (පනශබ්දය පක්ෂාන්තරාර්තයි) පවාරිතානං, පවාරණය කළ භික්ෂූන්ගේ, සන්තිකෙ, සම්පයෙහි, පුරිමිකාය, උපගතෙනවා, පෙරවස් එළඹි භික්ෂුවක් විසින් හෝ, අනුපගතෙනවා, වස් නොඑලඹි භික්ෂුවක් හු විසින් හෝ, ඡින්නවස්සෙනවා සිඳින

ලද වස් ඇති භික්ෂුවක් විසින් හෝ, කායසාමග්ගිංදත්වා, කායසාමග්‍රියදී (නොහොත් එක්රැස්ව) පරිසුද්ධෙ අහමහන්තෙ, පරිසුද්ධොතිමංධාරෙථ ඉති, පරිසුද්ධො පෙ ධාරෙථයනු, තික්ඛත්තුං වත්වා, තුන්යලක්කියා, පාරිසුද්ධි උපෝසථො, පාරිසුද්ධිඋපෝසථය, කාතබ්බො, කටයුතුයි. (භාවය - වප්මස පුරපසළොස්වක දවස්හි පෙර වස් එළඹි භික්ෂුව විසින් පසුව එළඹි භික්ෂුවක් හෝ වස් නොඑළඹි භික්ෂුවක් හෝ බිඳගත් වස් ඇත්තා වූ භික්ෂුවක් හෝ සමග සමසමව හෝ අධිකව හෝ සංඝ පවාරණය කරණ කලැ සංඝ ඥප්තිය තබා පෙර වස් පවාරණය කරන්නා වූ භික්ෂූන් විසින් පවාරණය කටයුත්තාහුය. පසු වස් විසූ භික්ෂූන් හා බිඳුන වස් ඇති භික්ෂුහුද පෙරවස් විසූ භික්ෂූන්ගේ සම්පයෙහි පාරිසුද්ධි උපෝසථය කටයුත්තෝ වෙති. සංඝ පවාරණයට සංඝයා නොපොහොන කලැ ගණඥප්තිය තබා පෙර සේම පවාරණය කටයුතුයි. භික්ෂුහු දෙදෙනෙක් වුවාහු නම් එක් භික්ෂුවක් විසින් අනික් භික්ෂුවගේ සම්පයෙහි පවාරණය කටයුතුයි. එක් භික්ෂුවක් වී නම් පාරිසුද්ධි උපෝසථය කටයුතුයි. ඉල්මස පුර පසළොස්වක් පොහෝ දවස් හිද පවාරණය කරන භික්ෂූන් විසින් මෙසේම කටයුත්තාහ. "ඉදින් පවාරණය කරණ භික්ෂූන් කෙරෙන් පොහොය කරන්නාවූ භික්ෂුහු අධික වූවාහු නම් පාමොක් උදෙසාම ස්වල්ප භික්ෂූන් විසින් පවාරණය කටයුත්තාහුය. මේ අර්ථය සඳහා බුද්ධසික්ඛානම් සංග්‍රහ අටුවායෙහි "පවාරිතෙව සංඝම්හි- පාරිසුද්ධි උපොසථං - කරෙය්‍ය ඡින්නවස්සෝවා - අවුත්ථොවානුපගතො - චාතුමාසිනි යාචාපි - කතෙ සංඝෙනුපොස්ථෙ වුත්ථ වස්සා පවාරෙයුං - සචෙඅප්පතරාසියුං" යනු කීහ.

පවාරණ දිවසං, පවාරණ දවස, ඨපෙත්වාපන, තබා වනාහි, අඤ්ඤස්මිං කාලෙ, සෙසු කල්හි, ආවාසිකෙහි, ආවාසික භික්ෂූන් විසින්, පාතිමොක්ඛෙ උද්දිට්ඨමත්තේ, පාමොක් උදෙසූ මාත්‍රයෙහි, පරිසාය, භික්ෂු පිරිස, අවුට්ඨිතායවා, නොනැගිටි කල හෝ, එකච්චාය පරිසාය, ඇතම් භික්ෂු පිරිසක්, වුට්ඨිතායවා, නැගීගිය කල හෝ, සබ්බාය පරිසාය, සියලු භික්ෂු පිරිස, වුට්ඨිතායවා, නැගීගිය කලහෝ, අඤ්ඤ, අන්‍ය වූ, සමසමාවා, සමසමවුහෝ, ථොකතරාහිවා, ඉතා අඩු වූ හෝ, යෙභික්ඛු ආගච්ඡේයුං, යම් භික්ෂු කෙනෙක් එන්නාහු ද, තෙහි, ඒ පසුව ආ භික්ෂූන්විසින්, තේසං, ඒ ආවාසික භික්ෂූන්ගේ, සන්තිකෙ, සම්පයෙහි, වුත්තනයෙන එව, යට කියන ලද ක්‍රමයෙන්ම, පාරිසුද්ධි,

පාරිසුද්ධි උපෝසථය, ආරෝචෙතබ්බා, ඇස්විය යුත්තිය. අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන් විසින්, ආරෝචන වසෙන, ඇස්වීම වශයෙන්, යොපනායං පාරිසුද්ධි උපෝසථො, යම් පාරිසුද්ධි උපෝසථයක්, කරියති, කරණු ලැබේද, සො, ඒ පාරිසුද්ධ උපෝසථ තෙමේ, ඤත්තිං ඨපෙත්වා, ඤත්තියතබාද, අට්ඨපෙත්වාච, ඤත්තිය නොතබාද, කරණවසෙන, කටයුතු උපෝසථයාගේ වශයෙන්, දුවිධො, ද්විප්‍රකාර වේ. තත්ථ ඒ ද්විප්‍රකාර උපෝසථයන් අතුරෙන්, යස්මිං අවාසෙ, යම් විහාරයෙක් හි, තයො භික්ඛූ විහරන්ති, භික්ෂුහු තුන් දෙනෙක් වෙසෙද්ද, තෙසු, ඒ භික්ෂූන්, උපොසථ දිවසෙ, පොහො දවස්හි, සන්නිපතිතෙසු, රැස්වීමක් ඇති කල්හි, එකේන භික්ඛුනා, එක් භික්ෂුවක් විසින්, භන්තෙ, වහන්ස, ආයස්මන්තො, ආයුෂ්මත්නි, මෙ, මාගේ වචනය, සුණන්තු, අසත්වා, අජ්ජ, අද දවස, උපොසථො, පොහොය, චාතුද්දසො ඉතිවා, තුදුස්වක් පොහොයයි කියා හෝ, පණ්ණරසො ඉතිවා, පසළොස්වක් පොහොයයි කියා හෝ, වත්වා, කියා, ආයස්මන්තානං, ආයුෂ්මත් වූ නුඹ වහන්සේලාට, පත්තකල්ලංයදිහොති, ඉදින් යුක්ත ප්‍රාප්ත කල් ඇත්තේ වේනම්, මයං, අපි, අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්, පාරිසුද්ධි උපෝසථංකරෙයසාම, පාරිසුද්ධි උපොසථය කරම්හ, ඉති, මෙසේ, ඤත්තියාඨපිතාය, ඤත්තිය තැබූ කල්හි, ථෙරෙන භික්ඛුනා, වයසින් වැඩි මහල් වූ ස්ථවිර භික්ෂුවක් විසින්, එකංසං, එක් අංශයෙක්හි, උත්තරා සංඝං කරිත්වා, තනිපට සිවුර කොට, (හෙවත්) එකාංශ පොරොවා. උක්කුටිකං නිසීදිත්වා, උත්කුටකාසයෙන් හිඳ, අඤ්ජලිංපග්ගහෙත්වා, ඇඳිලි බැඳ, (හෙවත් දෙහොත් මුදුන් දී) පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධොති මංධාරේථ ඉති, පරිසුද්ධො පෙ ධාරෙථයි, තික්ඛත්තුං වත්තබ්බං, තුන්යළක් කියයුතුයි. ඉතරෙහි, අවශේෂ බාල භික්ෂූන් විසින්, භන්තෙ ඉති, භන්තෙයි, වත්වා, කියා, එවං එව වත්තබ්බා, මෙසේම තුන යළක් කියයුතුයි. එවං, මෙසේ ඤත්තිංඨපෙත්වා, ඤත්තියතබා, කාතබ්බො, කටයුතුයි, යත්ථපන, යම් විහාරයෙක් වනාහි, ද්වේ භික්ඛූ විහරන්ති, භික්ෂුහු දෙදෙනෙක් වෙසෙද්ද, තත්‍ර, ඒ විහාරයෙහි, ඤත්තිං අට්ඨපෙත්වා, ඤත්තිය නොතබා, වුත්තනයෙන එව, යට කියන ලද ක්‍රමයෙන්ම පාරිසුද්ධි ආරොචෙතබ්බා, පාරිසුද්ධිය ඇස්විය යුත්තිය. අයං, මේ කියන ලද්දේ, පාරිසුද්ධි උපෝසථො, පාරිසුද්ධි උපෝසථය නම් වේ.

එකොව භික්ඛු, එක් භික්ෂුවක්ම, සචේපනහොති, ඉදින් වේ නම්, සබ්බං පුබ්බ කරණියං, සියලු නව ප්‍රකාර වූ පූර්ව කරණ පූර්වකෘත්‍ය සමූහයා, කත්වා, කොට, අසද්දෙසං, අන්‍ය භික්ෂූන්ගේ, අනාගමනංඤත්වා, නොපැමිණීම දැන, අජ්ජ, අද (මේදවස) මෙ, මට, උපොසථො, පොහොය, චාතුද්දසො ඉතිවා, තුදුස්වක් පොහොයයයි කියා හෝ, පණ්ණරසො ඉතිවා, පසළොස්වක් පොහොය යි කියාහෝ, වත්වා කියා, අධිට්ඨාමි ඉති වත්තබ්බං, අධිට්ඨාමි යනු කියයුතුයි. අයං, මේ උපෝසථ තෙමේ, අධිට්ඨානුපොසථො ඉති, අධිට්ඨානුපොසථය නම් වේ. එවං, මෙසේ, කත්තබ්බාකාරවසෙන, කර්තව්‍යාකාර වශයෙන්, තයො උපොසථා, උපොසථයෝ තුන් දෙනෙක්, වුත්තා ඉති. කියන ලද්දහු, වේදිතබ්බා, දත යුත්තාහුය. එත්තාවතා (එත්තාවතා පරිමාණ වන්තේන වචනක්කමේන) මෙපමණ ශබ්දයන්ගේ පිළිවෙලින්, නව උපොසථා, උපෝසථයෝ නව දෙනෙක්, දීපිතා හොන්ති, ප්‍රකාශ කරණ ලද්ද හු වෙති. (නව උපෝසථයෝය යනු චාතුද්දසී පණ්ණරසී සාමග්ගි යන මොවුන්ගේ වශයෙන් තුණෙක්ද සංඝුපොසථ ගණුපොසථ පුග්ගලු පොසථයයි කාරක වශයෙන් තුණෙක් ද සුත්තු ද්දේසුපෝසථය පාරිසුද්ධි උපෝසථය අධිට්ඨානුපොසථයයි කර්තව්‍යාකාර වශයෙන් තුණෙක්දැයි මෙසේ උපොසථයෝ නව දෙනෙකි) තෙසු, ඒ නව ප්‍රකාර උපෝසථයන් අතුරෙන්, දිවසවසෙන, දවස්හු ගේ වශයෙන්, පණ්ණරසිකො, පණ්ණරසීයද, කාරක වසෙන, පොහොය කරණ පුද්ගලයන්ගේ වශයෙන්, සංඝු පොසථො, සංඝුපොසථයද, කත්තබ්බාකාරවසෙන, පොහොය කටයුතු ආකාර වශයෙන්, සුත්තුද්දෙසො ඉති, සුත්තුද්දේසයදැයි, ඒවං, මෙසේ, තිලක්ඛණසම්පන්නෝ, ත්‍රිවිධ ලක්ෂණයෙන් සම්පූර්ණ වූ, උපොසථො, උපෝසථය, ඉධ, මේ ප්‍රාතිමෝක්ෂයෙහි, නිද්දිට්ඨොති ඉති, දක්වනලදැයි, වේදිතබ්බො, දතයුතුයි, තස්මිං, ඒ උපොසථය, වත්තමානෙ, පවතිනු ලබන කල්හි, (නොහොත් පොහොය කටයුතු දවස පැමිණි කල්හි) උපෝසථං අකත්වා, පොහොය නොකොට, තදහුපොසථෙ, ඒ පොහෝ දවස්හහි, අසද්ඝං, අන්‍ය වූ, අභික්ඛුකං, භික්ෂූන් නැත්තාවූ, ආවාසංවා, විහාරයකට හෝ, අනාවාසංවා, විහාරය නොවන තැනකට හෝ, නානාසංවාසකෙහි සද්ධිං, නානාසංවාසක නම් වූ අන්‍ය නිකායික භික්ෂූන් හා සමග, සභික්ඛුකං, භික්ෂූන් සහිත වූ, ආවාසංවා, විහාරයකට හෝ, අනාවාසංවා, වෙහෙරක් නොවන තැනකට හෝ, වාසත්ථාය,

විසීම පිණිස සංඝෙන අසද්ධදාතු, සංඝයා හැර, අන්තරායා අසද්ධදාතු, දශවිධ අන්තරායෙන් තොරව, ගච්ඡන්තස්ස, යන්නා වූ මහණාහට, දුක්කටංහොති, දුකුළා ඇවැත වේ. (මෙසේ වෙන වෙනම සම්බන්ධ කොට අර්ථෝද්ග්‍රහණය කටයුතුයි. පොහොය කටයුතු දවස පැමිණි කල පොහොය නොකොට ඒ පොහෝ දවස්හිම භික්ෂූන් නැත්තා වූ වෙන අරමකට හෝ විහාරයක් නොවන්නා වූ යම් තැනකට හෝ ලබ්ධිනානා සංවාසක භික්ෂූන් වසන වෙහෙරකට හෝ සංඝයාගෙන් තොරව විහාරයක් නොවන තැනකට ගියාවූ හෝ දශවිධ අන්තරායන්ගෙන් යම්කිසි අන්තරායකින් තොරව පොහොය නොකරන්නාවූ භික්ෂුගට දුකුළා ඇවැතවෙයි) කිංසංඝස්ස පුබ්බකිච්චං ඉති, කිං පෙ පුබ්බකිච්චං යන පාඨයෙන්, (පුච්ඡති යන්නෙහි සම්බන්ධයි) සංඝො උපොසථංකරෙය්‍ය ඉති. සංඝො උපෝසථං කරෙය්‍ය යනු, එවං, මෙසේ, උපෝසථකරණ සම්බන්ධෙන එව, පොහො කිරීම් සම්බන්ධයෙන්ම, වුත්තස්ස, වදාරණ ලද්ද වූ, සංඝස්ස (සංඝෙන) සංඝයා විසින්, උපොසථෙකත්තබ්බෙ, පොහොය කටයුතු කල්හි, අනුජානාමි, භික්ඛවේ උපෝසථාගාරං සම්මජ්ජිතුං ඉති, අනුජානාමි පෙ සම්මජ්ජතුං යන ආදීනානයෙන, මේ ආදී ක්‍රමයෙන්, පාළියං, පෙළෙහි, යංපුබ්බකිච්චං, යම් පූර්වකෘත්‍යයක් තෙමේ, ආගතං, ආයේ වේද, අට්ඨකථාසුච, අටුවා වන්හිද, (ඉති) ඒවං, මෙසේ, ද්විහි නාමෙහි, නම් දෙකකින්, නවවිධං, නව ප්‍රකාර වූ, පුබ්බකිච්චං, යම් පූර්ව කෘත්‍යයක්, දස්සිතං, දක්වන ලද්දේයි, (යංතං යනු පූර්වාක්‍යයෙන් මෙහි එළවිය යුතුයි)

**"සම්මජ්ජනි පදීපොච උදකං ආසනෙනච**

**උපොසථස්ස එතානි පුබ්බකරණාන්ති වුච්චති**

**ඡන්ද පාරිසුද්ධි උතුක්ඛානං භික්ඛුගණනාච ඔවාදෙ**

**උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති" ති**

සම්මජ්ජනි පෙ වුච්චති යනු, එවං, මෙසේ, ද්විහිනා මෙහි, නම් දෙකකින්. නව විධං, නව ප්‍රකාර වූ, යංතං පුබ්බකිච්චං දස්සිතං, යම් පූර්ව කෘත්‍යයක් දක්වන ලද්ද, සම්මජ්ජනී, සීමාමාලකයෙහි කැළිකසළ හැමදීමය, පදීපොච, පහන් දැල්වීමය, ආසනෙන, අසුන් පැණවීම සමග, උදකඤ්ච, පානීය පරිභෝජනීය පැන් එළවා තැබීමය යන, එතානි චත්තාරි, මේ කාරණායෝ සතර

දෙන, උපෝසථස්ස, පොහොය කිරීමට, පුබ්බකරණං ඉති, සංඝසන්නිපාතයට පූර්වයෙහි කටයුතු පූර්වකරණයයි. වුච්චති, (වුච්චන්තෙ) කියනු ලැබෙත්, ඡන්ද පාරිසුද්ධිච, ඡන්දය එලවීමද, (ඡන්දෙච පාරිසුද්ධිච ඡන්දපාරිසුද්ධි යනු විග්‍රහය. පරපදයෙහි පූර්වපදලෝපයයි) උතුක්ඛානං, සෘතුව ඇස්වීමය, භික්ඛුගණනාච, සීමා මාලකයෙහි වැඩ හුන් භික්ෂූන් ගිණීමය, ඔවාදෙච, භික්ෂුණීන් විසින් අවවාද අනුසාසනා ඉල්වන ලද බව ඇස්වීමය යන, එතානිපඤ්චව, මේ පස්දෙන, උපෝසථස්ස, උපෝසථකර්මයාගේ, පුබ්බ කිච්චං ඉති, සංඝසන්නිපාතයෙන් පසු පොහොය කිරීමට මත්තෙන් කටයුතු කෘත්‍යයයි. වුච්චති (වුච්චන්තෙ) කියනු ලැබෙත්.

යංතං පුබ්බකිච්චං ඒ පූර්ව කෘත්‍යය, කිං, කීම, කතං, ඉති, කරණ ලද දැයි, පුච්ඡති, විචාරයි, තං, ඒ පූර්ව කෘත්‍යය, අකත්වා, නොකොට, උපොසථං කාතුං, පොහෝ කිරීමට, හි (යස්මා) නවට්ටති, යම්හෙයකින් නොවටනේද, තස්මා එසේහෙයින්, ථේරේන, මහතෙරහු විසින්, ආණත්තේන, ඇණවන ලද්ද වූ, අගිලානේන භික්ඛුනා, නොගිලන් මහණහු විසින්, උපෝසථාගාරං, පොහෝ ගෙය, සම්මජ්ජිතබ්බං, හැමදිය යුතුයි. පානීයං පරිභෝජනීයං, බොන පැන් පරිභෝජනීය පැන්, උපට්ඨපෙතබ්බං, එළවා තැබිය යුතුයි. ආසනං පඤ්ඤපෙතබ්බං, අස්න පැණවිය යුතුයි. පදීපොකාතබ්බො, පහණ දැල්විය යුතුයි. අකරොන්තෙ, නොකරණ කල්හි, දුක්කටං, දුකුළා ඇවතට, ආපජ්ජති. අවදනේ, ථෙරෙන අපි, තෙරහු විසිනුදු, පතිරූපංඤත්වා, සුදුස්සෙකු දැන, ආණාපෙතබ්බං, ඇණ විය යුතුයි. (ඒ සංඝ සන්නිපාතයෙහි රැස්වූ සුවච වූ බාල භික්ෂුවක් ලවා ඒ කටයුතු කරවිය යුතුයි යනු භාවයි)

ඡන්දපාරිසුද්ධි ඉති, ඡන්ද පාරිසුද්ධි යන, එත්ථ, මේ පාඨයෙහි, උපෝසථකරණත්ථං, පොහොය කිරීම පිණිස, සංඝෙ, සංඝයා, සන්නිපතිතෙ, රැස්වූ කල්හි, බහි උපෝසථං කත්වා, පිටත් සීමාවෙක්හි පොහොය කොට, ආගතේන, අවාවූ භික්ෂුවක් විසින්, සන්නිපතිතට්ඨානං, සංඝයා රැස්වූ තැනට, ගනත්වා, ගොස්, කායසාමග්ගිං, අදෙන්තෙන, කායාසාමාග්‍රිය නොදෙන්නහු විසින් (නොහොත් නොදෙන කල්හි) ඡන්දෙදතබ්බො, ඡන්දය දිය යුතුයි. යො භික්ඛු අපි, යම් භික්ෂුවක් තෙමේද, ගිලානොවාහොති, ගිලන් හෝ වේද, කිච්ච පසු

හොවා හොති. සබ්‍රහ්මචාරීන්ගේ ගිලන්කම් ආදී කටයුත්තෙහි නියුක්ත හෝ වේද, තෙනාපි, ඒ භික්ෂුහු විසිනුදු, පාරිසුද්ධි දෙන්තෙන. පාරිසුද්ධි දෙන කල්හි. ඡන්දෙ අපි දාතබ්බො, ඡන්දය ද දිය යුතුයි. කථං දාතබ්බො, කෙසේ දිය යුතුද යත්? ඒකස්ස භික්ඛුනාසන්තිකෙ, එක් භික්ෂුවක් හුගේ සමීපයෙහි, ඡන්දං, ඡන්දය, අහං, මම, දම්මි, දෙමි, මෙ, මාගේ, ඡන්දං, ඡන්දය, හර, එළවන සේක්වා, මෙ, මාගේ, ඡන්දං, ඡන්දය, ආරොචෙහි, අස්වන සේක්වා. ඉති අයං අත්ථො, යන මේ අර්ථය, කායේනවා, කායාද්වාරයෙන් හෝ, වාචායවා, වාක්ද්වාරයෙන් හෝ, උභයෙනවා, කායද්වාර වාක්ද්වාර දෙකින් හෝ, විඤ්ඤපෙත්බ්බො, හැගවිය යුතුයි. ඒවං, මෙසේ, (දුන් කල්හි) ඡන්දෙ දින්නෝ හොති. ඡන්දය දෙන ලද්දේ වේ. අකතුපොසථෙනවා. පොහොය නොකළ භික්ෂුවක් විසින් හෝ, ගිලානේනවා, ගිලන්භික්ෂුවක් විසින් හෝ, කිච්ච පසුතෙනවා, සබ්‍රහ්මචාරීන්ගේ ගිලන් කටයුතු ආදියෙහි නියුක්ත භික්ෂුවක්හු විසින් හෝ, පාරිසුද්ධි, පාරිසුද්ධිය (නොහොත් පිරිසිදු බව) දාතබ්බා, දිය යුත්තිය. කථංදාතබ්බා, කෙසේ දිය යුත්තිද යත්? ඒකස්ස භික්ඛුනොසන්තිකෙ, එක් භික්ෂුවක්හුගේ සමීපයෙහි, අහං, මම, පාරිසුද්ධිං දම්මි, පාරිසුද්ධිය දෙමි, මේ, මාගේ, පාරිසුද්ධිං, පාරිසුද්ධිය, හර, එළවන සේක්වා, පාරිසුද්ධිං, පාරිසුද්ධිය, අරොචෙහි, දන්වන සේක්වා, ඉති (අයං අත්ථො) යන මේඅර්ථ, කායෙනවා, කායද්වාරයෙන් හෝ, වාචායවා, වාක්ද්වාරයෙන් හෝ, උභයෙනවා, කායද්වාර වාක්ද්වාර දෙකින් හෝ, විඤ්ඤපෙතබ්බො, විශේෂයෙන් හැගවිය යුතුයි. ඒවං, මෙසේ (දුන් කල්හි) පාරිසුද්ධි, පාරිසුද්ධිය, දින්නාහොති, දෙන ලද්දේ නම්වේ. තංපන, ඒ පාරිශුද්ධිය වනාහි, දේන්තෙන, දෙන භික්ෂුව විසින්. ඡන්දෙදාතබ්බො, ඡන්දය දිය යුතුයි. හි ඒ එසේ මැයි, ඒතං, මේ කාරණය, භගවතා, භගවත්හු විසින්, අනුජානාමි භික්ඛවේ තදහුපොසථෙ පාරිසුද්ධිං දේන්තෙන ඡන්දම්පිදාතුං සන්ති සංඝස්ස කරණීයන්ති. අනුජානාමි පෙ කරණීයං යනු, වුත්තං, වදාරණ ලදී. (උදාහරණ පාඨයෙහි අර්ථ) භික්ඛවෙ, මහණෙනි, තදහු පෝසථේ, ඒ පොහෝ දවස්හි, සංඝස්ය, සංඝයාගේ, කරණීයං (කරණීයානි) සංඝකර්ම කෙනෙක්, සන්ති, ඇත්තාහුද, පාරිසුද්ධිං, පාරිසුද්ධිය, දෙන්තෙන, දෙන්නා වූ භික්ෂුහු විසින්, ඡන්දං අපි, ඡන්දය ද, දාතුං, දෙන්නට, අනුජානාමි, අවසර දෙමි. තත්ථ, ඒ ඡන්ද පාරිසුද්ධි දෙදෙනා අතුරෙන්. පාරිසුද්ධිදානං. පාරිශුද්ධියදීම, සංඝස්ස අපි,

සංඝයාගේද, අත්තනො අපි, තමාගේද, උපොසථකරණං, පොහෝ කිරීම, සම්පාදෙති, සම්පූර්ණ කෙරේ, අවසේසං, අවශේෂ වූ, සංඝ කිච්චං, සංඝයාගේ කෘත්‍යයක්, නසම්පාදෙති, සම්පූර්ණ නොකෙරේ (අවශේෂ සංඝකෘත්‍යය යනු උපෝසථකර්මය හැර අපලොකන කර්මාදි අවශේෂ විනය කර්මයෝයි) ඡන්දදනං, ඡන්දය දීම, සංඝස්ස එව, සංඝයාගේම, උපෝසථකරණඤ්ච, පොහෝකිරීමද, සෙසකිච්චඤ්ච, අවශේෂ කෘත්‍යය ද, සම්පාදෙති, සම්පූර්ණ කෙරේ, අත්තනෝපන, තමාගේ වනාහි, උපෝසථො, උපෝසථය, අකතො එව, නොකරණ ලද්දේම, යස්මා හොති, යම් හෙයකින් වේද, තස්මා, එසේ හෙයින්, පාරිසුද්ධි දෙන්තෙන, පාරිසුද්ධිය දෙන භික්ෂුහු විසින්, ඡන්දෙ අපි, ඡන්දය දාතබ්බො, දිය යුතුයි, එකේන, එක් භික්ෂුවක්හු විසින්, බහුනං අපි, බොහෝ දෙනාගේද, පුබ්බෙ වුත්තං, පූර්වයෙහි කියන ලද්ද, වූ, සුද්ධිකඡන්දංවා, පාරිශුද්ධියෙන් අමිශ්‍ර වූ ශුද්ධ ඡන්දය හෝ, ඉමං ඡන්ද පාරිසුද්ධිංවා, මේ ඡන්ද පාරිශුද්ධිය හෝ, ආහරිතුං වට්ටති, එළවන්නට වටනේයි, සචෙපන, ඉදින් වනාහි, සො, ඒ ඡන්ද පාරිශුද්ධිය එළවන භික්ෂු තෙමේ, අන්තරාමග්ගෙ, අතරමග, අඤ්ඤං භික්ඛුං පස්සිත්වා, අන්‍ය වූ භික්ෂුවක් හු දැක, තේන, ඒ භික්ෂුහු විසින්, යේසං, යම් භික්ෂු කෙනෙකුන් ගේ, ඡන්දෙවා, ඡන්දය හෝ, පාරිසුද්ධිවා, පාරිශුද්ධිය හෝ, ගහිතා, ගන්නා ලද්දී ද, තෙසඤ්ච ඒ භික්ෂුන් ගේද, අත්තනොච, තමාගේද, ඡන්දපාරිසුද්ධිං, ඡන්දපාරිශුද්ධිය ("ඡන්දෙච පාරිසුද්ධිච = ඡන්ද පාරිසුද්ධි" යනු ඒකශේෂ තද්ධිත විග්‍රහයි = නාමඤ්ච රූපඤ්ච නාම රූපං, යන්න මෙනි) දෙති, දේද, තස්ස එව, ඒ භික්ෂුහුගේම, ඡන්ද පාරිසුද්ධි, ඡන්දපාරිශුද්ධි තොමෝ, ආගච්ඡති, එයි, ඉතරා, මෙයින් අන්‍ය වූ, ඡන්ද පාරිසුද්ධි, ඡන්දපාරිශුද්ධි තොමෝ, බිලාළ සංඛලික ඡන්ද පාරිසුද්ධි නාම හොති, බලල් ගැකිල්ලකට බඳු වූ නොහොත් බළලුන්ගේ මාඤ්චුවකට බඳු උපමා ඇත්තා වූ ඡන්ද පාරිශුද්ධි නම් වේ. සා, ඒ ඡන්ද පාරි ශුද්ධි තොමෝ, න ආගච්ඡති, නොඑයි, තස්මා, එසේ හෙයින්, සයං එව, තෙමේම, සන්නිපතිතට්ඨානංගනත්වා, සංඝයාරැස්වූ තැනට ගොස්, ආරෝචෙතබ්බා, ඇස්විය යුත්තිය සඤ්චිච්ච (සංචේතෙත්වා) කල්පනා කොට හෙවත් දැන ගෙනම, ඡන්දං, ඡන්දය, සචෙන ආරොචෙති, ඉදින් නොඅස්වා නම්, දුක්කටං ආපජ්ජති, දුකුළා ඇවතට අවදනේයි, ඡන්ද පාරිසුද්ධිපන, ඡන්ද පාරිශුද්ධිය

නම් වනාහි, තස්මිං, ඒ ඡන්ද පාරිශුද්ධිය එලවූ භික්ෂුව, හත්ථපාසං (සංඝයාගේ) අත්පසට, උපගතමත්තෙ එව, පැමිණි මාත්‍රයක්ම ඇති කල්හි ආගතාහොති. (ඡන්දපාරිශුද්ධිය) එන ලද්දී වේ.

උතුක්ඛානං ඉති, උතුක්ඛානං යනු, හෙමන්තාදීනං තිණ්ණං උතූනං, හේමන්තා දිහු තුන් ඍතූන්ගේ, එත්තකං අතික්කන්තං, මෙපමණ ඉක්ම ගියේය. එත්තකං අවසිට්ඨං ඉති, මෙපමණ ශේෂව ඇත්තේ යයි, එවං, මෙසේ උතූ ආචික්ඛනං, ඍතුව ඇස්වීමයි, භික්ඛු ගණනාති, භික්ඛු ගණනා යනු, එත්තකා භික්ඛූ, මෙපමණ භික්ෂූහු තුමූ, උපෝසථග්ගෙ, උපෝසථාග්‍රයෙහි හෙවත් පොහෝ සීමාවෙහි, සන්නිපතිතා, රැස් වූවාහුය. ඉති, මෙසේ, භික්ඛූනං, භික්ෂූන්ගේ, ගණනා, ගිණීමයි, හි, (සච්චං) ඒ සැබෑමය. ඉදං උභයංපි, මේ දෙකද, කත්වා ඒව, කොටම, උපෝසථොකාතබ්බෝ, පොහොය කටයුතුයි, ඔවාදෙ ඉති, ඔවාදෙ යනු, භික්ඛු නොවාදෙ, භික්ෂුණීන් විසින් අවවාද අනුශාසනා කරවයි සංඝයාට ඇස්වීමයි, හි, ඒ එසේ මැයි, භික්ඛුනීහි, භික්ෂුණීන් විසින්, යාචිතං ඔවාදං, ඉල්වන ලද අවවාදය, අනාරොචෙත්වා, සංඝයාට නොදන්වා, උපෝසථංකාතුං, පොහොය කරන්නට, නවට්ටති නොවටනේයි, හි, ඒ වචනය විස්තර කෙරෙමි, භික්ඛුනියො, මෙහෙණිහු තුමූ, ස්වෙ සෙට දවස, උපෝසථො ඉතිවුත්තෙ, පොහෝ කිරීමයයි කී කල්හි, අජ්ජෙව, අදම, ආගන්ත්වා, අවුත්, අයං උපෝසථො, මේ උපෝසථය තෙම, චාතුද්දසො, තුදුස්වක් පොහොයක් ද පණ්ණරසො, පුණුරු සි පොහොයක් දැයි? ඉතිපුච්ඡිත්වා, මෙසේ විචාරා, පුන, නැවත, උපෝසථ දිවසෙ, පොහෝ දවස්හි, ආගන්ත්වා, අවුත්, අය්‍ය, ය්වාමිනි, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, භික්ඛු සංඝස්ස, භික්ෂු සංඝයාගේ, පාදෙවන්දති, පාදයන් වදී. ඔවාදූප සංකමනකද්ව, අවවාද අනුශාසනාවට එළඹීමද, යාචති, ඉල්වයි. අය්‍ය, ස්වාමිනි, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, ඔවාදූප සංකමනං, අවවාද අනුශාසනාවට එළඹීම, ලභතුකිර ඉති, ලබන සේක්දැයි, ඉති ඒවං, මෙසේ, ඔවාදං, අවවාදය, යාචන්ති, ඉල්වන්නා හු ද, තං, ඒ යාචක්‍ද වචනය, බාල ගිලානගම්කෙ, අදක්ෂ වූනවක භික්ෂූහුය ගිලන් භික්ෂූහුය ගමන් යන්නා වූ භික්ෂූහුය යන මොවුන්, ඨපෙත්වා, තබා, අඤ්ඤෙදා, අන්‍ය වූ භික්ෂුවක් තෙමේ, ආරඤ්ඤකොපි, ආරණ්‍ය ධූතංගධාරී වූ භික්ෂුවක් වුයේ, සචෙහොති, ඉදින්

වේනම්, අප්පටිග්ගණ්හන්තං, නොපිළිගැන්ම පිණිස, යස්මා නලභති. යම් හෙයකින්, නොලැබේ ද, තස්මා, එසේ හෙයින් යෙන භික්ඛුනා, යම් භික්ෂුවක් හු විසින්, සොඔවාදො, ඒ අවවාදය තෙම, පටිග්ගහිතො, පිළිගන්නා ලද්දේ ද, තේන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්, උපොසථග්ගෙ, පොහොය සීමාවෙහි, පාතිමොක්ඛුද්දේසකො, පාමොක් උදෙසන්නා වූ, භික්ඛු, භික්ෂුවක්, ඒවං වත්තබ්බො, මෙසේ කිය යුතුයි. භන්තෙ, ස්වාමීනී. භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝතෙම, භික්ඛු සංඝස්ස, භික්ෂු සංඝයාගේ, පාදෙවන්දති, පාවදියි, ඔවාදූප සංකමනඤ්ච, අවවාදයට එළඹීටද, යාචති, ඉල්වයි, භන්තෙ, වහන්ස, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙම, ඔවාදූප සංකමනං, අවවාදයට එළඹීම, ලභතුකිර, ලබන සේක්වා, ඉති, මෙසේ, පාතිමොක්ඛුද්දෙසකේන, පාමොක් උදෙසන භික්ෂුහු විසින්, කොචි භික්ඛුනොවාදකො, යම්කිසි භික්ෂුණීන්ට අවවාද දෙන්නා වූ, සම්මතො, සංඝයා විසින් සම්මත කරණ ලද්ද වූ, භික්ඛු අත්ථි, භික්ෂුවක් තෙම, ඇත්තේ දැයි, ඉති එතං වචනං, යන මේ වචනය, වත්තබ්බං, කියයුතුයි, භික්ඛු නොවාදකො, භික්ෂුණීන්ට අවවාද දෙන්නා වූ, සම්මතො, සංඝයා විසින් සම්මත වූ, කොචි භික්ඛු, යම්කිසි භික්ෂුවක් තෙමේ, සචෙහොති. ඉදින් වේද, තතො, ඊටඅනතුරුව, තේන, ඒ පාමොක් උදේසන භික්ෂුහු විසින්, සො, ඒ යාචිඥුව ඉවසන භික්ෂුව, ඉත්ථන්නාමො භික්ඛු, මේ නම් ඇත්තා වූ, භික්ෂුව, භික්ඛුනොවාදකො, භික්ෂුනීන්ට අවවාද කරන භික්ෂුව යයි, සම්මතො, සම්මත කරන ලද්දේද, තං, ඒ භික්ෂුව කරා, භික්ඛුනීසංඝො උපසංකමතු, භික්ෂුණී සංඝ තෙමේ, එළඹෙන සේක්වා, ඉතිවත්තබ්බො, මෙසේ කිය යුතුයි, සචෙනත්ථි, ඉදින් එබදු භික්ෂුවක් නැත්තේ වී නම්, තතො, ඊට අනතුරුව, තේන, ඒ පාමොක් උදෙසන භික්ෂුහු විසින්, කො ආයස්මා, කවර ආයුෂ්මත් කෙනෙක්, භික්ඛුනියො, භික්ෂුණීන්, ඔවදිතුං, අවවාද කරන්නට, උස්සහතිති, පොහොසත් වේ දැයි, පුච්ඡිතබ්බං, විචාළ යුතුයි, කොචි භික්ඛු, යම්කිසි භික්ෂුවක් තෙමේ, සචෙ උස්සහති, ඉදින් උත්සාහ කෙරේද (නොහොත්) පොහොසත් වේනම්, සො පිච, ඒ භික්ෂු තෙමේ ද, අංගී අංගේහි, අෂ්ටාංගයකින් (අංග අටකින්) සමන්නාගතොහොති, සම්පූර්ණ වූයේ වේද, තං, ඒ භික්ෂුව, තත්ථේව, ඒ සීමාමලකයෙහිම, සම්මන්නිත්වා, සම්මත කොට, ඔවාදපටිග්ගාහකො, මෙහෙණීන්ට අවවාද ඉල්ලීම පිළිගත් භික්ෂුව වත්තබ්බො, කියයුතුයි,

ඉත්ථන්නාමො භික්ඛු, මෙනම් ඇත්තා වූ භික්ෂුව, භික්ඛුනොවාදකො, මෙහෙණීන්ට අවවාද දෙන්නා වූ භික්ෂුවයයි, සම්මතො, සම්මත කරණ ලදී, තං, ඒ භික්ෂුව කරා, භික්ඛුනි සංඝො, භික්ෂුණී සංඝ තෙම, උපසංගකමතු ඉති, එළඹෙන සේක්වායි, වත්තබ්බො, කියයුතුයි. කොචි, කිසියම් භික්ෂුවක් තෙමේ, යමෙ නළස්සගති, ඉදින් පොහොසත් නොවේ නම්, පාතිමොක්ඛුද්දේසකෙන, පාමොක් උදෙසන්නාවූ භික්ෂුහු විසින්, වත්තබ්බං, කියයුත්තේයි, භික්ඛුනොවාදකො, භික්ෂුණීන්ට අවවාද දෙන්නා වූ, සම්මතො, සංඝයා විසින් සම්මත කරණ ලද්ද වූ, කොචි භික්ඛු, කිසි භික්ෂුවක් තෙමේ, නත්ථි, නැත්තේය, පාසාදිකෙන, ප්‍රශාදය ආරක්ෂා කිරීම වශයෙන්, භික්ෂුනී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, සම්පාදෙතු, සම්පූර්ණ වන සේක්වා, ඉති වත්තබ්බං, මෙසේ කියයුතුයි. හි, ඒ එසේ මැයි, එත්තාවතා, මෙපමණකින්, සික්ඛත්තය සංගහිතං, ත්‍රිවිධ ශික්ෂාවෙන් සංග්‍රහ කරණ ලද්ද වූ, සකලංසාසනං, සියලු සාසනය, ආරොචිතංහොති, අස්වන ලද්දේ වෙයි. තේන භික්ඛුනා, ඒ ඉවසන භික්ෂුව විසින්, සාධුති, මැනවැයි, සම්පටිච්ඡිත්වා, පිළිගෙන, පාටිපද දිවසෙ, පෑළවිය දවස්හි, භික්ඛුනීනං, භික්ෂුණීන්ට, ආරොචෙතබ්බං, ඇස්විය යුතුයි, භික්ඛුනි සංඝෙනාපි, භික්ෂුණී සංඝයා විසිනුදු, තාභික්ඛුනියො, ඒ භික්ෂුණීහු, පෙසෙතබ්බා, පිටත් කළ යුත්තාහ, අය්‍යෙප, ස්වාමිනී, ගච්ඡථ, යව්, අය්‍යප, ස්වාමීන් වහන්ස, භික්ඛුනි සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභතුකිර ඉති, ලබන්නේදැයි, පුච්ඡථ ඉති, මෙසේ විචාරව් යයි, පෙසෙතබ්බා, පිටත් කළ යුත්තාහුය, අය්‍යෙප, වහන්ස, සාධුඉති, යහපතැයි, සම්පටිච්ඡිත්වා, පිළිගෙන, තංභික්ඛුං, ඒ භික්ෂුව කරා, උපසංගකමිත්වා, එළඹ, ඒවං වත්තබ්බො, මෙසේ කියයුතුයි, අය්‍යප, වහන්ස, භික්ඛුනිසංඝො, භික්ෂුණී සංඝ තෙමේ, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභතිකං, ලබන්නේදැයි, ඉති වතතබ්බං, මෙසේ කියයුතුයි, තේනභික්ඛුනා, ඒ භික්ෂුව විසින්, භගිනියො, නැගනියෙනි, භික්ඛුනොවාදකො, භික්ෂුනීන්ට අවවාද කරන්නා වූ, සම්මතො, සංඝයා විසින් සම්මත කරණ ලද්ද වූ, කොචි භික්ඛු නත්ථි, කිසි භික්ෂුවක් තෙමේ නැත්තේයි, පාසාදිකේන, ප්‍රශාදය එළවීම් වශයෙන් (හෙවත්) ප්‍රශාදය ආරාක්ෂා කිරීම් වශයෙන්, භික්ඛුනි සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, සම්පාදෙතු, සම්පූර්ණ වන සේක්වා, ඉති වත්තබ්බං, මෙසේ කිය යුතුයි, තාහි, ඒ භික්ෂුණීන් විසින්, අය්‍යප,

වහන්ස, සාධු ඉති, මැනවැයි, සම්පටිච්ඡිතබ්බං, පිළිගත යුතුයි, ඉදඤ්ච වචනං. මේ වචනය ද, එකතො ආගතානං, එකට ආවාවූ, ද්වින්නංවා, භික්ෂුන් දෙදෙනෙකුන්ගේ හෝ, තිණ්ණංවාවසේන, භික්ෂූන්, තුන් දෙනෙකුන්ගේ වශයෙන් හෝ, වුත්තා, කියන ලදී. පන, තථාපි) එසේ කියන ලද්දේ නමුදු, තාසු, ඒ භික්ෂුනීන් අතුරෙන්, එකාය භික්ඛුනියාච, එක් භික්ෂුණියක්හු විසින්ම, භික්ඛුනිං, මෙහෙණියක්, වත්තබ්බංචේව, කියයුත්තේ ද වේ, සම්පටිච්ඡිතබ්බංඤ්ච, පිළිගත යුත්තේ ද වේ, ඉතරා, සෙසු භික්ෂුණීහු තුමූ, තස්සා, ඒ භික්ෂුනියට, සහායිකා, යෙහෙළිනියෝ වූවාහුයි.

භික්ඛු සංඝොවා, භික්ෂු සංඝ තෙමේ හෝ, භික්ඛුනී සංඝොවා, භික්ෂුණී සංඝ තෙමේ හෝ, සමේපන නපූරති, ඉදින් සම්පූර්ණ නොවේ නම්, උභයතොපිවා, භික්ෂු භික්ෂුණී දෙපක්ෂයෙන්ම හෝ, ගණමත්තං එවවා, ගණමාත්‍රයක්ම හෝ, පුග්ගල මත්තංවාහොති. පුද්ගල මාත්‍රයක් හෝ වේද, තත්‍ර, ඒ අපරිපූර්ණ ස්ථානයෙහි, අයං, මේ මතු වක්ෂ්‍යමානවනු ලබන්නේ, වචනක්කමො, ශබ්ද ක්‍රමයයි, අය්‍ය, ස්වාමිනි, භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ, භික්ඛු සංඝස්ස, භික්ෂු සංඝයාගේ, පාදෙවන්දති, පාවඳිත්, ඔවාදූප සංකමඤ්ච, අවවාදයට එළඹීමද, යාචාමි, යාච්ඤා කෙරෙමි, අය්‍ය, වහන්ස, අහං, මම, ඕවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභාමිතිච, ලබම්දැයි කියාද, අය්‍ය, වහන්ස, භික්ඛුනි සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, අය්‍යනං, ස්වාමීන් වහන්සේලාගේ, පාදෙවන්දති. පාවඳී. ඔවාදූපසංකමනංඤ්ච, අවවාදයට එළඹීමද, යාචති. යාච්ඤා කරයි, අය්‍ය, වහන්ස, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභන්තුකිර ඉතිචා, ලබාවායි කියාද අය්‍ය, වහන්ස, භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ අය්‍යානං, නුඹ වහන්සේලාගේ, පාදෙවන්දති පාවඳිති, ඔවාදූපසංකමනඤ්ච, අවවාදයට එළඹීමද, යාචන්ති, යාච්ඤා කෙරෙති, අය්‍ය, ස්වාමීන් වහන්ස, භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ, ඔවාදූපසංකමනං අවවාදයට එළඹීම, ලභන්තුකිර ඉතිවා, ලබත්වායි කියාද, අය්‍ය, වහන්ස, අහං, මම, අය්‍යා නං, ස්වාමීන් වහන්සේලාගේ පාදෙ වන්දමි, පාවඳිමි, ඔවාදූප සංකමනඤ්ච, අවවාදයට එළඹීටද, යාචාමි, යාච්ඥ කරෙමි. අය්‍ය, වහන්ස, අහං, මම, ඔවාදූප සංකමනං, අවවාදයට එළඹීම, ලභාමිතිච, ලබම් දැයි කියාද, අය්‍ය, වහන්ස, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙම, අය්‍යස්ස,

ස්වාමීන් වහන්සේගේ, පාදෙවන්දති, පාවදියි, ඔවාදූප සංකමනඤ්ච, අවවාදයට එළඹීමද, යාචති, ඉල්වයි, අය්‍ය, වහන්ස, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙම, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභතුකිර ඉතිච, ලබන සේක්වායි කියාද, අය්‍ය, වහන්ස, භික්ඛුණියෝ භික්ෂුණීහු තුමූ, අය්‍යස්ස, ස්වාමීන් වහන්සේගේ, පාදෙ වන්දන්ති, පාවදිති, ඔවාදූපසංකමනඤ්ච, අවවාදයට එළඹීම ද, යාචන්ති, යාච්ඤා කෙරෙති, අය්‍ය, වහන්ස, භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ, ඔවාදූප සංකමනං, අවවාදයට එළඹීම, ලභන්තුකිර ඉතිච, ලබත්වා කියාද, අය්‍ය, වහන්ස, අහං, මම, අය්‍යස්ස, ස්වාමීන් වහන්සේගේ, පාදෙවන්දමි, පාවදිමි, ඔවාදූපසංකමනඤ්ච, අවවාදයට එළඹීමද, යාචාමි, යාච්ඤා කෙරෙමි, අය්‍ය, වහන්ස, අහං, මම, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභාමිතිච, ලබම්දැයි කියාද, වත්තබ්බං, කියයුතුයි, තේනපි භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්ද, උපෝසථකාලෙ, පොහෝකරණ කල්හි, ඒවං වත්තබ්බං, මෙසේ කිය යුතුයි, භන්තෙ, ස්වාමීනි, භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ, භික්ඛු සංඝස්ස, භික්ෂු සංඝයාගේ, පාදෙවන්දන්ති, පාවදිති, ඔවාදූපසංක මනඤ්ච, අවවාදයට එළඹීමද, යාචන්ති, යාච්ඤා කෙරෙති, භන්තෙ, වහන්ස, භික්ඛුනියො, භික්ෂුනීහු තුමූ, ඔවාදූප සංකමනං, අවවාදයට එළඹීම, ළභන්තුකිර ඉතිච, ලබත්වායි කියාද, භන්තෙ, වහන්ස, භික්ඛුනියො, භික්ෂුණී හු තුමූ, භික්ඛු සංඝස්ස, භික්ෂු සංඝයාගේ, පාදෙවන්දන්ති, පාවදිති, ඔවවාදූපසංකමනඤ්ච, අවවාදයට එළඹීමද, යාචන්ති, යාච්ඤා කෙරෙත්, භන්තෙ, වහන්ස, භික්ඛුනී, මෙහෙණියක් තොමෝ, ඔවාදූප සංකමනංච, අවවාදයට එළඹීම, ලභතුකිර, ලබන්නේ දැයි, භන්තෙ, වහන්ස, භික්ඛුනි, මෙහෙණියක් තොමෝ, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභතුකිර ඉතිච, ලබන සේක් දැයි කියාද, භන්තෙ, වහන්ස, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, භන්තෙ, වහන්ස, භික්ඛුනියො, භික්ෂුණීහු, තුමූ, භන්තෙ, වහන්ස, භික්ඛුනී, භික්ෂුනියක් තොමෝ, ආයස්මන්තානං, ආයුෂ්මතුන්ගේ, පාදෙවන්දති, පාවදනේයි, (මෙහි අවසාන වචන මාත්‍රයක් දැක්වූයේ යැයි සුදුසු පරිද්දෙන් යොද ගත යුතුයි) ඔවාදූප සංකමනඤ්ච, අවවාදයට එළඹීම ද, යාචති, යාච්ඤා කෙරෙයි, භන්තෙ, වහන්ස, භික්ඛුනී, භික්ෂුණියක් තොමෝ, ඔවාදූප සංකමනං, අවවාදයට එළඹීම, ලභතුකිර, ලබන සේක් දැයි කියාද, භන්තෙ, වහන්ස, භික්ඛුනී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, භන්තෙ, වහන්ස,

භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ, ලභන්තුකිර. ලබත්වායි කියාද, භන්තෙ, වහන්ස, භික්ඛුනී, භික්ෂුණියක් තොමෝ, ඔවාදූපසංකමනං, අවවාදයට එළඹීම, ලභතුකිර ඉතිච. ලබන සේක්වා යි කියාද, වත්තබ්බං, කියයුතුයි. උපෝසථග්ගෙ, පොහොය සීමාවෙහි, පාතිමොක්ඛුද්දේදකෙනවා. පාමොක් උදෙසන භික්ෂුහු විසින් හෝ, ඤත්ති ඨපකෙනවා ඤත්තිය තබන භික්ෂුහු විසින් හෝ (මෙහි ගණඤත්තිය තබන භික්ෂුව දත යුතුයි) ඉතිරෙනවා භික්ඛුනා, පිළිගත් මහණහු කෙරෙන් අනික් මහණෙකු විසින් හෝ, සම්මතො භික්ඛු, සම්මත කරණ ලද භික්ෂු තෙමේ, සචෙ අත්ථි, ඉඳින් ඇත්තේ වේද, පුරිමනයේනෙව, පළමු කීනයින්ම, තංභික්ඛුං, ඒ භික්ෂුව කරා, භික්ඛුණී සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, තං භික්ඛුං, ඒ භික්ෂුව කරා භික්ඛුනියො. භික්ෂුණීහු තුමූ, තං භික්ඛුං, ඒ භික්ෂුව කරා, භික්ඛුනී, මෙහෙණි තොමෝ, උපසංකමතු එලඹෙන සේක්වා, උපසංකමන්තු එළඹෙනත්වා උපසංකමතු ඉති, එළඹේවායි, වත්තබ්බං, කියයුතුයි, සම්මතො, සම්මත කරණ ලද්ද වූ භික්ෂුවක් තෙමේ, යචෙනත්ථි, ඉඳින් නැත්තේ වී නම්, පාසාදිකේන, ප්‍රශාද එළවීම් වශයෙන්, භික්ඛුනි සංඝො, භික්ෂුණී සංඝ තෙමේ, භික්ඛුනියො, භික්ෂුණීහු තුමූ, භික්ඛුනී, භික්ෂුණි තොමෝ, සම්පාදෙතු, සම්පූර්ණවන සේක්වා, සම්පාදෙන්තු, සම්පූර්ණ වෙත්වා, සම්පාදෙතු ඉති, සම්පූර්ණ වන සේක්වායි, වත්තබ්බං, කියයුතුයි. ඔවාදපටිග්ගාහකෙන, අවවාදකෙරෙමැයි පිළිගත් භික්ෂුව විසින්, පාටිපදෙ, පැළවිය දවසහි, තං, ඒ වචනය, පච්චාහරිත්වා, නැවත වරක් එළවා, තථෙව, ඒ පූර්වයෙහි කී පරිද්දෙන්ම, වත්තබ්බං, කියයුතුයි. ඒත්ථ, මේ භික්ඛුනෝ වාදෙ යන පදයෙහි, අයං සංඛෙප විනිච්ජයො, මේ සංක්ෂේප වූ අර්ථ විනිශ්චයයි. ඒවං, මෙසේ, භික්ඛුනීහි, භික්ෂුණීන් විසින්, යාචිතඥ ඔවාදං, යාචිතකරණ ලද අවවාදය (හෙවත්) අවවාදයට එළඹේවායි යන වචනය, ආරොචෙත්වාච, දන්වාම, උපොසතොකාතබ්බො, පොහෝ කටයුතුයි. තේන එහෙයින්, ඡන්ද පාරිසුද්ධි පෙ පුබ්බකිච්චන්ති වුච්චතිති, ඡන්ද පාරිසුද්ධි පෙ පුබ්බ කිච්චන්ති වුච්චති යනු වුත්තං, කියන ලදී.

පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථාති, පාරිසුද්ධිං, පෙ ආරොචෙථ යනු, අත්තනො. තමාගේ, පරිසුද්ධ භාවං, පිරිසිදු බව, ආරොචෙථ, ආරොචනය කරව්, පාතිමොක්ඛං උද්දිසිස්සාමීති, පාතිමොක්ඛං උද්දිසිස්සාමි යන ඉදං වචනං, මේ ශබ්දය තෙමේ, පාරිසුද්ධි ආරොචනස්ස, පිරිසිදු බව ඇස්වීමට,

කාරණ වචනං, හේතු භූත ශබ්දයයි, හී, ඒ වචනය සැබෑමය, භික්ඛවේ, මහණෙනි, ආපත්තිකේන, අවන් ඇවත් සහිත වූ, භික්ඛුනා, මහණහු විසින්, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය, නසොතබ්බං, නොඇසිය යුතුයි. යොභික්ඛු, යම් මහණෙක් තෙමේ, සුණෙය්‍ය, (පාමොක්) අසන්නේ වී නම්, දුක්කටස්ස, දුකුළාඇවතට, ආපත්ති, (ආපජ්ජනං) හොති, පැමිණීම වෙයි. ඉති වචනතො, මෙසේ වදළ හෙයින්, අපරිසුද්ධෙහි, ඇවතින් පිරිසිදු නුවූ භික්ෂූන් විසින්, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය. සොතුංනවට්ටති, අසන්නට නොවටනේයි, තේන, එහෙයින්, පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ පාතිමොක්ඛං උද්දිසිස්සාමිති, පාරිසුද්ධිං පෙ උද්දිසිස්සාමි යනු, වුත්තං, වදරන ලදී. ඒත්ථ පදෙ, මේ "පාතිමොක්ඛං උද්දිසිස්සාමි යන පදයෙහි, කස්සචි, යම්කිසිවක්හුගේ, චෝදනාසියා, චෝදනාවක් වන්නේය. සංඝො උපෝසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍යාති, සංඝො පෙ උද්දිසෙය්‍ය යනු වුත්තත්ථා වදාල හෙයින් ඉදාපි මෙ පාතිමොක්ඛං උද්දිසිස්සාමි යන පෙදෙහිද, පාතිමොක්ඛං, උද්දිසිස්සතීති, පාතිමොක්ඛං උද්දිසිස්සති යනු, වත්තබ්බං, කියයුතුයි. හි, ඒ සැබෑමය. එවංසති, මෙසේ කියන ලද කල්හි, පුබ්බේන, පූර්ව වචනය හා අපරං, පශ්චිම වචනය, සන්ධියති. ගළපනු ලැබේ. ඉති (අයංචොදනාසියා, මෙසේ මෙබඳු චෝදනාවක් වන්නේය. පරිහාරො, ඊට පරිහාරය මයාවුච්චතේ, මා විසින් කියනු ලැබේ) ඒතං, මේ පාතිමොක්ඛං උද්දිසිස්සාමි, යන පද තෙමේ, වචන මත්තමේව ශබ්ද මාත්‍රයක්ම, නසන්ධියති, නොගැලපෙනු ලැබේ. ලක්ඛණ තොපන, ලක්ෂණ වශයෙන් වනාහි, සමෙති, සමවෙයි. සංඝස්ස, සංඝයාගේ, සාමග්ගියා, සාමාග්‍රිය හේතුකොට ගණ, ගණස්ස, ගණයාගේ, සාමග්ගියා, සාමාග්‍රිය හේතු කොටගෙණ, පුග්ගලස්ස, පුද්ගලයාගේ, උද්දෙසා, පහළකිරීම හේතු කොටගෙන, සංඝස්ස, (සංඝෙන) සංඝයා විසින්, පාතිමොක්ඛං උද්දිට්ඨං, ප්‍රාතිමෝක්ෂය උ දෙසන ලද්දේ, හි, (යස්මා) හොති, යම් හෙයකින් වේද) ඉති ඉදං, යන මේ කාරණය, එත්ථ, මේ ප්‍රාතිමොක්ෂයෙහි, ලක්ඛණං, ලක්ෂන නම්වේද, තස්මා, එසේ හෙයින්, පාතිමොක්ඛං උද්දිසිස්සාමිති ඉදමේව, පාතිමොක්ඛං උද්දිසිස්සාමි යන මේ වචනයම, එත්ථ, මේ ස්ථානයෙහි, වත්තබ්බං කියයුතුයි. තං සබ්බෙවසන්තා සාධුකං සුනොම මනසිකරොමාති, තං, පෙ මනසිකරොම යන, එත්ථ, මේ පාඨයෙහි, තං ඉති, තං යනු, පාතිමොක්ඛං, ප්‍රාතිමෝක්ෂය, සබ්බෙවසන්තාති,

සබ්බේවසන්තා යනු, හස්සා පරියාය, ඒ පිරිසෙහි, යාවතිකාථෙරා, යම් පමණ ස්ථවිර වූ, මයකද්ව, අපි ද, නවා, බාලවූ, මයකද්ව, අපිද, මජ්ඣිමා, මධ්‍යම වූ මයං ච, අපිද, සාධුකංසුනොමාහි, සාධුකංසුණොාම යනු, අට්ඨිකත්වා, තමාගේ ශරීරය ප්‍රාතිමෝක්ෂයෙන් ධනවතෙකු කොට (හෙවත්) ප්‍රාතිමෝක්ෂය තමාගේ ධනය කොට, මනසිකරිත්වා, මෙනෙහි කොට, සෝතද්වාරවසේන, ශ්‍රොත්‍රද්වාරික ජවන චිත්ත විථි වශයෙන් සබ්බචෙතසා, සියලු චිත්තයෙන්, සමන්නාහරාම, මොනවට එළවමු හෙවත් මොනවට ආවර්ජනා කරමු. (මේ අට්ඨිකත්වා යන්නෙහි අට්ඨි ශබ්ද තෙමේ ධනවාචකයි "අට්ඨ කතා" යන පදයෙහි මෙන් "තථානරානංටථ්ණලා" යන මුගලන් සූත්‍රෙන් ටකාරයට ඨකාරාදේශකොට අභූත තද්භාවාර්ථයෙහි ඊ ප්‍රත්‍යය කොට "අට්ඨිකත්වා" යි තුබූ තන්හි ඊ කාරයට හ්‍රස්ව කොට සිද්ධයි. එහි භාවය ලෝකයෙහි ධනය ඇත්තා වූ පුරුෂ තෙමේ තමාගේ ධනය නොනස්නා පිණිස පෙට්ටි පියලි ආදියෙහි දමා යම්සේ සුරක්ෂිත කෙරේද එපරිද්දෙන් තමාගේ ශරීරය හෝ ආත්මය ප්‍රාතිමෝක්ෂයෙන් ධනවත් කොට සිත් නමැති මඤ්ජූසාවෙහි බහා ශ්‍රොත්‍රද්වාරික ජවන විථින්ගේ වශයෙන් සිතින් බැහැර නොයන පරිද්දෙන් කොට නිරන්තරයෙන් මෙනෙහි කෙරෙයි යනුයි) මනසිකරොම ඉති, මනසිකරොම යනු, එකග්ගචිත්තාභුත්වා, එක අරමුණෙක්හි පවත්නාවූද සිත් ඇත්තාහුව්, චිත්තෙඨපෙයනාම, සිත්හි තබම්හ. එත්ථච, මේ සුණොමමනසිරොම යන වාක්‍යයෙහිද, පාතිමොක්ඛං උද්දිසිසසාමි ඉති, පාතිමොක්ඛං උද්දිසිස්සම්යනු, වුත්තතත්තා, වදළ හෙයින්, සුණොථ මනසිකරොථාති, අසන්වායි මෙනෙහි කරත්වායි, වත්තුං, කියන්නට, යුත්තංවිය, යෙදෙන්නාක් මෙන්, කිසද්වාපිදිස්සති, ඉදින් වැටහේ නම්, පනතථාපි, එපරිද්දෙන් වැටහෙන්නේ නමුදු, සංඝො උපෝසථං කරෙයත්‍යඉති ඉම්නා, සංඝො උපෝසථංකරෙයත්‍ය යන මේ පදය හා සමග නසමෙති, සම නොවෙයි. හි (කස්මා) කුමක් හෙයින් සම නොවේද යත්? සමග්ගස්ස සංඝස්ස, සමගි සංඝයාගේ, ඒතං උපෝසථකරණංහොති, මේ පොහෝ කිරීම වෙයි. පාතිමොක්ඛුද්දේසකොච, පාමොක් උදෙසන භික්ෂු තෙමේද, සංඝ පරියාපන්නෝ එව, සංඝයා කෙරෙහි ඇතුළත් ම වේ. ඉති (එවං) මෙසේ, අස්ස, ඒ පාමොක් උදෙසන භික්ෂුහුගේ, සංඝපරියාපන්නත්තා, සංගයා කෙරෙහි ඇතුළත් වන හෙයින්, සුණොම මනසිකරොමාති ඉදං එව වචනං, සුණොම මනසිකරොම යන මේ වචන

මාතුයම, වත්තුං, කියන්නට, යුත්තං, යෙදේ, ඉදානි, දැන්, පාරිසුද්ධිං, ආයස්මන්තො, ආරොචෙථ ඉති, පාරිසුද්ධිං පෙ ආරොචෙථයන, යං වචනං, යම් වචනයක් වුත්තං, කියන ලද්දේද, තත්ථ (තස්මිං වචනේ) ඒ වචනයෙහි, යථා (යෙන කාරෙන) යම් ප්‍රකාරයකින්, පාරිසුද්ධි ආරොචනංහොති, පාරිසුද්ධිය ඇස්වීම වේද, තංදස්සෙතුං, ඒ ප්‍රකාරය දක්වනු පිණිස, යස්සසියා ආපත්ති සොආවි කරෙය්‍ය ඉති, යස්ස පෙ ආවිකරෙය්‍ය යනු, ආහ (අවොච, වදළ සේක.

තත්ථ (තස්මිං වචනෙ) ඒ වචනයෙහි, යස්සසියා ඉති, යස්සපුග්ගලස්ස. යම් පුද්ගලයෙක් හට, ඡන්නං ආකාරානං, ෂඩාකාරයන් අතුරෙන්, අඤ්ඤතරේන ආකාරෙන, එක්තරා ආකාරයකින්. ආපත්ති, ආපත්ති තොමෝ, ආපන්නාභවෙය්‍ය, පැමිණියා වන්නේද (ඒ වචනය විස්තර කෙරෙම්) ආපත්තිං ආපජ්ජන්තො, ඇවතට පැමිණියා වූ හෙවත් පැමිණි කල්හි, අලජ්ජිතා, ලජ්ජා නැති බැවින්ද අඤ්ඤාණතා, දැන නොගත් බැවින්ද, කුක්කුච්චපකතත්තා, සැකයෙන් පෙළෙන ලද බැවින්ද, අකප්පියෙ, අකප වූවස්තුවෙහි, කප්පිය සඤ්ඤිතා. කැපයය යුන සංඥ ඇති හෙයින්ද, කප්පියේ කැප වස්තුවෙහි අකප්පිය සඤ්ඤිතා, අකැප යන සංඥ ඇති බැවින්ද සතිසම්මොසා. සිහියෙන් තුරන් වීමෙන්ද,, ඉති ඉමෙහි ඡ හි ආකාරෙහි, මේ සවැදෑරුම් වූ ආකාරයෙන්, ආපජ්ජති, පැමිනෙයි, අලජ්ජිතාය, ලජ්ජා නැති බැවින්, කථං ආපජ්ජති සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති, කෙසේ පැමිණෝ ද යත්, අකප්පිය භාවං, නොකැප බව ජානන්තො එව, දැන ගනිමින්ම, මද්දිත්වා, වස්තුව මැඩගෙන, වීතික්කමනං කරොති, ඉක්මීම කෙරේද, එතං, ඒ කාරණය ආපත්තිං පරිගුහති අගතිගමනඤ්ච ගච්ඡති එදිසොවුච්චති අලජ්ජි පුග්ගලොති, සංචිච්ච පෙ පුග්ගලො යනු, වුත්තම්පිච (වුත්තං එව) වදාරන ලද්දේ මැයි (උදාහරණ පාඨයාගේ අත්ථ) සංචිච්ච (සංචේතෙත්වා) ආපත්ති වස්තුව මඩිම්යන චේතනාව කොට, ආපත්තිං ආපජ්ජිති, ඇවතට අවදී ද, ආපත්තිං පරිගුහති, ඇවත සඟවා ද, අගතිගමනඤ්ච ගච්ඡති, නොයා යුතු වූ අගතියට යේද, එදිසො මෙබඳු ස්වභාව ඇත්තා වූ පුද්ගල තෙම, අලජ්ජි පුග්ගලො ඉති, අලජ්ජි පුද්ගලයයි. වුච්චති, කියනු ලැබේ.

අසඤ්ඤතාය, නොදැනීමෙන්, කථං ආපජ්ජති, කෙසේ පැමිණේ ද යත්. අසඤ්ඤතා පුග්ගලො, නොදන්නා වූ පුද්ගල තෙමේ, හි (යස්මා) යම් හෙයකින්, මන්දෙ, බාලවේද, මොමුහො, මෝහයෙන් මුළාවේද, තස්මා, එසේ හෙයින්, කත්තබ්බා කත්තබ්බං, කටයුතු නොකටයුතු, අජානන්තො, නොදන්නේ, අකත්තබ්බංකරොති, නොකටයුත්තක් කෙරෙයි, කත්තබ්බං විරෝධෙති, කටයුත්ත වළක්වයි. ඒවං, මෙසේ, අසඤ්ඤතාය, නොදැන්මෙන්, ආපජ්ජති, ඇවතට අවදනේයි.

කුක්කුච්ච පකතත්තාය, සැකයෙන් මැඩපැවැත්වීමෙන්, කථං ආපජ්ජති, කෙසේ ඇවතට පැමිණේද, කප්පියා කප්පියංනිස්සාය, කැප අකැප දෙය නිසා, කුක්කුච්චෙ උප්පන්නෙ, සැකයක් උපන් කල්හි, විනය ධරං පුච්ඡිත්වා, විනයධරයෙකු විචාරා කප්පියං චෙයියා, ඉදින් කැප වේ නම්, කත්තබ්බං, කටයුතුයි, අකප්පියංචෙසියා, ඉදින් අකැප වේනම්, නකත්තබ්බං, නොකටයුතුයි, අයංපන පුග්ගලො, මේ පුද්ගල තෙමේ වනාහී (අයංපන වත්ථුයි, සම්බන්ධ කටයුතුයි එනකුදු වූවත් වත්ථු ශබ්දය හා සම්බන්ධ නොවන්නාක් මෙන් පෙනේ. කුමක් හෙයින්ද යත්? "වත්ථු" ශබ්දයනපුංසකලිංගුවේ "අයං" යන පදය පුල්ලිංගුවෙහි එසේ ද වුවත් ලිංග විපරිණාම වශයෙන් සම්බන්ධ වෙයි. යනු ආචාර්ය මතයි වට්ටති ඉති, වටනේ යයි, මද්දිත්වා, වස්තුව මර්දනය කොට, විතික්කමති එව. ඉක්මවා මැයි, ඒවං, මෙසේ, කුක්කුච්චපකතතාය, කුකුසින් මැඩ පවත්නා හෙයින් ආපජ්ජති, ඇවතට අවදනේයි.

අකප්පියෙ, අකැප වස්තුවෙහි, කප්පිය සඤ්ඤිතාය, කැපය යන සංඥ ඇති හෙයින්, කථං ආපජ්ජති, කෙසේ ඇවතට පැමිණේ ද යත්, අච්ඡමංසං, වලස්මස, සූකර මංසංඉති, ඌරුමස යයි (සිතා) බාදති, අනුභව කරයි. විකාලෙ, හිරු මුදුනෙන් නැමු කල්හි, කාල සඤ්ඤය, පෙරබත් කාලය, යන සංඥවෙන්, භුඤ්ජති, වළදාද, ඒවං, මෙසේ. අකප්පියෙ, අකැප වස්තුවෙහි, කප්පිය සඤ්ඤිතාය, කැපය යන සංඥවෙන්, ආපජ්ජති, ඇවතට අවදනේයි කප්පියෙ. කැප වස්තුවෙහි, අකප්පිය සඤ්ඤිතාය. නොකැපය යන සංඥවෙන්, කථං ආපජ්ජති, කෙසේ ඇවතට අවදනේ යත්? සූකර මංසං, ඌරුමස, අච්ඡමංසං ඉති. වලස් මසය යන සංඥවෙන්, බාදති, අනුභව කෙරේද, කාලෙ, පෙරබත්

කාලයෙහි, විකාල සඤ්ඤය හිරු මුදුනෙන් නැමූ කලැය යන සංඥවෙන්, භුඤ්ජති, අනුභව කෙරේද, ඒවං, මෙසේ කප්පියෙ, කැප වස්තුවෙහි, අකප්පිය සඤ්ඤිතාය, නොකැපය යන සංඥවෙන්, ආපජ්ජති. ඇවතට අවදනේයි.

සතිසම්මොසා, සමෘති විප්‍රවාසයෙන්. කථං ආපජ්ජති, කෙසේ ඇවතට අවදනේද යත්? සහසෙය්‍ය චීවර විප්පවාසාදිනි, සහසෙය්‍යාපත්ති චීවරවිප්පවාසාදි ආපත්තීන්ට, සතිසම්මෝසා, සිහිමුළාවෙන් ආපජ්ජති, ඇවතට අවදනේයි (භාවය, සහසෙය්‍යාපත්ති යනු ගිහිහෙරණුන් හා සමග සහසෙය්‍ය විය යුතු වූ සෙනෙසුනෙහි පිළිවෙළින් තුන් රැයක් නිද්‍රෝපගතව සිහිමුළාවෙන් සතර වන රැයෙහි නිද්‍රෝපගතවීමෙන් පැමිණෙන්නා වූ ඇවතක් වෙයි. චීවර විප්පවාස ආපත්තිය යනු තිචීවරාධිෂ්ඨානයෙන් ඉටා ගන්නා ලද සිවුරෙන් සිහිමුළාව හේතුකොට එක් රැයක් හෝ සරැයක් හෝ වෙන්ව විසීමෙන් පැමිණෙන්නා වූ ඇවතක් වෙයි, ආදි ශබ්දය් කරණ කොටගෙණ සත්තාහ අතික්කන්ත දසාහ අතික්කන්ත වීමෙන් පැමිණිය යුතු ඇවැත් සංග්‍රහයට යෙති) ඉති ඉමෙසංජන්නං ආකාරානං, මෙසේ මේ ෂඩාකාරයන් අතුරෙන්, අඤ්ඤතරෙන ආකාරෙන, එක්තරා ආකාරයකින්, ආපන්නාභවෙය්‍ය, පැමිණියාවන්නේද, යස්සසියා ආපත්ති ඉති. යස්සසියා ආපත්ති යනු, සත්තන්නං ආපත්තික්ඛන්ධානං, සප්තාපත්ති ස්කන්ධයන් අතුරෙන්, අඤ්ඤතරාආපත්ති, එක්තරා ඇවතක්, ථේරස්සවා, ස්ථවිරයෙක් හට හෝ නවකස්සවා, බාල භික්ෂුවක් හට හෝ, මජ්ඣිමස්සවා, මධ්‍යම භික්ෂුවක් හට හෝ, සියා (භවෙය්‍ය) වන්නේය. ඉති අයං, මේ වනාහී අත්ථො, අර්ථයි සො ආවිකරෙය්‍ය ඉති, සො ආවිකරෙය්‍ය යනු, සෝ භික්ඛු, ඒ මහණතෙම, තංආපත්තිං, ඒ ඇවත, දෙසෙතුවා, අස්වන්නේ හෝ වේවා, පකාසෙතුවා, පහළ කරන්නේ හෝ වේවා, ඉති අයං, මේ වනාහී, අධිප්පායො, කැමති වූ අර්ථය, වුත්තං (වුත්තාහොති) කියන ලද්දේ වෙයි.

(භාවය - දේශනා කටයුතුය යනු පාරාජිකාවට පැමිණි භික්ෂු තෙමේ භික්ෂුභාවය හැරීමය, සංඝාදිසේසයට පැමිණි භික්ෂු තෙමේ පිරිවෙස්මානත් පුරා අබ්භාන කර්ම කිරීමය. ලහුකාපත්තීන්ට පැමිණි මහණතෙමේ ඇවත් දෙසීමය යන මොහු ආපත්ති දේශනා යයි දත යුතුයි. "පකාසෙතු" යන වනාහි

ගරුක ලහුකාපත්තීන්ට පැමිණි මහණ තෙමේ ගණයා කෙරෙහි හෝ පුද්ගලයා කෙරෙහි හෝ සංඝයා කෙරෙහි හෝ යන මොවුන් අතුරෙන් යම්කිසිවෙකු කරා එළඹ මට මෙබඳු ඇවතක් විය ඒ ඇවත නුඹ වහන්සේට අස්වමි නොහොත් මා මෙබඳු ඇවතකට පැමිණි බව නුඹ වහන්සේ දැන ගන්නා සේක්වා යි යනාදී ක්‍රමයකින් පහළ කටයුතුයි) අසන්තියා ආපත්තියා ඉති, අසන්තියා ආපත්තියා යනු, යස්සපන, යම් මහණෙක් හට වනාහී, ඒවං, (ඉමිනාවුත්ත නයෙන) මේ කියන ලද ක්‍රමයෙන්, අනාපන්නා හොති, ඇවතට නොපැමිණියාවේද, ආපජ්ජිත්වාව, ඇවතට පැමිණද, ආපත්තිතො, ඇවතින්, වුට්ඨිතා හොති, නැගිටින ලද්දීවේද, ආපත්ති, ඇවත, දෙසිතාවා, දෙසන ලද්දී හෝ, ආරොචිතා වාහොති, පහළ කරණ ලද්දී හෝ වේද, තස්ස භික්ඛුනො, ඒ මහණාට, සාආපත්ති, ඒ ඇවැත් තොමෝ, අසන්තීනාමහොති, අවිද්‍යාමාන වන්නී නම්වේ. ඒවං, මෙසේ, ආපත්තියා අසන්තියා, ඇවත නැති කල්හි, තුණ්හීභවිතබ්බං, මුවෙන් නොබැණ හිඳියි යුතුයි. තුණ්හීභාවෙන බොපනායස්මන්තෙ පරිසුද්ධාති වේදිස්සාමීති, මුවෙන් නොබැණ හිඳීම සංඛ්‍යාත වූ කාරණයෙන් (අපි ශබ්දයෙන් ඇවතින් පිරිසිදු මැයි කී මාත්‍රයකින් පිරිසිදු බව දැන ගන්නේ නොවෙයි. තුෂ්ණීම්භූතව හිඳීම් මාත්‍රයකින් දැන ගන්නේ යන අර්ථය සංගෘහිතයි. අපි ශබ්දය වචනාලංකාරයි) අහං, මම, ආයස්මන්තෙ, ආයුෂ්මතුන්, පරිසුද්ධා ඉති, පිරිසිදු වූහයි, ඉච්චෙවං, ජානිස්සාමි, මෙසේ දැන ගන්නෙමි. යථාබොපන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණංහොති, ඉති, යථා පෙ හොතියන, එකෙන, එක් පුද්ගලයෙකු විසින්, පුට්ඨො, විචාරණ ලදුව, එකො, එක් පුද්ගලයෙක් තෙමේ, බ්‍යාකරෙය්‍යයථා, විසඳීමක් මෙනි, (මේ වනාහි පුච්ඡධාතු තොමෝ ද්විකර්මක ධාතුවක්ව මුඛ්‍ය වූ ක්‍රියාව අත්හැර කාරක භාවයට පැමිණීම අප්‍රධාන කර්මයයි දතයුතු) එකෙන, එක් පුද්ගලයෙකු විසින්, පච්චෙක පුට්ඨො, වෙන වෙන විචාරණ ලද්ද වූ, එකො, එක් පුද්ගලයෙක් තෙමේ, එසො, මේ තෙමේ, මං, මා, පඤ්හං පුච්ඡතීති, පැණයක් විචාරා යයි. සඤත්වා, දැන, බ්‍යාකරෙය්‍යයථා, යම්සේ විවරණය කෙරේද, ඉති අයං අධිප්පායො, මේ අභිමත වූ අර්ථය, වුත්තං, (වුත්තොහොති) කියන ලද්දේ වේ. ඒවමේවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතංහොති ඉති, එව මේවං පෙ හොතියන, ඒත්ථ, මේ පාඨයෙහි එකචේච ආචාරියා, සමහර ආචාර්යවරයෝ තුමූ, නාව, පළමු කොට,

ඒවංවදන්ති, මෙසේ කියත්, ඒවමේව (ඒවංහඨා) එපරිද්දෙන්, ඉමිස්සා භික්ඛුපරියාය, මේ භික්ෂු පිරිස්හි යස්ස භික්ඛුනො, යම් භික්ෂුවක් හට, ආපත්තිඩ්යා, ඇවතක් වන්නේ වී නම්, සෝභික්ඛු, ඒ මහණ තෙමේ, ආවිකරෙය්‍ය පහළ කරන්නේය, ආපත්තියා අසන්තියා, ඇවතක් නැති කල්හි, තුණ්හිභ විතබ්බං, මුවෙන් නොබැණ හිඳිය යුතුයි. තුණ්හීභාවෙන, මුවෙන් නොබැණ හිඳීමෙන්, ආයස්මන්තො, ආයුස්මතුන්, පරිසුද්ධාති, පිරිසිදුහයි. වෙදිස්සාමි, දැනගනනිම්. ඉති එවං, මෙසේ තික්ඛත්තුං, තුන්වරක්, යං ඒතං අනුසාවනං හොති, යමක් අනුශ්‍රාවණාය කරණ ලද්දේ ද හෙවත් නැවත නැවත ඇස්වන ලද්දේ වේද, තං ඒ අස්වන ලද්ද, ඒක මේකෙන, ඒ එක් භික්ෂුවක්හු විසින්, මං, මා එසො, මේ පාමොක් උදෙසන භික්ෂුහු තෙමේ. පුච්ජති, විචාරයි. ඉතිඑවං, මෙසේ ජානිතබ්බං හොති. දත යුත්තේ වෙයි. ඉති අයං, මේ වනාහි, අත්ථා, අත්ථයි, ඉති, මෙසේ වදන්ති, කියති, ඒතං වචනං, ඒ (සමහර ඇදුරන්ගේ) වචනය, නයුජ්ජති, නොයෙදෙයි, කස්මා, කුමක් හෙයින් නොයෙදේ ද යත්? අත්ථබ්‍යජන භේදතො, අර්ථයාගේ හා ශබ්දයාගේ භේදය ඇති හෙයින්, අනුසාවණංනාම, අනුසාවණාය නම්, අත්ථතො ච, අර්ථ වශයෙන්ද, බ්‍යජනතොච, ශබ්ද වශයෙන්ද, හි (යස්මා) යම්හෙයකින්, අභිනනංහොති, ප්‍රභේද නොවේද, දුතියම්පි ඒතමත්ථංව දමිති ආදිසු විය, දුතියම්පි එතමත්ථංවදම්යන ආදියෙහි මෙනි. යස්සසියාති ආදිසූවිය, දුතියම්පි ඒතමත්ථංවවදම්යන ආදියෙහි මෙනි. යස්සසියාති ආදි වචනත්තයංපන, යස්ස යා යනාදි ශබ්දත්‍රය වනාහි. අත්ථතොපි, අර්ථවශනේද, බ්‍යජනතොපි, ශබ්ද වශයෙන්ද, භින්නං, ප්‍රභේද වෙයි. තේන, එසේ ප්‍රභේද වන හෙයින්, අස්ස යනාදි ශබ්දයන් තුන්දෙනාගේ, අනුසාවණාත්තයං, අනුසාවණාත්තයං, නයුජ්ජති, නොයෙදෙයි (මෙහි භාවය "යස්සසියා" යනාදි ශබ්දයෝ තුනදෙන හෙවත් ඇවත් ඇති කල්හි ප්‍රකට කිරීමය යන අර්ථයද ඇවත් නැති කල්හි තුෂ්ණිම්භාවයෙන් හිඳීමය යන අර්ථයද ඒ තුෂ්ණිම්භාවයෙන් හිඳීමෙන් ඇවතින් පිරිසිදු වූ බව දැන ගැනීමය යන අර්ථයද මෙසේ අර්ථ වශයෙන් සමාන නොවෙයි. ශබ්ද වශයෙන්ද සමාන නොවෙයි. අනුසාවණාය නම් ශබ්දයද ප්‍රභේද නොවෙයි. අර්ථයද ප්‍රභේද නොවෙයි. අනුසාවණාය නම් ශබ්දයද ප්‍රභේද නොවෙයි අර්ථයද ප්‍රභේද නොවෙයි. එහෙයින් "යස්සසියා" යනාදි ශබ්දයෝ තුන්දෙන අනුසාවණාත්‍රයයි නො යෙදෙන්නේය "යස්සසියා" යනාදි

ශබ්දයෝ තුන්දෙන අර්ථ ශබ්ද වශයෙන් සමාන නොවන හෙයින් අනුසාවණාත්‍රය නොවිය යුතුයයි කී කල්හි අර්ථ ශබ්දයන්ගේ විසදෘශ්‍යභාව මාත්‍රයකින් යන කිසිහේතු ඵලයන්ගේ සම්බන්ධය විරුද්ධවන්නේ නමුදු අනුසාවණාත්‍රය නොවිය යුත්තේ ද යන චෝද්‍යය සඳහා "යදිවෙතං" යනාදිය කීහ.) ඒතං, ඒ යස්ස සියා යනාදි ශබ්දයෝ තුන්දෙන, යාවතතියානු සාවණං යදිසියා, ඉදින් තුන්වරක් දක්වා අනුසාවණය නොවේ නම්, එවංසති, මෙසේ ඇති කල්හි, නිදනුද්දේසෙ, නිදනුද්දේසය, අනිට්ඨිතෙ අපි, නොනිමි කල්හිද, ආපත්තිසියා, ඇවතක් වන්නේය. අනාපත්තිඛෙත්තෙ අනාපත්තික්ෂේත්‍රයෙහි, ආපත්තිං ආපජ්ජිතුං, ඇවතට පැමිණෙන්නට, නව යුත්තං, නොයෙදෙන්නේ මැයි, අපරෙ, අපරාචාර්යවරයෝ තුමූ, අනුසාවිතන්තිපදස්ස, අනුසාවිතං යන පදයාගේ, අනුසාවෙතබ්බන්ති අත්ථං, අනුසාවෙතබ්බං යන අනාගතාර්ථය, විකප්පෙත්වා, කල්පනා කොට, යාවතතියං ඉදං, යාවතතියංයන මේ පදය තෙමේ, උපරි, මත්තෙහි, උද්දේසාවසානෙ, උද්දේසයාගේ කෙළවර, කච්චිත්ථපරිසුද්ධා දුතියම්පි පුච්ඡාමීති, කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමියන, ඒතං වචනං සන්ධාය, මේ වචනය සඳහා, වුත්තනන්ති, කියන ලද්දේ යයි, ආහු, කීවාහුය, තම්පිවචනං, ඒ වචනයද, නයුජ්ජති, නොයෙදෙයි. කස්මා, කුමක් හෙයින් නොයෙදේ ද යත්? අත්ථ යුත්තීනං, අර්ථ යුක්තීන්ගේ නොහොත් අර්ථ හේතූන්ගේ, අභාවතො, නැති හෙයිනි, හි, ඒ වචනය විස්තර කෙරෙමි, ඉදං පදං, මේ අනුසාවිතං යන පදය, කෙචි, ඇතැම් ආචාර්යයෝ තුමූ, අනුසාවිතන්ති, අනුසාවිතංයි, සජ්ඣායන්ති, සජ්ඣායනාකෙරෙත්. හෙවත් උච්චාරණය කෙරෙත්, කෙචි, සමහර ඇදුරෝතු මූ, අනුසාවෙතන්ති, අනුසාවෙතංයි සජ්ඣායන්ති, හදරත්, තං උභයංවාපි, ඒ ද්විප්‍රකාර වචනයම හෝ, අතීත කාල මෙවදීපෙති, අතීත කාලයම, ප්‍රකාශ කෙරෙයි, අනාගත කාලං න දීපෙති, අනාගත කාලය ප්‍රකා නොකෙරෙයි. අස්ස, ඒ අනුසාවිතං යන පදයාගේ, අයං අත්ථො, මේ අනාගතාර්ථය තෙමේ, යදිවසියා, ඉදින් වන්නේවි නම්, එවංසෙති, මෙසේ ඇති කල්හි, අනුසාවිතං හෙස්සතීතිවදෙය්‍ය, අනුසාවිතංහෙස්සතියයි කියයුත්තේය. ඒවං මෙසේ තාව, පළමු කොට, අත්ථාභාවතො, අර්ථයක් නොවිය යුතු හෙයින්, නයුජ්ජති, නොයෙදෙයි. (මෙහි භාවය - අපරාචාර්යයෝ වනාහි "අනුසාවිතං, යන මේ පදයෙහි තප්‍රත්‍යය අතීත කාලයෙහි යෙදෙන්නේ නමුදු

ධාත්වර්ථය හා සම්බන්ධ වන හෙයින් අනාගත කාලය වාචකවෙයි, එහෙයින් "අනුසාවිතං" යන පදය මතුපරාපිකුද්දේස නිගමනයෙහි "තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථපරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි, යනාදී වචන සඳහා කියන ලද්දේ යයි කියත් ඒ වචනය නොයෙදෙයි කුමක් හෙයින්ද යත්, අර්ථ යුක්තිය නොයෙදෙන හෙයිනැයි දතයුතු කුමක් හෙයින් අර්ථ යුක්තිය නොයෙදේද යත්? ධාත්වර්ථ සම්බන්ධය යනුද විශේෂන විශේෂ්‍යය වන හෙයින් සම්බන්ධ වන්නා වූ පදයාගේ අර්ථය ඇති හෙයින් වෙයි අර්ථය නැති කල්හි නොවෙයි. මෙහි එනාහි ඉදින් ධාත්වර්ථ සම්බන්ධය වන්නේ නම් "අනුසාවිතං හෙස්සති" යි අනාගත විභක්තියෙන්ම කියයුත්තේය එසේ නොකියන ලදී. එහෙයින් අනාගත කාලවාචක නොවන්නේ යයි කීනියායි. අර්ථය නොවිය යුතු හෙයින් නොවන්නේ යැයි කී කල්හි කුමක් හෙයින් අර්ථය නොවිය යුත්තේ ද යන චෝද්‍ය සඳහා "යදිවෙතං" යනාදිය කිහ) ඒතං, ඒ අනුසාවිතං යන පදය, උද්දේසාවසානෙ, උද්දේසයාගේ කෙළවර, වචනං සන්ධාය (කියයුතු) වචනය සඳහා යදිවුත්තං සියා, ඉදින් කියන ලද්දේ වී නම්, ඒවංසති, මෙසේ ඇති කල්හි, න ආවිකරිස්සාමිති, පහළනොකරන්නෙමියි, චිත්තං උප්පාදෙන්තස්ස, සිත උපදවන්නා වූ භික්ෂු හට, නිදානෙසමත්තෙපි, නිදානය සම්පූර්ණ වූ කල්හිද, වුත්තමුසාවාදෙ, කියන කල මුසාවාදය, නසියා, නොවන්නේයි, කස්මා කුමක් හෙයින් නොවන්නේ ද යත්? යාවතතියං අනුසාවියමානෙ ඉති. යාවතතියං අනුසාවියමානෙ යනු, වචනතො පච්චුප්පන්නකාල වශයෙන් කී හෙයින්, යාවතතියන්ති ඉදං වචනමේව, යාවත්තියං යන මේ වචනයම, නිරත්ථකංසියා, මොඝවන්නේයි, කස්මා, කුමක් හෙයින යත්, නිදානුද්දේසෙ, නිදානුද්දේසයෙහි, යාවතතියා නුසාවණස්ස අභාවතො ඉති, යාවතතියානුසාවණය නැති හෙයිනි. ඒවං මෙසේ යුත්ති අභාවතො අපි, න්‍යාය ක්‍රමයක් නැති හෙයිනුදු, නයුජ්ජති, නොයෙදෙයි. (භාවය "යාවතතියං අනුසාවිතං" යන පදය උද්දේශයාගේ කෙළවර කියනලද වචනය සඳහා කියන ලද්දක් වී නම් ඇවත පහළ නොකරමි යන සිත උපදවන්නාවූ මහණ හට නිදානොද්දේසයෙහි යාවතතියානුසාවණය නැතිහෙයින් අසම්පූර්ණ වුයේ නමුදු කියන ලද මුසාවාදය නොවෙයි. කුමක් හෙයින යත්? "අනුසාවියමානෙ, යන වර්තමාන කාලයෙහි වූ මාන ප්‍රත්‍යයෙන් කී හෙයින් නිදානොද්දේසයෙහි යාවතතියකානුසාවණය නැතිහෙයින් "යාවතතියං"

යන මේ පදය නිෂ්ප්‍රයෝජන විය යුතුයි. මෙසේ හේතු ඵලයන්ගේ සම්බන්ධය නැති හෙයින් නොයෙදේ යයි කීනියායි. "කෙචිඅපරෝ" යන ආචාර්යයීවරුන්ගේ වචනයෝ ශබ්දර්ථයන් විසදෘෂ හෙයින් ද අර්ථයුත්වීන්ගේ ශබ්දයන් නැති හෙයින්ද නොයෙදෙයි. මේ "යාවතතියං අනුසාවිතංහොති" යන වචනය වනාහී කුමක් දැයි යන චොදනය සඳහා "යාවතතියං, යනාදිය කීහ) යාවතතියං අනුසාවිතං හොතීති (ඉදංවචනං) යාවතතියං, අනුසාවිතං හොති යන මේ ශබ්ද තෙමේ, ලක්ඛණ වචන මත්තං, හැඳිනීමම හේතු වූ ශබ්ද මාත්‍රයකි. තේන, එහෙයින්, ඉමමත්ථංදස්සේති, මේ අර්ථය දක්වයි. ඉදං පාතිමොක්ඛං නාම, මේ ප්‍රාතිමෝක්ෂය වනාහි, යාවතතියං, තුන්වර දක්වා, අනුසාවියති, අනුශ්‍රාවනය කරනු ලැබේ. තස්මිං, ඒ ප්‍රාතිමෝක්ෂය යාවත්තියං, තුන්වර දක්වා, අනුසාවියමානෙ, අනුසාවණය කරනු ලබන කල්හි, යො භික්ඛු, යම් මහණෙක් තෙමේ, සරමානො, ඇවත සිහි කරණු ලබනුයේ සන්තිංආපත්තිං, ප්‍රකටව ඇත්තා වූ ඇවත, නාවිකරොති, පහළ නොකෙරේද, තස්ස භික්ඛුනො, ඒ මහණහට, යාවතතියානුසාවණාවසානෙ, තුන්වන වර දක්වා අනුශ්‍රාවණය කිරීමෙන් හෙවත් තුන්වන අනුසාවනාවගේ කෙළවර, සම්පජානමුසාවාදෙහොති, සම්පජාන මුසාවාදය වේ, තංදෙනංපාතිමොක්ඛං, මේ ප්‍රාතිමෝක්ෂය, යථා අනුසාවිතං, යම් පරිද්දකින් අනුශ්‍රාවනය කරණ ලද කල්හි, යාවතතියං, තුන්වන වරදක්වා. අනුසාවිතං නාමහොති, අනුශ්‍රාවණය කරණ ලද්දේ නම් වේද, තං, ඒ අනුශ්‍රාවණය, දස්සේතුං, දක්වනු පිණිස. තත්ථා යස්මන්තෙ පුච්ඡාමිති ආදි, තත්ථායස්මන්තෙ පුච්ඡාමි යනාදිය, වුත්තං, කියන ලදී. තංපනෙතං, ඒ "තත්ථායස්මන්තෙ පුච්ඡාමි යනාදි පාඨය, පාරාජිකාදීනං, පාරාජිකොද්දේසාදීන්ගේ. අවසානෙ, කෙළවර දිස්සති. දක්නා ලැබේ. නිදනාවසානෙ, නිදනොද්දේසයාගේ කෙළවර, නදිස්සති, නොදක්නා ලැබේ. කිඤ්චාපිනදිස්සති, ඉදින් නොදක්නේද, අථඛො, එසේ නොදක්නේ නමුදු, උද්දෙසකාලෙ, පාමොක් උදෙසන කල්හි, ආවිකතාහිස්ස ඵාසුහොතිතිවත්වා, ආවිකතා පෙ හොති යනු කියා, උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදනං තත්ථාය ස්මන්තෙ පුච්ඡාමිති ආදිනානයෙන. උද්දිට්ඨංඛො පෙ පුච්ඡාම යනාදී ක්‍රමයෙන්, වත්තබ්බමෙව, කියයුත්තේ මය, හි ඒ එසේමැයි ඒවං, මෙසේ (කීකල්හි) නිදනං, නිදනය, සුඋද්දිට්ඨංහොති මොනවට ප්‍රකාශ කරණ ලද්දේ වේ, අඤ්ඤථා,

මෙයින් අන්‍යාකාරයකින් ප්‍රකාශ කළ කල්හි, දුළද්දිට්ඨංහොති, නපුරුකොට ප්‍රකාශ කරණ ලද්දේ වේ, ඉමමේවත්ථංසන්ධාය, මේ අර්ථයම සඳහා,

එකම්පි, එක්වරක්ද, අනුසාවිතං හෝති, අනුශ්‍රාවණය කරන ලද්දේවේ, දුතියම්පි, දෙවනුවත්, අනුසාවිතං හෝති, අනුශ්‍රාවණය කරන ලද්දේ වේ, තතියම්පි, තුන්වෙනුප්න්, අනුසාවිතංහොහිති, අනුශ්‍රාවණය කරන ලද්දේ වේ. යයි අයං, මේ කියන ලද අර්ථ විනිශ්චය) එත්ථ, "මේ යාවතතියං අනුසාවිතංහෝති" යන පදයෙහි, ආචාරිය පරම්පරා භතො, ඇදුරු පරපුරෙන් එළවන ලද්ද වූ, විනිච්ඡයො, අර්ථ විනිශ්චයයි.

යොපන භික්ඛු පෙ සම්පජාන මුසාවාදස්ස හොතීති, යොපන පෙ හොති යනු, අස්ස භික්ඛුනො, ඒ මහණ හට, සම්පජාන මුසාවාදෙහොති, දැන දැන බොරු කීමක් වේ, තේන, ඒ සම්පජාන මුසාවාද හේතුවෙන් අස්ස භික්ඛුනො, ඒ මහණ හට, දුක්කටා පත්ති හෝති, දුකුලා ඇවතක් වේ. යාවබො, ඒ දුකුලා ඇවැතද වනාහි, මුසාවාද ලක්ඛණෙන, මුසාවාද ලක්ෂණයෙන් (නොහොත්) මුසාවාද යටකී අංග සම්පූර්ණත්වයෙන්, නහොති, නොවෙයි. සම්පජාන මුසාවාදෙ, සම්පජාන මුසාවාද තෙමේ, කා ආපත්ති හෝති, කවර ඇවතක් වේද යත්? දුක්කටං හෝති, දුකුලා ඇවතක් වේ, භගවතො, භගවත් හුගේ, ඉති ඉමිනාපන වචනෙන, මෙසේ මේ වචනයෙන් වනාහි, වචිද්වාරෙ, වාග් ද්වාරයෙහි, අකිරිය සමුට්ඨානාපත්ති, කියයුක්ත නොකීමෙන් පැමිණි ඇවත, හොතීති වේදිතබ්බා, වේයයි දත යුතුයි, ඒතං, ඒ කාරණය, පරිවාරෙ, පරිවාර පාඨයෙහි, උපාලි ථේරේන, උපාලි මහා ස්ථවිරයන් වහන්සේ විසින්, වුත්තංපිච, වදරණ ලද්දේ මැයි

**අනාලපන්තො මනුජෙන කෙනචි**

**වාචාගිරං නොච පරෙ භණෙය්‍ය**

**ආපජ්ජෙය්‍ය වාචසිකං නකායිකං**

**පඤ්හාමෙසා කුසලෙහි චින්තිතාති**

(යොපනභික්ඛු, යම් මහණෙක් තෙමේ) කෙනචි මනුජෙන, යම්කිසි මනුෂ්‍යයෙක්,වාචාය, වචනයෙන්, (මෙහි ය කාරය ලොප් වේ. "ආචික්ඛතා" යන පදයෙන් කරණාර්ථයෙහි ප්‍රථමා විභක්තියි කල්පනා කටයුතුයි) අනාලපන්තො,

නොකියන්නේ, පරෙ, අන්‍යයන් සඳහා, (සන්ධාය යනු පාඨ ශේෂයි) ගිරං වචනය, නොවභාෂෙය්‍ය, නොකියන්නේද, වාචසිකං වචනයෙන් හටගන්නා වූ, නකායිකං, කයින් හටනොගන්නාවූ, ආපත්තිං, ඇවතට, ආපජ්ජෙය්‍ය, අවදනේය, එසාපඤ්හා, (එසො පඤ්හො) මේ ප්‍රශ්නය, කුසලෙහි, ප්‍රාඥ වූ විනය ධරයන් විසින්, චින්තිතා (චින්තිතො) සිතන ලද්දේයි.

අන්තරායිකො ඉති, අන්තරායිකො යනු, විප්පටිසාර වත්ථුභාය, විපිළිසර බවට කාරණා වන හෙයින්, පාමොජ්ජාදිසම්භවං, ප්‍රමොදනාදීන්ගේ හට ගැන්ම, නිවාරෙත්වා, වළක්වා, පඨමජ්ඣානාදීනං, ප්‍රථම ධ්‍යානාදීන්ගේ, අධිගමාය, පැමිණීමට, අන්තරාය කරො හොති අන්තරාය කරන්නේ වේ. තස්මා ඉති, තස්මා යනු, අනාවිකරණසඞ්ඛාතො, පහළ නොකිරීමයයි කියන ලද්ද වූ, අයං සම්පජාන මුසාවාදො, මේ සම්පජාන මුසාවාද තෙමේ, යස්මා, යම් හෙයකින් අන්තරායිකා හොති, අන්තරායකර වේද, තස්මා එසේ හෙයින්, සරමානෙනාති, සරමාණේන යනු, අත්තනි, තමා කෙරෙහි, සන්තිං ආපත්තිං, විද්‍යාමාන වූ ඇවත, ජානන්තෙන, දැනගත් භික්ෂුහු විසින්, විසුද්ධාපෙක්ඛෙන යනු, වුද්ඨාතුකාමේන, ගරුකාපත්තියෙන් නැගිටිනු කැමති මහණාහු විසින්, විසුජ්ඣිතු කාමේන, ලහුකාපත්තියෙන් පිරිසිදු වනු කැමති මහණාහු විසින්, සන්තිආපත්ති ඉති, සන්ති ආපත්ති යනු, ආපජ්ජිත්වා, ඇවතට ඇවද, අවුට්ඨිතා, නොනැගිටියා වූ, ආපත්ති, ආපත්ති යයි, ආවිකාතබ්බා ඉති, ආවිකාතබ්බා යනු, සංඝ මජ්ඣෙවා, සඟ මැද හෝ ගණ මජ්ඣෙවා, ගණයා මැද හෝ, ඒක පුග්ගලෙවා, එක්පුද්ගලයෙකු කෙරෙහි හෝ, පකාසෙසතබ්බා, පහළ කටයුත්තිය, අන්තමසො. යටත්පිරියෙයන්, අනන්තරස්ස, අනතුරු වූ, භික්ඛුනො අපි, භික්ෂුවක් හටද, ආවුසො, ඇවැත්නි, අහං, මම, ඉත්ථනාමං ආපත්තිං, මේ නම් ඇවතකට, ආපන්නො, පැමිණියේ, ඉතො, මේ පොහොය සීමාවෙන්, වුට්ඨහිත්වා, නැගිට, තං ආප්පත්තිං, ඒ ඇවත, පටිකරිස්සාමි ඉති, පිළියම් කරන්නෙමියි, වත්තබ්බං, කියයුතුයි, සචෙපි, ඉදින් වනාහි, වෙමතිකොහොති, විමති ඇත්තේ වේද, ආවුසො, ඇවත්නි, අහං, මම, ඉත්ථන්නා මාය ආපත්තියා, මේනම් ඇවතෙක්හි, වෙමතිකො, සැක ඇත්තේ වෙමි, යද, යම් කලෙක්හි, නිබ්බෙමතිකො භවිස්සාමි, නිසැක වන්නෙමිද, තද, එකල්හි, තං ආපත්තිං, ඒ ඇවත, පටිකරිස්සාමිති, පිළියම් කරන්නෙමියි, වත්තබ්බං, කියයුතුයි, ආවිකතා හිස්සඵාසු හොතිති එත්ථ,

ආවිකතාහිස්සඵාසුහොති යන පාඨයෙහි, ආවිකතාති, ආවිකතා යනු, ආවිකතාය, පහළ කිරීමෙන්, පකසිතාය, ප්‍රකාශකිරීමෙන්, ඉති, මෙසේ, අයං අත්‍ථො, මේ අර්ථයි, හි, ඒ එසේ මැයි, අලජ්ජිතාය ආදිසුවිය, අලජ්ජිතාය යනාදීන් හි මෙන්. ඉදම්පි පදං, මේ පදයද, කරණත්‍ථෙ, කරණ විභක්තිහු ගේ අර්ථයෙහි, පච්චත්ත වචනං, ප්‍රථමා විභක්තිය කෙළවර කොට ඇත්තා වූ ශබ්දයෙකි, හීති ඉදං පදං, හ යන මේ පද තෙමේ, නිපාත මත්තං, නිපාත මාත්‍රයකි, අස්සාති, අස්ස යනු, එතස්ස භික්ඛුනො, ඒ භික්ෂුව හට, ඵාසු හොතිති, ඵාසුහොති යනු, පඨමජ්ඣානාදීනං අධිගමාය, ප්‍රථම ධ්‍යානාදීන්ගේ ලැබීම පිණිස, ඵාසුහොති, පහසුවෙයි. අවිප්පටිසාර මූලකානං, සිත විපිළිසර නොවීම මුල්කොට ඇත්තා වූ, පාමොජ්ජාදීනංවසෙන, ස්ඵුරණ ප්‍රීති ආදීන්ගේ වශයෙන්, සුඛපටිපදා, සැපවූ ප්‍රතිපත්ති හොමෝ හෙවත් පහසු වූ පිළිපැදීම, සම්පජ්ජති, සම්පූර්ණ වෙයි. ඉති, මෙසේ, අයං අත්ථො,මේ අර්ථයි.

කංඛාවිතරණීය? කංඛා විතරණී නම් වූ, පාතිමොක්ඛවණ්ණනාය, ප්‍රාතිමෝක්ෂාර්ථ වර්ණනාහු ගේ, නිදාන වණ්ණනා, නිදානවණ්නා හොමෝ, ඉති (ඉමෙහි වචනක්කමෙහි) මෙතෙක් ශබ්දයන්ගේ ක්‍රමයෙන්, නිට්ඨිතා, සම්පූර්ණ කරන ලද්දී වේ.

ඉදානි, දැන්, නිදානන්තරං, නිදානොත් දේශයට අනතුරුව, තත්‍රිමේචත්තාරො පාරාජිකාති ආදී, තත්‍රිමෙචත්තාරො පාරාජිකා යන ආදී (පිරිසිඳීම් ඇත්තා වූ) යං ඒතං පාරාජිකකණ්ඩං, යම් පාරාජිකා කාණ්ඩයක්, වුත්තං, වදාරණ ලද්දේද, තත්ථ, ඒ පාරාජික ඛාණ්ඩයෙහි, තත්‍රාති, තත්‍ර යනු, පාතිමොක්ඛං උද්දිසිස්සාමි ඉති, පාති මොක්ඛං උද්දිසිස්සාමියි, ඒවං වුත්තෙ, මෙසේ වදාරණ ලද්ද වූ, තස්මිං පාතිමොක්ඛෙ, ඒ ප්‍රාතිමෝක්ෂයෙහි, ඉමෙති ඉදං වචනං, ඉමෙ යන මේ ශබ්ද තෙමේ, ඉදානිවත්තබ්බතං, දැන් කිය යුතු පාරාජික කාණ්ඩය, අභිමුඛී කරණං, අභිමුඛ කරන්නා වූ ශබ්දයයි, චත්තාරොති අයං සද්දො, චත්තාරො යන මේ ශබ්ද තෙමේ, ගණන පරිච්ඡේදෙ, ගණන් වෙන් කරන්නාවූ ශබ්දයයි, පාරාජිකාති, පාරාජිකා යනු, ඒවං නාමකා, පාරාජිකා යන නම් ඇත්තා වූ, ධම්මාති, ධම්මා යනු, ආපත්තියො, ආපත්තිහු යි, උද්දේසං ආගච්ඡන්තීති, උද්දේසං ආගච්ඡන්ති යනු, සරූපෙන, ස්වකීය රූපයෙන්, උද්දිසිතබ්බතං,

ප්‍රකාශ කටයුතු බවට, ආගච්ජන්ති, පැමිණෙත්, නිදානෙච්ය, නිදානයෙහි මෙන්, යස්සසියා ආපත්තීති, සාධාරණ වචන මත්තේන, යස්සසියා ආපත්ති යන සාධාරණ වචන මාත්‍රයකින්, න, ප්‍රකාශ කරණ ලද්දේ නොවෙයි.

යොපනාති, යොපන යනු, රස්සදීඝාදිනා, හ්‍රස්ව දීඝාදි වූ, ලිංගාදිභෙදෙන, ලිංගා දි ප්‍රභේදයෙන්, යොකෙච්, අනියමිත වූ යම්කිසිවෙකි. භික්ඛුති, භික්ඛු යනු, එහි භික්ඛු උපසම්පද, ඒහි භික්ඛු යන වචන මාත්‍රයකින් උපසපන් බවට පැමිණි භික්ෂුවද, සරණාගමන උපසම්පද, ත්‍රිවිධ සරණාගමනයෙන් උපසම්පද බවට පැමිණි භික්ෂුවද, ඔවාද පටිග්ගහණ උපසම්පද, අවවාද පිළිගැනීම් වශයෙන් උපසම්පද බවට පැමිණි භික්ෂුවද, පඤ්හාබ්‍යාකරණ උපසම්පද, ප්‍රශ්න විසඳීම් වශයෙන් උපසම්පද බවට පැමිණි භික්ෂුවද, අෂ්ඨ ගරු ධර්ම පටිග්ගහණ උපසම්පද, අෂ්ට ප්‍රකාර ගර ධර්මයන් පිළිගැනීම් වශයෙන් උපසම්පද බවට පැමිණි භික්ෂුවද, දූතේන උපසම්පද, දූතයෙකු යැවීම වශයෙන් උපසම්පද බවට පැමිණි භික්ෂුවද, අට්ඨවාචික උපසම්පද, කර්ම වාක්‍යය අටවරකින් උපසම්පද බවට පැමිණි භික්සුවද, ඤත්ති චතුත්ථකම්ම උපසම්පද, ඤත්තිය සතර වනුකොට ඇති කර්මයෙන් උපසම්පද බවට පැමිණි භික්ෂුවද ඉති ඉමාසු අට්ඨසු උපසම්පද සු, මේ අෂ්ට ප්‍රකාර වූ උපසම්පදවන් අතුරෙන්, ඤත්තිචතුත්ථේන, ඤත්තිය සතර වනුකොට ඇත්තා වූ, අකුප්පේන, අකොප්‍ය වූ හෙවත් අවිරුද්ධ වූ, ඨානාරහෙන, නෛර්‍යාණික ශාසනයට සුදුසු වූ, උපසම්පද කම්මේන, උපසම්පද කර්මයෙන්, උපසම්පන්නො, උතුම් බවට පැමිණි භික්සු තෙමේ, තස්සපන කම්මස්ස, ඒ කර්මයාගේ, (පනශබ්දය විස්තරාද්‍යෙතක නිපාතයි) වත්ථුඤත්ති අනුසාවණ සීමාපරිසසම්පත්තිවසෙන, වස්තුහුගේ සම්පූර්ත්වය ඤත්තිහුගේ සම්පූර්ණත්වය, කර්ම වාක්‍යයාගේ සම්පූර්ණත්වය සීමාවගේ සම්පූර්ණත්වය පිරිස්හුගේ සම්පූර්ත්වය යන පඤ්ච සම්පත්තීන්ගේ වශයෙන්, අකුප්පතා, අකොප්‍යභාවය හෙවත් අවිරුද්ධ බව, වේදිතබ්බා, දතයුත්තිය, තත්ථ, ඒ පඤ්ච සම්පත්තීන් අතුරෙන්, වත්ථුති, වස්තු යනු, උපසම්පද පෙඛො, උපසපන් බව අපේක්ෂා කරන්නාවූ, පුග්ගලො, පුද්ගල තෙමේයි, සො, ඒ පුද්ගල තෙම, ඌන විසතිවස්සං පුග්ගලං, අඩු විසිවයස් ඇති පුද්ගලයාද, අන්තිම වත්ථුං, සතර පරිජි ඇවතකට, අජ්ඣාපන්න පුබ්බං පැමිණි විරූ පුද්ගලයාද, පණ්ඩකාදයො, පණ්ඩකයා ආදි කොට ඇත්තා වූ,

එකාදස අභබ්බ පුග්ගලේව, එකොළොස් අභව්‍ය පුද්ගලයන්ද . ඨපෙත්වා, තබා, වේදිතබ්බො, දතයුතුයි, තත්ථ, ඒ පුද්ගලයන් අතුරෙන් ඌනවීසති වස්සො නාම අඩු විසි වයස් ඇති පුද්ගල තෙමේ නම්, පටිසන්ධිගහණතො පට්ඨාය, පිළිසිඳගත් දවස පටන්, අපරිපුණ්ණවීසති වස්සො, නොපිරිපුන් විසි වයස් ඇති පුද්ගලයි. අන්තිම වත්ථු අජ්ඣාපන්නො නාම, අන්තිම වස්තුවට පැමිණි පුද්ගල නම්, චතුන්නං පාරාජිකානං, සතර පරිජි ඇවත් අතුරෙන්, අඤ්ඤතරං, එක්තරා ඇවතකට, අජ්ඣාපන්න පුබ්බො, පැමිණි විරූ පද්ගලයායි, පණ්ඩකාදයො, පණ්ඩකාදීහු, වජ්ජනිය පුග්ගලකතායං, දුරු කටයුතු පුද්ගලයන්ගේ කථාවෙහි, වුත්තා, කියන ලද්ද හුයි, තෙසු, ඒ පණ්ඩකාදීන් අතුරෙන්, ආසිත්ත පණ්ඩකඤ්ච, ආසිත්ත පණ්ඩකයාද, උසූයපණ්ඩකඤ්ච, ඊර්ෂ්‍යා පණ්ඩකයාද, ඨපෙත්වා, හැර, ඔපක්කමික පණ්ඩකොච, ඖපක්‍රමික පණ්ඩකයාද, නපුංසක පණ්ඩකොච, නපුංසක පණ්ඩකයාද, පණ්ඩකභාව පක්ඛෙඨිතො, පණ්ඩක බව ඇති පක්ෂයෙහි සිටයා වූ, පක්ඛපණ්ඩකොච, පක්ඛපණ්ඩකයාද, ඉධ, මේ තන්හි, අධිප්පෙතො, කැමති වන ලදී. (පස්වැදෑරුම් පණ්ඩකයන් අතුරෙන් යම් පණ්ඩකයෙක් හට අනුන්ගේ අංගජාතය මුඛයෙන් ගෙන අනුන්ගේ ශුක්‍රධාතුව තමාගේ මුඛයෙහි සිඤ්චනය කළ කල්හි තමාගේ ධාතු මෝචනය වීමෙන් රාග පරිළාහය සංසිඳේද, හෙතෙම ආසිත්තපණ්ඩකනම්. යම් පණ්ඩකයෙක් හට අන්‍ය ස්ත්‍රී පුරුෂයන්ගේ අඬ්‍යාචාරය දක්නා කල්හි ඊර්ෂ්‍යා කිරීම් වශයෙන් සේවනය කරනු කැමති කාමරාගය හටගත් කලැ තමාගේ ධාතු මෝචනය වීමෙන් කාමපරිළාහය සංසිඳේද එබඳු පණ්ඩක තෙමේ ඊර්ෂයා පණ්ඩක නම්. යම් පණ්ඩකයෙකුගේ බීජෝද්ධරණය උපක්‍රමයෙන් කරන ලද්දේද ඒ පණ්ඩක තෙමේ ඖපක්‍රමික පන්ඩක නම්. යම් පණ්ඩකයෙකුට ප්‍රතිසන්ධියෙන්ම ස්ත්‍රී ව්‍යඤ්ජනය හෝ පුරුෂ ව්‍යඤ්ජනය හො නැතිවේද ඒ පණ්ඩක තෙමේ නපුංසක පණ්ඩක නම්. යම් පණ්ඩකයෙක් හට පරදර අකුශල කර්මානුභාවයෙන් අවපක්ෂයෙහි පණ්ඩක වේද පුර පක්ෂයෙහි කාමපරිළාහය සංසිඳේද මේ තෙමේ පක්ඛ පණ්ඩකනම්. ඒ පඤ්ච පණ්ඩකයන් අතුරෙන් ආසිත්ත පණ්ඩකය උසූයපණ්ඩකය පක්ඛපණ්ඩකය යන පණ්ඩකයෝ තුන්දෙන පුරුෂ ව්‍යඤ්ජනයෙන් හා පුරුෂ ලිංගයෙන්ද යුක්ත වෙති. කුශල විපාක අහේතුක ප්‍රතිසන්ධියෙන් පිළිසිඳ ගත්තෝද වෙති. ඒ පන්ඩකයෝ තුන්දෙන

කෙලෙස් බලවත් බැවින්ම නපුංසක පණ්ඩකයන්ට සදෘශ්‍ය බැවින් පණ්ඩකයයි ව්‍යවහාර කෙරෙත් යනු විමති විනෝදනී ටීකායෙහි ආයේයි. සාරාර්ථදීපනී ටීකායෙහි වනාහි යම් පණ්ඩකයෙක් තෙමේ කාල පක්ෂයෙහි ස්ත්‍රී වේද ජූණ්හ පක්ෂයෙහි පුරුෂ වේද මේතෙමේ පක්ඛපණ්ඩක නම්. යන මේ ප්‍රවෘත්තිය ටීකාචාරීන් වහන්සේට අභිමත නොවූ කෙච්වාදයකැයි කියා අටුවායෙහි කාලපක්ෂයෙහි පණ්ඩකවෙයි ජුණ්හපක්සයෙහි ඒ පණ්ඩකයාගේ රාගපරිළාහය සංසිඳෙන්නේ යයි කියා අපණ්ඩක පක්ෂයෙහි රාගපරිළාහය සංසිඳීම මාත්‍රයක්ම කියන ලද හෙයින් පණ්ඩක පක්ෂයෙහි කියන ලද රාග පරිළාහයට පැමිණි තැනැත්තේම පන්ඩක යයි කී බව දක්වා මේ ස්ථානය පරීක්ෂා කටයුතු බව කී පමණක් විනා සම්පූර්ණ විනිශ්චයක් නොකරන ලදී. එසේ විනිශ්චය නොකරණ ලද්දේ නමුදු පරීක්ෂා කොට ගතයුතු යයි කීබැවින් "මනුස්සපණ්ඩකස්ස ද්වෙමග්ගෙ මේථුනංධම්මං පටිසෙවන්තස්ස ආපත්ති පාරාජිකස්ස වච්චමග්ගෙමුඛෙ" යනාදීන් පදභාජනියෙහි ආ බැවින්ද "මනුස්ස පණ්ඩකාදීන් ද්වෙ ද්වෙ කත්වා ජ" යනු අටුවාවෙහි ආ බැවින්ද විමති විනෝදයෙහි දක්වන ලද විනිශ්චයම සාරවත් යයි පිළිගත යුතුයි. ථෙය්‍යසංවාසකෝපන. ථෙය්‍යසංවාසක තෙමේ වනාහි. ලිංගත්ථෙනකොච. ලිංගයෙන් සොරකම් කරන්නෙක්ද සංවාසත්ථෙනාකොච එක්ව විසීමෙන් සොරකම් කරන්නෙක්ද. උභයත්ථෙනකොච. ලිංගය සංවාසය යන දෙකින් සොරකම් කරන්නෙක්ද. ඉති. මෙසේ. තිවිධොහොති. තුන්වැදෑරුම් වේ. තත්ථ. ඒ තුන් වැදෑරුම් සොරුන් අතුරෙන්. යො. යමෙක් තෙමේ සයංපබ්බජිත්වා. තෙමේ පැවිදිව. භික්ඛුවස්සානි. භික්‍ෂුවර්ෂයන්. නගණෙති. ගණන් නොකෙරේද. යථාබුද්ධං වැඩිමහළු පිළිවෙලින්. භික්ඛූනංවා. භික්ෂූන්ගේ හෝ සාමණේරානංවා. හෙරණුන්ගේ හෝ. වන්දනංනසාදියති. වැඳීම නොඉවසාද. ආසනේන. හුනස්නෙන්. නපටිබාහති. නොනැගුටුවාද. උපෝසථාදිසු.පොහොය කිරීම් ආදී විනය කර්මයන්හි නසන්දිස්සති. නොදක්නේද. අයං. මේතෙමේ. අසුද්ධ චිත්තතාය. අපිරිසිදු සිත් ඇති බැවින්. ලිංගමත්තස්වෙථෙනිතත්තා. භික්ෂු වෙස මාත්‍රයක්ම සොරකම් කළ හෙයින. ලිංගත්ථෙනකො නාම. ලිංගතේථනක නම් වේ.

යොපන. යමෙක් තෙමේ වනාහි. භික්ඛු හි පබ්බපිතො. භික්ෂූන් විසින් පැවිදි කරණ ලද්ද වූ. සාමණේර සමානො. සාමණේරයෙක්ව. කාසායානි

අපනෙත්වා, සිවුරු පහකොට, තෙසු, ඒ චීවරයන්හි, සගුස්සාගො, උත්සාහවත්ව, මේථුනංධම්මං පටිසෙවිත්වා, මෙවුන් දම් සේවනය කොට, පුන, නැවත තානි, ඒ සිවුරු, නිවාසෙත්වා, හැඳපෙරවගෙණ, සාමණේරභාවං, හෙරණබව, පටිජානාති, හගවාද, අයං, මෙතෙමේ, භික්ඛූහි දින්නලිංගස්ස, භික්ෂූන් විසින් දෙන ලද පැවිදි වේසය, අපරිච්චත්තත්තා, අත්නොහැරිය බැවින්, ලිංගත්ථේන කොනහොති, ලිංගත්ථේනක නොවේ. ලිංගානුරූපස්ස, පැවිදිවේසයට සුදුසු වූ, සංවාසස්ස, සංවාසය හෙවත් භික්සුන් හා විසීම, සාදිත්තා. ඉවසූ හෙයින්, සංවාසත්ථේනකොනහොති, සංවාසත්ථේනක නොවේ. අන්තිම වත්ථුං අජකධාපන්නකෙපි, පාරාපිකාවට පැමිණි භික්ෂූහු කෙරෙහිද, එසෙවනයො, මෙම ක්‍රමයයි යො වඩොසාමණෙරො, යම් හෙරණක් තෙමේ වනාහි, සාමණේරො සමානො, හෙරණක්ව විදේසංගන්ත්වා, අන්රටකට ගොස්, භික්ඛු වස්සානි ගණෙති, භික්ෂු වර්ෂයන් ගණන් කෙරේද, යථාබුඩ්ඪං, වැඩි මහළු පිළිවෙලින්, වන්දනංසාදියති, වැඳුම් ඉවසාද, ආසනේන, හුනස්නෙන්, පටිබාහති, නැගිටුවාද, උපෝසථාදිසු, පොහොය කිරීම් ආදි විනය කර්මයන්හි, සන්දිස්සති, දක්නේද, අයං, මේ සාමණේර තෙමේ, සංවාසමත්තස්සේව, සංවාසමානුයක්ම, ථේනිත්තතා, සොරකම් කළ බැවින්, සංවාසත්ථේනකොනාම, සංවාසත්ථේනක නම් වේ. හි, ඒ වචනය යෙදේ මැයි, භික්ඛු වස්ස ගණනාදිකො, උපසම්පද වස්ගිණීම් ආදි වූ, සබ්බොකිරියභෙදෙපි, සියලු ක්‍රියා විශේෂයද හෙවත් භේදයද (අපි ශබ්දය අස්ථාන ප්‍රයුක්තයි, මේ අපි ශබ්දය කරණ කොටගෙණ එකුද්දේශ ඒක කර්ම සමශික්ෂාදි වූ ක්‍රියා විශේෂයම සංවාසයයි. මේ ස්ථානයෙහි කැමති වන ලද්දේ නොවෙයි. මේ උපසම්පද වර්ෂයන් ගණන් කිරීම් ආදියද කැමති වන ලදී) ඉමස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි, සංවාසොති, සංවාසයයි, වේදිතබ්බො, දතයුතුයි. සික්ඛංපච්චක්ඛාය, ශික්ෂා ප්‍රත්‍යක්ඛ්‍යායනය කොට නොහොත් උපසම්පද ශීලය බහා තබා, මං, මා, කොචි, යම් කිසිවෙක් තෙමේ, නජානාතීති, නොදන්නේ යය, පුන, නැවත, එවං, මේ කියන ලද්ද වූ ක්‍රමයෙන්, පටිපජ්ජන්තෙපි, පිළිපන් භික්ෂූහු කෙරෙහිද, එසෙවනයො, මේ ක්‍රමය මැයි යොපන, යමෙක් තෙමේ වනාහි, සයංපබ්බජිත්වා, තෙමේ පැවැදිව, විහාරංගන්ත්වා, වෙහෙරට ගොස්, යථාබුඩ්ඪං, වැඩි මහළු පිළිවෙලින්, වන්දනාංසාදියති, වැඳීම ඉවසාද,

අසනේනපටිබාහති, හුනස්නෙන් නැගිටුවාද, භික්ඛුවස්සානිගණෙති, උපසපන් වස් ගණන් කෙරේද, උපෝසථාදිසු, පොහොයකිරීම් ආදී විනය කර්මයන්හි, සන්දිස්සති, දක්නේද, අයං, මේ තෙමේ ලිංගස්සචෙව, භික්ෂුවෙසයද, සංවාසස්සච, භික්ෂුන් හා එක්ව විසීමද, ථෙනිතත්තා, සොරකම් කළ බැවින්, උභයත්ථේනකොනාම, උභයත්තේනක නම් වෙයි. ධුරනික්ඛෙපවසෙන, බර බහා තැබීම් වශයෙන්, කාසායානි අපනෙත්වා, සිවුරු පහකොට, අන්තිමවත්ථුං, අජ්ඣාපජ්ජිත්වා, පරිජි ඇවතකට පැමිණ , පුන, නැවත, තානි, ඒ සිවුරු, අච්ඡාදෙත්වා හැදපෙරවාගෙන, ඒවං, මෙසේ, පටිපජ්ජන්තෙපි, පිළිපදින්නාවූ භික්ෂුහු කෙරෙහිද, එසේවනයො, මේ ක්‍රමය මැයි තිවිධොපි, තුන් වැදෑරුම් වූද, අයංථෙය්‍ය සංවාසකො, මේ ථේය්‍ය සංවාසක තෙම, ඉධ, මේ අර්ථයෙහි, අධිප්පෙතො, කැමති වන ලදී. තිවිධ ඉමං ථෙය්‍යසංවාසකං ඨපෙත්වා, තුන්වැදෑරුම් වූ මේ ථෙය්‍යසංවාසකයා හැර

රාජ දුබ්භික්ඛ කන්තාර රෝගවෙරිභයෙනවා

චීවරාහරණත්ථාංවා ලිංගං ආදියතීධයො

සංවාසං නාධිවාසෙති යාව සො සුද්ධමානසො

ථෙය්‍යසංවාසකොනාම තාව එස නවුච්චතීති

යො, යමෙක් තෙමේ, රාජ, රාජ භයින් හෝ දුබ්භික්ඛ, දුර්භික්ෂ භයින් හෝ, කාන්තාර. චෝර කාන්තාර භයින් හෝ, රෝග, රෝග භයින් හෝ වෙරිභයෙනවා, සතුරු බියෙන් හෝ, චීවරාහරණත්ථංවා, සිවුරු ගෙණයාම පිණිස හෝ, ඉධ (සාසනේ) මේ සර්වඥ ශාසනයෙහි, ලිංගං ආදියති. ශ්‍රමණ වේශය ගණීද, සො ඒ පුද්ගල තෙමේ, යාව, යම්තාක් කල්, සංවාසං, භික්ෂුන් හා එක්ව විසීම, නාධිවාසෙති, නොඉවසාද, සුද්ධමානයො, යහපත් සිත් ඇත්තේ වේද, තාව, ඒ තාක්කල්, එසො මේතෙම්, ථෙය්‍යසංවාස කොනාමන වුච්චති, ථෙය්‍යසංවාසක නම්වෙයි. නොකියනු ලැබේ.

යොපන උපසම්පන්නො. යම් උපසපන් මහණෙක් තෙමේ වනාහි, තත්ථිය භාවංපත්ථයමානො, තිර්ථකභාවය ප්‍රාර්ථනා කරනුයේ, සයංවා, තෙමේ හෝ, කුසචීවරාදිකං, කුසතණින් කරණ ලද සිවුරු ආදී වූ නොහොත් කුසතණ සිවුරු ආදී වූ, තිර්ථය ලිංගං ආදියති, තිර්ථක වේසය ගනීද, තේසංවාසන්තිකෙ, ඒ

තිර්ථකයන්ගේහෝ සම්පයෙහි, පබ්බජති, පැවිදිවේද, නග්ගොහුත්වා, නග්නයෙක්ව, ආජීවකාදීනං, ආජීවකාදීන්ගේ, සන්තිකං ගන්ත්වා ලඟට ගොස් කෙසං වත්තානි ආදියති, වත්පිළිවෙත් පිළිගණිද, අයං, මේ මහණ තෙමේ නිර්ථියපක්ඛන්තකොනාම, තිර්ථකයන් මැද වැදුනේ නම් වෙයි. මනුස්ස ජාතිකං ඨපෙත්වා මනුෂ්‍ය ජාතික සත්වයෙකු හැර, අවසෙසො සබ්බොපි, අවශේෂ සියලු සත්ව තෙමේ ද, තිරච්ජානගතො නාම, තිරිසන් සත්ව නම්වෙයි. යේන, යමෙකු විසින්, මනුස්ස ජාතිකා ජනෙත්ති, මනුෂ්‍යජාතික වූ මවෙක්, සයම්පිමනුස්ස භූතෙනෙව, තෙමේත් මනුෂ්‍ය වූ ඔවුහු විසින් ම, සංචිච්ච, මරණු කැමතිචේතනා ඇතිව, ජීවිතාවොරොපිතා, දිවියෙන් තොර කරණ ලද්දී වි නම්, අයං, මේ තෙමේ මාතු ඝාතකො නාම, මාතෘ ඝාතකයා නම්වේ. පිතුඝාතකෙපි, පිතෘඝාතකයා කෙරෙහිද, එසේවනයො, මේ ක්‍රමයමැයි, යේන, යමෙකු විසින්, අන්තමසො, යටත් පිරිසෙයින්, ගිහිලිඞ්ගෙඨිතොපි, ගිහිවෙසයෙහි සිටියා වූද, මනුස්ස ජාතිකො, මනුෂ්‍යජාති ඇත්තා වූ, ඛීණාසවො, රහතෙක් තෙම, සංචිච්ච, මරණු කැමති චේතනාවෙන් යුක්තව, ජීවිතාවොරොපිතො, දිවියෙන් තොර කරණ ලද්දේ ද, අයං, මේ තෙමේ, අරහන්ත ඝාතකො නාම, අරහන්ත ඝාතක නම් වෙයි. යොපන, යමෙක් තෙම වනාහි, පකතත්තං ප්‍රකෘති භික්ෂුණී භාවය ඇත්තා වූ, භික්ඛුණිං, මෙහෙණියකු, තිණ්ණාමග්ගානං, ත්‍රිවිධ මාර්ගයන් අතුරෙන්, අඤ්ඤතරස්මිං මග්ගෙ, එක්තරා මාර්ගයෙක්හි, දූසෙති, විනාශ කෙරේද, අයං, මේ තෙමේ, භික්ඛුනී දූසකොනාම, භික්ෂුනී දූශක නම් වේ, යො, යමෙක් තෙමේ, දෙවදත්තො විය, දෙව්දත් තෙරණුවෝ මෙන්, සාසනං, නෛර්යාණික ශාසනය, උද්ධම්මං, ධර්මයක් නොවනු කොට, උබ්බිනයංකත්වා, විනයක් නොවෙනු කොට, චතුන්නංකම්මානං, අපලෝකනාදි චතුර්විධ කර්මයන් අතුරෙන්, අඤ්ඤතරවසෙන, එක්තරා කර්මයක්හුගේ වශයෙන්, සංඝාංභින්දති, සංඝයා බිඳුවාද, අයං, මේ තෙමේ, සංඝ භේදකොනාම, සංඝභේදක නම්වේ. යො, යමෙක් තෙම, දෙවදත්තොවිය, දෙව්දත් තෙරණුවෝ මෙන්, දුට්ඨචිත්තෙන, චරදවා ගන්නා ලද සිත් ඇත්තා වූ, වධක චිත්තෙන, වධකරනු කැමති සිතින්, තථාගතස්ස, තථාගතයන් වහන්සේගේ, ජීවමානක සරීරෙ, දිවමන් සිරුරෙහි, ඛුද්දකමක්ඛිකාය, කුඩා මැස්සෙකු විසින්, පිවනමත්තං අපි, එක් වරක් පිය යුතු ලේ උගුරක් පමණ වූද, ලොහිතං උප්පාදෙති, ලොහෙ උපදවාද අයං, මේ තෙමේ ලොහිතුප්පාදකො නාම,

ලෝහිතුප්පාදක නම්වේ. යස්ස, යමෙක් හට, ඉත්ථි නිමිත්තුප්පාදක කම්මතොච, සත්‍රී නිමිත්ත උපදවන්නා වූ කර්මහේතුවෙන් ද, පුරිස නිමිත්තුප්පාදන කම්මතොච, පුරුෂ නිමිත්ත උපදවන්නා වූ කර්ම හේතුවෙන්ද, උභතො, ද්විප්‍රකාර වූ කර්ම හේතුවෙන්, සමට්ඨිතං, හටගත්තා වූ, දුවිධම්පිබ්‍යඤ්ජනං අත්ථි, ද්විප්‍රකාර වූ නිමිත්තක් ඇත්තේද අයං, මේ තෙමේ, උභතොබ්‍යඤ්ජනකො නාම, උභතොබ්‍යඤ්ජනක නම්වේ. (මේ උභතොබ්‍යාඤ්ජනක පදතෙමේ භින්නාධිකරණ ඇත්තා වූ පූර්ව පදයෙහි ගි විභක්ති ලෝපය යනු වූ මධ්‍යලොප අලුප්ත බහුව්‍රීහි සමාස පදයි. උභතො සමුට්ඨිතං බ්‍යඤ්ජනමස්සාති - උභතොබ්‍යඤ්ජනකො යනු නිර්වචනයයි) ඉති ඉමෙතෙරස පුග්ගලා, මේ තෙළෙස් පුද්ගලයෝ තුමූ, උපසම්පදය, උපසම්පද කර්මයට, අවත්ථුකා, වස්තු නොවෙත් ඉමෙ පන ඨපෙත්වා, මේ තෙලෙස් පුගුලන් හැර, අඤ්ඤසම්මං උපසම්පද පෙක්ඛෙසති, අනික් උපසපන් වනු කැමති පුද්ගලයෙක් ඇති කල්හි, උපසම්පද කම්මං, උපසම්පද කර්මය තෙම, වත්ථුසම්පත්ති වසෙන, වස්තු සම්පත්තිහුගේ වශයෙන්, අකුප්පංහොති, අකොප්‍ය වේ හෙවත් අවිරුද්ධ වේ.

ඤත්තිසම්පත්ති වසෙන, ඤත්තිහුගේ සම්පත්ති වශයෙන් හෙවත් සම්පූර්ණවයන් අකුප්පං, අකොප්‍ය වූ කර්මය. කථංහොති, කෙසේ වේද යත්? වත්ථු සංඝ පුග්ගලඤත්තිනං, වස්තු සංඝ පුද්ගලඤත්තින්, අපරාමසනානි, පරාමර්ශනය නොකරන්නාහු, පච්ඡා, පසුව, ඤත්තිඨපනංච, ඤත්තිය තැබීම ද, ඉතිඉමේපඤ්ච, මේ පස් දෙන, තාව, පළමුකොට, ඤත්තිදෙසා හොන්ති, ඤත්තිහුගේ දේෂයෝ වෙත්, තත්ථ ඒ පඤ්ච ප්‍රකාර දේෂයන් අතුරෙන්, අයං ඉත්ථන්නාමොති, අයං ඉත්ථන්නාමො යනු, උපසම්පදපෙක්ඛස්ස, උපසම්පදව අපේක්ෂා කරන්නහුගේ, අකිත්තනං, නොඇස්වීම, වත්ථු අපරාමසනං නාම, වස්තුව පරාමර්ශනය නොකිරීම නම්වේ, සුණාතු මෙභන්තෙ සංඝොති ඒත්ථ, සුණාතු මෙභන්තෙ සංඝො යන මේ වාක්‍යයෙහි, සුණාතු මෙ භන්තෙති වත්වා සුණාතුමේභන්තෙ යනු කියා, සංඝොති, සංඝා යනු, අගහණං, නොගැණීම (නොකිරීම) සංඝ අපරා මසනං නාම, සංඝයා පරාමර්ශනය නොකිරීම නම් වේ. ඉත්ථන්නාමස්ස උපසම්පද පෙක්ඛොති, ඉත්ථන්නාමස්ස උපසම්පද පෙක්ඛො යනු උපජ්ඣායස්ස අකිත්තනං, උපාධ්‍යායයාගේ නො ඇස්වීම, පුග්ගල අපරාමසනං නාම. පුද්ගලයා පරාමර්ශනය නොකිරීම නම් වේ.

සබ්බේන සබ්බං, සර්වප්‍රකාරයෙන්, ඤත්තියා අනුච්චාරණං, ඤත්තිය නොවුසුරු වීම, ඤත්ති අපරාමසනං නාම, ඤත්තිය පරාමර්ශනය නොකිරීම නම් වේ. පඨමං, පළමු කොට කම්මවාචං, කර්ම වාක්‍යය, නිට්ඨාපෙත්වා, නිමවා, එසා ඤත්තීතිවත්වා, එසා ඤත්තිය යනු කියා, ඛමති සංඝස්සාති, ඛමති සංඝස්ස යනු, ඒවං, මෙසේ, ඤත්තිකිත්තනං, ඤත්තිය නොඇස්වීම, පච්ඡා, පසුව, ඤත්තිඨපනං නාම, ඤත්තිය තැබීම නම් වේ. ඉති ඉමෙහි දෙසෙහි, මේ පඤ්ච ප්‍රකාර දේෂයෙන්, විමුත්තාය, විශේෂයෙන් මුක්ත වූ (මිදුනා වූ) ඤත්තියා සම්පන්නං, ඤත්තියෙන් සම්පූර්ණ වීම, ඤත්ති සම්පත්තිවසෙන, ඤත්තිසම්පත්තිහුගේ වශයෙන්, අකුප්පං, හොති, අකෝප්‍ය වේ.

අනුසාවනවසෙන, කර්ම වාක්‍යයාගේ වශයෙන්, අකුප්පතායපි, අකොප්‍ය භාවයෙහිද. වත්ථු සංඝ පුග්ගලානං, වස්තු සංඝ පුද්ගල යන මොවුන්, අපරාමසානානි, පරාමර්ශනය නොකරන්නාහු, සාවණාය, කර්ම වාක්‍ය හාපනං, පිරිහීම, අකාලෙ, සාවණං, කර්ම වාක්‍ය ඒ වස්තු ආදීන්ගේ කීම, ඉති ඉමෙ පඤ්ච, මෙසේ මේ පස්දෙන, අනුසාවණ දෙසා නාම, කර්ම වාක්‍ය දේෂයෝ නම් වෙත්, තත්ථ, ඒ පඤ්චප්‍රකාර දේෂයන් අතුරෙන්, වත්ථාදීනං, වස්තු ආදීන්, අපරාමසනානි, පරාමර්ශනය නොකරන්නාහු, ඤත්තියං. ඤත්තියෙහි, වුත්තසදිසානි එව. කියන ලද අර්ථයට සදෘශ වූ අර්ථ ඇත්තාහුමැයි, හීසුපන අනුසාවණාසු, තුන් කර්ම වාක්‍යයන් අතුරෙන්, යත්ථ කත්ථචි, යම්කිසි තැනෙක්හි අපරාමසනං, පරාමර්ශනය නොකිරීම, අපරාමසනංඑව, පරාමර්ශනය නොකිරීම මැයි, සබ්බේන සබ්බංපන, සර්වප්‍රකාරයෙන් වනාහි, කම්ම වාචාං අවත්වා, කර්ම වාක්‍යය නොකියා, චතුක්ඛත්තුං, සතර වරෙක්හි, ඤත්තිකිත්තනංඑව, ඤත්තිය ඇස්වීමම, සාවණාය, කර්ම වාක්‍යයාගේ, හාපනංනාම, පිරිහීම නම් වේ. අට්ඨාපන, නොහොත්, කම්මවාචබ්භන්තරෙ, කර්ම වාක්‍යයාගේ ඇතුළෙහි, අක්ඛරස්සවා, අක්ෂරයක් හෝ පදස්සවා, පදයක් හෝ, අනුච්චාරණං වා, නොවුසුරු වීම හෝ දුරුච්චාරණංවා, නපුරුකොට උසුරුවීම හෝ සාවණායහාපනංනාම, කර්ම වාක්‍යයාගේ පිරිහීම නම් වේ. සාවණාය, කර්ම වාක්‍යයාගේ, අනොකාසෙ, නුසුදුසු අවකාශයෙහි, පඨමං, පළමුකොට, ඤත්තිං අට්ඨපෙත්වා, ඤත්තිය නොතබා අනුසාවණ කරණං, කර්ම වාක්‍ය කීම නම් වේ. ඉති ඉමෙහි දේසෙහි, මේ පඤ්චප්ප්‍රකාර

දේසයන්ගෙන්, විමුත්තාය, විශේෂයෙන් මිදුණා වූ අනුසාවණායසම්පන්නං, කර්ම වාක්‍යයෙන් සම්පූර්ණ වීම, අනුසාවණ සම්පත්ති වසේන, කර්ම වාක්‍ය සම්පත්හුගේ වශයෙන්, අකුප්පංහොති, අකොප්‍යවෙයි, පුබ්බෙවුත්තං, පෙර කියන ලද්ද වූ, විපත්ති සීමා ලක්ඛණං, විපත්ති සීමා ලක්ෂණය සමතික්කන්තාය, මොනවට ඉක්මවා සිටියා වූ, සීමාය කතං, සීමාවෙහි කරන ලද්ද වූ උපසම්පද කර්ම තෙමේ, සීමාසයකතං, සීමාවෙහි කරණ ලද්ද වූ උපසම්පද කර්මතෙමේ, සීමාසම්පත්තිවසෙන, සීමාසම්පත්හුගේ වශයෙන්, අකුප්පංහොති, අකොප්‍යවෙයි. යාවතිකාභික්ඛූ, යම් පමණ භික්ෂුහු, කම්මප්පත්තා, උපසම්පදකර්මයට යෝග්‍ය වූවාහුද, තේසං, ඒ භික්ෂූන්ගේ, අනාගමනසද්ච, නොපැමිණීම ද, ජන්දරහානං, ජන්දය එලවිය යුතු භික්ෂූන්ගේ, ජන්දස්ස අනාහරණංච ජන්දය නොඑලවීමද, සම්මුඛීභූතානං, ඉදිරියෙහි සිටි භික්ෂූන්ගේ, පටික්කොසනසද්ච, නොවැලැක්වීම ද, ඉති ඉමේහයොපන, මෙසේ මේ කාරණයෝ තුන් දෙන වනාහි, පරිසදෙසා, පිරිස්හුගේ දේෂයෝ නම්වෙත්, තෙහි, ඒ දේෂයන් කෙරෙන්, විමුත්තාය පරිසාය, වෙසෙසින්ම් මිදුනු පිරිසක්හු විසින්, කතං, කරණ ලද්ද වූ කර්ම තෙමේ, පරිසසම්පත්ති වසෙන, පිරිස්හුගේ සම්පූර්ත්වයෙන්, අකුප්පංහොති, අකොප්‍ය වේ. කාරණාරහත්තා, කාරණයට සුදුසු හෙයින්, සත්ථුසාසනාරහත්තා, සාස්තෲන් වහන්සේගේ ශාසනයට සුදුසු හෙයින්, ඨානාරහංනාමහොති. ස්ථානාහී වූයේ නම් වේ, ඉති, (එවං) මෙසේ, යො, යමෙක්, අකුප්පෙන, නොවැරදුනා වූ, ඨානාරහෙන, ස්ථානයට සුදුසු වූ, ඤත්තිචතුත්ථේන, ඤත්තිය සතර වනුකොට ඇත්තා වූ, ඉමිනා උපසම්පද කම්මේන, මේ උපසම්පද කර්මයෙන්, උපසම්පන්නො, උපසම්පද වූයේද, අයං, මේතෙමේ, ඉධ, මේ පාරාජිකායෙහි, භික්ඛූති, භික්ෂුයයි, අධිප්පෙතො, ඇදගස් කරණ ලදී. පඤ්ඤත්තිවජ්ජෙසුපන, ප්‍රඥප්තිවද්‍ය ව ශික්ෂාපදයෙහි වනාහි, අඤ්ඤෙපි, අනිකුදු භික්ෂු කෙනෙක්, සංගහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්.

භික්ඛූනංසික්ඛාසාජීවසමාපන්නොති, භික්ඛූනං පෙ සමාපන්නො යනු, භික්ඛූනං, භික්ෂූන්ගේ, අධි සීල සංඛාතා, අධි ශීලයයයි කියන ලද්ද වූ, යාසික්ඛා, යම් ශික්ෂාවක් තොමෝ, අත්ථි, ඇත්තේද, තඤ්ච, ඒ අධිශික්ෂාවද, යත්ථච, යම් ශික්ෂා පදයෙක් හිද, ඒතෙ, ඒ භික්ෂුහු තුමූ, සහජීවන්ති පවත්තනන්ති, එක්ව ජිවත් වෙද්ද පවතිද්ද, එකාජීවිකා සභාගවුත්තිනොහොති, එක් හට ගැනීමක්

හා සභාග පැවත්මක් ඇත්තාහු වෙද්ද, භගවතා, භගවත්හු විසින්, පඤ්ඤත්තං, පණවන ලද්ද වූ, සික්ඛා පද සංඛ්‍යාතං, ශික්ෂා පදයයි කියන ලද්ද වූ, තංසාචජීවකඤ්ච, ඒ සා ජීවයද, තත්ථ ඒ ශික්ෂාසාජීවයෙහි, සික්ඛානභාවෙන, හික්මෙන බැවින් නොහොත් පිළිපදනා බැවින්, සමාපන්නො, මොනවට පැමිණියේ වේද, ඉති (තස්මා) එසේ හෙයින්, භික්ඛුනං, භික්ෂූන්ගේ, සික්ඛාසාජීවසමාපන්නො, සික්ඛාසාජීව සමාපන්න නම්වේ. සමාපන්නොති, සමාපන්නො යනු, සික්ඛංච, ශික්ෂාවද, පරිපූරෙන්තො, සම්පූර්ණ කෙරෙමින්, සාජීවඤ්ච, සාජීවයද, අවීතික්කමන්තොහුත්වා, නොඉක්මවන්නෙක් වී, තදුභයං, ඒ දෙකට, උපගතො, පැමිණියේද, ඉති අයං, මෙසේ මේ කියන ලද්දේ, අත්ථො අර්ථයි.

සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වාති, සික්ඛං පෙ අනාවිකත්වා යනු, යංසික්ඛං, යම් ශික්ෂාවකට, සමාපන්නො, පැමිණියේද, තං, ඒ ශික්ෂාව අපච්චක්ඛිපිත්වා, පිළිකෙව් නොකොට නොහොත් අත්නොහැර, යංචසාජීවං, යම් සාජීව, කටද සමාලන්නෝ, මොනවට පැමිණියේ ද, තස්මිං, ඒ සාජීවයෙහි, දුබ්බලභාවං, දුබල්බව, අප්පකාසෙත්වා, ප්‍රකාශ නොකොට, තත්ථ, ඒ ද්විප්‍රකාර වූ කාරනයන් අතුරෙන්, චිත්තඛෙත්ත කාලපයෝග පුග්ගල විජානනවසෙන, චිත්තය ක්ෂේත්‍රය කාලය ප්‍රයෝගය පුද්ගලය යන මේ කාරණා පස දැනගැණීම් වශයෙන්, සික්ඛාය, සික්ෂාවෙහි, පච්චක්ඛානංඤත්වා, අත් හැරීම දැන, තදභාවෙන, ඒ චිත්තාදින්ගේ අවිද්‍යාමාන භාවයෙන් (තේසං අභාවො තදභාවො තෙන තදභාවෙන යනු විග්‍රහයි. ය ශබ්ද ත ශබ්දයන් පච්ඡිම පදය හා සමාස කල කල්හි පූර්ව පදයෙහි ද නිග්ගහිතාගම වේ. පශ්චිම පදයෙහිද ද්වෙ භාවය වේ. එහෙයින් මේ පූර්ව පදයෙහි නිග්ගහීතාගමවී නිග්ගහීතයට දන්තජ තෘතීයාක්ෂරය වූ ද කාරය කොට ඒ ද කාරය ආකාරයට පමුණුවා "තදභාවො" යි සිද්ධයි. අපච්චක්ඛානං බහා නොහැඹීම හෙවත් අත් නොහැරීම, වේදිතබ්බා, දතයුතුයි. කථං වේදිතබ්බං, කෙසේ දත යුතු ද යත්? හි, (විත්ථාරෙස්සාමි) විස්තාර කෙරෙමි. උපසම්පන්න භාවතො, උපසම්පද්‍යාභාවයෙන් හෙවත් භික්ෂුභාවයෙන්, චවිතු කාමතාචිත්තෙනෙව, පහවනු කැමති සිත කරණ කොට ගෙනම, සික්ඛා පච්චක්ඛානංහොති, ශික්ෂාප්‍රත්‍යඛ්‍යානය වේ. හෙවත් උපසපන් බැව් අත්හැරියේ නම් වේ. දවාචා, කලින් කියා හැඹීමෙන් හෝ, රවාචා, කටට

ආවක් කීමෙන් හෝ, භණන්තස්ස, කියන්නාහට, පච්චක්ඛානංනහොති, ශික්ෂාප්‍රත්‍යඛ්‍යානය නොවෙයි. (දවාරවා යන්නහෙි විශේෂ කවරයත්?) යමෙක් තෙමේ අන් වචනයක් කියනු කැමැත්තේ නමුදු,

"බුද්ධං පච්චක්ඛාමි යනු යුහුසුලුව කියාද, මෙබඳු වචනය දවාහන නම්, යමෙක් තෙමේ අනත්‍යාර්ථයක් කියනු කැමැත්තේ අදහස් නොකොට "බුද්ධං පච්චක්ඛාමි" යනු කියාද මෙබඳු වචනය රවාභණන නම්) ඒවං, මෙසේ, චිත්ත වසෙන, චිත්තයාගේ වශයෙන්, සික්ඛාපච්චක්ඛාණංහොති, ශික්ෂාප්‍රත්‍යක්ඛාණය වේ. තදහාවෙන, ඒ චිත්තය නැති බැවින්, නහොති, නොවෙයි, තථා, එපරිද්දෙන්, බුද්ධං, සර්වඥයන් වහන්සේ, පච්චක්ඛාමි අත්හරිමි, ධම්මං පච්චක්ඛාමි, ධර්මය අත්හරිමි, සංඝංපච්චක්ඛාමි, සංඝයා අත් හරිමි, සික්ඛංපච්චක්ඛාමි, උපසම්පදාශීල සංඛ්‍යාත ශික්ෂාව අත්හරිමි, විනයං පච්චක්ඛාමි, විනය අත්හරිමි, පාතිමොක්ඛංපච්චක්කාමි, ප්‍රාතිමෝක්ෂය අත්හරිමි, උද්දේසංපච්චක්ඛාමි, උද්දේශය අත්හරිමි, උපජ්ඣායං පච්චක්ඛාමි, උපාධ්‍යායයා අත්හරිමි, ආචාරියං පච්චක්ඛාමි, ආචාර්යයා අත්හරිමි, සද්ධිවිහාරිකංපච්චක්ඛාමි, එක්ව වසන ශිෂ්‍යයා අත්හරිමි, අන්තෙවාසිකංපච්චක්ඛාමි, ඇතුලත් ශිෂ්‍යයා අත්හරිමි, සමානුපජ්ඣායකං පච්චක්ඛාමි, එක උපාධ්‍යාය ඇත්තා වූ සබ්‍රහ්මචාරියා අත්හරිමි, සමානාචරියකංපච්චක්ඛාමි, සමාන ආචාර්ය වූ ශිෂ්‍යයා අත්හරිමි, සබ්‍රහම්චාරිපච්චක්ඛාමි, උතුම් වූ බඹසර වස් ඇත්තා අත්හරිමි, (පච්චක්ඛාමි යන පදය ආද්‍යන්ත දීපක න්‍යාය වශයෙන් ආදියෙහි පටන් අවසානය දක්වා සියලු පදයන් හා යෙදිය යුතුයි) ඉති (ඒවං) මෙසේ, වුත්තා නං, දේශනා කරණ ලද්ද වූ, බුද්ධාදීනංවුද්දසන්නසද්ව, බුද්ධශබ්දදී වූ තුදුස් පදයන්ගේද, ගිහීති මංධාරෙහි, මාගිහියෙකැයි දරව හෙවත් දනුව, උපාසකොති මංධාරෙහි, මා උවසුවෙකැයි දරව, ආරාමිකොතිමංධාරෙහි, මා අරම රකින්නෙකැයි දරව, සාමණේරොතිමංධාරෙහි, මාහෙරණෙකැයි දරව, තිත්ථියොති මං ධාරෙහි, මා තීර්ථයෙකැයි ධරව තිත්ථියසාව කොතිමංධාරෙහි, මාතීර්ථකයන් ගේ සව්වෙකැයි දරව, අස්සමණොති මංධාරෙහි, මා ශ්‍රමණයෙක් නොවෙයි දරව, අසක්‍ය පුත්තියෝති මංධාරෙහි, මා සාක්‍ය පුත්‍රයෙක් නොවෙයි දරව, ඉති, මෙසේ, වුත්තානං, වදාරණ ලද්ද වූ, ගිහි ආදීනං, ගිහි ශබ්ද දී වූ, අට්ඨන්නසද්ව, අට

පදයන්ගේද, ඉති ඉමෙසං ද්වාවීසතියා ඛෙත්තපදානං, මේ දෙවිසි ක්ෂේත්‍ර පදයන් අතුරෙන්, යස්සකස්සචි සවෙවචනස්ස, අනියමිත වූ වෙ වචන සහිත වූ, ඛෙත්ත පදස්සවසෙන, ක්ෂේත්‍ර පදයාගේ වශයෙන්, හෙසු, ඒ කෂේත්‍ර පදයන් අතුරෙන්, යංකිඤ්චි, යම්කිසි පදයක්, වත්තු කාමස්ස, කියනු කැමැත්තා හට, යං කිඤ්චි, යම්කිසි පදයක්, වදතො, කියන්නා හට නොහොත් කියන කල්හි, සික්ඛා පච්චක්ඛානංහොති, ශික්ෂා ප්‍රත්‍යඛ්‍යානය වේ, රුක්ඛාදීනං, වෘක්ෂාදීන් අතුරෙන්, අඤ්ඤතරස්ස නාමං, එක්තරා රුකක්හුගේ නම, ගහෙත්වා, ගෙණ, පච්චා ක්ඛන්තස්ස, නැවත අස්වන්නා වූ භික්ෂුවහට, නහොති, ශික්ෂාප්‍රත්‍යඛ්‍යානය නොවේ. ඒවං, මෙසේ, ඛෙත්තවසෙන, ක්ෂේත්‍ර පදයන්ගේ වශයෙන්, පච්චක්ඛානංහොති, ශික්ෂා ප්‍රත්‍යක්ඛ්‍යානය වේ. තදභාවෙන, ඒ ක්ෂේත්‍ර පදයන්ගේ අවිද්‍යමාන භාවයෙන්, නහොති, නොවේ. තත්ථ, ඒ ක්ෂේත්‍ර පදයන් අතුරෙන්, පච්චක්ඛාමීතිච, පච්චක්ඛාමියනුද, මංධාරෙහීති ච, මංධාරෙහි යනුද, වුත්තං, කියන ලද්ද වූ, යංඒතං, වත්තමාන කාල වචනං, යම් වර්තමාන කාල වචනයක් අත්ථි, ඇත්තේද, බුද්ධෙන, සර්වඥයන් වහන්සේගෙන්, මෙ, මට, අලං, ප්‍රයෝජනයක් නැත. බුද්ධෙන, බුදුන්ගෙන්, කින්නු, කවර ප්‍රයෝජනයක්ද, බුද්ධෙන, බුදුන්ගෙන්, මෙ, මට, නඅත්ථො, වැඩක් නැත්තේයි, බුද්ධෙන, බුදුන් කෙරෙන්, අහං, මම, යුමුත්තො, මනාකොට මිදුනෙමි, ඉති ආදිනානයෙන, යන මේ ආදී ක්‍රමයෙන්, ආඛ්‍යාත වසෙන, ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය වශයෙන්, කාලං අනාමසිත්වා, වර්තමාන කාලය ආමර්ශනය නොකොට, පුර් මෙහි වුද්දස හි පදෙහි සද්ධිං, පූර්ව වූ තුදුස් පදයන් සමග, යෝජෙත්වා, යොද, වුත්තානි, කියන ලද්ද වූ, අලංමෙහි ආදිනි, අලංමෙ යනාදි වූ, යානිචත්තාරි පදනි අත්ථි, යම් සතර පද කෙණෙක් ඇත්තා හුද, තෙසංයෙව, ඒ පදයන්ගේ, වෙ වචනානංවසෙන, පරියාය හෙවත් විශේෂ වචනයන්ගේ වශයෙන්, පච්චක්ඛානං හොති, ප්‍රත්‍යඛ්‍යානය වේ. පච්චක්ඛාසීතිවා, ප්‍රත්‍යඛ්‍යානය කෙළේයයි කියා හෝ, පච්චක්ඛිස්සං ඉතිවා, ප්‍රත්‍යඛ්‍යානය කරන්නෙමියි කියා හෝ, මංධාරෙයීතිවා මා දැනගනුවයි හෝ, මංධාරෙස්සසීතිවා, මාදැන ගන්නෙහි යයි කියා හෝ, අහං, මම, යන්නුන (යදිපන) පච්චක්ඛෙය්‍යන්තිවා, ඉදින් ප්‍රත්‍යඛ්‍යානය කෙළේ වී නම් යෙහෙකැයි කියා හෝ, ඉති ආදීනි, මේ ආදී වූ, අතීතානාගත පරිකප්පව චනානි,

අතීතානාගත කාලයන් කල්පණා කරන්නා වූ වචනයන්, භණන්තස්ස, බණන්නා හට, පච්චක්ඛානංනහොති. ප්‍රත්‍යඛ්‍යානය නොවෙයි, ඒවං, මෙසේ, වත්තමාන කාල වසෙනව. ප්‍රත්‍යුත්පන්න කාලයෙහි වූ ශබ්දයන්ගේ වශයෙන්ද,, අනාමට්ඨකාල වසෙන ච, කාල පරාමර්ශනය නොකිරීම් වශයෙන් ද, පච්චක්ඛානංහොති, ප්‍රත්‍යඛ්‍යානය වේ, (ප්‍රත්‍යුත්පන්න කාලයෙහි වූ ශබ්දය කාලපරාමර්ශනය නොකළා වූ ශබ්දයද යන මේ දෙදෙනාගේ අභාවයෙන්) නහොති, ප්‍රත්‍යඛ්‍යානය නොවේ. පයොගොපන, ප්‍රයෝගය වනාහී, කායිකො, කායික ප්‍රයෝගය, වාචසිකොති, වාචසික ප්‍රයෝගයයි, දුවිධො, ද්විප්‍රකාර වේ, තත්ථ, ඒ ද්විප්‍රකාරයන් අතුරෙන්, බුද්ධං පච්චක්ඛාමීති ආදිනානයෙන, බුද්ධංපච්චක්ඛාමි යනාදී ක්‍රමයෙන්, යායකායචිභාසාය, අනියමිත වූ යම්කිසි බසකින්, වචීභේදංකත්වා, වාක්භේදය කොට. වාචසික පයොගෙන එව, වචනයෙන් හටගත් ප්‍රයෝගයෙන්ම, පච්චක්ඛානංහොති, ශික්ෂා ප්‍රත්‍යඛ්‍යානය වේ. අක්ඛරලිඛනංවා, අකුරු ලිවීමක් හෝ. හත්ථමුට්ඨාදස්ස නංවා, අත්මිට ආදිය දැන්වීමක් හෝ, කායපයෝගං කරොන්තස්ස, කායික ප්‍රයෝගය කරන්නාහට, නහොති, ශික්ෂාප්‍රත්‍යඛ්‍යානය නොවේ. ඒවං, මෙසේ, වාචසිකපයොගෙන එව, වචනයෙන් කරණ ප්‍රයෝගයෙන්ම, පච්චක්ඛානංහොති, ශික්ෂා ප්‍රත්‍යඛ්‍යානය වේ, තදභාවෙන, ඒ වාචසික ප්‍රයෝගයාගේ අභාවයෙන්, නහොති. ප්‍රත්‍යඛ්‍යානය නොවේ. පුග්ගලෝපන. පුද්ගලතෙම වනාහි, යොචපච්චක්ඛාති. යමෙක් තෙමේ උපසම්පද ශීලය අත්හරිද, යස්සචසන්තිකෙ, යමෙකුගේ සමීපයෙහි, පච්චක්ඛාති, උපසම්පදව අත්හරිද, (සන්තිකෙ යනු පාඨශේෂයි) ඉති. මෙසේ, දුවිධො, ද්විප්‍රකාර වේ, තත්ථ, ඒ ද්විප්‍රකාරයන අතුරෙන්, යොපච්චක්ඛාති, යමෙක් තෙම ප්‍රත්‍යඛ්‍යානය කෙරේද, සො, හෙතෙම, උම්මත්තකඛිත්ත චිත්ත වෙදනට්ටානං, උමතු තැනැත්තේය. වික්ෂිප්ත සිත් ඇත්තේය. යම් රෝග වේදනාවකින් පෙළෙන්නාය යන මේ තුන්දෙන අතුරෙන්, අඤ්ඤතරො සචෙහොති, ඉදින් එක්තරා කෙනෙක් වේද, යස්සපනසන්තිකෙ, යමෙකුගේ සමීපයෙහි වනාහි, පච්චක්ඛාති, ප්‍රත්‍යඛ්‍යානය කෙරේ ද, සො, ඒ ප්‍රත්‍යඛ්‍යානය පිළිගන්නා වූ පුද්ගල තෙමේ, සචෙ මනුස්ස ජාතිකොහොති, ඉදින් මනුෂ්‍ය ජාති ඇත්තෙක් වේද, උම්මත්තකාදීනං, උමතුවන් ආදීන් අතුරෙන් අඤ්ඤතරොනවහොති, එක්තරා එකෙක් නොවේද, සම්මුඛීභූතෝවහොති,

සම්මුඛ වුයේත් වේද ගෙවත් මුහුනට මුහුනලා සරිලෑයෙන් වේද, සික්ඛා පච්චක්ඛානං හොති, ශික්ෂා ප්‍රත්‍යඛ්‍යානය වේ, අසම්මුඛීභූතස්ස, ඉදිරිපිට නොසිටියෙකු හට, දූතෙනවා, දූතයෙකු ලවා හෝ, පණ්ණෙනවා, පත්‍රයකින් හෝ, ආරෝචනං, ඇස්වීම, නරූහති, නොනැගේ, ඒවං, මෙසේ, යථාවුත්ත පුග්ගල වසෙන, යම් යම් පරිද්දකින් කියන ලද පුද්ගලයන්ගේ වශයෙන්, පච්චක්ඛානංහොති, ශික්ෂාප්‍රත්‍යඛ්‍යානය වේ, තදභාවෙන, ඒ පුද්ගලයාගේ අභාවයෙන්, නහොති, ශික්ෂා ප්‍රත්‍යඛ්‍යානය නොවේ. විජානනම්පි, දැනගැන්මද, නියමිතා නියමිතවසෙන, නියමිත අනියමිත වශයෙන්, දුවිධං, ද්විප්‍රකාරවේ, තත්ථ, ඒ ද්විප්‍රකාරයන් අතුරෙන්, යස්සවා, යමෙක්හුගේ සමීපයෙහි හෝ, යෙසංවා, යම් කෙණෙකුන්ගේ සමීපයෙහි හෝ, නියමෙත්වා, නියමකොට, ඉමස්සවා, මොහුට හෝ, ඉමෙසංවා, මොවුන්හට හෝ, ආරොචමිතිවදති, දන්වමියි කියාද, සචෙ, ඉදින්, තෙ, ඒ අසන්නා වූ පුද්ගලයෝ, ජානන්ති යන්නෙහි සම්බන්ධයි, පකතියා, ස්වභාවයෙන්, ලෝකෙ, ලෝකයෙහි, මනුස්සානං, මිනිසුන්ගේ, වචනංසුත්වා, වචනය අසා, ආවජ්ජන සමයෙ, ආවර්ජනාකරණ කල්හි, ජානන්තියථා, යම්සේ දනිද්ද, ඒවං, (තථා) එපරිද්දෙන්, තස්ස, ඒ උපසම්පදව අත්හරණ භික්ෂුහුගේ, වචානන්තරමේව, වචනයට අනතුරුවම, තස්ස, ඒ උපසම්පදව හරණ භික්ෂුහුගේ, සික්ඛංපච්චක්ඛානභාවං යන්නෙහි සම්බන්ධයි, අයං, මේ මහණ තෙම, උක්කණ්ඨිතො ශුහිවා, සස්නෙහි උකටලි වුයේයයි කියාහෝ, ගිහිභාවං පත්ථයති ඉතිවා, ගිහිභව පතන්නේ යයි කියා හෝ යෙනකෙනචි ආකාරේන, යම්කිසි අයුරකින්, සික්ඛා පච්චක්ඛානභාවං, උපසම්පදව අත්හරණ බව, ජානන්ති, දැනගණිද්ද, සික්ඛාපච්චක්ඛාහොති, ශික්ෂාව අත්හරින ලද්දිම වේ. (භාවය - "සචෙපනෙ යථාපකතියා ලෝකෙමනුස්සානං වචනං සුත්වා ආවජ්ජනසමයෙ ජානන්ති" යනාදී පාඨයාගේ භාවය - ලෝකවාසී මනුෂ්‍යයෝ තුමූ "බුද්ධං" යන වචනය කී කල්හි "බු" යන ශබ්දය අරමුණු කොට ගෙණ ශ්‍රොත ද්වාරයෙහි සතළොස් චිත්තක්ෂණයකින් චිත්තවීථියක් හා තදනන්තරව ඒබුකාරයම අරමුණු කොටගෙණ මනො ද්වාරයෙහි සත් ජවනයකින් පරිපූර්ණ වූ තදනු වර්තක මනො ද්වාර චිත්ත වීථියක් ද ඊට අනතුරුව, "ධං" යන ශබ්දය අරමුණු කොටගෙණ ශ්‍රොතවාරික චිත්ත වීථියක් හා ඉක්බිති ඒ "ධං" යන්නම අරමුනු කොට ගෙණ තදනුවර්තක

මනෝද්වාරික චිත්තවීථියක්ද තදනන්තරව "බුද්ධං" යන අක්ෂර සමුදයසංඛ්‍යාත වූ නාම ප්‍රඥප්තිය අරමුනු කොටගෙණ මනෝද්වාර චිත්තවීථියක්ද ඊට අනතුරුව "බුද්ධං" යන අක්ෂරාවලියෙන් වාචකවූ බුද්ධ පදාර්ථය අරමුණු කොට ගෙණ එක් මනෝද්වාරික චිත්තවීථියක්ද යන මේ චිත්ත වීථි සතක් උපදිති. මේ ශබ්දයෙන් පරෝපදේශ රහිතව චතුස්සත්‍යාව බෝධය කළා වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වාචක වන සේක්යයි දැනගන්නාක් මෙන් ශික්ෂා ප්‍රත්‍යක්ඛ්‍යානය කරන්නාවූ භික්ෂූහුගේ "බුද්ධංපච්චක්ඛාමි" යන ආදී වචනයන්ට අනතුරුව මේ මහණා තෙමේ සස්නෙහි උකටලී වූයේ යයි කියා හෝ ගිහිබව පතන්නේ යයි කියා හෝ ශික්ෂාව බහා තබන්නේ යයි කියා හෝ සස්නෙහි දුකසේ ජීවත් වනබවට පැමිණියේ යයි කියාහෝ යන මේ ආදි යම්කිසි අක්ෂරයකින් ශික්ෂාප්‍රත්‍යක්ඛ්‍යානය කෙළේ යයි අනිත් භික්ෂුව දැනගත් කල්හිම ශික්ෂා ප්‍රත්‍යක්ඛ්‍යානය සිද්ධ විය යයි දත යුතු. ශබ්දාර්ථය දන්නේ නමුදු කියන ලද ආකාරයෙන් ශික්ෂා ප්‍රත්‍යක්ඛ්‍යානය කළබව අනිත් භික්ෂුවක්හු විසින් දැන නොගන්නා ලද්දේ නම් ශික්ෂාප්‍රත්‍යාක්ඛ්‍යානය සිද්ධ නොවී යයි දත යුතු) අථ, එසේ නොවී නම්, අපරභාගෙ, මෑතභාගයෙහි, ඉමිනා, මේ භික්ෂුහු විසින්, කිංවුත්තං ඉති, කුමක් කියන ලද්දේ දැයි, චින්තෙත්වා ජානන්ති, සිතා හෙවත් කල්පණාකොට දැනගනිද්ද, අඤ්ඤෙවාජානන්ති, අන්‍යයෝ හෝ දැනගණිද්ද, සික්ඛා අපච්චක්ඛාතාවහොති, ශික්ෂාව ප්‍රත්‍යක්ඛ්‍යානය නොකරන ලද්දී ම වේ. අනියමෙත්වා, නියම නොකොට, ආරොචෙන්තස්සපන, දන්වන්නා වූ භික්ෂුව හට වනාහි, වුත්තනයෙන, උක්ත නයින් හෙවත් යටකියන ලද ක්‍රමයෙන්, යොකොචිමනුස්ස ජාතිකො, යම්කිසි මනුෂ්‍ය ජාති ඇත්තෙක් තෙමේ, වචනත්ථං, ශබ්දාර්ථය, සචෙජානාති, ඉදින් දනී නම්, සික්ඛා පච්චක්ඛාතාවහොති, ශික්ෂාප්‍රත්‍යක්ඛ්‍යානය කරන ලද්දීම වේ. ඒවං, මෙසේ, විජානනවසෙන, විශේෂයෙන් දැනීම් වශයෙන් පච්චක්ඛානංහොති, ශික්ෂාප්‍රත්‍යක්ඛඛ්‍යානය වෙයි. තදභාවෙන, ඒ දැනීම නැති බැවින්, නහොති, ශික්ෂාප්‍රත්‍යක්ඛ්‍යානය නොවෙයි. යොපන, යම් මහණෙක් තෙමේ වනාහි, අන්තමසො, යටත් පිරිසෙයින්, දවායපි, ක්‍රීඩා වශයෙන් හෝ, පච්චක්ඛාති, ප්‍රත්‍යක්ඛ්‍යානය කෙරේද, තේන, ඒ මහණුන් විසින්, සික්ඛා, ශික්ෂා තොමෝ, අපච්චක්ඛාතාහොති, ප්‍රත්‍යකඛ්‍යානය නොකරණ

ලද්දීම වෙයි. වුත්තප්පකාරානං, යටකියන ලද ප්‍රභේද ඇත්තා වූ. ඉති ඉමෙසං, චිත්තාදීනංවාවසේන, මෙසේ මේ චිත්තාදීන්ගේ වශයෙන් හෝ (ආදි ශබ්දයෙන් ක්ෂේත්‍ර කාලය ප්‍රයෝගය පුද්ගලය විජානනය යන පස ගැනේ) සබ්බසොවා, සර්වප්‍රකාරයෙන් හෝ, අපච්චක්ඛානේන, ශික්ෂාව බහා නොතැබීමෙන්, සික්ඛං, ශික්ෂාව, අපච්චක්ඛාය, ප්‍රත්‍යාඛ්‍යානය නොකොට සික්ඛාපච්චක්ඛානස්ස ඒව, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයාගේම, අන්වභූතං, කාරණා වූ, එකච්චං, එකම කාරණය, දුබ්බලශ්‍යං, දුර්වලභාවය, අනාවිකත්වා, ප්‍රකාශ නොකොට, මෙථුනංධම්මං පතිසෙවෙය්‍යාති එත්ථ, මෙථුනං පෙ පතිසෙවෙය්‍ය යන මේ පාඨයෙහි, මෙථුනං ධම්මන්ති, මෛථුන ධර්මය යනු, රාගපරියුට්ඨානේන, රාගසල්ලයෙන් විදුනා ලද සිත් ඇති බැවින්, සදිසානං, සදෘශ්‍ය වූ, උභින්නං, ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකුන්ගේ, ධම්මං, හැසිරීම වෙයි. පතිසෙවෙය්‍යාති, පතිසෙවෙය්‍ය යනු, සෙවෙය්‍ය, සේවනය කරන්නේ වී නම්, අජ්ඣාපජ්ජෙය්‍ය, ඉක්මවා හැසිරෙන්නේ වී නම්, අන්තමසො ඉති, අන්තමසො යනු, සබ්බන්තිමෙන පරිච්ඡේදෙන, සියල්ලගෙන් පහත් වූ පිරිසිඳීමෙන්, තිරච්ඡානගතායපි ඉති තිරච්ඡානගතායපි යනු, පටිසන්ධි වසෙන, ප්‍රතිසන්ධි වශයෙන් තිරච්ඡානේසු, තිරසනුන් කෙරෙහි, ගතාය අපි,හට ගත්තා වූ මාගමක් කෙරෙහිද? තිරච්ඡානෙසු. තිරිසන්හුයයි කීයේ නමුදු පාරාජිකාවට සුදුසු වූ තිරිසන්හුම මෙහි තිරච්ඡානයයි දතයුක්තාහුය. සියලු තිරිසන් ගත සත්වයෝම නොගත යුක්තාහුය. එහෙයින් කිහ.

"අපදනං අහිමච්ඡා දිපදනඤ්ච කුක්කුටි

චතුප්පදනං මජ්ජාරි වත්ථුපාරාජිකස්සිමා"

යන මේ ගාථාව ආශ්‍රය කොටගෙණ පාරාජිකාවට වස්තු වූ තිරිසන් මාගමුන් දත යුක්තාහුයි) අයං, මේ තිරච්ඡානගතායයන ප්‍රඥප්ති තොමෝ, අනුප්පඤ්ඤත්ති, අනුප්‍රඥප්ති නම්වේ. පාරාජිකොහොති ඉති. පාරාජිකා හොති යනු, පරාජිතොහොති, පැරදුනේ වෙයි,පරාජයං, පැරදීමට, ආපන්නො, පැමිණියේ වෙයි, (භාවය පුද්ගල වාචක වූ මේ පාරාජික ශබ්ද තෙමේ කර්ම සාධනයෙහි වේ. පරායන පදය උපපදකොට ඇත්තා වූ ජිධාතුවෙන් පරව තද්ධිතප්‍රත්‍යය වූ තැනි උපසර්ගයාගේ ආකාරයට වෘද්ධිකොට තකාරයට

තකාරාදේශකොට පාරාජික ශබ්දය නිපන්නේයි "පරාජීයතීති = පාරාජිකෝ" යනු නිර්වචනයි. කුමක් හෙයින් කර්ම සාධනයෙහි මේ ප්‍රත්‍යය කරණ ලද්දේ ද යත්? "පුග්ගලෝපන කම්මසාධනේන පාරාජිකසද්දේන වුච්චතීති දස්සෙ න්තො ආහ යස්මා පරාජිතොති ආදි" යන ටීකා පාඨයෙන් හා සාරාර්ථ දීපනී පාඨයෙන්ද දත යුතුයි. "පරා" යන උපසර්ග තෙමේ ධාත්වර්ත්ව බාධක වෙයි. ජි ධාතු තොමෝ හඤ්ජනාර්ථ වාචක වෙයි. "චුතොපර දේධා හට්ඨෝ" යන පාඨයෙහි "හට්ඨෝ" යන පදය හා සමානාර්ථයි) අසංවාසො ඉති, අසංවාසො යනු, පකතත්තා, ප්‍රකෘති උපසම්පද ශීලය ඇත්තා වූ, භික්ඛූ, භික්ෂුහු තුමූ, එත්ථ, මේ එකකර්මාදිවිධියෙහි, සහවසන්ති, එක්ව වෙසෙද්ද, ඉති (තස්මා) එසේ හෙයින්, එකකම්මාදිකො, ඒකකර්මාදී වූ විධි, රචනා තෙමේ, සංවාසොනාම, සංවාසගම් වේ. යො, ඒ සංවාස තෙමේ, තෙනසද්ධිං, ඒ පාරාජිකාවට පැමිණි භික්ෂුව හා සමග, නත්ථි, නැත්තේ ද, ඉති (තස්මා) එසේ හෙයින්, අසංවාසො, අසංවාස නම් වේ. හි, ඒ වචනය යෙදේ මැයි, එසො, මේ පාරාජිකාවට පැමිණි භික්ෂු තෙමේ, සංඝ කම්මේසු, සංඝයාගේ කුදුමහත් විනය කර්මයන්හි, ගණපුරණොපිනහොති, ගණයපිරවීම් මාත්‍රයකුදු නොවෙයි. අයංපන, මේ වනාහි, තාව, පළමුකොට, පදවණ්ණනා, පදයක් පාසා කරන්නාවූ අර්ථ වර්ණනාවයි,- "අයං තාව පද වණ්ණනා"යන වචනය මතු විනිශ්චය දැක්වීම සඳහා යොදන්නා වූ පදයකි. ඒ විනිශ්චය කවරේ දැයි යන චෝදනයට පරිහාර පිණිස "අයංපනෙත්ථ" යනාදිය කථනය කළහ.

අයංපන, මේ මතු වක්ෂ්‍යමාන වනූ ලබන්නේ වනාහි, එත්ථ, මේ ශික්ෂා පදයෙහි, විනිච්ඡයො, අර්ථ විනිශ්චයයි. හි, විස්තාර කෙරෙමි. මනුස්සා මනුස්ස තිරච්ඡානවසෙන, මිනිස් නොමිනිස් තිරිසන්නුන්ගේ වශයෙන්, තිස්සො ඉත්ථියො හොන්ති, ස්ත්‍රිහු තුන් දෙනෙක් වෙති. තාසං, ඒ ස්ත්‍රීන්ගේ, වච්චමග්ග පස්සාවමග්ග මුඛ මග්ග වසෙන, මුත්‍ර මාර්ගය මලමාර්ගය, මුඛමාර්ගය යන තුන් දෙනාගෙන් වශයෙන්, තයොතයොකත්වා, තුණක්තුණක් කොට, නවමග්ගා, මාර්ග නවදෙනෙක් ද, තථා, එපරිද්දෙන්, උභතොබ්‍යඤ්ජනකානං, උභතො, බ්‍යඤ්ජනකයන්ගේ, නවමග්ගා, මාර්ගයෝ නවදෙනෙක්ද, පුරිසානංපන, පුරුෂන්ගේ වනාහි, වච්චමග්ග මුඛ මග්ග වසෙන, මලමාර්ග මුඛ මාර්ගයන්ගේ වශයෙන්, ද්වෙද්වෙකත්වා, මාර්ග දෙකක් දෙකක් කොට, ඡමග්ගා මාර්ගයෝ සදෙනෙක්ද, පණ්ඩකානං,

පණ්ඩකයන්ගේ, තථා, එපරිද්දෙන්, ජමග්ගා, මර්ගයො සදෙදෙක්ද, ඉති (එවං) මෙසේ, තිංසමග්ගා හොන්ති, තිස්මාර්ගී කෙනෙක් වෙති. තෙසු, ඒ තිස් මාර්ගීයන් අතුරෙන්, අත්තනෝවා, තමාගේ හෝ, පරෙසංවා, මෙරමාගේ හෝ, යස්සකස්ස චි, අනියමිත වූ යම්කිසි, සන්ථතස්සවා, අතුරණ ලද්ද වූ හෝ අසන්ථතස්සවා, නොඅතුරණ ලද්ද වූ හෝ, මග්ගස්ස, මාර්ගීයාගේ, පරෙසංපනමතානම්පි, අන්‍ය වූ මලවුවන්ගේද, අක්ඛායිතස්ස, බලු කැණහිල් ආදීන් විසින් කඩා නොකන ලද්ද වූ හෝ, යෙභුය්‍යෙන, බොහෝ සෙයින්, අක්ඛායිතස්සවා, බළු කැණහිල් ආදීන් විසින් කඩා නොකන ලද්ද වූ හෝ (යෙභුය්‍යෙන අක්ඛායිත යනු ශරීරයාගේ දෙකෙන් කොටසක් බලු කැණහිල් ආදීන් විසින් කඩා නොකන ලද්ද වූ යනුවෙන් අර්ථගත යුතු) මග්ගස්ස, මාර්ගීයාගේ, පකතිවාතේන, ප්‍රකෘති වාතයෙන්, අසම්ඵුට්ඨෙ, වැද නොගන්නා ලද්ද වූ, අල්ලොකාසෙ, තෙත් වූ අවකාශයෙහි, යො භික්ඛු, යම් මහණෙක් තෙමේ, එක තිල බීජ මත්තම්පි, එක් තල ඇටයක් පමණකුදු, සන්ථතංවා, අතුරණ ලද්ද වූ හෝ, අසන්ථතංවා, නොඅතුරණ ලද්ද වූ හෝ අත්තනො, තමාගේ අංගජාතං, පුරුෂව්‍යඤ්ජනය, සෙවන චිත්තේන, සෙවිනා කැමති සිතින්, පවෙසෙති, ප්‍රවේශ කෙරේද, (මේ පාඨයෙන් ආත්මෝපක්‍රමය දක්වන ලදී. ආත්මෝපක්‍රමය දක්වා මේ සේවනය වනාහි ආත්මෝපක්‍රමමාත්‍රයකින්ම සිද්ධවන්නේ නොවෙයි. පරොපක්‍රමයෙන්ද සිද්ධවන්නේය. ඒ පරෝපක්‍රමයෙහිද ආස්වාදනය කරන්නාහටම නොහොත් කැමැත්තෙන් රසවිඳින්නාහටම ඇවත්වෙයි. ආස්වාදනය නොකරන්නාහට ඇවත් නොවෙයි යනු දක්වනු පිණිස "පරෙනවා" යනාදිය කීහ) පරෙනවා, මෙර මා විසින් හෝ පවෙසියමානෙ, ප්‍රවේශකිරීම ප්‍රවේශ කරණ ලදය සිටීමය උද්ධරණය කිරීමය යන මේ සතර දෙනා අතුරෙන්, යංකිඤ්චි, යම්කිසි ක්ෂණයෙක්හි නොහොත් යම්කිසි ක්‍රියාවෙක්හි, සාදියති, ආස්වාදනය කෙරේද, අයංභික්ඛු, මේ මහණ තෙමේ, පාරාජිකාපත්තිං, පරිජි ඇවතට, ආපන්නො නාමහොති, අවන්නේ නම් වේ, අයංපන, මේ කියන ලද්දේ වනාහි, තාව, පළමු කොට, එත්ථ, මේ ප්‍රථම පාරාජිකායෙහි, අසාධරණ විනිච්ඡයො, සෙසු පාරාජිකාවන්ට සාධාරණ නොවූ විනිශ්චයයි, සබ්බසික්ඛා පදානංපන, සියලු ශික්ෂාපදයන්ගේ වනාහි, සාධාරවිනිච්ඡයත්ථං, සාධාරණ වූ විනිශ්චය පිණිස, අයං, මේ මතු වක්ෂ මාන වනු ලබන්නේ, මාතිකා, මාතෘකායි. ඒ මාතෘකාව

දක්වන්නට "නිදානං" යනාදිය කීහ.

**නිදානං පුග්ගලං වත්ථු පඤ්ඤත්ති විධිමෙවච**
**ආණත්තාපත්ති නාපත්ති විපත්තිං අඞ්ගමේවච**
**සමුට්ඨානං විධිං කිරියා සඤ්ඤ චිත්තෙහි නානත්තං**
**වජ්ජකම්මප්ප භේදඤ්ච තිකද්වය විධිංතථා**

**ලක්ඛණං සත්තරසධා ඨිතං සාධාරණං ඉදං**
**ඤත්වා යොජෙය්‍ය මෙධාවි තත්ථතත්ථයථාරහං**

නිදානං, නිදානයද, පුග්ගලවත්ථු පඤ්ඤත්තිවිධිමෙවච, පුද්ගල වස්තු ප්‍රඥප්තීන්ගේ ප්‍රභේදයද, ආණත්තාපත්තිනාපත්ති විපත්ති අංගමේවච, ඇණවීමය ආපත්ති භේදය ඇවත් නොවීමය විනාශවීමය අංගය යන මොහුද සමුට්ඨාන විධිංච, සමුට්ඨාන ප්‍රභේදය ද, කිරියාසඤ්ඤචිත්තෙහි, ක්‍රියා සංඥ චිත්තයන්, කරණ කොටගෙණ, නානත්තංච, වෙනස් බවද, වජ් ජකම්මප්පභේදංච, වද්‍ය ප්‍රභේදය හා කර්ම ප්‍රභේදයද, තථා, එපරිද්දෙන්, තිකද්වය විධිංච, කුශල ත්‍රික වේදනා ත්‍රික විධිය ද, ඉති, මෙසේ, සප්තරසද, සතළොස් ප්‍රකාරයකින්, ඨිතං, සිටියා වූ, සාධාරණ, සියලු ආපත්තීන්ට සාධාරණ වූ, ඉදංලක්ඛණංඤත්වා, මේ ලක්ෂණය දැන, මෙධාවි, නුවණැත්තේ, තත්ථ තත්ථ, ඒ ඒ ශික්ෂා පදයෙහි, යථාරහං, සුදුසු පරිද්දෙන්, යොජෙය්‍ය. යොදන්නේය.

තත්ථ, ඒ ගාථාවෙහි, නිදානංනාම , නිදානය වනාහි, වේසාලි, විසල් මහනුවරය, රාජගහ, රජගහ නුවරය, සාවත්ථි, සැවැත්නුවරය, ආලවි, අලවි රටය, කෝසම්බි, කොසඹෑ නුවරය සක්ක, සක්ක නම් දනව්වය. භග්ගානං වසේන භග්ග නම් නුවරය, යන මොවුන්ගේ වශයෙන්, සත්තවිධං, සත් වැදෑරුම් වූ, පඤ්ඤත්තිඨානං, ප්‍රඥප්ති ස්ථානයකි. හි, ඒ එසේ මැයි, ඉදං, මේ සත්වැදෑරුම් වූ තැන, සබ්බ සික්ඛා පදානං, සියලු ශික්ෂා පදයන්ගේ, නිදානං, නිදානයයි. පුග්ගලෝනාම, පුද්ගල නම්, යං යං ආරබ්භ, යම් යම් පුද්ගලයෙකු

අරබයා, තං තං සික්ඛාපදං පඤ්ඤත්තං ඒ ඒ ශික්ෂාපදය පනවන ලද්දේ වේද, සො සො පුග්ගලො, ඒ ඒ පුද්ගල තෙමේ, පුග්ගලො නාම, පුද්ගල නම් වේ. (භාවය - ආදිකර්මික පුද්ගලයෝ භික්ෂු භික්ෂුනීන්ගේ වශයෙන් ද්විප්‍රකාර වෙති. ඔහු තුමූ කවර හයත්

**සුදින්නො ධනියො සම්බහුලා, වග්ගුමුදන්තිකා**
**සෙය්‍යසකො උදායිචාලවකා ඡන්න මෙත්තියා**
**දෙවදත්තස්සපි ඡබ්බග්ගියො පනඤ්ඤතරොපිච**

**හත්ථකො අනුරුද්ධොච සත්තර ස චුල්ලපන්ථකො**
**බෙලට්ඨී සීසො චානන්දෙ සාගතො රිට්ඨනාමකො**
**නන්ද ථේරේත තෙවීස භික්ඛු නං ආදි කම්මකා**

**සුන්දරිනන්ද ථුල්ලනන්ද ඡබ්බග්ගියඤ්ඤතරාපිච**
**චණ්ඩ කාලි සම්බහුලාචේව භික්ඛුනියො පරා**
**භික්ඛු නන්තු සත්තෙව හොන්තිතා ආදි කම්මිකා**

යන මේ ගාථාශ්‍රය කොටගෙණ විනයෙහි ආදි කම්මකයෝ දත යුක්තාහුය) වත්ථුනාම, වස්තූහු නම්, තස්ස තස්ය පුග්ගලස්ස, ඒ ඒ පුද්ගලයාගේ, අජ්ඣාචාරො වුච්චති, හැසිරීම යයි කියනු ලැබේ. පඤ්ඤත්තිවිධන්ති, පඤ්ඤත්ති විධිය යනු, පඨම පඤ්ඤත්ති, ප්‍රථම ප්‍රඥප්තිය, අනුපඤ්ඤත්ති, අනුප්‍රඥප්තිය, අනුප්පන්න ප්‍රඥප්තිය, සබ්බත්ථ පඤ්ඤත්ති, සබ්බත්ථ ප්‍රඥප්තිය, පදෙසාපඤ්ඤත්ති, ප්‍රදේශ ප්‍රඥප්තිය , සාධාරණ පඤ්ඤත්ති, සාධාරණප්‍රඥප්තිය, අසාධාරණ පඤ්ඤත්ති, අසාධාරණ ප්‍රඥප්තිය, එකතොපඤ්ඤත්ති, එකතො ප්‍රඥප්තිය, උභතො පඤ්ඤත්තිවසෙන, උභතොප්‍රඥප්තිය යන මොවුන්ගේ වශයෙන්, නවවිධා, නව ප්‍රකාර වූ, පඤ්ඤත්ති, ප්‍රඥප්තියයි, තත්ථ ඒ නව වැදෑරුම් ප්‍රඥප්තීන් අතුරෙන්,

අනුප්පන්න පඤ්ඤත්ති නාම, අනුප්පන්න ප්‍රඥප්ති නම්, දෙසෙ අනුප්පන්නෙ, [illegible] නුපන් කල්හි, පඤ්ඤත්තා, පණවන ලද්ද වූ ආපත්තියයි. සා, ඒ අනුප්පන්න ප්‍රඥප්ති හොමෝ, අට්ඨ ගරු ධර්ම වසෙන, අෂ්ට ප්‍රකාර වූ ගරු ධර්මයන්ගේ වශයෙන්, භික්ඛුනීනංයේව, භික්ෂුනීන්ටම, යස්මා, යම් හෙයකින්, ඉතො, මෙයින්, අඤ්ඤත්‍ර සෙසු තැනෙක්හි, නත්ථි, නැත්තේයි විනය ධර පඤ්චමෙන, විනය ධරයෙකු පස්වැනි කොට ඇත්තා වූ, ගණෙන, ගණයා කරණකොට ගෙන, උපසම්පදා, කරන්නාවූ, උපසම්පදාවද, ගුණංගුණූපාහනං, මහනෙහි සම් පටල කීපයකින් යුක්ත වූ වහන් දැරීමද, ධුවනහානං, නිතර නැහැම ද, චම්මත්ථරණං, හම්, ඇතිරිල්ලක් ද, ඉති, මෙසේ, එතෙසං වසෙන, ඒ ශික්ෂාපදයන්ගේ වශයෙන්, චතුබ්බිධා, සතර වැදෑරුම් වූ ප්‍රඥප්ති හොමෝ, පදෙස පඤ්ඤත්ති නාම, ප්‍රදේශ ප්‍රඥප්ති නම් වේ. හි, ඒ එසේ මැයි, මජ්ඣිම දේසෙයෙව, මධ්‍යම දේශයෙහිම, එතෙහි, ඒ ශික්ෂා පදයන් කරණ කොට ගෙණ, ආපත්තිහොති, ඇවතට පැමිණීම වේ. හෙසුපී, ඒ ශික්ෂා පදයන් අතුරෙනුදු, ධුවනහානං, නිතර නැහැම, පටික්ඛිත්තමත්තං, පිළිකෙව් කිරීම පමණකි, පාතිමොක්ඛෙ, ප්‍රාතිමෝක්ෂයෙහි, හි (යස්මා) යම්හෙයකින්, ඉතො, මෙයින්, තතො, ඒ ධුවනහාන ශික්ෂා පදයෙන්, අඤ්ඤං, අන්‍ය වූ, පදෙසපඤ්ඤත්ති නාම, ප්‍රදේශ ප්‍රඥප්තියක් නම්, නත්ථි, නැත්තේ යි, සබ්බානි, සියලු ශික්ෂා පදයෝ තුමූ, සබ්බත්ථ පඤ්ඤත්තියේව හොන්ති. සබ්බත්ථ ප්‍රඥප්තිහුම වෙති.

සාධාරණ පඤ්ඤත්ති දුකඤ්ච, සාධාරණ ප්‍රඥප්ති අසාධාරණ ප්‍රඥප්ති යන දුකයද, එකතොපඤ්ඤත්ති දුකඤ්ච, එකතො ප්‍රඥප්ති උභතො ප්‍රඥප්තියන දුකයද, අත්ථතො, අර්ථ වශයෙන්, යස්මා, යම්හෙයකින්, ඒකං, සදෘශ්‍ය වේද, තස්මා, එසේ හෙයින්, අනුප්පන්නපඤ්ඤත්තිච, අනුප්පන්න ප්‍රඥප්ති යද, සබ්බත්ථ පඤ්ඤත්ති දුකඤ්ච, සබ්බත්ථ ප්‍රඥප්ති ප්‍රදේශ ප්‍රඥප්ති යන දුකයද, එකතොපඤ්ඤත්ති දුකඤ්ච, එකතොප්‍රඥප්ති උභතො ප්‍රඥප්ති යන දුකයද, ඨපෙත්වා, හැර, සෙසානංචතුන්නංපඤ්ඤත්තිනංවසෙන, අවශිෂ්ට වූසතර ප්‍රඥප්තීන්ගේ වශයෙන්, සබ්බත්ථ, සියලු ශික්ෂාපදයෙහි, විනිච්ඡයොවේදිතබ්බො, අර්ථ විනිශ්චය දතයුතුයි. ආණත්තාපත්තිනාපත්ති විපත්තීති එත්ථ, ආණත්තා පත්තිනාපත්ති විපත්ති යන මේ පදයෙහි, ආණත්තීති, ආණත්ති යනු, ආණාපනා

වුච්චති, ඇණවීම යයි කියනු ලැබේ. ආපත්තීති, ආපත්තිය යනු, පුබ්බපයොගාදිවසෙන , පූර්ව ප්‍රයෝගාදීන්ගේ වශයෙන්, ආපත්ති භේදෙ, ආපත්ති විශේෂයි, අනාපත්තීති, අනාපත්තිය යනු, අජානනාදිවසෙන, නොදැනීම ආදී වශයෙන්, අනාපත්ති, ආපත්ති නොවීමයි, විපත්තීති, විපත්ති යනු, සීල ආචාර දිට්ඨි ආජීව විපත්තිනං, ශීලවිපත්තිය ආචාර විපත්තිය දෘෂ්ටි විපත්තිය ආජීව විපත්තිය යන සතර විපත්තීන් අතුරෙන්, අඤ්ඤතරා, එක්තරා විපත්තියකි, ඉති ඉමාසං, ආණත්තාදීනංවසෙන, මෙසේ මේ ඇණවුම් ආදීන්ගේ වශයෙන්, සබ්බත්ථ, සියලු ශික්ෂා පදයෙහි, විනිච්ඡයො වේදිතබ්බො, විනිශ්චය දත යුතුයි. අංගන්ති, අංගං යනු, සබ්බසික්ඛාපදෙසු, සියලු ශික්ෂා පදයන්හි, ආපත්තීනං, ආපත්තීන්ගේ, අංගංවේදිතබ්බං, අංගය දත යුතුයි. සමුට්ඨාන විධන්ති, සමුට්ඨාන විධිය යනු, සබ්බාපත්තීනං, සියලු ආපත්තීන්ගේ, (සමුට්ඨානානි නාමයන්නෙ හි සම්බන්ධයි) කායො, ශරීරයද, වාචා, වචනයද, කායවාචා, කය වචන යන දෙදෙනාද, කාය චිත්තං, කාය චිත්ත යන දෙදෙනාද, වාචාචිත්තං, වචන චිත්තය යන දෙදෙනා ද, කායවාචාචිත්තං, කය වචනය සිත යන තුණද, ඉති, මෙසේ, එකාංගිකද්වංගික තිවඞ්ගිකානි, එක් අංගයක්හා අංගයෝ දෙදෙනෙක් ද අංගයෝ තුන් දෙනෙක් ද ඇත්තාවූ, ඉති ඉමානිඡ, මෙසේ මොව්හු සදෙන, සමුට්ඨානානි නාම, සමුට්ඨානයෝ නම් වෙති. යානි, යම් සවැදෑරුම් සමුට්ඨාන කෙණෙක් තුමූ, නොහොත් ඇවත් නගින්නා වූ හේතු වූ සදෙනකේ තුමූ, සන්ති, ඇත්තාහුද, තානි, ඒ සවැදෑරුම් සමුට්ඨානයෝ. සික්ඛාපද සමුට්ඨානානිතිපි, සමුට්ඨානයෝ යයි ද, වුච්චන්ති, කියනු ලැබෙත් (යන්ති තානි ආපත්ති සමුට්ඨානානිතිපි යනු පාඨශේෂයි) තත්ථ, ඒ ෂඩාකාර ආපත්ති සමුට්ඨානයන් අතුරෙන්, පුරිමානිතීනි, පූර්ව වූ සමුට්ඨානයෝ තුන්දෙන, අචිත්තකානි, අචිත්තක නොහොත් සිත නොමෙහෙයා නගින්නාවූ ඇවැත් නම් වෙති, පච්ඡිමානි, පශ්චිම වූ සමුට්ඨානයෝ තුන් දෙන, සචිත්තකානි, සිත මුල් ව නගින ආපත්තීහු නම්වෙති. තෙසු, ඒ අචිත්තක සචිත්තක සමුට්ඨානයන් අතුරෙන්, ඒකෙන වා සමුට්ඨානෙන, එක් සමුට්ඨානයකින් හෝ, ද්විවාසමුට්ඨානෙහි, සමුට්ඨානයන් දෙදෙනෙකුන්ගෙන් හෝ, තීහිවා සමුට්ඨානෙහි, සමුට්ඨානයන් තුන්දෙනෙකුන්ගෙන් හෝ චතූහිවාසමුට්ඨානෙහි, සතර සමුට්ඨානයකින් හෝ, ඡහිවා සමුට්ඨානෙහි, සමුට්ඨානසයකින් හෝ, ආපත්තියො සමුට්ඨහන්ති, ආපත්තිහු නගිත්, පඤ්ච

සමුට්ඨානානාම, සමුට්ඨානපසකින් නගින ඇවතක් නම්, නත්ථි, නැත්තේයි, නත්ථි, ඒ ඇවත් නගින පඤ්චප්‍රකාර සමුට්ඨානයන් අතුරෙන්, ඒකසමුට්ඨානානාම, එක් සමුට්ඨානයක් ඇත්තා වූ ආපත්ති නම්, චතුත්ථේනච, සතර වැනි වූද, පඤ්චමෙනච, පස්වැනි වූද, ඡට්ඨෙනච, සැවනි වූද, සමුට්ඨානේන, සමුට්ඨානය හේතු කොටගෙන, සමුට්ඨාති, ඇවත නගී. අඤ්ඤේහි, අනික් සමුද්ධානයන් හේතු කොටගෙන, නසමුට්ඨාති, ඇවත නොනගී, ද්විසමුට්ඨානා නාම, සමුට්ඨාන දෙකක් ඇත්තා වූ, ඇවත් නම්, පඨම චතුත්ථේහිච, පලමුවැනි සතර වැනි වූද, දුතිය පඤ්චමෙහිච, දෙවෙනි පස්වෙනි වූද. තතියඡට්ඨෙහිච, තුන්වෙනි සවැනි වූද, චතුත්ථඡට්ඨෙහිච, සතර වැනි සවැනි වූද, පඤ්චමඡට්ඨෙහිච, පස්වෙනි සවැනිවූද, සමුට්ඨානෙහි, සමුට්ඨානයන් හේතු කොට ගෙන, සමුට්ඨාති, ඇවත නැගේ. අඤ්ඤෙහි, අනික් සමුට්ඨානයන් හේතු කොටගෙන, නසමුට්ඨාති, ඇවත නොනැගේ, තිසමුට්ඨානා නාම, සමුට්ඨානත්‍රයකින් නගින ඇවතක් වනාහි, පඨමෙහි, පළමු වැනි වූ, තීහිසමුට්ඨානේහිච, තුන්සමුට්ඨානෙහිච, තුන් සමුට්ඨානයන් හේතු කොටගෙණද, සමුට්ඨාති, ඇවත නැගේ, අඤ්ඤෙහි, අනික් සමුට්ඨානයන්ගෙන්, නසමුට්ඨාති, ඇවත නොනැගේ. චතුසමුට්ඨානානාම, චතුසමුට්ඨානික ආපත්තිතොමෝ වනාහි, පඨමතතිය චතුත්ථඡට්ඨෙහිච, පළමුවෙනි තුන්වෙනි සතරවෙනි සවැනි වූද, දුතියතතිය පඤ්චමඡට්ඨෙහිච, දෙවෙනි තුන්වෙනි පස්වෙනි සවෙනි වූද, සමුට්ඨානෙහි, සමුට්ඨානයන් හේතුකොට ගෙන, සමුට්ඨාති, ඇවත නගී, අඤ්ඤෙහි, අනික් සමුට්ඨානයන් හේතු කොට ගෙන, නසමුට්ඨාති, ඇවත නොනගී. ඡසමුට්ඨානා නාම, සමුට්ඨානසයක් ඇත්තා වු ආපත්ති තොමෝ වනාහි, ඡහිපි, සමුට්ඨානසය හේතුකොට ගෙනද නොහොත් ෂඩාකාර සමුට්ඨානයන් හේතුකොට ගෙණද, සමුට්ඨාති, ඇවත නගී. ඒවං,මෙසේ,

**තිධෙකසමුට්ඨානා පඤ්චධා ද්විසමුට්ඨිතා**

**තිධාති චතුරුට්ඨානා එකධා ඡසමට්ඨිතාති**

එකසමුට්ඨානා, එක් සමුට්ඨානයක් ඇත්තා වූ,ආපත්ති තොමෝ, තිධා, තුන්වැදෑරුම් වන්නීය, ද්විසමුට්ඨිතා, සමුට්ඨාන දෙකක් ඇත්තාවූ ආපත්ති තොමෝ, පඤ්චධා, පස් පරිද්දෙකින් වන්නීය. තිචතුරොඨානා, තිසමුට්ඨානික

චතුසමුට්ඨානික වූ ආපත්ති තොමෝ ද්විධා, දෙවැදෑරුම වන්නීය, ඡසමුට්ඨිතා, සමුට්ඨානසයක් ඇත්තා වූ ආපත්ති තොමෝ, ඒකධා, එක් වැදෑරුම් වන්නීය.

ඉති, මෙසේ, සමුට්ඨාන වසෙන, ඇවැත් නගින්නා වූ ශේතූන්ගේ වශයෙන්, සබ්බා ආපත්තියො, සියලු ආපත්තීහු තුමූ. තෙරසධාව හොන්ති, තෙළෙසක් ම වෙති. තා, ඒ ආපත්තිහු තුමූ, පඨමපඤ්ඤත්ති සික්ඛා පද වසෙන, ප්‍රථම ප්‍රඥප්ති ශික්ෂා පදයාගේ වශයෙන්. සමුට්ඨානතො, හටගන්නා හෙයින්, තෙරසනාමානි, තෙළෙස් නම් කෙනෙකුන්. ලභන්ති. ලබත්. පඨම පාරාජික සමුට්ඨානා, ප්‍රථම පාරාජිකාවට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, අදින්නාදාන, ආදින්නාදානය බඳු සමුට්ඨාන ඇත්තා වූ, ආපත්ති කෙනෙක්ද, සඤ්චරිත්ත, සඤ්චරිත්ත ශික්ෂා පදයට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, සමනුභාසන, සමනුභාසන, ශික්ෂාපදයට බඳු සමට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, කඨින, කඨින ශික්ෂා පදයට බඳු සමට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, එළකලොම, එළකලොම ශික්ෂා පදයට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, පදසොධම්ම, පද සොධම්ම ශික්ෂා පදයට බඳු සමුටඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, අද්ධාන, අද්ධාන සිකපදයට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, ථෙය්‍ය සත්ථ, ථෙය්‍යසත්ථ ශික්ෂා පදයට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, ධම්මදේසනා, ධම්මදේසනා ශික්ෂා පදයට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, භූතාරොචන, භූතාරෝචන ශික්ෂා පදයට බඳු සමට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, චොරි වුට්ඨාපන චොරිවුට්ඨාපන ශික්ෂා පදයට බඳු සමට්ඨාන ඇත්තා වූ, ආපත්ති කෙනෙක්ද. අනනුඤ්ඤාතසමට්ඨානා, අනනුඤ්ඤාත ශික්ෂා පදයට බඳු සමුට්ඨාන ඇත්තා වූ ආපත්ති කෙනෙක්ද, ඉති, මෙසේ. තෙරසනාමානිලභන්ති, තෙළෙස් නම් කෙනෙක් ලැබෙත්, තත්ථ, ඒතෙළෙස් නම් අතුරෙන්, යා, යම් ආපත්තියක් තොමෝ, කායචිත්තතො, කය සිත දෙකින්, සමුට්ඨාති, නැගේද, අයං, මේ ආපත්ති තොමෝ, පඨමපාරාජික සමුට්ඨානා නාම, පඨමපාරාජික සමුට්ඨාන ඇවත නම් වේ. යා, යම් ආපත්තියක් තොමෝ, සචිත්තකෙහි සචිත්තක වූ, තීහිසමුට්ඨානෙහි, තුන්සමුටඨානයකින්, සමුට්ඨාති, නැගේද, අයං, මේ ආපත්ති තොමෝ, අදින්නා දාන සමුටඨා නාම, අදින්නා දාන සමට්ඨාන ඇත්තා වූ ආපත්ති නම් වන්නීය. යා, යම් ආපත්තියක් තොමෝ,

ජහිපිසමුට්ඨානෙහි, ෂඩාකාර සමුට්ඨානයන්ගෙන්ද, සමුට්ඨාති, නගීද, අයං, මේ ආපත්ති තොමෝ, සඤ්චරිත්ත සමුට්ඨාන නාම, සඤ්චරිත්ත සමුට්ඨාන නම් වන්නීය. යා, යම් ආපත්තියක් තොමෝ, ජට්ඨෙනෙව, සවැනි වූ සමුට්ඨානයෙන්ම, සමුට්ඨාති, නගීද, අයං, මේ ආපත්ති තොමෝ සමනුභාසන සමුට්ඨානා නාම, සමනුභාසන සමුට්ඨාන නම් වන්නිය, යා, යම් ආපත්තියක් තොමෝ, තතියජට්ඨෙහි, තුන්වන සවන සමුට්ඨානයන්ගෙන්, සමුට්ඨාති, හටගනීද, අයං, මේආපත්ති තොමෝ, කඨින සමුට්ඨානා නාම, කඨින සමුට්ඨාන නම් වන්නිය, සමුට්ඨානයන්ගෙන් සමුට්ඨාති හට ගනීද, අයං, මේ ආපත්ති තොමෝ, එළකලොමසමුට්ඨානානාම, එළකලොමසමුට්ඨාන නම් වන්නීය. යා, යම් ආපත්තියක් තොමෝ, දුතියපඤ්චමෙහි, දෙවනපස්වන සමුට්ඨානයන් හේතුකොටගෙන, සමුට්ඨාති, නගීද, අයං, මේ ආපත්ති තොමෝ, පදසොධම්ම සමුට්ඨාන නාම, පදසොධම්ම සමුට්ඨානනම් වන්නීය. යා යම් ආපත්තියක් තොමෝ, පඨම තතිය චතුත්ථ ජයෙහි, පළමුවන තුන්වන සතරවන සවන සමුට්ඨානයන්ගෙන්, සමුට්ඨාති, ගටගනීද, අයං, මේආපත්ති තොමෝ, අද්ධානසමුද්ධානා නාම, අද්ධාන සමුට්ඨානා නම් වන්නිය, යා, යම් ආපත්තියක් තොමෝ, චතුත්ථජට්ඨෙහි, සතරවන සවන සමුට්ඨානයන්ගෙන්, සමුට්ඨාති, නගීද, අයං, මෝ තොමෝ ථෙය්‍යපසත්ථ සමුට්ඨානා නාම, ථෙය්‍යපසත්ත සමුට්ඨාන නම් වන්නීය. යා, යම් ආපත්තියක් තොමෝ, පඤ්චමේනෙව, පස්වෙනි සමුට්ඨානයෙක්ම, සමුට්ඨාති, නගීද, අයං, මො තොමෝ, ධම්ම දේසනා සමුට්ඨානා නාම, ධම්ම දේසනා සමුට්ඨාන නම් වන්නීය, යා, යම් ආපත්තියක් තොමෝ, අචිත්තකෙහි, අචිත්තක වූ, තිහිසමුට්ඨානෙහි, තුන්සමුට්ඨානයකින්, සමුට්ටාති .නගීද, අයං, මෝ තොමෝ, භූතාරොචන සමුට්ඨානා නාම, භූතාරොචන සමුට්ඨාන නම් වන්නිය, යා, යම් ආපත්තියක් තොමෝ, පඤ්චජට්ඨෙහි පස්වෙනි සවෙනි සමුට්ඨානයන්ගෙන්, සමුට්ඨාති, නගීද, අයං, මෝ තොමෝ, චොරිවුට්ඨාපන සමුට්ඨානා නාම, චොරි වුට්ඨාපන සමුට්ඨාන නම් වන්නිය, යා, යම් ආපත්තියක් තොමෝ, දුතිය තතිය පඤ්මජට්ඨෙහි, දෙවන තුන්වන පස්වන සවන සමුට්ඨානයන් ගෙන්, සමුට්ඨාති, නගීද, අයං, මෝ තොමෝ, අනනුඤ්ඤාත සමුට්ඨානා නාම, අනනුඤ්ඤාත සමුට්ඨාන නම් වන්නීය. ඉති, මෙසේ, ඉමස්ස සමුට්ඨාන විධිනොපිවසෙන, මේ සමුට්ඨාන විධිහුගේ

වශයෙන්ද, සබ්බත්ථ, සියලු ශික්ෂා පදයෙහි, විනිච්ඡයෝ වෙදිතබ්බො, අර්ථ විනිශ්චය දත යුතුයි.

කිරියා සඤ්ඤ චිත්තෙහි නානත්තන්ති, කිරියා පෙ නානත්තං යනු, එතෙහි, කිරියාදීහි, මේ ක්‍රියාදීන් කරණකොටගෙන, සබ්බාපත්තීනං, සියලු ආපත්තීන්ගේ, නානාභාවංසඤ්ඤත්වා, වෙනස් වනබව දැන, සබ්බත්ථ, සියලු ශික්ෂා පදයෙහි, විනිච්ඡයෝවේදිතබ්බො, විනිශ්චය දතයුතුයි. හි, ඒ එසේමැයි, සබ්බාපත්තියො, සියලු ආපත්ති හු තුමු, කිරියවසෙන, ක්‍රියාවන්ගේ වශයෙන්, පඤ්චවිධාහොන්ති, පස්වැදෑරුම් වෙත්, සෙයපථිදං, (කතමානි) ඒ පස්වැදෑරුම් ආපත්තිහු කවරහ යත්? කිරියතො, නොකටයුතු දෙය කිරීමෙන්, සමුට්ඨාති, නැගෙන්නා වූ, ආපත්ති අත්ථි, ඇවතක් ඇත්තිය, අකිරියතො, කටයුතු දෙය නොකිරීමෙන්, සමුට්ඨාති, නගින්නාවූ, ආපතති අත්ථි, ඇවතක් ඇත්තිය, කිරියා කිරියතො, නොකටයුතු දෙය කිරීමය කටයුතු දෙය නොකිරීමය යන මෙයින්, සමුට්ඨාති, හටගන්නා වූ, ආපත්ති අත්ථි, ඇවතක් ඇත්තිය. සියා, ඇතැම් කලෙක්හි, කිරියතො, නොකටයුතු දෙය කිරීමෙන්, සියා, ඇතැම් කලෙක්හි, අකිරියතො, කටයුතු දෙය, නොකිරීමෙන්, සමුට්ඨාති. හටගන්නා වූ. ආපත්ති අත්ථි, ඇවතක් ඇත්තිය, සියා ඇතැම් කලෙක්හි, කිරියතො, නොකටයුතු දෙය කිරීමෙන්, සියා ඇතැම් කලෙක්හි, කිරියා කිරියතො, නොකටයුතු දෙය කිරීමය කටයුතු දෙය නොකිරීමය යන මෙයින්, සමුට්ඨාති, හටගන්නා වූ, ආපත්ති අත්ථි, ඇවතක් ඇත්තිය තත්ථ, ඒ පස් වැදෑරුම් ආපත්තීන් අතුරෙන්, යා, යම් ඇවතක් හොමෝ, කායෙනවා, කයින් හෝ, වාචායවා, වචනයෙන් හෝ, පඨවිඛණනාදිසුවිය, පොළව කැනීම් ආදියෙහි මෙන්, වීතික්කමං, කරොන්තස්ස, ඉක්මවීම කරන්නාවූ භික්ෂුහට, හොති, වේද, අයං, මේ ආපත්ති තොමෝ, කිරියතො, නොකටයුතු දෙය කිරීමෙන්, සමුට්ඨාති නාම, නැගෙන්නා වූ ඇවත නම් වන්නීය. යා, ඇවතක් තොමෝ, කාය වාචාහි, කය වචන දෙකින්, කත්තබ්බං, කටයුතු දෙය, අකරොන්තස්ස, නොකරන්නා වූ භික්ෂුහට, හොති, වේද, පඨම කඨිනාපත්ති විය. පළමුවන කෙළින් ඇවත මෙන්, හොති, වේද, අයං, මේ ඇවැත් තොමෝ, අකිරියතො, කටයුතු දෙය නොකිරීමෙන්, සමුට්ඨාති නාම, හටගන්නා වු ඇවත නම් වේ. යා, යම් ඇවතක් තොමෝ, අඤ්ඤාතිකාය භික්ඛුණියා, නොනෑවූ මෙහෙණින්නක්හුගේ, හත්ථතො, අතින්, චීවර පටිග්ගහණාපත්ති විය, සිවුරු පිළිගැනීමෙන් වන ඇවත මෙන්,

කරොන්තස්සච, කරන්නා වූ මහණහටද, අකරොන්තස්සච, නොකරන්නා වූ මහණ හටද, හොති, වේද, අයං, මේ ඇවත් තොමෝ, කිරියාකිරියතො, නොකටයුතු දෙය කිරීමෙන් හා කටයුතු දෙය නොකිරීමෙන්, සමුට්ඨාති නාම, නගින්නා වූ ඇවත නම් වන්නිය. යා, යම් ආපත්තියක් තොමෝ, රූපිය පටිග්ගහණාපත්ති විය. රන් රිදී පිළිගැන්වීමෙන් වියයුතු වූ ඇවතක් මෙන්ද, සියා කරොන්තස්සච, ඇතැම් කලෙක්හි කරන්නාවූ මහණ හටද, සියා අකරොන්තස්සච, ඇතැම් කලෙක්හි නොකරන්නාවූ මහණ හටද, හොති, වේද, අයං, මේ ඇවත් තොමෝ, සියාකිරියතො, ඇතැම් කලෙක්හි නොකටයුතු දෙය කිරීමෙන්, සියා අකිරියතො, ඇතම් කලෙක්හි කටයුතු දෙය නොකිරීමෙන්, සමුට්ඨාති නාම, හටගන්නා වූ ආපත්ති නම් වන්නීය, යා, යම් ඇවතක් තොමෝ, කුටිකාරාපත්ති විය. කුටිය කිරීමෙන් වන ඇවතක් මෙන්, සියාකරොන්තස්සච, ඇතැම් කලෙක්හි කරන්නා වූ නොකරන්නා වූ මහණ හටද, හොති, වේද, අයං, මේ ආපත්ති තොමෝ. සියා, ඇතැම් කලෙක්හි, කිරියතො, කිරීමෙන් ද, සියා ඇතැමි කලෙක්හි, කිරියා කිරියතො, කිරීමෙන් හා නොකිරීමෙන් ද, සමුට්ඨාති නාම, හටගන්නා වූ ඇවත නම් වන්නිය. සබ්බාපත්තියොච, සියලු ආපත්තිහුද, සඤ්ඤාවසෙන, සංඥා වශයෙන්, සඤ්ඤා විමොක්ඛා, සඤ්ඤා විමොක්ඛාපත්ති යයි කියාද, නො සඤ්ඤා විමොක්ඛා නො සඤ්ඤා විමොක්ඛාපත්ති යැයි කියාද, ඉති, මෙසේ, දුවිධාහොන්ති, දෙවැදෑරුම් වෙත්, තත්ථ, ඒ දෙවැදෑරුම් ආපත්තීන්අතුරෙන්, යතො., යම් ඇවතකින් , වීතික්කමසඤ්ඤය අභාවෙන, ඉක්මවන කල්පනාවක් නැති බැවින්, මුච්චති, මිදේද, අයං, මේ ඇවත් තොමෝ, සඤ්ඤා විමොක්ඛා සංඥාවිමෝක්ෂා නම් වන්නීය. (සඤ්ඤාය අභාවෙන විමොක්ඛො අස්සාති, සඤ්ඤා විමෝකඛා යි මධ්‍ය පද ලොප බහුව්‍රීහි සමාස කරුණු කැමතිව, "යතොවිතික්කම සඤ්ඤාය අභාවෙන මුච්චති අයං සඤ්ඤා විමෝක්ඛා" යි, කියන ලදී) ඉතරා, ඉක්මවන චේතනාව නැත්තේද නොමිදෙන ඇවත් තොමෝ, නොසඤ්ඤාවිමොක්ඛා, නොසඤ්ඤා විමෝක්ඛා නම් වන්නීය. පුනච, නැවතද, සබ්බාපි, සියලු ඇවත්හු ද, චිත්තවසෙන, චිත්තයාගේ වශයෙන්, සචිත්තකා, සචිත්තකාපත්ති යයි කියාද, අචිත්කා ඉති අචිත්තාපත්තියයි කියාද, දුවිධාහොන්ති. දෙවැදෑරුම් වෙත්. තත්ථ, ඒ දෙවැදෑරුම් ආපත්තීන් අතුරෙන්, යා, යම් ඇවතක් තොමෝ, සචිත්තක සමුට්ඨානච සෙනෙව, සචිත්තක

සමුට්ඨානයාගේ වශයෙන්ම, සමුට්ඨාති. නගිද, අයං, මේආපත්ති තොමෝ, සචිත්තකා. සචිත්තක නම් වන්නීය, යා, යම් ඇවතක් තොමෝ. අචිත්තකෙනවා, අචිත්තක සමුට්ඨානයෙන් හෝ, සචිත්තකමිස්සකෙනවා, සචිත්තකය හාමිශ්‍ර වූ සමුට්ඨානයෙන් හෝ, සමුට්ඨා, නගිද, අයං, මෝ තොමෝ. අචිත්තකා. අචිත්තක නම් වන්නීය. වජ්ජකම්මප්පභෙදන්ති එත්ථ, වජ්ජකම්මප්පභේදං යන මේ වාක්‍යයෙහි, සබ්බාපත්තියො, සියලු ආපත්තිහු, වජ්ජවසෙන, වද්‍ය වශයෙන්, ලොකවජ්ජාව, ලෝක වද්‍යය ඇත්තී යයි කියාද, පන්නත්ති වජ් ජාව, ප්‍රඥපතිවද්‍ය ඇත්තියයි කියාද, ඉති මෙසේ දුවිධාහොන්ති, දෙවැදෑරුම් වෙත්, තත්ථ, ඒ දෙවැදෑරුම් ආපත්තින් අතුරෙන්, යස්ස, යම් ඇවතකට, සචිත්තකපක්ඛෙ, සචිත්තක පක්ෂයෙහි, චිත්තං, චිත්තය තෙමේ, අකුසල මෙව හොති. අකුසල්ම වේද, අයං, මේ ආපත්ති තොමෝ, ලෝකවජ්ජා, ලෝකවද්‍ය නම් වන්නීය. සෙසා. අවශේෂාපත්තිහු තුමු. පණ්ණත්තිවජ්ජා, ප්‍රඥප්තිවද්‍ය නම් වන්නාහ. (මෙහි අභිප්‍රාය - සචිත්තක අචිත්තකයයි කියන ලද්ද වූ සුරාපානා දී අචිත්තකාපත්තියකට සුරාය'යන වස්තුව දැනගන්නාවූ සිතින් සචිත්තක යන පක්ෂයෙහි චිත්තයද අකුසල් සිතම වේ.ඒ ආපත්ති තොමෝ ලෝකවද්‍ය නම්. සචිත්තකපක්ඛෙ,  යනමේ විශේෂණය නිෂ්ප්‍රයෝජන විය යුතුයි. සචිත්තකපක්ඛෙ යන සාමාන්‍යය කීයේ නමුදු වස්තු විජානනයෙන් හටගන්නා වූ සචිත්තකය  ම ගත යුතුයි. ප්‍රඥප්ති විජානනයෙන් හටගත්තා වූ සචිත්තකය නොගත යුතුයි. කුමක් හෙයින යත්. ඉදින් ප්‍රඥප්ති වද්‍ය වූ ශික්ෂා පදයෝ තුමූ, ලෝකවද්‍ය වූ ශික්ෂා පදය වන්නේ නම්, ඒ වචනය යෙදේ මැයි, නොකැපයයි තහනම් කොට වදාරණ ලද්ද වූ භාග්‍යවත් බුදු රජාණන් වහන්සේගේ ආඥාව බව දැන දැනම ශික්ෂා පද ඉක්මවන්නා වූ පුද්ගලයාට කුශල චිත්තයක් නම් නොඋපදියි. අනාදර වශයෙන් ප්‍රතිඝචිත්තයක්ම උපදී. එහෙයින් ප්‍රඥප්ති විජානන යෙන් හටගත්තා වූ සචිත්තක පක්ෂය නොගත යුතු යයි කී නිසායි. මේ වනාහි සාරාර්ථදීපනී ටීකායෙහි ආවා වූ මුඛමාත්‍ර විනිශ්චයකි. සාරාර්ථදීපනී ටීකායෙහි "අපිචෙත්ථ" යනාදීන් ප්‍රාරම්භව යුක්ති සාධක සඳපත හෝ එලවා කරන ලද්ද වූ විස්තාර විනිශ්චය එයින් දත යුතුයි. යම් ඇවතකට වස්තු විජානනයෙන් හටගන්නා වූ සචිත්තක පක්ෂයෙහි සිත් තෙමේ කුශලය කියාද අකුශලය කියාද අව්‍යාකෘතය කියාද අනියම් වී නම් ඒ

ආපත්ති හොමෝ ප්‍රඥප්තිවද්‍ය නම් වෙයි. කී නියායි.) සබ්බාව, සර්වාපත්තිහුද, කායකම්ම, වචිකම්ම, තදුභය වසෙන, කායකර්මය වාක්කර්මය කායවාක්කර්මය යන මොවුන්ගේ වශයෙන්, තිවිධාහොන්ති, තුන් වැදෑරුම් වෙත්, තත්ථ ඒ තුන් වැදෑරුම් කර්මයන් අතුරෙන්, කායද්වාරෙ, කායද්වාරයෙහි, ආපජ්ජිතබ්බා, පැමැණිය යුතු ඇවත, කායකම්මන්ති වුච්චති, කාය කර්මයයි කියනු ලැබේ. වචීද්වාරෙ, වාක්ද්වරයෙහි, ආපජ්ජිතබ්බා, පැමිණිය යුතු ඇවත, වචිකම්මන්ති වුච්චති, වාක් කර්මයයි කියනු ලැබේ. උභයත්ථ, කායද්වාර වාක්ද්වාර දෙකෙහි, ආපජ්ජිතබ්බා, පැමිණිය යුතු, ඇවත, කායකම්මව, කාය කර්මයයි කියාද, වචීකම්මංච, වාක්කර්මයයි කියාද, වුච්චති, කියනු ලැබේ. මනෝද්වාරෙ, මනෝද්වාරයෙහි පැමිණිය යුතු,ආපත්තිනාම නත්ථි, ඇවතක් නම් නැතේනේයි. (භාවය - "මනොද්වාරෙ ආපත්තිනාම නත්ථීති ඉදං යෙභුය්‍යවසෙන වුත්තං උපනික්ඛිත්තසාදියනාසු ආපත්ති සම්භවතොති දට්ඨබ්බං" යන මේ ටීකායෙහි කියන ලද වාදය සාරත්ථදීපනී ටීකායෙහි කියත් යයි කීහ. ජාතර පිය පටිග්ගහණ ශික්ෂාපද වර්ණණාවෙහි "සචෙපන කායවාචාහි) අපටික්ඛිපිත්වා චිත්තේන අධිවාසෙති කායවාචාහි කත්තබ්බස්ස පටික්ඛෙපස්ස අකරණතො අකිරියසමුට්ඨානං කායවචීද්වාරේන ආපත්ති ආපජ්ජති මනෝද්වාරෙ ආපත්තිනා මනත්ථි" යනු වක්ෂයමාන වන හෙයින් මනෝ ද්වාරයෙහි ආපත්ති නාම නත්ථිති. ඉදංයෙ භුය්‍යවසෙන වුත්තං" යනාදි ටීකාපාඨය චිත්තසාදියන මාත්‍රයක් සඳහා කීයේයි. මුඛ්‍ය වශයෙන් මනෝද්වාරෙයහි ඇවත් විය යුතු බැවින් කීයේ නොවෙයි. මෙසේ අර්ථගත් කල්හි පූර්වාපර සම්බන්ධය වෙයි. පාළිඅර්ථකථාටීකාවන් හා සමගද ගැලපෙයි) ඉති ඉමිනා වජ්ජ කම්මප්ප භේදෙනාපි, මෙ වද්‍ය කර්ම ප්‍රභේද වශයෙන්ද, සබ්බත්ථ, සියලු ශික්ෂා පදයෙහි, විනිච්ඡයො වේදිතබ්බො, විනිශ්චය දත යුතුයි. තිකද්වයවිධින්ති, තිකද්වය විධිං යනු කුසලත්තික වේදනාත්තික විධි, කුසලත්‍රික වෙදනාත්‍රික විධියයි,. හි .ඒ එසේ මැයි, ආපත්තිං ආපජ්ජමානො, ඇවතට අවන් මහණ තෙමේ නොහොත් ඇවතට පැමිණි කල්හි, අකුසල චිත්තෙවා, අකුශල චිත්තයක් ඇතිව හෝ ආපජ්ජති, පැමිණේ. කුසලාබ්‍යාකත චිත්තෙවා, කුසල චිත්තයක් හෝ අව්‍යාකෘත චිත්තයක් ඇතිව හෝ, ආපජ්ජති, පැමිණේ, තථා, එයින් අන්‍ය වූ, දුක්ඛ වේදනා සමංගිවා, දුක්ඛ වේදනාවෙන් සම්පූර්ණව හෝ

ආපජ්ජති, පැමිණේ. ඉතර වෙදනාද්වය සමංගීවා, අනාපාවුසුඛවේදනාවෙන් හෝ උපේක්ෂා වේදනාවෙන් හෝ සම්පූර්ණ වූයේහෝ, ආපජ්ජති, පැමිණේ. (භාවය -අකුශල චිත්තයක් ඇතිව පැමිණෙන ආපත්තිහු නම් සතර පාරාජිකා පත්තිහුයි. සුක්ක විසට්ඨිය කායසංසග්ගය දුට්ඨුල්ලය අත්තකාම පාරිචරිය දුට්ඨදෝසය සංඝ භේදය ප්‍රහාරදනය යනාදීහුයි, කුශල චිත්තයෙන් යුක්තව පැමිණෙන ආපත්තිහු නම් පදසොධම්ම ආපත්තිහුයි ඒ ආපත්තිහුද අකුශල අව්‍යාකෘතයෝ මෙන් කුශලයම ආපත්තියයි නොගත යුතු කුමක් හෙයින යත්? "ආපත්තාධිකරණං සියා කුසලං සියා අබ්‍යාකතං නත්ථි ආපත්තාධිකරණං කුසලං" යනු වදළ බැවින, එතකුදු වුවත් සමන්ත පාසාදිකාඅර්ථ කථායෙහි "යංකුසල චිත්තේන ආපජ්ජති. තංකුසලං යනු කුමක් හෙයින් කියන ලදද යත්? තදර්ථකථාවචනය පරියාය කථාවක් මුත් මුඛ්‍ය වශයෙන් ලැබිය යුතු අර්ථයක් නොවේ. ඒ එසේ මැයි. කුශල චිත්තයක් කරණ කොටගෙන ඇවතට පැමිණෙන කල්හි සචිත්තකඅචිත්තක වූ ශික්ෂා පදයක් ඉක්මවන ආකාරයෙන් හටගන්නා වූ රූප ස්කන්ධයයි කියන ලද්ද වූ අව්‍යාකෘත ඇවතක්ම මුඛ්‍ය වශයෙන් ලැබේ. මෙහි විස්තාර කථාව සාරාර්ථදීපනී ටීකා ගුළ හත්ථ දීපනී ටීකාවන්ගෙන් දත යුත්තියි. විමති විනෝදනී ටීකාචාර්ය වූ උදුම්බර ගිරි මහා කාශ්‍යප තෙරතුමන් විසින් මේ සාරාර්ථ දීපනී වාදය ප්‍රතික්ෂේප කොට ආපත්තීන් ගේ ප්‍රඥප්තිභාවය යුක්ති සාධක සඳපකහේතූන් එළවා එහි විස්තාර විනිශ්චය කරන ලදී. විස්තාරාර්ථීන් විසින් ඒ ටීකාව බලා දත යුතුයි. සමෘති විප්‍රවාශයෙන් සහසෙය්‍යාපත්ති ආදීන්ට පැමිණෙන කල්හි අව්‍යාකෘත චිත්තයෙන් පැමිණීම දතයුතු. රහතුන්ට වනාහි සියලු ප්‍රඥප්ති වද්‍ය වූ ඇවතුන්ට පැමිණීමක් ඇති කල්හි අව්‍යාකෘත චිත්තයෙන්ම පැමිණෙති. දුට්ඨදෝසාදි ආපත්තීන්ට පැමිණීමක් ඇති කල්හි දුක්ඛ වේදනාවෙන් සම්පූර්ණව ඇවතට පැමිණෙන්නේයි. මෛථුන ධම්මාදියට පැමිණෙන්නා වූ පුද්ගල තෙම සුඛ වේදනා උපේක්ෂා වේදනාවන්ගෙන් සම්පූර්ණව පැමිණෙන්නේ නම් වේ.) ඒවංසන්තේපි, මෙසේ ඇත්තෙහිදු, සබ්බ සික්ඛා පදෙසු, සියලු ශික්ෂා පදයන්හි අකුසල චිත්තවසෙන, අකුශල චිත්තයාගේ වශයෙන්, එකචිත්තං, එක්සිත ඇත්තෙක් වෙයි. කුසලාබ්‍යාකත වසෙන, කුශල අව්‍යාකෘතයන්ගේ වශයෙන්, ද්වෙචිත්තානි. චිත්තයෝ දෙදෙනෙක් වෙත්, සබ්බෙසංවසෙන සියලු චිත්තයන්ගේ වශයෙන්,

තිනිච්ත්තානි, චිත්තයෝ තුන් දෙනෙක් වෙත්, දුක්ඛ වේදනාවසෙන, දුක් වේදනාවගේ වශයෙන්, එකා වේදනා, එක් වේදනාවක් ඇත්තීය. සුඛ උපෙක්ඛාවසෙන, සුඛ වේදනා උපේක්ෂා වේදනාවන්ගේ වශයෙන්, ද්වෙවෙදනා, වෙදනාවෝ දෙදෙනෙක් ඇත්තාහුය. සබ්බාසංවසෙන, සියලු වෙදනාවන්ගේ වශයෙන්, තිස්සො වේදනා, වේදනාවෝ තුන් දෙනෙක් ඇත්තාහුය. ඉති අයමේව පභෙදෙ ලබ්භති, මෙසේ මේ ප්‍රභේදයම ලැබෙයි. අඤ්ඤෙ, අනික් ප්‍රභේදයක්, නලබ්භති, නොලැබෙයි. (මෙ ත්‍රිකයන් දෙදෙනා ද යෙභුය්‍යනය වශයෙන් ම කියන ලදී. නිරෝධයට සමවන්නා වූ අනාගාමින්ට හා රහතුන්ටද අචිත්තක වූද අවෙදනා වූද හෙවත් සිතින් හා වෙදනාවෙන් තොරවූ අව්‍යාකෘත ඇවතට පැමිණිය යුතු හෙයින් යෙභුය්‍යනයායයි දත යුතුයි) ලක්ඛණං සත්තරසධාඨිතං සාධාරණං ඉදං ඤත්වාතිලක්ඛණං සත්තරසධා ඉදං පෙ ඤත්වා යනු, නිදනාදි වෙදනත්තික පරියොසානං, නිදනය ආදිකොට වෙදනාත්‍රිකය අවසාන කොට ඇත්තා වූ, සත්තරසප්පකාරං, සතළොස් ප්‍රකාරයක් ඇත්තා වූ, ඉදංලක්ඛණං, මේ ලක්ෂණය, ජානිත්වා, දැන, යොජෙය්‍යමෙධාවී තත්ථතත්ථ යථාරහන්ති, යොජෙය්‍ය පෙ යථාරහං යනු, පණ්ඩිතො, නුවණැත්තා වූ, භික්ඛු, මහණ තෙමේ, තස්මිං තස්මිංසික්ඛාපදෙ, ඒ ඒ සිකපදයෙහි, ඉදංලක්ඛණං, මේ ලක්ෂණය, යථානුරූපං, සුදුසු පරිද්දෙන්, යොජෙය්‍ය , යොදන්නේයි, ඉති අයං, මේ කියන ලද්දේ, අත්ථො, අර්ථයි. තංපන, ඒ සතළොස් ප්‍රකාර ලක්ෂණය වනාහි, අයොජිතං, නොයොදන ලද්ද වූ සික්ෂා පදය, යස්මා, යම්හෙයකින්, දුබ්බිජානංහොති, දුක සේ දත යුතු වේද, හෙවත් නොදත හැකි වේද, තස්මා, එසේහෙයින්, තං, ඒ සතළොස් ප්‍රකාරසාධාරණ ලක්ෂනය, සබ්බත්ථ, හැමතන්හි, සික්ඛාපදනං, ශික්ෂාපදයන්ගේ, අසාධාරණ විනිච්ඡය පරියොසානෙ, අසාධාරණ විනිශ්චයාගේ කෙළවර, ඉමං මාතිකං, අනද්ධරිත්වාව, මේ මාතෘකා වනු ගුළුවාම, යොජෙත්වා, යොද, දස්සයිස්සාම, දක්වන්නෙමු. ඉධපන, මේ ප්‍රථම ශික්ෂා පදයෙහි වනාහි, අස්ස, ඒ විනිශ්චයාගේ, අයං, මේ මතුවක්ෂ්‍යමාන වනු ලබනුයේ, යෝජනා, යෙදීමයි, වෙසාලියං, විසල් මහනුවර, සුදින්නථේරං, ආරබ්භ සුදින්නස්ථවිරයන් අරභයා, මෙථුන වීතික්කමනවත්ථුස්මිං, මෛථුන ධර්මය ඉක්මවීම් සංඛ්‍යාත සතුව හේතු කොට ගෙන, පඤ්ඤත්තං, පණවන

ලදී. මෙථුනං ධම්මං පටිසෙවයයාති, අයං, මෙථුනංධම්මං පටිසෙවෙය්‍ය යන මේ ප්‍රඥප්ති තොමෝ, එත්ථ, මේ ශික්ෂාපදයෙහි, පඤ්ඤත්ති, මූල ප්‍රඥප්තියයි. සික්ඛං අපච්චක්ඛායාතිච, සික්ඛං අප්පච්චක්ඛා යනුද, අන්තමසො තිරච්ඡානගතායති ච, අන්තමසො තිරච්ඡානගතා යනුද, ඉතිඉමාද්වෙ, මේ ප්‍රඥප්තිහු දෙදෙන තුමූ (ද්වෙයන පදයාගේ පූර්වයෙහි ඉම ශබ්දයට පර්යාය වූ ඉති ශබ්දය ලොප් කරණ ලදී. එහෙයින් ටීකාචාර්ය් විසින් "අන්තමසො තිරච්ඡානගතාය තිචසික්ඛං අපච්චක්ඛායාතිචාති ඉමේද්වෙ" යනු කියන ලදී) අනුපඤ්ඤත්තියො, අනුප්‍රඥප්තිහුයි, එසා ච අනුපඤ්ඤත්ති නාම, මේ අනුප්‍රඥප්ති තොමෝ වනාහි, (ච ශබ්දය උපන්‍යාසාර්ථයි. උපන්‍යාස යනු අනික් වාක්‍යයක් හුගේ පටන් ගැනීමයි) ආපත්ති කරාවහොති. ඇවතට පැමිණීම කරන්නීද වෙයි, අඤ්ඤවාදක සික්ඛා පදාදිසුවිය, අන්‍යවාදක ශික්ෂා පදාදියෙහි මෙනි. අනාපත්තිකරා ච හොති. අනාපත්තිකර ද වන්නීය. අඤ්ඤතුසුපිනන්තානි ආදිසුවිය, අඤ්ඤතුසුපිනන්තා 'යනාදිය මෙනි. ආපත්ති උපත්ථම්භ තරාව හොති. මූල ප්‍රඥප්තියගේ ස්ථිර භාවය කරන්නීද වෙයි. අදින්නාදාන දිසුවිය, අදින්නා දාන ශික්ෂා පදාදියෙහි මෙනි. ඉධපන, මේ ප්‍රථම ශික්ෂා පදයෙහි වනාහි, උපත්ථම්භකරාතිච වේදිතබ්බා, මූල ප්‍රඥප්තියට අනුප්‍රඥප්ති තොමෝ රුකුල් දෙන්නී යයි දත යුතුයි. ඉතොපරංපන, මෙයින් මතු වනාහි, යත්ථ, යම් ශික්ෂා පදයෙක්හි, අනුපඤ්ඤත්ති අත්ථි, අනුප්‍රඥප්තියක් ඇත්තේද, තත්ථ, ඒ අනුප්‍රඥප්තියෙහි, අයං, මේ ආපත්ති තොමෝ, අනුපඤ්ඤත්තිති ඒත්තකමේව, අනුප්‍රඥප්තිය යන මේ වචන මාත්‍රයම දස්සයිස්සාම, දක්වමු, අනුපඤ්ඤත්තිංඨපෙත්වාපන, අනුප්‍රඥප්තිය හැර වනාහි, අවසේසා, සෙසු ආපත්තිහු, පඤ්ඤත්තියේව, මූල ප්‍රඥප්තිහුමැයි, ඉති, මෙසේ, සබ්බත්ථ, සියලු ශික්ෂා පදයන්හි. විනිච්ඡයො වේදිතබ්බො, අර්ථවිනිශ්චය දත යුතුයි. භික්ඛුං ආරබ්භ, භික්ෂුවක්හු අරභයා, උප්පන්නවත්ථුස්මිංයෙව, උපන්නාවූ වස්තුවෙක්හිම, යාපන භික්ඛුනී, යම් භික්ෂුණියක් තොමෝ, ඡන්දසො, කැමති පරිද්දෙන්, මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය, මෙවුන්දම් සෙවුනේ වී නම්, ඉති එවං, මේ ආදී ක්‍රමයෙන්, භික්ඛුණී නම්පි, භික්ෂුණීන්ටද, පඤ්ඤත්තිතො, පණවා වදළ හෙයින්, සාධාරණ පඤ්ඤත්ති, සාධාරණ පඤ්ඤත්ති නම් වේ.

ආණත්තියා, ඇණවීම් කරණ කොට ගෙණ, අනාපජ්ජිතබ්බතො, ඇවතට නොපැමිණිය යුතු හෙයින්, අණානත්තිකං, අණානත්තික නම් වේ. පනතථාපි, එසේ වුයේ නමුදු, භික්ඛුං, භික්ෂුවක්හු, ආණාපෙන්තො, ඇණවන්නා වූ මහණ තෙමේ, අකප්පියසමාදනාපත්තිතො, අකැප වස්තුවෙහි සමාදන් කරවීමෙන් පැමිණි ඇවතින්, න මුච්චති, නොමිදේ. මෙථුනරාගෙන, මෙවුන් දම් ඇළුමෙන්, කාය සංසග්ගෙ, කායසංසර්ගය හේතුවෙන්, දුක්කටං හොති, දුකුළා ඇවත වෙයි. ජීවමානකසරීරස්ස, දිවමන් සිරුරක් හුගේ, වුත්තප්පකාරෙමග්ගෙ, කියන ලද ප්‍රකාර ඇත්තා වූ මාර්ගයක්, සචෙපි, ඉදිනුදු, තචාදීනි අනවසෙසෙත්වා, සම් ආදීන් ඉතුරු නොකොට, සබ්බසොජින්නෙ, සර්වප්‍රකාරයෙන් සිඳිනා ලද කල්හි, නිමිත්ත සණ්ඨානමත්තං පඤ්ඤායති, නිමිති සටහන් පමණක් පෙනේද, තත්ථ, ඒ නිමිති සටහන් මාත්‍රයෙහි, අන්තමසො, යටත් පිරිසෙයින් (අත්තනොයන සම්බන්ධනය අධ්‍යාහාර කටයුතුයි) අත්තනොංගජාතෙ, තමාගේ අංගජාතයෙහි, වුට්ඨිතං, නැග්ගාවූ, (අත්තනෙ යන සම්බන්ධය ආයුතු බව "නිමිත්තෙජාතන්ති අත්තනොනිමි ත්තජාතං" යන සාරාර්ථදීපනී ටීකා පාඨයෙන් දත යුතුයි) අනට්ඨකායප්පසාදං, නොනටුවාවූ කාය ප්‍රසාදය ඇත්තා වූ, පිළකංවා, පිළිකයක් නොහොත්, ගැටයක් හෝ චම්මඛිලංවා, චර්මාංකුරයක් හෝ, පවෙසන්තස්සාපි, ප්‍රවේශ කරන්නාවූ භික්ෂුහටද, සෙවන චිත්තෙසතිපි, සෙවනය කරණු කැමති සිත් ඇති කල්හිද, පාරාජිකංහොති, පරිජි ඇවත වෙයි. නට්ඨකායප්පසාදං, නටුවාවූ කාය ප්‍රසාදය ඇත්තා වූ, සුක්ඛපිළකංවා, වියලී ගිය ගැටයක් හෝ, මතචම්මංවා, මළාවූ චර්මාංකුරයක් හෝ , ලොමංවා, ලොමයක් හෝ, පවෙසන්තස්ස, ප්‍රවේශ කරන්නාවූ මහණ හට, දුක්කටං, හොති, දුකුළා ඇවැත වෙයි. (භාවය - මේ "අංගජාතෙඋට්ඨිතං පිළකංවා චම්මඛිලංවා නට්ඨකායප්පසාදං සුඛ්ඛපිළකංවා මතචම්මංවා" යන පාඨයෙන් කියන ලද්ද වූ පිළිකාදීන් සේවනය කරන්නා වූ භික්ෂුහුගේ අංගජාතයෙහි හටගත්තාහුම ගත යුත්තාහුයි. සේවනය කටයුතු ස්ත්‍රී නිමිති ආදියෙහි හටගත්තාහු නොගත යුත්තාහුයි. සාරාර්ථදීපනී ටීකායෙහි "උපහතකායප්පසාදංති අවත්වා නට්ඨකායප්පසාදන්ති වචනං පෙ උපාදින්නකෙයෙවච පාරාජිකාපත්තිතෙනාහ ආපත්ති දුක්කටස්සාති නච ඒවං කරොන්තස්ස අනාපාත්තිසක්කා වත්තුන්ති දුක්කටං වුත්තං, ඉත්ථී නිමිත්තස්ස පනනට්ඨේපි උපාදින්නකභාවෙ

පාරාජිකාපත්තියේව" යනාදිය කී හෙයින් යට කී අර්ථය නොගත යුතු යැයි හැගේ. කංඛාවිතරණී ටීකායෙහි "නට්ඨකායප්පසාදං සුක්ඛපිළකංවා මතචම්මාචානි එත්ථ මතෙ අක්ඛායිතෙ යේභුයේ‍යන අක්ඛායිතෙච පාරාජිකාපත්ති වචනතොපන නට්ඨකායප්පසාදෙපි ඉත්ථිනිමිත්තෙ පවෙසෙන්තස්ස පාරාජිකායේව, යන පාඨයෙන් සෙවනය කටයුතු නිමිත්ත ගන්නේයි. එසේ ගත කලැ අටුවා ව හා සමගද නොගැලපේ. මේ පූර්ව වාක්‍යයෙහිද "අගජාතෙවුට්ඨිතං යනාදිය ද ස්ත්‍රී නිමිත්ත ගත යුතු බවට පැමිණේ. එසේ ගත්කලැ "තත්ථ" යන පාඨයද නොතිබිය යුතු වේ. එහෙයින් සාරාර්ථ දීපනී ටීකාචාර්න්ගේ විනිශ්චයම යුක්ති යුක්ත යයි හැගේ) නිමිත්ත සණ්ඨානමත්තම්පි, නිමිති සටහන් මාත්‍රයකුදු, අනවසෙසෙත්වා, අවශිෂ්ට නොකොට, සබ්බසෝමග්ගො, සියලු ආකාර ඇති මාර්ගය තෙම, සචෙ උප්පාටිතො, ඉදින් උගුළුවන ලද්දේද, තත්ථ, ඒ නිමිති මාර්ගය උගුළුවාගන්නා ලද තන්හි, උපක්කමතො, ව්‍යායාම් කරන්නා වූ මහණහට වණසංඛේපවසෙන ව්‍රණසංක්ෂේප වශයෙන්, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවත වේ. තථා, එපරිද්දෙන් , මනුස්සානං, මිනිසුන්ගේ. අක්ඛිනාසා කණ්ණච්ඡිද්ද වත්ථිකොසෙසුවා, ඇස්වලය නහැසිදුරය, කන්සිදුරය, වස්තිකෝෂය යනමේ ස්ථානයන්හි හෝ, සත්ථකේන, සැතකින්, කතවණෙවා, කරණ ලද්ද වූ ව්‍රණයෙක්හි හෝ, හත්ථි අස්සාදීනං, ඇත් අස් ආදී වූ, තිරච්ඡානානංච, තිරිසනුන්ගේද, වත්ති කෝසනාසාපුටෙසු, වස්ති කෝෂනාසා පුටයන්හි, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවත වේ. තිරච්ඡානා නංපන, තිරිසනුන්ගේ වනාහි, අක්ඛිකණ්ණවණෙසුච, ඇස්වල කන්සිදුරු වව්‍රණයන්හිද, අහිමච්ඡානං, සර්පමත්ස්‍යාදීන්ගේ, පවෙසනප්පමාණ විරහිතෙ, ප්‍රවේසනය කිරීම පිණිස සුදුසු ප්‍රමාණයෙන් වෙන්වූ, අණු නිමිත්තෙසුච, ස්වල්ප වූ නිමිත්තයන්හිද, සබ්බේසංච, සියලු සතුන්ගේද, උපකච්ඡකාදිසු, කිසිලි ආදී වූ, සෙස සරීරෙසුච, අවශෙෂ ශරීරයන්හිද, උපක්‍රම කරන්නාවූ භික්ෂුහට, දුක්කටංහොති, දුකුලා ඇවත වේ, (භාවය - මේ දුකුලවසතුන් අතුරෙන් "තිරච්ඡානානංපන අක්ඛිකණ්ණවණෙසු - "යන පාඨයද අහිමච්ඡාදීනං පවෙසනප්ප මාණ විරහිතෙ අණු නිමිත්තෙ යන පාඨයද අටුවා කථා ප්‍රමාණයෙන්ම සැළකිය යුතුයි. කුමක් හෙයින යත්? මනුෂ්‍යය අමනුෂ්‍යය තිරශ්චීන යන මොවුන් කෙරෙහි වච්ච මාර්ගය පස්සාව මාර්ගය මුඛ මාර්ගය යන මොවුන් ගේ

පාරාජිකා වස්තු වශයෙන් වෙනස් නොවන්නාක් මෙන් ඇස්වල ආදීන්ගේද ථුල්ලච්චය වස්තු බැවින් නොම ආයේයි, ව්‍රණයෙහි ථුල්ලච්චයද "අමග්ගෙනඅමග්ගං පවෙසෙති ආපත්ති ථුල්ලච්චයස්ස යනුවෙන් සාමාන්‍යයෙන් වදළේයි. "මනුස්සානං" යනුවෙන් විශේෂයක් නොකෙළේයි. තිරිසනුන්ගේ ව්‍රණයෙහි ථුල්ලච්ච නොවිය යුතු නම් පටංග නම් වූ මැසින්ගේ මුඛයෙහි ව්‍රණසංක්ෂේපයෙන් ථුලසිවන්නේ යයි අටුවාචාරීන් වහන්සේ විසින් විනිශ්චය නොකටයුත්තක් විනිශ්චය කෙළේ නම් වේ. එහෙයින් අටුවා කතාව ප්‍රමාණකොටම සැළකිය යුතුයි. අටුවාචාර්න්වහන්සේ වානහි සර්ව ප්‍රකාරයෙන්ම සර්වඥයන් වහන්සේගේ අභිප්‍රාය දැන අටුවා ලියන ලදැයි සාරාර්ථ දීපනි ටීකායෙහි ආයේයි, ජීවමානක ශරීරයෙහි ලැබිය යුතු ඇවත දක්වා මළ සිරුරෙහි ලැබිය යුතු විශේෂ ඇවත දක්වනු කැමති වූ අර්ථ කථාචාර්යයෝ "මත සරීර නිමිත්තෙච" යනාදිය කීහ) මතසරීරනිමිත්තෙ, මෘතශරීරයාගේ නිමිත්තෙහි, උපඩ්ඪක්ඛායිතතොපට්ඨාය, බලු කැණහිල් ආදීන් විසින් අඩක් කන ලද ශරීරය පටන්. යාව, යම්තාක්, කුථිතංනහොති, කුනුනුවූයේද, තාව, ඒතාක්. ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වේ. කුථිතෙසති, කුනු වූ කල්හි, දුක්කටං හොති, දුකුලා ඇවත වේ. විවටකතෙ, විවෘත කරණ ලද මුඛයෙහි, අච්ඡුපන්තං, ස්පර්ශය නොදී, අංගජාතම්පිප වෙසන්තස්ස, අංගජාතය ප්‍රවේශකරණ මහණහට, තථා, එසේම, දුක්කටංහොති, දුකුලා ඇවත වේ. ඔට්ඨනොබහි. තොලෙන් පිටතට නික්ඛන්තජිව්හායවා, නික්මුනු දිවෙහි හෝ, දන්තෙසුවාදත් හි හෝ (ඝර්ෂණය කරන්නාවූ මහණ හට) ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වේ. නිමිත්තතොබහි, නිමිත්තෙන් පිටතට . පතිත මංසපේසියං, හුනුමස් වැදැල්ලෙහි ඝර්ෂනය කරන්නා වු මහණ හට, දුක්කටං හොති, දුකුලා ඇවත වේ. ඉති අයං, මේ වනාහි, ඒත්ථ මේ ප්‍රථම ශික්ෂා පදයෙහි , ආපත්තිභේදෙ, ආපත්ති විශේෂයයි, අජානන්තස්ස, නොදන්නා වු මහණ හටද, අසාදියන්තස්ස, කැමැත්තෙන් රස නොවිඳින මහණහටද, උම්මත්තකස්ස, උමතු මහණ හටද, ඛිත්තචිත්තස්ස, වික්ෂිප්ත සිත් ඇති මහණ හටද, වෙදනට්ටස්ස, යම්කිසි දුක්ඛ වේදනාවකින් පෙළෙන්නා වු මහණ හටද, ආදිකම්මිකානඤ්ච, ආදිකම්මික වූ නොහොත් ප්‍රඥප්තියට පළමු ව්‍යතික්‍රමණය කළ භික්ෂූන්ටද, අනාපත්ති, ඇවතනොවේ. ඒත්ථපන. මේ නොදන්නවුන් ආදීන් අතුරෙන් වනාහි,

යො. යම් මහණෙක් තෙමේ, නිද්දං ඔක්කන්තත්තා, නිද්‍රාවට පැමිණි හෙයින්, පරෙන, මෙර මා විසින්, කතම්පි උපක්කමං, කරණ ලද්ද වූ උපක්‍රමයද, නජානාති, නොදනිද, සො, ඒ මහණ තෙමේ, අජානනතො, අජානන්ත නම් වේ. (විසාලා මහනුවර මහ වෙනෙහි සයනය කළ භික්ෂුව මෙනි) යො, යම් මහණෙක් තෙම, ජානිත්වාපි, දැන දැන ද, නසාදියති, කැමැත්තෙන් රසාස්වාදනය කෙරේද, සො, ඒ මහණ තෙමේ, ආසාදියන්තො නාම, අසාදියන්ත නම් වේ. යො, යම් මහණෙක් තෙම, පිත්තවසෙන . බද්ධපිත්තයාගේ විපරිතවීම් වශයෙන්, අතෙකිච්ඡං, බෙහෙදින් පිළියම් නොකටහැකිවූ, උම්මාදප්පත්තො, උමතු බවට පැමිණියේද, සො, ඒ මහණ තෙම, උම්මත්තකො, උම්මත්තක නම් වේ. යක්ඛේහි, යකුන් විසින්, ගහිතචිත්ත වික්ඛෙපො, අල්වා ගන්නා ලද වික්ෂිප්ත සිත් ඇත්තා වූ මහණ තෙමේ, ඛිත්තචිත්තොනාම, ඛිත්තචිත්ත නම්වේ. එතෙසංද්වින්නම්පිච, මේ දෙදෙනාහටද, අග්ගිසුවණ්ණ ගූථචන්දනාදිසු, ගිණිය රත්රන්ය අසූචිය සඳුන්ය යනාදින හි, සමප්පවත්තිභාවෙන, සම වූ පැවතීම් ඇති බැවින්, අජානනභාවොව, නොදන්නාබවම, පමාණං, ප්‍රමාණයි. යො, යම් මහණෙක් තෙම, අධිමත්තවෙදනාය, අතිශය වේගවත් වූ දුක්ඛ වේදනාවෙන්, ආතුරත්තා, ගිලන් වූ හෙයින්, කිංචිනජානාති, යම්කිසිවක් නොදනීද, සො, ඒ මහණ තෙමේ, වේදනට්ටො, වෙදනට්ට නම් වේ. යො, යම් මහණෙක් තෙමේ, තස්මිං තස්මිං වත්ථුස්මිං, ඒ ඒ වස්තුවෙහි, ආදි භූතෝ, ආදී පුරුෂවූයේද, නොහොත් ප්‍රඥප්තියට පෙරඅතුව පලමුකොට ඉක්මවූයේ වේද, සො, ඒ මහණ තෙමේ, ආදිකම්මිකො, ආදිකම්මිකනම්වේ, අංපන, මේ කියන ලද්දේ වනාහි, අනාපත්ති, ඇවත්නොවීමයි, චතුසුවිපත්තිසු.

සතර විපත්තින් අතුරෙන්, සීලවිපත්ති, ශීලවිපත්තියයි. තස්ස, ඒ ඇවත්හුගේ., අංගානි, අඟයෝ තුමූ, ද්වෙ, දෙදෙනෙක් වෙත්, සෙවන චිත්තං ච, සේවනය කරමිය යන සිත ද, මග්ගෙන, එක් මාර්ගයෙක්හි, (සත්‍යමපාර්තයෙහි තෘතියා විභක්තියි) මග්ගපටිපාදංච, එක් මාර්ගයක් පිහිටුවීමද හෙවත් පිළියෙල කිරීමද, ඉති ඉමේද්වෙ, මේ අංගයෝ දෙදෙනායි, සමුට්ඨානාදිනො, සමුට්ඨානාදින්ගේ වශයෙන්, ඉදං, සික්ඛාපදං, මේ ශික්ෂා පදය, පඨම පාරාජික සමුට්ඨානං, පඨම පාරාජික සමුට්ඨාන ඇත්තේ වෙයි. කිරියා, ක්‍රියාවයි.

සඤ්ඤවිමොක්ඛ,ං, සංඥාවිමෝක්ෂයයි. සච්නතකං, සචිත්තකයයි. ලොකවජ්ජං, ලොකවද්‍යයි. කායකම්මං, කායද්වාරයෙහි ගටගන්නා කර්මයක් වේ. අකුසල චිත්තං, ලෝභ මූලික අකුශල චිත්තයක් ඇත්තේ වෙයි. ද්වි වෙදනං, සුඛොපෙක්ෂා වෙදනා ද්වයන් ඇත්තේ වෙයි. ඉමානි සමට්ඨානාදීනිනාම, මේ සමුට්ඨානාදී හු වනාහි, ආපත්තියා, ආපත්තිහුගේ, සමුට්ඨානාදීනි හොන්ති, සමුට්ඨානාදිහු වෙත් සික්ඛා පදස්ස, ශික්ෂා පදයාගේ, සමුට්ඨානාදිනි, නහොන්ති, සමුට්ඨානාදිහු නොවෙත් පනතථාපි එතකුදු වුවත්, වොහාර සුකත්ථං, ව්‍යවහාරසෞකාය්‍යයීය පිණිස. සබ්බට්ඨකථාසු, සියලු අටුවා කථාවන්හි, සික්ඛා පදසීසෙන, ශික්ෂාපදය පෙරටුකිරීම් වශයෙන්, දෙසනා ආගතා, දේශනාව ආවාය, තස්මා, එසේ හෙයින්, අඤ්ඤෙදසුපි, එවරුපෙසුඨානේසු, මෙයින් අන්‍ය වූද මෙබඳු ස්ථානයන්හි, බ්‍යඤ්ජනෙසු, ශබ්දයන්හි, ආදරංඅකත්වා, ගරු බුහුමන් නොකොට, අධිප්පෙතනත්ථමේව, සාස්තෘන් විසින් අදහස් කර වදරන ලද්ද වූ අර්ථයම, ගහෙතබ්බං, ගත යුතුයි.

**අත්ථංහිනාථො සරණං අවොච**

**නබ්‍යඤ්ජනං ලෝකහිතොමහේසී**

**තස්මා අකත්වාරතිමක්ඛරෙසු**

**අත්ථෙනිවෙසයෘ මතිංමුතිමාති**

නාථො, විනයජන සමූහයාට පිහිට වූ නොහොත් වෛනෙයෘ ජන සමූහයාගේ කෙලෙස් විඩාව සංසිඳුවන්නා වූ, ලෝකහිතො, සත්ව ලෝකයාගේ හිතාභිවෘද්ධිය කරන්නාවූ, මහෙසී, මහාර්ෂී වූ ශාස්තෘන් වහන්සේ, අත්ථං, අර්ථය, සරණං, ප්‍රතිෂ්ඨාධාරවන්නේ යයි, හි, (යස්මා) යම් හෙයකින්, අවොච, වදළ සේක්ද, බ්‍යඤ්ජනං, ශබ්දය, නඅවොච, නොවදළ සේක්ද, තස්මා, එසේ හෙයින්, මතිමා, සමෘතිමත් වූ පණ්ඩිත තෙමේ, අකඛරෙසු අක්ෂර සංඛ්‍යාත වූ බ්‍යඤ්ජනයන්හි, රතිංඅකත්වා, ඇල්ම නොකොට, අත්ථෙ, අර්ථයෙහි, මතිං, ප්‍රඥාව, නිවෙසයෘ, පිහිටුවනතේයි.

පඨම පාරාජිකං, පළමුවන පාරාජික තෙමේ, සමත්තං, සම්පූර්ණ කරන ලදී.

**ප්‍රථම පාරාජිකාවයි.**

(2) දුතියෙ, දෙවන ශික්ෂා පදයෙහි, ගාමාවාඅරඤ්ඤාවාති එත්ථ, ගාමාවාඅරඤ්ඤාවා යන මේ පදයන් අතුරෙන්, එකකුටිකාදි භේදෙ, එක් ගෙයක් ආදි ප්‍රභේද ඇත්තා වූ, පරික්ඛිත්තොවා, පවුරෙන් වට කරන ලද්ද වූ හෝ, අපරික්ඛිත්තොවො, පවුරෙන් වට නොකරණ ලද්ද වුහෝ, සමනුස්සොවා, මිනිසුන් සහිත වූ හෝ, අමනුස්සොවා, මිනිසුන් රහිත වු හෝ, සබ්බෝ පි, සියලු ග්‍රාමයද, අන්තමසො, යටත පිරිසෙයින්, අතිරේක චාතුමාසනිවිද්ධා, වැසිසාරමසට වැඩියක් වාසය කරණ ලද්ද වූ, යොකොචි, යම්කිසි, සත්ථො අපි, වෙළඳුන්ගේ තාවකාලික වාසස්ථානයද, ගාමොති, ග්‍රාමයයි, වෙදිතබ්බො, දත යුතුයි. ගාමඤ්ච, ග්‍රාමයද, ගාමූපචාරඤ්ච, ග්‍රාමයාගේ උපචාරයද, නොහොත් ග්‍රාම සමීපයද, ඨපෙත්වා, හැර, අවසේසං, සෙසු තැන, අරඤ්ඤංනාම, අරණ්‍ය නම් වේ. තත්ථ, ඒ ග්‍රාමය හා ග්‍රාමූපචාරයෙහි, අසම්මොහත්ථං, නොමුළා බව පිණිස, ඝරං, ගෘහයද, ඝරූපචාරො, ගෘහොප චාරයද, ගාමො, ග්‍රාමයද, ගාමූපචරො, ග්‍රාමයාගේ උපචාරයද, ඉති අයං විභාගො, මේ විභාගය වේදිතබ්බො, දත යුතුයි. හි, (වත්ථාරෙස්සාම) විස්තාර කෙරෙමි, නිම්බකොසස්ස, ජදනාගුයාගේ, උදකපතනට්ඨානබ්භන්තරං, ජලය වැටෙන්නාවූ ස්ථානයෙන් අභ්‍යන්තරය, ඝරං නාම, ඝර නම් වේ. ද්වාරෙඨිතො මාතු ගාමො, දොරකඩ සිටි මාගම තෙමේ, යංපන භාජන ධොවන උදකං, බඳුන් දෙවූ යම් ජලයක් වනාහි, ජඩ්ඩෙති. දමාගාසද, තස්ස, ඒ බඳුන් දෙවූ ජලයාගේ, පතනපඨානංච, හෙන්නා වූ තැනද, මාතු ගාමේන එව, මාගම විසින්ම, අන්තොගෙහෙ, ඇතුල්ගෙහි, ඨිතේන, සිටියහු විසින්, පකතියා, ප්‍රකෘති වශයෙන්, බහිඛිත්තස්ස, පිටත දමන ලද්ද වූ, සුප්පස්සවා, කුල්ලක් හෝ, සම්මජ්ජනියාවා, මුස්නක් හෝ, පතනට්ඨානංච, හෙන්නා වූ තැනද, ඝරස්සපුරතො, ගේ ඉදිරියෙන්, ද්විසුකොණෙසු සම්බන්ධිත්වා, දෙකොන්ගලපා, මජ්ඣෙකඩ, මධ්‍යයෙහි, රුක්ඛසූචිද්වාරං, රුක් සිඳුර දොරටුව, ඨපෙත්වා, හැර, ගොරූපානං, ගෙරිසමූහයාගේ, පවෙසනනිවාරණත්ථං, ඇතුල්වීම වැලක්ම පිණිස, කතපරික්ඛෙපොච, කරණ ලද්ද වූ වැටද, අයංසබ්බො අපි, මේ සියල්ලද, ඝරූපචාරො නාම, ඝරූපචාර නම් වේ, යංපනඝරං, යම් ගෙයක් වනාහි, සබ්බන්තිමංහොති, සියලු ගෘහයන්ගේ කෙළවර වේද, තස්සඝරස්ස, ඒ ගෘහයාගේ, තාදිසෙඝරූපචාරෙ, එබඳු ගෘහෝපචාරයෙක් හි, ඨිතස්ස, සිටියා

වූ, ථාමමජ්ඣිමස්ස පුරිසස්ස, මැදුම් බලැති පුරුෂයෙකුගේ, තරුණ මනුස්සා, යෞවන මනුෂ්‍යයෝ තුමූ, අත්තනොබලං, තමාගේ ශක්තිය, දස්සෙන්තො, දක්වන්නේ, බාහුංපසාරෙත්වා, අතදිග හැර, ලෙඩ්ඩුංඛිපන්තියථා, යම් සේ කැටක් දමාගසද්ද, ඒවං, එපරිද්දෙන්, ඛිත්තස්සලෙඩ්ඩුස්ස, දමා ගසන ලද කැටය, පතනට්ඨානබ්භන්තරං, හෙන්නා වූ ස්ථානය ඇතුළත, ගාමො නාම, ග්‍රාම නම් වේ. තතො, ඒ එකම ලෙඩ්ඩුප්‍රාහාරය කෙරෙන්, අඤ්ඤස්ස ලෙඩ්ඩුපාතස්ස, අනික් කැටක් හෙන්නා වූ ස්ථානයාගේ, අබ්භන්තරං, ඇතුළත, ගාමූපචාරොනාම, ග්‍රාමයාගේ උපචාර නම්වේ. පතිතස්සලෙඩ්ඩුනො, වැටුනා වූ කැටය, පවට්ටෙත්වා, පෙරලී, ගතට්ඨානං, ගියතැන, නගහෙතබ්බං, නොගත යුතුයි. පරික්ඛිත්තස්ස, වැටපවුරු ආදියෙන් වටකරණ ලද්ද වූ, ගාමස්සපන, ග්‍රාමයාගේ වනාහි, පරික්ඛේපොයෙව, පරික්ෂේපයම, හෙවත් වැට පුවරු ආදියම, ගාමස්ස පරිච්ඡෙදෙ, ග්‍රාමයාගේ පිරිසිඳීම වේ, තස්ස, ඒ පරික්ෂේප ඇත්තා වූ ග්‍රාමයාගේ, ද්වෙඉන්දඛීලා, ඉන්ද්‍රඛීලයෝ දෙදෙනෙක් තුමූ, සචෙ හොන්ති, ඉදින් වෙද්ද, අබ්භන්තරිමෙඉන්දඛීලෙ, ඇතුළත් හි වූ ඉන්ද්‍රඛීලයෙහි, හෙවත් ඇතුල් එලිපතෙහි, ඨිතස්ස, සිටි පුරුෂයෙකුගේ, ලෙඩ්ඩුපාතබ්භන්තරං, එක් කැටක් හෙන්නා වූ ස්ථානයාගේද, බ්භන්තරය, ගාමූපචාරොනාම, ග්‍රාමූපචාර නම් වේ. (අපරික්ෂිප්ත වූ ග්‍රාමයාගේ උපචාරය දැක්වීම පදභාජනිය හා විරුද්ධ නොවේ දැයි යන චොද්‍යය සඳහා "පදභාජනෙයෙපි" යනාදිය කීහ) පද භාජනියෙපි, පදභාජනියෙහිද, "ගාමූපචාරොනාම පරික්ඛිත්තස්සගාමස්ස ඉන්ද්‍රඛීලෙඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො අපරික්ඛිත්තස්ස ගාමස්සඝරූපචාරෙඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො" යනුවෙන් පරික්ෂේප රහිත ග්‍රාමයාගේ ඝරූපචාරයෙහි සිටියා වූ මධ්‍යම පුරුෂයෙකුගේ එක් කැටක් දමාගැසීම ගාමූපචාරයයි ආයේයි. අර්ථ කථාචාර්වරයෝ ඒ එකම ලෙඩ්ඩුපාතනය ග්‍රාමයයි. විනිශ්චය කළෝ හි, ඒ එසේමැයි, පදභාජනියෙ අපි, පදභාජනියෙහිද, ඉමිනාවනයෙන, මේ කියන ලද්ද වූ ක්‍රමයෙන්ම, අත්ථො වේදිතබ්බො, අර්ථය දත යුතුයි. (අභිප්‍රාය - පරික්ෂේප ඇත්තාවූ ග්‍රාමයාගේ ඒ පරික්ෂේපයම ග්‍රාම පරිච්ඡේදය වන හෙයින් ග්‍රාම පරිච්ඡේදය නොදක්වා උපචාරයම දක්වනු පිණිස "ගමූපචාරො නාම" යනාදිය කීහ. අපරික්ෂිප්ත වූ ග්‍රාමයාගේ පරිච්ඡේදය නොදක්වා උපචාරයාගේ පරිච්ඡේදය දක්වනු කැමතිව

"සාඅපරික්ඛිත්තස්ස ගාමස්ස ඝරූපචාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස" යනාදිය කීයේයි. ග්‍රාම පරිච්ඡේදය දක්වනු පිණිස නොකීයේයි. ඒ අපරික්ඛිප්ත ග්‍රාමයාගේ උපචාරය වනාහි පරික්ෂිප්ත ග්‍රාමයාගේ උපචාරය නිශ්‍රය කොට ගෙන දතයුතු බැවින් විශේෂ නොදක්වන ලදී) තත්ථ, ඒ ද්විප්‍රකාර වූ උපචාරයන් අතුරෙන්, අපරික්ඛිත්තස්ස ගාමස්ස, පරික්ෂේප රහිත ග්‍රාමයාගේ, යොඅයං උපචාරො, යම් උපචාරයක්, දස්සිතො, දක්වන ලද්දේද, තස්සවසෙන, ඒ උපචාරයාගේ වශයෙන්, විකාලෙ, නොකල්හි, ගාමප්පවෙසනාදිසු, ගම්වැදීම් ආදියෙහි, ආපත්ති පරිච්ඡින්දිතබ්බා, ඇවත පිරිසිඳිය යුත්තීය. (පරික්සේප ඇත්තා වූ ග්‍රාමයාගේ යම් උපචාරයක් දක්වන ලද්දේ වේද ඒ උපචාර තෙමේ විනය පිටකයෙහි යම් ශික්ෂාපදයක් හා නොයෙදෙන්නේයි. ඒකාන්තයෙන් වනාහි අපරික්ඛිප්ත ග්‍රම යාගේ පරික්ෂේපය සුදුසු තැනකින් දමා ගසන ලද්ද වූ එකම ලෙඩ්ඩුපාතනය ගාමූපචාර නම්වෙයි. යන බව පමණක් දැනගනු පිනිස දක්වන ලදී. මෙසේ දැක්වූ කල්හි ග්‍රාමයාගේද එකම ලෙඩ්ඩු පාතනය කප්පිය භූමියෙහි වූ උපචාරය දක්වන ලදැයි දත යුතුයි. පරික්ෂේප රහිත වූ ග්‍රාමයාගේ පරික්ෂේප කටයුතු තැනින් ගසන ලද්ද වූ ලෙඩ්ඩුපාතනයෙහගි කිය යුත්තක්ම නැත්තේයි. කප්පිය භූමියයි ටීකාචාරීන් විසින් කියන ලදී. මෙසේ කී බැවින් විකාල ගාමප්පවෙසනාපත්තියද නොවිය යුත්තේය යන අර්ථය ලැබේ. සාරාර්ථදීපනී ටීකාකාරයෝ වනාහි මේ ටීකා මතය "කෙචිවදන්ති" යනුවෙන් කීහ. පදභාජනියෙහි "පරික්ඛිත්තස්ස ගාමස්ස පරික්ඛෙපං අතික්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්සපරික්ඛිත්තස්ස අපරික්ඛිත්තස්ස උපචාරං ඔක්කමන්තස්ස ආපත්තිපාචිත්තියස්ස" යනු වදළ හෙයින් පරික්ෂේප රහිත ග්‍රාමයාගේ ඝරූපචාරය පටන් ලෙඩ්ඩුපාතන දෙකෙකැයි කියන ලද්ද වූ උපචාරයට ඇතුළ් වීමෙන් ඇවත්වන බව දක්වනු කැමතිව පවිති අටුවායෙහි "යවායං" යනාදි පාඨයද එළවා ඇත්තා වූ පරික්ෂේප ග්‍රාමයාගේ පරික්සේපය ඉක්මවන්නාවූ භික්ෂුහටද පරික්සේප රහිත ග්‍රාමයාගේ උපචාරයට බස්නාවූ භික්ෂුහටද ඇවත් වන බව ඒකාන්තයෙන් දතයුත්තේ යයි දක්වන ලදී. මේ වාදයන් දෙදෙන අතුරෙන් පශ්චිම වාදය යුක්ති යුත්ත වන්නේයි කුමක් හෙයිනයත්? සූත්‍රය ආචාර්යභවාදයයි කියන ලද පාළුවර්ත්ථ කථාවන් හා ගැලපෙන හෙයින් හා පූර්වාචාර්ය වරයන්ගේ වාදය අත්තනෝමති මාත්‍රයක්ම

වියයුතු හෙයිනි. මේ ස්ථානය නැවත නැවත පරීක්ෂා කොට අරුත් දත යුතුයි) ඉතිඉමං, මෙබඳු ස්වභාව ඇත්තා වූ, ගාමඤ්ච, ග්‍රාමයද, ගාමූපචාරඤ්ච, ග්‍රාමයාගේ උපචාරයද, ඨපෙත්වා, තබා, අවසේසං, සෙසු තැන, ඉමස්මිං සික්ඛාපදෙ, මේ ශික්ෂා පදයෙහි, අරඤ්ඤං නාම, අරණ්‍ය නම් වේ. ගාමාචා අරඤ්ඤචාති ඒතං, ගාමාචා අරඤ්ඤචායන මේ වචනය, දේසනාමත්තමේව, දේශනා මාත්‍රයක් මැයි, ඉමේසං, මේ ග්‍රාමාරණ්‍යයන්ගේ පරිච්ඡේද දස්සනත්ථං, වෙන් කිරීම හෙවත් සීමාව දැක්වීම පිණිස, යෙපනඝරඝරූපචාරා, යම් ගෘහයක් හා ගෘහෝපචාරයෝද, යෙගාමගාමූපචාරා, යම් ග්‍රාමයක් හා ග්‍රාමූපචාරයෝද, වුත්තා, කියන ලද්ද හු වෙද්ද, තතොපි, ඒඝර ඝරූපචාර ගාමගාමොපචාරයන්ගෙන්ද, පාරාජිකවත්ථුං පාරාජිකාවට සුදුසු වූ වස්තුවක්, අවහරන්තස්ස, පැහැර ගන්නා වූ මහණ හට, පාරාජිකංහොති. යේව, පරිපිඅැවත වේ මැයි, අදින්නන්ති, අදින්නං යනු, අඤ්ඤස්ස, අන්‍ය වූ, මනුස්සජාතිකස්ස, මිනිස්ජාති ඇත්තෙකුගේ සන්තකං, සන්තක වූ වස්තුවයි. ථෙය්‍යසංඛාතන්ති එත්ථ, ථෙය්‍යසංඛාතං යන මේ පාඨයෙහි, ථෙනොති, ථෙනො යනු, චොරො, සොරෙක් වෙයි. ථෙනස්ස, සොරකම් කරන්නාහුගේ, භාවො, ස්වභාව තෙමේ, ථෙය්‍යං, ථෙය්‍ය නම් වේ. ඒතං, ඒථෙය්‍ය සංඛ්‍යාතය තෙමේ, අවහරණචිත්තස්ස, පැහැර ගන්නා වූ සිත් ඇත්තහුගේ, නාමං, නමෙකි, සංඛ්‍යාසංඛාතන්ති ඉදං, සංඛා ශබ්දය සංඛාත ශබ්දය යන මෙය, අත්ථතො, අර්ථ වශයෙන්, ඒකං, සදෘශවෙයි. ඒතං, ඒ ශබ්දද්වය, කොට්ඨාසස්ස, කොට්ඨාසයාගේ හෙවත් රාශිහුගේ, නාමං, නමකි, (මෙහි සංඛාසංඛාතං යන පදය, ඇතැම් පොත්හි සංඛ්‍යාතයයි දක්නා ලැබේ, ඒකං, යන්නෙහිද එකයයි සමහර පොත්හි දක්නා ලැබේ. මේ දෙකමබලිත පාඨයි, කුමක් හෙයින් බලිතපාඨයයි දත යුතුද යත්? කොට්ඨාසවචනං සංඛාසද්දං සසන්ධායාහසංඛාසංඛාතනන්ති අත්ථතොඑකන්ති යන සාරත්ථදීපනී ටීකා වචනයද සංඛ්‍යාසද්දස්සේව තකාරෙනවඩ්ඪෙත්වා වුත්තත්තා සංඛාසංඛතන්ති අත්ථතො ඒකන්තිවුත්ත තත්ථ අත්ථතො එකන්ති පාදත්ථතොඑකං අත්ථන්තරන්ති වුත්තං හොති" යන කංඛාවිතරණී ටීකාපාඨය ද දක්නා බැවින් බලිත පාඨයයි හැගේ. සාරත්ථදීපනී ටීකා පාඨය නොබලා ඇතැම් ආචාර්යවරයෝ සංඛාතන්ති, සංඛ්‍යාතං යනු අත්ථතො, අර්ථ වශයෙන්,

එකකොට්ඨාසස්ස, එක්කොට්ඨාසයක් හුගේ යයි පද සම්බන්ධය කෙරෙත් එය නොගත යුතුයි) ඡන්දඡන්ද නිදනාතිපපඤ්ච ඡන්දඡන්ද සංඛාති ආදිසුවය, යථාදියෙහි මෙන්, පපඤ්චඡන්දඡන්ද සංඛා, සසර ගැටගසන්නාවූ තෘෂ්ණා මාන දෘෂ්ටිසංඛ්‍යාත වූ ඡන්දඡන්දරාශිහුතමු, ඡන්දඡන්ද නිදනාහි, සංඥව කාරණකොට ඇත්තාහු වෙති. ථෙය්‍යපංචහොති, සොරකම් කරණු කැමති සිතක් වේද, තං, ඒ සොරකම් කරණු කැමති, සිත, සංඛ්‍යාතංචහොති, කොට්ඨාසයක් වේද, ඉතිතස්මා, එසේ හෙයින්, ථෙය්‍යසංකඛ්‍යාතං, ථෙය්‍යසංඛ්‍යාත නම්වේ. ථෙය්‍යචිත්තසංඛ්‍යාතො, සොරකම් කරණු කැමති සිත යයි කියන ලද්ද වූ, එකොචිත්ත කොට්ඨාසො, එක් චිත්ත රාශියකි. ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි. ඒතං, ඒ ථෙය්‍යසංඛාතං, ථෙය්‍ය සංඛ්‍යාත නම්වේ. ථෙය්‍යචිත්ත සංඛ්‍යාතො, සොරකම් කරණු කැමති සිත යයි කියන ලද්ද වූ, එකොචිත්ත කොට්ඨාසො, එක් චිත්ත රාශියකි. ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි. ඒතං, ඒ ථෙය්‍යසංඛාතං යන ශබ්ද තෙමේ, කරණත්ථෙච, කරණාර්ථයෙහිද, පච්චත්ත වචනං, ප්‍රථමා විභක්ති ඇත්තා වූ ශබ්දයකි. තස්මා, එසේ හෙයින්, ථෙය්‍යසංඛාතෙනති අත්ථො, ථෙය්‍යසංඛාතේන යන අර්ථය, දට්ඨබ්බො, දත යුතුයි. යොච, යමෙක් තෙමේද, ථෙය්‍යසංඛාතේන සොරකම් කරණු කැමති චිත්තරාශිය කරණකොටගෙන, ආදියති, පැහැරගණීද, සො, ඒ පුද්ගල තෙමේ, යස්මා, යම් හෙයකින්, ථෙය්‍යචිත්තොහොති, සොරකම් කරණු කැමති සිත් ඇත්තේ වේද, තස්මා, එසේ හෙයින්, ව්‍යඤ්ජනං, ශබ්දයෙහි, අනාදරිත්වා, ගෞරව නොකොට, අත්ථමේව දස්සෙතුං, අර්ථයම දක්වනු පිණිස, ථෙය්‍යචිත්තො අවහරණ චිත්තොති, ථෙය්‍යචිත්තො, අවහරණ චිත්තොයනු, ඒවං, මෙසේ, අස්ස, ඒ ථෙය්‍යසංඛාතංයන පදයාගේ, පදභාජනං, පදභාජනිය, වුත්තං. කියන ලදී. ඉති, මෙසේ, වේදිතබ්බං, දතයුතුයි. ආදියෙය්‍යාති, ආදියෙය්‍යයනු, පඤ්චවීසතියා අවහාරානං, පස්විසි සොරකම් කරණ ක්‍රමයන් අතුරෙන්, අඤ්ඤතරවසෙන, එක්තරා ක්‍රමයකින්, ධාරෙය්‍ය, දරන්නේ නම්, හෙවත් සොරකම් කරන්නේ නම්, තෙපන අවහාරා ඒ පස්විසි සොරකම් කරණ ක්‍රමයෝ. පඤ්චපඤ්චකානි, පඤ්චකයන් පස්දෙනෙකුන්, සමොධානෙත්වා, එක්කොටගෙණ, සාධුකං, මොනවට, සල්ලක්ඛෙතබ්බා, සැලකිය යුත්තාහුය. පඤ්චපඤ්චකානිනාම, පඤ්චකයෝ පස්දෙන නම්, නානාභණ්ඩපඤ්චකං,

නානාභණ්ඩපඤ්චකයද, එක භාණ්ඩපඤ්චකං, එක භාණ්ඩ පඤ්චකයද, සාහත්ථික පඤ්චකං, සාහත්ථික පඤ්චකයද, පුබ්බපයොගපඤ්චකයද, ථෙය්‍යාවහාරපඤ්චකං, ථෙය්‍යාවහාරපඤ්චකයද, ඉති ඉමෙ, මේ පඤ්චකයෝ පස්දෙනායි. තත්ථ, ඒ පඤ්චපංචකයන් අතුරෙන්, පුරිමානිද්වෙපංචකානි, පූර්ව වූ පඤ්චකයෝ දෙදෙන, එත සේසවපදස්ස, ඒ ආදියෙය්‍ය යන පදයාගේම, පදභාජනෙ, පදභාජනියෙහි, වුත්තානං, වදාරණ ලද්ද වූ, ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය ඉරියාපථං විකොපෙය්‍ය ඨානාචාවෙය්‍යාති ආදියෙය්‍ය පෙ යන, ඉමෙසං, පදනං, මේ පදයන්ගේ, වසෙන, ශක්ති වශයෙන්, ලබ්භන්ති, ලැබෙත්, තත්ථ, ඒ ද්විප්‍රකාරපංචකයන් අතුරෙන්, නානාභාණ්ඩපංචකං, නානාභාන්ඩපඤ්චකය සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වසෙන, සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වශයෙන්, දඨබ්බං, දතයුතුයි. ඉතරං අන්‍ය වූ එක භාණ්ඩක පඤ්චකය, සවිඤ්ඤාණක වසෙනෙව, සවිඤ්ඤාණක වශයෙන්ම, දට්ඨබ්බං, දතයුතුයි. කථං දට්ඨබ්බං, කෙසේ දතයුතු ද යත්? ආදියෙය්‍යති, ආදියෙය්‍ය යනු, ආරාමං, අරමකට, අභියුඤ්ජති, චිත්තිබණාන්නේද, දුක්කටං ආපත්ති, දුකුලා ඇවතක්, අස්ස (භවෙය්‍ය) වන්නේයි. වා. නොහොත්, දුක්කටස්ස, දුකුලා ඇවතකට, ආපත්ති, (ආපජ්ජනං) පැමිණීම, හොති, වේ, (චිත්තිබණාන්නේ යයි කීයේ නමුදු අන්සතු අරමක් මාගේ යයි, මුසාවාදයෙන් චිත්තිබ්ණී මම ගත යුතුයි. මුසාවාදය පාචිත්ති වස්තුවක් වුයේ නමුදු අදින්නාදනයාගේ පූර්ව ප්‍රයෝගය වන්නේයි, දුකුලා ඇවතක්ම වේ යැයි, ටීකායෙහි කීයේයි, ටීකායෙහි වනාහි, "සම්පජාන මුසාවාදෙපි අදින්නාදනස්ස පුබ්බපයො ගත්තා දුක්කටං" යන පාඨය බලා අදින්නා දනයාගේ පූර්වභාගයෙහි වන්නා වූ සියලු පාචිත්ති වස්තු තුමූ දුකුලා ඇවත් වෙතියි කියන්නා හු නම් ඒ වචනය නොගත යුත්තේයි. කුමක් හෙයින යත්? අදින්නාදනයාගේ පූර්ව ප්‍රයෝගයෙහි පචිති විය යුතු තන්හි දුකුලා නොවිය යුතු හෙයිනි. කුමක් හෙයින් නොවිය යුතුද යත් සමන්ත පාසාදිකා අටුවායෙහි "විහාරෙගුම්කම්මං අත්ථිති මුසාභණති යංයංවචනං මුසාතත්ථ තත්ථපාචිත්තියං" යනුද නහිඅදින්නාදනස්ස පුබ්බපයෝගෙ පාචිත්ති යට්ඨානෙ දුක්කටං නාම අත්ථි යනුද අකප්පිය පථවි ඛණන්තානං දුක්කටෙන සද්ධිං පාචිත්තියානි යනුද ආහෙයිනැයි දතයුතුයි, එසේ වී නම් ටීකාචාරී හෙමේ කුමක් හෙයින් "පුබ්බපයොගත්තා යනු කීයේද යත්? සඟ ප්‍රයෝගමය අදින්නාදනයාගේ

පූර්වභාග වශයෙන් කීයේයි. මුඛපප්‍රයෝග වශයෙන් කීයේ නොවෙයි. මෙසේ ගත් කලැ අටුවා වහා ටීකාව ගැලපෙයි) සාමිකස්ස, ස්වාමියාගේ, විමතිං උප්පාදෙති, සැකය උපදවාද, ථුල්ලච්චයස්ස, ථුලසිඇවතට, ආපත්ති (ආපජ්ජනංහොති) පැමිණීම වෙයි. සාමිකො, වස්තු ස්වාමිහෙම, මයහං, මාගේ, සන්තකොනභවිස්සති, සන්තක නොවන්නේයයි, ඉති, මෙසේ, ධුරංනික්ඛිපති, බරබහාතබා ද, නොහොත් තමා සතුය යන බරහරණේද, පාරාජිකස්ස, පරාජිකාපත්තියට, ආපත්ති (ආපජ්ජනංහොති) පැමිණීම වෙයි. (අභිප්‍රාය විත්තිබණින්නාවූ භික්ෂු තෙමේ ධුරනික්ෂේපය කරන්නේ යැයි කීයේයි - ඒ භික්ෂුහු දෙදෙනම ධුර නික්ශේපය කිරීමෙන්ම පාරාජිකාපත්තියට පැමිණෙති, එක් නමක් ධුරනික්ෂේපය නොකළ කල්හි නොපැමිණෙයි. විත්තිබණින්නාවූ භික්ෂුතෙමේ මාගේ ආගෙව දන්වා නැවත දෙන්නෙම්දැයි සිත් ඇති කල්හි දු ස්වාමි වූ අනික් භික්ෂු තෙමේත් පසුව ලැබෙයයි සිතාද මෙසේ දෙදෙනාම ධුරනික්ෂේපය නොකළ කල්හි පාරාජිකාපත්තියට නොපැමිණෙති) හරෙයපාති, හරෙයප යනු, අඤ්ඤස්ස, භණ්ඩං, අනිකෙකුගේ භාජනාදි උපකරණයක්, හරන්තො, පැහැර ගන්නා වූ සතුරු තෙමේ, සීසෙඨිතං, හිසෙහි තුබුනාවූ, භාරං, බරක්, ථෙයපචිත්තො, සොර සිත් ඇත්තේ, ආමසති, අල්වාද, දුක්කටංහොති, දුකුළා ඇවැතක් වෙයි. එන්දාපෙති, ඒ බඩුව සොලවාද, ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වෙයි. ඛන්ධං ඔරොපෙති, කරපිටට බස්වාද, පාරාජිකංහොති, පරිජි ඇවත වෙයි. අවහරෙයපාති, අවහරෙයප යනු, උපනික්ඛිත්තං භණ්ඩං, තමාහට භාරකොට තබන ලද භාණ්ඩයක්, මේ භාණ්ඩං, මාගේ භාණ්ඩය, දෙහිති, දෙවයි, ඉතිවුච්චමානො, මෙසේ කියනු ලබනුයේ, අහං, මම, නගණ්හාමිති, නොගනිමියි, භණති, බෙනේද, දුක්කටංහොති, දුකුලා ඇවැතක් වෙයි. (ගණ්හාමි, යනු අනිහාර්ථයෙහි අර්ථ ප්‍රකාශක වූ වර්තමාන විභක්තියි) සාමිකස්ස, වස්තු ස්වාමියා හට, විමතිං උප්පාදෙති, (මාගේ බඩුව ලැබේදේහෝ නොලැබේදේ හෝ යි) සැක උපදවාද, ථුල්ලච්චයං හොති, ථුලසිඇවැත් වෙයි. සාමිකො, වස්තු ස්වාමි තෙමේ, මයහං සන්තකොනභවිස්සති. මින්මතු මාසන්තක නොවන්නේ යයි, ඉතිධුරං නික්ඛිපති, මෙසේ අයිතිබර බහා තබාද, පාරාජිකංහෝති. පරිජි ඇවතක් වෙයි. ඉරියාපථං විකොපෙයපාති, ඉරියාපථං විකොපෙයප යනු,

සහභාණ්ඩහාරකං, බඩුවගෙණයන්නහු සමග, නෙස්සාමීති, තමහට අභිමත ස්ථානයට පමුණුවන්නේමියි, පඨමං පාදං, පළමු වන පියවර, අතික්කාමෙති, ඉක්මවාද, ථුල්ලච්චයංහොති ථුලසි ඇවත වෙයි. දුතියංපාදං, දෙවෙනිපියවර, අතික්කාමෙති, ඉක්මවාද, පාරාජිකංහොති, පරිජි ඇවත වෙයි. ඨානාචාවෙයපාති, ඨානාචාවෙයප යනු, ථලට්ඨංභණ්ඩං, ගොඩතුබුනා වූ භාණ්ඩයක්, ථෙයපච්ත්තො, සොර සිත්ඇත්තේ, ආමසති, අල්වාද, දුක්කටං හොති, දුකුලා ඇවතක් වෙයි. ඵන්දපෙති, තුබූ තැනින් සොලවාද, ථුල්ලච්චයංහොති, ථුලසිඇවත වෙයි. ඨානාචාවෙති, තුබූ තැනින් පහ කෙරේද, පාරාජිකංහොති, පරිජිඇවතවෙයි. ඒවං, මෙසේ, තාම පලමුකොට, නානාභණ්ඩපංචකං නානාභාණ්ඩපඤ්චකය, වේදිතබ්බං, දතයුතුයි. සස්සාමිකස්ස, ස්වාමියා සහිත වූ , දසස්සවා, දසයෙක හෝ, තිරච්ඡානගතස්සවා, තිරිසන් ගිය එකෙක් හෝ, යථාවුත්තෙන, යම් පරිද්දකින් කියන ලද ක්‍රමයෙන්, අභියෝගාදිනානයෙන, විත්තිබිණීම් ආදී වූ ක්‍රමයෙන්, ආදියන, විත්තිබැණ පැහැර ගැනීමය. හරණ, ගෙණ යන්නා වූ වස්තුව උදුරා ගැනීමය, අවහරණ, භාර කොට තිබූ වස්තුව නොදී පැහැර ගැනීමය ඉරියාපථ විකෝපන, ඉරියව් බිඳ පැහැර ගැනීමය, ඨානාචාවනවසෙන, තුබූ තැනින් පහකොට පැහැර ගැනීමය යන මොවුන්ගේ වශයෙන්, එකභණ්ඩ පඤ්චකංවේදිතබ්බං, එක භාණ්ඩ පඤ්චකංවේදිතබ්බං, එකභාණ්ඩ පංචකය දත යුතුයි. සාහත්ථික පඤ්චකං, සාහත්ථික පඤ්චකය තෙමේ, කතමං, කවරයත්? සාහත්ථිකො, සිය අතින් සොරකම් කොට ගැනීමය. ආණත්තිකො, අනුන් මෙහෙයාසොරකම් කොට ගැනීමය. නිස්සග්ගියො, දුරට දමා ගැසීමෙන් සොරකම් කොටගැනීමය. අත්ථසාධකො, සොරකම කෙළවර කිරීමට මත්තෙන් අර්ථසාධක වූ පැහැර ගැනීමය. ධුරනික්ඛෙපො, බර බහා තබන්නා වූ සොරකම් කිරීමය. ඉතිඉමෙ, මේ අවහාරයෝය. තත්ථ, ඒ පඤ්චප්‍රකාර අවහාරයන් අතුරෙන්, සාහත්ථිකොනාම, සාහත්ථිකය වනාහි, පරස්සෙවභණ්ඩං, අනුන්ගේම භාණ්ඩයක්, සහත්ථා, (සහත්ථේන) සිය අතින්, අවහරති, පැහැර ගණීද, ආණත්තිකො නාම, ආණත්තිකය වනාහි, අසුකස්සභණ්ඩං, අසවලාගේ බඩුව, අවහරතීති, සොරකම් කරවයි, අඤ්ඤංආණාපෙති, අනිකෙකුට අණවාද, (අසවලාගේ භාණ්ඩය තෝ සොරකම් කරවයි මෙසේ අණවාද, ඒ ඇණවන්නා

වූ මහණ හට, ඒ අණවන්නා වූ ක්ෂණයෙහිම පාරාජිකාපන්න වෙයි. ඒ ඇණවනු ලැබූ මහණ හට බඩුව තුබ තැනින් පහකරන්නා වූ ක්ෂණයෙහිම පාරාජිකාපත්තිය වෙයි. ආණත්තිකයාගේ හා අත්ථසාධකයාගේද විශේෂය ඒ ක්ෂණයෙහි සොරකම් කරවයි. ඇණවන්නා වූ ප්‍රයෝගය ආණත්තිය නම් වෙයි. යම්කලෙක්හි සොරකම් කල හැකිවේනම් එකල්හි සොරකම් කරවයි. ඇණවීම අත්ථසාධක නම් වෙයි. අත්ථ සාධකයෙහි කාල නියමයක් නැත්තේයි. මේ වනාහි මේ දෙදෙනාගේ විශෙෂයයි) නිස්සග්ගිනාම, නිස්සග්ගි වනාහි, සුංකඝාත පරිකප්පිතොපාසානං, සුංකන් හඹන්නා ස්ථානය කල්පනා කරන්නා වූ ස්ථානය යන දෙදෙනාගේ අන්තො ඇතුලත්හි, ඨත්වා, සිට, බහි පාතනං පිටතට හෙළීමයි. අත්ථසාධකොනාම, අත්ථසාධකය වනාහි, අසුකස්සභණ්ඩං, අසවලාගේ බඩුව, යදාසක්කොති, යම්කලක පැහැර ගත හැකිවේද, තදා, එකල්හි, තං, ඒ භාණ්ඩය, අවහර ඉති, පැහැර ගනුවයි. ආණාපෙති, ඇණවාද, තත්ථ, ඒ ඇණවන්නා වූ ස්ථානයෙහි, පරො, ඒ ඇණවුම් ලද්ද වූ පුද්ගල තෙමේ, අනන්තරාධකොහුත්වා, අනතුරක් නැත්තෙක්ව, තං, ඒ භාණ්ඩය, සචෙ අවහරති, ඉදින් පැහැර ගණිද, ආණාපකස්ස, ඇණවූ මහණ හට, ආණත්තික්ඛණෙයෙව, ඇණ වූ ක්ෂනයෙහිම, පාරාජිකංහොති, පාරාජිකාපත්තිය වෙයි. පරස්සචාපන, අනුන්ගේ වනාහි, තෙලකුම්භියා, තෙල් කලයෙක්හි, පාදග්ඝණකං, රන්මසු පාදයක් අගනා වූ, තෙලං, තෙල, අවස්සං, ඒකාන්තයෙන්, පිවකානි, බොන්නා වූ, උපාහණාදීනි, වහන් ආදීන්, පක්ඛිපති, දමාද, හත්ථතො, අතින්, මුත්තමත්තෙයෙව, මිදුනු පමණෙක් හිම, පාරාජිකංහොති. පරිජි ඇවත වෙයි. ධුරනික්ඛෙපොපන, ධුරනික්ෂේපය වනාහි, අරාමාභියෝග උපනික්ඛිත්ත භණ්ඩවසෙන, ආරාමාදියට චිත්තනිබ්ඛිණීමය. භාරකොට තුබූ වස්තුව සඟවා ගැනීමය යන මොවුන්ගේ වශයෙන්, වේදිතබ්බො, දතයුතුයි. තාවකාලික භාණ්ඩ දෙයපාහි, තාවකාලික වශයෙන් ඉල්වා ගන්නා ලද්ද වූ භාණ්ඩයන්, අදෙන්තස්සාපි, නොදෙන්නා වූ මහණ හටද, එසෙවනයො, මෙම ක්‍රමය දතයුතු වෙයි. ඉති ඉදං, මේ වනාහි, සාහත්ථිකපඤ්චකං, සාහත්ථික පඤ්චකයයි. පුබ්බපයෝගපඤ්චකං, පූර්ව ප්‍රයෝග පඤ්චකය තෙමේ. තතාමං, තත්‍රව්ද: පුබ්බ පයොගො පූර්වභාගයෙහි හටගන්නා වූ උත්සාහ ඇත්තා වූ සොරකම් කිරීමය. සහ පයොගො, උත්සාහ සහිතව එකක්ෂණයෙහි හටගන්නාවූ සොරකම් කිරීමය, සංවිධාය භාරොව,

සාකච්ඡාකොම සොරකම් කිරීමයි. සංකේතකම්මං, සලකුණක් කොට හෙවත් සංඥකොට සොරකම් කිරීමය, නිමිත්තකම්මං, නිමිත්තක් කොට, සොරකම් කිරීමය, ඉතිඉමෙ, මේ අවහාරයේ පස්දෙනායි තත්ථ, ඒ අවහාරයන් පස්දෙනා අතුරෙන්, ආණත්තිවසෙන, අණවීම් වශයෙන්, පුබ්බපයොගො, පූර්වප්‍රයෝගය, වේදිතබ්බො, දත යුත්තේයි. ඨානාචාවනවසෙනවා, තුබූ තැනින් පහකිරීම් වශයෙන්ද. ඛීලාදිනිසංකමෙන්වා, හුල් ආදිය සංක්‍රමණය කොට, ඛෙත්තාදිග්ගහණවසෙනව, කෙත්වත් ආදිය ගැනීම් වශයෙන්ද, සහපයොගො, සහපයොගය, වේදිතබ්බො, දත යුතුයි. සංවිදවහාරො නාම සංවිදාවහාරය නම්, අසුකංනාමභණ්ඩං, මේනම් ඇත්තා වු භාණ්ඩය, අවහරිස්සාමාති, සොරකම්කරම්හයි, සංවිදහිත්වා, එක්සත් කොට, සම්මන්තයිත්වා, සාකච්ඡා කොට, අවහරණං, සොරකම් කිරීම වෙයි. හි, එසේමැයි. ඒවංසංවිදහිත්වා, මෙසේ එක් සත්කොට, ගතෙසු, ගියවුන් අතුරෙන්, එකේන අපි, ඒකෙකු විසිනුද, තස්මිං භණ්ඩෙ, ඒ භාණ්ඩය, ඨානාචාවිතෙ, තුබූ තැනින් පහ කළ කල්හි, සබ්බෙසං, සියල්ලවුන්ට, අවහාරාහොන්ති, සොරකම් කලාහුවෙත්, සංකේතකම්මංනාම, සංකේතකර්මය නම්. සංජානන කම්මං, දැනගන්නා පිණිස සලකුනු කිරීමයි. හි, ඒ වචනය සැබෑමය, පුරෙභත්තාදිසු, පෙරවරු කල් ආදීන් අතුරෙන්, යංකිඤ්චිකාලං, යම්කිසි කාලයක්, පරිච්ඡින්දිත්වා, පිරිසිඳ නියම කොට, අසුකස්මිංකාලෙ, මේ නම් ඇත්තා වූ අසවල් කාලයෙහි, ඉත්ථන්නාමංභණ්ඩං, මෙනම් ඇත්තා වූ භාණ්ඩය, අවහරාතිවුත්තෙ, පැහැර ගණුවයි කී කල්හි, සංකේතතො, සලකුණෙන්, අපච්ඡාඅපුරෙ, පෙරපසුනොවී, සචෙඅවහරති, ඉදින් පැහැරගණීද, සංකේතකාරකස්ස, සලකුණු කළා වු මහණ හට, සංකේත කරණක්ඛණෙයෙව, සලකුණු කරන්නා වූ ක්ෂණයෙහිම, අවහාරොහොති, සොරකමවෙයි. නිමිත්තකම්මං නාම, නිමිත්තකර්මය නම්, සඤ්ඤුප්පාදනත්ථං, සලකුණු උපදවන පිණිස, අක්ඛිනිඛණනාදි නිමිත්තකරණං. ඇස්පියමැරීම් ආදි, නිමිත්ත කිරීම වේ. හි, ඒ එසේ මැයි, ඒවංකත නිමිත්තතො, මෙසේ කරණ ලද්ද වු නිමිත්තෙන්, අපච්ඡා අපුරෙ, පෙර පසුනොවී, යං, යම් භාණ්ඩයක්, අවහරාතිවුත්තො, පැහැර ගණුවයි කියනු ලැබූ පුද්ගල තෙමේ, තං, ඒ භාණ්ඩය, සචෙඅවහරති, ඉදින් පැහැර ගණීද, නිමිත්තකාරකස්ස, නිමිති කරන්නාවු මහණහට, නිමිත්ත කරණක්ඛණෙයෙව,

නිමිති කරන්නා වූ ක්ෂණයෙහිම, අවහාරො හොති, සොරකම වෙයි. ඉතිඉදං මේ වනාහි, පුබ්බපයොගපඤ්චකං, පූර්ව ප්‍රයෝග පංචක නම් වේ. ථෙය්‍යාවහාරපඤ්චකං, ථෙය්‍යාවහාර පඤ්චක නම්, කතමං, කවරේද යත්? ථෙය්‍යාවහාරො, සැඟවී සිට සොරකම් කිරීමය. පසය්හාවහාරො බලනාත්කාරයෙන් අත කර කවා සොරකම කිරීමය. පරිකප්පාවහාරො, වස්තු ප්‍රදේශය කල්පනා කොට සොරකම් කිරීමය, පටිච්ඡන්නාවහාරො, පිලිසන් කොට තබා සොරකම් කිරීමය. කුසාවහාරො, කුසපත් මාරුකොට, සොරකම් කිරීමය, ඉතිඉමෙ, මේ අවහාරයෝ පස්දෙනායි. තත්ථ, ඔවුන් අතුරෙන්, යො, යමෙක් තෙමේ, සන්ධිච්ඡෙදනිකත්වා, භිත්ති ආදිය බිඳ, ආදිස්සමානො, අදෘශ්‍යමානව, හරති, සොරකම් කෙරේද, කූටමානකූටකහාපණාදීහිවා, සොරමැනුම් සොරකහවණු ආදියෙන් හෝ වඤ්චෙත්වා, රවටා, ගණ්හාති, පැහැරගණීද, ඡවංගණ්හතො, මෙසේ ගන්නා වූ, තස්ස, ඔහුගේ, අවහාරො, සොරකම, ථෙය්‍යාවහාරොති, ථෙය්‍යාවහාරයයි. වෙදිතබ්බො, දත යුතුයි. (කූට මාන කූටකහාපණාදීහ, යන මේ පෙදෙහි කූට මානා තෙමේ හදය භේදය සිඛාභේදය රජ්ජු භේදයයි ත්‍රිවිධ වේ. ඔවුන්-අතුරෙන් හදය භේදය යනු තෙල් ආදිය මනින්නා වූ පියලි ආදියෙහි සිදුරු කිරීම වෙයි. තෙල් ගිතෙල් ආදිය තමාවිසින් ගන්නා වූ කාලයෙහි යට සිදුරෙන් වගුරුවා සෙමින් සෙමින් වත්කරවයි කියා ගන්නේ වේ. තමාගේ තෙල අනුන්ට මැන දෙන කාලයෙහි යටසිදුර අතින් වහවහාම පුරවාදෙන්නේ වෙයි. සිඛාභේද යනු තල සහල් ආදිය මණින්නා වූ කල්හි තමා විසින් ගන්නා ලද්දේ සෙමින් සෙමින් මුදුන පුරවා ගන්නේ වෙයි. අනුන්ට මැන දෙන කල්හි වහවහාම මුදුන බිඳ දෙන්නේ වෙයි. රජ්ජු භේදය යනු කෙත්වත් ආදිය තමා විසින් මැන ගන්නා වූ කල්හි විසාල වූ භූමි ප්‍රදේශය සංක්ෂේප කොට මැන ගන්නේ වේ. අනුන්ට මැන දෙන කල්හි සංක්ෂේප වූ භූමිය විශාල කොට මැන දෙන්නේ වෙයි. මේ වනාහි කූට මාණ නම් වේ හෙවත් කුළුමැණීම් නම් වෙයි. කූටකහාපණ යනු සුදු පිත්තල ආදියෙන් කරණ ලද්ද වූ රුපිය කහාපණාදීන් රජතමය කහාපණාදීන් කොට දීමවේ. ආදි ශබ්දයෙන් තුලාකූට කංසකූට වඤ්චනාදිහු ගැණෙත්. ඔවුන් අතුරෙන් තුලාකූටය, රූපකූටය අංගකූටය ගහණකූටය පටිච්ඡන්නකූටයයි චතුර්විධ වේ. ඔවුන් අතුරෙන් රූපකූටය යනු එක්වන් සටහන් ඇත්තා වූ කුඩු මහත් තරාදි දෙකක් තබාගනිමින් අනුන්ගේ

වස්තුව කිරා ගන්නා කල්හි මහත් තරාදියෙන් කිරාගනී. තමන්ගේ වස්තුව කිරාදෙන කල්හි කුඩා තරාදියෙන් කිරාදෙයි. මේ රූප කූට නම්වේ. අංගකූට යනු අනුන්ගේ වස්තුව කිරාගන්නා කල්හි පසුභාගය තදකොට කිරාගැනීමය. තමාගේ වස්තුව කිරාදෙන කල්හි පූර්වභාගය තදකොට කිරා දීම වෙයි. ගහණකූටය යනු ගණ්න කල්හි රැහැණ මුලින් අල්වාගැනීමයි. දෙන්නා වූ කල්හි රැහැණ අගින් අල්වා ගැනීම වෙයි. පටිච්ඡන්නකූට යනු තුලාකපාලයෙහි නොහොත් තරාදි තට්ටුයෙහි සිදුරක් කොට ලොහොයුණු ආදිය කිරා ගන්නා කල්හි ඒ සිදුරු සහිත වූ තරාදි තට්ටුව පසු භාගයෙහි කිරීමද කිරාදෙන කල්හි පූර්වභාගයෙහි කිරීමද වෙයි. කංසකූටයනු එක් ස්වර්ණභාජනයක් කොට ඒ ස්වර්ණභාජනයට බඳු වූ සටහන් ඇත්තා වූ තඹ පිත්තල භාජනි කීපයක් කොට යම්කිසි ප්‍රදේශයකට ගොස් විකුණාන්නා වූ කාලයෙහි ස්වර්ණභාජනය උරගා පෙන්වා ඒ ස්වර්ණභාජනය මෙන්ම සෙසු ලෝහ භාජනද විකිනීම වෙයි. වංචනාය යනු ඒ ඒ පයහීමායාවන් කරන කොට ගෙන වංචාකිරීම වෙයි. යොපන, යමෙක් වනාහි, ගාමඝාතකාදයොව්ය, ගම්පහරණ සොරහුමෙන්, පසයහ, හිංසාපීඩා කොට, බලක්කාරේන, බල ඇත්තහුගේ වශයෙන්, පරෙසංසන්තකං, මෙර මාසතු වස්තුව ගණ්හාති, පැහර ගණිද්ද, රාජ භටාදයොව්ය, රාජභට පුරුෂාදීහුමෙන්, ඈත්තනො, තමහට, පත්තහලිතොවා, පැමිණියා වූ අයට අධික වශයෙන් හෝ, වුත්තනයේනව කියන ලද්ද වූ ක්‍රමයෙන්ම, අධිකංගණ්හාති, වැඩියක් ගණිද, ඒවං ගණ්හතො, මෙසේ ගන්නා වූ, තස්ස, ඔහුගේ, අවහාරො, සොරකම, පසය්හාවහාරොති, පසය්හාව හාරයයි, වේදිතබ්බො. දත යුත්තේයි. පරිකප්පෙත්වා, කල්පනා කොට, ගහණංපන, ගැණීම වනාහි, පරිකප්පාවහාරො නාම. පරිකප්පාවහාරය නම්වෙයි. සො, ඒ පරිකප්පාවහාරය තෙමේ, භණ්ඩොකාසවසෙන, භාණ්ඩය කල්පණා කිරීමය ස්ථානය කල්පනා කිරීමය යන මොවුන්ගේ වශයෙන්, දුවිධො, දෙවැදෑරුම් වේ, තත්‍ර, ඒ දෙවැදෑරුම් පරිකප්පයන් අතුරෙන්, අයං, මේ කියනු ලබන්නේ, භණ්ඩපරිකප්පො, භාණ්ඩය ක්ල්පණා කිරීමයි. සාටකත්ථිකො, වස්ත්‍රයක් කැමති මහණ තෙමේ, අන්තොගබ්භං පවිසිත්වා, ඇතුල් ගබඩාවට පිවිස, සචෙසාටකො, භවිස්සති. ඉදින් වස්ත්‍රයක් වූයේ නම්, ගණ්හිස්සාමි, ගන්නෙමි. සචෙසුත්තං භවිස්සති. ඉදින්හූ වී නම්, නගණ්හිස්සාමිති. නොගන්නෙමියි, පරිකප්පෙත්වා,

කල්පනාකොට, අන්ධකාරෙ, අඳුරෙහි, පසිබ්බකංගණ්හාති, පසුම්බියක් ගණීද, තත්‍ර, ඒ පසුම්බියෙහි, සචෙසාටකො හොති, අඳින් සළුවක් වේද, උද්ධාරෙයෙව, උගුළුවාගත් ක්ෂණයෙහිම, පාරාජිකංහොති, පරිජි ඇවත වෙයි. සුත්තංචෙහොති, ඉදින් හුයිද. රක්ඛති, රක්ෂා කෙරෙයි. බහිනීහරිත්වා, පිටතට නිකුත් කොට, මුඤ්චිත්වා, මුද, සුත්තන්තිසඤ්ඤාය, නූල් මලකැයි දැන, පුන නැවත, ආහරිත්වා ඨපෙති, එළවාතබාද, රක්ඛතියෙව, රක්ෂාකෙරෙමැයි සුත්තන්තිසඤ්ඤායාපි, නූල් මලෙකැයි දැනගෙනද, යංලද්ධං, යම් වස්තුවක් ලබන ලද්දේ වී නම්, තංගහෙතබ්බන්ති, එය ගතයුතු යයි, ගච්ඡති, යේද, පදුද්ධාරෙන, පය උගුළු වීමෙන්, කාරෙතබ්බං, විනිශ්චය කටයුතුයි. (දෙවෙනි පාදය උගුළුයේ වී නම් පාරාජිකාවට පැමිණෙයි කීනිසායි. මෙහි වනාහි භූමියෙහි නොතබන ලද්ද වූ භාණ්ඩයක් සඳහා කීයේ යයි දත යුතුයි) භූමියංඨපෙත්වා, භූමියෙහි තබා, ගණ්හාති, ගණීද, උද්ධාරෙ, පය ඉගුළු ක්ෂණයෙහි, පාරාජිකං හොති, පරිජි ඇවත වෙයි. චොරොචොරොති. සොරෙක සොරෙකැයි, අනුබද්ධො, ලුහුබඳනා ලද්දේ, ඡඩ්ඩෙත්වා පලායති.' හැරදමා දුවාද, රක්ඛති. රක්ෂා කෙරෙයි. සාමිකාදිස්වා, වස්තු ස්වාමි හු දැක, ගණ්හන්ති, ගණිද්ද, රක්ඛතියෙව, රක්ෂා කෙරේ මැයි, අසොදසදකොට්, අන්කිසිවෙක් තෙමේ, වෙගණ්හාති. ඉදින් ගණිනම් භණ්ඩදෙය්‍යංහොති, බඩුව දිය යුත්තක් වේ. සාමිකෙසු, ස්වාමියන්, නිවත්තෙසු, නැවතුනු කල්හි, සයංදිස්වා, තෙමේ දැක, පංසුකුල සඤ්ඤාය, පංශුකූලය යන සංඥවෙන්, ගණ්හන්තස්ස අපි ගන්නාවූ , මහණ හටද පගෙව පුර්වයෙහිම, එතං මේ වස්තුව මයා ගහිතං, මා විසින් ගන්නා ලදි ඉදනි දැන් මම සන්තකං, මා සතුයි. ඉති මනසිකත්වා, මෙසේ මෙනෙහි කොට, ගණ්හන්තස්සාපි, ගන්නා වූ මහණහටද, භණ්ඩදෙය්‍යමෙව හොති, භණ්ඩදෙය්‍යයක්ම වේ. තත්ථ. ඒවචනයෙහි, "සචෙසාටකො භවිස්සති ගණ්හිස්සාමිති ආදිනානයේන, සචෙ පෙ ගණ්හිස්සාමි" යනාදී ක්‍රමයෙන් පවත්තො, හටගත්තා වූ, යොඅයංපරිකප්පො, යම් කල්පණා කිරීමක් තෙමේ, අත්වී ඇත්තේද අයං මේ කල්පනා කිරීම තෙමේ භණ්ඩපරිකප්පො නාම, භණ්ඩපරිකප්පය නම් වේ. ඔකාසපරිකප්පොපන, ඔකාසපරිකප්පය වනාහි, ඒවංවේදිතබ්බො, මේ මතු වක්ෂ්‍යමාන ක්‍රමයෙන් දතයුත්තේයි. එකච්චො ඇතම් මහණෙක් තෙමේ, පරිවෙණාදීනිපවිට්ඨො, පිරිවෙන් ,ආදියට ප්‍රවිෂ්ට වූයේ,

නික්ඛිපිතුකාමතාය, ලොභනියං භණ්ඩංදිස්වා, ඇළුම් කටයුතු වූ යම්කිසි භාණ්ඩයක් දැක, ගබ්භද්වාර පමුඛ හෙට්ඨා පාසාද ද්වාර කොට්ඨක රුක්ඛ මූලාදි වසෙන ගබ්භද්වාරයාගේ අභිමුඛය ප්‍රාසාදයාගේ යටදෙරටුවය කොටුවය රුක් මුලය යනාදීන්ගේ වශයෙන්, පරිච්ඡෙදංකත්වා, පිරිසිඳීම කොට, මං, මා, එත්ථන්තරෙ, මේ අතුරෙහි, සචෙපස්සන්ති, ඉදින් දක්නාහු නම්, දට්ඨුකාමතාය, බලනු කැමැත්තෙන්, ගහෙත්වා විචරන්තො විය, අතින් ගෙන සක්මන් කරන්නෙක් මෙන්, දස්සාමි, දෙන්නෙමි, නොචෙපස්සන්ති, ඉදින් නොදකින්නාහු නම්, හරිස්සාමි ඉති, පැහැර ගන්නෙමියි. පරිකප්පෙති, කල්පනා කෙරේද, තස්ස, ඒ මහණා හට, තංභණ්ඩං, ඒ බඩුවගෙන, පරිකප්පිතපරිච්ඡෙදං, කල්පනාකළ පරිච්ඡේදය, අතික්කන්තමත්තෙ, ඉක්මවූ මාත්‍රයෙහි, අවහාරොහොති, සොරකම වෙයි. ඉති (එවං) මෙසේ, වුත්තනයෙන, කියන ලද ක්‍රමයෙන්, පවත්තො, හටගත්තා වූ, යොයංපරිකප්පො අත්ථි, යම් මේ කල්පනා කිරීමක් ඇත්තේද, අයං, මේතෙ මේ, ඔකාසපරිකප්පො නාම, ඔකාස පරිකප්පය නම් වේ. එවං, මෙසේ, ඉමෙසංද්වින්නං පරිකප්පානංවසෙන, මේ පරිකප්පයන් දෙදෙනාගේ වශයෙන්, පරිකප්පෙත්වා, කල්පනා කොට, ගණ්හතො, පැහැරගන්නාවූ මහණාහුගේ, අවහාරො, සොරකම, පරිකප්පාවහාරොති, පරිකප්පාවහාරයයි, වේදිතබ්බො, දතයුත්තේයි. පටිච්ඡාදෙත්වාපන, පිළිසන් කොට වනාහි, අවහරණං, පැහැර ගැනීම, පටිච්ඡන්නාවහාරො, පටිච්ඡන්නාවහාරය නම් වේ. සො, ඒ පටිච්ඡන්නාවහාරය, එවංවේදිතබ්බො, මෙසේ දත යුත්තේයි. යො භික්ඛු, යම් මහණෙක් තෙමේ, උය්‍යානාදිසු, උයන්වතු ආදියෙහි, පරෙසං, අනුන්ගේ, ඔමුඤ්චිත්වා, මුද, ඨපිතඅංගුලිමුද්දිකාදිං, තැබූ ඇඟිලි මුදු ආදිය, දිස්වා, දැක, පච්ඡාගණ්හිස්සාමිති, පසුව ගන්නේමියි, පංසුනාවා, පසින් හෝ, පණ්ණෙනවා, කොළපතින් හෝ, පටිච්ඡාදෙති. පිළිසන් කෙරේද, තස්ස, ඒ මහණාහට, එත්තාවතා මේ පමණකින්, උද්ධාරො, උගුළුවා ගැනීමක්, නත්ථි, නැත්තේද, ඉති (තස්මා) එසේ හෙයින් අවහාරා, අවහාරයෝ තුමූ, නහොන්ති, ඒ තාක් නොවෙති. යදාපන, යම් කලෙක්හි වනාහි, සාමිකා, වස්තු ස්වාමීහු තුමූ, විචිනන්තා, සොයන්නාහු, අපස්සිත්වා, වස්තුව නොදැක, ස්වෙජානිස්සාමාති, සෙට දවස (අවුත) දැන ගණිම්හයි, සාලයාව, ආලය සහිත වූවාහූම, ගතාහොන්ති, ගියාහු වෙද්ද, අථ(පච්ඡා) ඊට පසුව, අස්ස, ඒ මහණාහට, තං, ඒ ඇඟිලි මුදුව,

උද්ධාරකො, උගුළුවාගන්නේ, උද්ධාරෙ, උගුළුවන්නා වූ ක්ෂණයෙහි, අවහාරොහොති, සොරකම වෙයි. පටිජානනකාලෙයෙව, පිළිසන් කළ කල්හිම, තං, ඒ වස්තුව, මමසන්තකං, මාගේ වස්තුවයයි. ඉති සඤ්ඤායවා, මෙබඳු සංඥාවෙන් හෝ, ඉදානි, දැන්, තෙ, ඒ වස්තු ස්වාමිහු තුමූ, ගතා, ගියාහුය, ඉදං, මේ වස්තුව, ඡඩ්ඩිත භණ්ඩං ඉති, හරණ ලද බඩුවකැයි, පංසුකූල සඤ්ඤායවා, පංශුකූල යන සංඥාවෙන්හෝ, ගණ්හන්තස්සපන, ගන්නා වූ මහණා හට වනාහි, භණ්ඩදෙය්‍යං, භාණ්ඩ දෙය්‍යය වේ. තේපු, ඒ වස්තු ස්වාමියන්, දුතිය දිවසෙ, දෙවන දවස් (උදසන්) හි, ආගන්ත්වා, ඇවුත්, විචිනිත්වා, සොයා, අදිස්වා, (බඩුව) නොදැක, ධුරනික්ඛෙපංකත්වා, ධුරනික්ෂේපය හෙවත් අයිති බැව් සංබන්ධනබරබහානබා, ගතෙසුපි, ගියකල්හිද, ගහිතං, ගන්නා ලද්දේ, භණ්ඩදෙය්‍යමේව, භාණ්ඩදෙය්‍යයම වේ. පච්ඡා, පසුව, සදත්වා, දැන්, චොදයමානස්ස, චෝදනා කරනු ලබන්නාවූ, අදදතො, නොදෙන්නාවූ මහණා හට, සාමිකානං, වස්තු ස්වාමියන්ගේ, ධුරනික්ඛෙපෙ, ධුරනික්ෂේපයෙහි නොහොත් ධුරනික්ෂේපය හේතු කොටගෙන, අවහාරොහොති, සොරකම වෙයි. (කස්මා යන මේ ප්‍රශ්නය "භණ්ඩදෙය්‍යමේව" යන පූර්ව වාක්‍ය සඳහා හටගත්තේයි. වස්තු ස්වාමිහුද බඩුව සොයා නොලත් හෙයින් ධුරනික්ෂේප කිරීම වශයෙන් ආලය අතහරණ ලද්ද වූ අස්වාමික භාණ්ඩය ගන්නා වූ මහණාහට කුමක් හෙයින් භාණ්ඩ දෙය්‍යය වන්නේ දැයි යන ප්‍රශ්නයක් ඇති හෙයින් ඒ ප්‍රශ්නය නිකුත් කරනු කැමති ආචාර්‍ය්‍ය තෙමේ "කස්මා යනු කියේයි. එතකුදු වුවත් ටීකායෙහි ඒ අර්ථය නොකියන ලදී. ටීකායෙහි නොකීයේ නමුදු සමන්ත පාසාදිකා අටුවායෙහි "භණ්ඩදෙය්‍යමේව" යන පදයට අනතුරුව "කස්මා" යන්නම යොදන ලදී. "පච්ඡාසදත්වා" යනාදි පාඨයන් නැති හෙයිනැයි දත යුතුයි. "අවහාරොහොති" යන්න සඳහා ඒ ප්‍රශ්නොද්ධරණය කෙළේ නම් යුක්ති යුක්ත වන්නේයි) කස්මා, කුමක් හෙයින යත්? තස්ස, ඒ මහණාහුගේ, පයොගෙන, ප්‍රයෝගය හේතු කොටගෙන, තේහි, ඒ වස්තු ස්වාමියන් විසින්, යස්මා යම් හෙයකින්, නදිට්ඨං, නොදක්නා ලද්දේද, තස්මා, එසේ හෙයින්, භණ්ඩදෙය්‍යමේවහොති, භණ්ඩදෙය්‍යමවේ. යොපන, යම් මහණෙක් තෙම වනාහි, තථාරූපංභණ්ඩං, එබඳු වූ භාණ්ඩයක්, යථාඨානෙ, තුබූ තන්හි, ඨිතං එව, තුබූනේම, අපටිච්ඡාදෙත්වා, මුවහ නොකොට, ථෙය්‍යචිත්තො, සොර, සිත් ඇත්තේ,

පාදේන, පාදය කරණ කොටගෙන, අක්කමිත්වා, ඇක්ම, කද්දමේවා, මඩෙහි හෝ, වාලුකායවා, වැලි ගොඩෙහි හෝ, පවෙසෙති, ප්‍රවේශ කෙරේද, තස්ස, ඒ මහණාහට, පවෙසිතමත්තෙයෙව, ප්‍රවේශ කළ පමණොක්හිම, අවහාරොහොති, සොරකම වේ (ඒ භාණ්ඩය පයින් ඇක්ම වූ පමණොක්හිම අවහාරය වන්නේ යයි කී නියායි) කුසංසංකාමෙත්වා, තල්පත් හුණපතුරු ආදී කුසපතක් පෙරලා, අවහරණං, සොරකම් කිරිම, කුසාවහාරොනාම, කුසාවහාරය නම් වේ. සොපි, ඒ කුසාවහාරයද, එවං, වෙදිතබ්බො, මෙසේ දතයුත්තේයි, යොභික්ඛු, යම් මහණෙක් තෙම, කතසඤ්ඤාණං, කළ සලකුණු අතුරෙන්, විලීවමයංවා, බට පතුරෙන් කරණ ලද්ද වූ හෝ, තාලපණ්ණමයංවා, තල්පතින් කරණ ලද්ද වූ හෝ, කතසඤ්ඤාණං, කරන ලද සලකුණු අතුරෙන් යංකිංචිකුසං, යම්කිසි කුසපතක්, පාතෙත්වා, හෙලා, විචරෙතාපියමානෙ, සිවුරු බෙදනු ලබන කල්හි අත්තනොකොට්ඨාසස්ස, තමාගේ කොටස්හුගේ, සමීපෙඨිතං, ලග තුබුනා වූ. අප්පග්ඝතරංවා, ස්වල්පයක් අගනා වූ හෝ, මහග්ඝතරංවා, බොහෝ අගනා වූ හෝ, අග්ඝෙනසමසමංවා, අගයෙන් සමසම වූ හෝ, පරස්සකොට්ඨාසං, අනුන්ගේ කොටසක්, හරිතුකාමො, පැහැර ගනු කැමත්තේ, අත්තනොකොට්ඨාසෙ, මෙර මාගේ කොටස්හි, පාතෙතු කාමතාය, හෙලනු කැමැත්තෙන්, උද්දරති, කුසපත උදුරාගණීද, තාවරක්ඛති, ඒ තාක් රක්ෂා කෙරේ, පරස්සකොට්ඨාසෙ, මෙර මා යතු කොටස්හි, පාතිතෙ, හෙල වූ කල්හි, රක්ඛතියේව, රකීමැයි, යදපන, යම් කාලෙක්හි වනාහි, තස්මිං, ඒ (තමාගේ) කුසපත, පාතිතෙ, මෙර මාගේ කොටස්හි දැම්ම වූ කල්හි පරස්ස, මෙරමාගේ, කොට්ඨාසතො, කොටසින් පරස්සකුසං, මෙරමාගේ,කුසපත උද්ධරති, උගුලාගණීද, උද්ධටමත්තෙ, උගුලුවා ගත් මාත්‍රයෙක්හි, අවහාරො හොති, සොරකම වේ. සචෙපන, ඉදින් වනාහි පඨමතරං පලමු කොටම පරකොට්ඨාසතො, අනුන්ගේ කොටසින්, කුසංඋද්ධරති, කුසපත උදුරාද, අත්තනොකොට්ඨාසෙ, තමාගේ කොටස්හි, පාතේතු කාමතාය, හෙලවනු කැමැත්තෙන්, උද්ධාරෙ, උදුරා ගත් කල්හි, රක්ඛතියේව, රකීමැයි, පාතනෙ, තමාගේ කොටස්හි හෙලවීමෙහි, රක්ඛති, රකියි, අත්තනො කොට්ඨාසතෝපන, තමාගේ කොටසින් වනාහි, අත්තනොකුසං, තමාගේ කුසපත, උද්දරතො, උගුළුවන්නා වූ මහණාහට, උද්දරෙයෙව, උගුළුවාගත් කල්හිම, රක්ඛති, රකියි, (එව ශබ්දය කරණ කොටගෙන "පාතනේන

රක්ඛති" යන්න වෙන් කරයි. මේ අව ශබ්දය කරණ කොටගෙන "පාතනේන රක්ඛති" යන පදයෙන් අර්ථ සිද්ධිය වන්නේ නමුදු අර්ථසාධක වශයෙන් ඵලය සම්පූර්ණ වන බව දක්වනු කැමති. අර්ථකථාචාර්යවරයෝ "තංඋද්ධාරෙත්වා" යනාදිය කීහ) තං, ඒ තමාගේ කුසපත. උද්ධාරෙත්වා, උගුළුවා, පරකොට්ඨාසෙ, අන් කොටස්හි, පාතෙන්තස්ස, හෙලවන්නා වූ මහණ හට, හත්ථතොමුත්තමත්තෙ, අතින් මිදුනු මාත්‍රයෙක්හි, අවහාරොහොති, සොරකමවේ. ඉති අයං, මේ වනාහි, කුසාවහාරො, කුසාවහාරය නම් වේ. ඉති ඉමෙහි වචනක්කමෙහි, මෙසේ මෙපමණ වූ ශබ්ද ක්‍රමයෙන්, (පකාසිතො යන්නෙහි සම්බන්ධයි) ආදියෙයපාති පඤ්චවීසතියා අවහාරානං අඤ්ඤතර වසෙන හරෙයපාති, ආදියෙයපාති පෙ හරෙයප යනු, යං වචනං, යම් වචනයක්, අම්හෙහි, අප විසින්, ගෙවත් ධර්මසංගාහක පන්සියයක් මහරහතුන් විසින්, වුත්තං. කියන ලද්දේද, තස්සවචනස්ස, ඒ ශබ්දයාගේ අත්ථො, අර්ථය, පකාසිතො හොතිව, (හොතියෙව) ප්‍රකාශ කරණ ලද්දේම වේ යථාරූපෙති, යථාරූපෙ යනු, යාදිසෙ (යාදිස්සෙ) යම් බඳු වූ ( අදින්නස්ස) යන්නෙහි සම්බන්ධයි. (පාලියෙහි "යථාරූපෙ අදින්නාදනෙ" යන පදයෙහි අදින්නශබ්දයෙහිම සම්බන්ද වේ. ආදන යන්නෙහි සම්බන්ධ නොවේ. කුමක් හෙයින යත්? "යථාරූපංනාම පාදංවා පාදරහංවා" යනාදිය කරණ කොට ගෙන පදභාජනියෙහි වදළ හෙයිනි. මේ "යථාරූපෙයාදිසෙ" යන පදයෝ වනාහි කර්මාර්ථයෙහි ශප්තමී විභක්තියයි.කල්පනා කටයුත්තාහුය) අදින්නාදනෙති, අදින්නාදනෙ යනු, අදින්නස්ස, ස්වාමියා විසින් කයින් හෝ වචනයෙන් හෝ නොදෙන ලද්ද වූ, පරසන්තකස්ස, අන්සතු වස්තුවක්, ගහණෙ, ගැනීමෙහි හෙවත් ගැනීම් හේතුකොට ගෙන, රාජානොති ඉදං, රාජානොයන මේ වචනය, බිම්බිසාරංයෙවසන්ධාය, බිම්සර මහ රජුහු සඳහාම, වුත්තං, වදරණ ලදී. අඤ්ඤෙද්පන, සෙසු රජහු වනාහි, තථා, එපරිද්දෙන්, කරෙයපුංවා. කරන්නාහු නම් හෝ, නකරෙයපුංවා, නොකරන්නාහු නම් හෝ, ඉති (තස්මා) එසේ හෙයින්, තෙ, ඒ රජහු තුමූ, නප්පමාණා, ප්‍රමාණ නොවෙත්, හනෙයපුංවාති, හනෙයපුං වා යනු හත්ථාදීහි වා හස්තාදියෙන් හෝ පොයෙයපුං තලන්නාහුය. සත්ථෙනවා, ශස්ත්‍රයෙන් හෝ, පීන්දෙයපුං, සිඳින්නාහුය. බන්ධෙයපුංවාති, බන්ධෙයපුවා යනු, රජ්ජුබන්ධනාදිහිවා, රැහැන් බැම් ආදියෙන් හෝ බන්ධෙයපුංවා, බඳින්නාහු

හෝ වෙත්, පබ්බාජෙයුංවාති, පබ්බාජෙයුංවා යනු, නිහරෙයුංවා, රටින් නෙරපන්නාහු හෝ වෙත්, ත්වං, හෝ, චොරො අසි, සොරෙහිය, ත්වං, හෝ, බාලො අසි, අඥනයෙහිය, ත්වං, හෝ, මුළ්හො අසි, ජඩ වූයෙහිය, ත්වං, හෝ. ථෙනොඅසි, සඟවන්නෙහිය. ඉති ඉමෙහි වචනෙහි, යන මේ වචනයන් කරණකොටගෙන, පරිභාසෙයුංවා පරිභව කරන්නාහුය. කීදිසස්ස, කෙබඳු ස්වභාවය ඇත්තා වූ, අදින්නස්ස, නුදුන් වස්තුවක්,ආදනෙ, පැහැර ගැණීම හේතුකොටගෙන, රාජානො, රජදරුවෝ තුමූ, ඒවංකරොන්ති, මෙසේ කෙරෙද්ද, පාදස්සවා, පාදයක් හෝ හෙවත් රන්මස්සකින් සතර වෙනි කොටසක් හෝ, පාදරහස්සවා, පාදයක් අගනා වූ හෝ නොහොත් රන්මස්සක්හගේ සතරවෙනි කොටසක් අගනා වස්තුවක් හෝ, ආදනෙ, පැහැර ගැන්මෙහි නොහොත් පැහැර ගැන්ම හේතුකොටගෙන, කරොන්ති, කෙරෙද්ද, (පාදස්ස යන මෙයින් අකැප වූ රන්මසු ආදී භාණ්ඩයද පාදරහස්ස යන පෙදින් පාදයක් අගනා වූ වස්ත්‍රාදී භාණ්ඩය ද ගැණේ. තථාරූපංභික්ඛු අදින්නං ආදිය මානොති, තථා පෙ ආදියමානො යනු, භික්ඛු, මහණ තෙම, තාදිසං, එබඳු ස්වභාවය ඇත්තා වූ, පොරාණස්ස, පුරාතන නීති ග්‍රන්ථයෙහි ආ පරිද්දෙන් උපදවන ලක්ද වූ කහාපණස්ස නීලකහාපණයාගේ, පාදංවා, පාදයක් හෝ, පාදරහංවා, පාදයක් අගනා වූ හෝ ගුම් අදිසු, පැවිච් ආදින් අතුරෙන්, යත්ථකත්ථචි, යම්කිසි තැනෙක්හි, ඨිතං, තුබුනා වූ, යංකඤ්චි, යම්කිසි, සජීවනිජ්ජීවං, සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වූ, අදින්නං, ස්වාමියා විසින් නොදෙන ලද්ද වූ, භණ්ඩං, භාණ්ඩයක්, වුත්තප්පකාරානං, කියන ලද ප්‍රකාර වූ, අවහාරානං, අවහාරයන් අතුරෙන්. යේනකෙනචි, යම්කිසි අවහාරයකින් අවහරනේනා, සොරකම් කරන්නා වූ මහණ තෙම, පාරාජිකාහොති, සස්නයෙන් පැරදුනේ නම් වේ, හෙවත් පාරාජිකාපත්තියට පැමිණියේ වේ. තතො, ඒ පාදයක් අගනා භාණ්ඩයින්, අතිරේ තරස්මිං, අගයෙන් අධික වූ භාණ්ඩයෙක්හි, කොපනවාදෙ, කියනු කවරේද, (භාවය පෞරාණික කහාපණය යන නීතිග්‍රන්ථයෙහි ආනයින් කරණ ලද්ද වූ නීලකහාපණය හා සදෘශ වූ කහාපණයයි. ඒ නීලකහාපණය වනාහි රත්රන් පස් මස්සෙක රිදී පස්මස්සෙක රක්තවර්ණ වූ තඹ දසමස්සෙක යන මේ තුන් කොටස් මිශ්‍රකොට ඒ සියලු බරට පිත්තල බරක් මිශ්‍රකොට කළ කහාපණය නීලකහාපණය නම්. මෙසේ අසාධාරණ විනිශ්චය දක්වා දැන් සාධාරණ විනිශ්චය දක්වනු කැමති

අර්ථකථාචාර්යයීයෝ "රාජගහෙ" යනාදිය කීහ.)

රාජගහෙ, රජගහ නුවර, ධනියත්ථෙරං ආරබ්භ, ධනිය නම් තෙරුන් අරබයා, රඤ්ඤො, රජහුගේ, දරුනි, දැවයන්, අදින්නං, ස්වාමිහු විසින් නොදෙන ලදුව, ආදියන වත්ථු ස්මිං, පැහැර ගන්නා වූ වස්තුවෙහි නොහොත් වස්තුව හේතු කොටගෙන, පඤ්ඤත්තං, පණාවා වදාරණ ලදී. ගාමාවා අරඤ්ඤවාති, ගාමාවා අරඤ්ඤවායන, අයං, මේ ප්‍රඥප්ති තොමෝ, ඒත්ථ, මේ ද්විතීය පාරාජිකා ශික්ෂාපදයෙහි, අනුපඤ්ඤත්ති, අනුප්‍රඥප්තියයි හෙවත් දෙවෙනි පැණවීමයි. සාධාරණ පඤ්ඤත්ති, සාධාරණ ප්‍රඥප්තියයි. සාණත්තිකං, ආණත්තිසහිතවේ. හරණත්තාය, සොරකම් කරනු පිණිස, ගමනාදිකෙ, ගමන් ආදිවූ, පුබ්බපයොගෙ, පූර්ව ප්‍රයෝගයෙහි, දුක්කටං, දුකුලා ඇවත වේ. ආමසනෙ ඇල්ලීමෙහි දුක්කටං දුකුලා ඇවැත වේ. පාරාජිකා වත්ථුනො, පාරාජිකාවට සුදුසු වස්තුවක්, ඵන්දපනෙ, සෙලවීමෙහි හෙවත් සෙලවීම හේතුකොට ගෙන, ථුල්ලච්චයං, ථුලසී ඇවැත වෙයි. මාසකෙවා, මස්සක් අගනා වස්තුවක් හෝ, ඌන මාසකෙ වා මස්සකින් අඩු වූ අගනා වස්තුවක් හෝ ආදියන්නස්ස, පැහැර ගන්නා වූ මහණ හට, දුක්කටංහොති, දුකුලා ඇවැත වේ. අතිරේක මාසකේවා, මස්සකට වැඩි අගනා වස්තුවෙක්හි හෝ, ඌන පඤ්චමාසකෙවා, පස් මස්සකට අඩු වූ වස්තුවෙක් හිහෝ, ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වේ, පඤ්චමාසකේවා, පස්මස්සක් අගනා වස්තුවෙක්හි හෝ, අතිරේක පඤ්චමාසකේවා, පස්මස්සකට වඩා අගනා වස්තුවෙක් හි හෝ පාරාජිකංහොති, පරිජිඇවත වේ. සබ්බත්ථ, සියලු ඌනමාසක ඌන පඤ්චමාසකයෙහි, ගහණකාලවසෙනච, ගන්නා වූ කාලයාගේ වශයෙන් ද, ගහණදෙසවසෙනච, ගන්නා වූ ස්ථානයාගේ වශයෙන්ද, පරිභෝගභාජන පරිවත්තනාදිහි, පරිභොගකිරීම් භාජනපෙරලා ගැනීම් ආදියෙන්, පරිහිනා පරිහිනච සෙනච, අඩු වැඩීම් වශයෙන් ද, විනිච්ඡයො වේදිතබ්බො, විනිශ්චය දත යුත්තේයි. සකසඤ්ඤිස්ස, තමාගේය යන සංඥව ඇත්තා වූ මහණහටද, විස්සාසගාහෙච, මාගේ යහලු භික්ෂුහුගේය යන අදහසින් ගැණීමෙහිද, තාවකාලිකේච, එතකලට ගැනීමෙහිද, පෙතපරිග්ගහෙච, ප්‍රේතයන් විසින් ආරක්ෂා කරන්නා වූ ධනයෙහි ද, තිරච්ඡානගත පරිග්ගහෙච, තිරිසන් ගියවුන් විසින් ආරක්ෂා කරන්නාවූ ධනයෙහි ද, පංසුකුලසඤ්ඤිස්සච, පංශුකුල සංඥා ඇති මහණහටද, උම්මත්තකාදිනංච, උමතු ආදී මහණුන්ටද, අනාපත්ති,

ඇවැත් නොවේ. සීලවිපත්ති, ශීලවිපත්තිය වේ. අඤ්ඤස්ස, මෙයින් අන්‍ය වූ, මනුස්ස ජාතිකස්ස වසෙන, මිනිස් ජාති ඇත්තහුගේ වශයෙන්, පරපරිග්ගහිතං අනුන් සන්තක වස්තුවක් වන බවය. පරපරග්ගහිතසඤ්ඤිතා, අනුන් සන්තකය යන සංඥාව ඇති බවය. ගරුපරික්ඛාරො, පාදයක් අගනා පරිස්කාරයක් වීමය. ථෙය්‍යචිත්තං, සොරසිත් ඇති බවය. වුත්තප්පකාරානං, කියන ලද ප්‍රකාර ඇත්තා වූ, අවහාරානංවසෙන, අවහාරයන්ගේ වශයෙන්, අවහරණංච, සොරකම්කිරීමය, ඉති ඉමානි පඤ්ච, මේ කාරණයෝ පස්දෙන, ඒත්ථ, මේ ශික්ෂා පදයෙහි, අංගානි, අංගයෝ නම් වෙත්, අදින්නාදාන සමට්ඨානං, අදින්නාදාන සමුට්ඨානය ඇත්තේයි, කිරියා, ක්‍රියාවෙන් හට ගත්තේයි. සඤ්ඤාවිමොක්ඛං, සංඥාව නැතිහෙයින් මිදීම ඇත්තේ වෙයි. සචිත්තකං, සචිත්තකය වෙයි. ලෝකවජ්ජං, ලෝකවද්‍යය වෙයි. කායකම්මං, කායද්වාරයෙහි හටගත්තේ වෙයි. වචීකම්මං, වාක්ද්වාරයෙහි හටගත්තේ වේ. අකුසල චිත්තං, අකුසල් සිත් ඇත්තේ වෙයි. තිවෙදනං, තුන් ප්‍රකාර වේදනා ඇත්තේ වෙයි. (සචිත්තක වූ ත්‍රිවිධ සමුට්ඨානයෙන් හටගැනීම අදින්නාදාන සමුට්ඨානයයි දත යුතුයි. කුමක් හෙයින්ද යත්? තමා සියතින් ගන්නා කල්හි කායචිත්ත දෙකින් ද අනුන් ලවා ගන්වන්නා වූ කල්හි වාචාචිත්ත දෙකින්ද බරවූ බඩුවක් තොපිත් අල්වාගණිච් මමත් අල්වා ගණිමියි කියා දෙදෙනෙක් එක්ව සොරකම් කරන කල්හි කායාවාචාචිත්ත යන තුණින් ගන්නේ යයි කීනියායි)

දුතියපාරාජිකං, දෙවෙනි පාරාජිකාපත්තිය, සමත්තං, සම්පූර්ණ කරණ ලදී.

## ද්විතීය පාරාජිකාවයි.

(3) තතියෙ, තුන්වෙනි ශික්ෂා පදයෙහි, සංචිච්චාති, සංචිච්ච යනු, සංචෙතෙත්වා, (සන්ධිංචෙතෙත්වා) එක්ව මෙහෙයා, පාණොතිසඤ්ඤය, සත්වයාය යන සඥාව හා, සන්ධිංයේව, සමගම, නං. ඒ සත්වයා, වධාමි ඉති, මරමියි, වධක චෙතනාය, මරනු කැමති සිත කරණ කොට ගෙන, චෙතෙත්වා, මෙහෙයා, පකප්පෙත්වා, කල්පනාකොට, මනුස්ස විග්ගහන්ති, මනුස්සවිග්ගහං යනු, කලලතොපට්ඨාය, කලල අවස්ථාවෙහි පටන්, ජීවමානක මනුස්ස ජාතික

සරීරං, ජීවිතේන්ද්‍රිය ඇත්තා වූ මනුෂ්‍ය ජාතික ශරීරයක්, ජීවිතාවොරොපෙය්‍යාති, ජීවිතාවොරොපෙය්‍ය යනු, කලලකාලෙපි, කලලඅවස්ථාවෙහිද, තාපනමද්දනෙහිවා, ගින්නෙන් තැවීම් මැඩීම් කරණ කොට ගෙනද, භෙසජ්ජ සම්පදනෙනවා, ගැබ්හෙලන බෙහෙත් දීමෙන් හෝ, තතොඋද්ධංපි, එයින් මත්තෙහි ද, තදනුරූපෙන, ඒ ගැබ් හෙලීමට සුදුසු වූ, උපක්කමෙන, උත්සාහයෙන්, ජීවිතාවියොජෙය්‍ය, ජීවිතෙන්ද්‍රියෙන් පහකෙළේ වී නම් ඉමස්සපනත්තස්ස, මේ අර්ථය, ආවිභාවත්ථං, පහළ කරනු පිණිස, පාණො, සත්වයා, වේදිතබ්බෝ, දතයුත්තේයි. පාණාතිපාතො, සත්වයා ජීවිතේන්ද්‍රියෙන් යුහුසුලුව හෙලීම නොහොත් කඩුදුනු ආදී ආයුධයෙන් හින්සාකොට හෙලීම, වේදිනබ්බො, දතයුත්තේයි. පාණාතිපාති, සත්වයා ජීවිතේන්ද්‍රියෙන් වහා හෙලන්නා වූ, පුද්ගලයා, වේදිතබ්බො, දතයුත්තේයි. පාණාතිපාතස්ස, ප්‍රාණසංඛ්‍යාත ජීවිතේන්ද්‍රිය අතිපාතනයාගේ, පයොගොවේදිතබ්බො, ප්‍රයෝගය දත යුත්තේයි. තත්ථ, ඒ චතුර්විධ කාරණයන් අතුරෙන්, පාණොති, පාණොයනු, වොහාරතො, ව්‍යවහාර වශයෙන්. සත්තො, සත්වයායි, පරමත්ථතො, අවිපරීතාර්ථ වශයෙන්, ජීවිතින්ද්‍රියං, ජීවිතෙන්ද්‍රියයි. පාණාතිපාතොති, පාණාතිපාතො යනු, යායචෙතනාය, යම් චේතනාවක් විසින්, ජීවිතේන්ද්‍රියුපච්ඡේදකපයෝගං, ජීවිතෙන්ද්‍රිය මුල් සිඳිනා ප්‍රයෝගය හෙවත් උත්සාහය, සමුට්ඨාපෙති, හටගන්වාද, සාචේතනා, ඒ චෙතනා තොමෝ, පාණාතිපාතො, පාණාතිපාත නම් වේ. පාණාතිපාතීති, පාණාතිපාති යනු, වුත්තචේතනාය, කියන ලද චේතනාව හා, සමංගිපුග්ගලෝ, සම්පූර්ණ වූ පුද්ගලයායි. පාණාතිපාතස්ස, පයොගොති. පාණාති පාතස්ස පයොගො යනු, පාණාතිපාතස්ස, පාණාතිපාතයාගේ, ඡපයොගහොන්ති, ප්‍රයෝගයෝ සදෙනෙක් වෙති, සාහත්තිකො, සාහත්ථික ප්‍රයෝගයද, නිස්සග්ගියො, නිස්සග්ගිය ප්‍රයෝගයද, ආණත්තිකො, ආණත්තික ප්‍රයෝගයද, ථාවරො, ථාවර ප්‍රයෝගයද, විජ්ජාමයො, විජ්ජාමය ප්‍රයෝගයද, ඉද්ධිමයො, ඉද්ධිමය ප්‍රයෝගයද, ඉතිඉමෙ යන මේ සවැදෑරුම් ප්‍රයෝගයෝයි. තත්ථ, ඒ සවැදෑරුම් ප්‍රයෝගයන් අතුරෙන්, සාහත්ථිකොති, සාහත්ථිකො යනු, සයං, තෙමේ, මාරෙන්තස්ස, මරගන්නාහට, කායෙනවා, කයින් හෝ, (කායේනයනතන්හි හස්තපාදදි සියලු ශරීරාවයවයෝ ගැණෙත්) කායපටිබද්ධෙනවා, කය පිළිබඳ වස්තුවකින් හෝ, පහරණං,

පැහැරීමයි, නිස්සග්ගියොති, නිස්සග්ගියො යනු, දූරෙඨිතං, දුරසිටියක් හු, මාරෙතුකාමතාය, මරවනු කැමැත්තෙන්, කායෙනවා, කයින් හෝ, කායපටිබද්ධෙනවා, කය පිළිබඳ වස්තුවකින් හෝ, උස්සුසත්තියන්තපාසාණාදීනං, දුනුහෙල් යන්ත්‍ර පහන් ආදීන්, නිස්සජ්ජනං, අතින් මුදා හැරීමයි. (ශරීරය කරණ කොටගෙන හෙල්ලයද ශරීරය ප්‍රතිබද්ධවස්තුන් කරණකොට ගෙන දුන යන්ත්‍ර පහන් ද මුදා හරණ්ය.) තත්ථ, ඒකායකාය ප්‍රතිබද්ධයන් අතුරෙන්, එකෙකො, එක එකක් තෙමේ, උද්දිස්සානුද්දිස්සභේදතො, උදෙසාය නොවූ දෙසාය යන ප්‍රභේදයෙන්, දුවිධො, ද්විප්‍රකාර වේ. තත්ථ, ඒ ද්විප්‍රකාරයන් අතුරෙන්, උද්දිස්සකෙ, යමෙකු උදෙසා ආයුධාදිය මුදාහැරීමෙහි, යංඋද්දිස්ස, යමක් හු උදෙසා, පහරති, ප්‍රහාරය කෙරේද, තස්සේව මරණෙන, ඒ පුද්ගලයාගේම මරණය හේතුකොටගෙන, කම්මබද්ධො, කර්මයෙන් බැඳුනේ වේ. යොකොචි, යම් කිසිවෙක් තෙමේ, මරතුති, මැරේවායි, ඒවං, මෙසේ, අනුද්දිස්සකෙ, යමෙකු නොවූදෙසා පැහැරීමෙහි, පහාරපච්චයා, පහරදීම හේතුකොටගෙන, යස්සකස්සචිමරණෙන, යම්කිසිවෙකුගේ මරණය හේතුකොටගෙන, කම්මබද්ධො, කර්මයෙන් බැඳුනේ වේ, උභයත්ථාපිච, මේ දෙතන්හිම, පහරිතමත්තෙවා, පහරදුන් ක්ෂණයෙහි හෝ, මරතු, මැරේවා, පච්ඡාවා, පසුව හෝ, තෙනපයොගෙන, ඒ ප්‍රයෝගය හේතු කොටගෙන, මරතු, මැරේවා, පහරිතමාතේතයෙව, පහරදුන් ක්ෂනයෙහිම, කම්මබද්ධො, කර්මයෙන් බැඳුනේ වේ, ආණත්තිකෝති, ආණත්තිකො යනු, අසුකංනාම, අසවල් නම් තැනැත්තා, මාරෙහිති, මරවයි, අසද්කදංආණාපෙනතස්ස, අනිකෙකු ඇණවන මහණහුගේ, ආණාපනං, ඇණවීමයි, තත්ථ, ඒ ආණත්ති ප්‍රයෝගයෙහි.

**වත්ථු කාලොච ඔකාසො ආයුධං ඉරියාපථො**

**කිරියා විසේසොති ඉමෙ ඡ ආණත්ති නියාමකා**

වත්ථුච, මැරිය යුතු පුද්ගලයාද, කාලෝච, මැරිය යුතු කාලය ද, ඔකාසොච, මැරිය යුතු ස්ථානයද, ආයුධංච, පැහැරිය යුතු ආයුධද, ඉරියාපථොච, ඊයඹීපථයද, කිරියාවිසේසොච ඉති, ක්‍රියා විශේෂයදැයි, ඉමේඡ, මොහු සදෙන, ආණත්ති නියාමකො, ආණත්තිය නියම කරන්නාහු වෙත්.

තත්ථ, ඔවුන් සදෙනා අතුරෙන්, වත්ථුනි, වත්ථු යනු, පුග්ගලො, මැරිය

යුතු පුද්ගලයායි, හි, ඒ එසේ මැයි, යංපුග්ගලං, යම් පුද්ගලයෙකු, මාරේහීති, මරවයි, ආණත්තො, ඇණවුම් ලැබූ පුරුෂ තෙමේ, තමේව, ඒ පුද්ගලයාම, සචෙමාරෙති, ඉදින් මරවාද, ආණාපකස්ස, ඇණවූ මහණාහට, ආපත්ති, ඇවත වෙයි. අඤ්ඤං, අනික් පුද්ගලයෙකු, මාරෙති, මරවාද, තංමඤ්ඤමානොවා, ඔහු යයි සිතනු ලබමින් හෝ අඤ්ඤං මාරෙති, අනෙකෙකු මරවාද, ආණාපකො ඇණවූ මහණ තෙමේ, මුච්චති, ඇවතින් මිදේ. (ආණාපකොමුච්චති යනු කීයේද වස්තුව හා සුදුසු පරිද්දෙන් පවිති වූලයි පරිපියන ඇවතින් මිදේයයි අරුත් ගත යුතුයි. එසේ නොගෙන සර්වාපත්තීන් ගෙන් මිදේ යයි අරුත් නොගත යුතුයි. එහෙයින් දැන් වනාහි "ඉමං" යනාදී පාඨය කීහ. ඉමං, මේ තැනැත්තා, මාරෙහීති, මරවයි, ආණත්තෙපන, ඇණවූ කල්හි වනාහි, නොහොත් ඇණවීම හේතුකොට ගෙන, ආණාපකස්ය, ඇණවූ මහණාහට, දුක්කටංහෝති, දුකුලා ඇවැත වෙයි. කාලොති, කාලො යනු, පුරෙභත්තාදි, පෙරවරු කාලාදියයි. හි, ඒ වචනය යෙදේ මැයි. පුරෙභත්තමේව, පෙරවරු කාලයෙහිම, මාරෙහීති, මරවයි, ආණත්තො, ඇණවුම් ලැබූ පුරුෂ තෙමේ, පුරෙභත්තමේව, පෙරවරු කාලයෙහිම, සචෙමාරෙති, ඉදින් මරවාද, ආණාපකස්ස. ඇණවූ මහණාහට, ආපත්ති, ඇවත වේ, අථ, නොහොත් නොඑසේ වී නම්, යංපුරෙභත්තං. යම් පෙරවරු කාලයක්, නියාමිතං, නියම කරණ ලද්දේ වේද, තතොපච්ඡාවා, ඒ නියමිත කාලයෙන් පසුභාගයෙහි හෝ පුරෙවා, පූර්ව භාගයෙහි හෝ මාරෙති, මරවාද, ආණාපකො, ඇණවූ මහණ තෙමේ, මුච්චති, ඇවනිත් මිදෙයි, ඉමිනානයෙන, මේ නියායෙන් සබ්බත්ථ, සියලු ඔකාසාදී සතර ප්‍රයෝගයන්හි, විනිච්ඡයො, අර්ථ විනිශ්චය, වේදිතබ්බො, දත යුත්තේයි. ("ඉමිනාවනයෙන සබ්බත්ථ විනිච්ඡයො වේදිතබ්බො" යන පාඨයාගේ අභිප්‍රාය මෙසේයි. ගමෙහි වසන කල මරවයි, නියෝග කරනු ලැබූ පුරුෂයෙකු වනයෙහි වසනකල මැරුයේද, එපරිද්දෙන්ම වනයෙහි වසන කල්හි මරවයි, නියෝග කරනු ලැබූව හු ග්‍රාමයෙහිද ගෙහිද ගෙයින් පිටත්හිද මරවයි යනාදිය ඔකාසව් සංකේත නම්. හෙල්ලකින් අණුවයි නියෝග කරනු ලැබූවාහු අනික් ආයුධයකින් මැරීම් ආදියද ආයුධව් සංකේත නම් සිටිනා ඉරියව්වෙහි මරවයි නියෝග කරනු ලැබූවහු හිදිනා ඉරියව්වෙහි මැරීමද දිග හැරී සයනය කරන කල්හි මරවයි. නියෝග කරනු ලැබූවහු යන කල්හි ආදිය ඊර්‍යාපථ විසංකේත යයි කී නිසායි.) ඨාවරොති,

ථාවරො යනු, අසංහාරිමෙන, ඔසවා නොගත හැකි වූ, උපකරණෙන, යම්කිසි උපකරණයකින්, මාරෙතුකාමස්ස, මරවනු කැමැත්තහුගේ, ඔපාතඛණනං, බොරුවල් කැණීමද, අපසේසන සංවිධානං, අපසේසන ඵලකයන් කිරීමද, (අපස්සන ඵලකය යනු පුටු ඇඳි ආදියට බඳු වූ උගුල් හබක් විශේෂයකි) අසි ආදීනං, කඩු ආදිය, උපනික්ඛිපනං, බොරුවල් ආදියෙහි හිඳුවීමද, තලාකාදීසු, විල්පොකුණු ලින් ආදීයෙහි, විසංපයෝජනං, විෂයෙදීමද, රූපූපහාරො, මනාප අමනාප රූපයන් ලගට එළවීමද, ඉතිඑවමාදි, මේ ආදියයි, වුත්තනයේනව, කියන ලද ක්‍රමයෙන්ම, එත්ථාපි, මේ ථාවර ප්‍රයෝගයෙහිද, උද්දිස්සා, නුද්දිස්සභේදෙ, උදෙසා නොඋදෙසා කරණ ප්‍රයෝග භේදය, වේදිතබ්බො, දත යුත්තේයි, වජ්ජාමයොති, විජ්ජාමයො යනු, මරණත්ථං, මරණය පිණිස, විජ් ජාපරිජපනං, මන්ත්‍රපිරුවීමයි. ඉද්ධිමයොති, ඉද්ධිමයො යනු, කම්මවිපාකජාය, කර්මවිපාකයෙන් හටගන්නාවූ ඉද්ධියා, සෘද්ධිය පයෝජනං, යෙදීමයි, සත්ථහාරකංවාස්සපරියෙසෙයහාති ඒත්ථ, සත්ථහාරකං, පෙ, පරියෙසෙය්‍ය, යන මේ පාඨයෙහි, හරතීති, පැහැර ගණ්නුයි, ඉති (තස්මා) එසේ හෙයින්, හාරකං, හාරක නම් වේ. කිං හරති, කුමක් එළවාද, ජීවිතං, ජීවිතේන්ද්‍රිය, හරති, පැහැර ගණී, ජීවිතංහරති, ජීවිතේන්ද්‍රිය පැහැරගණී, අථවා, නොහොත්, හරිතබ්බන්ති, පැහැර ගත යුත්තේ යයි, ඉති, (තස්මා) එසේ හෙයින්, හාරකං, හාරක නම් වේ. උපනික්ඛිපිතබ්බං සමීපයෙහි දැමිය යුතුයි. ඉති අයං අත්ථො, මේ වනාහි අර්ථයි, සත්ථකද්වතං, හිංසාකිරීමට හේතු වූ ශස්ත්‍ර වූයේත් හේමනුයි, හාරකං වාති ජීවිතේන්ද්‍රිය පැහැර ගැනීමෙහි පොහොසත් වූයේත් හේමනුයි. වා, නොහොත් සමීපයෙහි දමන ලද්දේත් වේද, ඉති (තස්මා) එසේ හෙයින්, සත්ථහාරකං, සත්ථහාරක නම් වේ) හාරකසත්ථංයි තිබිය යුතුවද විශේෂණ පරනිපාතන වශයෙන් සත්ථහාරකංයි යෙදේ) අස්සාති, අස්ස යනු, මනුස්සවිග්ගහස්ස, මනුෂ්‍යජාති ඇත්තෙකුගේ, පරියෙසෙයපාති, පරියෙසෙය්‍ය යනු, යථා, යම්සේ හෙවත් යම් ආකාරයකින්, ලභති, ලබද, තථා, ඒ ලභ්‍ය මානාකාරයෙන්, කරෙය්‍ය, කරන්නේ වී නම්, උපනික්ඛිපෙය්‍ය, සමීපයෙහි තබන්නේ වී නම්, ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි, එතේන, මේ පරියෙසෙය්‍ය යන පාඨය කරණකොටගෙන, ථාවරපයෝගදදස්සේති, තහවුරු වූ ප්‍රයෝගය දක්වයි. හී, ඒ එසේ මැයි, ඉතරථා, මෙයින් අන්‍ය වූ

පරියෙසනාර්ථයක් ගත් කල්හි, පරියෙසිතම ත්තේයෙව, සෙවීම් මාත්‍රයෙක් හිම, පාරාජිකො භවෙය්‍ය පරිදි ඇවැතට පැමිණියේ වන්නේය, එතං ඒ පාරාජිකාපත්තියට පැමිණීම, නවයුත්තං, නොයෙදේ මැයි, පදභාජනෙපන, පදභාජනියෙහි වනාහි, අස්ස, ඒ සත්ථහාරකං වාසය පරියෙසෙය්‍ය යන පදයාගේ, බ්‍යඤ්ජනං ශබ්දය, අනාදරිත්වා, ආදර ගෞරව නොකොට, ථාවරප්පයොගෙ, මේ තහවුරු ප්‍රයෝගයෙහි, සංඝහිතං, සංග්‍රහ කරණ ලද්ද වූ, යං සත්ථං අත්ථි, යම් ශාස්ත්‍රයක් ඇත්තේද, තදේව, ඒ ශාස්ත්‍රයම, දස්සෙතුං, දක්වනු පිණිස, අසිංවාති ආදි, අසංවා යනාදිය, වුත්තං, කියන, ලදී. මරණවණ්ණංවා සංවණ්ණෙය්‍යාති, මරණවණ්ණංවාසං වණ්ණෙය්‍ය යනු, වාචායවා, වචනයෙන් හෝ, හාලපණ්ණාදිසු, තල්පත් ආදියෙහි, තිඛිත්වාවා, ලියාහෝ, යො, යමෙක් තෙමේ, ඒවං, මරති, මෙසේ, මැරේද, සො, ඒ පුද්ගල තෙමේ, ධනංවාලභති, වස්තුව හෝ ලබයි, ඉති ආදිනානයෙන, මේ ආදි ක්‍රමයෙන්, මරණෙ, මරණයෙහි, ගුණංපකාසෙය්‍ය, ගුණය පහළ කෙළේ වී නම්, එතෙන, ඒ මරණවණ්ණංවා සංවණ්ණෙය්‍ය යන පාඨය කරණ කොටගෙන, අදින්නාදනෙ, අදින්නාදන ශික්ෂා පදයෙහි, ආදියෙය්‍යාති වුත්තනා. ආදියෙය්‍යයනු වදළ හෙයින්, පරියායකථාය, පරියාය වචනයෙන්, හෙවත් ඒ අර්ථය ඇත්තා වූ අනික් ශබ්දයකින්, මුච්චතියථා, යම්සේ මිදේද, ඒවං, (තථා) උපරිද්දෙන්, ඉධ, මේ මනුස්සවිග්ගහ පාරාජිකාවෙහි, නමුච්චති, නොමිදේ. සංවණ්ණෙය්‍යාති, සංවණ්ණෙය්‍ය යනු, වචනතොපන, වදළ හෙයින් වනාහි, ඉධ, මේ තුන්වන පාරාජිකාවෙහි, පරියායකථායපි, පරියායවචන යෙනිදු, නමුච්චති. නොමිදේ. ඉති අයං අත්ථො, මේ අර්ථය වේදිතබ්බො, දතයුත්තේයි, මරණායවා සමාදපෙය්‍යාති, මරණායවා සමාදපෙය්‍ය යනු, සත්ථංවා, ශාස්ත්‍රයක් හෝ, ආහර, හෙණව, ඉති ආදිනානයෙන, යන මේ ආදි ක්‍රමයෙන්, මරණත්ථාය, මරණුපිණිස, උපායං, හේතුවක්, ගාහාපෙය්‍ය, ගන්වන්නේ වී නම්, එතේන, ඒ මරණායවා සමාදපෙය්‍ය යන පාඨය කරණකොටගෙන, ආණත්තිකපයෝගං, ආණත්තික ප්‍රයෝගය, දසේසති, දක්වයි. අමේහා පුරිසාති ඒතං වචනං, අම්භොපුරිස යන මේ ශබ්දය තෙමේ, ආලපණං, ආමන්ත්‍රණයයි, කිංතුය හිම්නා පාපකෙනාති ආදි, කිංතුයහිම්නා පාපකේන යනාදි ශබ්දය තෙමේ, සංවණ්ණාකාරනිදස්සනං, ස්තුති කටයුතු ආකාරය දක්වන්නාවූ ශබ්දයයි. ඉති

චිත්තමනොති, ඉති චිත්ත මනො යනු, ඉතිචිතේතහනො, මෙසේ මැරේවායි කැමති සිත් ඇතිව, ඉතිමනො, මෙසේ මැරේවායි මෙනෙහි කිරීම් ඇතිව, මතංතෙ ජීවිතා සෙයෙහාති ඒත්ථ, මතංතෙ ජීවිතා සෙයෙහා යන මේ පදයෙහි, වුත්තමරණ චිත්තො කියන ලද්ද වු මරණු කැමති සිත් ඇතිව, වුත්තමරණමනො, කියන ලද්ද වූ මරනු කැමති මෙනෙහි කිරීම් ඇතිව, ඉති අයං, මේ වනාහි, අත්ථො අර්ථයි. (මේ ඉතිචිත්ත මනො යන පදයෙහි, ඉති ශබ්දය තෙමේ "අර්ථිති බො කච්චාන අය මෙකො අනේතා නත්ථිතිබොකච්චාන අයං දුතියෝ අන්තො" යනාදියෙහි මෙන් නිදර්ශනාර්ථයෙහි වැටේයයි දක්වනු කැමතිව මතංතෙජීවිතා සෙයෙහාති ඒත්ථවුත්තමරණ චිත්තො, මරණමනොති අත්ථො යනු කීහ. ආයුෂ්මත් අර්ථකථාචාරීන් වහන්ස, පන ශබ්දය තෙමේද, අර්ථ වශයෙන් චිත්තම නොවන්නේ නොවේද කුමක් හෙයින් ඉතිචිත්තො යනුවෙන් නොකියා ඉතිචිත්තමනොයි කියෙදැයි යන චොදනය සඳහා "ඒත්ථච" යනාදිය කීහ) ඒත්ථච, මේ ඉතිචිත්තම නොයන පදයෙහි, මනොති ඉදං වචනං, මනො යන ශබ්දය, චිත්තස්ස, චිත්ත ශබ්දයාගේ, අත්ථදීපනත්ථං, අර්ථය පහල කරනු පිණිස, වුත්තං, කියන ලදී. තෙනෙව, එහෙයින්ම, අස්ස, ඒ ඉතිචිත්තමනො යන පදයාගේ, පදභාජනෙ, පදභාජනියෙහි, යංචිත්තංතංමනොති, යංචිත්තංතං මනො යනාදිය ආහ, (ආචොව) කීයේය. චිත්තසංකප්පෝ යනු, විචිත්තසංකප්පො, විසිතුරු වු සංඥ චේතනා කල්පණා ඇතිව, ඒත්ථ අපි මේ චිත්ත සංකප්පො යන මේ පදයෙහිද, ඉතිසද්දෙ, ඉති ශබ්දය, ආහරිතබ්බො, එළවිය යුත්තේයි, සංකප්පොතිච ඒතං, සංකප්පො යන මේ නාමය තෙමේ, සංවිධාන මත්තස්ස, පිහිටුවීම් මාත්‍රයක් හුගේ, නාමං, නමකි, විතක්කස්සෙව, විතර්කයාගේම, ននාමං, නාමයක් නොවෙයි, තංචසංවිධානං, ඒ පිහිටුවීමද, ඉමස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි, සඤ්ඤචේතනා ධිප්පායෙහි, සංඥචේතනා විතර්කයන් කරණ කොට ගෙන, සංගහං, සංග්‍රහයට, යස්මාගච්ඡන්ති, යම් හෙයකින් යෙද්ද, තස්මා, එසේ හෙයින්, ඉති චිත්ත සංකප්පොති, ඉති චිත්ත සංකප්පො යනු වේ. මතංතෙ ජීවිතාසෙයෙහාති එත්ථ, මතං, පෙ සෙයෙහා යන මේ පදයෙහි, වුත්ත මරණසඤ්ඤි, කියන ලද මරණු කැමති සංඥ ඇතිව, වුත්තමරණ චේතනො, කියන ලද්ද වු මරණ කැමති සිතිවිලි ඇතිව, වුත්ත මරණාධිප්පායො, කියන ලද්ද වූ මරණු කැමති කල්පණා ඇතිව, ඉති ඒවං, මෙසේ, ඒත්ථ, මේ

චිත්තසංකප්පො යන පදයෙහි, අත්ථොද්ධබ්බො, අර්ථය තෙම දත යුත්තේයි (ආයුෂ්මත් අටුවාචාරීන් වහන්ස චිත්තසංකප්පො යන පදයෙහි ඉති ශබ්දය එළවිය යුතු බව හා සංකප්ප ශබ්දය විසින් සංඥ, චෙතනා විතර්කයන් වාචක වියයුතු බවට ප්‍රත්‍යක්ෂ වශයෙන් දත යුතුදැයි යන චෝදනය සඳහා "පදභාජනෙ" යනාදියකී හ) හි, ඒ එසේ මැයි, පදභාජනෙපි, පදභාජනියෙහිද, අයමෙවත්‍ථො, මෙම ක්‍රමය, දස්සිතො, දක්වන ලදී, ඒතේන, ඒ ඉතිචිත්තනයො, මෙම ක්‍රමය, දස්සිතො, දක්වන ලදී. ඒතේන ඒ ඉතිචිත්ත සංකප්පො යන පාඨය කරණකොටගෙන, මරණ චිත්තාදිහි, මරණු කැමති චිත්තාදින් කෙරෙන්, චිනා, තොරව, දළ්හං, දැඩි කොට, විරියං, වියයීය, ආරභතො, පටන් ගන්නා තැනැත්තා හට, එකාහං, එක් දවසක්, ජීවිතං සෙය්‍යොති, ජිවත් වීම උතුමැයි, ඉති ආදිනානයේන, මේ ආදි ක්‍රමයෙන්, ධම්මං භාසන්තස්ස, ධර්ය දේශනා කරන්නා වු මහණ හට, සංවණ්ණනානාමන හොති, ස්තුති කිරීමක්ද නොවේ. ඉති දස්සෙති, මෙසේ දක්වයි, අනෙක පරියායෙනාති, අනෙක පරියාය යනු, නානාප්පකාරේන, නොයෙක් ප්‍රකාර ඇත්තාවු, උච්චාවචේන, උතුම් වූ ද ලාමක වූද, කාරණේන, කාරණයක් හේතු කොටගෙන, පුන, නැවත, වුත්තං, කියන ලදී. මරණවණ්ණන්ති ආදි, මරණවණ්ණං යනාදී වූ වචනය තෙමේ, නිගමන වචනං, නිගමන වචනයයි. පාරාජිකොහොතීති, පාරාජිකොහොති යනු, කංඛණුප්පන්නං, එකණෙහි උපන්නා වූ, මනුස්ස විග්ගහම්පි, මනුෂ්‍යජාති ඇත්තාවූ ශරීරයක්ද, වුත්තනයේන, කියන ලද ක්‍රමයෙන්, ජීවිතං, වොරොපෙන්තො දිවියෙන් ගලවන්නා වූ මහණ තෙමේ, පරාජිකොහොති, පැරදුනේ වෙයි හෙවත් විනාශ වන ලද්දේ නම් වෙයි. වෙ සාලියං, විසල් මහනුවර, සම්බහුලෙ භික්ඛු, බොහෝ භික්ෂූන්, අරබ්භ, අරභයා, අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්, ජීවිතාවොරොපන වත්ථුස්මිං, දිවියෙන් තෙර කළ වස්තුවෙහි, නොහොත් වස්තුව හේතු කොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. මරණවණ්ණංවාසංවණ්ණෙය්‍යාති අයංපඤ්ඤත්ති, මරණවණ්ණං වාසංවණ්ණෙය්‍ය යන මේ ප්‍රඥප්ති තොමෝ, ඒත්ථ, මේ ශික්ෂාපදයෙහි, අනුපඤ්ඤත්ති, අනුප්‍රඥප්තියයි හෙවත් දෙවෙනි පැණවීමයි, සාධාරණ පඤ්ඤත්ති, සාධාරණ ප්‍රඥප්තියයි, සාණත්තිකං, ආණත්තියෙන් පැමිණවිය යුතු ඇවතයි. මරණත්ථාය, මරණ පිණිස, ඔපාතඛණනාදිසු, බොරුවළ් කැණීම්

ආදියෙහි, දුක්කටං හොති, දුකුලා ඇවතක් වෙයි. අනොදිස්ස, යම් පුද්ගලයෙකු නොවුදෙසා, බතෙ ඔපාතෙ, කණිනා ලද බොරුවලෙහි, යස්සකස්ස විපතනෙපි, යම් කිසිවෙකත්හි මෙහිද, දුක්කටංහොති, දුකුලා ඇවතක් වේ. යක්ඛපෙත තිරච්ඡානගත මනුස්ස විග්ගහානංච, යක්ෂ ප්‍රේත මනුෂ්‍යයන් බඳු වූ තිරිසනුන්ගේද, තිරච්ඡානගතස්සච, තිරිසන් ගියගුගේද, දුක්ඛුප්පත්තියං, දුක් ඉපදීමෙහි හෙවත් දුක් ඉපදීම හේතු කොටගෙන දුක්කටමෙව හොති, දුකුලා ඇවතම වේ. මනුස්සජාතිකස්ස, මනුෂ්‍යජාති ඇත්තෙක් හුගේ, දුක්ඛුස්සත්තියං, දු:ඛොත්පත්තිය හේතුකොටගෙන, ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වෙයි. යක්ඛාදීනං, යක්ෂාදීන්ගේ, මරණෙ, මැරීමෙහි තථා, එපරිද්දෙන්, ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වේ. තිරච්ඡානගත මරණෙපන, තිරිසන් ගියවුන්ගේ මරණය හේතුකොටගෙන වනාහි, පාචිත්තියංහෝති, පචිති ඇවත වෙයි. මනුස්ස මරණෙ, මිනිසුන් මැරීම හේතු කොටගෙන, පාරාජිකං හෝති, පරිජි ඇවත වේ. ඉමිනාවනයෙන, මෙම ක්‍රමයෙන්, සබ්බත්ථ, සියලු ප්‍රයෝගයෙහි, පයොග භේදවසෙන, ප්‍රයෝගයන්ගේ භේද වශයෙන්, ආපත්ති භේදෙ, ආපත්ති විශේෂය, වේදිතබ්බො, දත යුත්තේයි. අසංචිච්ච, මේ උත්සාහයෙන් මරමියි කල්පණා නොකොට, මාරෙන්තස්ස, මරවන්නා වූ මහණ හටද අජානන්තස්සච, මේ උත්සාහය කරණ කොටගෙන, මරණය වන්නේ යයි නොදන්වා වූ මහණහටද, නමරණාධිප්පායස්සච, නොමරවනු කැමති අදහස ඇති මහණහටද, උම්මත්තකාදීනඤ්ච, උමතු මහනනුන් ආදීන්ටද අනාපත්ති, ඇවත නොවේ, තත්ථ අසංචිච්ච යනාදි පදයන් අතුරෙන්, අසංචිච්චාති, අසංචිච්ච යනු, ඉමිනාඋපක්කමේන, මේ උපක්‍රමයෙන්, හෙවත් මේ උත්සාහයෙන්, ඉමංමාරෙමීති, මොහු මරවමියි, අචෙතෙත්වා, කල්පණා නොකොට, කතේන උපක්කමේන, කරණලද්ද වූ උපක්‍රමයෙන්, මුසලුස්සාපන වත්ථුස්මිං විය. මොහොල එසවූ වස්තුවෙහි මෙන්, පරෙ, අන්‍යයෙක්, මතෙපි, මළ කල්හිද, අනාපත්ති, ඇවත නොවේ. අජානන්තස්සාති, අජානන්තස්සය යනු, ඉමිනා, මේ උත්සාහයෙන්, අයංමරිස්සතීති, මෙතෙම මැරෙන්නේ යයි, අජානන්තස්ස, නොදන්නා වූ මහණ හට, උපක්කමේන, උපක්‍රම හේතුවෙන්, විසගත පිණ්ඩපාත වත්ථුස්මිංවිය, විෂ මිශ්‍ර පිණ්ඩපාත පිළිගැන්වූ වස්තුවෙහි මෙන්, පරෙමතේපි, අනිකෙක් මළ කල්හිද, අනාපත්ති, ඇවත නොවේ. නමරණාධිප්පායස්සාති,

නමරණාධිප්පායස්ස යනු, මරණං අනිච්ඡන්තස්ස, මරණය නොකැමති මහණා හට, උපක්කමේන, උපක්‍රම හේතුවෙන්, භෙසජ්ජවත්ථුස්මිංවිය, බෙහෙත් පිළියම් කළ කථාවස්තුවෙහි මෙන්, පරෙමනෙපි, අනිකෙක් මළ කල්හිද, අනාපත්ති, ඇවත නොවේ. ඒවං, මෙසේ, අසංචිච්චාදීසු, අසංචිච්ච යනාදි පදයන්හි. විනිච්ඡයො වේදිතබ්බො, අර්ථ විනිශ්චය දත යුත්තේයි. සීලවිපත්ති, ශීලවිපත්තියයි. මනුස්ස ජාතිකපාණො, මනුෂ්‍යජාති ඇත්තා වූ සත්වයෙක් වීමය. පාණසඤ්ඤිතා සත්වයෙක යන සංඥ ඇති බවය (මේ පාණ සඤ්ඤිතා යන පාඨය කරන කොට ගෙන මනුෂ්‍යයෙක්ය යන සංඥ ඇත්තේවේද සත්වයෙක යන සංඥ ඇතිව මනුෂ්‍යය ජාතියෙකු මැරූ කල්හි පාරාජිකාපත්තියට පැමිණෙය යනු ප්‍රකාශ කෙරේ. මේ අර්ථය ළළකවතුෂ්කාදියෙන් දත යුතුයි) වධකචිත්තං, මරණු කැමති සිත් ඇති බවය. උපක්කමො, මරණයට සුදුසු වූ උපක්‍රම කිරීමය. තෙනමරණං, ඒ උපක්‍රමයෙන් මරණය සිද්ධ වීමය. ඉති ඉමානිපඤ්ච, මේ කාරණායෝ පස්දෙන තුමූ, එත්ථ, මේ මනුෂ්‍ය විග්‍රහ ශික්ෂාපදයෙහි, අංගානි, අංගයෝයි. අදින්නාදන සමුට්ඨානං, අදින්නාදන සමුට්ඨානය ඇත්තේයි. කිරියා, ක්‍රියාවෙන් හටගත්තේයි. සඤ්ඤාවිමොක්ඛං, මරණු කැමති සිත් නැත්තෙන් ඇවතින් මිදෙන්නේ වෙයි. සචිත්තකං චිත්තය හා සමග හටගන්නේයි. ලෝකවජ්ජං, ලෝකයෙහිද වරද යයි සම්මත කරණ ලද්දේයි, කායකම්මං, කායද්වාරයෙහි හටගණියි, වචීකම්මං, වචීද්වාරයෙහි හටගණියි. අකුසල චිත්තං, ද්වේෂමූලික අකුශල චිත්තය ඇත්තේයි. දුක්ඛ වේදනං, දුක් වේදනා නොහොත් දෙම්නස් වේදනා ඇත්තේ වෙයි.

තතියපාරාජිකං තුන්වෙනි පාරාජිකාපත්තිය, සමත්තං, සම්පූර්ණ කරණ ලදී.

## තෘතිය පාරාජිකාවයි.

(4) චතුත්ථෙ, සතරවෙනි ශික්ෂාපදයෙහි, අනභිජානන්ති, අනභිජානං යනු සකසන්තානෙ, තමාගේ සතන්හි, අනුප්පන්නත්තා, නූපන් බැවින්, අත්තනි, තමා කෙරෙහි, අත්ථිභාවං, විද්‍යාමාන බව, අජානන්තො, නොදන්නේ, උත්තරි

මනුස්ස ධම්මන්ති. උත්තරිමනුස්ස ධම්මං යනු, පක්ති මනුස්සෙහි, ප්‍රකෘති මනුෂ්‍යයන් විසින්, (මෙහි අපාදන බහුවචනය ගත යුතු කල්හි ප්‍රකෘති මනුෂ්‍යයන් කෙරෙන් යැයි අර්ථ කියනු) උත්තරි මනුස්සානං, උතුම් මනුෂ්‍ය වූ, ඣායීනංචෙව, ධ්‍යාන ලාභීන්ගේද, අරියානඤ්ච, ආර්‍ය්‍යයන්ගේද, ධම්මං, ධර්මයකි. අත්තූපනායිකන්ති, අත්තූපනායිකං යනු, මයි, මා කෙරෙහි, එසො, මේ උත්තරිමනුෂ්‍ය ධර්මය තෙමේ, අත්ථි ඇත්තේයි. ඉති සමුදචරන්තො, මෙසේ කියන්නේ, අත්තනි, තමා කෙරෙහි, තං .ඒ උත්තරි මනුෂ්‍ය ධර්මය, උපනෙති, එළවයි, වා, නොහොත්, අහං, මම, ඒත්ථ, මේ උත්තරිමනුෂ්‍ය ධර්මයෙහි, සන්දිස්සාමි ඉති, දක්නා ලැබෙමියි, ඉති සමුදචරන්තො, මෙසේ කියන්නේ, අත්තානං, තමා, තත්ථ, ඒ උත්තරි මනුෂ්‍ය ධර්මයෙහි, උපනෙති, එලවයි, ඉති (තස්මා) එසේ හෙයින්, අත්තූපනායිකො, අත්තූපනායික නම් වේ. නොහොත් උත්තරි මනුෂ්‍ය ධර්මය තමාකෙරෙහි එළවන්නේ නම් වේ. තං අත්තූපනායිකං, ඒ තමාකෙරෙහි උත්තරි මනුෂ්‍ය ධර්මය එළවන්නා වූ පුද්ගලයා, වා, නොහොත උත්තරි මනුෂ්‍ය ධර්මයයෙහි තමා එළවන්නා වූ ඒ පුද්ගලයා, ඒවං කත්වා, මෙසේ එළවීම කොට, සමුදචරෙය්‍ය, කියන්නේ වී නම්, ඉති අයං, මේ වනාහී, සම්බන්ධො, පද සම්බන්ධයි. අලමරිය ඤාණදස්සනන්ති එත්ථ, අලමරියඤාණදස්සනං යන මේ පදයෙහි, මහග්ගත ලොකුත්තර පඤ්ඤා, මහද්ගතලෝකෝත්තර ප්‍රඥා තොමෝ, ජානනත්ථේන, දැනගන්නා අර්ථයෙන්, ඤාණං, ඤාණ නම් වේ. චක්ඛුනා, චක්ෂුර් විඥානය කරණ කොටගෙන, රූපං භූතො පාදය භේද භින්නවූ රූපය (රූපං යනු කර්මකාරකය පිණිස ගැණේ) දිට්ඨං ඉව, දක්නා ලද්දක් මෙන්, ධම්මං, ධර්මය, පච්චක්ඛකරණතො, ප්‍රත්‍යක්ෂකරණ හෙයින් හෙවත් ඇස් හමුකරණ හෙයින්, දස්සනත්ථේන, දක්නා අර්තයෙන්, දස්සනං, දස්සන නම් වේ. ඉති (තස්මා) එසේ හෙයින්, ඤාණ දස්සනං, ඤාණදස්සන නම් වේ. අරියං, නිර්දෝෂ වූ, විසුද්ධං, විශේෂයෙන් පිරිසිදු වූ, උත්තමං, උතුම් වූ, ඤාණ දස්සනං, ඤාණසංඛ්‍යාත වූ දැකීමයි. ඉති (තස්මා) එසේ හෙයින්. අරිය ඤාණ දස්සනං, අරිය ඤාණ දස්සන නම් වේ. අලංපරියත්තං කිලෙස විද්ධංසනස මත්තං කෙලෙසුන් විනාශ කිරීමෙහි පොහොසත් වූ අරිය ඤාණ දස්සනං, උතුම් වූ ඥානයෙන් දැකීම, ඣානාදිභේදෙ, ධ්‍යානාදිප්‍රභේද ඇත්ත වූ, ඒත්ථ උත්තරි මනුස්ස ධම්මෙ, මේ උතුරු මිනිස් දම්හි, අත්ථි ඇත්තේ ද, වා,

නොහොත්, අස්ස, ඒ උත්තරිමනුෂ්‍ය ධර්මයට, අලං, කෙලෙස්, නැසීමෙහි පොහොසත් වූ, අරියඤාණදස්සනං, උතුම් වූ නුවණින් දැකීම, අත්ථි ඇත්තේද, ඉති (තස්මා) එසේ හෙයින්, අලමරියඤාණදස්සනො, අලමරිය ඤාණදස්සන නම් වේ. තංඅලමරියඤාණ දස්සනං, ඒ කෙලෙස් නැසීමෙහි පොහොසත් වු උතුම් නැණින් බැලීම ඇත්තා වූ ධ්‍යානාදී උත්තරි මනුෂ්‍ය ධර්මය, සමුදාචරෙය්‍යාති, සමුදාචරෙය්‍ය යනු, වුත්තප්පකාරං, කියන ලද ප්‍රකාර ඇත්තාවූ, ඒතං උත්තරි මනුස්ස ධම්මං, ඒ උත්තරි මනුෂ්‍ය ධර්මය, අත්තුපනායිකං කත්වා, තමාකෙරෙහි එලවීම කොට, කායේනවා, කයින් හෝ, වාචායවා, වචනයෙන් හෝ තදුභයේනවා, ඒ කායවාක් දෙකින් හෝ, විඤ්ඤුස්ස, පණ්ඩිත බවට පැමිණියා වූ නොහොත් කාරණා කාරණා දන්නා වූ, මනුස්ස ජාතිකස්ස, මිනිස් දෑ ඇත්තෙක් හට, ආරොචෙය්‍ය, අස්වන්නේ නම්, ඉතිජානාමි ඉතිපස්සාමිති එතං, ඉති පෙ පස්සාමි යන මේ වාක්‍යය තෙමේ, සමුදාචරණාකාර දස්සනං, කියන අයුරු දැක්වීමයි. අත්තුපනායිකං කත්වා, තමාකෙරෙහි, එලවීම කොට, අඤ්ඤපදෙසෙනවිනා, අනුන් දැක්වීමෙන් තොරව, සමුදාචරන්තො, කියන්නේ, ඒවං, මෙසේ, හි (යස්මා) යම් හෙයකින්. සමුදාචරති, කියාද, තස්මා, එසේ හෙයින්, පදභාජනෙ, පදභාජනියෙහි, පඨමජ්ඣානං සමාපජ්ජිං සමාපජ්ජාමි, සමාපන්නොති ආදි, පඨමජ්ඣා නං පෙ සමාපන්නො යනාදී වූ යො අයංපනපභෙදෙ වුත්තො, යම් ප්‍රභේදයක් කියන ලද්දේද සොසබ්බො, ඒ සියල්ල තෙම, ඉධ එව, මේ ඉති ජානාමි ඉතිපස්සාමි යන පෙදෙහිම, සංඝහංගච්ඡති, සංග්‍රහයට යෙයි, ඉති වේදිතබ්බො, මෙසේ දතයුත්තේයි, හි (කස්මා) කුමක් හෙයින්, ඉතිජානාමි ඉතිපස්සාමිති වදන්තො, ඉතිජානාමි ඉතිපස්සාමි යනු කියන්නා වූ මහණ තෙමේ, ඉදංවචන මත්තමේව, මේ වචන මාත්‍රයම, නවදති, නොකියයි, අථඛො, ඒකාන්තයෙන් වනාහි, ඉමිනාව ඉමිනාවකාරනෙන, මේ මේ හේතුවෙන්, අයංධම්මො, මේ ධ්‍යාන මාර්ග ඵලාදිවූ ධර්මය තෙමේ, මයි අත්ථිදිපෙති, මා කෙරෙහි ඇතැයි ප්‍රකාශ කෙරේ, හි, ඒ වචනය යෙදේ මැයි, සමාපජ්ජින්ති ආදිනි සමාපජ්ජිං යනාදී වචනයන් වදන් නොහ කියන්නානවූ මහණානු විසින් සමාපජ්ජනාදීහි, සමවැදීම් ආදී වූ, කාරනෙහි, කාරණයන් හේතු කොටගෙන, අත්ථිතා, විද්‍යාමාන බව, දීපිතාහොති, ප්‍රකාශ කරණ ලද්දී වේ, තෙනා එහෙයින් යායං පද භාජන පඨමජ්ඣානං සමාපජ්ජිං සමාපජ්ජාමි සමාපන්නොති ආදිභේදේ

වුත්තොසො සබ්බො ඉධෙවසංඝහං ගච්ඡන්ති, යථායං පෙ ගච්ඡතියන වචනය, අම්හෙහි, අප විසින්, වුත්තං, කියන ලද්දේයි.

තතොඅපරෙන සමයෙනාති, තතොඅපරෙන සමයෙන යනු, තතො ආරොචිත කාලතො, ඒ ඇස් වූ කාලයෙන්. අඤ්ඤතරස්මිං කාලෙ, එක්තරා කාලයෙක්හි, ඉතිඑතං, මේ තතො අපරෙන සමයෙන යන වාක්‍යය තෙමේ, ආපත්ති පටිජානනකාල දස්සනං, ඇවත පිළිගන්නා කාලය බැලීමයි. අයංපන භික්ඛු, මේ මහණ තෙමේ වනාහි, ආරොචිතක්ඛණෙයෙව, ඇස් වූ ක්ෂණයෙහිම, ආපත්තිං ආපජ්ජති, ඇවතට අවදනේයි, ආපත්තිංපන, ඇවතට වනාහි, ආපන්නො, අවන් මහණ තෙමේ, යස්මා, යම් හෙයකින්, පරෙන, මෙර මා විසින්, චොදිතොවා, චෝදනා කරණු ලැබුයේ හෝ අචොදිතොවා, චෝදනා නොකරණු ලැබුයේ හෝ හෙවත් නොවිචාරණු ලැබූයේ හෝ පටිජානාති, ප්‍රතිඥකෙරේද, තස්මා, එහෙයින්, සමනුග්ගාහිය මානොවා අසමනුග්ගාහිය මානොවා ඉති, සමනුග්ගාහිය මානො පෙ වායනු, වුත්තං, කියන ලද්දේයි, ආපන්නෙනති, ආපන්නො යනු, ආරෝචිතක්ඛණෙයෙව, ඇස් වූ ක්ෂණයෙහි, පාරාජිකං, පාරාජිකාපත්තියට, ආපන්නො, අවන් මහණ තෙමේ, විසුද්ධාපෙක්ඛොති, විසුද්ධාපෙක්ඛො යනු, අත්තනො, තමාගේ, ගිහි භාවාදිකං විසුද්ධිං, ගිහි බැව් ආදී විශුද්ධිය, අපෙක්ඛමානො, අපේක්ෂා කරනුයේ, ඉච්ඡමානො, කැමති වූයේ, හි, ඒ එසේ මැයි, අයං භික්ඛු, මේ මහණ තෙමේ, යස්මා, යම්හෙයකින්, පාරාජිකං ආපන්නො, පරිජි ඇවතට පැමිණියේ වේද, තස්මා, එසේ හෙයින්, භික්ඛුභාවෙඨත්වා, භික්ෂුභාවයෙහි සිටගෙන, ඣානාදීනි, ධ්‍යානාදීන් අධිගන්තුං, ලබන පිණිස, අභබ්බො, නුසුදුසු වෙයි. ඉති (තස්මා) එසේ හෙයින් අස්ස, ඒ මහණහට, භික්ඛුභාවො, භික්ෂුභාවය තෙමේ, විසුද්ධිනාමන හොති, පිරිසිදු බවෙක් නම් නොවෙයි. යස්මාපන, යම් හෙයකින් වනාහි, ගිහිවා, ගිහියෙක් හෝ, උපාසකාරාමික සාමණේරානංවා, උපාසකය අරාමිකය සාමණේරය යන මොවුන් අතුරෙන් හෝ, අඤ්ඤතරොහුත්වා, එක්තරා එකෙක් වී, දානාදීහි දන්දීම් ආදීන් කරණ කොටගෙණ සග්ගමග්ගංවා, ස්වර්ගමාර්ගය හෝ ඣානාදීහි, ධ්‍යානාදීන් කරණ කොටගෙන, මොක්ඛමග්ගංවා, නිවන් මග හෝ ආරාධෙතුං, සිද්ධකරණු පිණිස, භබ්බො හොති, යෝග්‍ය වෙයි, තස්මා, එසේ හෙයින්. තස්ස, ඒ මහණ හට, ගිහි ආදිභාවො, ගෘහස්තාදිභාවය, විසුද්ධිනාමහොති, පිරිසිදු

බව නම් වෙයි. තේන, එහෙයින්, ගිහිභාවාදිකං විසුද්ධිං අපෙක්ඛමානොති, ගිහිභාවාදිකං විසුද්ධිං අපේක්ඛමානො යනු, වුත්තං, කියන ලද්දේයි, ඒවං වදෙය්‍යාති, ඒවං දෙය්‍ය යනු, ඒවංභණෙය්‍ය, මෙසේ කියන්නේ වී නම්, කථංභණෙය්‍ය, කෙසේ කියන්නේද යත්, අජානමේවං ආවුසොති ආදිං, අජානමේවං ආවුසො යනාදිය, වදෙය්‍ය, කියන්නේයි, (මේ අජානමේවං යන පාඨයෙහි ඒවං ශබ්දය "ඒවංජානාමි ඒවංපස්සාමි" යනුවෙන් යෙදිය යුත්තේයි. අජානමෙවංයන පාඨයද බොහෝ පුරාණ පොත්හි දක්නා ලැබෙයි. සමහරුන්ගේ මතය අජානමේව යයි විය යුතුය යනුයි. අජාන මේවයයි විය යුතු නම් නොදනිමින් මයයි අවධාරණාර්ථය වෙයි. මේ ස්ථානය කල්පනා කටයුතුයි) තත්ථ වචනෙ, ඒ වචනයෙහි, අජානන්ති, අජානං යනු, අජානන්තො, නොදන්නේ, අපස්සන්ති, අපස්සං යනු, අපස්සන්තො, නොදක්නේ තුච්ඡං මුසාවිලපින්ති, තුච්ඡං මුසාවිලපිං යනු, අහං, මම, වචනත්ථ විරහිතො, සබ්දර්ථයෙන් වෙන් වූ හෙයින්, තුච්ඡං, හිස්වූ, වඤ්චනාධිප්පායතො, රවටනු කැමති හෙයින්, මුසාවිලපිං, බොරුවක් කිවෙමි. අභණිං, බොරුවක් බිණුවෙමි. ඉති අයං අධිප්පායො, යන මේ අභිප්‍රාය, වුත්තං (මුත්තො) හොති, කියන ලද්දේ වෙයි. අඤ්ඤත්‍ර අධිමානාති, අඤ්ඤත්‍ර අධිමානා යනු, තිලක්ඛණං ආරෝපෙත්වා, ලක්ෂණත්‍රයට නගා, සංඛාරෙ, සංස්කාර ධර්මයන්, සම්මසන්තස්ස, සම්මර්ශනය කරන්නාවූ, ආරද්ධවිපස්සකස්ස, පටන් ගන්නා ලද විදර්ශනා ඇත්තා වූ මහණහට, අප්පත්තෙ, නොපැමිණි කල්හි හෙවත් මාර්ගාධිමාර්ගමයට අප්‍රාප්ත කල්හි, පත්තසඤ්ඤිතාසංඛාතො, පැමිණියෙමි යන සංඥ භාව සංඛ්‍යාත වූ, ය්වායං අධිමානො, යම් අධිමානයක් තෙමේ, උප්පජ්ජති, උපදනේද, තංඅධිමානංඨපෙත්වා, ඒ අධිමානය තබා, කේවලං, හුදෙක් පාපිච්ඡතාය, ලාමක අදහස් ඇති බැවින්, යො භික්ඛු යම් මහණෙක් තෙමේ, සමුදාචාරෙය්‍ය කියන්නේ වී නම්, අයට භික්ඛු, මේ මහණ පාරාජිකොහොති, කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ වෙයි. ඉතිඅයං, මේ වනාහි, අත්ථො. අර්ථයි.

වෙසාලියං, විසල් මහනුවර, වග්ගුමුදතිරියෙ, වග්ගුමුද නම් ගංගාව සමීපයෙහි, භික්ඛුආරම්භ, භික්ෂූන් අරභයා, තේසං භික්ඛූනං, ඒ භික්ෂූන්ගේ උත්තරි මනුස්ස ධම්මාරොචන වත්ථුස්මිං, උතුරු මිනිස් දම් ඇස්වීම් වස්තුවෙහි හෙවත් වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලද්දේයි, අඤ්ඤත්‍ර

අධිමානාති අයං පඤ්ඤත්ති. අඤ්ඤත්‍රඅධිමානා යන මේ ප්‍රඥප්ති තොමෝ. ජත්ථ මේ සතර වෙනි ශික්ෂාපදයෙහි, අනුපඤ්ඤත්ති, දෙවෙනි පැණවීමයි. සාධාරණ පඤ්ඤත්ති, භික්ෂු භික්ෂුණී උභය පක්ෂයට සාධාරණ ප්‍රඥප්තියයි. ආණත්තිකං, ආණත්තික ශික්ෂා පදයයි. පඨමංඣානං සමාපජ්ජින්ති ආදිනානයේන, පඨමංඣානංසම පජ්ජිං යනාදි ක්‍රමයෙන් වුත්තප්පකාරං, කියන ලද ප්‍රකාර ඇත්තා වූ, අසන්තං, තමා කෙරෙහි අවිද්‍යමාන වූ, ඣානාදිධම්මං, ධ්‍යානාදි ධර්මය, ආරෝචෙන්තස්ස, අස්වන්නා වූ මහණ හට, පාරාජිකං යන්නෙහි සම්බන්ධයි. යස්සකස්සචි, අනියමිත වූ යම්කිසිවෙකු හට, ආරොචෙති, අස්වාද, සො, ඒ අසන ලද පුද්ගල තෙමේ, මනුස්සජාති කොසචෙහොති, ඉදින් මනුෂ්‍යජාතිකයෙක් වේද, අනන්තර මේව, ඒ ඇස්වීමට අනතුරුවම, අයං, මේ මහණ තෙමේ, ඣානලාභී ඉතිවා, ධ්‍යානලාභී භික්ෂුවකැයි කියාහෝ. අරියො ඉතිමා, ආයඹියෙකැයි කියා හෝයේනකෙනචි ආකාරේන, යම්කිසි හේතුවකින් තමත්ථං, ඒ අර්ථය සචෙජානාති, ඉදි දනී නම්,.පාරාජිකංහොති, පරිජි ඇවත වේ, සචෙනජානාති, ඉදින් නොදනී නම්, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවත වේ. සචේපන, ඉදින් වනාහි, යො, යම් මහණෙක් තෙමේ, තෙ, (උම්බාදයකය) තාගේ, විහාරෙ,වෙහෙරෙහි වසති. වෙසේද, සෝ භික්ඛු, ඒ මහණ තෙමේ, පඨමංඣානං, ප්‍රථමධ්‍යානයට, සමාපජ්ජි, සමවදනේය, ඉති ආදිනානයේන, මේ ආදි ක්‍රමයෙන්, අඤ්ඤපදෙසෙන, අනුන් අපදිසනය කෙරෙමින් හෙවත් අනුන් දක්වමින්, ආරොචෙන්තස්ස, අස්වන්නා වු මහණහට, සචේනජානාති, ඉදින් දනී නම්, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවත වෙයි. සචේනජානාති, ඉදින් නොදනී නම්, දුක්කටං හොති, දුකුලා ඇවත වේ. අධිමානේන, අධිමානය කරණකොටගෙන, ආරොචෙන්තස්සච, අස්වන්නාවු මහණ හටද, අනුල්ලපනාධිප්පායස්සච, උසස් කොට කියනු කැමැත්තක් ඇති මහණහට, උම්මත්තකාදිනඤ්ච, උමතු භික්ෂුන් ආදීන්ටද, අනාපත්ති, ඇවත නොවේ. සීලවිපත්ති, ශීලවිපත්තියයි. හෙවත් ශීල විනාශයයි. උත්තරිමනුස්සධම්මස්ස, උත්තරිමනුෂ්‍ය ධර්මයාගේ, අත්තනි, තමා කෙරෙහි, අසන්තතා, අවිද්‍යමාන බව, පාපිච්ඡතාය, ලාමක අදහස් ඇති බැවින්, තස්ස, ඒ උත්තරිමනුෂ්‍යධර්මය, අරෝචනං, ඇස්වීමය, අනඤ්ඤපදේසො, අනිකෙකු නොදැක්වීමය. යස්ස, යමෙක් හට, ආරොචෙති, අස්වාද, තස්ස ඔහුගේ, මනුස්සජාතිකතා, මනුෂ්‍යජාති ඇති බවය. තංඛණංවිජානනං, එකණෙහි දැන

ගැන්මය. ඉති ඉමානි පඤ්ච, යන මේ පස්දෙන, ඒත්ථ, මේ සතරවෙනි පාරාජිකා ශික්ෂාපදයෙහි, අංගානි, අංගයෝයි, සමුද්ධානාදීනි, සමුද්ධානාදීහු තුමූ, අදින්නාදනෙ, අදින්නාදන ශික්ෂාපදයෙහි, වුත්ත සදිසානිඑව, කියන ලද්දට සදෘශයෝම වෙති.

චතුත්ථපාරාජිකං, සතරවෙනි පාරාජිකාපත්තිය, සමත්තං, සම්පූර්ණ වූයේයි.

## සතරවෙනි පාරාජිකාවයි.

උද්දිද්ධාඛො ආයසම්නේතා චත්තා රොපාරාජිකාධම්මානි ඉදංවචනං, උද්දිට්ඨා පෙ පාරාජිකා ධම්මා යන මේ වචනය තෙමේ, ඉධ, මේ භික්ෂුප්‍රාතිමෝක්ෂයෙහි, උද්දිට්ඨාපාරාජික පරිදීපනමෙව, දක්වන ලද මේ පාරාජිකාවන්ම ප්‍රකාශකරණ පාඨයකි. (ආයුෂ්මත් අර්ථකථාචාර්ය්‍යන් වහන්සේ "උද්දිට්ඨාඛො ආයස්මන්තො" යනාදී වාක්‍යය තෙමේ මේ භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දක්වන ලද්ද වූ පාරාජිකාවන්ම ප්‍රකාශ කරන්නා වූ වාක්‍යකැයි ඒව ශබ්දය සමග කියෙහිය. මෙයින් අන්‍ය වූ පාරාජිකාවක් අවිශිස්ටව ඇති බව කියයුත්තේ දැය යන චෝද්‍යය සඳහා "සමොධානෙත්වා" යනාදිය කිහ) සබ්බානේව, සියලුම (ඒ ග්‍රන්ථයෙහි ආවාවූ) පාරාජිකාවන් සමොධානෙත්වාපන, එක්කොට වනාහි, චතුවීසති පාරාජිකානි, සවිසි පාරාජිකා කෙනෙක්, වේදිතබ්බානි, දතයුත්තාහ. චතුවීසති, සූවිසි ප්‍රභේද වූ පාරාජිකාවෝ තුමූ, කතමානි, කවරහුද යත්, පළියංආගතානි, පෙළෙහි ආවාවූ පාරාජිකාවෝ තුමූ, තාව, පළමුකොට, භිකඛූනං, භික්ෂූන්ගේ, චත්තාරි, සතර දෙනෙක්ද, භික්ඛුනීනං, භික්ෂුණීන්ගේ, භික්ඛුභී අසාධාරණානි, භික්ෂූන් හා සාධාරණ නොවන්නාවූ, චත්තාරීති, පාරාජිකවෝ සතර දෙනෙක්ද දැයි, ඉමෙ අඩ, මොහු අට දෙනෙක් වෙති, භික්ෂූන් හා සාධාරණ නොවූ පාරාජිකාවෝ සතර දෙන යනු උබ්භජානුමණ්ඩලිකා, වජ්ජපටිච්ඡාදිකා, උක්ඛිත්තානුවත්තිකා, අංග වත්ථුකා, යන මේ සතර දෙන වෙති. මේ ආපත්තීන් සතර දෙන අතුරෙන් උබ්භජානුමණ්ඩලිකායනු යම් භික්ෂුණියක් තොමෝ කාය සංසර්ගරාගයෙන් විපරිත සිත් ඇත්තියක්ව කායසංසර්ග රාගයෙන්

විපරීත සිත් ඇත්තා වූ පුරුෂයෙකුගේ ගලවලුයෙන් යට දනමඩලින් මත්තෙහි යම්කිසි ශරීරාංගයක් ස්පර්ශ කිරීම ඉවසා නම් ඔතොමෝ පරිජි ඇවතට පැමිණෝ. මෙසේ මේ ආපත්තිය උබ්භජානුමණ්ඩලිකා නම්. යම් භික්ෂුණියක් තොමෝ අන්‍ය භික්ෂුණියක් හුගේ පාරාජිකාපත්තියට සුදුසු වූ වරද ප්‍රතිච්ජාන්න කරන්නී වේද ඒ භික්ෂුනී තොමෝ වජ්ජපටිච්ජාදිකා නම් වන්නිය. සමගි සංඝයා විසින් උක්ෂේපනීය කර්මයෙන් නෙරපන ලද්ද වූ භික්ෂුවක් හට යම් භික්ෂුණියක් තොමෝ අනුවර්තක වේද ඒ භික්ෂුණියට සෙසු මෙහෙණින්නන් විසින් ආයතීාවෙනි මේ භික්ෂුවට වනාහි සංඝයා විසින් ධර්ම කර්මයෙන් සුදුසු පරිද්දෙන් උක්සේපනීය කර්මය කරණ ලදී. එබඳු උක්ෂේපනීය කර්මය කළ භික්ෂුවක් හට අනුවර්තක වීම නුසුදුසු වෙයි. මෙසේ වෙන් වශයෙන් අවවාද කොට භික්ෂුණී සංඝයාගේ මධ්‍යයට ඒ භික්ෂුණීය පමුනුවා සංඝයා විසින් අවවාද කොටත් ඒ අධර්ම ලබ්ධිය නොහරින්නී වී නම් විධ වූ පරිද්දෙන් කර් වාක්‍යානුසාරය කටයුත්තේයි. ඒ කර්ම වාක්‍යයාගේ අවසානයෙහි ඒ භික්ෂුණී තොමෝ උක්ඛිත්තානුවත්තිකා නම් වන්නිය. යම් භික්ෂුණියක් තොමෝ කායසංසර්ග රාගයෙන් විපරීත සිත් ඇත්තියක්ව එසේම කාය සංසර්ග රාගයෙන් විපරීත සිත් ඇත්තාවූ පුරුෂයෙකුගේ අත ඇල්වීම හෝ සිවුරු ඇල්වීම හෝ කැමැත්තෙන් ඉවසන්නීවේද කාය සංසර්ගය යයි කියන ලද්ද වූ දුශ්චරිතයෙහි හැසිරෙනු පිණිස පුරුෂයාගේ අත්පසෙහි සිටින්නී වේද එසේ අත්පසෙහි සිට කථාකරන්නී හෝ වේද කියන ස්ථානයකට යන්නී හෝ වේද පුරුෂයෙකුගේ ඊම අපේක්ෂා කරන්නී හෝ වේද යම්කිසිවක් මුවඟ වූ ස්ථානයට යන්නීහෝ වේද පුරුෂයෙකුගේ අත්පසෙහි සිට තමා ගේ ශරීරය අභිමුඛ කරන්නී හෝ වේද මේ කරුණු අටින් පාරාජිකාපත්තියට පැමිනෙන්නී ද ඒ භික්ෂුණී තොමෝ අද්ධවත්ථුකා නම් වන්නීය) තානි ඒ අෂ්ට වස්තුහු තුමූ, එකාදසන්නං පණ්ඩකාදීනං, පණ්ඩකාදී වූ එකොළොස් පුද්ගලයන්ගේ, අභබ්බභාව සංඛාතෙහි, භික්ෂුභාවයට නුසුදුසු බැව් සංඛ්‍යාත වූ, එකාදසහි පාරාජිකෙහි සද්ධිං, එකොළොස් පාරාජිකාවන් සමග එකූනවීසති, එකුන් විසි දෙනෙක් තුමූ, ගිහිභාවං පත්ථයමානාය, ගිහිබව පත්න්නා වූ, භික්ඛුනියා, මෙහෙණින්නගේ විබ්භන්තභාව පාරාජිකෙනසද්ධිං, ගිහිවීම් සංඛ්‍යාත වූ පාරාජිකාව හා සමග වීසති හොන්ති, පාරාජිකාවෝ විසිදෙනක් වෙති. අපරාපි, ඔවුන් කෙරෙත් අන්‍ය වූද, ලබ්ම්,

දීර්ඝ වූ අංගජාතය ඇත්තා වූ භික්සුවෙන්ද, මුදුපිට්ඨිකො, මොලොක් පිටක් ඇත්තා වූ භික්ෂුවක්ද, පරස්ස අංගජාතං, මෙරමාගේ අංගජාතය, මුඛෙනගණ්හාති, මුවෙන් ගණ්ද එබඳු භික්ෂුවෙක්ද, පරස්ස අංගජාතෙ, මෙර මාගේ අංගජාතයෙහි, අභිනිසීදති, හිඳිනා භික්ෂුවෙක්ද, ඉමෙ සංචතුන්නංවසෙන, මේ සතර දෙනාගේ වශයෙන්, චත්තාරි, පාරාජිකාවෝ සතර දෙනෙක යන මොහු, අනුලෝම පාරාජිකානිති වදන්ති, අනුලෝම පාරාජිකාවෝ යයි කියති. (අභව්‍ය පුද්ගලයන් අතුරෙන් පණ්ඩකය උභතොබ්‍යඤ්ජනකය තිරච්ඡානය යන මේ තුන්දෙන තුමූ අහේතුක ප්‍රතිසන්ධි ගැනීම් සංඛ්‍යාත වූ වස්තු විනාශය වන හෙයින් ප්‍රවුජ් ජෝපසම්පද කර්මයන්ට නුසුදුස්සෝ වෙති. ඔවුහුද පාරාජිකාපත්තියට බඳු වූ බැවින් පාරාජිකා නම් වෙති. ථෙය්‍යසංවාසකයතිත්ථිය පක්කන්තකය යනාදී අටදෙන තුමූ තමාගේ ක්‍රියාවෙන් විනාශ වූ හෙයින් පැවිදි උපසපනුන්ට නුසුදුසු වේති. ඔවුහුද පාරාජිකා පත්තිප්‍රාප්තයන්ට බඳුවූ බැවින් පාරාජිකාපත්තියට පැමිණියෝ නම්වෙති. ලම්බි පාරාජිකය මුදු පිට්ඨි පාරාජිකය යන මොවුන්ට වනාහි එපමණින් ලබ්ම්පාරාජිකාපත්තිය නොවෙයි. යම් කලෙක අන්ගිරති සංඛ්‍යාත වූ කාමරාගය ඉපිද උළපන් කල්හි තමාගේ අංගජාතය මලමාගී මුඛ මාර්ගය කරා ප්‍රතිපාදනය කෙළේ වී නම් එකල පාරාජිකාපත්තියට පැමිණෙතියි කීනියායි) ඉති ඉමානිචත්තාරිච, මේ සතර පාරාජිකාපත්තිහුද, පුරිමානිවීසතිච, පූර්ව වූ විසිපාරාජිකාවෝද, ඉති,මෙසේ සබ්බානෙව, (ඒ ඒ ප්‍රකරණයන්හි ආවාවූ) සියලු පාරාජිකාපත්තිනම්, සමොධානෙත්වා, එක් කොටගෙන, චතුවීසතිපාරාජිකානි, සූවිසි පාරාජිකා කෙනෙක්. වේදිතබ්බානි, දත යුත්තාහුය. නලභතිභික්ඛුහිසද්ධිං සංවාසන්ති, නලභති, පෙ සංවාසං යනු උපෝසථාදිභේදං, පොහෝ කිරීම් ආදී ප්‍රභේද ඇත්තා වූ, සංවාසං, එක්ව විසීම, භික්ඛුහිසද්ධිං, භික්ෂූන් හා සමග, නලභති, නොලබයි, යථාපුරෙ තථාපච්ඡාති, යථා පෙ පච්ඡා යනු, පුබ්බෙ ගිහි කාලේච, පළමු ගිහිකල්හිද, අනුපසම්පන්නකාලේච, හෙරණ පැවිදි කල්හිද, අසංවාසොහොතියථා, එක්ව විසීම යම් සේ නොවේද? පච්ඡා, පසුකාලයෙහි, පාරාජිකං, පාරාජික ඇවතට, ආපන්නෝපි, අවන් මහණ තෙමේද, තථේව, අසංවාසොහොති, එපරිද්දෙන්ම එක්ව විසීම නොවේද? තස්ස, ඒ පාරාජිකාවට අවන් මහණහට, භික්ඛු හිසද්ධිං, භික්ෂූන් හා සමග, උපෝසථාදිභේදේ, පොහෝ කිරීම් ආදී ප්‍රභේද ඇත්තා වූ සංවාසොනත්ථි, එක්ව

විසිමක් නැත්තේයි, ඉති අයං, මේ වනාගි, අත්ථො, අර්ථයි.

තත්ථාය සම්මනේන පුච්ඡාමිති, තත්ථා පෙ පුච්ඡාමි යනු, තේසු චතුසුපාරාජිකේසු, ඒසතරපරිජි ඇවතුන් කෙරෙහි, ආයස්මන්තෙ, ආයුෂ්මතුන් කච්චි, කිමෙක් ද, ඒත්ථ, මේ යතර පාරාජිකා පත්තියෙහි, පරිසුද්ධා ඉති, පිරිසිදු වූවාහුදැයි, පුච්චාමි විචාරමි. කච්චිත්තාතිපදය්‍යස, කච්චිත්ථ යන පදයාගේ, කච්චි එත්තාති, කච්චි එත්ථ යනු, පදවේජ්ජදෙකාතබ්බො, පදසිඳීම් කටයුත්තේයි, ඒතෙසුචතසු පාරාජිකේසු, මේ සතර පාරාජිකාපත්තින් කෙරෙහි, තච්චි, කිමෙක්ද, පරිසුද්ධා ඉති, පිරිසිදුද යනු, අත්ථො, අර්ථයි, අථවා, නොහොත් කච්චිත්ථ පරිසුද්ධාති, පදස්ස, කච්චිත්ථ පරිසුද්ද යන පදයාගේ, කච්චි කිමෙක්ද, පරිසුද්ධා, ඇවතින් පිරිසිදු වූවාහු, භවත්ථ, වූහුදැයි, ඉති අයං, මේ වනාති, උන්තො, අර්ථයි, (පූර්ව ක්‍රමය නාමපද වශයෙන්ද පශ්චිම ක්‍රමය ආඛ්‍යාත පද වශයෙන්ද අර්ථ කථනය කෙරෙත්) සෙසං, සෙය්ස, සබ්බත්ථ, සියලු ස්ථානයෙහි, උත්තානමේව, නොගැඹුරු මැයි.

කංඛාවිතරණියා, කංඛාවිතරණී නම් වූ, පාතිමොක්ඛවණ්ණනාය, ප්‍රාතිමෝක්ෂ අර්ථවර්ණනාවෙහි, පාරාජික කණ්ඩවණ්ණනා, පාරාජික පුරුක්නුගේ අර්ථ වර්ණනා තොමෝ, ඉති (ඉමෙහි වචනක්කමෙහි) මෙසේ (මේ දක්වන ලද වචනයන්ගෙන් ක්‍රමයෙන්) නිට්ඨිතා, සම්පූර්ණ කරන ලද්දිය.

## පාරාජිකා කණ්ඩ වර්ණනායි.

ඉමෙබොපනාති ඉදං, ඉමෙබොපන යන මේ වාක්‍යය තෙමේ, ඉදනි, දැන්, වත්තබ්බානං, කියයුතු ආපත්තින්, අභිමුඛීකරණං, අභිමුඛකිරීමයි, ආයස්මන්තොති ඉදං, ආයස්මනන්තො යන මේ ශබ්දය තෙමේ, සන්නිපතිතානං, රැස්වූ භික්ෂූන්ට, පියවචනෙන, ප්‍රියවචනයෙන්, ආලපණං, ආමන්ත්‍රණය කරණ ශබ්දයයි හෙවත් හඩගානා ශබ්දයයි. තෙරසාති අයංසද්දෙ, තෙරස යන මේ ශබ්දය තෙමේ, ගණන පරිච්චේදෙ, ගණන් පිරිසිඳිනා ශබ්දයයි. සංඝාදිසේසාති, සංඝාදිසේසා යනු, ඒවං නාමකා, මේ සංඝාදිසෙසයන නම් ඇත්තාහුයි. ධම්මාති, ධම්මා යනු, ආපත්තියො, ආපත්තිහු වෙති, උද්දේසංආගච්ඡන්තීති, උද්දේසංආගච්ඡන්ති යනු, සරුපෙන ස්වකීය රූපයෙන්, උද්දිසිතබ්බතං,

දැක්විය යුතු බවට, ආගච්ඡන්ති, පැමිණෙත්, නිදානෙච්ච, නිදානයෙහි මෙන්, යස්සසියා ආපත්තිති සාධාරණ වචන මාත්‍රයකින්, උද්දිසිතබ්බතං, ප්‍රකාශ කටයුතු බවට, නආගච්ඡන්ති, නොපැමිණෙත්, අස්සාසුක්කවිසට්ඨියා, ඒ සුක්කවිසට්ඨියට, චේතනා, මිදියට චේතනා තොමෝ සංවිජ්ජති විද්‍යාමාන වේද ඉති තස්මා, එසේ හෙයින් සා සුක්ක විසට්ඨි, ඒ සුක්ක විසට්ඨි තොමෝ සංචෙතනා, සංචෙතනා නම් වන්නීය, සංචේතනාව, සංචේතනා තොමෝම සංචේතනිකා, සංචේතනික නම් වේ. වා නොහොත් අස්සා සුක්ක විසට්ඨියා ඒ සුක්ක විසට්ඨියට, සංචේතනා, සුකුරු විදියැට් චේතනා තොමේ අත්ථි ඇත්තීද ඉති (තස්මා) එසේ හෙයින්. සංචේතනිකා, සංචේතනිකා නම් වේ. සුක්කවිසට්ඨීති, සුක්ක විසසට්ඨි යනු, සුක්කස්ස, සුකුරුගේ, විසට්ඨි මිදීමයි. රාගුපත්ථම්භාදීසු, රාගයෙන් වූ උපත්ථම්භනාදීන් අතුරෙන්, යේනකෙනචි, යම්කිසි හේතුවකින්, අංගජාතෙ, අංගජාතය, කම්මනියං පත්තෙ, කර්මන්‍ය බවට පැමිණි කල්හි, ආරොග්‍යතා දීසු, නිරෝගී බැව් ආදීන් අතුරෙන්, යංකිඤ්චි අපදිසිත්වා, යම්කිසිවක් දක්වා, අජ්ඣත්තරූපාදීසු, අධ්‍යාත්මික රූපාදීන් අතුරෙන්, යත්ථකත්ථචි, යම්කිසි තැනෙක්හි, මෝචනස්සාද චේතනාය, මිදීමෙහි ආස්වාද චේතනාව කරණ කොට ගෙන, නිමිත්තෙ, නිමිත්තයෙහි, උපක්කමන්තස්ස, උත්සාහ කරන්නා වූ මහණ හට, ආසය ධාතුනා නත්තතො, අදහස් ධාතුන්ගේ විශේෂත්වයෙන්, නීලාදිවසෙන, නීල වර්ණාදීන්ගේ වශයෙන්, දසවිධෙසු සුක්කේසු, දශප්‍රකාර සුක්‍රයන් අතුරෙන්, (රුක්ඛෙසාඛාහිට්ඨිති යන උදාහරණයෙහි මෙනි) යස්සකස්සචි සුක්කස්ස, යම්කිසි සුක්‍රයක්හුගේ ඨානාචචනා, පිහිටි තැනින් ගිලිහීමයි, ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි, අඤ්ඤත්‍ර සුපිනන්තාති, අඤ්ඤත්‍රසුපිනන්තා යනු, සුපිනෙ, ස්වප්නයෙහි, යාසුක්කවිසඩ්ඩි, යම් සුකුරු මිදීමක් වේද, තං, ඒ සුකුරු මිදීම, ඨපෙත්වා, තබා, සංඝාදිසොසොති, සංඝාදිසෙ සොයනු, සුපිනන්තා, ස්වප්නයෙහි සුකුරු මිදීම, අඤ්ඤත්‍ර (ඨපෙත්වා) තබා, සංචේතනිකා, සුකුරු මිදියට චේතනා ඇත්තා වූ, යාසුක්කවිසඩ්ඩිහොති, යම් සුකුරු මිදීමක් වේද, අයං, මේ සුකුරු මිදීම තොමෝ, සංඝාදිසේසොනාම, සංඝාදිසේස නම් වූ, ආපත්තිනිකායො හොති. ඇවැත් සමූහයක් වෙයි. ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි. (එකම ආපත්තියක් "ආපත්තිනිකායො" යි ව්‍යවහාර කිරීම වනාහි මයූර ශබ්ද මහි

ශබ්ද ගොශබ්දයන් මෙන් උපචාර රූඪි පඨි රූඪි වශයෙන් විප්‍රකාර වූ රූඪි ශබ්දයන් අතුරෙන් පසිද්ධරූඪි වශයෙන් විප්‍රකාර වූ රූඪි ශබ්දයන් අතුරෙන් පසිද්ධ රූඪි වශයෙන් කීහයි දත යුතු. නොහොත් "එකොවෙදනාක්ඛන්ධො එකොවිඤ්ඤාණක්ඛන්ධො" යනාදී උදහරණයෙහි මෙන් සමූහයාගේ නාමය එක දේශයෙක්හි ආරොපනය කොට ඒක දේශ වූ එකම ආපත්තියකුදු නිකායයි ව්‍යවහාර කරණ ලදී. එත්ථ, මේ සංඝාදිසෙසොයන පදයෙහි, වචනත්ථොපන, විග්‍රහය වනාහි, ඒවංවේදිතබ්බො, මෙසේ දත යුත්තේයි. අස්ස ආපත්ති නිකායස්ස, ඒ ඇවැත් සමූහයාට, ආදි මහිචේව, පළමුවන පිරිවෙස්දෙන කාලයෙහිද, සෙසෙව, අවශිෂ්ට මානත්දෙන කාලයෙහි හා අබ්භාන කර්මය කාලයෙහිද, සංඝො, සංඝයා, ඉච්ඡිතබ්බො, කැමති විය යුත්තේද, ඉති (තස්මා7, එසේ හෙයින්, සො ආපත්ති නිකායො, ඒ ආපත්තිනිකාය තෙමේ, සංඝාදිසේසො, සංඝාදිසේස නම් වේ, (අර්ථ කථාචාරීන් වහන්ස, ආපත්ති සමුද්ධානයාගේ ආදි මධ්‍ය පරියොසාන යන තුන්කල්හිම සංඝයා කැමති විය යුත්තේ වේද ආපත්තිහුගේ ආදි මධ්‍ය පරියොසානයන්හි කැමති විය යුත්තේ ද යන වචනය කෙසේ යෙදෙන්නේ දැයි යන චොද්‍යය සඳහා "කිංවුත්තං හොති" යනාදී පාඨය කීහ) කිං (කොඅධිප්පායො) කවර අදහසක්, වුත්තං (වුත්හොහොති) කියන ලද්දේ වේද යත්? ඉමං ආපත්තිං, මේ ඇවැතට ආපජ්ජිත්වා, ඇවද, වුද්ධාතුකාමස්ස, නැගිටිනු කැමති මහණහට, යන්තං ආපත්ති වුද්ධානං, යම් ඇවතින් නැගිසිටි මගේ, ආදිමහිචේව, ආදියෙහිද, මජ්ඣෙච, මධ්‍යයෙහිද, ආදිතො, පිරිවෙස් දීමෙන්, සෙසෙ, ආවශිෂ්ටවූ, පටිකස්සනේනවාසහ, ආපසු ඇදීම හා සමගද, මානත්තදනත්ථායච, මානත්දීම පිණිසද, අවසානෙච, අවසානයෙහිද, අබ්භානත්ථායච, අබ්භාන සංඛ්‍යාත වූ ඇතුළත් කිරීම පිණිසද, සංඝොඉච්ඡිතබ්බො, සංඝයා කැමති විය යුත්තේයි, එත්ථ, මේ විනය කර්මයන් අතුරෙන්, එකම්පිකම්මං, එක් කර්මය කුදු, සංඝෙනවිනා, සංඝයාගෙන් තොරව, කාතුං, කරන්නට, හි (යස්මා) යම්හෙයකින්, නසක්කා, නොහැකිවේද, ඉති (තස්මා) එසේ හෙයින්, අස්ස ආපත්ති නිකායස්ස, ඒ ඇවැත් සමුහයාගේ, ආදිමහිචේව, ආදියෙහිද, සෙසේච, අවශිෂ්ට වූ මධ්‍ය පරියොසාන කාලයන්හි, සංඝො ඉච්ඡිතබ්බො, සංඝයා කැමති විය යුත්තේය. ඉති (තස්මා) එසේ හෙයින්, සංඝාදිසේසො, සංඝාදිසේස නම් වෙයි. (එහි අභිප්‍රාය නම් ආපත්ති වුට්ඨානයාගේ

ආදියෙහිද, අවශේෂ වූ මධ්‍යපර්යොසානයන්හිද, සංඝයා කැමති විය යුතු කල්හි ආපත්තිහුගේද ආදියෙහිද අවශේෂ කාලයෙහිද සංඝයා කැමතිවිය යුත්තේ නම් වෙයි කී නියායි. අසාධාරණ විනිශ්වය දක්වා තදනන්තරව සාධාරණ විනිශ්වය දක්වනු පිණිස "සාවත්ථියං" යනාදි කීහ) සාවත්ථියං, සැවැත්නුවර, සෙය්‍යසකං ආරබ්භ, සෙය්‍යසක ස්ථවිරයන් අරභයා, උපක්කමිත්වා, උත්සාහ කොට, අසුචිමෝචන වත්ථුස්මිං, සුකුරු මිදු වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. අඤ්ඤත්‍ර සුපිනන්තාති අයං පඤ්ඤත්ති, අඤ්ඤත්‍රසුපිනන්තා යන මේ ප්‍රඥප්ති තොමෝ, ඒත්ථ, මේ ශික්ෂාපදයෙහි, අනුපඤ්ඤත්ති, දෙවෙනි පැනවීමයි. අසාධාරණ පඤ්ඤත්ති. භික්ෂුණීන් හැර භික්ෂුන්ට සාධාරණ ප්‍රඥප්තියකි, අනාණත්තිකං, අනාණත්ති ප්‍රඥප්තියකි. (අනාණත්තිකං යනු, "යදිපන අනාණතේහා සයමේවකරොති අංගපාරිපූරියා අභාවතො අනාපත්තීති වදන්ති" යනු සාරාර්ථදීපනී ටීකායි යන මේ පාඨයෙහි "වදන්ති" යනුවෙන් ටීකාචාරීන්ට අප්‍රිය වූ' වචනයකින් ප්‍රකාශ කළ හෙයින් අචිජම්භන අකිරිය වන්නේ යයි කී නිසායි. එහෙයින් අර්ථකථාචාර්ය තෙමේද "සචේපන" යනාදිය කීහ) පත්තඨාපි, එසේ වුයේ නමුදු, පරේන, මෙර මා විසින්, අත්තනො අංගජාතෙ, තමාගේ අංගජාතයෙහි, උපක්කමංකාරෙත්වා, උපක්‍රම කරවා, සචෙමොචාපෙති, ඉදින් සුකුරුමුදවාද, ආපත්තියේව, ඇවැත්ම වෙයි. වේනෙත්වා අනුන් මෙහෙයා, අන්තමසො, යටත්පිරිසෙයින්, ආකාසෙ, අවකාශයෙහි හෙවත් අවකාශස්ථානයෙහි, කටිකම්පනෙනාපි, කටියසෙලවීම් මාත්‍රයකිනිදු, නිමිත්තෙ, නිමිත්තයෙහි, උපක්කමන්තස්ස, උත්සාහ කිරීමක් ඇති කල්හි, සචේන මුච්චති, ඉදින් සුකුරු නොමිදේද, ථුල්ලච්චියං, ථුලසි ඇවැත වෙයි. අන්තමසො, යටත් පිරිසෙයින්, යංසුක්කං, යම් සුකුරක්, එකාබුද්දකමක්ඛිකා. එක් කුඩා මැස්සෙක්, ස්චේපනපිවෙය්‍ය, ඉදින් බොන පමණක් වන්නේද, තත්තම්පි, එපමණ වූ සුකුරක්ද, ඨානතො, පිහිටි තැනින්, සචෙමුච්චති, ඉදින් මිදේද, දකසොතං, මුත්‍රප්‍රවාහයට, අනොතිණ්ණෙපි, නොබස්නේද, සංඝාදිසේසොහොති. සංඝාදිසේසා පත්තිය වෙයි. (අර්ථකථාචාරීන් වහන්ස පිහිටි තැනින් ගිලිහී මුත්‍ර ශ්‍රෝතයට පැමිණියේද නොපැමිණියේද සංඝාදිසේසාපත්තිය වෙයි යන විනිශ්වය පුරාණ අටුවා වහා අවිරුද්ධ දැයි යන චොද්‍ය සඳහා "ඨානතොපන" යනාදිය කීහ) ඨානතොපන,

පිහිටි තැන් වනාහි, චුතං, ගිලිහුනා වූ සුකුර, අස්සමේව, ඒකාන්තයෙන්ම, දකසොතං, මුත්‍රශ්‍රෝතයට, යස්මා යම් හෙයකින්, ඔතරති, බසීද, තස්මා එසෙ හෙයින්, දකසොතං ඔතිණ්ණමත්තෙ බහිනික්ඛන්තෙවා අනික්ඛන්තෙවා සංඝාදිසේසොති, දකසොතං පෙ සංඝාදිසේසො යනු, අට්ඨ කථා සුවුත්තං, අටුවායෙහි කියන ලදී. (එහි අභිප්‍රාය නම් - අටුවායෙහි තිබ තැනින් සෙලවුනා වූ සුකුර තෙමේ ඒකාන්තයෙන්ම මුත්‍රශ්‍රෝතයට බස්නේමැයි අතරෙහි නොනැවැත්විය හැක්කේය. ඒ අර්ථය සඳහා "ඔතිණ්ණමත්තේ" යනු කීහ. එසේ හෙයින් මුත්‍ර ශ්‍රෝතයට පැමිණීමෙන්ම ඇවැත් නොවන්නේ යැයි දත යුතුයි) අනුපක්කමන්තස්සච, උත්සාහ කරන්නා වූ මහණහටද, අමොචනාධිප්පායස්සච, සුකුරු මිදියවි යිත් නැත්තාවූ මහණහටද, සුපිනංපස්සන්තස්සච, ස්වප්නයක් දක්නා වූ මහණහටද, උම්මත්තකාදීනංච, උමතු ආදීන්ටද, මුත්තෙහපි, සුකුරු මිදීමෙහිද, අනාපත්ති, ඇවැත් නොවේ. සීලවිපත්ති, ශීලයාගේ විනාශයයි. චේතනා, සුකුරු මිදියවි සිත් ඇති බවය. උපක්කමො, උත්සාහ කිරීමය, මුච්චනං, ඒ උත්සාහයෙන් සුකුරු මිදීමය, ඉති ඉමානිතීණි, මේ කාරණයෝ තුන්දෙන තුමූ, එත්ථ, මේ සුක්කවිසද්ධි ශික්ෂා පදයෙහි, අංගානි, අංගයෝ නම් වෙති, සමුද්ධානාදීනි, සමුද්ධානාදීහු තුමූ, පඨමපාරාජික සදිසානේව, ප්‍රථම පාරාජිකාවට සදෘශයෝම වෙත්.

සංඝාදිසේසකණ්ඩෙ, සංඝාදිසේස පුරුක්හි, පඨමසික්ඛාපදං, පළමුවෙනි ශික්ෂාපදය තෙමේ, සමත්තං, සම්පූර්ණ වූයේයි.

දුතියෙ, දෙවෙනි ශික්ෂා පදයෙහි, ඔතිණ්ණොති, ඔතිණ්ණො යනු, යක්ඛාදීනි, යක්ෂාදීන්ට, සත්තා, සත්වයෝ තුමූ, ඔතිණ්ණා විය. බැසගන්නා ලද්දක් මෙන්, අන්තො, ඇතුළත්හි, උප්පජ්ජන්තෙන රාගේන, උපදින්නා වූ රාගය විසින්, ඔතිණ්ණො, බැසගත්තේවා. නොහොත්, කූපාදීනි, ලිං ආදියට, සත්තා, සත්වයෝ තුමූ, ඔතිණ්ණොවිය, බැසගන්නාක් මෙන්, අසම්පෙක්ඛිත්වා, විසමවදැක, රජ්ජනීයඨානෙ, ඇලුම් කටයුතු තන්හි, රජ්ජන්තො, ඇලුනේ, සයං, තෙමේ, රාගංඔතිණ්ණො, රාගයට බැසගත්තේ, ඒතං, ඒ ඔතිණ්ණො යන නාමය තෙමේ, කායසංසග්ග රාගසමංගිස්ස, හස්ත පාදදියෙන් වැලඳගනු කැමති රාගයෙන් සම්පූර්ණ වූ පුද්ගලයාට, අධිවචනංනාම, නාමයක් නම් වෙයි, විපරිණතෙන චිත්තෙනාති, විපරිණතෙන චිත්තෙන යනු,

පරිසුද්ධභවංගසන්තතිසංඛාතං, පවිත්‍ර වූ භවාංග ප්‍රවාහයයි කියන ලද්ද වූ, පකතිංජහිත්වා, ප්‍රකෘතිය හැර, අඤ්ඤථා, අනික් ප්‍රකාරයකින්, පවත්තෙන, හටගන්නා වූ වා, නොහොත්, විරූපං, ප්‍රකෘති ස්වභාව පෙරලී, පරිණතේන, පෙරලුනා වූ. යථා, යම් පරිච්ඡෙදකින්, පරිවත්තමානං, පෙරලීමක්, ඇතිකල්හි, විරූපංහොති, විකාර වේද, ඒවං (තථා) එපරිච්ඡෙදෙන්, වුත්තරාගවසෙන, කියන ලද්ද වූ රාගයාගේ වශයෙන්, පරිවත්තේවා, පෙරලී. ඨිතේන චිත්තේන, සිටියා වූ සිත කරණකොට ගෙන, ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි මාතුගාමෙනසද්ධින්ති, මාතු ගාමෙනසද්ධිං යනු, තදහුජාතායපි, එදවස්හි උපන්නා වූද. ජීවමානක මනුස්සිත්ථියාසද්ධි, දිවමන් මිනිස් ඉතිරියක් සමග. කායසංසග්ගං සමාපජ්ජෙය්‍යාති, කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය යනු, හත්ථග්ගහණාදි කායසම්පයෝගං, අතගැණීම් ආදි වූ කායසම්ප්‍රයෝගයට, කායමිස්සීභාවං, කය හා මිශ්‍රබවට, සමාපජ්ජෙය්‍ය පැමිණියේ වී නම්, හත්ථගාහංවාති ආදිපන, හත්ථගාහංවා යනාදි වචන තෙමේ, අස්ස, ඒ කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය යන පදයාගේ, විත්ථාරෙන, විස්තර හෙයින්, අත්ථ දස්සනං, අර්ථය දක්වන්නා වූ ශබ්දයයි, තත්ථවචනෙ, ඒ වචනයෙහි, හත්ථො නාම, හස්තය වනාහි කප්පර තොපද්ධාය, වැලමිට සන්ධිය පටන්, යාව අග්ගනඛා, යම්සේ සුලඟිලි නියපොතු අගදක්වා, වේදිතබ්බෝ, දතයුත්තේයි. වෙණිනාම, වෙණි නම්, චිනන්ධිත්වාවා, ගොතා හෝ, අවිනන්ධිත්වා වා, නොහොතා හෝ, සුද්ධකෙසෙහිවා, අමිශ්‍ර වූ කේශයන් කරණකොට ගෙන හෝ, නීලාදිවණ්ණ සුත්ත කුසුම කහාපණ මාලා සුවණ්ණචීරක මුත්තාවලි ආදිසු, නීලාදී වර්ණය සූත්‍රය මල්දම් රන්මාලා රන් කුරු මුතු වැල් ආදීන් අතුරෙන්, අඤ්ඤතර මිස්සකෙහි, යමකින් මිශ්‍රකිරීමෙන් හෝ, කතකෙස කලාපස්ස, කරණලද කේශකලාපයාගේ, ඒතං, ඒ පවෙණි යන නාමය තෙමේ, අධිවචනං, නමකි, ඒත්ථ, මේ හත්ථගාහංවා යනාදි පදයන් අතුරෙන්, වෙණිග්ගහණෙන, වෙණිශබ්දය කරණකොටගෙන, ලොමෙහිසද්ධිං, ලෝමයන් හාසමග, කේසාපිගහිතායේව, කේශයෝද ගන්නා ලද්ද හු මැයි. ඉති වුත්ත ලක්ඛණස්ස, මෙසේ කියන ලද ලක්ෂණ ඇත්තා වූ, හත්ථස්ස ගහණං, හස්තය ගැනීම, හත්ථගාහො, හත්ථගාහ නම් වේ, වෙණියාගහණං, කොණ්ඩය ගැනීම, වෙණිගාහො, වෙණීගාහ නම් වේ. අවසේසස්ස සරීරස්ස, සෙසු ශරීරය.

පරාමසනං, ඇල්ලීමට, අඤ්ඤතරස්සවා, අඤ්ඤතරස්සවා අංගස්ස, එක්තරා එක්තරා අංගයක්. පරාමසනං, ඇල්ලීම නම් වෙයි. යොභික්ඛු, යම් මහණෙක් තෙමේ, හත්ථග්ගාහංවා, ඒ අතගැණීමට හෝ, වෙණිග්ගාහංවා, ඒ කොණ්ඩය ගැණීමට හෝ අඤ්ඤතරස්සවා අඤ්ඤතරස්සවා අංගස්ස පරාමසනං, එක් එක්තරා ශරීරාවයවයක් ඇල්ලීමට හෝ සමාපජ්ජෙය්‍ය, පැමිණියේ වී නම්, තස්සභික්ඛුනො, ඒ මහණහට, සංඝාදිසේසොනාම, සංඝාදිසේස නම් වූ, ආපත්ති නිකායොහොති. ඇවැත් සමූහය වෙයි.

සාවත්ථියං, සැවැත්නුවර, උදායිත්ථෙරං ආරබ්භ. උදායිස්ථවිරයන් අරභයා, කායසංසග්ග සමාපජ්ජනවත්ථුස්මිං, කාය සංසර්ගයට පැමිණීම් සංඛ්‍යාත වස්තුවෙහි, පඤ්ඤත්තං පණවන ලදී. සාධාරණ පඤ්ඤත්ති, භික්ෂු භික්ෂුණී උභය පක්ෂයට සාධාරණ ප්‍රඥප්තියයි. අනාණත්තිකං, ආණත්තික නොවෙයි. (අනාණත්තිකයයි කී හෙයින් මාගමක් ස්පර්ශකරවයි කියේ ද කී කායික උත්සාහය නොකොට සිතින් ආශ්වාදනය කරණ මහණහට ආපත්තිනොවෙයි යනුඇතැම් ආචාර්යයෝ කීහු. ඒ වචනය එනාහි අටුවා ටීකායෙහි විශේෂ නොකී හෙයින් යුක්ත වන්නේයි) ඉත්ථියා, ස්ත්‍රිය කෙරෙහි, ඉත්ථි සඤ්ඤිනො ස්ත්‍රිය යන සංඥ ඇත්තා වූ මහණහට, අන්තමසො, යටත්පිරිසෙයින් ලොමෙනලෝමං අසන්තස්සාපි, ලෝමයෙන් ලෝමය ස්පර්ශ කරන්නා වූ මහණ හටද, ඉත්ථියාවා, ස්ත්‍රියෙක් හෝ ඵුසියමානස්ස, ස්පර්ශ කරනු ලබන කල්හි, සේවනාධිප්පායේන, සෙවිනා අදහසින්, වායමිත්වා, ශරීරයෙන් ව්‍යායාමිකොට ඵස්සං, ස්පර්ශය පටිජානන්තස්ස, ඉවසන්නා වූ මහණහට, සංඝාදිසේසොහොති, සංඝාදිසේසාපත්තිය වෙයි. එකෙනපනහත්ථේන, එක් අතකින් ගහෙත්වා, අල්වාගෙන, දුතියෙන හත්ථේන, දෙවන අතින්, දිවසම්පි, දවස මුල්ල්ලෙහිද නත්වී ඒ අංග ප්‍රත්‍යංග යෙහි ඵුසන්තස්ස, ස්පර්ශකරන්නාවූ නොහොත් අල්වන්නා වූ මහණ හට, එකාව ආපත්තිහොති, එකම ඇවැතක් වෙයි, අගහෙත්වා, පළමු අතින් අල්වා නොගෙන, ඵුසන්තස්සපන, දෙවෙනි අතින් ස්පර්ශ කරණ මහණ හට එනාහි. සීසතො, හිස පටන්, යාව පාදු අත්ථි යම් තාක් පාදයෝ ඇත්තා හුද නාම ඒ තාක් කයතො. ශරීරයෙන්, හත්ථංඅමොචන්තොයේව, අතනොමුදන්නේම, ඵුසති, ස්පර්ශ කෙරේද, එකාව ආපත්ති හොති. එකම ඇවැතක් වෙයි. පඤ්චංගුලිනං, පසඟිලිහු,

එකතොගහණෙපි, එක්කොට ගැණීමෙහිද, එකායෙවහොති, එකම ඇවැතක් වෙයි. සචෙපන, ඉදින් වනාහි, නානිත්ථීනං, නොයෙක් ස්ත්‍රීන්ගේ, පඤ්චංගුලියො, පසැගලි, එකතොගණ්හාති, එක් කොට ගන්නේ වී නම්, පඤ්චආපත්තියො හොන්ති, ආපත්හිහු පස්දෙනෙක් වෙත්, (මේ වනාහි පඤ්චාංගුලිම භික්ෂූන්ගේ අතින් ඇල්වීම සඳහා කියන ලදී. ඉදින් මැදැගිලි හු තමාගේ අතට නොගැටුනාහු නම් ඒ මැදැගිලි හේතුකොටගෙන, හෙවත් මැදැගිලි සංඛ්‍යාවට සමාන වූ ථුල්ලසී ආපත්හිහු වෙත්) ඉත්ථියා, ස්ත්‍රිය කෙරෙහි, වෙමතිකස්ස, විමති ඇත්තා වූ භික්ෂුහටද, පණ්ඩක පුරිස තිරච්ඡානගතසඤ්ඤිස්සච, පණ්ඩකයෙක පුරුෂයෙක තිරච්ඡානගත සත්වයෙකැයි යන සංඥ ඇත්තා වූ මහණහටද, ථුල්ලච්චයංහොති. ථුල්ලසී ඇවැතක් වෙයි. තථා, එපරිද්දෙන්, කායේන, භික්ෂුහුගේ ශරීරයෙන්, කායපටිබද්ධං, ස්ත්‍රීහුගේ කායප්‍රතිබද්ධ වස්තුවක්, කායපටිඉද්ධේන, භික්ෂුහුගේ ශරීරය ප්‍රතිබද්ද වූ වස්තුවකින් කායං, ස්ත්‍රීහුගේ ශරීරය ඵුසන්තස්සාපි, වැදගන්නා වූ මහණහටද, (මෙසේ සම්පූර්ණයෙන් සම්බන්ධකොට අර්ථ ගත යුත්තාහුයි කංඛාවිතරණී අටුවායෙහි වනාහි "කායේන කාය පටිබද්ධේන" යන මාත්‍රයක් ඇත්තේයි) අමනුස්සිත්ථිපණ්ඩකෙහි, යක්ෂනීන් දිව්‍යාංගනාවන් අසුරාංගනාවන් ප්‍රේතීන් පණ්ඩකයන්, සද්ධිං, සමග කායසංසග්ගේපි, කායසංසර්ග හේතුවෙන්ද, ථුල්ලච්චයංහොති, ථුල්ලසී ඇවතක් වෙයි. මනුස්සිත්ථියාපන, මිනිස් ඉතිරියක්හුගේ වනාහි, කායපටිබද්ධේන, කයපිළිබඳ වස්තුවකින්, කායපටිබද්ධාදිසුච, කය පිළිබඳ වස්තු ආදීන්හිද, පුරිසකායඵුසනාදිසුච, පුරුෂයන්ගේ ශරීර ස්පර්ශාදීන් හිද, දුක්කටංහොති, දුකුළා ඇවතක් වෙයි. ඉත්ථියා, ස්ත්‍රියෙකු විසින්, ඵුසියමානස්සච ස්පර්ෂ කරනු ලබන කල්හි සෙවනාධිප්පායස්සාපි සෙවිනා කැමැති අදහස් ඇති කල්හි, කායේන, ශරීරයෙන්, අවායමිත්වා, ව්‍යායාම් නොකොට, ඵස්සංපටිජානන්තස්සච, ස්පර්ශය ඉවසන්නා වූ මහණ හටද, මොක්ඛාධිප්පායේන, තමා නොකැමැත්තෙන් අල්වාගත් ස්ත්‍රියෙකුගෙන් මිදෙනු කැමැති අදහසින්, ඉත්ථිංඵුසන්තස්සච, ස්ත්‍රිය අල්වන්නා වූ මහණහටද, අසඤ්චිච්ච, ස්පර්ශ කරමි යන චේතනා නැතිව, අසතියා, සමෘති විප්‍රවාශයෙන්, ඵුස්න්තස්සඤ, ස්පර්ශ කරන්නාවූ මහණ හටද, අජානන්තස්සච, නොදන්නා වූ මහණ හටද, අසාදියන්තස්සච, නොඉවසන්නා වූ මහණහටද,

උම්මත්තාදිනඤ්ච, උමතු ආදි භික්ෂූන්ටද, අනාපත්ති, ආපත්ති නොවෙයි. සීලවිපත්ති, ශීලයාගේ විපත්තියයි. මනුස්සිත්ථි, මිනිස් ඉතිරියක් වීමය. ඉත්ථි සඤ්ඤිතා, ස්ත්‍රියෙක යන සංඥ ඇති බවය. කායසංසග්ගරාගො, එක්කරනු කැමති ඇල්මය, තෙනරාගෙන, ඒ ඇල්ම කරණකොටගෙන, වායාමො, ශරීරයෙන් ව්‍යායාම කිරීමය. හත්ථගාහාදි සමාපජ්ජනං, අත් ඇල්වීම් ආදියට පැමිණීමය. ඉතිඉමානිපඤ්ච, මේ අංගයෝ පස්දෙන තුමූ, ඒත්ථ, මේ දෙවන සංඝාදිසේස ශික්ෂා පදයෙහි, අංගානි, අංගයෝයි, සමුට්ඨානාදීනි, සමුට්ඨාදීහු තුමූ, පඨම පාරාජිකො, පළමුවන පාරාජිකා පත්තියෙහි, වුත්ත සදිසානෙව, කියන ලද්දට සදෘෂ වෙත්මය.

**දුතිය සික්ඛා පදං, දෙවෙනි ශික්ෂාපදය සම්පූර්ණයි.**

තතියෙ, තුන්වෙනි ශික්ෂාපදයෙහි, ඔතිණ්ණතාව, රාගය විසින් බැසගන්නා ලද බවද, විපරිණත චිත්තතාව, පෙරලුනු සිත් ඇතිබවද, දුට්ඨුල්ලවාචස්සාද රාග වසෙන, ස්ත්‍රී පුරුෂ නිමිති ආදිය සම්බන්ධ වූ ලාමක වචන රසාස්වාදනයෙහි ඇලීම වශයෙන්, වේදිතබ්බා, දත යුත්තීය. මාතුගාමන්ති, මාතුගාමං යනු, දුට්ඨුල්ලා දුට්ඨුල්ලං, ලාමක අලාමක බව, සංලක්ඛණ සමත්ථං, සලකුණු කිරීමෙහි පොහොසත් වූ හෙවත් සංඥකිරීමෙහි පොහොසත් වූ, මනුස්සිත්ථිං, මිනිස් ඉතිරියෙකු, දුට්ඨුල්ලා දුට්ඨුල්ලං සංලක්ඛණ සමත්ථං යන මේ පාඨයෙන් ඇතැම් ස්ත්‍රීහු වැඩිවිය පැමිණියාහුද ලාමක අලාමක බව නොදත් අඥාන ස්ත්‍රීහු ගැණෙත්. මේ ස්ථානයෙහි මාතුගාමයයි නොගත යුත්තේයි) දුට්ඨුල්ලාහි වාචාහීති, දුට්ඨුල්ලාහි වාචාහි යනු, වච්චමග්ගපස්සාවමග්ග, මලමාගී මූත්‍රමාගීයන් සම්බන්ධ වූ, මෙථුන ධම්ම පටිසංයුත්තාහි, මෙවුන් දම් ප්‍රතිසංයුක්ත වූ, වාචාහි, වචනයෙන්, ඔභාසෙය්‍යාති. ඔභාසෙය්‍ය යනු, අවභාසෙය්‍ය, පහත් වශයෙන් කියන්නේ වී නම්, වණ්ණං, ස්තුතිය, අවණ්ණං, ගැරහීමය, යාචන, ඉල්වීමය. ආයාචන, හාත්පසින් ඉල්වීමය. පුච්ඡන, විචාරීමය, පටිපුච්ඡන, පසු පසුව විචාරීමය, ආචික්ඛන ඇස්වීමය, අනුසාසන, හික්මවීමය, අක්කොසනවසෙන, ආක්‍රෝෂ කිරීමය යන මොවුන්ගේ වශයෙන් නානප්පකාර කං, නොයෙක් ප්‍රකාර ඇත්තා වූ, අසද්ධම්මවචනං, අසත් පුරුෂයන්ගේ වචනය,

වදෙය්‍යාති, කියන්නේ වී නම්, යථාතන්ති ඒත්ථ, යථාතං යන මේ පාඨයෙහි, තංති ඉදං පදං, තං යන මේ පදය තෙමේ, නිපාතමත්තං, නිපාත මාත්‍රයකි. යුවා, තරුණ පුරුෂයෙක් තෙමේ, යුවතිං, තරුණ ස්ත්‍රියෙකු, ඔගාසෙය්‍යයථා, කියන්නාක් මෙනැයි. ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි, ඒතේන, ඒ "යථාතංයුවායුවතිං" යන පාඨයෙන්, ඔභාසනෙ, පහත්කොට කිමෙහි, නිරාසංකතාවං, සැකය නැති බව, දස්සෙති, දක්වයි. මෙථුනං, මෙථුනු සංහිතාභාහිතාහි යන මේ පදය තෙමේ, දුට්ඨුල්ලාය වාචාය, ලාමක වචනයාගේ, සිඛාප්පත්ත ලක්ඛණ දස්සනං, මුදුන් පැමිණි ලක්ෂණය ප්‍රකාශ කරන්නාවූ ශබ්දයයි. සංඝාදිසේසොති, සංඝාදිසේසො යනු, ද්වින්නංමග්ගානංවසෙන මලමාර්ගී මුත්‍රමාර්ගයන්ගේ වශයෙන් වණ්ණාවණ්ණෙහිවා, ස්තුති නින්ද වචනයෙන් හෝ, මෙථුනයාචනාදිහිවා, මෙමුන් දම් ඉල්ලීම් ආදි වචනයෙන් හෝ, (ආදි ශබ්දයෙන් ආයාචන පුච්ඡන පටිපුච්ඡන ආචික්ඛන අනුසාසනයෝ ගැණෙත්, සිඛරණී අසි, පිටතට නික්මුනා වූ මයදඑවක් ඇත්තෙහිය. සම්භින්නා අසි, එකට සම්බන්ධ වූ මල මාගී මුත්‍ර මාගී ඇත්තෙහිය. උභතොබ්‍යඤ්ජනකා අසි, උභය පාර්ශවයෙහි ස්ත්‍රී නිමිති පුරුෂ නිමිති ඇත්තෙහිය. ඉති ඉමෙසු තිසු, යන මේ තුන් පදයන් අතුරෙන්, අඤ්ඤතරෙන අක්කොසවචනේනවා, එක්තරා ආක්‍රෝශ වචනයකින් හෝ, මාතුගාමං මාගමක්, ඔභාසෙන්තස්ස, ප්‍රකාශ කොට කියන්නා වූ මහණ හට, සංඝාදිසේසො නාම, සංඝාදිසේස නම් වූ, ආපත්ති නිකායො හොති, ඇවැත් සමූහයක් වෙයි. සාවත්ථියං, සැවැත් නුවර, උදයිත්ථේරං ආරබ්භ, උදයි ස්ථවිරයන් අරභයා, දුට්ඨුල්ල වාචාහි, ලාමක වචනයෙන්, ඔභාසන වත්ථු ස්මිං, ප්‍රකාශකොට කී වස්තුවෙහි, පඤ්ඤත්තං. පණවන ලද්දේයි, අසාධාරණ පඤ්ඤත්ති, මෙහෙණීන්ට සාධාරණ නොවූ ප්‍රඥප්තියකි. අනාණත්තිකං, ඇණ වීමෙන් ඇවැත නොවෙයි. ඉත්ථියා, ස්ත්‍රියක් සමීපයෙහි, ඉත්ථිසඤ්ඤිනො, ස්ත්‍රිය යන දැනුම් ඇත්තා වූ මහණහට, අන්තමසො, යටත් පිරිසෙයින්, හත්ථමුද්දායාපි, අත් මිටෙනුදු නොහොත් හස්ත මුද්‍රා වෙනුදු, වුත්තනයෙන, කියන ලද ක්‍රමයෙන්, ', ඔභාසන්තස්ස, ප්‍රකාශය කොට කියන කල්හි , සා, ඒ ස්ත්‍රී තොමෝ තමත්ථං, ඒ අර්ථය, තස්මිංයේවඛණෙ, එකෙණෙහිම, සචේජානාති, ඉදින් දැන ගණීද, සංඝාදිසේසොහොති, සංඝාදිසේසාපත්තිය වෙයි. පණ්ඩකෙ, පණ්ඩකයා සමීපයෙහි කියන්නා වූ

මහණහට, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවැත වෙයි. තස්මිංයේව, ඒ පණ්ඩකයා කෙරෙහිම, ඉත්ථි සඤ්ඤිනො, ස්ත්‍රිය සංඥා ඇති මහණහට, දුක්කටංහොති, දුකුලා ඇවැතවෙයි. පුනප්පුනං, නැවත නැවත ඔභාසන්තස්සවා, ප්‍රකාශ කොට කියන මහණ හට හෝ සම්බහුලාව ඉත්ථියො, බොහෝ වූ ස්ත්‍රීහුද, එකවාචාය, එක් වචනයකින්, ඔභාසන්තස්සවා, ප්‍රකාශකොට කියන මහණ හට හෝ, වාචා ගණනාය චෙව, වචනයන්ගේ ගණනින්හෝ, ඉත්ථිගණනායච, ස්ත්‍රීන්ගේ ගණනින් හෝ ආපත්තියො හොන්ති, ආපත්තිහු වෙත්, යංඉත්ථිං, යම් ස්ත්‍රියෙකු ඔභාසති., ප්‍රකාශකොට කියාද, සා, ඒ ස්ත්‍රී තොමෝ, සචේන ජානාති, ඉදින් නොදනී නම්, ථුල්ලච්චයංහොති, ථුලසී ඇවත වෙයි.

අධක්ඛකඤ්ච, අකු ඇටයෙන් යටද, උබ්භ ජානු මණ්ඩලංච, දන මඩලින් උඩද, ආදිස්ය. දක්වා, වණ්ණාදිභණනෙ, ස්තුති වචන ආදිය කීම හේතුකොටගෙන, ථුල්ලච්චයංහොති, ථුලසිඇවැත වෙයි. පණ්ඩකෙ, පණ්ඩකයා සමීපයෙහි කියන මහණ හට, දුක්කටංහොති, දුකුලා ඇවැත වෙයි. උබ්භක්ඛකංච, අකු ඇටයෙන් මත්තෙහිද, අධො ජානු මණ්ඩලංච, දන මඩලින් යටද, කායපටිබද්ධච, කය හා පිළිබඳ වස්තුවක් හෝ ආදිස්ස, දක්වා, වණ්ණාදිභණනෙ, ගුණාදිය කීම හේතුකොටගෙන, සබ්බත්ථ ස්ත්‍රී පණ්ඩක යන සියල්ලන් සමීපයෙහි කියන්නා වූ මහණහට, දුක්කටංහොති, දුකුලා ඇවැත වෙයි. උබ්භජානු මණ්ඩලය හා සමග අධක්ඛකය වනාහි මේ දුකකට වස්තුවෙහි සංග්‍රහ කරණු ලැබේ) අත්ථධම්මානුසාසනි පුරෙක්ඛාරානඤ්ච, අටුවාව ඉගණිමය පාළිය ඉගෙනිමය අනුසාසනා කිරීමය යන මේ පූර්වකොට ඇත්තා වූ භික්ෂූන්ටද, උම්මත්තකාදීනංච, උමතු ආදීන්ටද, අනාපත්ති, ඇවැත නොවෙයි. සීල විපත්ති ශිල විනාශයයි. මනුස්සිත්ථි, මිනිස් ඉතිරියක් වීමය. ඉත්ථිසඤ්ඤිතා, ස්ත්‍රිය යන සංඥා ඇති බවය. දුට්ඨුල්ලවාචස්සාදරාගො, ලාමක වචනයක් කී මෙහි රස විඳගන්නා ඇල්ම ඇති බවය. තෙනරාගෙන, ඒ රාගය කරණ කොට ගෙන, ඔභාසනං, වචන ප්‍රකාශකොට කීමය. තංඛණෙවිජානනං, එකෙණෙහි වචනාර්ථය දැනගැනීමය. ඉති ඉමානි පඤ්ච, මේ කාරණායෝ පස්දෙන තුමූ, ඒත්ථ. මේ තුන්වන ශික්ෂා පදයෙහි, අංගානි, අංගයෝයි, අදින්නාදන සමුට්ඨානං, අදින්නාදන සමුට්ඨාන ඇත්තේයි, කිරියා, වාචසික ක්‍රියාවෙන් ඇවැත නගින්නේයි. සඤ්ඤාවිමොක්ඛං, සංඥාවෙන් මිදෙන්නේයි,

සචිත්තකං,චිත්තය සහිත වෙයි. ලෝකවජ්ජං, ලෝකයෙහි වරද යයි සම්මත කරණ ලද්දේයි. කාය කම්මං හස්ත මුද්‍රය ලිපි ආදියෙන් දන්වන කල්හි කාය කර්මයයි, වචිකම්මං, වචන කියන කල්හි වාග් කර්මයයි. අකුසල චිත්තං, ලෝභ මූලික අකුසල චිත්තයයි. ද්විවෙදනං, දෙම්නස් වේදනා උපේක්ෂා වේදනාවයකින් යුක්ත වෙයි.

**තතිය සික්ඛා පදං, තුන්වෙනි ශික්ෂා පදය නිමියේයි.**

චතුත්ථෙ, සතරවෙනි ශික්ෂාපදයෙහි, ඔතිණ්ණභාව, ඔතිණ්ණ බවද, විපරිණත චිත්තතාව, විපරිණත සිත් ඇති බවද, අත්තකාම පාරිචරියාවසෙන, තමා පිණිස කැමති වන ලද්දවූ මෛථුන සෙවනොපස්ථාන කිරීම් වශයෙන්, වේදිතබ්බා, දතයුත්තිය. මාතුගාමස්ස සන්තිකෙති, මාතුගාමස්ස සන්තිකෙ යනු, දුට්ඨුල්ලොභාසනෙ, දුට්ඨුල්ලොභාසන ශික්ෂා පදයෙහි, වුත්තප්පකාරාය, කියන ලද ප්‍රකාර ඇත්තා වූ, ඉත්ථියා, ස්ත්‍රියක් හුගේ, සම්පෙය්‍යත්වා, ලග සිටගෙන, (සම්පෙය්‍යත්වා යනු පාඨ ශේෂයි. මේ පාඨශේෂය පාළියෙහි භාසෙය්‍ය යන පදය හා සම්බන්ධයි) අත්තකාම පාරිචරියායාති, අත්තකාමපාරිචරියාය යනු. මෙථුනධම්ම සංඛාතේන, මෙවුන්දම් සංඛ්‍යාත වූ, කාමෙන, කාමය කරණ කොටගෙන, පාරිචරියා, උපස්ථාන කිරීම, කාමපාරිචරියා, කාමපාරිචරියා නම් වේ. අත්තනො, තමාගේ, අත්ථාය, වැඩ පිණිස, කාමපාරිචරියා, මෛථුන ධර්මයෙන් උපස්ථාන කිරීම, අත්තකාම පාරිචරියා, අත්තකාම පාරිචරියා නම් වේ. නොහොත් අත්තා තමා විසින් කාමිතා කැමතිවන ලද්දීය, ඉච්ඡිතා, ඊප්සාකරණ ලද්ධීය. ඉති (තස්මා) එසේ හෙයින්, අත්තකාමා, අත්තකාමා නම් වේ. සයං තමා විසින්, මෙථුනරාගවසෙන, මෙවුන් දම් සෙවීමෙහි ඇලීම් වශයෙන්, පත්ථිතා, ප්‍රාර්ථනා කරණ ලද්දීය. ඉති අයං, මේ චනාහි, අත්ථො, අර්ථයි. අත්තකාමාචහොති, තමා විසින් කැමති වන ලද්දීත් වේද, සා. ඒ තමා විසින් කැමැති වන ලද්දී චනාහි, පාරිචරියාචහොති, උපස්ථානයත් වේද, ඉති (තස්මා) එසේ හෙයින්, අත්තකාමපාරිචරියා, අත්තකාමපාරිචරියා නම් වන්නීය. තස්සා අත්තකාපාරිචරියාය, ඒ තමා පිණිස මෙවුන් දම් සෙවීම් වශයෙන් උපස්ථාන කිරීමෙහි, වණ්ණංභාසෙය්‍යාති, වණ්ණංභාසෙය්‍ය යනු, ගුණං, උපකාරය,

ආනිසංසං, විපාක පරම්පරාව, පකාසෙයා, ප්‍රකාශ කරන්නේ වී නම්, ඒතදග්ගංති ආදි, එතදග්ගං යනාදී වචනය තෙමේ, තස්සා අත්තකාම පාරිචාරියාය, ඒ තමා විසින් කැමති වන ලද්ද වූ උපස්ථානයාගේ, වණ්ණභාසනාකාර දස්සනං, උපකාරය කියන්නා වූ ආකාරය ප්‍රකාශ කරණ වචනයයි. (තත්‍රවචනෙ) ඒ වචනයෙහි, අයං, මේ මතු වක්ෂ්‍යමාන වනු ලබන්නේ, පද සම්බන්ධව සෙනෙව, පද සම්බන්ධයාගේ වශයෙන්ම, සංඛෙපත්ථො, සංක්ෂේප වූ අර්ථයයි. යා ඉත්ථි, යම් ස්ත්‍රියෙක් තොමෝ, මාදිසං, මාවැනි ස්වභාව ඇත්තා වූ, පාණාතිපාතා දීහි විරහිතත්තා, පණිවා ආදියෙන් වැලකුණු හෙයින්, සීලවන්තං, සිල් ඇත්තා වූ, මෙථුන ධම්මා, මෛථුන සේවනයෙන්, විරහිතත්තා, වැලකුණු හෙයින්, බ්‍රහ්මචාරිං, උතුම් වූ ශ්‍රේෂ්ඨාචයක්‍ය ඇත්තා වූ, භික්ඛු, භික්ෂුවෙකු, තෙන ධම්මෙන, ඒ මෛථුන ධර්මයෙන් පරිචරෙය්‍ය, (අභිරාමෙය්‍යං) සිත් ඇලවූයේ වී නම් එවං මෙසේ මාදිසං මාවැනි භික්ෂුවකු පාරිචරන්තියා, උපස්ථාන කරන්නාවූ, තස්සා ඉත්ථියා, ඒ ස්ත්‍රීහුගේ, යා අයං පාරිචරියානාම අත්ථි, යම් උපස්ථාන කිරීමක් නම් ඇත්තිද, ඒතං (එසාපාරිචරියා) මේ මෛථුන සේවනයෙන් උපස්ථාන කිරීම, පාරිචරියානං, උපස්ථානයන් අතුරෙන්, අග්ගං (අග්ගා) ශ්‍රේෂ්ඨවන්නීය. (ඒතදග්ගං යනු ලිංග විපල්ලාසයයි) මෙථුනුපසංහිතේන සංඝාදිසෙසොති, මෙථුනුපසංහිතේන සංඝාදිසේසො යනු. ඒවං, මෙසේ, අත්තකාමපාරිචරියාය, තමා විසින් කැමති වන ලද මෛථුනයෙන් උපස්ථාන කිරීම ගේ, වණ්ණං, උපකාරය, භාසන්තොව, කියන්නා වූ මහණ තෙමේද, ත්වං, තෝ, මය්හං, මට, මෙථුනධම්මං, මෛථුනධර්මය, දාතුංඅරහසි, දීමට සුදුසු වන්නෙහිය. ඉති ආදිනා, මේ ආදී වූ, මෙථුන සංයුත්තේනෙව, මෙවුන් දම් පිළිසංයුත් වූම, වචනෙන වචනය කරණකොට ගෙන, යොභික්ඛු යම් මහණෙක් තෙමේ, භාසෙය්‍ය, ප්‍රකාශකොට කියා නම්, තස්ස භික්ඛුනො, ඒ මහණහට, සංඝාදිසේසොහොති, සංඝාදිසේසාපත්තිය වෙයි. (මේ මෛථුන යාචනය දුට්ඨුල්ලොභාසන ශික්ෂා පදයෙහිත් ආයේය. එසේ ආයේ නමුදු ඒ ශික්සා පදයෙහි දුට්ඨුල්ලාවාචස්සාද රාග වශයෙන් කියන ලද්දේයි. මේ ශික්ෂා පදයෙහි වනාහි මෛථුනස්වාද රාග වශයෙන් කියන ලද්දේයි. වනාහි මේ භික්ෂා පද දෙදෙනාගේ වෙනසයි.) සාවත්ථියං, සැවැත් නුවර, උදයිත්ථෙරං ආරබ්භ, උදායිස්ථවිරයන් අරභයා,

අත්තකාම පාරිචරියාය, තමා පිණිස මෙවුන් දම් සෙවීම් වශයෙන් උපස්ථාන කිරීමෙහි, වණ්ණභාසනවත්ථුස්මිං, ගුණ කියන්නා වූ වස්තුව හේතුකොට ගෙන, පකද්සදත්තං පණවන ලදී. අසාධාරණ පකද්සදත්ති, මෙහෙණීන්ට සාධාරණ නුවූ ප්‍රඥප්තියකි. අනාණත්තිකං, ඇණවීමෙන් ඇවැත් නොවෙයි. ඉත්ථියා, ස්ත්‍රිය කෙරෙහි ඉත්ථි සඤ්ඤිනො, ස්ත්‍රිය යන සංඥා ඇත්තා වූ මහණ හට අන්තමෙසා යටත් පරිසෙයන් හත්ථමුට්ඨියාපි, අතමිට මොලවීමෙනුදු හෙවත් හස්ත මුද්‍රා ලිපි ආදියෙහි දු, වුත්තනයේනෙව. කියන ලද ක්‍රමයෙන්ම, අත්තකාම පාරිචරියාය, තමා පිණිස කාමයෙන් උපස්ථාන කිරීමගේ, වණ්ණංභාසන්තස්ස, ගුණ කියනු ලබන කල්හි, සා. ඒ ස්ත්‍රී තොමෝ, තමත්ථං, ඒ අර්ථය, තස්මිංයේවඛණෙ, ඒකෙණෙහිම, සචෙජානාති, ඉදින් දනී නම්, සංඝාදිසේසොහොති, සංඝාදිසේසාපත්තිය වෙයි. නොවෙජානාති. ඉදින් නොදනී නම්, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවැත වෙයි. පණ්ඩකෙ, පණ්ඩකයා කෙරෙහි, පණ්ඩක සඤ්ඤිනොපි, පණ්ඩකයා යන හැඟීම් ඇත්තා වූ මහණ හටද, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවැත වෙයි. තස්මිංයේව, ඒ පණ්ඩකයා කෙරෙහිම, ඉත්ථි සඤ්ඤිනො, ස්ත්‍රී යන හැඟීම් ඇත්තා වූ මහණහටද දුක්කටංහොති, දුකුලා ඇවැත වෙයි. (උභතොබ්‍යඤ්ජනකොපනපණ්ඩක ගතිකත්තා විසුංනවුත්තො" යනු ටීකායි. මේ ටීකා වචනයෙන් උබතොබ්‍යඤ්ජනක තෙමේද ථුල්ලච්චය වස්තු වියයි දක්වන ලදී. අෂ්මදචාර්ය පරම්පරාගත මතය වනාහි ස්ත්‍රී පක්ෂයෙහි සංඝාදිසේස වස්තු බවද පුරුෂ පක්ෂයෙහි දුෂ්කටාපත්ති වස්තු වන බවද හැගේ. ඒ තකුදු වුවත් ටීකායෙහි නොකියන ලදින් පරීක්ෂා කොට ගත යුතුයි. යක්ෂණීහුය දිව්‍යාංගනාවෝය. ප්‍රේතියෝය යන මොවුහු ථුල්ලච්චය වස්තුයයි ටීකායෙහි කියන ලද්දහුය. ඒ මතය ද අටුවායෙහි නොආයේ නමුදු කායසංසර්ග ශික්ෂාපදයෙහි යක්ෂණී ආදීහු ථුල්ලච්චය වස්තුවෙහි අටුවාචාරීන් විසින් සංග්‍රහ කරණ ලද්දහුය. "යොතෙවිහාරෙවසති තස්සඅග්ගදනං මෙථුනධම්මං දෙහිතිපරියාය වචනෙනාපිදුක්කටං, අත්තකාමපාරිචරියාය වණ්ණංභාසෙය්‍ය මාදිසං සීලවන්තන්ති වුත්තනතාති එකෙපංසු අංගේසු අභාවාසංඝාදී සෙසොයෙවාති අපරෙ" යනුද ටීකායි. මේ කෙචිඅපරෙන යන ආචාර්යවාද දෙදෙනා අතුරෙන් අපරෙ ආචායඍීවාදයම අංගයෙහි නොආ හෙයින් ද ගරුක වූ හෙයින් ද යෙදෙන්නේ මැයි) චීවරාදීහි,

සිවුරු ආදිවූ, වත්ථු කාමෙහි, වස්තුකාමයන් කරණකොටගෙන. පාරිචරියාය, උපස්ථාන කිරීමගේ, වණ්ණභාසනතස්සච, ගුණකියන්නාවූ මහණහටද, උම්මත්තකාදීනංච, උමතු ආදීන්ටද, අනාපත්ති, ඇවැත නොවේ. සීලවිපත්ති, ශීල විනාශයයි. මනුස්සිත්ථි, මිනිස් ඉතිරියක් වීමය. ඉත්ථි සඤ්ඤිතා, ස්ත්‍රිය යන සංඥ ඇති බවය. අත්තකාමපාරිචරියාය, අත්තකාමපාරිචරියාවෙහි, රාගො, ඇල්ම ඇති බවය. තෙනරාගේන, ඒ ඇල්මෙන්, වණ්ණභණනං, ගුණකීමය. තංඛණවිජානනං, එකෙණෙහි අර්ථ දැනීමය. ඉති ඉමානි පඤ්ච, මේ කාරණයෝ පස් දෙන තුමූ, එත්ථ, මේ ශික්ෂා පදයෙහි, අංගානි. අංගයෝයි. සමුට්ඨානාදීනි, සමුට්ඨානාදිහු තුමූ, දුට්ඨුල්ලොභාසනෙ, දුට්ඨුල්ලොභාසන ශික්ෂා පදයෙහි, වුත්ත සදිසානේව, කියන ලද්දට සදෘශම වෙත්.

## චතුත්ථ සික්ඛා පදං, සතරවෙනි ශික්ෂාපදය සම්පූර්ණ වූයේයි.

පඤ්චමෙ, පස්වෙනි ශික්ෂාපදයෙහි, සඤ්චරිත්තන්ති, සංචරිත්තං යනු, ඉත්ථි පුරිසානං, ස්ත්‍රී පුරුෂයන්ගේ, අන්තරෙ, අතුරෙහි, සංචරණභාවං, ඔබ්මොබචන ගෙන හැසිරෙන බවට, සමාපජ්ජෙය්‍යාති, සමාපජ්ජෙය්‍ය යනු, සම්මා පටිග්ගහණාවි මංසන පච්චාහරණානි, මොනවට පිළිගැනීමය අදහස් විමසීමය නැවත ගෙණඊමය යන මොවුන් කරොනත්තො, කරන්නේ. ආපජ්ජෙය්‍ය, පැමිණෙන්නේ වී නම්, ඉත්ථියාවාති ආදි, ඉත්ථියාවා යනාදී වචන තෙමේ, සමාපජ්ජනාකාර දස්සනං, මොනවට පැමිණෙන ආකාර දක්වන්නා වූ වචනයයි. තත්ථ, ඒ වචනයෙහි ඉත්ථියාවා පුරිසමතිනති, ඉත්ථියාවා පුරිමතිං යනු, පුරිසෙනවා, පුරුෂයෙකු විසින් හෝ, අස්සපුරිසස්ස ඒ පුරුෂයාගේ, මාතාපිතා දිහිවා, මව්පියාදීන් විසින් හෝ පෙසිතො, යවන ලද මහණ තෙමේ, තස්ස පුරිසස්ස ඒ පුරුෂයාගේ, මතිං (අධිප්පායං) අදහස නොහොත් කැමැත්ත, ඉත්ථියා ස්ත්‍රිය හට ආරොචෙය්‍ය අස්වන්නේ වී නම් ඉති අයං මේ වනාහි අත්ථො අර්ථයි පුරිසස්ස වා ඉත්ථිමතිත්ති පුරිස්සවා ඉත්ථි මතිං යනු ඉත්ථියා වා ස්ත්‍රිය විසින්හෝ තස්ස ඉත්ථිය ඒ ස්ත්‍රිය ගේ මතාපාතාදීහි වා මව්පිය ආදීන් විසින් හෝ පොසිතෝ යවන ලද මහණ තෙමේ ඉත්ථියා ස්ත්‍රියගේ මතිං (අධිප්පායං) අදහස නොහෙත් කැමැත්ත. පුරිසස්ස, පුරුෂයා

හට, ආරොවෙය්‍ය, අස්වන්නේ වී නම්, ඉති අයං, මේ වනාගි, අත්ථෝ, අර්ථයි. ජායත්තනෙවා ජාරත්තනෙවාති, ජායත්තනෙවා ජාරත්තනෙවා යනු, ජාය භාවෙ, අඹුවක් වනු කැමැත්තෙන් හෝ, ජාරභාවෙවා, සැමියෙක් වනු කැමැත්තෙන් හෝ පුරිසස්ස (භියානුවිස්ථාරාර්ථයෙහිනිපාතයි) පුරුෂයාගේ වනාගි, මතිං, කැමැත්ත, ඉත්ථියා ආරොවෙන්තො, ස්ත්‍රියට අස්වන්නාවූ මහණ තෙමේ, ජායත්තනෙ, අඹුවක් වනු කැමැත්තෙන් ආරොවෙති, අස්වන්නේ නම් වෙයි. (පදභාජනයෙහි වනාගි ජාරත්තනෙවාති ජාරිභවිස්සති. යනුවෙන් ස්ත්‍රී ලිඟුවෙන් වදළේ නමුදු ජාරත්තනෙ යන පදය තෙමේ, ලිංගව සාධාරණ හෙයින්. පුල්ලිඟු වශයෙන් යොද දක්වනු කැමති අර්ථ කථා චාර්‍ය්‍යයෝ, ඉත්ථියා මතිං යනාදිය කීහ) ඉත්ථියා මතිං, ස්ත්‍රියගෙ කැමැත්ත, පුරුෂයාහට, ආරොවෙන්තෝ අස්වනුයේ. හෙවත් අස්වන කල්හි, ජාරත්තනෙ සැමියා වනු කැමැත්තෙන ආරොවෙති අස්වයි. දැන් වන්හි පද භාජනයෙහි ආවාවූ ක්‍රමයෙන් දක්වනු කැමතිව "අපිච" යනාදිය කීහ) අපිච, අනිකුදු ක්‍රමයක් මයා වුවවන්නේ යනු අධ්‍යාහාරරයි) පුරිසස්සේව, පුරුෂයාගේම, මතිං, කැමත්ත, ඉත්ථියා ආරොවෙන්තො, ස්ත්‍රියට අස්වන කල්හි, ජායත්තනෙවා (නිබද්ධභාර්‍ය්‍යාභාවෙවා) එකැතියෙන් බිරිඳක් වනු කැමැත්තෙන් හෝ ආරොවෙති, අස්වයි. ජාරත්තනෙවා (මිච්ජාචාර භාවෙවා) තාවකාලික අඹුවක් වනු කැමැත්තෙන් හෝ, ආරොවෙති, අස්වයි. තෙනෙව, එහෙයින්, අස්ස, ඒ ජායත්තනෙවා ජාරත්තනෙවා යන පදයාගේ, පද භාජනෙ, පද භාජනියෙහි, ජායත්තනෙවාති, ජායාභවිස්සති ජාරාත්තනේවාති ජාරිභවිස්සති යනුවෙන්, වුත්තං වදරණ ලදී. එතේනෙව උපායෙන, මෙම හේතුවෙන්, ඉත්ථියාමතිං, ස්ත්‍රියගේ කැමැත්ත පුරිසස්ස අරොචනෙපි, පුරුෂයාට ඇස්විමෙහිද, පතිභවිසසසි, ඒකාන්ත සැමියෙක් වේවි, ජාරොභවිස්සසි, තාවකාලික සැමියෙක් වෙව, ඉති, මෙසේ, වත්තබ්බතා, කියයුතු බව, වේදිතබ්බො, දත යුත්තිය, අන්තමසො තංඛණිකායපි, අන්තමසො තංඛණිකායපිය යනු, සබ්බන්තිමෙන පරිච්චේදෙන සියල්ලට යටත පිරිසෙයින්, යා අයං ඉත්ථි, යම් ස්ත්‍රියක් තංඛණෙ (මුහුත්තමත්තේන) එකෙණෙහිම, සංවසිතබ්බතො, එක්ව විසිය යුතු හෙයින්, තංඛණිකාතිවුච්චති, තංඛණිකායයි කියනු ලැබේ. මුහුත්තිකා, එකෙණෙහි අඹුය යන, ඉති අයං, මේ වනාහි, අත්ථො, අර්ථයි, ("මුහුත්තිකාති බණිකා" යනු ටීකායි. "මුහුත්තිකා භවිස්සසීති අස්ස

මිකංසන්ධා යමුත්තං, පාරිභව්‍යස්සයිති, සාමිකංසන්ධායවුත්තං" යනු සාරාර්ථදීපනී ටීකායි) තස්සාපි, ඒ ස්ත්‍රිය හටද, මුහුත්තිකා. එකෙණෙහි අඹු තොමෝ, භවිස්සසි, වන්නෙහිය. ඉති (එවං) මෙසේ, පුරිසස්ස මතිං, පුරුෂයාගේ කැමැත්ත, ආරොචෙනතස්ස, අස්වන්නාවූ මහණහට, සංඝාදිසේසොහොති, සංඝාදිසේසාපත්තිය වෙයි. එතේනෙව උපායෙන, මේ හේතුවෙන්ම, මුහුත්තිකො භවිස්සසි, එකෙණෙහි සැමියෙක් වෙව, ඉති (එවං) මෙසේ, පුරිසස්ස, පුරුෂයාහට, ඉත්ථි මතිං, ස්ත්‍රියගේ කැමැත්ත ආරොචෙ වන්තොපි, අස්වන්නා වූ මහණ තෙමේද, සංඝාදිසේසා, සංඝාදිසේසාපත්තියට, ආපජ්ජති, පැමිණෙයි, ඉතිවේදිතබ්බො, මෙසේ දත යුත්තේයි. සාවත්ථියං, සැවැත් නුවර උදායිත්ථේරං ආරබ්භ, උදායි ස්ථවිරයන් අරභයා, සඤ්චරිත්තං, ඔබ මොබ හසුන්ගෙන ගැසිරීමට, සමාපජ්ජන වත්ථුස්මිං, මොනවට පැමිණි වස්තුව හේතුකොට ගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. අන්තමසො, තංඛණිකායපි ඉති. අන්තමසො තංඛණිකායපියන, අයංපඤ්ඤත්ති, මේ ප්‍රඥප්ති තොමෝ ඒත්ථ, මේ ශික්ෂා පදයෙහි, අනුපඤ්ඤත්ති, අනුප්‍රඥප්ති සංඛ්‍යාත වූ දෙවෙනි පැණවීමයි. සාධාරණ පඤ්ඤත්ති, මහණ මෙහෙණි දෙපක්ෂයට සාධාරණ පැණවීමයි. පටිගණ්හාති, මැනවැයි පිළිගණීද, වීමංසති, කැමති නොකැමති බැව් විමසාද, අන්තෙවාසිං, අතවැස්සෙකු, පච්චාහරාපෙති, නැවත එළවානම්, ඉති ගමනාගයෙන, මෙසේ මේ ක්‍රමයෙන්, සාණත්තිකං, අණවීම් සහිත වෙයි. නාලංවපනියාය, යම් සර්වප්‍රකාරයෙන් අත් නොහැරියා වූ ස්ත්‍රියකු අඤ්ඤනු (ඨපෙත්වා) තබා, යස්සකස්සචි ඉත්ථියා, යම්කිසි ස්ත්‍රියක් හට, අන්තමසො, යටත් පිරිසෙයින්, මාතුයාපි, මවටද, (අපි ශබ්දය කරණ කොට ගෙන මවටද ඇවැත්වී නම් අනික් ස්ත්‍රීන් කෙරෙහි ඇවැත් වීම කියනුම කවරේදැයි යන අර්ථය දක්වයි පුරිස්මතිං, පුරුෂයාගේ කැමැත්ත, ආරොචෙන්තෝ, අස්වන්නේ නොහොත් අස්වන කල්හි, ධනක් කී භාගරියා, ධනයෙන් වි කොටගන්නා ලද භාර්යයා තොමෝ, හොතිකිර, වේදැයි, ඉති, මෙසේ, වත්තුකාමොසචෙහොති, ඉදින් කියනු කැමති වේ නම්, ඡන්දවාසිනී ආදිසු, ඡන්දවාසිනී ආදීන් අතුරෙන්, අඤ්ඤතරෙන ආකාරෙන, එක්තරා ආකාරයකින්, ආරොචෙත්වා අස්වා, තාය, ඈ විසින්, සාධූති, මැනවැයි, සම්පටිච්ඡිතෙපි, පිළිගත් කල්හිද, අසම්පටිච්ඡිතෙපි, පිළිනොගත් කල්හිද, පුන, නැවත, ආගනත්වා, අවුත්, යෙන, යම් පුරුෂයෙකු

විසින්, පෙසිතො, යවන ලද්දේ ද, තස්ස, ඒ පුරුෂයාගට, තංපවත්තිං ආරොචෙති. එපවත් අස්වානම්, සංඝාදිසෙසං, සංඝාදිසෙසාපත්තියට, ආපජ්ජති. පැමිණේයි. (එහි අභිප්‍රාය - යම් අත් නොහරන ලද ස්ත්‍රියෙකු හැර මාතු රක්ඛිතා, පිතු රක්ඛිතා, මාතු පිතු රක්ඛිතා, භාතු රක්ඛිතා, භගිනී රක්ඛිතා, ඤාති රක්ඛිතා, ගොත්ත රක්ඛිතා, ධම්ම රක්ඛිතා, සාරක්ඛා, සපරිදණ්ඩා, යන දශප්‍රකාර ස්ත්‍රීන් අතුරෙන් මව් විසින් රක්නා ස්ත්‍රිය කරා යම්කිසිවෙකු විසින් භික්ෂුවක්ය වන්නේ වේද ස්වාමිනී මේ මව්විසින් රක්නා ස්ත්‍රිය ධනයෙන් විකොට මට භාර්‍යාවක් කෙළේ වී නම් යහපතැයි කී කල්හි ඒ මහණ තෙමේ ඒ බස් ගිවිස ඒ මාගම කරාගොස් ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඕදපත්තකිනී, ඕභටචුම්බටා, දාසීචභරියාච, කම්මකාරීච භරියාච, ධජාහටා මුහුත්තිකා, යන පෙළෙහි ආවාවූ දශ ස්ත්‍රීන් අතුරෙන් හොති කිර ධනක්කීතා යනු කී හෙයින් ඡන්දවාසිනී ආදී පදයන් අතුරෙන් එක් පදයක්ද පාලියෙහි නොආවා වූ පුත්තමාතාසරණී ගන්තරන්ධකා යනාදී සංවාසය ප්‍රකාශ කරන්නා වූ වචනයන් අතුරෙන් එක්තරා වචනයක් කීයේද ත්‍රෛත්‍රයට පැමිණෙනන්නේයි. ඒ ස්ත්‍රී තොමෝ ඒ වචනය පිළිගන්නේ වේවා පිළිනොගන්නේ වේවා නැවත ගෙනවුත් ඒ පුරුෂයා හට අස්වන්නේ නම් මේ අංගත්‍රය එක් වූ කල්හි, සංඝාදිසේසා පත්තිය වන්නේ යයි කී නියායි. මෙසේ දක්වන ලද්ද වූ විසි ස්ත්‍රීන් අතුරෙන් සාරක්ඛාසපරිදණ්ඩා යන දෙදෙනාය ධනක්කීතාදී දශදෙනාය යන මේ ස්ත්‍රීහු දොළොස් දෙන පුරුෂාන්තරයකට ගිය කල්හි කාමේසුමිච්ඡාචාරය වෙයි. කුමක් හෙයිනයත්, ඒ ස්ත්‍රීහු තුමූ සැමියාට අයත් වූ ස්පර්ශය සොරකම් කොට අන්‍ය පුරුෂයන් හා අභිරමණය කළ හෙයිනැයි දත යුතුයි. මාතු රක්ඛිතාදී ස්ත්‍රීන් අටදෙනාහට නොවෙයි. කුමක් හෙයින යත්? මව් ආදීහු තුමූ ඒ ස්ත්‍රියගේ ස්පර්ශය අයිතිකාරයන් නොවන හෙයිනි. පුරුෂයන්ට වනාහි ඒ විසි ස්ත්‍රීන් කරා යන කල්හි මිත්‍යාචාරය වන්නේ මැයි කුමක් හෙයිනයත්? අනුන් විසින් රක්ෂා කරණ ලද්ද වූ අනුන් සන්තක ස්පර්ශය සොරකම් කොට ආස්වාදනය කළ හෙයිනැයි දත යුතුයි. මේ වනාහි නයමුඛමාත්‍රයකි. විස්තරාර්ත්ථීන් විසින් පාරාජිකා පාළි අට්ඨ කථා සාරාර්ථ දීපනී ආදීන්ගෙන් බලාගත යුතුයි) සාපන, ඒ ස්ත්‍රී තොමෝ වනාහි තස්ස, ඒ පුරුෂයාගේ, භරියාහොතුවා, බිරින්දක් හෝ වේවා, මාහොතුවා, බිරින්දක් හෝ නොවේවා, ඒතං, ඒ බිරින්දක් වන නොවන

බව, අකාරණං, කාරණයක් නොවෙයි. සචෙපි, ඉදින් වනාහි, යස්සා, යම් ස්ත්‍රියක්හුගේ සන්තිකං, සමීපයට, පෙසිතො, යවනලද මහණතෙමේ, තංඅදිස්වා, ඒ ස්ත්‍රිය නොදැක, අඤ්ඤස්ස අවස්සාරොචනකස්ස, අවශ්‍යයෙන් අස්වන්නා වූ අන්කිසිවෙක් හට, ආරොචෙහිතිවත්වා, අස්වයි කියා, පච්චාහරති, නැවත එළවාද, ආපජ්ජතියෙව, ඇවැතට පැමිණේමැයි, මාතුරක්ඛිතං, මව් විසින් රක්ෂා කරණ ලද ස්ත්‍රියක්හට, බෲහිති, කියවයි. පෙසිතස්සපන, යවන ලද මහණෙක් හට ගනත්වා, ගොස්, පිතුරක්ඛිතා දිසු, පියා විසින් රක්ෂාකරණ ලද ස්ත්‍රී ආදීන් අතුරෙන්, අඤ්ඤං අඤ්ඤතරං, අනික් එක්තරා ස්ත්‍රියක් හට, වදන්තස්ස, කියන මහණහට, විසංකේතංහොති, සලකුණ වැරදුනේ වේද, පුරිසස්සවා, පුරුෂයෙකුගේ හෝ ඉත්ථියාවා, ස්ත්‍රියෙකුගේ හෝ වචනං, වචනය, සාධූති, මැනවයි, කායේනවා, ශරීරයෙන් හෝ, වාචාය වා, වචනයෙන් හෝ උභයෙන වා, කායවාක් දෙකින් හෝ, පතිග්ගණ්හිත්වා, පිලිගෙණ, තස්සා ඉත්ථියා. ඒ ස්ත්‍රියහට හෝ පුරිසස්සවා, පුරුෂයා හට හෝ, ආරොචෙත්වාවා, අස්වාහෝ ආරොචාපෙත්වාවා, අස්වාවා හෝ, පුන, නැවත යෙනපෙසිතො, යමෙකු විසින් පිටත් කරවන ලද්දේද, තස්ස, ඔහට, තංපවත්තිං, එපුවත, සයං, තමහට, ආරොචෙන්තස්සවා, අස්වන්නාහට හෝ, අඤ්ඤෙන, අනිකෙකු විසින්, ආරොචාපෙන්තස්සවා. අස්වන්නා වූ මහණ හට හෝ සංඝාදිසේසොහොති, සංඝාදිසෙසාපත්තිය වෙයි. හි, ඒ වචනය යෙදේ මැයි, එත්තාවතා, මෙපමණකින්, පටිගණ්හාති, පිළිගණීද, විමංසති, විමසාද, පච්චාහරති. නැවත එළවාද, ඉති ඉදං, අංගත්තයං, යන මේ අංගත්‍රය තෙමේ, සම්පාදිත මේ වහොති, සම්පූර්ණ කරන ලද්දේම වෙයි. ඉතෝපන. මේ අංගත්‍රයෙන් වනාහි, යෙහිකෙහිචිතීහි අංගේහි, යම් කිසිතුන් අංගයකින්, පණ්ඩකෙච, පණ්ඩකයා කෙරෙහිද, අංගත්තයේනවාපි, අංගත්‍රයකින්, දුක්කටංහොති, චුලසීඇවත වෙයි. එකේන, එක් අංගයකින්, දුක්කටංහොති, දුකුලා ඇවත වෙයි. සංඝස්සවා, සංඝයාගේ හෝ, ගණස්සවා, ගණයාගේ හෝ චේතියස්සවා, චෛත්‍යයාගේ හෝ ගිලානස්සවා, ගිලන් භික්ෂුවක් හුගේ හෝ, කිච්චේන, කෘත්‍යය හේතුවෙන්, ගච්ඡන්තස්සච යන්නා වූ මහණහටද, උම්මත්තකාදී නසඤ්ච, උමතු ආදීන්ටද, අනාපත්ති, ඇවැත නොවෙයි. සීලවිපත්ති, ශීලයාගේ විනාශයයි. යෙසං අත්ථාය, යම් කෙණෙකුන්ගේ ප්‍රයෝජනය පිණිස, සඤ්චරිත්තං, සුන්ගෙන ඔබ්මොබ හැසිරෙන බවට, ආපජ්

ජති, පැමිණේද, තේසං, ඔවුන්ගේ. මනුස්සසඨානිකතා, මිනිස් දෑ ඇති බවය. අලංවචනියතා, යුහුව අනහැරිය යුතු බවය. පතිග්ගණ්හණ විමංසන පච්චාහරණානි, පිලිගැනීමය, විමසීමය ආපසු ගෙන ඒමය. යන මොහුයි. ඉති ඉමානිපඤ්ච, මේ කාරණායෝ පස්දෙන, එත්ථ, මේ පස්වෙනි ශික්ෂා පදයෙහි, අංගානි. අංගයෝයි. ඡසමුට්ඨානං, සවැදෑරුම් වූ සමුට්ඨානයක් ඇත්තේයි. පණ්ණාණත්තිංවා, ප්‍රඥප්තිය හෝ අලංවචනීයභාවංවා, යුහුසුළුව අත්හැරිය යුතු බව හෝ, අජානන්තස්ස, නොදන්නා වූ මහණහට, කායවිකාරෙන, ඉසවැනීම් ආදී වූ ශරීර විකාරයෙන්, සාසනං ගහෙත්වා, පණිවුඩයගෙන, තථේව, එපරිද්දෙන්ම, විංසිත්වා, විමසා, තථේව, එපරිද්දෙන්ම, පච්චාහරන්තස්ස, නැවත එලවන්නා වූ මහණහට, කායතොසමුට්ඨාති, කයින් හට ගණියි, ඉත්ථන්නාමා, මේ නම් ඇති ස්ත්‍රියක් තොමෝ, ආගමිස්සති. එන්නේයි. තස්සාපි, ඈගේම, චිත්තංජානෙයපාථ, සිත දැනගණිව, ඉති මෙසේ, කෙනෙව. යම්කිසිඑකු විසින් වුත්තො, කියනු ලැබූ මහණ තෙමේ, සාධූතිසම්පටිච්ඡිත්වා, මැනවැයි පිළිගෙන, ආගතං, ආවාවූ, තං, ඒ ස්ත්‍රිය වත්වා, කියා, පුන නැවත, තස්මිං පුරිසෙ ආගතෙ, ඒ පුරුෂයා ආකල්හි, ආරොචෙන්තස්ස අස්වන්නා වූ මහණහට කායේන ශරීරයෙන්, කිංචි, යම්කිසිවක්, අකත්තතා, නොකළ බැවින්, වාචතොසමුට්ඨාති, වචනයෙන් නගියි, වාචාය, වචනයෙන්, සාධූති, මැනවැයි, සාසනංගහෙත්වා, පණිවුඩය ගෙන, අසද්සෙදනකරණීයෙන, අනික් කටයුත්තකින්, තස්සා, ඒ ස්ත්‍රියගේ ඝරංගනත්වා, ගෙටගාස්, අසද්සැදත්ථවා, අනික් තැනක හෝ, ගමනකාලෙ, යන කල්හි, තංදිස්වා, ඒ ස්ත්‍රිය දැක, වචීභේදේන, වාග් භේදයෙන්, වීමංසිත්වා, වීමසා, පුන නැවත, අඤ්ඤෙනේව කාරණේන, අනික් කාරණායකින්ම, තතො අපක්කම්ම, ඒ ස්ථානයෙන් පහව, කදවිදේව, යම්කිසි කලෙක් හිම, තංපුරිසං, ඒ පුරුෂයා, දිස්වා, දැක, ආරොචෙන්තස්සාපි, අස්වන්නා වූ මහණහටද, වාචතොසමුට්ඨාති, වචනයෙන් නගී, පණ්ණත්තිං අජානතස්ස, ප්‍රඥප්තිය නොදන්නා වූ, ඛීණාසවස්සාපි, රහත් මහණ හටද, (සම්භාව නාර්ථයෙහි වූ අපි ශබ්දයෙන් පෘථග්ජන මහණුන්ට කියයුත්තක්ම නැත්තේ යයි දක්වයි) පිතුවචනෙන, පියාගේ වචනයෙන්, ගන්ත්වා, ගොස්, අලංවචනීයං, අත්හරණ ලද්ද වූ, මාතරම්පි, මවටද, එහි, ගොස් එව, මෙපිතරං, මාගේ පියාහට, උපට්ඨාහි, උවටැන් කරව, ඉතිඑවංවාදානං, යන මෙබඳු වචනයක්,

වත්වා, කියා පච්චාහරන්තස්ස, නැවත එළවන කල්හි. කායවාචතො සමුට්ඨාති, කය වචන දෙකින් නගී. (කායොචවාචා කායවාචාච - කායවාචා යි එකසෙසතද්ධිත කටයුතුයි. "පණ්ණත්තිං අජානන්තස්ස බීජාසවස්සාපි පෙ කායවාචතො සමුට්ඨාති" යන වචන හෙමේද නිදර්ශන න්‍යාය මාත්‍රයකි. ප්‍රඥප්තිය දන්නේ නමුදු වහා අත්හරණ ලද බව නොදන්නා වු රහත්හටද කායවාචා දෙකින් ඇවැත් විය යුතු හෙයිනි. එහෙයින් ටීකායෙහි "පණ්ණත්තිංජානිත්වා අලංවචනියභාවං අජානන්තස්සාපි කායවාචතො සමුට්ඨාති" යනු කීහ) ඉමානිතීණි, මේ ආපත්තිහු තුන්දෙන තුමූ. අචිත්තක සමුට්ඨානානි. අචිත්තක සමුට්ඨානයෙන් හටගන්නාහුයි. තදුභයංපන, ඒ ප්‍රඥප්තිය වහා අත්හැරිය බවද, යන කාරණය වනාහි ජානිත්වා දැන. එතේහෙවතීහිනයෙහි, ඒ ත්‍රිවිධ ක්‍රමයෙන්ම, සමාපජ්ජනතස්ස, පැමිණියාවූ මහණ හට, තානෙවතීණි. එම තුන් දෙන තුමූ. තදුභයජානනචිත්තේන, ඒ ප්‍රඥප්තිය හා වහා අත්හැරිය බවද දැනගන්නා සිතින් සචිත්තකානිහොන්ති, සචිත්තක සමුට්ඨාන ඇත්තාහුවෙත්, (මේ ස්ථානයෙහි මේ කංඛාවිතරණී අටුවාවහා සමන්තපාසාදිකා අටුවාවද විරුද්ධ වුවාක් මෙන් හැගෙයි. කුමක් හෙයින යත්? මේ අටුවායෙහි සචිත්තකයාගේ අර්ථය "පණ්ණත්ති විජානනං අලංවචනියභාවං" යනුවෙන් ගෙන "තදුභයංපනජානිත්වා" යනාදීන් කීයේයි. සමන්තපාසාදිකා අටුවායෙහි සචිත්තකය ගේ අර්ථය "පණ්ණත්තිවිජානනයයි" ගෙන "පණ්ණත්තිංපනජානිත්වා එතේහෙවතීහිනයෙහි සංවරිත්තං සමාපජ්ජන්තස්ස කායචිත්තතො වාචාචිත්තතො කායවාචා චිත්තතො සමුට්ඨාති ඉමානිතීනි පණ්ණත්ති විජානනචිත්තේන සචිත්තක සමුට්ඨානානි" යනු කීහ. එහෙයින් අවිරෝධකොට අර්ථගත යුත්තාහුයි. කෙසේ අර්ථ ගත් කල්හි අවිරෝධ වේදයත්? මේ කංඛාවිතරණී අටුවායෙහි යට අචිත්තකාර්ථයෙහි ප්‍රඥප්තිය දන්නා වූ මහණ හට කාය වාචා දෙකින් වන්නේ යයි දැක්වූ තන්හි ප්‍රඥප්තිය දන්නේ නමුදු යුහුසුළුව අත්හරණ ලද බව නොදන්නා වු මහණහටද කායාවාචාදෙකින් වන්නේ යයි අර්ථ ගතයුතුවාක් මෙන් නිදර්ශන න්‍යාය වශයෙන් "පණ්ණත්තිංපනජානිත්වා" යනාදිය කීයේ නමුදු ප්‍රඥප්තිය දන්නේද යුහුසුළුව අත්හරණ ලද බව නොදත් මහණහට සචිත්තක සමුට්ඨානයෙන් ඇවැත්විය යුතු හෙයින් නොකියේ යයි අර්ථය නොගන්නේයි. මෙසේ අර්ථ ගත්

ගි මේ අටුවාදෙක්හි ආචාරුවචනද්වය ගංගොදකය හා යමුනොදකය මෙන් සන්දනය වන්නේයි. එකම අර්ථකථාචාර්යන් විසින් එකම ශික්ෂා පදයාගේ ක්ෂේප විස්තර කථා මාර්ගයෙන් දැක්වූ අටුවා දෙක එකාන්තයෙන් විරුද්ධ වය යුත්තාහුයි. එතකුදු වුවත් අර්ථගන්නවුන්ගේ අදක්ෂභාවය කරණකොට න විරුද්ධ වූවාක් මෙන් හැගේයේයි) ක්‍රියා ක්‍රියාවෙන් හටගන්නේ යයි, සඤ්ඤවිමොක්ඛං, නොසංඥාවිමොක්ෂ නම් වෙයි. අචිත්තකං, ත්තකයයි, පණ්ණත්තිවජ්ජං, ප්‍රඥප්ති වද්‍යයයි. කායකම්මං, කාය කර්මයත් යි. වාක්කම්මං, වචීකර්මයත් වෙයි. කුසලාදිවසෙන, කුශලාදීන්ගේ වශයෙන්, චිත්තානි, තුන්ප්‍රකාර සිත් ඇත්තාහුයි. සුඛාදිවසෙන, සුඛවේදනාදීන්ගේ යෙන්, තිස්සො වේදනා, තුන්ප්‍රකාර වේදනා කෙණෙක් ඇත්තාහුයි.

## පඤ්චම සික්ඛාපදං, පස්වෙනි ශික්ෂාපදයයි.

ජට්ඨෙ, සවෙනි සික පදයෙහි, සංයාචිකාය පනාහි එත්ථ, සංයාචිකායපන මේ වාක්‍යයෙහි, සංයාචිකානාම සංයාචිකා නම්, සයං, තමා විසින්, චිතා, උපදවන ලද්දවු හෙවත් කරණ ලද්ද වූ, යාචනා වුච්චති, යාචඤාව කියනු ලැබේ. තස්මා, එසේ හෙයින්, සංයාචිකායාහි, සංයාචිකාය යනු, නො, තමාගේ, යාචනාය, ඉල්ලීම කරණකොටගෙන, ඉති අයං අධිප්පායො, මේ අභිප්‍රාය, වුත්තං (වුත්තොහොති) කියන ලද්දේ වෙයි. සයං තමා විසින්, තකෙහි, ඉල්වා ගන්නා ලද්ද වූ, උපකරණෙහි, ද්‍රව්‍යයන්ගෙන්, ඉති අයං, වනාහි, අත්ථො, අර්ථයි, ඒත්ථච, මේ ස්ථානයෙහිද, යංකිඤ්චි, යම්කිසිවක් වත් අනියමිත වූ, පරපරිග්ගහිතකං, අනුන් අයත් වස්තුවක්, මූලච්ඡේ සෙන මුල් සිඳීම් වශයෙන්, යාචිතුං, ඉල්වන්නට, නවට්ටති, නොවටනේයි, තාලිකංපන, ඒ තාක් කල් වනාහි නොහොත් තව් කැලි වශයෙන් වනාහි, ටති, වටනේයි, සහායත්ථාය, යහලු බව පිණිස, කම්මකරණත්ථාය, මාන්ත කරණු පිණිස, පුරිසංදෙථෙති, පුරුෂයෙකු දෙව්යැයි වත්තුං වට්ටති, න්නට වටී වටනේයි, පුරිසත්ථ කරම්පි පුරුෂයෙකු විසින් කටයුතු මාන්තයද, යාචිතංවට්ටති, ඉල්වන්නට වටනේයි. පුරිසත්ථකරොනාම, ථකර නම්, වඩ්ඪකි ආදිනා, වඩුවන් ආදී වූ, පුරිසෙන, පුරුෂයෙකු

විසින්, කත්තබ්බං, කටයුතු වූ, හත්ථකම්ම හස්ත කර්මාන්තයකි. තං, ඒ
කටයුතු කර්මාන්තය, (යාචිතුං යන්නෙහි සම්බන්දයි) පුරිසත්ථකරං, පුරුෂ
විසින් කටයුතු කර්මාන්තය, දෙහිතිවා, දෙවයි කියා හෝ, හත්ථකම්මං,
කර්මාන්තය, දෙහිතිවා, දෙවයි කියා හෝ, වත්වා, කියා, යාචිතුං වට
ඉල්වන්නට වටනේයි, හත්ථකම්මං නාම, හස්ත කර්මාන්තය වනාහි, ය
යම් හෙයකින්, කිඤ්චිවත්ථුංනහොති, යම්කිසි වස්තුවක් නොවේද? තස්මා,
හෙයින්, භන්තෙ, වහන්ස, කිං, කවර කාරණයකින්, ආගතත්ථාති, ව
සේක්දැයි, පුච්ජිතේවා, විචාළ කල්හි හෝ, අපුච්ජිතෙවා, නොවිචාළ කල්හි
යාචිතුං වට්ටති, ඉල්වන්නට වටනේයි. විඤ්ඤත්තිපච්චයා, ඉල්වීම හේතු
ගෙන, දෙසොනත්ථි, වරදක් නැත්තේයි, මිගලුද්දකාදයොපන, මුවවැදි
වනාහි, සකකම්මං ස්වකීය, (තමාගේ) කර්මාන්තය, නයාචිතබ්බං, නොඉ
යුතුයි. (මෙහි අභිප්‍රාය වනාහි - මුවන් මරණ වැද්දෙකු හෝ දියමසුන්
කෙවුලෙකු හෝ කරා එළඹ අනියම වශයෙන් හස්ත කර්මාන්තයක් දෙ
නොඉල්විය යුතුයි. විහාරයෙහි වලක් කැණීම් ආදී යම්කිසි කටයුත්තක්
කල්හි ඒ කර්මාන්තයට සුදුසු හස්ත කර්මාන්තයක් දෙවයි නියමකොට ඉ
යුතුයි. අනියමිත වශයෙන් ඉල් වූ කල්හි ඒ වැදිකෙවුල් ආදිහු මේ භික්ෂු
මුවන් මසුන් මරාදෙන්නාහු වෙති. එබැවින් වැදිකෙවුල් ආදින් කරා එළඹ අ
විහාරයෙහි මෙනම් කර්මාන්තයක් ඇත. ඒ කරදෙවයි නියම වශයෙන් නො
සෙසු මනුෂ්‍යයන්ට මෙන් හස්තකර්මාන්තයක් දෙවයි ඉල්වූ කල්හි ඔව්හු ද
වූ මුව දඩයම් මසුන් මැරීම් ආදි වූ පාපක්‍රියා කරන්නාහු වෙති) කුටින්ති.
යනු, උල්ලිත්තාදිසු, උල්ලිත්තකුටි ආදින් අතුරෙන්, අඤ්ඤතරං, එක
කුටියක්, තත්ථ, උල්ලිත්තාදීන් අතුරෙන්, උල්ලිත්තානාම, උල්ලිත්ත
ථම්භතලා පිංය සංඝාටක වාතපානධූමච්ජිද්දදිභේදං, ටැම්තලාද
ජනෙල් කවුළු දුම්කවුළු ආදි ප්‍රභේද වූ, ආලෙපොකාසං ඨපෙත්වා, ලේප
කටයුතු අවකාශ ස්ථානය හැර, අවසෙසෙ, එයින් අවශිෂ්ට වූ ලෙපොකා
ලේපනය කටයුතු අවකාශයන්, කුඩ්ඩෙහිසද්ධිං, භිත්තිගා සමග, ඕට්ඨෙ
ගලපා, ඡදනස්ස අන්තො, සෙවෙනිහුගේ ඇතුළත්හි, සුද්ධායවා, සුනුබ
හෝ, මත්තිකායවා, මැටියෙන් හෝ, ලිත්තා, ලේපනය කරණ ලද කුටි
අවලිත්තා නාම, අවලිත්ත කුටිය නම්, තථෙව, එපරිද්දෙන්ම, වුත්තන

කියන ලද ක්‍රමයෙන්, ඡදනස්ස, සෙවෙනිහුගේ, බහි, පිටත්හි, ලිත්තා, ලේපනය කරණලද කුටියයි. උල්ලිත්තාවලිත්තා නාම, උල්ලිත්ත අවලිත්ත කුටිය නම්, තථේව, එපරිද්දෙන්ම ඡදනස්ස, සෙවෙනිහුගේ, අන්තොව, ඇතුළත් හිද, බහිච, පිටත්හිද, ලිත්තා, ලේපනය කරණ ලද කුටියයි. (කාරයමානෙන යන හෙතු කතෘවෙන් දේශනා කල හෙයින් වනාහි සාමාර්ථ වශයෙන් සුද්ධ කතෘවක්ද යෙදිය යුතුය යන බව ප්‍රකාශ කරනු කැමති අර්ථකථාචාරීන් වහන්සේ, "කාරයමානෙනාති-සයංවාකරොන්තේන" යනාදිය කීයේයි) කාරයමානෙනාති, කාරය මානෙන යනු. සයංවා, තමා විසින් හෝ, කරොන්තේන, කරනු කැමති වූ, ආණත්තියා වා ඇණ විමෙන් හෝ කාරාපෙන්තේන කරවනු කැමති වූ අස්සාමිකන්ති, අස්සාමිකං යනු, කාරෙතා, කරවන්නා වූ, දයකේන, දයකයා කෙරෙන්, විරහිතං, වෙන්වූ, අත්තුද්දෙසන්ති, අත්තුද්දේසං යනු, එසාකුටි, මේ කුටි තොමෝ, මය්හං, මාගේ වාසාගාරං, හිඳිනා විහාරය වෙයි. ඉති (එවං) මෙසේ, අත්තා, උද්දෙසො, උදෙසීම, ඒ තිස්සාකුටියා අත්වී, ඒ කිළිටියට ඇත්තේනුයි. ඉති (තස්මා) එසේ හෙයින් අත්තුද්දෙසො, අත්තුද්දේස නම් වේ. තං ඒ අත්තුද්දේසයයි, පමාණිකාකාරෙතබ්බාති, පමාණිකාකාරෙතබ්බා යනු, පමාණයුත්තා, ප්‍රමාණයෙන් යුක්තව, කාරෙතබ්බා, කරවිය යුත්තීය, තත්‍රිදංපමාණන්ති, තත්‍රිදංපමාණං යනු, තස්සාකුටියා, ඒ කිලියගේ, ඉදං, මේ කියනු ලබන්නේ, පමාණං, ප්‍රමාණයයි. තත්‍ර යනු සාමාර්ථයෙහි නු ප්‍රත්‍යයයි. දීඝසොති, දීඝසොයනු, දීඝතො, දිගින්, ද්වාදසවිදත්ථියො සුගත විදත්ථියා ති එත්ථ, යන මේ පාඨයෙහි, සුගත විදත්ථි නාම, සුගත් වියත නම්, ඉදනි, වර්තමාන සමයෙහි, මජ්ඣිමස්ස පුරිසස්ස, මධ්‍යම පුරුෂයෙකුගේ, තිස්සොවිදත්ථියො, තුන්විය තෙක්, වඩ්ඪකිහත්ථේන, වඩුරියනින්, දියඩ්ඪොහත්ථො හොති, එක් රියන් සමාරක් වෙයි. මිණන්තෙනපන, සමකොටමණිනා භික්ෂුවක්හු විසින් වනාහි, කුටියා, කිළියගේ, බහිකුඩ්ඩෙ, පිටත භිත්තියෙහි, පඨමං, පළමුකොට, ලිත්තං, ආලේපකරණ ලද්ද වූ, මහා මත්තික පරියන්තං, දෙමැටි කෙළවර, අගහෙත්වා නොගෙන ථුස පිණ්ඩ පරියන්තෙන, දහයිය සමග මිශ්‍ර කරන ලද්දවූ කටුමැටි කෙළවරින්, වාදසවිදත්ථියො, දෙළොස් වියතක් මිණෙතබ්බා, මිණිය යුත්තාහුය, ථුසපිණ්ඩකෙන, කටුමැටියෙන්, සචේ අනත්ථ කොහොති, ඉදින් ප්‍රයොජන නැත්තේ වේද, මහා මත්තිකලේපෙනෙව, දෙමැටි ලේපනයෙන්ම, නිට්ඨාපෙති.

නිමවාද, සචේච, ඒ දෙමැටි කෙළවරම, පරිච්ඡේදෙ, පිරිසිඳීම වෙයි. තිරියන්ති, තිරියං යනු, විත්ථාරතො, පුළුලින්, සත්ථන්තරාති, සත්ථන්තරා යනු, කුඞ්ඩස්ස, භික්ඛුගේ, බහිඅන්තං. පිටත් කෙළවර, අගහෙත්වා, නොගෙන, අබ්භන්තරිමෙන අන්තේන, ඇතුළත් හි වූ කෙළවරින්, සත්ත සුගත විදත්ථියො, සුගත් වියතින් සත් වියත් කෙණෙක්, පමාණං, ප්‍රමාණයයි. ඉති අයං අධිප්පායො, මේසේ මේ අභිප්‍රාය, වුත්තං (වුත්තොහොති) කියන ලද්දේ වෙයි. ("ආයාමතොච විත්ථාරතොච" යනුවෙන් පදභාජනියෙහි නොවදරා "ආයාමතෝවා විත්ථාරතෝවා" යි විකල්පාර්ථ වූ වා ශබ්දයෙන් වදළ හෙයින් එක් පාර්ශවයකින් වැඩුයේ නමුදු ඇවැත වෙයි. යන බව දක්වනු කැමතිව "ඒත්ථච" යනාදිය කීහ) එත්ථච, මේ ස්ථානයෙහිද, කේසග්ගමත්තම්පි, කෙසගක් පමණ කුදු, දීඝතො, දිගින් හාපෙත්වා, අඩුකොට, දීඝං, දිග වඩ්ඩෙතුං, වඩනු පිණිස, නවට්ටති, නොවටනේයි. උභයවඩ්ඩනෙ, දිගින් හා පුලුලින් වැඩීමෙහි, කොපනවාදෙ, කියනුම කවරේද, යාපන, යම් කිළියක් තොමෝ චනාහි, දීඝතො, දිගින්, සට්ඨිහත්ථාපිහොති, සැටරියන් ඇත්තීත් වේද, තිරියතො, පුළුලින්, තිහත්ථාවා. තුන්රියන් ඇත්තියක් හෝ, ඌනක චතුහත්ථාවා, උනුසතර රියන් ඇත්තියක් හෝ හොති, වේද, යත්ථ යම් කිලියෙක් හි, පමාණයුත්තො, ප්‍රමාණයෙන් යුක්ත වූ, මංචො, මංචයක් තෙමේ, ඉතොචිතොච, ඔබ්මොබින්ද, නපරිවත්තති, නොපෙරලිය හැක්කේ වේද, පච්පිමකොට්යා, යටත් පිරිසෙයින්, චතුහත්ථ විත්ථාරොනහොති. සතර රියන් පුළුල් නැත්තේ වේද, අයං, මේ කුටි තොමෝ කුටි සංඛ කුටි සංඛ්‍යාවට, හෙවත් කුටින්ගේ ගණනට, යස්මානගච්ඡති, යම් හෙයකින්, නොපැමිණේ ද, තස්මා, එසේ හෙයින්, සා, ඒ කුටි තොමෝ වට්ටති. වටනේයි. (මෙහි අභිප්‍රාය දිගින් සැටරියනක් ඇත්තිද පුළුලින් සතර රියනක් නොපිරුණු කල්හි කුටි සංඛ්‍යාවට නොගියාද කටයුත්තිය යනුයි. මේ "යාපනදීඝතො සට්ඨිහත්ථාපි" යන පාඨයාගේ සාමර්ථයෙන් පාළියෙහි ආවාවූ යුගත් වියතින් දෙළොස් වියතක් දිග හා සත් වියතක් පළල ඇත්තා වූ ප්‍රමාණ යුක්ත වූ කිළිය පටන් පුළුල් සතර රියනින් වැඩිනොවූ ප්‍රමාණ ඇත්තා වූ කිළියද කුටි සංඛ්‍යාවට නොපැමිණෙන හෙයින් කුටිය කළ කල්හි අදෙසික වස්තුක හෙයින් නැගිය යුතු සංඝාදිසේස වස්තුවෙන් නොමිදෙන්නේය යනබව ප්‍රකාශ කෙළෙයි. එහෙයින් මත්තෙහි ආපත්ති භේදය දක්වන තන්හි "සචෙ අදේසික

වත්ථුකා එවචාපමාණාතික්කන්තා, එවචාගොති එකොසංඝාදිසේසො" යනු කථිතයි. සමන්තපාසාදිකා අටුවායෙහි ද පමාණතො ඌන තතරම්පිච වතුහත්ථංපසද්වහත්ථංපි කරොන්තෙන දෙයිත වත්ථුකාච කාරෙතබ්බා" යනුවෙන් ඒව ශබ්දයෙන් අවධාරණය කොට කථිතයයි. පද භාජනියෙහිද "භික්ඛු කුටිංකරොති අදෙසික වත්ථුකං පමාණිකං අනාරබ්භං සපරික්කමනං ආපත්ති සංඝාදිසෙසස්ස" යනු වදරණ ලදී) භික්ඛු අභිනෙතබ්බා වත්ථු දේශනයාති භික්ඛු පෙ දෙසනාය යනු යස්මිං පදෙසා යම් ප්‍රදේශයෙක් හි, කුටිංකාරෙතු කාමොහොති, කිලියක් කටැවීවේද, තං, ඒ ප්‍රදේශය, සොධෙත්වා, කටු කොහොල් හරවා, පදභාජනෙවුත්තනයෙන, පදභාජනියෙහි වදළ ක්‍රමයෙන්, සංඝං, සංඝයා, භික්ඛත්තුං, තුන්යලක් යාචිත්වා අයැද පබ්බේවා සියලු භික්ෂූන් හෝ සංඝ පරියා පන්නේවා සංඝයා කෙරෙහි ඇතුළත් වූ භික්ෂූන් සතර නමක් හෝ, සංඝෙනවා, සංඝයා විසින් හෝ, සම්මතා, සම්මත කරණ ලද්ද වූ, ද්වෙතයොවා භික්ඛූ, දෙතුන් නමක් භික්ෂූන් හෝ, තත්ථ, ඒ ප්‍රදේශයෙහි, වත්ථු දේසනත්ථාය, කුටි වස්තු දේශනාව පිණිස, අභිනෙතබ්බා පැමිණවිය යුත්තාහුය. තේහි භික්ඛූහි වත්ථුං දේසෙතබ්බං අනාරම්භං සපරික්කමනන්ති, තේහි පෙ සපරික්කමනං යනු, තේහි භික්ඛූහි, ඒ භික්ෂූන් විසින්, කිපිල්ලිකාදිනං, කුහුඹුවන් ආදීන්ගේ, ආසයාදිහි, වාසස්ථානාදීවූ, තෙරසහි උපද්දවෙහි, තෙළෙස් උපද්‍රවයන්ගෙන්, පුබ්බන්න පරන්න නිස්සිතාදිහි, සස්‍ය උදු මුං ආදී වූ, සොළසහි උපද්දවෙහි, සොළොස් උපද්‍රවයන්ගෙන්. විරහිතත්තා, වෙන් වූ බැවින්, අනාරම්භං කඩිගුල් ආදී භයනැත්තා වූ, ද්විහිවාචතුහිවා බලිවද්දෙහි, ගවයන් දෙදෙනෙකුගෙන් හෝ සතර දෙනෙකුගෙන් හෝ, යුත්තේන, යොදන ලද්ද වූ, සකටෙන, ගැල කරණකොටගෙන, ඒකංචක්කං, එක් ගැල්සකක්, නිම්බොදකපතනට්ඨානෙ, පියසි ජලය වැටෙන තන්හි, ඒකංචක්කං, එක් ගැල් සකක්, බහිකත්වා, පිටත්හි කොට, අචිකද්චිතුං, හැසිරෙනු පිණිස, සක්කුණෙයනාය, හැකිවිය යුතු බැවින්, සපරික්කමණන්ති. ගැල්සක හැසිරීමට සුදුසු උපචාර ඇත්තේ යයි, සල්ලක්ඛෙත්වා, සළකා, සංඝපහොනකා, සංඝයාට පොහොනා හු, සචෙහොන්ති, ඉදින් වෙද්ද, තත්ථෙව, ඒ කුටිවස්තුවෙහිම, නොවෙහොන්ති, ඉදින් නොපොහොනාහු වෙද්ද, සංඝමජ්ඣංගන්ත්වා, සග මැදට ගොස්, තේනභික්ඛුනා, ඒ කිළිය කරනු කැමති මහණාහු විසින්, යාචිතෙහි, යාච්ඤාකරනු ලැබූ භික්ෂූන්

විසින්, ඤත්ති දුතියේන කම්මේන, ඤත්තිය දෙවෙනි කොට ඇති කර්මයෙන්, වත්ථුං, කුටිවස්තුව, දෙසෙතබ්බං, දෙසිය යුතුයි. සාරම්භෙවෙති ආදි, සාරම්භාවෙ යනාදි වචනය, පටිපක්ඛනයෙන, කියන ලද්දට ප්‍රතිපක්ෂනයින්, වේදිතබ්බං දත යුතුයි. ආලවියං, අලව් නුවර, ආලවකෙ භික්ඛු ආරබ්භ, අලව් රට වැසි භික්ෂූන් අරභයා, සංයාචිකාය, තමාවිසින් ඉල්වාගන්නා ලද උපකරණයෙන්, කුටිකාරවත්ථුස්මිං, කිළියක් කළ වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. අසාධාරණ පඤ්ඤත්ති, භික්ෂූනීන්ට සාධාරණ නොවූ ප්‍රඥප්තියයි. සාණත්තිකං, ආණත්තික සහිත වෙයි. අදෙසිත වත්ථුකං, නොදක්වන ලද කුටි වස්තුව ඇත්තා වූ, පමාණාතික්කන්තං, දිලපුළුල ප්‍රමාණ ඉක්ම ගියා වූ, කුටිංකාරෙය්‍යාමිති, කිළියක් කරවන්නෙම්යි, උපකරණත්ථං, දැව ආදි උපකණ පිණිස, අරඤ්ඤගමනතො, පට්ඨාය, වනයට යන ගමන පටන්, සබ්බපයොගෙසු, සියලු ප්‍රයෝගයන්හි, දුක්කටංහොති, දුකුළා ඇවැතක් වෙයි. ඉදනි, දැන් ද්වීහිපිණ්ඩෙහි, මැටිගුළි දෙකකින් නිට්ඨානංගමිස්සති, නිමා වටයන්නේ ද, එතේසුද්විසු, ඒ මැටිගුලි දෙක අතුරෙන්, පඨමපිණ්ඩදනෙ, පළමුවන පිඩය දීමෙහි, ථුල්ලච්චයංහොති, ථුලසි ඇවැත වෙයි. දුතිය පිණ්ඩදනෙ, දෙවෙනි පිඩ දීමෙහි, ලෙපෙඝට්ටෙ, ලේපනය ගලපන ලද කල්හි, අදෙසිත වත්ථුකාඑච්චා, නොදෙසන ලද කුටි වස්තු ඇත්තිම හෝ, පමාණාතික්කන්තාඑවවා, දිගපුළුල ප්‍රමාණය ඉක්මවූවාම හෝ, සචෙහොති, ඉදින් වේනම්, එකොසංඝාදිසේසො, එක් සංඝාදිසේසයක්ද, ද්වෙදුක්කටානි, දුකුලා ඇවැත් දෙකක්ද, හොන්ති, වෙත්, සචෙ, ඉදින්, උභයවිපන්නා. දෙදෙනම වැරදුනාහුවෙත් නම්, ද්වෙසංඝාදිසේසා, සංඝාදිසේසයෝ දෙදෙනෙක්ද, ද්වෙව දුක්කටානි, දුකුලා ඇවැත් දෙකක් ද, හොන්ති, වෙත්, සචේපන, ඉදින් වනාහි, ද්වාරබන්ධනංවා, දෙරබාවහෝ. වාතපානංවා, කවුළු දෙර හෝ අට්ඨපෙත්වාව, නොතබාම, මත්තිකායලිම්පති, මැටියෙන් ලේපනය කෙරේද, තස්මිං, ඒ දෙර බා වහා ජනේල දෙර, ඨපිතෙච, තැබූ කල්හිද, පුබ්බං, පළමුකොට, ලේපො, දෙනලද ලේපනය තෙමේ, තේන, ඒ දෙරබා වහා ජනේල දෙර, නඝට්යති, නොගලපනු ලැබේද, තාවරක්ඛති. ඒ තාක් රකී, (මෙසේ පාඨශේෂය යොද සම්බන්ධ කටයුතුයි. සමහර පොත්හි 'ලෙපොනඝට්යතිරක්ඛතිතාව" යනු පමණක් ඇත්තේයි. "ලෙපො" යන පදය තෙමේ "අපෙතො" යන්නෙහි

අකාරලොපය කොට "පෙතො" යි දක්නාක් මෙන් ද "දේවදත්තො" යන්නෙහි දෙව ශබ්දය ලොප් කොට "දත්තො" යි දක්නාක් මෙන්ද "ආලෙපො" යන්නෙහි ආකාරය ලොප්කොට "ලෙපො" සිටියේ යයි දත යුත්තේයි. එහෙයින් ටීකායෙහි "ලෙපොනඝට්යතීති පුබ්බදින්නලෙපොද්වාරබන්ධනේනවා වාතපානෙනවාසද්ධිං නඝට්යති" යනාදිය කථිතයි. සාරාර්ථදීපනී ටීකායෙහි ද මෙසේම ආයේයි) පුන, නැවත, ලිම්පන්තස්සපන, ලේපනය කරන්නා වූ මහණහට වනාහි, ඝට්තමත්තෙ, ගැලපූ මාත්‍රයෙක්හි, සංඝාදිසේසො, සංඝාදිසේසාපත්තිය තෙමේ, හොති, වෙයි. සචෙ, ඉදින්, ඨපියමානං, තබනු ලබන්නාවූ, තං, ඒ දෙර බා වහා ජනේල දෙර, පඨම දින්නලෙපෙනසද්ධිං, පළමු දුන් ලේපනය හා සමග, නිරන්තර මේ වහුත්වා, අතුරක් නැතුවම වී. තිට්ඨති. සිටිද තේසං, ඒ දෙරබාවහා කවුළු දෙර, ඨපන්තො, තැබීමෙන්, පඨමමේව, පළමුකොටම, සංඝාදිසේසොහොති, සංඝාදිසේසය වෙයි. කේවලං ශුදෙක්, සාරම්භාය, භයසහිත පෘථිවියෙහි, දුක්කටංහොති. දුකුලා ඇවැත වෙයි. තථා, එපරිද්දෙන්, අපරික්කමනාය, ගැල්සක හැසිරීමට නොපොහොනා භූමියෙහි, දුක්කටංහොති, දුකුලා ඇවැත වෙයි. විප්පකතං, නොනිමියා වූ අඩාල කිළිය, අඤ්ඤස්ස, අනික් මහණෙක් හට, දදතො. දෙන්නා වූ මහණ හටද, භූමිං සමං කත්වා, භූමිය සමකොට හින්දන්තස්සච බිඳින්නාවූ මහණහටද ලෙනගුහා තිණකුටි පණ්ණච්ඡදනගෙහෙසු, . ලෙණය ගඩොල් ආදියෙන් කරණ ලද්ද වූ ගුහාය තෘණාදියෙන් සෙවෙනි කරණ ලද්ද වූ කිළිය වෘක්ෂපත්‍රාදියෙන් සෙවෙනි කරණ ලද කිළිය යන මොවුන් අතුරෙන්. අඤ්ඤතරං, එක්තරා කිලියක්, කරොන්තස්සච, කරන්නාවූ මහණහටද, කුටිම්පි, උල්ලිත්තාදිවූ කුටියක්ද, අඤ්ඤස්සවා සත්ථාය, අනිකෙකුගේ විසීම පිණිස, වාසාගාරංවා. වසන ගෙයක් හෝ, ඨපෙත්වා, තබා, උපෝසථාගාරාදිසු, පොහෝ ගෙවල් ආදීන් අතුරෙන්, අඤ්ඤතරත්ථාය, එක්තරා එකක් පිණිස, කරොන්තස්සච, කරනනාහටද, උම්මත්තකාදීනංච, උමතු භික්ෂූන් ආදීන්ටද, අනාපත්ති, ඇවැත නොවේ. සීලවිපත්ති, ශීලවිපත්තියයි. උල්ලිත්තාදිනං, උල්ලිත්තකුටි ආදීන් අතුරෙන්, අඤ්ඤතරතා, එක්තරා කුටියක් වන බවය. හෙට්ඨිමප්පමාණසම්භවො, යටත් පිරිසෙයින් පුලුල සතර රියනක් ඇති බවය. අදෙසිත වත්ථු කතා, නොදෙසන ලද කුටි වස්තුව ඇති බවය. කතපමාණාතික්කන්නතා, කියන ලද ප්‍රමාණය ඉක්මවූ බවය. ("භවාසකරා

සබ්බාධාතන්වත්ථා" යි කී බැවින් මෙහි කර ධාතුව විසින් උක්තාර්ථය වාචකවන්නේ යයි කල්පනා කටයුතුයි. සියලු පොත්හි "කතපමාණාතික්කන්තතා" යන පාඨය ඇති හෙයින් මෙසේ කල්පණා කටයුතුයි. සාරාර්ථදීපනී ටීකායෙහි වනාහි පමාණාතික්කන්තාතා" යන මාත්‍රයක් දක්නා ලැබේ) අත්තුද්දේසිකතා, තමා උදෙසා කරණ ලද බවය. වාසාගාරතා, වසන වෙහෙරක් වන බවය. ලෙපඝටනා, ලේපනය සම්බන්ධ කිරීමය. ඉති ඉමානිච්ඡා, මේ කාරණායෝ සදෙන හෝ, සත්තවා, සත්දෙන හෝ, ඒත්ථ, යන මේ ශික්ෂා පදයෙහි, අංගානි, අංගයෝයි. ජසමුද්ධානං, සමුද්දන සදෙනෙක් ඇත්තේයි. කිරියාව, ක්‍රියාවෙන්ද ඇවැත නගින්නේයි, ක්‍රියා ක්‍රියාව, ක්‍රියාවෙන් හා අක්‍රියාවෙන් ද ඇවැත නගින්නේය, හි, ඒ වචනය යෙදේ මැයි, ඉදංසික්ඛාපදං, මේ ශික්ෂා පදය තෙමේ, වත්ථුං, කුටි වස්තුව, දෙසාපෙත්වා, දේශනා කරවා, පමාණාතික්කන්තංවා, ප්‍රමාණය ඉක්මවීම හෝ (මෙහි වා ශබ්දය වනාහි "අයංවාසො මහානාගො" යනාදියෙහි මෙන් අවධාරණාර්ථයෙහි වැටේ) කරොතො. කරන්නා වූ මහණහට කිරියතො සමුද්ධාති, ක්‍රියාවෙන් ඇවැත නගින්නේයි. අදෙසාපෙත්වා, කුටිවස්තුව දේශනා නොකරවා, කරොතො, කරන්නා වු මහණහට, කිරියාකිරිය තොසමුද්ධාති. ක්‍රියාවෙන් හා අක්‍රියාවෙන් ඇවැත නගින්නේයි. ඒත්ථ, මේ ශික්ෂා පදයෙහි, සෙසං අවසෙසාර්ථය, සඤ්චරිත්තතෙ සිඤ්චරිත්ත ඔශික්ෂාපදයෙහි වුත්ත සදිසමේව, කියන ලද්දට සදෘශමැයි, (කුටි වස්තුව දේශනා නොකොට ප්‍රමාණ යුක්ත වූ කුටියක් කරන්නා වූ මහණහටද අකිරිය සමුට්ඨාන වූ ඇවැතක් නැගිය යුතු හෙයින් "කිරියාව අකිරියාව ක්‍රියා ක්‍රියාව" යනු කියයුතු නමුදු ඒ අකිරිය සමුට්ඨානය කිරියාකිරිය සමුට්ඨානයෙහි සංග්‍රහකොට ගත් හෙයින් විශේෂය නොකියන ලදී. එහෙයින් අදෙසනස්ථානයෙහි "පමාණංවා පමාණාතික්කන්තංවා" යි විශේෂ නොදක්වා "අදෙසාපෙත්වා කරොතො කිරියාකිරියතො සමුට්ඨාති" යන සාමාන්‍යය කීයේය යනු ආචාර්ය පරම්පරාගත මතයයි)

**ඡට්ඨම සික්ඛාපදං, සවෙනි ශික්ෂාපදයයි.**

සත්තමෙ, සත්වෙනි ශික්ෂාපදයෙහි, මහල්ලකන්ති. මහල්ලකං යනු, සස්වාමිකභාවෙන, ස්වාමියෙකු ඇතිබැවින් සංයාචිතකුටිතො, සංයාචිත කුටිය

කෙරෙන් නොහොත් කුටියට වඩා, මහන්තභාවො, මහත්බවක්, එතස්ස, ඒ විහාරයට අත්ථි ඇත්තේද ඉති (තස්මා) එසේ හෙයින්, මහල්ලකො, මහල්ලක නම් වේ. වා, නොහොත්, යස්මා, යම් හෙයකින්, වත්ථුං, කුටි වස්තුව, දෙසාපෙත්වා, දේශනා කරවා, පමාණාතික්කමෙනාපි, ප්‍රමාණය ඉක්මවීමෙනුදු, කාතුං වට්ටති, කරන්නට වටනේද, තස්මා, එසේ හෙයින් පමාණ මහන්තතායපි, ප්‍රමාණමහන්තත්වයෙනුදු, මහල්ලකො, මහල්ලක නම් වේ. තංමහල්ලකං, ඒ මහත් වූ විහාරය, යස්මාපන, යම් හෙයකින් වනාහි, අස්ස, ඒ විහාරයාගේ, පමාණ මහන්තතං, පමණ මහත් බව, සස්සාමිකත්තාව, ස්වාමියෙක් සහිත බැවින්ම, ලබ්භති, ලැබේද, තස්මා, එසේ හෙයින්, තදත්ථදස්සනත්ථං, ඒ අර්ථය දක්වනු පිණිස, මහල්ලකොනාම විහාරො සස්සාමිකො වුච්චතිති මහල්ලකො පෙ වුච්චති යනුවෙන්, ඒවං, මෙසේ, අස්ස, ඒ මහල්ලකං යන පදයාගේ, පදභාජනං වුත්තං, පදභාජනීය කියන ලදී. සෙසං, අවශේෂවූ, සබ්බං, සියලු අර්ථය, කුටිකාර සික්ඛාපදෙ, කුටිකාර ශික්ෂාපදයෙහි වුත්තසදිසං, කියන ලද්දට සදෘශ මැයි, හි, ඒ වචනය යෙදේමැයි, සස්සාමිකභාව මත්තමේව, ස්වාමියෙක් සහිත බැව් මාත්‍රයක්ම විසේසං, වෙනසි කොසම්බියං, කොසඹෑනුවර, ඡන්නත්ථේරං ආරබ්භ, ඡන්නස්ථවිරයන් අරභයා, චේතිය රුක්ඛං, මිනිසුන් විසින් පුදන ලද වෘක්ෂයක්, ඡේදපනවත්ථුස්මිං, සිඳුවාලු වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තිභාවොච, පැණවූ බවද, අකිරියාමත්තතො, අකිරිය මාත්‍රයකින් හෙවත් නොකිරීම් පමණකින්, සමුට්ඨානභාවොච, ඇවැත නගින බවද, එකසංඝාදිසේසතාව, එක්සංඝාදිසේසයක් බවද, ඒත්ථ, මේ ශික්ෂා පදයෙහි, විසෙසො, වෙනසී

## සත්තම සික්ඛාපදං, සත්වෙනි ශික්ෂා පදයයි.

අට්ඨමෙ, අටවෙනි ශික්ෂාපදයෙහි, දුට්ඨෝදෙසොති, දුට්ඨොදෙසො යනු, දුසිතො චේව, දුෂ්‍ය කරණ ලද්දේද, දූසකොව, දුෂ්‍ය කරන්නේද, හි, විස්තාර කෙරෙමි, දෙසෙළුප්පන්නෙ, ද්වේෂය උපන් කල්හි, පුග්ගලො, පුද්ගලයා, තේනදෙසෙන, ඒ ද්වේෂය විසින්, දුසිතොහොති, විනාශ කරන ලද්දේ හෙවත් දුෂ්‍ය කරණ ලද්දේ වෙයි. පකතිභාවං, ප්‍රකෘති ස්වභාව, ජහාපිතො, හරණ ලද්දේ

වෙයි. තස්මා, එසේ හෙයින්, දුට්ඨාති වුච්චති, දුට්ඨයයි කියනු ලැබෙයි. පරංච, මෙරමාද, දූසෙති, විනාසෙති, දුෂ්‍ය කෙරේද විනාශ කෙරේද, තස්මා, එසේ හෙයින්, දෙසොති වුච්චති, දේසයයි කියනු ලැබෙයි. ඉති, මෙසේ, දුට්ඨොදෙසොති ඒතං, දුද්ඨොදෙසොයන මේ ශබ්ද යුග්මය තෙමේ, එකස්සෙව පුග්ගලස්ස, එකම පුද්ගලයෙක් හුගේ, ආකාරනානත්තෙන, ආකාර විශේෂය කරණ කොට ගෙන, නිදස්සනං, දැක්වීමට හේතු වූ ශබ්ද යුග්මයකි. අප්පතීතොති, අප්පතීතො යනු, නපීතිතො, ප්‍රීතිසුඛාදීන් හා අසම්පූර්ණ වූ, පීතිසුඛාදීහි, ප්‍රීතිසුඛාදීන් විසින්, විවජ්ජිතො, පියන ලද්දේයි, අභිස්සටො, නොපෙරලෙන්නේයි. ඉති අයං, මේ එනාහි, අන්ථො. අර්ථයි. අමූලකෙනාති, අමූලකෙන යනු, යංපාරාජිකං, යම් පාරාජිකාපත්තියක්, චෝදකෙන, චෝදක පුද්ගලයා විසින්, චුදිතකම්හිපුග්ගලෙ, චෝදනාකරනු ලැබූ පුද්ගලයා කෙරෙහි, අදිට්ඨං, නොදක්නා ලද්දේයි. අසුතං, නොඅසන ලද්දේයි. අපරිසංකිතං, සැක නොකරන ලද්දේයි. ඉදං, මේ පාරාජිකා සංඛ්‍යාත වූ ආපත්ති තොමෝ, එතෙසංදස්සනසවණ පරිසංකිත සංඛ්‍යාතානං මූලානං, ඒ දැකීමය, ඇසීමය සැක කිරීමයයි කියන ලද මූලයන්ගේ. අභාවතො, නැතිහෙයින්, අමූලකංනාම, අමූලක නම්වෙයි. තංපන, ඒ පාරාජිකාපත්තියට එනාහි, සො, ඒ චෝදනා කරණු ලැබූ මහණ තෙමේ, ආපන්නොවාහොතු, පැමිණියේ හෝ වේවා. අනාපන්නොවාහොතු, නොපැමිණියේ හෝ වේවා, ඒතං, ඒ පැමිණීම හා නොපැමිණීම, ඉධ, මේ ශික්ෂා පදයෙහි, අප්පමාණං, ප්‍රමාණ නොවෙයි. ඒත්ථච, මේ අදිට්ඨාදීන් අතුරෙන්ද, අදිට්ඨංනාම. අදිට්ඨ නම්, අත්තනො, තමාගේ, පසාදචක්ඛුනාවා, ප්‍රශාදචක්ෂුස කරණ කොට ගෙන හෝ, දිබ්බචක්ඛුනාවා, දිව්‍යචක්සුස කරනකොටගෙන හෝ. අදිට්ඨං, නොදක්නා ලද්දයි. අසුතංනාම, අසුත නම්, තථේව, එපරිද්දෙන්ම, කෙනචි, යම්කිසිවෙකු විසින් වුච්චමානං, කියනු ලබන මානය, න සුතං, අසන ලද්දයි, අපරිසංකිත නම්, අත්තනො වා, තමාගේ හෝ, පරස්ස වා, මෙරමාගේ හෝ, දිට්ඨ සුතමුත වසෙන, දක්න ලද්ද අසන ලද්ද ස්පර්ශ කරන ලද්ද වශයෙන් චෙතසා සිතින් අපරිසංකිතං, සැකනොකරන ලද්ද වූ, ඉතිඑවරූපෙන, මෙබඳු ස්වභාව ඇත්තා වූ, අමූලකේන, නිර්මල හෙවත් මූලක් නැත්තා වූ, පාරාජිකෙනාති, පාරාජිකෙන යනු, භික්ඛුනො, භික්ෂුවක් හට, අනුරූපෙසු, සුදුසු වූ, එකූනවීසතියා පාරාජිකෙසු, එකුන්විසි පාරාජිකාවන් අතුරෙන්, අඤ්ඤතරේන, එක්තරා පරිපීඇවැතකින්,

පදභාජනෙජ්ජන, පදභාජනියෙහි වනාහි, පාරාජිකුද්දේසෙ, පාරාජිකොද්දේශයෙහි, ආගතානෙව, ආවාවූ පරිදිම, ගහෙත්වා, ගෙන, චතුන්නං, අඤ්ඤතරෙනාති, චතුන්නං අඤ්ඤතරෙන යනු, වුත්තං, කියන ලදී. අනුද්ධංසෙය්‍යාති, අනුද්ධංසෙය්‍ය යනු, ධංසෙය්‍ය විද්ධංසෙය්‍ය පධංසෙය්‍ය, විනාශකරන්නේ වී නම්, අභිභවෙය්‍ය, හිංසාකරන්නේ වී නම්, තංපන අනුද්ධංසනං, ඒ විනාශ කිරීම, යස්මා, යම්හෙයකින්, අත්තනා, තමා විසින්, චොදෙන්තොපි, චෝදනා කරන්නේ ද අත්තන, තමා විසින් පරෙන, මෙරමාලවා, චොදපෙනේතොපි, චොදනා කරවන්නේද, කරොති, කෙරේද, තස්මා, එයේ හෙයින්, අය්ස, ඒ අනුද්ධංසෙය්‍ය යන පදයාගේ, පදභාජනෙ, පදභාජනියෙහි, චොදෙතිවා, චොදාපෙතිවා චොදෙති, පෙ වායනු, වුත්තං, කියන ලදී. තත්ථ, ඒ වචනයෙහි, වත්ථුසන්දස්සනා, වස්තුව දැක්වීමය. ආපත්ති සන්දය්සනා, ඇවත දැක්වීමය. සංවාසපටික්ඛෙපො, සංවාසය පිළිකෙව් කිරීමය හෙවත් ධර්‍මසම්භොගය හැරීමය. සාමීචිපටික්ඛෙපො, ගරු බුහුමන් කිරීම පිළිකෙව් කිරීමය, ඉති (එවං) මෙසේ, සංඛෙපතො, සැකෙවින්, චතස්සො චෝදනාහොන්ති, චොදනාවෝ සතර දෙනෙක් වෙත්, තාසු, ඒ චතුර්විධ චෝදනාවන් අතුරෙන්, වත්ථු සන්දස්සනානාම, වස්තුව දැක්වීම වනාහි, ත්වං, තෝ, මෙථුනංධම්මං පතිසෙවී, මෙවුන් දම් සෙවුනෙවෙහිය, ඉති ආදිනානයෙන, මේ ආදී ක්‍රමයෙන්, පවත්තා, හටගත්තා වූ චෝදනාවයි. ආපත්ති සංදස්සනා නාම ඇවත දැක්වීම වනාහි, ත්වං තෝ මෙථුන ධම්මා පත්තිං, මෙවුන්දම් සෙවීම සංඛ්‍යාත වූ ඇවතට ආපන්නෝ ඉති, පැමිණියෙහි යයි ආදිනානයෙන මේ ආදි ක්‍රමයෙන්, පවත්නා හටගත්තා වූ චෝදනාවයි සංවාස පටික්ඛේපොනාම, සංවාසපටික්ඛේපය වනාහි, තයාසද්ධිං, තාහා සමග, උපොසථොවා, පොහෝ කිරීමක් හෝ, පවාරණාවා, පවාරණය කිරීමක් හෝ, සංඝකම්මංවා, සංඝකර්මයක් හෝ, නත්ථිති, නැතැයි, ඒවංපවත්තා, මෙසේ හට ගත්තා වූ චෝදනාවයි. එත්තාවතාපන, මෙපමණකින් වනාහි, සීසංනඑති, මස්තක ප්‍රාප්ත නොවෙයි හෙවත් සංඝාදිසේසාපත්තිය නොවෙයි. අස්සමණො අසි, අශ්‍රමණයෙක් වූයෙහිය. ඉති ආදි වචනෙන සද්ධිං, යන මේ ආදී වචනය හා සමග, ඝටිතෙයෙව, චෝදනාව සම්බන්ධ කළ කල්හිම, සීසං එති, මස්තක ප්‍රාප්ත වෙයි හෙවත් සංඝාදිසෙසාපත්තිය වෙයි. සාමීචිපටික්ඛේපොනාම, සාමීචි ප්‍රතික්ෂේපය වනාහි, අභිවාදන පච්චුට්ඨාන

අඤ්ජලිකම්ම සාමීචිකම්ම වීජනිකම්මාදීනං, වැඳීමය දැක හුනස්නෙන් නැගිට පෙර ගමන් යාමය ඇඳිලි බැඳීමය බුහුමන් කිරීමය පවන් සැලීමය යනාදීන්, අකරණං, නොකිරීමයි, තං, ඒ කර්තව්‍යය පටිපාටියා, පිළිවෙලින්, වන්දනාදීනි, වැඳීම් ආදීන් කරොන්තො, කරන්නා වූ මහණ තෙමේ, එකස්ස අකත්වා, එක් භික්ෂුවක් හට නොකොට, සෙසානං, අවශේෂ වූ භික්ෂූන්ට, කරණකාලෙ, කරන්නාවූ කල්හි. වේදිතබ්බං, දතයුතුයි. එත්තාවතා, මෙපමණකින්. චෝදනා නාම හොති, චෝදනා කෙළේ නම් වෙයි. ආපත්තිපන, ආපත්ති තොමෝ වනාහි, සීසංන එති, මස්තකප්‍රාප්ත නොවෙයි. කස්මා, කුමක් හෙයින යත්? මම, මට, වන්දනාදීනි, වැඳීම් ආදීන්, නකරොසීති පුච්ඡිතෙ, නොකෙරෙහි දැයි විචාළ කල්හි, අස්සමණොඅසි. ශ්‍රමණයෙක් නොවෙහිය. ඉති ආදි වචනෙහි සද්ධිං, යන මේ ආදී වචනයක් හා සමග ඝටිතෙයේව, ගලපන ලද කල්හිම, සීසං එති, මස්තකප්‍රාප්ත වෙයි. තස්මා, එසේ හෙයින්, යොභික්ඛු, යම් මහණෙක් තෙමේ, භික්ඛුං, භික්ෂුවක්හට, සම්පෙ, සමීපයෙහි නොහොත් අභිමුඛයෙහි, ඨත්වා, සිට, ("සම්පෙතිද් වාදස හත්ථප්පමාණොපදෙසෙ" යනු ටීකායි. ගණ්ඨිපදයෙහිද මෙසේම ආයේයි" "පරතොපන දූතංවාපණ්ණංවා සාසනංවාපෙසෙත්වා චොදෙන්තස්ස සීසං න එතීති පරම්මුඛා චොදනායෙවච අනාපත්තියා වුත්තත්තා සම්පෙඨත්වාති ඉදං සම්මුඛභාව මත්තදස්සනත්ථං වුත්තන්ති අම්හාකංඛන්ති" යනු සාරාර්ථදීපනී ටීකායි. මත්තෙහි "පරම්මුඛාචොදෙන්තස්ස පන සීසංනඑතීති" යනුවෙන්ද අංගයන් දක්වන්නා වූ තන්හි "වාචනාධිප්පායෙන සම්මුඛාචෝදනා" යනු කියනු ලබන හෙයින්ද සම්මුඛාචෝදනාහුගේද ස්වභාව දෙළොස් රියන් තැනයයි ඒකාන්තයෙන් නොදත යුතු හෙයින්ද විනිශ්චය ස්ථානයට පැමිණ ගරුකයෙහිම සිටිය යුතු යයි කිහෙයින්ද පරීක්ෂාකොට ගත යුතුයි) ත්වං, තෝ, මෙථුනංධම්මං, මෛථුනධර්මය, පතිසෙවිතිවා, පිළිසෙව්නෙ යයි කියා හෝ, අස්සමණොසීතිවා, අශ්‍රමණයෙක් වූයෙහි යයි කියා හෝ ඉති ආදි වචනෙහිවා, යන මේ ආදී වචනයෙන් හෝ, (ආදි හි යන්නට පූර්වයෙහි එක් ඉති ශබ්දයක් ලොප් කෙළේය. මෙබඳු පාඨයක් ඇත්තේ වී නම් ඉති ශබ්දය ලොප් වූතැන් බොහෝයි. "කුසලාතිවා ධම්මාතිවා ආදීසු" යනාදියෙහි මෙනි) හත්ථමුද්දියා එවවා, අත්මිටින් ම හෝ, එතමත්ථං, ඒ අර්ථය, දීපෙන්තො, ප්‍රකාශ කරණුයේ, සයංවා, තෙමේ හෝ, චොදෙති, චෝදනා කෙරෙයි, ගහට්ඨපබ්බජිතෙසු,

ගිහිපැවිද්දන් අතුරෙන්, අඤ්ඤතරෙනවා, එක්තරා කෙනෙකු ලවා හෝ, චොදාපෙති. චෝදනා කරවයි, අයං, මේ භික්ෂු තෙමේ, අනුද්ධංසෙති නාම, අනුද්ධංසනය කරවයි නම් වේ හෙවත් චෝදනා කරවන්නේ නම් වෙයි. අප්පෙවනාමනං ඉම මහා බ්‍රහ්මචරියාචා චෙය්‍යං ඉති, අප්පෙවනාම පෙ චාවෙය්‍යං යනු, තං පුග්ගලං, ඒ පුද්ගලයා, ඉම්මහාසෙට්ඨචරියා, මේ උතුම් වූ ප්‍රතිපත්තියෙන්, අපි එව නාම අපනෙය්‍යං, පහකරවිය හැකි වෙම් දැයි නොදැනේ. අහං, මම, ඉමංපුග්ගලං, මේ පුද්ගලයා, ඉම මහා බ්‍රහ්මචරියා, මේ ශාසන බ්‍රහ්මචය්‍යීාවෙන්, සචෙචාවෙය්‍යං, ඉදින් පහකරවූයේ වී නම්, එසාචාවනා, මේ පහකරවීම, චත (එකන්තෙන) ඒකාන්තයෙන්, සාධුඅස්ස, (භවෙය්‍ය) යහපත් වන්නේය. ඉති ඉමිනා (අධිප්පායෙන) යන මේ අභිප්‍රායෙන්, අනුද්ධංසයත, චෝදනා කරන්නේ වීනම්, ඉති, (අයං අධිප්පායො) මේ අධිප්‍රාය, වුත්තං (වුත්තොහොති) කියන ලද්දේ වෙයි. එතේන, ඒ ඉම මහා බ්‍රහ්මචරියාචාවෙය්‍යං යන පාඨයෙන්, එකංචාවනාධිප්පායං, එක් පහකරණු කැමැත්තක්, ගහෙත්වා, ගෙන, අවසෙසා, අවශිෂ්ට වූ, අක්කොසාධිප්පායො, ආක්‍රොශකරණු කැමැත්තද, කම්මාධිප්පායො, තර්පනියාදී සත් වැදෑරුම් කර්ම කරනු කැමැත්තද, වුට්ඨානාධිප්පායො, ඇවතින් නැගිටුවනු කැමදත්ද උපොසථට්ඨපනාධිප්පායො පොහෝ කිරීම නවත්වනු කැමැත්තද අනුවිජ්ජනාධිප්පායො, විනිශ්චය කරණු කැමැත්තද, ධම්මකථාධිප්පායො, දහම් දෙසනු කැමැත්තද, ඉති ඉමෙ සත්තඅධිප්පායා, මේ සත් වැදෑරුම් අධිප්‍රාචෝ, පටික්ඛිත්තාහොන්ති, පිළිකෙව් කරණ ලද්ද හුවෙත්, තතො අපරෙන සමයෙනාති තතො අපරෙන සමයෙන යනු යස්මිං සමයේ යම් කලෙක්හි, අනුද්ධංසිතො හොති චෝදනා කරන ලද්දේ ද තතො ඒ චෝදනා කරණ කාලයෙන්, අඤ්ඤස්මිංසමයෙ, අනික් කාලයෙක්හි, සමනුග්ගාහිය මානොවාති, සමනුග්ගාහිය මානොවා යනු, අනුවිජ්ජකේන, විනිශ්චය කාරක භික්ෂුහු විසින්, තෙ, තාවිසින්, කිංදිට්ඨං, කුමක් දක්නා ලද්දේද, ඉති ආදිනානයේන, යන මේ ආදී ක්‍රමයෙන්, අනුවිජ්ජිය මානො, විනිශ්චය කරනු ලබන්නේ, උපපරික්ඛියමානො, පරීක්ෂාකරනු ලබන්නේ, අසමනුග්ගාහිය මානොවාති, අසමනුග්ගාගයමා නොවා යනු, දිට්ඨාදිසු, දක්නා ලද වස්තු ආදීන් අතුරෙන්, කෙනච් වත්ථුනාවා, කිසි වස්තුවක් කරණ කොට ගෙන හෝ අනුවිජ් ජකාදිසු, විනිශ්චය කාරාදීන් අතුරෙන්, යේන කෙනච් පුග්ගලෙනවා, යම්කිසි

පුද්ගලයෙකු විසින් හෝ .අවුච්චමානොවා, නොකියනු ලබමින් හෝ ඉමෙසංපනපදනං, මේ සමනුග්ගාහියමානොවා යනාදි පදයන්ගේ, පරතො, මත්තෙහි, භික්ඛුචදේසං පතිට්ඨාතිහි ඉමිනා, භික්ඛුව දේසං, පතිට්ඨාති යන මේ පදය හා සමග, සම්බන්ධොකාතබ්බො, සම්බන්ධය කටයුත්තේයි. හි, ඒ එසේ මැයි, ඉදං (අයං අධිප්පායො) මේ අධිප්‍රාය, වුත්තං (වුත්තොහොති) කියන ලද්දේ වෙයි. ඒවං, මෙසේ, සමනුග්ගාහිය මානොවා, විනිශ්චය කරණු ලබන්නා . වූ හෝ, අසමනුග්ගාහිය මානොවා විනිශ්චය කරනු නොලබන්නාවූ හෝ භික්ඛුව, මහණ තෙමේද, දෙසං, දේෂය හෙවත් වරද, පතිට්ඨාති පටිච්චතිට්ඨති පටිජානාති, ප්‍රතිඥා කෙරේද හෙවත් පිළිගන්නේ වී නම්, සංඝාදිසේසොහොති, සංඝාදිසෙසාපත්තිය වෙයි. ඉති අයං, මේ වනාහි, අධිප්පායො, අභිප්‍රායයි. ඉදං වචනඤ්ච, මේ වචනයද, අමූලක භාවස්ස, අමූලකභාවයාගේ, පාකට කාලදස්සනත්ථං, ප්‍රකට කාලයක් දක්වනු පිණිස. වුත්තං, කියන ලදී. ආපත්තිංපන, ඇවතට වනාහි, අනුද්ධංසිතක්ඛණෙයෙව, චෝදනා කළ ක්ෂණයෙහිම, ආපජ්ජති, අවදනේයි. අමූලකංචේව තංඅධිකරණං හොතීති ඒත්ථපන, අමූලකං පෙ හොති යන මේ පාඨයෙහි වනාහි, දිට්ඨමූලාදීනං, දක්නා ලද්ද සංඛ්‍යාත මූලාදීන්ගේ, අභාවෙන, අවිද්‍යාමාන භාවයෙන්, අමූලකං, අමූලක නම් වෙයි. සමථෙහි, සමථයන් විසින්, අදිකරණීයභාවෙන, ආපත්තාධිකරණය කටයුතු බැවින්, අධිකරණං, අධිකරණ නම් වේ. හි, ඒ එසේ මැයි, යං, යම් කෘත්‍යයක්, අධිකිච්ච ආරබ්භ, කාරණාකොට ගෙන, පටිච්ච, යම් කෘත්‍යයක් පිණිස,. සන්ධාය, යම් කෘත්‍යයක් සඳහා, සමථාපවත්තන්ති. සමථයෝ තුමූ හටගණිද්ද, තං, ඒ කෘත්‍යය තෙමේ, අධිකරණං, අධිකරන නම් .වේ. ඉධපන, මේ ස්ථානයෙහි වනාහි, පාරාජිකසංඛ්‍යාතං, පාරාජිකායයි කියන ලද්ද වූ, ආපත්තාධිකරණමේව, ආපත්තාධිකරණංයම, අධිප්පේතං, කැමතිවන ලදී. යදිහි, ඉදින් වනාහි, තංඅදිකරණං, ඒ අධිකරණය තෙමේ, දිද්ධාදිහි මූලෙහි, දක්නා ලද වස්තු ආදී මූලයන් කරණකොටගෙන,, මූලකං වෙචහොති. මූලක් නැත්තේම වේද, චොදෙතුං, චෝදනා කරන්නට, ආගතො, ආවාවූ, අයංච භික්ඛු, මේ භික්ෂුතෙමේද, දේසං, වදතය, මයා, මා විසින්, තුවිජකා භණිතං, හිස්වූ වචනයක් කියන ලද්දේය. ඉති ආදීනි. යන මේ ආදී වචනයන්, වදන්තො, කියනුයේ, පතිට්ඨාති පටිච්චතිට්ඨති පටිජානාති, පිළිගණී නම්, තස්ස භික්ඛුනො,

ඒ මහණහට අනුද්ධංසිතක්ඛණෙයෙව, චෝදනා කළ ක්ෂණයෙහිම, සංඝාදිසේසොහොති, සංඝාදිසේසාපත්තිය වෙයි. අයං, මේ කියන ලද්දේ සික්ඛාපදස්ස, ශික්ෂා පදයාගේ, පදනුක්කමේන, පදයන්ගේ පිළිවෙලින්, අත්ථො. අර්ථයි.

රාජගහෙ, රජගහනුවර, මෙත්තිය භුම්මජකෙ, මෙත්තිය භුම්මජක නම් වූ, භික්ඛු ආරබ්භ, භික්ෂූන් කාරණකොටගෙන, අමූලකේන, මුලක් නැත්තා වූ, පාරාජිකේන, පාරාජිකාපත්තියෙන්, අනුද්ධංසන, වත්ථුස්මිං, චෝදනා කිරීම් සංඛ්‍යාත වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. සාධාරණ පඤ්ඤත්ති, භික්ෂූන්ට සාධාරණ වූ පැණවීමයි. සාණත්තිකං, ආණත්ති සහිතයි. කතූපසම්පදං, කරණ ලද උපසම්පද කර්ම ඇත්තා වූ, සුද්ධංවා, පිරිසිදු වූ හෝ, අසුද්ධංවා, අපිරිසිදු වූ හෝ. පුග්ගලං, පුද්ගලයෙකු යේන පාරාජිකේන, යම් පාරාජිකා පත්තියකින්. චොදෙති, මේ හෙයාද, තං ඒ පාරාජිකා පත්තියට අයං, මේ පුද්ගල තෙමේ, අනජ්ඣාපන්නෝනාතිසඤ්ඤා, නොපැමිණියේ යයි දැන, චාවනාධිප්පායෙන, ශාසනයෙන් පහ කරණු කැමැත්තෙන්. ආයස්මා, ආයුෂ්මත් තෙමේ, ඔකාසංකරොතු අවකාශ කෙරේවා, අහං, මම, ත්වා, තොපට, වත්තුකාමො අම්හි ඉති, කියනු කැමැත්තේ වෙමියි, ඒවං, මෙසේ, ඔකාසං අකාරෙත්වා, අවකාශ නොකරවා, චො, දෙන්තස්ස, චෝදනා කරන්නාවූ මහණහට, සචෙ, ඉදින්, සො, ඒ චෝදනා කරණු ලැබූ මහණ තෙමේ තංඛණෙයෙව, එකෙණෙහිම, මං, මට, චොදෙති ඉති, චෝදනා කෙරේ යයි, ජානාති, දනීද, වා චායවාචාය, වචනයක් වචනයක් පාසා, සංඝාදිසේසොවේව, සංඝාදිසේසාපත්තියද, දුක්කටංච, දුකුලා ඇවැතද, හොති, වෙයි, ඔකාසංකාරෙත්වා, අවකාශ කරවා, චොදෙන්තස්ස, චෝදනා කරන්නාවූ මහණ හට, සංඝාදිසේසොයෙවහොති, සංඝාදිසේසාපත්තියම වෙයි. හත්ථමුට්ඨියා, අත්මිටින්, නොහොත් හස්ත මුද්‍රාවෙන්, සම්මුඛා, සම්මුඛයෙහි, චොදෙන්තස්සාපි, චෝදනාකරණ මහණහටද, එසෙ වනයො, මේ ක්‍රමය මැයි, පරම්මුඛා, අසම්මුඛයෙහි, චොදෙන්තස්සපන, චෝදනාකරණ මහනහට වනාහි, සීසංනඑති. මස්තකප්‍රාප්ත නොවෙයි. අත්තනා, තමා විසින්, ("චුදිතකස්ස" යනු අද්ධාහාරයි) චුදිතකස්ස, චෝදනා කරණු ලබන මහණහුගේ, සම්පෙ, සමීපයෙහි, නොහොත්, අභිමුඛයෙහි, ඨත්වා, සිට, අඤ්ඤං භික්ඛුං, අනික් මහණෙකු, ආණාපෙති,

ඇණාවාද, සො, ඒ ඇනවුම් ලැබූ මහණ තෙමේ. ,තස්ස, ඒ ඇණාවූ මහණාහුගේ, වචනෙන, වචනයෙන්. තං, ඒ චෝදනා කරනු ලැබූ මහණාහට. චෝදෙති, චෝදනා කෙරේද, චෝදපකස්සච, චෝදනාකිරීමට ඇණාවූ මහණාහටම, වුත්තනයාපත්තියො, කියන ලද කම ඇත්තා වූ ආපත්තිහු තුමූ, හොන්ති. වෙත්, අතපන, ඉදින් වනාහි, සොපි, ඒ ඇණාවුම් ලැබූ මහණාතෙමේද, මයාදිඨං, මා විසින් දක්නා ලද්දක්ද, අත්ථි, ඇත්තේය. සුතං, අසන ලද්දක්ද, අත්ථීති, ඇතැයි චොදෙති, චෝදනා කෙරේද, චිත්තංපිප්නානං, ඇණාවූ මහනය ඇණවුම් ලැබූ මහණ යන දෙදෙනා හටද, තථෙව, එපරිද්දෙන්ම, ආපත්තියො හොන්ති, ආපත්තිහු වෙත්, අක්කොසාධිප්පායෙන, ආක්‍රෝශකරණ අදහසින්, ඔකාසං, අවකාශය, අකාරෙත්වා, නොකරවා වදන්තස්ස. කියන්නාවූ මහණාහට, වුත්තනයේනෙච, කියන ලද ක්‍රමයෙන්ම, පාචිත්තියංචේච, පචිති ඇවැතද, දුක්කටංච, දුකුලා ඇවැතද, හොති, වෙයි, ඔකාසංකාරෙත්වා, අවකාශකරවා, වදනතස්ස, කියන්නා වූ මහනහට, පාචිත්තිය මෙවහොති, පචිත ඇවැතම වෙයි. කම්මාධිප්පායෙන, කර්මයන් කරණු කැමැත්තෙන්, අසම්මුකා, අසම්මුඛයෙහි. සත්තවිධං අපිකම්මං, සත් වැදෑරුම් වූද, කර්මය, කරොන්තස්ස, කරන්නා වූ මහණ හට, දුක්කට මෙ හොති, දුකුලා ඇවැතම වෙයි. වුට්ඨානාදිප්පායෙන. ඇවැතින් නැගිටුවනු කැමැත්තෙන්, ත්වං, තෝ, ඉත්ථංනාමපත්ථිං, මේනම් ඇවැතකට, ආපන්නො, පැමිණියේය. තං, ඒ ඇවැත, පටිකරොහි, පිළියම් කරව, ඉති වදන්තස්ස, මෙසේ කියන්නා වූ මහණාහට, උපෝසථංවා, පොහෝ කිරීම හෝ පවාරණංවා, පවාරණය කිරීම හෝ. ඨපෙන්තස්ස. නවත්වන්නා වූ මහණාහට. ඔකාසකම්මං නාම නත්ථි, අවකාශ කිරීමක් නම් නැත්තේයි, ඨපනබෙත්තංපන, නවත්වන ක්ෂේත්‍රය වනාහි, ජානිතබ්බං, දත යුතුයි. අනුවිජ් ජකස්සපි, විනිශ්චය කරණ මහණාහටද, වත්ථුස්මිං, වස්තුවක්, ඔසටෙ, සගමැදට පැමිණි කල්හි, තව, තොපට, ඒතං, ඒ අධිකරණය තෙමේ, අත්ථි, ඇත්තේද, මාවාඅත්ථි, නොමඇත්තේ දැයි, ("අත්ථෙතංමාවාති" යන පාඨය යෙදේ මැයි) ඉති (එවං) මෙසේ අනුවිජ්ජනාධිප්පායෙන, විනිශ්චය කරණ අභිප්‍රායෙන්, වදන්තස්ස. කියන්නා වූ මහණාහට, ඔකාසකම්මංනාමනත්ථි. අවකාශ කිරීමක් නම් නැත්තේයි. ධම්මකථිකස්සාපි, ධර්මකථික භික්ෂුවහටද, යො, යම් භික්ෂුවක් තෙමේ, ඉදංචඉදංච, මේ මේ කර්මයක්, කරොති, කෙරේද, අයං, මේ මහණ

තෙමේ, අස්සමණොති ආදිනානයෙන, අශ්‍රමණයෙක් වෙයි යනාදි ක්‍රමයෙන්, අනොදිස්සකංධම්මං, නොඋදෙසා කියන ලද ධර්මයක්, කථොන්තස්ස, කියන්නා වූ මහණහට, ඔකාසකම්මංනාමනත්ථි, අවකාශ කිරීමක් නම් නැත්තේය, සචෙපන, ඉදින් වනාහි, ඔදිස්ස, උදෙසා, නියමෙත්වා, නියමකොට, අසුකොච අසුකොච, අසවල් අසවල් මහණ තෙමේද, අස්සමණො, ශ්‍රමණයෙක් නොවෙයි, අනුපාසකො, උපාසකයෙක් නොවෙයි, ඉති. මෙසේ, කථෙති, කියානම්, ආසනතො, හුනස්නෙන්, ඔරුයහ බැස, ආපත්තිං සෙදෙත්වා, ඇවැත දෙසාගන්තබ්බං, යායුතුයි, උම්මත්තකාදීනඤ්ච, උමතු වූවන් ආදීන්ටද, අනාපත්ති, ඇවැත නොවෙයි. සීලවිපත්ති ශීල විනාශයයි, යංචොදෙති, යම් භික්ෂුවක්හට චෝදනා කෙරේද, තස්ස, ඒ භික්ෂුහුගේ උපසම්පන්නොති සංඛ්‍යුපගමනං, උපසම්පද යන සංඛ්‍යාවට පැමිණීමය, තස්මිං, ඒ භික්ෂුව කෙරෙහි, සුද්ධසඤ්ඤිතා, පාරාජිකා පත්තියෙන් පිරිසිදුය යන සංඥ ඇති බවය. යෙන පාරාජිකෙන,යි මි පාරාජිකා පත්තියකින් චොදෙති චෝදනා කෙරේද තස්ස ඒ, පාරාජිකා පත්තිහුගේ, දිට්ඨාදිවසෙන, දක්නා ලද වස්තු ආදීන්ගේ වශයෙන්, අමූලකතා, මුලක් නැති බවය, චාවනාධිප්පායෙන, සස්නෙන් පහ කරණු කැමැත්තෙන්, සම්මුඛා චෝදනා, අභිමුඛයෙහි චෝදනා කිරීමය, තස්ස, ඒ චෝදනා කරණු ලැබූ මහණහුගේ, තංඛණ විජානනං, එකෙණෙහි දැන ගැනීමය, ඉති ඉමානි පඤ්ච, යන මේ කාරණායෝ පස් දෙන තුමූ, එත්ථ, මේ ශික්ෂා පදයෙහි, අංගානි, අංගයෝයි, සමුට්ඨානාදීනි, සමුට්ඨාදීහු තුමූ, අදින්නාදන සදිසානි, අදින්නාදන ශික්ෂාපදය හා සදෘශ වෙත්, එත්ථ, මේ ශික්ෂා පදයෙහි, වේදනාපන. වේදනා හොමෝ වනාහි, දුක්ඛායේව, දුක්වන්නීමැයි.

## අට්ඨම සික්ඛාපදං, අටවෙනි ශික්ෂා පදයයි.

නවමේ, නවවෙනි ශික්ෂා පදයෙහි, අඤ්ඤභාගියස්සාති ආදිසු, අඤ්ඤභාගියස්ස යනාදියෙහි, අඤ්ඤභාගස්ස, මනුෂ්‍ය ජාති ඇත්තා වූ භික්ෂුවක්හුගේ ස්වභාවයෙන් අන්‍ය කොට්ඨාසයක්හුගේ, ඉදං අයං ඡගලකො, මේ ස්වේත වර්ණ වූ එලකයයි. (අධිකරණ ශබ්දය අපේක්ෂා කොට, ඉදං "ඡගලකසංඛ්‍යාතං අධිකරණං" යනුවෙන්ද ආකර්ෂණය කරන්නේයි.) වා,

නොහොත් අස්ස, ඒ ස්වේත වර්ණ වූ එළුවාහට, අසද්සද භාගො, මනුෂ්‍යජාතික භික්ෂුභාවයෙන් අන්‍ය වූ කොට්ඨාසයක් තෙමේ, අත්ථි, ඇත්තේද, ඉති (තස්මා) එසේ හෙයින්, අසද්සදභාගියං, අසද්සදභාගිය නම් වේ. පූර්වාර්ථය ඉදං තද්ධිත වශයෙන්ද පශ්චමාර්ථය අස්සත්ථි තද්ධිත වශයෙන්ද ණික ප්‍රත්‍ය වූ තැනී. කකාරයටයකාරා දේශකොට අසද්සදභාගිය ශබ්දය නිපන්නේයි. තිරච්ඡානජාති ආදිය හැර පරමාර්ථය වශයෙන් වෙනම එලකයයි ජාතියක් නැත්තේ නමුදු "පටිමායසරීරං" යනාදි උදහරණයෙහි මෙන් අභේදහේදෙ පචාරාර්ථ වශයෙන් "අසද්සදගාගස්ස ඉදං, අසද්සදභාගොවා අස්ස අර්ථති, අසද්සදභාගියං", යනුවෙන් නිර්වචන දත යුතුයි) අධිකරණන්ති, අධිකරණං යනු, ආධාරො, පිහිටිය යුතු ආධාර ස්ථානයයි. වේදිතබ්බො, දත යුත්තේයි. වත්ථු, ආධාර ස්ථානය, අධිට්ඨානං, පිහිටීමට ස්ථානය, ඉති (අයං අධිප්පායො) මෙසේ මේ අභිප්‍රාය, වුත්තංහොති, කියන ලද්දේ වෙයි. හි, විස්තර කෙරෙමි, අට්ඨුප්පත්තියං, අර්ථෝත්පත්තියෙහි, දබ්බො මලල පුත්තොනාමාති, දබ්බමලල පුත්‍ර නම් වෙයි. යොසොඡගලකො, යම් සුදුවන් වූ එළුවෙක්, වුත්තො, කියන ලද්දේ ද, ආයසමනො, දීර්ඝායුෂ ඇත්තා වූද, මල්ල පුත්තස්ස, මලල නම් රජහුගේ පුත්‍ර වූ, දබ්බස්ස, දබ්බ නම් ස්ථවිරයාගේ, මනුස්ස ජාතිචේව, මනුෂ්‍ය ජාතියක් වූද, භික්ඛුභාවොච, භික්ෂුභාවයක් වූද, යොඅයංභාගො කොට්ඨාසොකේඛො, යම් කොට්ඨාශ සංඛ්‍යාත වූ පක්ෂයක් තෙමේ, අත්ථි ඇත්තේද තතෝ ඒ, කොට්ඨාශයෙන්, අසද්සදස්ස, අන්‍ය වූ, තිරච්ඡාන ජාතියාචෙව, තිරිසන් ජාතියක් වූද, ඡගලකභාවස්සච, සුදුවන් එළුවෙකුගේ ස්වභාවයයි කියන ලද්ද වූද, භාගස්ස කොට්ඨාසස්ස පක්ඛස්ස, භාගසංඛ්‍යාත වූද කොට්ඨාස සංඛ්‍යාත වූද, පක්ෂයාගේ, සො, ඒ සුදුවන් එළුක තෙමේ, භාගො, කොට්ඨාසය තෙමේ, යස්මාහොති. යම් හෙයකින් වේද, (යටයවායං යන පදයෙහි සොයන පදය එළුවා සම්බන්ධය ලංවන පිණිස අර්ථ යෝජනා කටයුතුයි) වා, නොහොත්, සො අසද්සදබාගො, ඒ මනුෂ්‍යජාතික භික්ෂුභාවයෙන් අන්‍ය වූ කොට්ඨාසය තෙමේ, අස්ස. ඒ ස්වේත වර්ණවූ එලකයා හට, අර්ථ, ඇත්තේද, ඉති (තස්මා) එසේ හෙයින්, සො, ඒ ස්වේත වර්ණ වූ එලක තෙමේ, අසද්සදභාගිය සංඛ්‍යං, අසද්සදභාගිය යන සංඛ්‍යා ව්‍යවහාරය, ලබ්භති, ලබයි, (ච ශබ්දය අස්ථාන ප්‍රයුක්තයි. "අධිකරණන්ති වේදිතබ්බො" යන පාඨයෙහි "අධිකරණන්තිච"

යනුවෙන් ව ශබ්දය කටයුත්තේයි) ඉමං, මේ සුදුවන් එළුවා, මයං, අපි, දබ්බංමල්ලපුත්තං නාම, මල්ලරජුගේ පුත්‍ර වූ දබ්බ නම් ඇත්තෙකු, කරොම, කරම්හ, ඉති වදන්තානං, මෙසේ කියන්නා වූ, තේසං, ඒ මෙත්තියභුම්මජක භික්ෂූන්ගේ නොහොත් භික්ෂුණීන්ට, තස්සනාම කරණ සඞ්ඛාදය, ඒ නම් කිරීම් සංඛ්‍යාත වූ සංඥාගුගේ, යොසොපගලකො, යම් සුදුවන් එළුවෙක් තෙමේ, ආධාරො, ආධාර වූයේ, වත්ථු, වස්තුවූයේ, අධිට්ඨානංහොති, ආධාර වූයේ වේද, තස්මා, එසේ හෙයින් සො, ඒ සුදුවන් එළුවා, අධිකරණන්තිව, අධිකරණයයි කියාද, වේදිතබ්බො, දත යුත්තේයි.

(ආයුෂ්මත් අර්ථකථාචාර්‍ය්‍යන් වහන්ස අධිකරණ ශබ්දයාගේ ආධාරස්ථාන සංඛ්‍යාත වූ අර්ථය වදාළ බව ප්‍රත්‍යක්ෂ වශයෙන් දතයුතු ද යන චෝද්‍යය සඳහා "තංහි" යනාදිය කීහ) තඤ්හිඑවසන්ධාය, ඒ සුදුවන් එළුවා සඳහාම සච්චංකිරතුම්හෙ භික්ඛවෙ දබ්බංමල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්සාති ආදි, සච්චංකිර පෙ අධිකරණඤ්හි යනාදිය වුත්තං, කියන ලද්දේයි, විවාදධිකරණාදීසු, විවාදධි කරණාදීන් අතුරෙන්, අඤ්ඤතරං සන්ධාය එක්තරා අධිකරණයක් සඳහා, නවුත්තං, නොකියන ලදී. කස්මා, කුමක් හෙයිනයත්, අසම්භවතො, නොලැබෙන හෙයිනි. හි, ඒ එසේ මැයි, මෙත්තිය භුම්මජකා, මෙත්තිය භුම්මජක භික්ෂූහු තුමූ, චතුන්නං අධිකරණානං, සතර අධිකරනයන් අතුරෙන්, කස්සචි අඤ්ඤභාගියස්ස, යම්කිසි අන්‍ය කොට්ඨාසයක් ඇත්තා වූ, අධිකරණස්ස, අධිකරණයක් හුගේ, කිංචිදේසං, ස්වල්පමාත්‍ර වූ, ලේසමත්තං, ලේශමාත්‍රයක්, න උපාදියිංසු, ආකර්ෂනය නොකළාහුය හෙවත් ලංකොට නොගත්තාහුය. චතුන්නංඅධිකරණානං, සතර අධිකරණයන්ගේ, ලෙසොනාම, ස්වල්ප මාත්‍රයක් නම්, නව අත්ථිනොද ඇත්තේ යි, හි එසේ මැයි ජාති ලෙසාදයො ජාති ලෙස ආදීහු, පුග්ගලානං එව, පුද්ගලයන්ගේම, ලෙසා ලේශයෝයයි, වුත්තා, කියන ලද්දාහුය. ("ජාතිලෙසාදයො" යන්නෙහි ආදි ශබ්දයෙන් නාමගොත්‍රාදි වූ නව ලේශයන් ගැණේ. ඒ ලේශයෝ සංක්ෂෙප වශයෙන් මෙසේ දත යුත්තාහුය.

**"ලෙස ජාති නාමගොත්ත, ලිංගාපත්ති වසාපිච**

**පත්තචීවරුපජ්ඣාය,චරිය වාසා වසාදස"**

යන ගාථාව වාචොද්ගතකොට දැරිය යුත්තීය. "ආපත්ති ලෙසො නාම ලහුකං ආපත්තිං අජ්ඣාපන්නො දිට්ඨොහොති තංචෙ පරෙපිකෙන, ධම්මේන චොදෙති අස්සමණොසි අසක්‍යපුත්තියොති ආපත්ති වාචායවාචාය සංඝාදිසේසස්ස" යනුවෙන් ආපත්ති ලෙසයද පුද්ගලයා කෙරෙහිම ආරොපනය කොට දේශනාකර වදාළ හෙයින් "ජාතිලෙසාදයොහි පුග්ගලානංයෙවලෙසා වුත්තා" යනු කියන ලදි) විවාදධිකරණාදිනං, විවාදධිකරණාදින්ගේ, ලෙසා, ලේශයෝයි. නවුත්තා, නොවදාරණ ලද්දහුය. අඤ්ඤභාගියාධිකරණ෴ භාවෙ, මනුෂ්‍ය ජාතික වූ භික්ෂු භාවයෙන් අන්‍ය වූ කොට්ඨාශයක් ඇත්තාවූ අධිකරනයාගේ ස්වභාවයෙහි ඨිතස්ස, සිටියා වූ, තස්සජගල කස්ස, ඒ සුදුවන් එළුවාගේ තංවදබ්බො, මල්ලපුත්තොති නාමං, ඒ මල්ලරජහුගේ පුත්‍ර වූ දබ්බයන නාමය තෙමේ, කොච්දෙසො, යම්කිසිවෙක් මොහුයයි, දැක්වූ මාත්‍රයක්ම, හොති, වෙයි, ථේරං, ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන්, පාරාජිකේන ධම්මේන, පාරාජිකාපත්තිය කරණකොටගෙන, අනුද්ධංසේතුං, චෝදනා කරණු පිණිස ලේසමත්තොව, ස්වල්ප මාත්‍රයක්ද, යස්මාහොති, යම් හෙයකින් වේද, තස්මා, එසේ හෙයින්, විවාදධිකරණාදිසු, විවාදධිකරණාදින් අතුරෙන්, අඤ්ඤඤතරං සන්ධාය, එක්තරා අධිකරනයක් සඳහා, නවුත්තං, නොවදරණ ලදී. (මෙසේ පද සම්බන්ධය කටයුතුයි) ඒත්ථව, මේ දෙශලේශයෙන් අතුරෙනුදු, අස්ස, ඒ ජාත්‍යාදිවූ සමූහයාගේ, යොඅඤ්ඤතරොකොට්ඨාසො, යම් එක්තරා කොට්ඨාසයක්, අයං, මේ දබ්බ ස්ථවිරයයි. ඉති, මෙසේ, දිස්සති අපදිස්සති, දක්වනු ලැබේද, වෝහාරියති, ව්‍යවහාර කරණු ලැබේද, ඉති (තස්මා), එසේ හෙයින්, සො, ඒජාත්‍යාදින්ගේ එක්තරා කොට්ඨාසයක් තෙමේ, දෙසො, දේශ නම් වෙයි. ඒතං, ඒ දේශ සංඛ්‍යාත නාමය තෙමේ, ජාති ආදිසු, ජාත්‍යාන්දින් අතුරෙන්, අඤ්ඤතර කොට්ඨාසස්ස, එක්තරා කොට්ඨාසයක්හුගේ, අධිවචනං, නමකි, අඤ්ඤම්පිවත්ථුං, අන්‍ය වස්තුවක් ද, වෝහාරමත්තෙන, ව්‍යවහාර මාත්‍රයකින්, ලිස්සති සිලිස්සති ඊසකං අල්ලියති, ස්වල්ප මාත්‍රයක් ඇලෙනු ලැබේද, ඉති (තස්මා) එසේ හෙයින්, ලෙසො, ලේශ නම් වේ, ඒතං, ඒ ලේශ සංඛ්‍යාත නාමය තෙමේ, ජාති ආදිනං එව, ජාත්‍යදින් අතුරෙන්ම, අඤ්ඤතර කොට්ඨාසස්ස, එක්තරා කොට්ඨාසයක් හුගේ, අධිවචනං, නමකි, (ආයුෂ්මත් අර්ථකථාචාරින් වහන්ස සංඥකරණය සංඥවගේ ආධාරස්ථානය වූ ස්වේත

වර්ණා වූ ඵලකය සඳහා වදරණ ලද්දේ යයි යුෂ්මත්හු විසින් කියන ලද්දෙහිය. එහකුදු වුවත් පදභාජනියෙහි ඒ නොබෙදම "අඤ්ඤභාගියස්ස අධිකරණස්සාති ආපත්තඤ්ඤභාගියංවාහොති අධිකරණඤ්ඤ භාගියංවා" යනාදියකු මක් හෙයින් දේශනා කළේ දැයි යන චොද්‍යය සඳහා "පදභාජනේපන" යනාදිය නීග) පදභාජනේපන, පදභාජනියෙහි වනාහි, අඤ්ඤභාගියස්ස, අන්‍ය කොට්ඨාසයක් ඇත්තා වූ යස්ස අධිකරණස්ස, යම් අධිකරණයක්හුගේ, කිඤ්චි දේසං, ස්වල්ප මාත්‍රයක් දක්වන ලද්ද වූ, ලෙසමත්තං උපාදය, ලේශමාත්‍රයක් ගෙන, පාරාජිකේන ධම්මේන, පාරාජිකාපත්තියක් රණකොට ගෙන, අනුද්ධංසෙය්‍ය, චෝදනා කරන්නේ නම්, තං, ඒ අධිකරණය තෙමේ, යස්මා, යම් හෙයකින්, අවිධූපන්තිවසෙනෙව, අර්ථවත් පත්තිවශයෙන්ම, ආවිභූතංහොති, ප්‍රකට වේද, තස්මා, එසේ හෙයින්, තං, ඒ අධිකරණය, අවිභජිත්වා, නොබෙද, අධිකරණන්ති වචන සාමඤ්ඤතො, අධිකරණ ශබ්දය හා සදෘශ හෙයින්, අත්ථුද්ධාවරසෙන, අර්ථය ඉගිලවීම් වශයෙන්, පවත්තානි, හටගත්තා වූ, යානිචත්තාරි, අධිකරණානි, යම් සතර වැදෑරුම් අධිකරණ කෙනෙක් තුමූ, අත්ථි, ඇත්තාහුද, තේසං, ඒ අධිකරනයන්ගේ, අඤ්ඤභාගියතාව, අන්‍ය කොට්ඨාසයක්හුගේ ස්වභාවයද, තබ්භාගියතාව, තත්භාගියභාවයද, යස්මා, යම් හෙයකින්, අපාකටාහොති, අප්‍රකට වේද, විනයධරෙහි, විනයධර පුද්ගලයන් විසින්, ජානිතබ්බාච, දත යුත්තාහුම වේද්ද, තස්මා, එසේ හෙයින්, තංච, ඒ අඤ්ඤභාගියභාවය හා තත්භාගියභාවයද, අවසානෙ, කෙළවරෙහි, ආපත්තඤ්ඤභාගියෙන, ආපත්තඤ්ඤභාගිය වශයෙන්, චෝදනඤ්ච චෝදනාවද, ආවිකාතුං, පහළකරණු පිණිස, අඤ්ඤභාගියස්ස අධිකරණස්සාති, අඤ්ඤභාගියස්ය අධිකරණය යනු, ආපත්තඤ්ඤ භාගියංවාහොති අධිකරණඤ්ඤ භාගියංවාති ආදි, අඤ්ඤභාගියස්ස පෙ අධිකරණඤ්ඤ භාගියංවා යන මේ ආදිය, වුත්තං, කියන ලදි, සෙසාවිනිච්ජය කථා, අවශේෂ වූ විනිශ්චය කථාවෝ තුමූ, අට්ඨමෙ, අටවෙනි ශික්ෂා පදයෙහි, වුත්තසදිසායෙව, කියන ලද්ද හා සදෘශ මැයි, අයංපන, මේ මතු කියනු ලබන්නේ වනාහි, විසෙසො, විශේෂ මාත්‍රයකි, ඉදංසික්ඛාපදං, මේ ශික්ෂාපදය තෙමේ, අඤ්ඤභාගියස්ස, අන්‍යකොට්ඨාසයක් ඇත්තා වූ, අධිකරණස්ස, අධිකරණයක්හුගේ, කිංචිදෙසං, ස්වල්පමාත්‍රයක් ඇත්තා වූ, ලේසමත්තං උපාදය, ලේශමාත්‍රයක් ගෙන,

පාරාජිකේන ධම්මේන, පාරාජිකාපත්තියක් කරණකොටගෙන, අනුද්ධංසනවත්ථුස්මිං, චෝදනා වස්තුවක් හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. ඉධච, මේ ශික්ෂාපදයෙහිද, ආපත්තඤ්ඤභාගිය චෝදනාය, ආපත්තඤ්ඤභාගියෙන් චොදනාවෙක්හි, තථාසඤ්ඤිනොපි, එබඳු සංඥාව ඇත්තා වූ මහණහටද, අනාපත්ති, ඇවැත නොවේ. අංගේසුච, අංගයන් කෙරෙහිද, අඤ්ඤභාගියස්ස, අන්‍යකොට්ඨාසයක් ඇත්තා වූ, අධිකරණස්ස, අධිකරණයක්හුගේ, කිංචිදෙසං, ස්වල්පමාත්‍රයක් දක්වන ලද්ද වූ, ලෙසමත්තං, ලේශමාත්‍රයක්, උපාදියන්තා, ඇදගන්නා බවක්, අධිකා, අධිකවන්නීය.

## නවමසික්ඛාපදං, නවවෙනි ශික්ෂා පදයයි.

දසමෙ, දශවෙනි ශික්ෂාපදයෙහි, සමග්ගස්සසංඝස්සාති, සමග්ගස්ස සංඝස්ස යනු, සහිතස්ස, එක්ව ගටගත්තාවූ, භික්ඛුසංඝස්ස, භික්ෂුසංඝයාගේ, චිත්තේනච, සිත හා සමගද, සරීරෙනච, ශරීරය හා සමගිද, අවියුත්තස්ස, වෙන්නොවූ, ඉති අයං අත්ථො, යන මේ අර්ථයි, තේනෙව, එහෙයින් ම, අස්ස, ඒ සමග්ගස්ස යන පදයාගේ, පද භාජනෙ, පදභාජනියෙහි, සමග්ගොනාමසංඝො සමාන සංවාසකො සමාන සීමායංඨිතොති, සමග්ගො, පෙ ඨිතො, යනු, වුත්තං, කියන ලදී. හි, ඒ වචනය යෙදේ මැයි, සමාන සංවාසකො, සමාන වූ සංවාසය ඇත්තා වූ සංඝ තෙමේ, සමචිත්තතාය, සමාන වූ සිත් ඇති බැවින්, චිත්තෙන, සිත හා, අවියුත්තොහොති, වෙන්නුවූයේ වේද? සමාන සීමායං, සමාන සීමාවෙක්හි, ඨිතො, සිටියා වූ සංඝ තෙමේ, කාය සාමග්ගි දනතො, ශරීරය කරණ කොටගෙන, සමගිය දෙනෙ හෙයින්, සරීරෙන, ශරීරය හා අවියුත්තොහොති, වෙන් නුවූයේ වෙයි, භේදය පරක්කමෙයපාති, භේදයපරක්කමෙය්‍ය යනු, අයංසංඝො, මේසංඝ තෙමේ, කථංනාමභිජ්ජෙය්‍යපාති, කෙසේ නම් බිඳුවන්නේ දැයි, භේදනත්ථාය, බිඳීම පිණිස, වායාමෙය්‍ය, උත්සාහ කරන්නේ වී නම්, භේදන සංවත්තනිකංවා අධිකරණන්ති, භේදන සංවත්ත නිකංවා අධිකරණං යනු, භේදනස්ස සංඝස්ස අත්ථාය, බිඳෙන්නා වූ සංඝයාගේ ප්‍රයෝජනය පිණිස සංවත්තනිකං, පවත්වන්නා වූ හෙවත් බිඳුවන්නාවූ, කාරණං, කාරණයකි. හි, ඒ වචනය සැබෑමය. ඉමස්මිං ඔකාසෙ, මේ අවකාශයෙහි

නොහොත් මේ ස්ථානයෙහි, කාමහේතු කාම නිදානං කාමාධිකරනන්ති ආදිසූච්ය, කාමහේතු පෙ යනාදී උදහරණයෙහි මෙන්, කාරණං, හේතුව, අධිකරණන්ති අධිප්පේතං, අධිකරණයයි කැමතිවන ලදි. තං, ඒ හේතුව තෙමේ, බේදකර වත්ථුවසෙන, බිඳීම කරන්නා වූ වස්තූන්ගේ වශයෙන්, අට්ඨාරසවිධං, අටළොස් වැදෑරුම්වෙයි.

(ඒ අටළොස් වස්තූන්ගේ ස්වරූප කවරහයන්?)

**"ධම්ම විනය භාසිතා - චිණ්ණපඤ්ඤත්තිගරුකා**

**ආපත්ති ලහු දුට්ඨුල්ලා - සාවසේසදුකානිච"**

යන ගාථාව උපනිශ්‍රය කොටගෙන සංක්ෂේපයෙන් දත යුතුයි)

සමාදයාති සමාදය යනු, ගහෙත්වා, ගෙන. පග්ගය්හන්ට්ටෙය්‍යාති, පග්ගය්හනිට්ඨෙය්‍ය යනු, සංඝ භේදස්ස අත්ථාය, සංඝභේදය පිණිස, සංවත්තනිකං, සංඝභේදය පවත්වන්නා වූ, සංඝ භේද නිබ්බත්ති සමත්ථ, සංඝභේදය ඉපදවීමෙහි පොහොසත් වූ, තංකාරණංගහෙත්වා, ඒ කාරණයගෙන, දීපෙය්‍යපෙව්ච, ප්‍රකාශ කරන්නේ ද වී නම්, නපටිනිස්සජ්ජෙය්‍යච, අත්නොහරණේද වී නම්, භික්ඛුහි එවමස්සවචනියොති, භික්ඛුහි ඒවමංස්සවචනියො යනු. යෙ, යම් භික්ෂු කෙනෙක් තුමූ, පග්ගය්හ, සංග්‍රහකොට, තිට්ඨන්තං, සිටින්නා වූ. තං ඒ භික්ෂුව, සම්මුඛාපස්සන්ති, අභිමුඛයෙහි දකිද්ද, යේච, යම් භික්ෂු කෙණෙක් තුමූ ද, අමුකස්මිංනාම විහාරෙති, මෙනම් ඇත්තා වූ විහාරයෙහි යයි, සුණන්ති, අසද්ද, තෙහි, ඒ භික්ෂූන් විසින්, සබ්බන්ති මෙන පරිච්ඡේදෙන, සියල්ලට යටත් පිරිසෙයින්, අඩ්ඪයෝජනමත්තම්පි, අඩයොදුන් පමණ තැනටද, ගනත්වාපි, ගොස්. "ගනත්වාපි" යන්නෙහි "අපි" ශබ්දය අස්ථානප්‍රයුක්තයි. ඒ අපි ශබ්දය කරණ කොට ගෙන එක් විහාරයෙක්හි වසන්නා වූ භික්ෂූන් කෙරෙහි කියයුත්තක්ම නැතැයි යන අර්ථය ප්‍රකාශ කෙරෙයි. මේ කාරණය වනාහි සමන්ත පාසාදිකා අටුවායෙහි "එකස්මිං විහාරෙවත්තබ්බමේවනත්ථි" යන පාඨයද "දූතංවාපණ්ණංවාපෙසෙත්වා වදතොපි ආපත්තිතො මොක්ඛොනත්ථි සයමේවගනත්වා පෙ වත්තබ්බං" යන පාඨය ද යන පාඨයෝ මෙම අර්ථයම ප්‍රකාශ කෙරෙති. ටීකාචාර්යයෝ වනාහි "අපිසද්දෙවෙත්ථ ගරුකො ආවුසො සංඝභේදේ මා සංඝභේදය

පරක්කමතිදීපෙති" යනු කිහ. මේ මතයෙහි වනාහි අපි ශබ්දය "යචායං අනන්තරෙ මා ආයස්මාති ආදි වචනක්ඛමො වුත්තො ඒවමති වචනක්ඛමො යන්නද, වචනීයොඅස්ස, කියයුතු වන්නේය. අස්සහවෙය්‍ය යන්න හා යෙදෙන්නාක් මෙන් දක්නා ලැබේ. මෙහි අර්ථය පරීක්ෂා කොට දත යුත්තේයි. අනන්තරෙ, අනතුරුතන්හි, මාආයස්මාති ආදි, මා ආයස්මා යනාදි වූ, යො අයං වචනක්කමො වුත්තො, යම් වචන පන්තියක් කියන ලද්දේද, ඒවං, මෙසේ (මේ වචන පන්තිය) වචනියො අස්ස, (භවෙය්‍ය) කියයුතු වන්නේය. දිස්වාවා, දැක හෝ, සුත්වාවා, අසා හෝ, අවදන්තානං, නොකියන්නාවූ භික්ෂූන්ට, දුක්කටං හොති, දුකුලා ඇවැත වෙයි. ඒත්ථච, මේ මා අයස්මායනාදි පාඨයෙහි, මා ඉති පදං, මා යන පදය, පරක්කමි පදෙන, පරක්කමි යන පදය සමග ද, අට්ඨාසිපදේනචසද්ධිං, අට්ඨාසියන පදය සමග ද, මා පරක්කමිමා අට්ඨාසීති, මා පරක්කමි මා අට්ඨා යනුවෙන්, යොජෙතබ්බං, යෙදිය යුතුයි. සමෙනාය ස්මාසඞ්ඝෙනාති, සමෙනා යස්මා සංඝේන යනු. ආයස්මා, දීර්ඝායුෂ ඇත්තා වූ ස්වාමිතෙමේ, සංඝේනසද්ධිං, සංඝයා මග, සමෙතුසමා ගච්ඡතු, සදෘශ වූ දෘෂ්ටි ඇත්තෝ වේවා. ඒකලද්ධි කොහොතු, සමාන ලබ්ධි ඇත්තේ වේවා, ඉති අයං අත්ථො, මේ වනාහි අර්ථයි. කිංකාරණා, කුමක් හෙයිනයත්? සමග්ගො සංඝො, සමගි වූ සංඝ තෙමේ, සම්මොදමානො, මොනවට සතුටු වනු ලබන්නේ, අවිවාදමානො, විවාද නොකරණු ලබන්නේ, එකුද්දේසො, එක්ව පාමොක් උදෙසීම ඇත්තේ, ඵාසු, සැපසේ, හි, (යස්මා) යම් හෙයකින්, විහරති, වාසය කෙරේද, ඉති (තස්මා) එසේ හෙයින්, සමෙතු සමාගච්ඡතු, සමාන වූ දෘෂ්ටි ඇත්තේ වේවා, (මෙසේ ද පරිවර්තනය කොට අර්ථෝද්ග්‍රහණය කටයුතුයි. පාළියෙහි පෙයපාල මෙන් යටකරණු ලද පාඨයන්ද උද්ධරණය කොට අර්ථ යෝජනාව කටයුත්තිය) තත්ථ, ඒ සමග්ගොහි යනාදි පාඨයන් අතුරෙන්, සම්මොදමානොති, සම්මොදමානො යනු, අඤ්ඤ මඤ්ඤං, ඔවුනොවුන් නොහොත් ඔවුනොවුන්ට, සම්පත්තියා, ශීලාදි සම්පත්තියෙන්, සුට්ඨුමෝදමානො, මෝදනාවට සතුටු වනු ලබන්නේ, අවිවාදමානොති, අවිවාදමානො යනු, අයංධම්මො, මේ වනාහි ධර්මයයි. අයං අධම්මො ඉති, මේ වනාහි ධර්මය නොවේ යයි. ඒවං. මෙසේ, නවිවදමානො, විවාද නොකරණු ලබන්නේ, අස්ස, ඒ සංඝයාහට, එකො, සදෘශ වූ. උද්දේසො අත්ථි පාමොක් උදෙසීමක් ඇත්තේද

ඉති තස්මා එසේ හෙයින් එකුද්දේසො, එකුද්දේස නම්වේ. එකතො, එක්ව පවත්තපාතිමොක්ඛුද්දේසො, පැවති පාමොක් උදෙසීම ඇත්තේයි, ඉති අයං, අත්ථො, මේ වනාහි අර්ථයි. ඵාසු විහරන්ති ඵාසුවිහරති යනු, සුඛං විහරති, සැපසේ වාසය කෙරෙයි, ඒවං මෙසේ වියුම්පි, වෙනමද, සංඝමජ්ඣෙපි, සඟ මැදද, නික්ඛන්තුං, තුන්යලක, වුච්චමානස්ය, කියනු ලබන්නාවූ වචනය හෙවත් කරණු ලබන්නා වූ අනුශාසනාව, අප්පටිනිස්සජ්ජතො, අත්නොහරණ මහණහට, දුක්කටංහොති. දුකුලා ඇවැත වේ. එවඤ්චසොති ආදීම්හි, ඒවඤ්චසො යනාදියෙහි, සමනුභාසිතබ්බොති, සමනුභාසිතබ්බො යනු, සමනුභාසනකම්මං, සමනුශාසන කර්මය, කාතබ්බං, කටයුතුයි. ඉච්චෙතං කුසලන්ති, ඉච්චෙතං කුසලං යනු, ඉතිඑත්තං පටිනිස්සජ්ජනං, මෙසේ මේ අත්හැරීම, කුසලංඛෙමං, නිර්භය වෙයි. සොත්ථිභාවො, සුවපත් බව, තස්ස භික්ඛුනොහොති, ඒ භික්ෂුවහට වෙයි. නොචෙපටිනිස්සජ්ජෙය්‍ය සංඝාදිසෙසොති, නොචෙ, පෙ සංඝාදිසේසො යන, ඒත්ථ, මේ පාඨයෙහි, සමනුභාසනකම්ම පරියොසානෙ, සමනුභාසන කර්මයගේ අවසානයෙහි, අප්පටිනිස්සජනතස්ස, අත්නොහරණ මහණහට, සංඝාදිසේසොහොති, සංඝාදිසේසොපත්තිය වෙයි. සේසං, සෙස්ස උත්තානපදත්ථමේව, නොගැඹුරු පදරුත් ඇත්තේ මැයි, රාජගහෙ, රජගහනුවර, දේවදත්තං ආරබ්භ, දෙව්දත් තෙරහු අරබයා, සංඝභේදය, සංඝයාගේ පිඹිදීම පිණිස, පරක්කමනවත්ථුස්මිං, උත්සාහ කළ වස්තුව හේතුකොට ගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. සාධාරණ පඤ්ඤත්ති, භික්ෂුභික්ෂුණීන්ට සාධාරණ පැනවීමයි අනාණත්තිකං, ඇණවීමෙන් ඇවැත නොවෙයි. සමනුභාසනකම්මෙ, සමනුභාසනකර්මය, කරියමානෙ, කරණු ලබන කල්හි, අප්පටිනිස්සජ්ජන්තස්ස අත් නොහරණ මහණහට, ඤත්තිපරියොසානෙ, ඤත්තියගේ අවසානයෙහි, දුක්කටංහොති, දුකුලා ඇවැත වෙයි. ද්වීහිකම්මවාචාහි, කම්මවාචානු ශ්‍රාවනද්වයකින්, ද්වෙථුල්ලච්චයාහොන්ති, ථුල්ලසිහු දෙදෙනෙක් වෙත්, යස්සනක්ඛමති සොභාසෙය්‍යාති. යස්ස පෙ භාසෙය්‍ය යනුවෙන්, ඒවං, මෙසේ යකාරපත්තාය, යකාරයට පැමිණියා වූ, තතියකම්මවාචාය, තුන්වෙනි කම්මවාචානුශාවනයෙහි, තඤ්ච දුක්කටං, ඒ දුකුලා ඇවැතද, තෙවථුල්ලච්චයා, ඒ ථුල්ලසිහුද, පටිප්පස්සම්භන්ති, සංසිඳෙන්නාහුය, සංඝාදි සේසොයෙවතිට්ඨති, සංඝාදිසේසාපත්තියම පිහිටයි.

අසමනුභාසියමානස්සව, සමනුභාසන කර්මය නොකරන්නා වූ මහනහටද, පටිනිස්සජන්තස්සව, අත්හරණා භික්ෂුව හටද, ආදිකම්මිකස්සව, ආදිකම්මික භික්ෂුවහටද, උම්මත්තකාදීනඤ්ච, උමතු ආදී භික්ෂූන්ටද, අනාපත්ති, ඇවැත නොවේ. මේ අනාපත්තිවාරයෙහි "අසමනුභාසියමානස්ස" යනු වනාහි සමනුභාසන කර්මය නොකළ භික්ෂුවක් හට ඒ ඇවැත සිද්ධවිය යුතු වස්තුව අත්නොහරණේද සංඝාදිසේසයෙන් ඇවැත නොවෙයි යනු කීනියායි. මෙහි ඤත්ති දුක්කට ථුල්ලච්චයන් කරණකොට ගෙනද ඇවැත නොවෙයි යනු දක්වනු කැමැත්තක් ඇත්තේය. එතකුදු වුවත් අර්ථකථා ටීකායෙහි ඒ අර්ථය නොදක්වන ලදී. "පටිනිස්සජන්තස්ස" යනු වනාහි සමනුභාසන කර්මය නොකළ භික්ෂුවහටද ඤත්තියට පූර්වයෙහි වූ ඤත්තිය තබන්නාවූ ක්ෂණයෙහි පළමුවන දෙවන කර්මවාචානුශ්‍රාවණයෙහි ද තෘතීසකර්මවාචානු ශ්‍රාවනයෙහිද "යස්සනක්ඛමතිසොභාසෙය්‍යය" යන පාඨයෙහි ය කාරයට නොපැමිණි තාක් ලබ්ධිය අත්හරණෝ ඒ නම් සංඝාදිසේසාපත්තිය නොවෙයි. කී නියායි. ආදිකම්මිකය යනු සංඝ භේදය පිණිස උත්සාහ කිරීමෙහි ආදිකම්මිකයාම ගත යුත්තේයි. සමනුභාසනකර්මය කිරීමෙහි ආදිකම්මිකයායි නොගත යුත්තේයි. ඒ ආදි කර්මිකයා හටද සංඝාදිසේසාපත්තියෙන් ඇවැත නොවෙයි කී නියායි. ඒ ආදිකර්මික අනාපත්ති තොමෝ ද "අසමනුභාසියමානස්ස යන පාඨයෙන් සිද්ධවිය යුත්තේ නමුදු අසමනුභාසියමානස්ස" යනු වනාහි සමනුභාසන කර්මය නොකළ තැනැත්තාහටම කියන ලදී. ආදිකර්මිකයා හට නොකියන ලදී. මේ තෙමේ ආදි කර්මිකම වෙයි. එහෙයින් "ආදිකම්මිකස්ස යනු කියන ලදී) සීල විපත්ති, ශීලයාගේ විනාශයයි. භේදය, සංඝයාගේ බිඳීම පිණිස, පරක්කමනං, උත්සාහ කිරීමය, ධම්මකම්මෙන, ධාර්මික වූ විනය කර්මයෙන්, සමනුභාසනං, සමනුභාසනකර්මය කිරීමය, කම්මවාචාපරියොසානං, කර්ම වාක්‍යයෙගේ අන්තිම ය කාරයට පැමිණීමෙන් අවසන් කිරීමය, අප්පටිනිස්සජනං, ලබ්ධිය නොහැරීමය, ඉති ඉමානි චත්තාරි, යන මේ කාරණායෝ සතර දෙන තුමූ, ඒත්ථ, මේ ශික්ෂා පදයෙහි, අංගානි. අංගයෝයි. සමනුභාසන සමුද්ධානං, සමනුභාසන සමුද්ධානය ඇත්තේ වෙයි. (කය වචන සිත යන තුණෙන් හටගන්නේ යයි කීනියායි) අකිරියා, අක්‍රිය මෙන් හටගන්නේ වෙයි. සඤ්ඤාවිමොක්ඛං, සංඥාවිමෝක්ෂයයි, සචිත්තකං, සචිත්තකයයි, ලෝකවජ්ජං, ලෝකවද්‍යයයි,

කායකම්මං, කායකර්මයයි, වචී කම්මං, වචීකර්මයයි, අකුසලචිත්තං, අකුශල චිත්තයයි, දුක්ඛ වේදනං, දුක්වේදනාව ඇත්තේයි.

## දසම සික්ඛාපදං, දශවෙනි ශික්ෂාපදයයි.

එකාදසමෙ, එකොළොස්වෙනි ශික්ෂාපදයෙහි, තස්සේවබොපනාති, තස්සේවබොපන යනු, යොභික්ඛු, යම් භික්ෂුවක් තෙමේ, සංඝ භේදය, සංඝයාගේ බිඳීම පිණිස, පරක්කමති, උත්සාහ කෙරේද, තස්සේව, ඒ භික්ෂුහුගේම, අනුවත්තකාති, අනුවත්තකා යනු, තස්ස, ඒ භික්ෂුහුගේ, දිට්ඨිං, දෘෂ්ටිය, ඛන්තිංරුචිං, කැමැත්ත, ගහණෙන, ගැණීමෙන්, අනුපටිපජ්ජනකා, අනුව පිළිපදින්නා වූ, වග්ගං, අසමගිබව කරන්නා වූ, අසාමග්ගිපක්ඛිය වචනං, අසමගිපක්ෂයෙහි වුවන්ගේ වචනය, වදන්ති, කියද්ද, ඉති, (තස්මා) එසේ හෙයින්, වග්ගවාදකා, වග්ගවාදක නම් වෙත්. යස්මාපන, යම් හෙයකින් වනාහි, තිණ්ණං, තුන්දෙනෙකුගෙන්, උද්ධං, අධික වූ භික්ෂුහු තුමූ, කම්මාරහානහොන්ති, කර්මයට සුදුසු නොවූවාහු වෙද්ද, හි, ඒ එසේ මැයි, සංඝො සංඝතෙමේ, සංඝස්ස, සංඝයාහට, කම්මංනකරොති. කර්මය නොකෙරේද, තස්මා, එසේ හෙයින්, එකොවාද්වේවාතයොවාති, එකෙක් හෝ දෙන්නෙක් හෝ තුන්දෙනෙක් හෝ යයි, වුත්තං, කියන ලදී. ජානාතිනොති, ජානාතිනො යනු, අම්හාකං, අපගේ, ඡන්දදීනි, ඡන්දදීන්, ජාති, දනී, භාසතිති, භාසති යනු, ඒවං කරොමාති, මෙසේ කරම්හ, ඉති, මෙසේ, අම්හෙහිසද්ධිං, අප හා සමග, භාසති, කියයි, අම්හාකං(අම්හෙහිපි) පෙතං ඛමතීති අම්හාකං පෙතං ඛමති යනු යම් කර්ම කෘත්‍යයක් සො ඒ මගණ තෙමේ කරොති කෙරේද එතං ඒ කෘත්‍ය අම්හාකං අප විසිනුදු, රුච්චති, කැමති වනු ලැබෙයි. (තොෂණාර්ථයෙහි වූ "ඛමු" ධාතුව හා "රුච" ධාතුවද කර්මවාචක වූ ප්‍රත්‍යයන් හා යෝගයක් ඇති කල්හි ෂෂ්ඨීකර්තෘකාරකයෙන් බොහෝ සෙයින් දක්නා ලැබේ. "යස්සායස්මතො ඛමතිනාගස්ස උපසම්පදනක්ඛමති සොතොසෙයන, මා ආයස්මන්තානම්පි සංඝභේදෙරුච්චිත්ථ" ථේරස්සසොපත්තො නරුච්චති" යනු ථට උදහරණයි) සමෙතායස්මනත්තානං, සංඝෙනාති සමෙතායස්සමත්නාං සංඝේන යනු අයස්මත්තානං ආයුෂ්මතුන්ගේ, චිත්තං. චිත්තය තෙමේ, සංඝේන සද්ධිං, සංඝයා හා සමග, සමෙතු සමාගච්ඡතු,

සදෘශලබ්ධි ඇත්තේ වේවා, එකිභාවංගච්ඡතු, එකක් බවට පැමිණෙත්වා ඉති අයං අධිප්පායො යන මේ අභිප්‍රාය වුත්තං වුත්තෝ හොති කියන ලද්දේ වේ. සෙසං සෙස්ස පදත්ථතො පදර්ථ වශයෙන්. උත්තානමේව, නොගැඹුරු මැයි, විනිච්ඡයකථාපි, විනිශචය කථාවද, එත්ථ, මෙහි, දසමෙ, දශවෙනි ශික්ෂාපදයෙහි, වුත්තසදිසායේව, කියන ලද්දට සදෘශමැයි, අයංපන, මේ වනාහි, විසේසො, විශේෂාර්ථමාත්‍රයකි. ඉදංසික්ඛාපදං, මේ ශික්ෂාපදය, රාජගහෙ, රජගහනුවර, සම්බහුලෙ භික්ඛු ආරබ්භ, බොහෝ වූ භික්ෂූන් අරබයා, සංඝභේදය, සංඝයාගේ බිඳීම පිණිස, පරාක්කමන්තස්ස. උත්සාහ කරන්නාවූ, දේවදත්තස්ස. දෙව්දත් තෙරනුවන්ගේ, අනුවත්තා නවත්ථුස්මිං, අනුව ගියා වූ වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදී. අංගේසුච, අංගයන් කෙරෙහිද, තත්ථ, ඒ දශවෙනි ශික්ෂාපදයෙහි, පරක්කමනං යථා, උත්සාහ කිරීම යම් සේද, ඒවං (තථා) එපරිද්දෙන්. ඉධ, මේ ශික්ෂා පදයෙහි, අනුවත්තානං, අනුව පැවතිම දට්ඨබ්බං, දැක්කයුතු.

## ඒකාදසම සික්ඛාපදං, එකොළොස් වෙනි ශික්ෂා පදයයි.

ද්වාදසමෙ, දොළොස් වෙනි ශික්ෂා පදයෙහි. දුබ්බච ජාතිකොති, දුබ්බචජාතිකො යනු, දුබ්බචසභාවො, නොකීකරු ස්වභාව ඇත්තේ, වත්තුං කියන්නට අසක්කුණෙය්‍යොපාති, නොහැක්කේ යයි, ඉති අයං, මේ වනාහි, පදත්ථො, පදර්ථයි. උද්දේසපරියාපන්නෙසුති, උද්දේසපරියාපන්නෙසු යනු, උද්දෙසෙ, ප්‍රාතිමෝක්ෂයෙහි, පරියාපනනෙසු, ඇතුළත් වූ. අන්තොගධෙසු, ඇතුළත්හි හටගත්තා වූ, යස්සසියා ආපත්තියො ආවිකරෙය්‍යාති, යස්ස පෙ ආවිකරෙය්‍ය යනු, ඒවං සංඝහිතත්තා, මෙසේ සංග්‍රහ කරණ ලද බැවින්, අන්තොපාතිමොක්ඛස්ස, ප්‍රාතිමෝක්ෂයාගේ ඇතුළෙහි, වත්තමානෙසු, හටගත්තාවූ ඉතිඅයං අත්ථො, යන මේ අර්ථයි. සහධම්මිකං වුච්චමානොති, සහ ධම්මිකං වුච්චමානො යනු, සහ ධම්මිකේන, ශික්ෂාපදය කරන කොටගෙන, වුච්චමානො, අවවාද කරනු ලබන්නේ, එතං. ඒ සහ ධම්මිකං යන පදය තෙමේ, කරණත්ථෙ, කරණාර්ථයෙහි, උපයෝගවචනං, ද්විතීය විභක්තියි, පඤ්චහි සහ ධම්මිකෙහි, පස් සහ දැමියන් විසින්, සික්ඛිතබ්බත්තා, හික්මිය යුතු බැවින්. වා, නොහොත්,

තෙසං, ඒ පස්සහදැමියන්ගේ, සන්තකත්තා, අයත් වස්තුවක් බැවින් සඟ ධම්මිකන්ති ලද්ධනාමෙන, සහධම්මිකයයි ලබන ලද නම් ඇත්තා වූ, බුද්ධපඤ්ඤත්තෙන, බුදුන් විසින් පණවන ලද්ද වූ, සික්ඛාපදෙන, ශික්ෂාපදය කරණකොටගෙන, වුච්චමානො, අවවාද කරණු ලබනුයේ, ඉති අයං අත්ථො, යන මේ අර්ථයි. විරමථායස්මන්තො, මම්වචනායාති, විරමථායස්මන්තො, මම වචනය යනු යෙන වචනෙන යම් වචනයක් කරණ කොටගෙන මං මාතුම්හෙ තෙපි, වදථ, කියව්ද, මම, මට, තනොවචනතො ඒ වචනයෙන්, විරමථ, වළකිව්, මං, මා, තංවචනං, ඒ වචනය, මාවදථ, නහමක් කියව්. ඉතිඅයං අධිප්පායො, යන මේ අභිප්‍රාය වුත්තං (වුත්තො) හොති, කියන ලද්දේ වෙයි. වදතු සඟ ධම්මෙනාති, වදතු සඟ ධම්මෙන යනු, සඟ ධම්මිකේන, පස් සඟ දැමියන් විසින් හික්මිය යුතු වූ, සික්ඛාපදෙන, ශික්ෂාපදය කරණ කොටගෙන, වා, නොහොත්, සහධම්මේන, කාරණාසහිත වූ, අඤ්ඤෙනාපි, අනිකුදු පාසාදිකභාව සංවත්තනිකේන, ප්‍රශන්නභාව ලබන්නා වූ, වචනෙනපි, වචනයෙනදු, වදතු, කියන සේක්වා, යදිදන්ති අයං සද්දෙ· යදිදං යන මේ ශබ්දය තෙමේ, වුද්ධිකාරණදස්සනත්ථෙ, අභිවෘධිහුගේ හේතුව දැක්වීම් සංඛ්‍යාත අර්ථයෙහි, නිපාතො, නිපාතයකි, තේන, ඒ යදිදං යන පදය කරණ කොට ගෙන, අඤ්ඤමඤ්ඤස්ස ඔවුනොවුන්ට, යංඉදංහිතවචනං, යම් මේ අභිවෘද්ධි වචනයක් තෙමේ, ආපත්තිතොව, ආපත්තියෙන් ද, යං ඉදං වුට්ඨාපනං අත්ථි, යම් මේ නැගිටුවීමක් ඇත්තේ ද, තේන අඤ්ඤමඤ්ඤ වචනේන, ඒ ඔවුනොවුන්ට අභිවෘද්ධිය කරණකොටගෙන තේනඅඤ්ඤමඤ්ඤ වුට්ඨාපෙනෙන, එබඳු ඔවුනොවුන් ඇවතින් නැගිටවීම කරණකොටගෙන, ඒවංසංවද්ධාහිතස්ස හගවතො පරිසාති, ඒවං පෙ පරිසා යනු, ඒවං වුත්තාය, මෙසේ වදරණ ලද්ද වූ, පරිසාය, භික්ෂු පිරිස්හුගේ, වුද්ධිකාරණං, අභිවෘද්ධියට හේතුව, දස්සිතංහොති, දක්වන ලද්දේ වේ. සෙසං, සෙස්ස, උත්තානත්ථමේව, නොගැඹුර අරුත් ඇත්තේ මැයි, විනිච්ඡය කථාපි. විනිශ්චය කථා තොමෝ, දසමෙවුත්ත සදිසායෙව, දශවෙනි ශික්ෂාපදයෙහි, කියන ලද්දට සදෘශ මැයි, අයංපන, මේ වනාහි, විසෙසො විශේෂාර්ථයි. ඉද සික්ඛාපදං, මේ ශික්ෂා පදය, කෝසම්බියං, කොසඹෑ නුවර, ඡන්නත්ථේරං ආරබ්භ, ඡන්න ස්ථවිරයන් අරභයා, අත්තානං, තමා, අවචනියකරන වත්ථුස්මිං, නොකිය යුතු බව කරණ වස්තුව හේතු

කොටගෙන, පකද්සඥත්ත, පණවන ලදී. අංගේසුච, අංගයන් කෙරෙහිද, තත්ථ, ඒ දශවෙනි ශික්ෂා පදයෙහි, පරක්කමනං යථා, උත්සාහ කිරීම යම් සේද, ඒවං (තථා) එපරිද්දෙන්, ඉධ, මේ ශික්ෂා පදයෙහි, අවචනීය කරණතා, නොකිය යුත්ත කරණ බව, දට්ඨබ්බං , දැක්ක යුත්තිය.

## ද්වාදසම සික්ඛාපදං, දොළොස් වෙනි ශික්ෂාපදයයි.

තෙරසමෙ, තෙළෙස්වෙනි ශික්ෂාපදයෙහි, ගාමංවානිගමංවාති, ගාමංවානිගමං වායන, ඒත්ථ, මේ පාඨයෙහි, නගරම්පි, නගරයද, ගාමෙඅන්තොගධමේව, ග්‍රාමයෙහි ඇතුළත් වේ මැයි, (මේ මතයෙන් නගරයද ග්‍රාම විශේෂයක් වන හෙයින් ගාම ශබ්දය කරණකොටගෙන නගරයද සංග්‍රහ කරණ ලදැයි කී නියායි නොහොත් අවුත්ත සමුච්චයාර්ථයෙහි වූ වාශබ්දය කරණ කොට ගෙන නගරයද දත යුතුයි. මේ ගාමනිගම නගරයන තුන්දෙන අතුරෙන් වටපව්රු නැත්තා වූ ගේ දෙර සල්පිල් ඇත්තේ නිගමනම්වේ. වට පවුරු හා ගේ දෙර සල්පිල් ඇත්තේ නගර නම් වේ. වටපව්රු හා සල්පිල් නැත්තා වූ මනුෂ්‍යවාසයට සුදුසු ගේදෙර ඇත්තේ ග්‍රාම නම් වේ. යන මේ විශේෂය දත යුතුයි) උපනිස්සා යවිහරතීති, උපනිස්සාය විහරති යනු, තත්ථ, ඒ ග්‍රාමාදීන් කෙරෙහි, පටිබද්ධචීරාදීපච්චයතාය, පිළිබඳ සිවුරු ආදිප්‍රත්‍යයන් ඇති බැවින්, තං, ඒ ග්‍රාමාදිය නිස්සායවසති. නිසාවෙසේ, පුප්ඵදනාදීහි, මල් දීම් ආදිය කරණකොටගෙන, මනුස්සානං, මිනිසුන්ගේ, සද්ධංවිනාසෙන්තො, ශ්‍රද්ධාව විනාශ කරන්නේ, කුලානි, දයකයන්, දූසෙති, විනාශ කෙරේද, ඉති (තස්මා) එසේ හෙයින්, කුලදූසකො, කුලදූසක නම් වේ. මාලාගච්ඡරෝපනාදයො, මල්ගස් ඉඳුවීම් ආදීවූ, පාපකාසමාචාරා, ලාමක වූ ප්‍රතිපත්තිහු, අස්ස, එමහණ හට අත්ථි ඇත්තාහුය. ඉති (තස්මා) එසේ හෙයින්, පාපසමාචාර, පාපසමචාර නම්වෙත්, සොභික්ඛූති, සොභික්ඛු යනු, කුලදූසකො භික්ඛු දයකයන් විනාශ කරන්නා වූ භික්ෂු, ආයස්මාඛොකුලදූසකො, පෙ ඉධවාසෙනාති. ආයසමාඛෙ, කුලදූසකො පෙ ඉධවාසෙන යනු, ඉමිනා. මේ පාඨය කරණකොට ගෙන, අස්ස, ඒ මහණහුගේ, පබ්බාජනියකම්මාරහතං. පබ්බාජනිය කර්මයට සුදුසු බව, දස්සෙති දක්වයි. පබ්බාජනිය කම්මකතො. පබ්බාජනියකර්මය කරණලද්ද වූ, එසොභික්ඛුපන,

මේ මහණ තෙම එනාහි, යස්මිං ගාමේවා, යම් ගමෙක්හි හෝ, නිගමේවා, නියම්ගමෙක්හි හෝ, කුලදූසකකම්මංකතං, කුලදූසකකර්මය කරණලද්දේද, යස්මිං විහාරෙවසති යම් වෙහෙරක්හිද වෙසේද, තස්මිංගාමේවා, ඒ ගම්හි හෝ, තස්මිං නිගමේවා. ඒ නියම් ගම්හි හෝ චරිතුං, භික්ෂාව පිනිස හැසිරෙන්නට, නෙවලබ්භති. නෙලැබිය යුත්තේ මැයි, විහාරෙ, විහාරයෙහි. වසිතුං, වාසය කරන්නට, නලබ්භතියෙව, නොලැබිය යුත්තේ මැයි ("පබ්බාජනියකම්මකතොපනෙස" යන පාඨයයාගේ ස්වාමාර්ථයෙන් පබ්බාජනියකර්ම්මය කරණු ලැබූ භික්ෂුවම යම් විහාරයෙක්හි වාසයකොට යම් ගමෙක්හි කුල දූසනකර්මය කරණ ලද්දේද ඒ විහාරයෙහි වාසය කොට ඒ ගමෙහිද අසල ගම්හිද පිඩුපිණිස නොහැසිරිය යුත්තේයි. සමීප විහාරයෙක වාසය කොට සමීප වූ අන් ගමකට පිඩුපිණිස යායුත්තේයි. පබ්බාජනියකර්මය පටිප්පස්සම්භනය වූ මහණතෙම එනාහි යම් කුලයෙක්හි කුලදූසනකර්මය කරණ ලද්දේද ඒ කුලයෙන් සිව්පසය නොඉවසිය යුත්තේයි. සියල් කෙලෙස් නැසූ රහතන් වහන්සේ විසිනුදු කුල·දූසන කර්මය කරණු ලැබූ කුලයෙන් පබ්බාජනියකර්මය පටිප්පස්සම්භනය වීමට පෙරටුව ඒ කුලයෙන් සිව්පසය නොඉවසිය යුත්තේ යනු කී නියායි) එවඤ්චසොභික්ඛුති, ඒවඤ්චසොභික්ඛු යනු, ඒත්ථ, මේ පාඨයෙහි, සොති, සොයනු, පබ්බාජනිය කම්මකතො, පබ්බාජනිය කර්මය කරණු ලැබූ මහණ, අධිප්පෙතො, කැමතිවන ලදී. ඡන්දේන, ඡන්දයෙන්, ගච්ඡන්ති, යෙද්ද, ඉති (තස්මා) එසේ හෙයින්, ඡන්දගාමිනො, ඡන්දගාමී නම් වෙත්, සෙසෙසු, සෙසු පදයන්හි, එසෙවනයො, මේ ක්‍රමය වේ. සොභික්ඛුති, සොභික්ඛු යනු, ඡන්දගාමිනොති ආදීනි, ඡන්දගාමිනො යනාදීන්, වදමානො, කියනු ලබන්නාවූ, සොභික්ඛු, ඒ මහණ තෙම, තස්සවචනස්ස පටිනිස්සග්ගාය, ඒ වචනය අත්හරින පිණිස, ඒවං වචනියො, මෙසේ කියයුත්තේයි. කුල දූසනනිවාරණත්ථාය, කුල දූසකකර්මය වලක්වන පිණිස, වචනියෝන අස්ස, නොකියන්නේය. හි, එ එසේ මැයි, කුල දූසනකම්මේන, කුලදූසක කර්ම හේතුවෙන්, සො, ඒ මහණතෙම, ආපජ්ජිතබ්බා, පැමිණිය යුතුවූ, ආපත්තියො, ආපත්තීන්ට, පුබ්බෙව, පළමුකොටම, ආපන්නො, පැමිණියේ වෙයි. ඒවං පන, මෙසේ එනාහි, අස්ස, ඒ මහණහට විසුම්පි වෙනමද, සංඝ මජ්ඣෙපි, සඟ මැද ද, වුච්චමානස්ස, කියනු ලබන්නා වූ, අපටිනිස්සජතො. අත්නොහරණ මහණහට, අපරංදුක්කටංහොති,

අනික් දුකුලා ඇවැතක් වෙයි. ඒවංව සොතී ආදි ඒවංව සොයනාදිය ද, ඉතො, මේ ඒවංව සොයනාදියෙන්, පුබ්බෙවුත්තසද්ව. පෙර කියන ලද්දද, අවුත්තසද්ව, නොකියන ලද්දද, සබ්බා, සියල්ල, වුත්තානත්ථමේව, නොගැඹුරු අරුත් ඇත්තේ මැයි. විනිච්ඡයකථාපි, විනිශ්චය කථා තොමෝද, දසමෙ, දශවෙනි ශික්ෂා පදයෙහි, වුත්තසදිසායෙව, කියන ලද්ද හා සදෘශ මැයි, අයංපන, මේ කියනු ලබන්නේ වනාහි, විසෙසො, වෙනසයි, ඉදංසික්ඛාපදං, මේ ශික්ෂා පදය, සාවත්ථියං, සැවැත්නුවර, අස්සජි පුනබ්බුසුකෙ, අස්සජි පුනබ්බුසුක නම් වූ, භික්ඛූ, සවග මහණුන්, ආරබ්භ, අරභයා, ඡන්දගාමිතාදීහි, ඡන්දගාමිතා යනාදී වූ වචනයන් කරණකොටගෙන, පාපනවත්ථුස්මිං, දේශාරෝපන වස්තුව හේතුකොටගෙන, පඤ්ඤත්තං, පණවන ලදි. අංගේසුව, අංගයන් කෙරෙහිද, නත්ථි, ඒ දශවෙනි ශික්ෂා පදයෙහි, පරක්කමනංයථා, උත්සාහ කිරීම යම් සේද, ඒවං (තථා) එපරිද්දෙන්, ඉධ, මේ ශික්ෂාපදයෙහි, ඡන්දදීහි, ඡන්දදීන් කරණකොටගෙන, පාපනං, දේශාරෝපනය කිරීම, දට්ඨබ්බං, දැක්ක යුතුයි.

## තෙරසම සික්ඛා පදං, තෙළෙස් වෙනි ශික්ෂා පදයයි.

උද්දිට්ඨාඛො පෙ එවමෙතංධාරයාමීති එත්ථ, උද්දිට්ඨාඛො පෙ ධාරායාමි යන මේ පාඨයෙහි, එතේසං (සික්ඛාපදනං) මේ ශික්ෂා පදයන්ට, පඨමං විතික්කම නක්ඛණෙයෙව, පළමුවෙනි ඇවැත ඉක්ම වූ ක්ෂණයෙහිම, ආපත්ති, පැමිණෙන ලද ආපත්තිහු තුමූ, අත්ථි, ඇත්තාහුද, ඉති (තස්මා) එසේ හෙයින්, තෙ, ඒ ශික්ෂා පදයෝ තුමූ, පඨමාපත්තිකා, පඨමාපත්තික නම් වෙත්, පඨමංවීතික්කමනක්ඛණෙයෙව, පළමු වෙනි ඇවැත ඉක්ම වූ ක්ෂණයෙහිම, ආපජ්ජිතබ්බා, පැමිණිය යුත්තාහුය. ඉති අයං අත්ථො, යන මේ අර්ථයි. ඉතිරෙපන, මෙයින් අනය වූ සතර සික්ෂා පදයෝ වනාහි, යථාතතියෙව වතුත්ථේව දිවසෙ හොතිහි, ඒත්ථ යථා පෙ හොති යන මේ පාඨයෙහි, තතිය කොවතුත්ථකොහි, තතියකය වතුත්ථකයයි. වුච්චතියථා, යම් සේ කියනු ලැබේද, ඒවං (තථා) එපරිද්දෙන්, යාවතතියෙ, තුන්වෙනි වර දක්වා, සමනුභාසනකම්මෙ, සමනුභාසනකර්මයෙහි, හොන්ති, වෙද්ද, ඉති (තස්මා) එසේ හෙයින්, යාවතතියකා, යාවතතියක නම් වෙත්, ඉතිවේදිතබ්බා, මෙසේ දතයුත්තාහුය.

යාවතිහන්ති, යාවතිහංයනු, යත්තකානිඅහානි, යම් පමණ දවස් මුළුල්ලෙහි, ජානංපටිච්ඡාදෙතිති, ජානංපටිච්ඡාදෙති යනු, ජානන්තො, දන්නේ, පටිච්ඡාදෙති, පිළිසන් කෙරේද, තත්ථවචනෙ, ඒ වචනයෙහි, අයං, මේ මතු කියනු ලබන්නේ, පටිච්ඡාදන ලක්ඛණස්ස, ප්‍රතිච්ඡාදන ලක්ෂණයාගේ, මාතිකා, මාතෘකාවයි. ආපත්තිචහොති, ආපත්තියක් ද වෙයි. ආපත්ති සඤ්ඤීචහොති, ඇවැතට පැමිණියේමියන සංඥ ඇත්තේ ද වෙයි. පකතත්තොචහොති, (උක්ෂේපනීය කර්මාදිය නොකරනු ලැබූ) ප්‍රකෘති භික්ෂුවක්ද වෙයි. පකතත්තසඤ්ඤීච හොති, ප්‍රකෘති භික්ෂුව යන සංඥ ඇත්තේ ද වෙයි. අනන්තරායිකොච හොති, අන්තරා නැත්තෙක් ද වෙයි. අනන්තරායික සඤ්ඤීචහොති, අන්තරාය නැත්තෙක් යන සංඥ ඇත්තේද වෙයි. පහුචහොති, පොහොසත්ද වෙයි. පහුසඤ්ඤීචහොති, පොහොසත්ය යන සංඥ ඇත්තේද වෙයි. ඡාදෙතුකාමොචහොති, වසනු කැමැත්තේද වෙයි. ඡාදෙතිඡාති, වසන්නේ ද වෙයි. ඉති අයං මාතිකා, යන මේ මාතෘකාවයි. තත්ථ, (තෙසුමාතිකාපදෙසු) ඒ මාතෘකා පදයන් අතුරෙන්, ආපත්තිචහොති ආපත්තිසඤ්ඤීචාති, පෙ ආපත්ති පෙ සඤ්ඤීච යනු වනාහි, යං, යම් ඇවැතකට, ආපන්නො, පැමිණියේ වේද, සා, ඒ ආපත්ති තොමෝ, තෙරසන්නං, තෙළෙස් සංඝාදිසේසාපත්තීන් අතුරෙන්, අඤ්ඤතරාහොති, එක්තරා ඇවැතක් වේද, සොපිච, ඒ භික්ෂුතෙමේද තත්ථ, ඒ ආපත්තියෙහි ඉදං, මේ වස්තු තෙමේ, භික්ඛූනං, භික්ෂූන්ට, නවට්ටතිති, නොවටනේයයි. වත්ථුවසෙනවා, වස්තූන්ගේ වශයෙන් හෝ අයං, මේ ඇවත තොමෝ, ඉත්ථං නාමාපත්ති හෝතිති, මේ නම් ඇත්තා වූ, ඇවැතක් වේ යයි, නාමමත්තවසෙනවා, නාමමාත්‍ර වශයෙන් හෝ, ආපත්ති සඤ්ඤීයෙච හුත්වා, ඇවැත් යන සංඥ ඇතිබව වී, ඉදනි, දැන්, තං, ඒ ඇවත, කස්සචි, කිසිවෙක් හට, නආරොචෙස්සාමිති, නොඅස්වන්නෙමියි, ඒවං, මෙසේ, ඡාදෙතුකාමොච, වසනු කැමැත්තෙන්ම, ධුරංනික්ඛිපිත්වා, බරබහාතබා, අරුණංඋට්ඨපෙති, අරුණනන්වාද, ආපත්තිඡන්නාචහොති, ඇවැත වසන ලද්දීම වෙයි. (යට පාඨය එලවා අර්ථ යෝජනා කටයුතුයි) සචෙපන, ඉදන් වනාහි, ඒත්ථ, මේ ආපත්තියෙහි, අනාපත්ති සඤ්ඤීචාහොති, අනාපත්ති සංඥ ඇත්තේ හෝ වේද, අඤ්ඤපත්තික්ඛන්ධ සඤ්ඤීචාහොති, අනික් ආපත්ති ස්කන්ධයක් යන සංඥ ඇත්තේ හෝ වේද, වෙමතිකොචාහොති, විමති ඇත්තෙක් හෝ වේද,

අවිජන්නාවහොති, නොවසන ලද්දීම වෙයි. පකතත්තොති, පකතත්තෝ යනු, අනුක්ඛිත්තෝ, උක්ඛේපනීය කර්මයෙන් උද්ධරණය නොකරණ ලද්ද වූ. සමාන සංවාසකො, සමාන සංවාස ඇති භික්ෂුවක් වේද, සො, ඒ භික්ෂු තෙමේ පකතත්ත සඤ්ඤි හුත්වා, ප්‍රකෘති භික්ෂුවක් යන සංඥ ඇතිව, උත්තනයෙනෙව, කියන ලද ක්‍රමයෙන්ම, පටිච්ඡාදෙති, ඉදින් වසාද, ඡන්නාව හොති, වසන ලද්දීම වෙයි. අනන්තරායිකොති, අනන්තරායිකො යනු, යස්ස, යම් භික්ෂුවක් හට, දසසු, දශප්‍රකාර වූ, රාජචොර අග්ගි උදක මනුස්ස අමනුස්ස වාළ සිරිංසප ජීවිත බ්‍රහ්මචරියන්රායෙසු, රාජභය චොරභය ගිගිභය උදකභය මනුෂ්‍යභය අමනුෂ්‍යභය චණ්ඩ සිවිපාභය සජීභය ජීවිතන්තරාය බ්‍රහ්මචරියාන් තරාය හෙවත් ශාසනභය යන මොවුන් අතුරෙන්, එකොපි, එක අන්තරායක්ද, නත්ථි, නැත්තේද, සො, ඒ මහණ තෙම්, අනන්තරායික සඤ්ඤි අන්තරායෙක් නැත යන සංඥවක්ඇතිව, පටිච්ඡාදෙති, ඉදින්වසාද, ඡන්නාහොති, වසන ලද්දී වෙයි. පහුති, පහුයනු, යො, යම් භික්ෂුවක් තෙම, භිකඛුනොසන්තිකං, සභාග භික්ෂුවක්හුගේ සමීපයට, ගන්තුංචේව, යන්නටද, ආරොචෙතුඤ්ච, අස්වන්නටද, සක්කොති, හැක්කේද, සොභික්ඛු, ඒ මහණ තෙමේ, පහුසඤ්ඤිහුත්වා, පොහොසත්ය යන සංඥ ඇතිව, පටිච්ඡාදෙති, ඉදින් ඇවැත වසාද, ඡන්නාහොති, වසන ලද්දී වෙයි. ඡාදෙතුකාමොවහොති, ඡාදෙතිවාති, ඡාදෙතු කාමොහොති ඡාදෙතිව යන, ඉදං අංගද්වයං, මේ අංගද්වය, උත්තානමේව, නොගැඹුරු අර්ථ ඇත්තේ මැයි. හි, ඒ සැබෑ මැයි, සචෙපි, ඉදිනුදු, සො, ඒ මහණ තෙමේ, සභාගංදිස්වා, සභාග භික්ෂුවක්හු දැක, අයං, මේ තෙමේ, මේ, මාගේ, උපජ්ඣායො, උපාධ්‍යායහෝ. ආචරියොවා ඉති, ආචාර්ය හෝ වේයයි, ලජ්ජාය, ලජ්ජාව කරණකොටගෙන, නාරොචෙති. ඇවැත නොදෙසාද, ඡන්නාවහොති, වසන ලද්දීම වෙයි. හි, ඒ සැබෑමය. උපජ්ඣායාදීභාවො, උපාධ්‍යායාදිභාවය, ඉධ, මෙතැන්හි, අප්පමාණං, ප්‍රමාණ නොවෙයි. සභාගමත්තමේව, එකොද්දේසාදි ස්වභාව මාත්‍රයක්ම, පමාණං, ප්‍රමාණයි, අයං, මේ කියන ලද්දේ, ජානංපටිච්ඡාදෙතිති පදස්ස, ජානංපටිච්ඡාදෙති යන පදයාගේ, සංඛෙපතො, සැකෙවින්, අත්ථ විනිච්ඡයො, අර්ථ විනිශ්චයයි. තාවතිහන්ති, තාවතිහං යනු, තත්තකානි අහානි. එපමණ දවස් මුළුල්ලෙහි, පටිච්ඡාදිත දිවසතො පට්ඨාය, ඇවැත පිළිසන් කල දවස පටන්, යාව, යම්තාක්,

ආරොචිත දිවසො අත්ථි, ඇවැත දෙසූ දවස ඇත්තේද, තාව, එපමණ වූ, දිවසපක්ඛමාසසංවච්ඡරවසෙන, දවස් පක්ෂ මාස වර්ෂයන්ගේ වශයෙන්, යත්ථාකොකාලො යම් පමණ කාලයක් තෙම, අතික්ඛන්තො, ඉක්මවූයේ වේද තත්ථකං කාලං, එපමණ වූ කාලයක් මුලුල්ලෙහි, ඉති අයං අත්ථො යන මේ අර්ථයි, අකාමා පරිච්ඡත්තබ්බන්ති, අකාමා පරිවත්තබ්බං යනුකැමැත්ත වශයෙන්, නපරිවත්ථබ්බං, පිරිවෙස නොඉවසිය යුතුයි. අථඛො, ඉක්බිත්තෙන් වනාහි, අකාමෙන අවසෙන, නොකැමැත්ත වශයෙන්, පරිවාසංසමාදය, පිරිවෙස සමාදන් වගෙන, වත්ථබ්බං, විසිය යුතුයි ගෙවත් පිළිපැදිය යුතුයි. තත්ථ වාකෙ‍්‍ය) ඒ අකාමාපරිවත්ථබ්බා යන වාක්‍යයෙහි, පටිච්ඡන්න පරිවාසොච, ප්‍රතිච්ඡන්න පිරිවෙසද, සුද්ධන්ත පරිවාසොච, ශුද්ධාන්ත පිරිවෙසද, සමොධාන පරිවාසොචාති, සමොධාන පිරිවෙස දැයි කියා, පරිවාසො, පිරිවෙස තෙමේ, තිවිධොහොති, තුන් වැදැරුම් වේ. තත්ථ, ඒ ත්‍රිවිධ පරිවාසයන් අතුරෙන්, පටිච්ඡන්නපරිවාසො, ප්‍රතිච්ඡන්න පිරිවෙස, යථාපටිච්ඡන්නාය, යම් තාක් වසන ලද්ද වූ, ආපත්තියා, ඇවැතට, තාවදාතබ්බො, ඒ තාක් දිය යුත්තේයි. හි (යස්මා) යම් හෙයකින්, කස්සචි, කිසියම් භික්ෂුවක්හට, එකාහපටිච්ඡන්නා, එක් දවසක් වසන ලද්ද වූ, ආපත්ති හොති, ඇවැතක් වේද, කස්සචි, කිසි භික්ෂුවක් හට, ද්විහාදිපටිච්ඡන්නා, දෙදිනාදියක් වසන ලද්ද වූ, ආපත්ති හොති, ඇවැතක් වේද, කස්සචි, කිසිවෙක්හට, එකාපත්තිහොති, එක් ඇවතක් වේද, කස්සචි, කිසි භික්ෂුවක්හට, ද්වෙවා, ඇවැත් දෙදෙනෙක් හෝ තිස්සොවා, ඇවැත් තුන් දෙනෙක් හෝ, තදුත්තරිංවා, ඊට අධික වූ ආපත්ති හෝ, හොන්ති, වෙද්ද, තස්මා, එසේ හෙයින්, පටිච්ඡන්නපරිවාසං දෙන්තෙන, ප්‍රතිච්ඡන්න පිරිවෙස දෙන්නා වූ මහණාහු විසින් පඨමමේව, පළමුකොටම, වුත්තන යෙන කියන ලද ක්‍රමයෙන් පටිච්ඡන්නභාවංඤත්වා, ප්‍රතිච්ඡන්නභාවය දැන, තතො ඒ දැනගැන්මෙන්, පටිච්ඡන්න දිවසෙච, ප්‍රතිච්ඡන්න දිනයන්ද, ආපත්තියොච, ආපත්තීන්ද, සල්ලක්ඛෙත්වා, සළකා, සචෙ, ඉදින්, එකා, එක් ඇවැතක් තොමෝ, එකාහපටිච්ඡන්නාහොති, එක් දවසක් ප්‍රතිච්ඡන්න වේද, අහංභන්තෙ, ඒකං ආපත්තිං ආපජ්ජිං සඤ්චෙතනිකං සුක්කවිසට්ඨිං එකාහපටිච්ඡන්නන්ති, අහංභන්තෙ පෙ එකාහ පටිච්ඡන්නං යනාදී ක්‍රමයෙන්, ඒවං, මෙසේ, පරිවාසංයාචාපෙත්වා, පිරිවෙස ඉල්වවා, ඛන්ධකෙ ආගතනයෙන, ඛන්ධකයෙහි

ආවා වූ ක්‍රමයෙන්, කම්මාවාචංවත්වා, කම්මවාක්‍යය කියා, පරිවාසොදාතබ්බො, පිරිවෙස දිය යුත්තේයි. අථ, ඉක්ඛිත්තෙන්, ද්විහතිහාදි පටිච්ඡන්නාහොන්ති. දෙදවසක් තුන් දවසක් ආදි ක්‍රමයෙන්, ප්‍රතිච්ඡන්න ඇවැතක් වේද, ද්විහපටිච්ඡන්නං තිහපටිච්ඡන්නං චතුහපටිච්ඡන්නං පඤ්චාහ පටිච්ඡන්නං පෙ චුද්දසාහ පටිච්ඡන්නං ඉති, ව්හපටිච්ඡන්නං තිහපටිච්ඡන්නං චතුහපටිච්ඡන්නං පඤ්චාහ පටිච්ඡන්නං පෙ චුද්දසාහ ටිච්ඡන්නං යනුවෙන්, ඉති (ඒවං) මෙසේ, යාව, යම්තාක්, චුද්දසදිවසාහොන්ති, තුදුස් දින කෙනෙක් වෙද්ද, තාව, එතාක් දිවසවයෙන, දවස්හුගේ වශයෙන්, යොජනාකාතබ්බා, (ඉල්වන වාක්‍යයෙහි හා කර්ම වාක්‍යයෙහිදා) යෙදීම කටයුත්තිය. පඤ්චදසදිවස පටිච්ඡන්නාය, පසළොස් දවසක් ප්‍රතිච්ඡන්න වූ ඇවැතෙහි, පක්ඛපටිච්ඡන්නාඉති, පක්ඛපටිච්ඡන්නා යනුවෙන්, යෝජනා කාතබ්බා, ඉල්වන වාක්‍යයෙහි හා කර්ම වාක්‍යයෙහි යෙදීම කටයුත්තිය. තතො, ඒ පසළොස් දවයින්, යාව, යම්තාක්, එකූනතිංසති මොදිවසො අත්ථි, එකුන්තිස්වෙනි දවසක් ඇත්තේ ද, තාව, ඒතාක්, අතිරේක පක්ඛපටිච්ඡන්නං ඉති, අතිරේක පක්ඛපටිච්ඡන්නං යනුවෙන්, යෝජනාකාතබ්බො, යෙදීම කටයුත්තිය. තතොපරං, ඉත්තෙන්තෙහි, මාසපටිච්ඡන්නං අතිරේක මාසපටිච්ඡන්නං තෙමාසපටිච්ඡන්නං පෙ අතිරේක එකාදසමාස පටිච්ඡන්නං ඉති, මාස පටිච්ඡන්නං පෙ අතිරේක එකාදසමාස පටිච්ඡන්නං යනුවෙන්, ඒවං, මෙසේ, යෝජනකාතබ්බා, යෙදීම කටයුත්තිය. සංවච්ඡරෙපුණ්ණෙ, අවුරුද්ද පිරුණු කල්හි, එකංසංවච්ඡරපටිච්ඡන්නංඉති, ඒකසංවච්ඡර පටිච්ඡන්නං ඉති. එක සංවච්ඡර පටිච්ඡනං යනුවෙන් යෝජනා කාතබ්බා යෙදීම කටයුත්තිය තතොපරං ඉත් මත්තෙහි අතිරෙක සංවච්ඡරට ද්වෙසංවච්ඡර පටිච්ඡර පටිච්ඡන්නං ඉති අතිරේක සංවච්ඡරපටිච්ඡන්නං වෙසංවච්ඡරං පටිච්ඡන්නං යනුවෙන්, ඒවං, මෙසේ යාව, යම්තාක් සට්ඨිසංවච්ඡර අතිරේක සට්ඨිසංවච්ඡර පටිච්ඡන්නං ඉති, සට්ඨී පෙ පටිච්ඡන්නං යනුවෙන්, තතොවා හියෙහාපි, එයි අධික කොටද, වත්වා, කියා, යෝජනා කාතබ්බො, යෙදීම කටයුත්තිය, ස්වේපන, ඉදින් චනාගි, වේවා, ඇවැත් දෙකක් හෝ, තිසේසාවා, ඇවැත් තුනක් හෝ, තදුත්තරිංවා, එයින් අධික වූ හෝ, ආපත්තියො හොන්ති, ඇවැත් වෙද්ද, ඒකං ආපත්තිං ඉති. ඒකං ආපත්තිං යනුවෙන්, යථාවුත්තං යම්සේ කියන ලද්දේද,

ඒවං, (තථා) එපරිද්දෙන්, වෙආපත්තියො, ආපත්තිහු දෙදෙනෙක, තිස්සො ආපත්තියො ඉති, ආපත්තිහු තුන් දෙනෙකැයි, වත්තබ්බං කියයුතුයි. තතොපරංපන, එයින් මත්තෙහි වනාහි, සතංවාහොතු සියයක් හෝ වේවා, සහස්සංවාහොතු, දහසක් හෝ වේවා, සම්බුලා ඉති, සම්බුලා යනු වත්තුංවට්ටති, කියන්නට වටනේයි, නා නා වත්ථුකායුපි, නොයෙක් වස්තු ඇත්තා වූ, ආපත්තීන් කෙරෙහිද, අහංභන්තෙ සම්භුලා සංඝාදිසේසා ආපත්තියො ආපජ්ජිං, එකංසුක්කවිසද්ධිං, ඒකංකායසංසග්ගං, ඒකංදුට්ඨුල්ලවාචං, ඒකං අත්තකාමං, ඒකංසඤ්චරිත්තං, එකාහපටිච්ඡන්නායොති. අහං, පෙ එකාහපටිච්ඡන්නායො යනුවෙන්, ඒවං, මෙසේ, ගණනවසෙනවා, ගණන් වශයෙන් හෝ, අහංභන්තෙ සම්භුලා සංඝාදිසේසා ආපත්තියො ආපජ්ජිංනානා වත්ථුකායො එකාහපටිච්ඡන්නායොති, අහං පෙ එකාහපටිච්ඡන්නායො යනුවෙන්, ඒවංනාමෙනසහ, මෙසේ ආපත්ති නාමය හා සමග, වත්ථුකිත්තනවසෙනවා, වස්තුව ඇස්වීම වශයෙන් හෝ, ("නාමෙන සහ" යනු පාඨ ශේෂයි. "වත්ථු කිත්තනවසෙනවාති නාමෙන සහ වත්ථු කිත්තනවසෙනවාති අත්ථො තෙනෙවහි උපරිනාමමත්තවසෙනවා, නාමග්ගහණං කතන්තිදංබ්බං" යනු ටීකායි) අහංභන්තෙ සම්භුලා සංඝාදිසේසා ආපත්තියො ආපජ්ජිං එකාහපටිච්ඡන්නායොති, අහං, පෙ එකාහපටිච්ඡන්නායො යනුවෙන්, ඒවං මෙසේ, නාම මත්ත වසෙනවා, නාම මාත්‍ර වශයෙන් හෝ, යෝජනාකාතබ්බො, අර්ථ යෝජනාව කටයුත්තීය, තත්ථවචනෙ, ඒ වචනයෙහි, නාමං නාමය තෙමේ, සජාති සාධාරණඤ්ච, තමාගේ ජාතිය හා සාධාරණ වූනමක් ද, සබ්බ සාධාරණක්ඛ සිව්පත්තීන්ට සාධාරණ වූ ඉති, මෙසේ දුවිධං, විවිධ වේ, තත්ථ, ඒ දෙවදෑරුම් වූ නාමයන් අතුරෙන්, සංඝාදිසෙසොති, නාමං, සංඝාදි සේස යන නාමය තෙමේ සජාති සාධාරණං, තමාගේ ජාතිය හා සාධාරණ වූ නමකි. ආපත්තිති නාමං, ආපත්ති යන නාමය තෙමේ, යස්මා, යම්හෙයකින්, සබ්බසාධාරණංහොති, සියලු ඇවතුන්ට සාධාරණවේද, තස්මා, එසේ හෙයින්, සම්බහුලා ආපත්තියෝ ආපජ්ජිං එකාහපටිච්ඡන්නායොති, සම්බහුලා පෙ එකාහපටිච්ඡන්නායො යනුවෙන්. ඒවං, මෙසේ, සබ්බ සාධාරණ නාම වසෙනාපි, සර්වාපත්තීන්ට සාධාරණ වූ නම් වශයෙන්ද, වත්තුං වට්ටති, කියන්නට වටනේයි, හි ඒ එසේ මැයි, ඉදංපරිවාසාදි විනය කම්මං, මේ පිරිවෙස් ආදි

විනය කර්මය, වත්ථුවසෙනව, වස්තූන්ගේ වශයෙන්ද, ගොත්තවසෙනව, ගෝත්‍රයාගේ වශයෙන්ද, නාමවසෙනවා, නාමයාගේ වශයෙන්ද, ආපත්ති වසෙනව, ආපත්තීන්ගේ වශයෙන්ද, කාතුංවට්ටතියෙව, කරන්නට වටනේමැයි, තත්ථ, ඒ සතර ආකාරයන් අතුරෙන්, සුක්කවිසට්ඨීති, සුක්කවිසට්ඨි යන ශබ්දය තෙමේ, වත්ථුසඞ්ඛෙව වහොති. වස්තුවක් වේද, ගොත්තසඞ්ඛවහොති, ගෝත්‍රයන් වේද, සංඝාදිසෙසොති, සංඝාදිසෙසො යන ශබ්දය තෙමේ, නාමසඞ්ඛෙවහොති, නාමයක් වේද, ආපත්තිවහොති,ආපත්තියක් වේද, තථා, එයින් අනපවූ, සුක්ක විසට්ඨිකාය සංසග්ගන්ති ආදි වචනෙනාපි, සුක්කවිසට්ඨිකාය සංසග්ගං යන ආදි ශබ්දයන්ගෙන්ද, නානා වත්ථුකායොති වචනෙනාපි, නානාවත්ථුකායො යන වචනයෙන්ද, වත්ථුංසඞ්ඛෙව, වස්තුවද, ගොත්තසඞ්ඛ, ගෝත්‍රයද, ගහිතංහොති, ගන්නා ලද්දේ වෙයි. සංඝාදිසෙසොතිවචනෙනාපි, සංඝාදිසේස යන ශබ්දයෙන්ද, ආපත්තියොති වචනෙනාපි, ආපත්තියෝ යන වචනයෙන්ද, නාමසඞ්ඛෙව, නාමය ද, ආපත්තිව, ඇවැතද, ගහිතා, ගන්නා ලද්දී, යස්මා හොති. යම් හෙයකින් වේද, තස්මා, එසේ හෙයින්, එතේසු, ඒ වස්තු ආදීන් අතුරෙන්, යස්ස කස්සචිවසෙන, යම්කිසි වස්තුවක්හුගේ වශයෙන්, කම්මවාචාකාතබ්බා, කර්මවාක්‍යය කටයුත්තිය. කම්මාවාචාපරියොසානෙව, කර්ම වාක්‍යයාගේ කෙළවරද, අප්පභික්ඛුකො, ස්වල්ප භික්ෂූන් ඇත්තා වූ, ආවාසො, ආවාසයක් තෙමේ, සචෙහොති, ඉදින් වේද, රත්තිච්ඡෙදං, රාත්‍රිච්ඡේද යට, අනාපජ්ජන්තෙන, නොපැමිණෙන්නහු විසින්, වසිතුංසක්කා, වසන්නට හැක්කේ, සචෙහොති, ඉදින් වේද, තත්ථෙව, ඒ වෙහෙරෙහිම හෙවත් ඒ සීමාවෙන් පිටත්හිම, පරිවාසංසමාදියාමීති වත්තංසමාදියාමි, පරිවාසං පෙ සමාදියාමි යනුවෙන්, තික්ඛත්තුං, තුන් යළක්, වත්තංසමාදාතබ්බං, වත් සමාදන් විය යුතුයි. සමාදියිත්වා, වත සමාදන්ව, තත්ථෙව, ඒ වෙහෙරෙහිම හෙවත් ඒ සීමාවෙන් පිටත්හිම, සංඝස්ස ආරොචෙත්වා, සංඝයාට අස්වා, පුන, නැවත ආගතාගතානං භික්ඛූනං, ආආ මහණුන්ට, ආරොචෙන්තෙන, අස්වන්නහු විසින්, වත්තභේදසඞ්ඛ, වත බිඳීමද, රත්තිච්ඡේදසඞ්ඛ, රාත්‍රිය සිඳීමද. අකත්වා, නොකොට, පරිවසිතබ්බං, පිරිවෙස් විසිය යුතුයි. පරිවාසං, පිරිවෙස, සොධෙතුං, ශුද්ධකරන්නට, සචෙ, ඉදින් නසක්කාහොති, නොහැකිවේද, නික්ඛිත්තවත්තෙන, බහාතබනලදවත් ඇත්තහු සින්,වසිතුකාමොහොති, වසනුකැමති වේද, තථෙව,

ඒ සීමාවෙන් පිටත්හිම, සංඝමපෙක්ඛිවා, සඟ මැද හෝ, එකපුග්ගලස්සවා, එක් පුද්ගලයෙක්හුගේ හෝ, සන්තිකෙ සමීපයෙහි, පරිවාසංනික්ඛිපාමිවත්තං නික්ඛිපාමීති, පරිවාසංනික්ඛිපාමිවත්තං නික්ඛිපාමි යනුවෙන්, පරිවාසො නික්ඛිපිතබ්බො, පරිවෙස බහා තැබිය යුත්තේයි. එත්ථච, (එතෙසු විසුපදෙසු) මේ පදයන් අතුරෙන්, එකපදෙනාපිච, එක් පදයකිනුදු, පරිවාසොනික්ඛිත්තොහොති, පිරිවෙස බහා තබන ලද්දේ වේ, විහිපන, දෙපෙදින් වනාහි, නික්ඛිත්තෙ, බහාතැබූ කල්හි, සුනික්ඛිත්තොයෙවහොති. මොනවට බහා තබන ලද්දේම වේ. සමාදනෙපි, සමාදනයෙහිදු, එසෙවනයො, මේ ක්‍රමය මැයි, නික්ඛිත්තකාලතො පද්ධාය, වතබහාතැබූ කල් තැන් පටන්, පකතත්තද්ධානෙ, ප්‍රකෘති ස්වභාව ඇත්තා වූ ස්ථානයෙහි, තිද්ධති, සිටියි, අථ (පච්ඡා) ඊට මෑත භාගයෙහි, අනේන භික්ඛුනා, මේ මහණාහු විසින්, පච්චුස්සමයෙ, ඉතා අළුයම් කාලයෙහි, එකේන භික්කුනා සද්ධිං, එක මහණෙකු සමඟ, පරික්ඛිත්තස්ස විහාරස්ස, පවුරු සහිත වෙහෙරක්හුගේ: පරික්ඛෙපතො, පවුරෙන්ද, අපරික්ඛිත්තස්ස විහාරස්ස, පවුරු රහිත වෙහෙරක්හුගේ, පරික්ඛෙපාරහද්ධානතො, පවුරු බැඳිය යුතු ස්ථානයෙන්, ද්වෙලෙඩ්ඩුපාතෙ අතික්කමිත්වා, ලෙඩ්ඩුපාත දෙකක් ඉක්මවා, මහාමග්ගතො. මහා මාර්ගයෙන්. ක්කම්ම, පහව, ගුමේබනවා, පඳුරකින් හෝ, වතීයාවා, වැටකින් හෝ, පටිච්ඡන්නද්ධානෙ. පිළිසන් තැනෙක්හි, නිසීදිත්වා, හිඳ, අන්තො අරුණෙයෙව, අරුණ ඇතුළෙහිම, වත්තංසමාදියිත්වා, වතසමාදන්ව, (ගෙන) ආරොචෙතබ්බං, ඇසිවිය යුතුයි. යම්පිඅඤ්ඤං භික්ඛුංපස්සති. යම් අනිකුදු භික්ෂුවක්හු දකීද, තස්සපි, ඒ භික්ෂුවහටද, ආරොචෙතබ්බාං එව, ඇස්විය යුතු මැයි, අරුණෙ, උද්ධිතෙ, අරුනනැගි කල්හි, තස්සන්තිකෙ, ඒ භික්ෂුහුගේ සමීපයෙහි, වත්තං නික්ඛිපිත්වා, වතබහාතබා. විහාරංගන්තබ්බං, විහාරයට යා යුතුයි. සො, ඒ ප්‍රකෘති ස්වභාව ඇත්තා වූ භික්ෂුතෙමේ, පුරෙ අරුණෙයෙව, අරුණ නොනැගි කල්හිම, කෙනචිකරණීයෙන, යම්කිසි කටයුත්තකින්, සවෙගතො, ඉදින් විහාරයට ගියේ වී නම්, විහාරං ගනත්වා, වෙහෙරට ගොස්, සබ්බපඨමං, සියල්ලට පළමු කොට, යංභික්ඛුං පස්සති, යම් භික්ෂුවක්හුද කීද, තස්ස, ඒ භික්ෂුවහට, ආරොචෙත්වා, අස්වා, නික්ඛිපිතබ්බං, වතබහා තැබිය යුතුයි.

("විහාරංගනත්වායං සබ්බපඨමං භික්ඛුන්ති විහාරතොනික්ඛමන්තංවා

ආගන්තුකංවා පඨමංයං අඤ්ඤං භික්ඛුංපස්සති තස්සාරොචෙත්වා නික්ඛිපිතබ්බන්ති නාරොචෙන්තස්ස දුක්කටංසියා තං සන්ධායවුත්තං නතුරත්තිච්ඡේදං සන්ධාය ඉතරථාහි විහාරසීමාපරියාපන්නානං සබ්බේසං ආරොචෙත්වාතිවදෙය්‍යු" යනු ටීකායි. මේ මතයෙන් විහාරයට පැමිණෙන්නේද දුටු මහණුන්ට නොඇස්වන ලද කල්හිම වත්භේද දුක්කටාපත්තිය වෙයි. නුදුටු මහණුන්ට නොඇස්වූ කල්හි වත්භේද දුක්කටාපත්තිය නොවන්නේය. එහෙයින් මානත්ත විනිශ්චයෙහි ද "සචෙපනකිඤ්චි නපස්සති විහාරංගන්ත්වායං පඨමං පස්සති තස්ස ආරොචෙත්වා නික්ඛිපිතබ්බං යනුද ටීකායි. මෙහි වනාහි "සචෙපනකිඤ්චි" යන පාඨයෝ මේ ටීකායෙහිම කියන ලද්දහු නොවෙති. විනය සංග්‍රහය ගුළ්හත්ථදීපනිය විනයාලංකාරය යනාදී පොත්හි දක්නා ලැබෙත්. "වත්තංනික්ඛිපිත්වා පරිවසන්තස්ස උපචාර ගතානං සබ්බේසං ආරොචන කිච්චං නත්ථි දිට්ඨරූපානං සුත සද්දානං ආරොචෙතබ්බං අදිට්ඨ අසුතානම්පි අන්තො ද්වාදස හත්ථ ගතානං ආරොචෙතබ්බං ඉදං වත්තං නික්ඛපිත්වා පරිවසන්තස්ස ලක්ඛණස්ස ථෙරස්ස අධිප්පායො" යනු කීහ. මේ පාඨයන් අතුරෙන් "තස්ස ආරොචෙත්වා නික්ඛිපිතබ්බන්ති අනාරොචෙන්තස්ස දුක්කටංසියා" යන පාඨය "අඤ්ඤතත්තාපන වත්තභේදෙ නත්ථි" යන පාඨය හා විරුද්ධාකාර හැගේ. කුමක් හෙයින්ද යත්? මේ වත් පුරණ මහණ තෙමේ පළමුකොට දුටු මහණහුගෙන් අන්‍ය වූ විහාරයෙහි භික්ෂුහු ඇත්තාහ යන සංඥාවෙන් තොර නොවිය යුතු හෙයින් පරීක්ෂා කොට අර්ථගත යුතුයි) ජවංසල්ලක්ඛෙත්වා, මෙසේ සලකා, යාවරත්තියො පූරෙන්ති, යම්තාක් රාත්‍රීහු පිරෙද්ද, තාව, ඒ තාක්කල් මුළුල්ලෙහි, පරිවත්ථබ්බං, පිරිවෙස් විසිය යුතුයි. අයං, මේ කියන ලද්දේ, සංඛෙපතො, සැකෙවින්, පටිච්ඡන්න පරිවාසස්ස, ප්‍රතිච්ඡන්න පරිවාසයාගේ. විනිච්ඡයො, අර්ථ විනිශ්චයයි, විත්ථාරොපන, විස්තාර විනිශ්චය වනාහි, සමන්ත පාසාදිකාය විනය සංවණ්ණනාය, සමන්ත පාසාදිකා නම් විනයාර්ථ කථාවෙහි, වුත්තනයෙනෙව, කියන ලද ක්‍රමයෙන්ම, වේදිතබ්බො, දතයුත්තේය. ඉතරෙසුද්වීසුපන, ප්‍රතිච්ඡන්න පරිවාසයෙන් අන්‍ය වූ සුද්ධන්ත පරිවාස සමොධාන පරිවාස දෙදෙනා අතුරෙන්, ආපත්ති පරියන්තං ජානාති රත්තිපරියන්තං නජානාතීති, ආපත්ති පරියන්තං පෙ නජානාති යනාදී වූ, ඉමස්මිං වත්තක්ඛන්ධකෙ, මේ වත්තක්ඛන්ධකයෙහි, අනුඤ්ඤාතො,

අනුදන්නා ලද පිරිවෙස හෙමේ, සුද්ධන්ත පරිවාසො නාම, සුදන්ත පරිවාසය නම් වේ, සො, ඒ සුද්ධන්ත පරිවාස හෙමේ. චුල්ල සුද්ධන්තො චුල්ල සුද්ධන්ත මහා සුදන්තො ඉති, මහාසුදන්තයයි. දුවිධො, විවිධ වේ, දුවිධොපිච එසෝපරිවාසො, ද්විප්‍රකාර වූද මේ පිරිවෙස, රත්ති පරිච්ඡේදං, රාත්‍රී පරිච්ඡේදය, සකලංවා, සියල්ල හෝ, එකච්චංවා, සමහරක් හෝ අජානන්තස්සච, නොදන්නා වූ භික්ෂුවහටද, අසරන්තස්සච, සිහිනොකරන්නා වූ භික්ෂුවහටද, තත්ථ, ඒ රාත්‍රි පරිච්ඡේදයෙහි, වෙමතිකස්සච විමති ඇත්තා වූ භික්ෂුවහටද, දතබ්බො, දියයුත්තේයි, ආපත්ති පරියන්තංපන, ආපත්ති පරියන්තය වනාහි, අහං, මම, එත්තකා ආපත්තියො, මෙපමණ ඇවතුන්ට, ආපන්නො ඉති, පැමිණියේ වෙමියි, ජානාතුවා, දන්නේ හෝ වේවා, මාවා, නොදන්නේ හෝ වේවා, ඒතං, ඒ දැනීම හා නොදැනීම, අකාරණං, කරුණක් නොවෙයි. තස්ස, ඒ සුද්ධන්ත පරිවාසයාගේ, දන විධි, දෙන්නා වූ විධි තොමෝ, ඛන්ධකෙ ආගතා, ඛන්ධකයෙහි ආයේයි, විනිච්ඡය කථාපන, විනිශ්චය කථාව වනාහි, විත්ථාරතො, විස්තාර හෙයින්, සමන්ත පාසාදිකාය වුත්තං, සමන්ත පාසාදිකායෙහි කියන ලදී. ඉතරොපන, සුදන්ත පරිවාසයෙන් අන්‍ය වූ පරිවෙස හෙම වනාහි, සමොධාන පරිවාසො නාම, සමෝධාන පරිවාස නම් වේ, සො, ඒ සමොධාන පරිවාස හෙමේ, ඔධාන සමෝධානො, ඔධාන සමෝධානය, අග්ඝ සමෝධානො, අග්ඝ සමෝධානය, මිස්සක සමොදනයයි, තිවිධොහොති, ත්‍රිවිධ වේ, තත්ථ, ඒ තුන් වැදෑරුම් සමෝධානයන් අතුරෙන්, ඔධාන සමෝධාන පරිවාසො නාම, ඔධාන සමොධාන පරිවාසය නම්, අන්තරාපත්තිං ආපජ්ජිත්වා, අන්තරා පත්තියකට පැමිණ, පටිච්ඡාදෙන්තස්ස, වසන්නා වූ මහණහට, පරිවුත්ථ දිවසෙ, පිරිවෙස් විසූ දවස්, ඔධුනිත්වා, සලා, මක්ඛෙත්වා, මකා, පුරිමාය ආපත්තියා, පළමු ඇවැතහුගේ, මූල දිවස පරිච්ඡේදෙ, මුල් දවස පිරිසිඳීමෙහි, පච්ඡා, පසුව, ආපන්නං ආපත්තිං, පැමිණි ඇවැත, සමොදහිත්වා, එක්කොට, දැතබ්බ පරිවාසො වුච්චති, දිය යුතු පිරිවෙස යයි කියනු ලැබේ. අග්ඝ සමෝධනො නාම, අග්ඝ සමෝධානය නම්, සම්බහුලා ස ආපත්තිසු, බොහෝ ඇවැත් අතුරෙන්, එකාවා, එක් ඇවැතක් හෝ, වේවා, ඇවැත් දෙකක් හෝ, තිස්සොවා, ඇවැත් තුනක් හෝ, සම්බහුලාවා, තුණෙන් අධික වූ ඇවැත් සිය දහස් ගණනක් හෝ, යා ආපත්තියො, යම් ඇවැත් කෙනෙක්, සබ්බචිර

පටිච්ඡන්නායො, සියලු ආපත්තීන්ට වැඩි වූ රාත්‍රීන් මුළුල්ලෙහි වසන ලද්ද හුද, තාසං, ඒ ආපත්තීන්ගේ, අග්ඝේන අගය වශයෙන් සමෝධාය එක්කොට නාසං ඒ (අතිශයින් දීර්ඝවූ රාත්‍රීන් මුලුම්ලෙහි වසන ලද) අපත්තීන්ගේ රත්ති පරිච්ඡේද වසෙන. රාත්‍රීන්ගේ පිරිසිඳීම් වශයෙන්, අවසෙසානං, අවශිෂ්ට වූ, ඌනතර පටිච්ඡන්නානං, අතිශයින් අඩු වූ රාත්‍රීන් වසන ලද්ද වූ, ආපත්තීනං, ආපත්තීන්ට, දාතබ්බ පරිවාසො දිය යුතු පිරිවෙස යැයි වුච්චති කියනු ලැබේ. මිස්ස සමෝධානො නාම, මිශ්‍රක සමෝධානය නම්, නානාවත්ථුකායො ආපත්තියො, නානා වස්තුක වූ ආපත්තීන්, එකතොකත්වා, එකතු කොට, දාතබ්බ පරිවාසො වුච්චති, දියයුතු පිරිවෙසයයි කියනු ලැබේ. අයං, මේ කියන ලද්දේ, තිවිධොපි, තුන් වැදෑරුම් වුද, සමෝධාන පරිවාසෙ, සමොධාන පරිවසයෙහි, සංඛෙපො තාව, සංක්ෂේප කථාවයි, විත්ථාරොපන, විස්තාර විනිශ්චය වනාහි, සමන්තපාසාදිකායං වුත්තො, සමන්තපාසාදිකා නම් අටුවායෙහි කියන ලදී. ඉදම්පන, මේ වචනය වනාහි, පරිවත්තලිඞ්ගන්තිදස්සස, පරිවත්තලිඞ්ගං යන පදයාගේ, විනිච්ඡය කථාමුඛං, විනිශ්චය කථාද්වාරයයි. (අග්ඝ සමොධනය හා මිස්සක සමෝධානය යන දෙදෙනාගේ විශේෂය වනාහි නානා වත්ථුක හෝ වේවා එක වත්ථුක හෝ වේවා අචිරපටිච්ඡන්න වූ ආපත්තිය චිරපටිච්ඡන්න වූ ආපත්තියෙහි එක්කොට පිරිවෙස්දීම වනාහි අග්ඝ සමෝධානය නම් වෙයි යනු විනයාලංකාර මහයි වජිරබුද්ධි ටීකායෙහි "අග්ඝසමෝධානො නාමසභාග වත්ථුකායො සම්බහුලා පත්තියො ආපන්නස්ස බහුරත්ති පටිච්ඡාදිකා ආපත්තියො නික්ඛිපිත්වා දාතබ්බො ඉතරො නා නා වත්ථු කානංවසෙනාති අය මෙතං විසෙසො" යනු උක්තයි. විනයාලංකාරයෙහිද මෙසේ මැයි. ගුළ්හත්ථ දීපනියෙහි වනාහි - "අයංපරිවාසො ආපත්තීනං වත්ථුනඤ්ච සමෝධාන පටිච්ඡන්නානං මිස්සකකරණෙන සමොධානෙත්වා දාතබ්බො, මිස්සක සමොධානො නාම අයංපන පටිච්ඡන්න පරිවාසෙන සමොධාන ලක්ඛණො, සොපන එකිස්සාය යථා පටිච්ඡන්නාය දාතබ්බො, අයංපන වත්ථුනඤ්ච ආපත්තීනඤ්චමිස්සෙත්වා සමොධානෙත්වා දාතබ්බො, අය මෙතෙ සංවිසෙසො" යනුවෙන් පටිච්ඡන්න පරිවාසය හා මිස්සක සමෝධානය වෙනස් කළෝ, අර්ථ කථාචාර්යයන් විසින් ම පටිච්ඡන්න පරිවාසයෙහිද නානා වත්ථුක සමෝධාන පටිච්ඡන්නයො විනිශ්චය කරණ ලද්දහුය. කල්පණාකොට අර්ථ ගත යුත්තාහුයි)

උත්තරිංජාරත්තනන්ති, උත්තරිංජාරත්තං යනු. පරිවාසතො උත්තරිං, පිරිවෙසින් මත්තෙහි, ජරත්තියො, ස රැයක් මුළුල්ලෙහි, භික්ඛුමානත්තායාති, භික්ඛුමානත්තා යනු, භික්ඛූනං, භික්ෂූන්ට, මානනභාවය, බුහුමන් කරණු පිනිස, ආරාධනත්ථාය, සතුටු වනු පිණිස, ඉති (අයං අධිප්පායො) මේ අභිප්‍රාය, වුත්තං, (වුතෙතා) හොති. කියන ලද්දේ වෙයි. පටිපජ්ජිතබ්බන්ති. පටිපජ්ජිතබ්බං යනු, වත්ති තබ්බං, පිළිපැදිය යුතුයි. ඒතං භික්ඛුමානත්තසඳවපන, ඒ භික්ෂූන්ගේ මානත තෙමේද වනාහි. පටිච්ඡන්නාපටිච්ඡන්නවසෙන, ප්‍රතිච්ඡන්න අප්‍රතිච්ඡන වශයෙන්, දුවිධං, ද්විප්‍රකාර වේ, තත්ථ, ඒ ද්විප්‍රකාරයන් අතුරෙන්, යස්ස භික්ඛුනො, යම් භික්ෂුවක් හට, අපටිච්ඡන්නාපත්තිහොති. අප්‍රතිච්ඡන්න වූ ඇවැතක් වේද, තස්ස භික්ඛුනො, ඒ භික්ෂුවහට, පරිවාසං අදත්වා, පිරිවෙස නොදී, මානත්තමේව දාතබ්බං, මානතම දිය යුතුයි. ඉදං, මේ මානත තෙමේ, අපටිච්ඡන්න මානත්තං, අප්‍රතිච්ඡන්න වූ මානත නම් වෙයි. යස්ස භික්ඛුනො, යම් භික්ෂුවක් හට, පටිච්ඡන්නාපත්තිහොති. ප්‍රතිච්ඡන්න වූ ඇවැතක් වේද, තස්ස භික්ඛුනො, ඒ භික්ෂුවහට, පරිවාස පරියොසානෙ, පිරිවෙස් කෙළවර, දාතබ්බං, දිය යුතු වූ, මානත්තං, මානත තෙමේ, පටිච්ඡන්න මානත්තං, ප්‍රතිච්ඡන්න මානත නම් වෙයි. ඉති වුච්චති. මෙසේ කියනු ලැබේ. ඉදං, මේ ප්‍රතිච්ඡන්න මානත, ඉධ, මේ උත්තරිජාරත්තං භික්ඛුමානත්තාය යන වාක්‍යයෙහි, අධිප්පෙතං, කැමති වන ලදී. එතෙසං උභින්නම්පිමානත්තානංපන, මේ ද්විප්‍රකාර වූ මානත්තයන්ගේ වනාහි, දානවිධිච, දෙන්නා වූ විධියද, විනිච්ඡය කථාච, අර්ථ විනිශ්චය කථාවද, සමන්ත පාසාදිකායං, සමන්ත පාසාදිකා නම් විනයාර්ථ කථාවෙහි, වුත්තනයෙනෙව, කියන ලද ක්‍රමයෙන්ම, වේදිතබ්බා දත යුත්තිය. අයංපන, මේ කියනු ලබන්නේ වනාහි, ඒත්ථ, මෙහි, සංඛෙපො, සංක්ෂේප විනිශ්චයයි. අයංභික්ඛු, මේ මහණ තෙමේ, වත්තංනික්ඛිපිත්වා වතබහාතබා, පච්චුසසමයෙ, ඉතා අළුයම් වේලෙහි සමාදතුං සමාදන් වනු පිණිස, සංවේගචජති, ඉඳින් යේද, සබ්බන්තිමේන පරිච්ඡේදෙන සියල්ලට යටත් පිරිසෙයින්, චතූහි භික්ඛූහි සද්ධිං, භික්ෂූන් සතර දෙනෙකුන් සමග, පරිවාසෙවුත්තප්පකාරං, පිරිවෙසෙහි කියන ලද ප්‍රකාර ඇත්තා වූ, පදෙසංගන්ත්වා, ප්‍රදේශයකට ගොස්, මානත්තං සමාදියාමි වත්තං සමාදියාමීති. මානත්තං සමාදියාමි වත්තං සමාදියාමි යනුවෙන්, සමාදියිත්වා, සමාදන්වගෙන,

තේසං, ඒ භික්ෂූන්ට, ආරොචෙත්වා, දන්වා, තතො, ඒ දැන්වීමෙන් මතු, තෙසු, ඒ භික්ෂූන්, ගතෙසුවා, ගියකල්හි හෝ, අගතෙසුවා, නොගිය කල්හි හෝ, පුරිමනයෙනෙව, පෙර කී ක්‍රමයෙන්ම, පටිප්පජ්ජිතබ්බං, පිළිපැදිය යුතුයි. යත්ථසියා වීසති ගණොති, යත්ථසියා වීසති ගණොයන, එත්ථ, මේ වාක්‍යයෙහි, වීසති සංඝො, ද්විදශකයක් ගණන් ඇති සංඝ සංඛ්‍යාත වූ, ගණො, ගණයෙක් තෙමේ, අස්ස (සංඝස්ස) අත්ථි, මේ සංඝයාට ඇත්තේද, ඉති (තස්මා) එසේ හෙයින්, වීසතිගණො, වීසතිගණ නම් වේ, තත්‍රාති, තත්‍ර යනු, යස්සංසීමායං, යම් සීමායෙක්හි, සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන, සියල්ලට යටත් පිරිසෙයින්, වීසතිගණො භික්ඛුසංඝො අත්ථි, වීසති ගණ සංඛ්‍යාත වූ භික්ෂු සංඝ තෙමේ ඇත්තේද, තස්සං සීමායං, ඒ සීමායෙහි, අබ්භෙතබ්බොති. අබ්භෙතබ්බො යනු. අභිහනබ්බො, එළවිය යුත්තේයි. සම්පටිච්ඡිතබ්බො, පිළිගත යුත්තේයි. අබ්භානකම්මවසෙන, අබ්භාන කර්මයාගේ වශයෙන්, ඔසාරෙතබ්බොති. ඇතුළත් කටයුත්තේයි. ඉති (අයං අධිප්පායො) මේ අභිප්‍රාය, වුත්තං (වුත්තො) හොති. කියන ලද්දේ වේයි. වා, නොහොත්. අබ්භාතබ්බොති, කැඳවිය යුත්තේයි. ඉති අයං අත්ථො, යන මේ අර්ථයි. අබ්භානකම්මංපන, අබ්භාන කර්මය වනාහි, පාළිවසෙන, පෙළ වශයෙන්, ඛන්ධකෙ, ඛන්ධකයෙහිද, විනිච්ඡයවසෙන, අර්ථ විනිශ්චය වශයෙන්, සමන්ත පාසාදිකායං, සමන්ත පාසාදිකා නම් විනයාර්ථ සංවර්ණනාවෙහි, වුත්තං, කියන ලදී. අනබ්භිතොති, අනබ්භිතො යනු. නඅබ්භිතො, නො එළවන ලද්දේයි. අසම්පටිච්ඡිතො, නොපිළිගන්නා ලද්දේයි, අකතාබ්භානකම්මො, නොකරණ ලද අබ්භානකර්මය ඇත්තේයි, ඉති (අයං අධිප්පායො) මේ අභිප්‍රාය, වුත්තං (වුත්තො) හොති, කියන ලද්දේ වේවා, නොහොත්, අනවහාතො. නොකැඳවන ලද්දේයි. ඉති අයං අත්ථො, යන මේ අර්ථයි. තෙචභික්ඛුගාරය්හාති. තෙචභික්ඛුගාරයිහා යනු, යෙභික්ඛු, යම් භික්ෂුකෙණෙක් තුමූ, ඌනභාවංඤත්වා, සංඝයා අඩුබව දැන, අබ්භෙන්ති, අබ්භාන කර්මයෙන් ඇතුළත් කෙරෙද්ද, තෙභික්ඛුච, ඒ භික්ෂුහුද, ගරහිතබ්බා, ගර්හා කටයුත්තොය. සාතිසාරායෙවා, දෙස් සහිතයෝ වෙත්, දුක්කටං ආපජ්ජන්ති, දුකුලාවට පැමිණෙත්, ඉති අයං අත්ථො, යන මේ අර්ථයි. අයං තත්ථ සාමීචිති, අයං තත්ථ සාමීචි යනු. අයං, මේ විධි තොමෝ. තත්ථ, ඒ අබ්භාන කර්මයෙන් ඇතුළත් කිරීමෙහි, අනුධම්මතා, ධර්මයට අනුව පිළිපැදීම වේ.

ලොකුත්තරධම්මං, ලොකොත්තර ධර්මයට, අනුගතා, අනුව ගියාවූ ප්‍රතිපත්තියයි. ඔවාදනුසාසනීසාමීචිධම්මතා, අවවාදානුශාසනා සංඛ්‍යාත වූ ගරු ගාරව කටයුතු වූ ස්වභාවයයි. සෙසං, සෙස්ස, ඒත්ථ, මේ අර්ථයෙහි, වුත්තනය මෙව, කියන ලද ක්‍රමය ඇත්තේ මැයි.

කංඛාවිතරණීයා, කංඛාවිතරණී නම් වූ, පාතිමොක්ඛවණ්ණනාය, ප්‍රාතිමෝක්ෂ අර්ථ වර්ණනාවෙහි, සංඝාදිසේස කණ්ඩ වණ්ණනා, සංඝාදිසේස කාණ්ඩයාගේ අර්ථ වර්ණනා තොමෝ, ඉති (ඉමෙහි වචනක්කමෙහි) මේ වචනයන්ගේ ක්‍රමයෙන්, නිට්ඨිතා, සම්පූර්ණ කරණ ලද්දීය.

**සංඝාදිසෙසුද්දේස වර්ණනාවයි.**